# පිරුවානා පොත් වහන්සේ

*Non-Commercial Distribution*

# පටුන


පිටුව

ප්‍රස්තාවනා vii
පූර්විකාව xi

පඨමක භාණවාරං-පෙළ

1. සරණාගමනං 35
2. දස සික්ඛාපදානි 36
3. සාමණෙර පඤ්හා 37
4. ද්වත්තිංසාකාරො 37
5. පච්චවෙක්ඛණා 38
6. දසධම්ම සුත්තං 39
7. මහා මඞ්ගල සුත්තං 41
8. රතන සුත්තං 43
9. කරණීය-මෙත්ත සුත්තං 47
10. ඛන්ධ පරිත්තං 49
11. මෙත්තානිසංස සුත්තං 51
12. මිත්තානිසංස සුත්තං 52
13. මොර පරිත්තං 54
14. චන්ද පරිත්තං 55
15. සූරිය පරිත්තං 56
16. ධජග්ග පරිත්තං 58

දුතියක භාණවාරං

17. මහා කස්සපත්ථෙර බොජ්ඣඞ්ග පරිත්තං 62
18. මහා මොග්ගල්ලානත්ථෙර බොජ්ඣඞ්ග පරිත්තං 64
19. මහා චුන්දත්ථෙර බොජ්ඣඞ්ග පරිත්තං 67
20. ගිරිමානන්ද සුත්තං 69
21. ඉසිගිලි සුත්තං 77

අතිරේකානි සත්ත සුත්තානි

1. ධම්මචක්කප්පවත්තන සුත්තං 82
2. මහාසමය සුත්තං 93
3. ආලවක සුත්තං 104
4. කසිභාරද්වාජ සුත්තං 107
5. පරාභව සුත්තං 111
6. අග්ගිකභාරද්වාජ සුත්තං (වසල සුත්තං වා) 115
7. සච්චවිභඞ්ග සුත්තං 121

තතියක භාණවාරං

1. ආටානාටිය සුත්තං (පඨමක භාණවාරං) 131

චතුත්ථක භාණවාරං

2. ආටානාටිය සුත්තං (දුතියක භාණවාරං) 145

පදගතාර්ථ සන්නය

පඨමක භාණවාරං - පළමුවන බණවර

1. සරණාගමනං - සරණාගමනය 159
2. දස සික්ඛාපදානි - දශ ශික්ෂාපද 159
3. සාමණෙරපඤ්හො - සාමණේර ප්‍රශ්නය 159
4. ද්වත්තිංසාකාරො - ද්වත්තිංසාකාරය 160
5. පච්චවෙක්ඛණා - පස් විකුම් 160
6. දසධම්ම සුත්තං - දස ධම්ම සූත්‍රය 161
7. මහා මංගල සුත්තං - මහා මංගල සූත්‍රය 162
8. රතන සුත්තං - රතන සූත්‍රය 163
9. කරණීයමෙත්ත සුත්තං - කරණීය-මෙත්ත සූත්‍රය 166
10. ඛන්ධ පරිත්තං - කඳ පිරිත 167
11. මෙත්තානිසංස සුත්තං - මෙත්තානිසංස සූත්‍රය 169
12. මිත්තානිසංස සුත්තං - මිත්තානිසංස සූත්‍රය 169
13. මොර පරිත්තං - මෝර පිරිත 171
14. චන්ද පරිත්තං - චන්ද පිරිත 171
15. සූරිය පරිත්තං - සූරිය පිරිත 172
16. ධජග්ග සුත්තං - ධජග්ග සූත්‍රය 173

දුතියක භාණවාරං - දෙවන බණවර

17. මහා කස්සපත්ථෙර බොජ්ඣඞ්ග පරිත්තං- මහා කස්සපත්ථෙර බොජ්ඣඞ්ග පිරිත 177
18. මහා මොග්ගල්ලාන ත්ථෙර බොජ්ඣංගං පරිත්තං - මහා මොග්ගල්ලානත්ථෙර බොජ්ඣංග පිරිත 179
19. මහා චුන්දත්ථෙර බොජ්ඣඞ්ග පරිත්තං - මහා චුන්දත්ථෙර බොජ්ඣඞ්ග පිරිත 181
20. ගිරිමානන්ද සුත්තං - ගිරිමානන්ද සූත්‍රය 182
21. ඉසිගිලි සුත්තං - ඉසිගිලි සූත්‍රය 187

අතිරේකානි සත්ත සුත්තානි
අතිරේක සප්ත සූත්‍රයෝ

1. ධම්මචක්කපවත්තන සුත්තං - දම්සක් පැවැතුම් සුතුර 191
2. මහාසමය සුත්තං - මහාසමය සූත්‍රය 197
3. ආලවක සුත්තං - ආලවක සූත්‍රය 205
4. කසීභාරද්වාජ සුත්තං - කසීභාරද්වාජ සූත්‍රය 208
5. පරාභව සුත්තං - පරාභව සූත්‍රය 211
6. අග්ගික භාරද්වාජ සුත්තං - අග්ගික භාරද්වාජ සූත්‍රය (වසල සුත්තං - වසල සූත්‍රය) 214
7. සච්චවිභඞ්ග සුත්තං - සච්චවිභඞ්ග සූත්‍රය 218

තතියක භාණවාරං - තුන්වන බණවරයි

1. ආටානාටිය සුත්තං - ආටානාටිය සූත්‍රය (පඨමක භාණවාරං - පළමුවන බණවර) 227

චතුත්ථක භාණවාරං - සතරවන බණවර

1. ආටානාටිය සුත්තං - ආටානාටිය සූත්‍රය (දුතියක භාණවාරං - දෙවන බණවර) 237

සිංහල අනුවාදය - පළමුවන බණවර

1. සරණා ගමනය 241
2. දස ශික්ෂාපද 241
3. සාමණේර ප්‍රශ්නය 242
4. දෙතිස් ආකාරය 243
5. ප්‍රත්‍යවේක්ෂා 243
6. දස ධම්ම සූත්‍රය 244
7. මහා මංගල සූත්‍රය 245
8. රතන සූත්‍රය 247
9. කරණීය මෙත්ත සූත්‍රය 250
10. ඛන්ධ පරිත්තය 252
11. මෙත්තානිසංස සූත්‍රය 254
12. මිත්තානිසංස පිරිත 256
13. මෝර පරිත්ත 257
14. චන්ද පරිත්ත 258
15. සූරිය පරිත්ත 258
16. ධජග්ග පරිත්ත 259

දෙවන බණවර

17. මහාකස්සපත්ථෙර බොජ්ඣඞ්ග පිරිත 263
18. මහාමොග්ගල්ලානත්ථෙර බොජ්ඣඞ්ග පිරිත 264
19. මහාචුන්දත්ථෙර බොජ්ඣඞ්ග පිරිත 265
20. ගිරිමානන්ද සූත්‍රය 265
21. ඉසිගිලි සූත්‍රය 269

අතිරේක සූත්‍ර හත ඇතුළත් බණවර

1. ධම්මචක්කප්පවත්තන සූත්‍රය 272


*Non-Commercial Distribution*

| | | පිටුව |
|---|---|---|
| 2. | මහාසමය සූත්‍රය | 274 |
| 3. | ආලවක සූත්‍රය | 279 |
| 4. | කසීභාරද්වාජ සූත්‍රය | 281 |
| 5. | පරාභව සූත්‍රය | 284 |
| 6. | අග්ගික භාරද්වාජ සූත්‍රය | 286 |
| 7. | සච්චවිභඞ්ග සූත්‍රය | 288 |
| | **තුන්වන බණවර** | |
| 1. | ආටානාටිය සූත්‍රය (i බණවර) | 293 |
| 1. | පිරිත් පේ කිරීම | 300 |
| 2. | ජයමංගල ගාථා | 300 |
| 3. | මහා ජයමඞ්ගල ගාථා | 302 |
| | උදේ පිරිත හමාර කිරීම | 304 |
| 4. | ජිනපඤ්ජරය | 304 |
| 5. | අටවිසි පිරිත | 306 |
| | දෙවියන්ට පිංදීම | 307 |
| | **උපග්‍රන්ථය I** | |
| 1. | ඇණවුම් පිරිත | 308 |
| 2. | අංගුලිමාල පිරිත | 309 |
| 3. | ජය පිරිත | 309 |
| 4. | ගිනි පිරිත | 310 |
| 5. | චූල ජිනපඤ්ජර පිරිත | 310 |
| 6. | වට්ටක පිරිත | 311 |
| 7. | වැසි පිරිත | 312 |
| 8. | මත්ස්‍ය රාජ පිරිත | 312 |
| 9. | බොජ්ඣඞ්ග පිරිත | 312 |
| 10. | චක්ක පිරිත | 313 |
| 11. | දස මාර පිරිත | 315 |
| 12. | ජ්වර පිරිත | 316 |
| 13. | ආටානාටිය පිරිත | 317 |
| 14. | නිධිකණ්ඩ සුත්තං | 319 |
| 15. | තිරොකුඩ්ඩ සුත්තං | 320 |
| | රන් දෙණේ ගාථා | 321 |
| | උදේ සවස භාවිතා කළයුතු ආරක්ෂා ගාථා | |
| | දුටුගැමුණු රජතුමන් නිතර භාවිතා කළ ආරක්ෂා ගාථා | 322 |
| | රත්නමාලා බන්ධන ගාථා | 323 |
| | නරසීහ ගාථා | 323 |
| | **උපග්‍රන්ථය II** | |
| | සතර කමටහන | 325 |
| | බුද්ධානුස්සති | 325 |
| | මෙත්තානුස්සති | 325 |
| | අසුභානුස්සති | 326 |
| | මරණානුස්සති | 326 |
| | අටධ මහා සංවේග වත්ථු | 327 |
| | මෙත්තා භාවනා ගාථා | 327 |
| | **උපග්‍රන්ථය III** | |
| | නවගුණ යන්ත්‍රය | 330 |
| | රතන යන්ත්‍රය | 330 |
| | සීවලී පිරිත | 332 |
| | සීවලී යන්ත්‍රය | 334 |
| | සීවලී දැහැණ | 334 |
| | අභිසම්භිදාන පිරිත (මන්ත්‍රය) අංක 1 | 336 |
| | අභිසම්භිදාන යන්ත්‍ර 1 | 337 |
| | අභිසම්භිදාන පිරිත (යන්ත්‍රය) අංක 2 | 338 |
| | අභිසම්භිදාන යන්ත්‍ර 2 | 339 |
| | ජලනන්දන පිරිත | 339 |
| | ජලනන්දන යන්ත්‍රය | 340 |
| | රත්නමාලි යන්ත්‍රය | 341 |
| | **පිරිත් ගාථාවලින් කළහැකි හාස්කම්** | |
| i. | මහාමංගල සූත්‍රයෙන් කළහැකි හාස්කම් | 342 |
| ii. | රතන සූත්‍රයෙන් කළහැකි හාස්කම් | 343 |
| iii. | කරණීය මෙත්ත සූත්‍රයෙන් කළහැකි හාස්කම් | 346 |
| vi. | කඳ පිරිතෙන් කළ හැකි හාස්කම් | 347 |
| v. | මෝර පිරිතේ හාස්කම් | 347 |
| vi. | ධජග්ග සූත්‍රයේ හාස්කම් | 348 |
| vii. | ඇණවුම් පිරිතේ හාස්කම් | 349 |
| viii. | ආටානාටිය සූත්‍රයෙන් කළහැකි හාස්කම් | 351 |
| ix. | අංගුලිමාල පිරිතේ හාස්කම් | 352 |
| x. | බොජ්ඣඞ්ග පිරිතේ හාස්කම් | 352 |
| xi. | රන්දෙණේ ගාථාවලින් කළහැකි හාස්කම් | 353 |
| | **උපග්‍රන්ථ IV** | |
| | ලිත කීම | 355 |
| | විහාර අස්න | 355 |
| | දේවාල තල්පත | 357 |
| | දොරකඩ අස්න | 358 |
| | අනුශාසනාව | 360 |
| | **බුද්ධ වර්ෂය කීම** | |
| | දෙවියන්ට පිංදීම | 364 |
| | පිරිත් සූත්‍රයන්හි ආරම්භක ගාථා | 365 |
| | **බණ පිරිත් කතිකාවත** | |
| | බණ පිරිත් කතිකාවත | 367 |
| | ආරාධක වත | 369 |
| | ආවාසික වත | 370 |
| | ආරාධනා ලත් මහා සංඝයාගේ වත | 370 |
| | උපස්ථායක වත | 371 |
| | කාරක සංඝ සභාවේ වත | 371 |
| | බණ පිරිත් කතිකාවතෙහි සඳහන් බණ පිරිත් විධි | 372 |
| | බණ පිරිත් විධිය | 373 |
| | පළාත්බද පිරිත් චාරිත්‍ර විධි - තිස්පැයේ පිරිත | 375 |
| | තුන්තිස්පැයේ හෙවත් තුන් වේලේ පිරිත | 376 |
| | පස්වේලේ (තිස් පැ පහේ) පිරිත | 376 |
| | හත්වේලේ (තිස් පැ හතේ) පිරිත | 376 |
| | අළුත්කුරු-සියනෑ ආදී කෝරළ බද පිරිත | 376 |
| | උඩරට, හතර කෝරළේ පිරිත් දේශනා- | 377 |
| | කිරීමේදී අනුගමනය කරනු ලබන චාරිත්‍ර විධි | 379 |


Non-Commercial Distribution

# ප්‍රස්තාවනා

ජාතක පොත් වහන්සේ සහ පිරුවානා පොත් වහන්සේ යන ධර්ම ග්‍රන්ථද්වය සිංහල බෞද්ධයන් ගේ අත්‍යන්ත ජනාදරයට පාත්‍ර වූ විශේෂ ග්‍රන්ථ දෙකකි. මේ පොත් දෙක ම සජීවත්වයෙන් සලකා 'වහන්සේ' යන ගෞරව නාමයෙන් ම ව්‍යවහාර කළාක් මෙන් ම විහාරස්ථානයකට නැතුව ම බැරි වස්තු දෙකකි. මෙයට ධාතු කරඬුවත් විධිමත් ව සකස් කරගත් පිරිත් හුයත් එක්කර ගත යුතු ය.

ජාතක පොත් වහන්සේ පහසුවෙන් එහා මෙහා ගෙන යා හැක්කක් නො වේ. පුස් කොළයේ ලියූ අලංකාර කැටයමින් හෙබි කම්බාවලින් යුත් ජාතක පොත එදා සිංහල බෞද්ධ ජනතාව ගේ ජීවිතය අලංකාර කළ ආදර්ශවත් උපමා කථාවන්ගෙන් යුත් නිරාමිෂ ප්‍රීතිය වර්ධනය කරමින් පන්සලේ වැඩ සිටියහ.

පිරිතෙහි ප්‍රධාන වශයෙන් අන්තර්ගත වූයේ සත්‍ය පාරමිතාව හා අධිෂ්ඨාන පාරමිතාව කුළුගැන් වූ දේශනා ය. ජාතක පොත දසපාරමිතාව ඇසුරු කළ මනහර සිද්ධීන් ගෙන් සැරසුන ග්‍රන්ථයකි. එහි ද විශේෂයෙන් තැනින් තැන සත්‍ය පාරමිතාව මතුකර දැක්වෙන ගාථා ද තිබේ.

වට්ටක ජාතකයෙහි එන

"සන්ති පක්ඛා අපතනා - සන්තිපාදා අවඤ්චනා
මාතා පිතා ච නික්ඛන්තා - ජාතවෙද පටික්කම"[1]

යන මේ ගාථාව ගිනි නිවීමේ මන්ත්‍රයක් මෙන් ද වැසි වැස්සවීමේ මන්ත්‍රයක් මෙන් ද අපේ සිංහලයෝ භාවිත කළහ. අභයගිරි දාගැබෙහි පසු කලක නිදන් කර තිබී සොයාගත් තඹ ලිපියක මේ ගාථාව ලියා තිබුණේ ය. එහි වූ තවත් විශේෂයක් නම් එය ලියා තිබුයේ නාගරාක්ෂරයෙන් වීම යි. එයින් පෙනී යන්නේ මහායාන ධර්මය මෙරට ව්‍යාප්තව ගියායින් පසුව මෙය ලියා ඇති බව යි. දැදිගම කොටවෙහෙරේ ද මේ ගාථාව ම මෙසේ ලියා නිදන් කරවා තිබී සොයා ගන්නා ලදී. මේ ගාථාවෙහි මෙන් එබඳු ශක්තියක් ඇති ආරක්ෂක ගාථා තව කොතෙකුත් ජාතක පොතෙන් සොයාගත හැකි ය. ජාතක පොතට ඇති ඉමහත් ගෞරවය නිසා පසු කලෙක පුස්කොළ පොත් ලියූ ඇතැම් ලේඛකයන් "මේ ථූපවංස ජාතක පොත් වහන්සේ", "බුත්සරණ ජාතක පොත් වහන්සේ" යයි ග්‍රන්ථයෙහි සඳහන් කර තිබෙනු අප විසින් දැක තිබේ. කෙසේ වෙතත් ජාතක පොතෙන් එදා සිංහල බෞද්ධයාගේ මානසික රෝග සමනය කිරීමෙහි ලා පිරිත් පොත මෙන් ම විශිෂ්ට සේවාවක් සිදුකර ඇත.

ජාතක පොත් වහන්සේටත් වඩා පිරුවානා පොත් වහන්සේට විශේෂ ගෞරවයක් බෞද්ධයන් විසින් දක්වන ලදී. එයට තවත් හේතුවක් නම් පිරුවානා පොත වැඩමවනු ලබන්නේ සධාතුක කරඬුවත් සමඟ වීමයි.

පිරුවානා පොත වැඩමවතොත් දාකරඬුවත් වැඩම විය යුතු ය. රත්නත්‍රය වැඩම කරවීමට නම් මේ උතුම් වස්තූන් දෙක සමග මහා සංඝරත්නය ද වැඩ සිටිය යුතු ය. ගිහි ගෙයක නම් එය විශේෂ මණ්ඩපයක් තුළ වඩා හිඳුවිය යුතු ය. නිශ්ශංකමල්ල රජතුමන් පොළොන්නරුවේ නිශ්ශංක ලතා මණ්ඩපය කරවූයේ පිරිත් ඇසීමට ය. එහි ක්‍රමවත් භාවයක් ද ඇත. පිරිත දෙසිය යුත්තේ ද පස්පව් ගැනවත් සැලකිල්ලක් නැති ගිහි කම්කටොළුවලින් යුත් ගිහියා විසින් නොවේ. මෙයින් අදහස් කරන්නේ ගිහියා

1. මේ පිරිතේ ඉතිරි ගාථා පහ මෙහි උපග්‍රන්ථයෙහි දැක් වේ.

Non-Commercial Distribution

**විසින්** පිරිත් නො දෙසිය යුතුය යන්න නොවේ. තම තමන්ගේ ආරක්ෂාව සඳහාත් පිරිත් කියා ගැනීම නුසුදුසු නො වේ. එසේ ම එයට සුදුසු පරිසරයක් ඇතිකර ගැනීමට කටයුතු කිරීමත් චරිත ශුද්ධියත් අවශ්‍ය ය. **"සද්ධාය තරතී ඔඝං"** ශ්‍රද්ධාවෙන් සියලු බාධා මග හරවා ගත හැකි ය. ආගමික සෑම ක්‍රියාවකට ම ශ්‍රද්ධාව මූලික වේ. විශේෂයෙන් ම පරිත්‍රාණ ධර්ම දේශනාවට මෙය අත්‍යවශ්‍ය ය. පිරිත් දේශනය මානසික ප්‍රතිකාරයකි. ප්‍රතිකාර කරන වෛද්‍යවරයා කෙරෙහි රෝගියා ගේ විශ්වාසය තැබීම රෝග සමනයට අතිශයින් ඉවහල් වන බව වෛද්‍ය ශාස්ත්‍රයෙහි ද ඉගැන්වෙන්නෙකි. පිරිතේ ගෞරවය රැකීම එහි ශක්තිය වර්ධනය කර ගැනීමට උපකාරී වේ. (ඒ පිළිබඳව මේ ග්‍රන්ථයේ පූර්විකාවේ දක්වා ඇත.) කෙලෙස් පිරුණු පුද්ගලයාට ධර්මයෙන් පිහිටක් නො ලද හැකි බව ධර්මයෙහි ම උගන්වා ඇත.

**පිරිත**

**පරිත්ත** යනු හාත්පසින් රැකවරණය ලබාදේය යන අර්ථයි. බුද්ධ දේශිත කවර ධර්මයක් වුව ද සාරක්ෂිත ය. **සීවලී මාතාවට** මහා කරුණාවෙන් **"සුවපත්වේවායි"** ආශිර්වාද කළ පමණකින් සතියක් ගර්භ මූඪව සිටි ඇය දුකින් මිදී සුවපත් වූවා ය. මෙවන් දහමක් අතරින් මංගලාශීර්වාද, ශුභාශීර්වාද හා රක්ෂණගෝපනාදිය පරමාර්ථ කොට බුද්ධ දේශිත විශේෂ ධර්ම සමූහය පෙර ඇදුරන් විසින් එකතුකර **පරිත්ත** නාමය යොදා **චතුභාණවාර පාළිය** නමින් ග්‍රන්ථයක් සකස් කරන ලදී. අපේ පිරිත් පොතට සතර බණවර ය යි නම් කළේ බෞද්ධ ශාස්ත්‍රීය පදනමක් යටතේ ය. එය මෙහි පෙන්වා දී තිබේ.

වේදයෙහි ප්‍රධාන වන්නේ ගායත්‍රී **ඡන්දස යි.** එයට අකුරු සයකි. පද සතරෙහි අකුරු සූවිස්සකි. බෞද්ධයන් ගේ ඡන්දස අකුරු අටෙන් යුත් අනුෂ්ටුප් ඡන්දස යි. එහි පාද සතරට අකුරු දෙතිසකි. මෙයට ග්‍රන්ථය යි ද කියත්. අපේ පිරිත් පොතේ ආරම්භක සරණාගමනයේ එක පදයකට බෞද්ධ ක්‍රමය අකුරු අටකි. එහි ඇත්තේ බුද්ධං සරණං ගච්ඡාමි, ධම්මං - සංඝං - යනාදී වශයෙන් බැලුවිට ගායත්‍රියට අයත් අකුරු සූවිස්සකි. අකුරු සූවිස්ස ආනුභාව සම්පන්න යෙදුමකැ යි වෛදිකයෝ කියති. කෙසේ හෝ ඒ ලක්ෂණ අපේ සරණාගමනයේ තිබේ. නමො බුද්ධාය යන්න ද මෙවැන්නකි. එය පඤ්චාක්ෂර ස්තොත්‍රයකි.

චතුභාණවාර පාළියේ තුන් සූත්‍රය ප්‍රධාන තැනක් ගනී. **සියම්,** බුරුම රටවල බහුල වශයෙන් ව්‍යවහාර වන්නේ මේ තුන් සූත්‍රය යි. එයිනුදු **කරණීය මෙත්ත සූත්‍රයට** විශේෂ ස්ථානයක් ඒ රටවල පමණක් නොව මේ රටේ ද හිමි වෙයි. මෙය පිරිතක් බව ද බුදුරජාණන් වහන්සේ විසින් ම වදාරා තිබේ. බුදුරජාණන් වහන්සේ ගෙන් කමටහන් ගෙන භාවනාව සඳහා භික්ෂු පිරිසක් වනගත වූහ. වනවාසී දෙවියෝ උන් වහන්සේලා ගේ ශීල තේජසින් සිය විමානයෙහි වසනු නො හැකිව ඒ භික්ෂූහු එතැනින් එලවා දමනු සඳහා විකාර වෙස් ගෙන බිය කළහ. බුදුරජාණන් වහන්සේ කරා පැමිණි ඒ භික්ෂූහු එපවත් බුදුරජාණන් වහන්සේට දැන්වූහ. උන්වහන්සේ ඔවුනට මේ මෙත් සුතුර වදාරා මෙසේ ද පැවසූහ.

**"ඉමං පරිත්තං උග්ගණ්හාථ, එතං මෙ පරිත්තඤ්ච කම්මට්ඨානං ච භවිස්සති"** මේ පිරිත ඉගෙන ගන්න. මෙය ඔබට පිරිතක් ද කම්ස්ථානයක් ද වන්නේ ය" කියා යි. මේ අනුව මේ ආරක්‍ෂක දේශනාවට "පරිත්ත" යන්න බුදුරදුන් විසින් ම නම් කරනු ලැබූවකි. මේ සූත්‍රය ඇසීමෙන් දෙවියෝ මහත්සේ අවනත වූහ. පිදූහ. සත්කාර කළහ.

ගාථාවක් පාසා ආශිර්වාද කළ ශ්‍රේෂ්ඨ සූත්‍රය **රතන සූත්‍රය** යි ඒ ගැන කවර කථාද? මංගල සූත්‍රය පිරිත් පොතට ඇතුලත් වූයේ මක්නිසාද ? යනු ඇතැමුන් නගන ප්‍රශ්නයකි. බුදුරජාණන් වහන්සේ ගේ ශ්‍රී මුඛයෙන් ගාථාවක් පාසා **"මංගලං"** යයි කියැවුන මංගලාර්ථ ප්‍රකාශක සූත්‍රයකි. **මංගල සූත්‍රය.** එය දෙසූයේ දෙවියකුට ය. දෙවියකුට දෙසූ එකම සූත්‍රය මෙය නොවූවත් මේ සූත්‍රය දෙසූ දිනට පසුදින බුදුරජාණන් වහන්සේ ආනන්ද ස්ථවිරයන් වහන්සේ අමතා මේ පුවත වදාරා මෙසේ ද පැවසූ සේක.

**"උග්ගණ්හාථ ආනන්ද, ඉමං මංගල පරිත්තං, උග්ගණ්හිත්වා වාචෙථ, භික්ඛූ'ති"** ආනන්ද, මේ මංගල ක්‍රම ඉගැන්වූ සූත්‍රය ඉගෙන ගන්න. ඉගෙන ගෙන මෙය භික්ෂූන්ට උගන්වන්න. පාඩම් කර ගැනීමට සලස්වන්නැයි කීහ. මෙය වාචෝද්ගත කළ යුතු මංගල පරියාය ධර්මයක් නිසා උභය ලෝකයට ම වැඩදායක ය. එබැවින් මෙය ආරක්ෂක මංගලාර්ථ සූචක සූත්‍රයකි. පිරිත් පොතෙහි එන සෑම සූත්‍රයකට ම මෙවැනි විග්‍රහයක් කළහැකි වුව ද ලිපියේ දීර්ඝත්වය සලකා මෙය තුන් සූත්‍රයට පමණක් සීමා කෙළෙමි.

**පිරුවානා පොත් වහන්සේ**

පිරුවානා හෙවත් පිරිවහනය යනු කටපාඩම් කිරීමයි. ලේඛනය කලාවක් ලෙස අභිවර්ධනයට පත්වීමට පෙර වාචෝද්ගතව ධර්ම ශාස්ත්‍රය පවත්වා ගෙන ආ බව ප්‍රකට ය. ඉතා මෑතක් වන තුරු කටපාඩම් කළ දේ පාඩම් කීමේ පරිචයක් පිරිවෙන් අධ්‍යාපනයේ පැවැත්තේ ය. උස් හඬින් කියන නිසා මෙය මධුරස්වරයට ද හේතු විය. පිරිත කටපාඩම් කළ යුතුය. එසේ ම එය මධුරස්වරයෙන් වෘත්තානුකූලව හඬ නඟා කීම ද එයට ම අයත් ය. බුදුරජාණන් වහන්සේ මධුරස්වරය අගයමින් ඒ පිළිබඳ තනතුරක් ද ඇතිකළ අයුරු එතදග්‍ර පාළියෙහි දැක්වේ.

පිරුවානා පොත සම්පූර්ණයෙන් පාඩම් නො කළ හැකි වූවන් පැවිදි නො කරන ලෙස පැරණි කතිකාවත්හි නියමයක් විය. අභිධර්ම විශාරදයකු වූ **පස්වන කසුප් රජතුමන් පිහිට වූ අභයගිරි සෙල්ලිපියෙහි** 'සතර බණවර පිනිසේ නො කළ වුන් පැවිදි නො කළ යුතු'ය යි නියෝග කර තිබුණේ ය. මේ නිසා ම **චතුභාණවාර පාළිය පිරුවානා** පොත යන නම ලැබීය. වෛදිකයන් ගේ මන්ත්‍ර සහ ධාරණී ස්මෘතියෙන් ම දැරිය යුතු ය යනු ඔවුන් ගේ පිළිගැනීම යි. එසේ නොවී නම් එයින් ලැබෙන ගුණය නිසිසේ නො ලැබේ ලු.

පිරිත වුව ද ධාරණයෙන් දෙසත හොත් අවධානය එයට ම යෙදෙන නිසා එය වඩා යහපත් විය යුතුය.

**රාහුල සංස්කරණය**

**පණ්ඩිත අත්තුඩාවේ ශ්‍රී රාහුල** අනුනායක ස්ථවිරයන් වහන්සේ ගේ පිරුවානා පොත් වහන්සේ බොහෝ කරුණු අතින් සම්පූර්ණ ය. බණවර සතරට ඇතුළත් නොවූ වර්තමානයේ බහුතරය විසින් පිළිගත් පිරිත් සූත්‍ර රාශියක් ඇත. එයින් වැඩි ගණනක් ම මෙහි අන්තර්ගතව තිබීම පාඨකයන් ගේ මහත් භාග්‍යයකි.

**මහාකාශ්‍යප** මහ රහතුන් ප්‍රමුඛ රහතුන් වහන්සේ ගේ **ප්‍රථම සංගායනාවේ** ඇතුළත් වූයේ ධර්මය හා විනය යන කොටස් දෙක යි. පිරිත් සූත්‍ර නමින් පෞරාණික ආචාර්යයන් වහන්සේලා විසින් සූත්‍ර සංඛ්‍යාවක් තෝරා ගන්නා ලද්දේ ඒ ධර්මයෙනි. එහෙත් ආරක්ෂක දේශනා වශයෙන් වෙන්කර ගත හැකි තවත් ගාථා රාශියක් ධර්මය තුළ පවතී. සියලු බුදුවරයන් ගේ ශ්‍රී මුඛයෙන් නිකුත් වී වදහළ **"සබ්බපාපස්ස අකරණං"** යනාදී බුද්ධානුශාසනය මහ බලැති ආරක්ෂක දේශනාවක් ලෙස බොහෝ දෙනා භාවිත කරන බව දනිමු. එය එසේම විය යුත්තකි.

ගද්‍යාත්මක ආටානාටිය වැනි සූත්‍ර ඉතා කෙටි පද්‍යයන්ට නැගූ පාරම්පරිකව භාවිත වන සූත්‍ර පඞ්ක්තියක් ද ඇත. එය එසේ කර ඇත්තේ වාචෝද්ගත කර ගැනීමේ පහසුවත් ඒවා නිතර භාවිත කළයුතු සූත්‍ර ලෙස සැලකූ නිසාත් ය. මේ සංස්කරණයේ ද **"බොජ්ඣඞ්ග සූත්‍ර"** වැනි එවැනි පද්‍යාත්මක සූත්‍ර කීපයක් ඇතුළත් ව ඇත.

Non-Commercial Distribution

අප භාවිතා කරන ජයමංගල ගාථාවන්ට ස්‍යාම දෙශීය භික්ෂූහු

"සුනක්ඛත්තං සුමංගලං"
"පදක්ඛිණං කාය කම්මං"
"සොඅත්‍ථ ලද්ධො සුඛිතො විරූළ්හො"

යනාදී ගාථා ද එක්කර නිතර භාවිත කරති. මහනුවර යුගයේ ලියැවුන පිරිත් සූත්‍ර අතර මේ ගාථා ද "ද්වාදස පරිත්ත" නමින් සඞ්ක්ෂිප්ත පිරිත් සූත්‍ර දොළසක් ද භාවිතාකොට අප රට ද පැවති බව දක්වා තිබේ. පිරිතෙහි දී ශ්‍රද්ධාව මූලික විය යුතු හෙයින් කවර බුද්ධ භාෂිතයක් වුවත් පිරිතක් කරගත හැකි ය. ආශිර්වාදාත්මක සූත්‍රයන්ට විශේෂ ස්ථානයක් ලැබේ.

මෙම සංස්කරණයෙහි උපග්‍රන්ථයෙහි iii කොටසෙහි දැක්වෙන පිරිත් ක්‍රම සම්පූර්ණයෙන් ස්ථවිර වාද නො වේ. යන්ත්‍ර මන්ත්‍ර විශ්වාසය බෞද්ධයන්ට පුහුණු වූයේ මහායානයේ බල පෑමෙනි. දිව්‍යාවදානයේ විත කපන මන්ත්‍රයක් බුද්ධ දේශනාව ලෙස දක්වා තිබේ.

ලලිත විස්තරයෙහි

බුදුරජාණන් වහන්සේ ත්‍රපුෂභල්ලුක වෙළෙඳ දෙබෑයනට ආශිර්වාද කළ හැටි යාගස්වරූපයෙන් ශ්ලොකවලින් විස්තර කර තිබේ. බෞද්ධයන් ගේ බෞද්ධ කමට හානි නොවන සේ පැරණියන් සකස් කළ මේ බෞද්ධ ශාන්ති ක්‍රමවලින් බෞද්ධයා මේ ස්ථවිරවාදී බෞද්ධ කේන්ද්‍රය තුළ ම රැඳී රත්නත්‍රය කෙරෙහි ශ්‍රද්ධාව හා ගෞරවය වැඩෙන පරිදි මේ හැම සූත්‍රයක් ම සකස් වී තිබීම නිසා මෙය බෞද්ධ ජනතාව ගේ අතට හැකිතාක් නිවැරදි ලෙසට දීමට කරන ලද මේ උත්සාහය අතිශයින් ම පැසසිය යුතුය. එය උභය ලොකාර්‍ථ සමෘද්ධිය පිණිස වන්නේ ය.

මෙයට,
ශාසනාලයැති,
**කඹුරුපිටියේ වනරතන**
ශ්‍රී රෝහණ පාර්ශවයේ මහා නායක ස්ථවිර.

සිරි රතනජොති පිරිවෙන
ඌරාපොළ - තිහගොඩ.

*Non-Commercial Distribution*

# පූර්විකාව

මානව සංහතිය සෑම කාර්‍යයක් ම සිදු කරනු ලබන්නේ ස්වකීය අභිලාශයන් මුදුන් පත් කර ගැනීමේ පරමාර්ථයෙනි. වේදනාවන් සමනය කර ගැනීමේ අභිප්‍රායෙනි. කෙබඳු නමකින් ඉදිරිපත් කළත් උත්තරීතර අර්ථකථනයක් ප්‍රකාශ කළත් සෑම ක්‍රියා පද්ධතියක මානව නිර්මාණයක පිටුපස ක්‍රියාත්මක වන බලවේගය අරමුණ හා හැඟීම යන දෙක අර්ථවත් කර ගැනීම යි.

මිනිස් සංහතියට ආගමක් අවශ්‍යවීමේ පසුබිම කුමක්දැයි විමසනවිට ප්‍රමුඛත්වය හිමි වන්නේ බියට ය. එදා මිනිසාට යථාර්ථවාදීව සිතන්නට හැකියාවක් නොතිබුණු නිසා සෑම සිදුවීමක ම හේතුව අදෘශ්‍යමාන ශක්තියක් ඇති දෙවිවරුන් ගේ බලපෑමයයි සිතුහ. දෙවියන් ගේ අනුකම්පාව ලබාගැනීමට දෙවියනට ස්තොත්‍ර ගැයූහ. එසේ දෙවියන්ගේ ප්‍රසාදය ලබා ගැනීම සිය සිතැඟි ඉටු කර ගැනීම් උපාය මාර්ගයයි ඔවුහු කල්පනා කළහ. ආදිම ඍග් ගීත ප්‍රභව වූයේ මේ ආකාරයට යි.

ගීත ගායනයෙන් නො සෑහුණු ඔව්හු අනතුරුව පුද පූජා පැවැත් වූහ. වෛදික ආගම ප්‍රභව වූයේ මේ ආකාරයෙනි. ස්වභාව ධර්මය දේවත්වයට ආරෝපණය කොට මුල දී දෙවිවරුන් කීප දෙනෙකු ගෙන් ඇරඹුණු දෙව ගණය පසුව සංවර්ධනය වී තිස් තුන් කෝටියක් බවට පත් වූහ. ආරම්භයේ දී ඉතා සරල අන්දමින් ඇරඹුණු යාගය පසුව අශ්වමේධ, පුරිසමේධ ආදී යාග සඳහා පශු පක්ෂීන් සිය දහස් ගණනකගේ ගෙල ලෝහිතයෙන් තෙත් කොට මහා ධනස්කන්ධයක් හා ශ්‍රමයක් වැය කොට කළයුතු මහා පරිමාණයේ යාගයක් බවට පත් විය. බුද්ධ කාලය වනවිට මෙය සමාජයට ඉසිලිය නොහැකි විනාශකාරී ව්‍යාපෘතියක් බවට පත් විය.

මහාචාර්‍ය ෆ්‍රේසර් නමැති විද්වතුයා අභිචාර විධි ආගමේ මූලාරම්භයයි කීයේ ය. යම් අපෙක්ෂාවක් ඉෂ්ට කර ගැනීමට අභිචාර විධි උපයෝගී කරගන්නා බැවින් එය විද්‍යාවක් වැනි වුව ද මිථ්‍යා අදහස් පදනම් කොට ඇති බැවින් මිථ්‍යා විද්‍යාවකැයි හේ කීයේ ය. මන්ත්‍ර ජප කිරීමෙන් අභිචාර විධි මාර්ගයෙන් තම අභිලාෂයන් ඉෂ්ට කරගත නොහැකි වූ විට මිනිසා යැදීමෙහි යෙදෙන බවත් එවිට ආගම බිහිවන බවත් හේ පැවසී ය.

අභිචාර විධි පිළිබඳව ඉතා වැදගත් අදහසක් මහාචාර්‍ය බ්‍රොනිස්ලාව් මැලිනොව්ස්කි ඉදිරිපත් කෙළේ ය. ස්වභාව ධර්මයා ගේ ක්‍රියාකාරිත්වය හා එය මිනිසා ගේ අවශ්‍යතාවන් උදෙසා උපයෝගී කොට ගැනීම පිළිබඳ විද්‍යාත්මක දැනීමට සමාන කළ හැකි යම්කිසි කාර්මික දැනීමක් ආදිම මිනිසා සතු වී යයි හෙතෙම සඳහන් කෙළේ ය. මේ අනුව අභිචාර විධි තමා දන්නා කාර්මික උපක්‍රමවලින් ඉටු නොවන කාර්‍යයන් ඉෂ්ඨ කර ගැනීමට මිනිසා යොදන ප්‍රයත්නයකැයි කීවේ ය.

අභිචාර විධි ප්‍රධාන වශයෙන් (i) **ඵලදායක** (ii) **ආරක්‍ෂා දායක** හා (iii) **විනාශ දායක** යැයි ප්‍රධාන කොටස් තුනකට බෙදයි. එයින් පළමුවන කොටස ආර්ථික කටයුතු හා ප්‍රේම බන්ධන සඵලත්වය සඳහා ද දෙවෙනි ගණයේ ඒවා ශාරීරික සුවය ආරක්‍ෂා කිරීම සඳහා ද තෙවෙනි ගණයේ ඒවා සතුරන් විනාශ කිරීම සඳහා ද යොදනු ලැබේ.

සමාජ විද්‍යාඥයින් මෙසේ කීවද බුදු සමය අනුව එය එසේම යයි පිළිගැනීම උගහට ය. බුදු දහම ඇති වී ශත වර්ෂ කීපයකට පසුවයි බුදු දහම පසුබිම කරගත් අභිචාර විධි ඇති වී තිබෙන්නේ. එය ශාසන ඉතිහාසය විමසීමෙන් පැහැදිලි වේ.

Non-Commercial Distribution

ඒ පිළිබඳ බෞද්ධ මතය මෙසේ ය :

| | | |
|---|---|---|
| බහුං වෙ සරණං යන්ති | - | පබ්බතානි වනානි ච |
| ආරාම රුක්ඛ චෙත්‍යානි | - | මනුස්සා භය තජ්ජිතා |
| නෙතං ඛො සරණං ඛෙමං | - | නෙතං සරණ මුත්තමං |
| නෙතං සරණ මාගම්ම | - | සබ්බ දුක්ඛා පමුච්චති |
| යො ච බුද්ධඤ්ච ධම්මඤ්ච | - | සංඝඤ්ච සරණං ගතො |
| චත්තාරි අරිය සච්චානි | - | සම්මප්පඤ්ඤාය පස්සති |
| දුක්ඛං දුක්ඛ සමුප්පාදං | - | දුක්ඛස්ස ච අතික්කමං |
| අරියංචට්ඨංගිකං මග්ගං | - | දුක්ඛූප සම ගාමිනං |
| එතං ඛො සරණං ඛෙමං | - | එතං සරණ මුත්තමං |
| එතං සරණ මාගම්ම | - | සබ්බ දුක්ඛා පමුච්චති[1] |

"බියෙන් තැතිගත් මිනිස්සු පර්වත ද වන ද ආරාම ද, වෘක්ෂ ද චෛත්‍යය ද බොහෝ සේ සරණයති. එහෙත් මේ කිසිත් නිරුපද්‍රැත පිහිටක් නොවේ. මේ කිසිත් උතුම් පිහිටක් ද නොවේ. මේ කිසිඳු කාරණයක් නිසා සියලු දුකින් මිදීම සිදු නොකෙරේ.

යමෙක් වනාහී බුදුන් ද දහම් ද සඟුන්ද සරණ ගියේ දුකත් දුක ඉපදීමේ හේතුවත් දුක දුරුකිරීමට හේතුව වූ නිවණත් දුක නිවීමේ මගත් යන සතර ආර්‍ය්‍ය සත්‍යයන් දක්නේ ද,

ඒ කාන්තයෙන් මේ නිරුපද්‍රැත පිහිට වේ. මෙය ක්‍ෂෙම වූ පිහිට වේ. තෙරුවන් සරණ යෑම හා චතුස්සත්‍යාව බොධය යන මේ සරණ යෑම නිසා හෙතෙම දුකින් මිදේ."

භීතියෙන් ත්‍රස්ත වූ මිනිසුන් පර්වත වන ආරාම ආදියට අධිගෘහිත දෙවියන් සරණ යතත් එය උතුම් සරණයෑමක් නොවන බවත් යමෙකු තෙරුවන් සරණ ගොස් සිවුසස් දහම අවබෝධ කිරීමෙන් දුකින් මිදිය හැකි බවත් බුදු දහමින් උගන්වයි. "**සුද්ධි අසුද්ධි පච්චත්තං නාඤ්ඤෝ අඤ්ඤං විසොධයෙ**" පිරිසිදු බව හෝ අපිරිසිදු බව තමා කෙරෙහි ම ය. අනෙකෙක් අනෙකකු පිරිසිදු නොකරයි. යන බුදු දහම අනුව කිසිදු බාහිර බලවේගයකට මිනිසා ගේ විමුක්තිය ඇති කළ නොහැකි ය.

ලෝකයේ සෑම ප්‍රබල ආගමක ම දාර්ශනික ආචාර විද්‍යාත්මක හා ශාන්ති කර්ම යන අංග තුනක් අන්තර්ගත වී තිබේ. ශාන්ති කර්මවලින් බලාපොරොත්තු වන්නේ ආරක්‍ෂාව හා ආශීර්වාදය යි. දිනපතා ජීවිතයේ දී මුහුණ පෑමට සිදුවන ගැටලු හා බාධකවලින් මිදී සුවය හා ශාන්තිය ළඟාකර ගැනීම ආගමින් බලාපොරොත්තු වේ. ආගම මිනිසා ගේ දෛනික අවශ්‍යතා සඳහා උපයෝගී නොවන්නේ නම් එය වැඩි කලක් චිරස්ථායි නොවේ.

අවුරුදු 2550 මුළුල්ලේ පවත්නා බුදු දහම ප්‍රායෝගික ආගමක් වූවාක් මෙන් ම ලක්‍ෂ සංඛ්‍යාත බුදුනු බැතිමතුන් ගේ කාලීන අවශ්‍යතාවන් සපුරාලූ විවිධ සම්ප්‍රදායන් ඔස්සේ ලෝකයේ ඒ ඒ රටවල බෞද්ධ ශාන්ති කර්ම සංඛ්‍යාත පිරිත් සජ්ඣායනය ව්‍යාප්ත වී පවතී.

බිහිසුණු වසංගත රෝග, දරුණු නියඟ, සාගත, වැස්ස, ජල ගැලීම් බිය දනවන වියවුල් පරිසරයට හානිකර විවිධ බලවේග හා සතුරු උවදුරු දුරුකර ගැනීමටත් සෞඛ්‍ය සම්පත සෞභාග්‍යය හා සාමය ළඟාකර ගැනීමටත් අනිවාර්‍ය්‍යයෙන් ම උපයෝගීවන ශාන්ති කර්මයක් ලෙස පිරිත පිළිබඳව බෞද්ධයාගේ අවධානය යොමු වී තිබේ.

පරිපූර්ව ත්‍රා ධාතුවෙන් නිපන් සංස්කෘත පරිත්‍රාණ, පාලි පරිත්ත යන පද දෙකින් සිංහලට බිඳී එන පිරිත් යන්නෙන් ආරක්‍ෂාව යන අරුත යෙදෙයි. අටුවා චාරීහු එයට මෙසේ අරුත් පවසති.

1. ධම්මපද 14-6

Non-Commercial Distribution

1. 'මහා තෙජවන්තතාය සමන්තතො සත්තානං භයං උපද්දවං උපසග්ගං චතායති රක්ඛතීති පරිත්තං.'
2. 'පරිසමන්තතො තායති රක්ඛතීති පරිත්තං'
3. 'අන්තරායං පරිහරන්තං තායතීති පරිත්තං'
4. 'පරිතොවා සබ්බූපද්දවතො තායතීති පරිත්තං'

තෙදවත් බැවින් සත්වයනට පැමිණෙන උවදුරු දුරුකරන හෙයින් ද සව් ප්‍රකාරයෙන් ආරක්‍ෂාව සලසන හෙයින් ද පැමිණෙන අනතුරු වලක්වා ලන හෙයින් ද ආරක්‍ෂා කරන බැවින් ද, පිරිත නම් වේ. බෞද්ධයා ගේ ආරක්‍ෂණ ක්‍රමයත්, ශාන්තිකර්මයත් පිරිතයි.

මහා පිරිත් පොත, පිරිත් පොත, පිරුවානා පොත් වහන්සේ යන නම් වලින් හැඳින්වෙන පොත අතීතයේ හඳුන්වන ලද්දේ චතුභාණවාර පාලිය යන නමිනි. එහි එන දේශනා උපුටා ගෙන තිබෙන්නේ මේ පොත් වලිනි.

## පළමු වන බණවර

| | | |
|---|---|---|
| සරණගමනය | ඛුද්දක නිකාය | ඛුද්දක පාඨ |
| දස සික්ඛාපද | " " | " " |
| සාමණෙර පඤ්හ | " " | " " |
| ද්වත්තිංසාකාරය | " " | " " |
| පච්ච වෙක්ඛණ | අංගුත්තර නිකාය | " " |
| දස ධම්ම සූත්‍රය | " " | " " |
| මහා මංගලසූත්‍රය | ඛුද්දක නිකාය | ඛුද්දක පාඨ |
| රතන සූත්‍රය | " " | " " |
| කරණීය මෙත්ත සූත්‍රය | " " | " " |
| ඛන්ධ පරිත්ත | අංගුත්තර නිකාය | චතුක්ක නිපාතය ඒකාදසක නිපාතය |
| මෙත්තානිසංස සූත්‍රය | " " | ජාතක පාලි නිපාතය |
| මිත්තානිසංස සූත්‍රය | ඛුද්දක නිකාය | ජාතක පාලි මහානිපාතය |
| මොර පරිත්ත | ඛුද්දක නිකාය | දුක නිපාතය |
| චන්ද පරිත්ත | සංයුත්ත නිකාය | දෙවපුත්ත සංයුත්තය |
| සූරිය පරිත්ත | " " | " |
| ධජග්ග පරිත්ත | " " | බොජ්ඣඞ්ග සංයුත්තය |

## දෙවන බණවර

| | | |
|---|---|---|
| මහා කස්සපත්ථෙර බොජ්ඣංගය | සංයුත්ත නිකාය | බොජ්ඣඞ්ග සංයුත්තය |
| මහා මොග්ගල්ලානත්ථෙර බොජ්ඣංගය | " " | " |
| මහා චුන්දත්ථෙර බොජ්ඣංගය | " " | " |
| ගිරිමානන්ද සූත්‍රය | අංගුත්තර නිකාය | දසක නිපාතය |
| ඉසිගිලි සූත්‍රය | මජ්ඣිම නිකාය | උපරිපණ්ණාසකය |

## අතිරේක බණවර

| | | |
|---|---|---|
| ධම්ම චක්කප්පවත්තන සූත්‍රය | සංයුත්ත නිකාය | ධ්‍යාන සංයුත්තය |
| මහා සමය සූත්‍රය | දීඝ නිකාය | මහාවග්ග |
| ආලවක සූත්‍රය | ඛුද්දක නිකාය | සුත්ත නිපාතය |
| කසීභාරද්වාජ සූත්‍රය | " " | " |
| පරාභව සූත්‍රය | " " | " |
| වසල සූත්‍රය | " " | " |
| සච්ච විභඞ්ග සූත්‍රය | මජ්ඣිම නිකාය | උපරි පණ්ණාසකය |

Non-Commercial Distribution

## තෙවන බණවර

ආටානාටිය සූත්‍රය | දීඝ නිකාය | පාටික වර්ගය

## සිවුවන බණවර

ආටානාටිය සූත්‍රය | දීඝ නිකාය | පාටික වර්ගය

චතුභාණවාර පාළියේ බණවර සතරකි.

අට්ඨක්ඛරා එක පදං - ගාථා එකං චතුප්පදං
ගාථා චෙ කමතො ගන්ථො - ගන්ථො බත්තිංසකක්ඛරා

බත්තිංසක්ඛර ගාථානං - පඤ්ඤාසං ද්විසතං පන
භාණවාරො මතො එකො - අට්ඨක්ඛර සහස්සකො

"අකුරු අටක් පදයකි. පද සතරක් ගාථාවකි. ගාථාවකට ග්‍රන්ථයකැයි කියති. එවිට ගාථාවකට අකුරු දෙතිසෙකි.

දෙතිස් අකුරකින් යුක්ත ග්‍රන්ථ දෙසිය පනසක් එක් බණ වරකි. බණවරකට අකුරු අට දහසකි. එවිට සතර බණවරෙහි අකුරු තිස් දෙදහසකි."

චතුභාණවාර පාළිය සසුන් වන් කුල දරුවනට වන පොත් කිරීම සඳහා පිළියෙල වූ අත් පොතක් බව සතර බණවර අටුවාවේත් සෙල්ලිපි වලත් සඳහන් වේ. පරමත්ථ ජෝතිකාවේ එය මෙසේ සඳහන් වේ.

**"සාසනා වචරාතං කුලපුත්තාන මජ්ඣාපනත්ථම්ති උපහසික**
**විබුධාචරියා ආචරියවරා කාලෙන කාලං සුත්ත සංගානාදි**
**වසෙනාපි ධම්ම සංගහෙ අකංසු, තෙසුබ පඤ්චහි නිකායෙහි**
**උඩමො එකො ධම්ම සංගහො ආසි සො පරිමාණතො චතුභාණ**
**වාරත්තා චතුභාණවාරොති ච පරිත්තානං සෙව භීයො සංගහිතත්තා**
**පරිත්ත පොත්ථකංතිච පසිද්ධ මාගතත්තා විජ්ජති. වාචුග්ගත**
**වසෙන පරියාපුණිතබ්බත්තා වස්ස පිරුවානා පොත ඉති වොහරන්ති සීහළා."**

"සසුන් වන් කුල දරුවන්ට ඉගැන්වීම සඳහායැයි ශ්‍රේෂ්ඨ ආචාර්‍යවරු සූත්‍ර සංග්‍රහ ආදී වශයෙන් වරින්වර ධර්ම සංග්‍රහ කළහ. ඒවා අතර නිකාය පසෙන් උපුටා ගන්නා ලද එක් ධර්ම සංග්‍රහයක් විය. එය ප්‍රමාණයෙන් බණවර සතරක් බැවින්, චතුභාණවාරයයි ද පිරිත් සඳහා වැඩිදුරටත් සංග්‍රහ කරන ලද බැවින් පිරිත් පොත යැයි ද ප්‍රසිද්ධියට පත් වී ඇත. පාඩම් කිරීම් වශයෙන් පුරුදු කළ යුතු බැවින් සිංහලයේ මෙය පිරුවානා පොතයයි ව්‍යවහාර කරති."

පරිත්‍රාණයෙන් මූර්තිමත් වන තේමා දෙකකි. එකක් සත්‍යය යි. අනික් කාරණය මෛත්‍රිය යි. සත්‍ය ක්‍රියාවට හොඳම නිදසුන අංගුලිමාල හිමියන් ගේ සත්‍ය ක්‍රියාවයි. සතියක් මුළුල්ලේ මූඪ ගර්භ දැඩි වේදනාවෙන් පෙළෙන එක් කාන්තාවක් දුටු අංගුලිමාල මහ රහතන් වහන්සේ දැඩිසේ සංවේගයට පැමිණ එය බුදු රජාණන් වහන්සේට දැන්වූ හ. බුදුරජාණන් වහන්සේ ඇයට සහනය ලබාදීමට සත්‍ය ක්‍රියා කරන්නැයි අංගුලිමාල හිමියනට පැවසූ හ.

**"යතොහං භගිනි අරියාය ජාතියා ජාතො නාභිජානාමි සංචිච්ච පාණං ජීවිතා වොරොපෙතා තෙන සච්චෙන සොත්ථි තෙ හොතු සොත්ථි ගබ්භස්සාති"**

Non-Commercial Distribution

"ආයඞ් ජාතියෙහි උපත ලැබූ පසු (රහත් වීමෙන් පසු) හිතාමතා ප්‍රාණියකු ගේ ජීවිතය නොනැසූ වෙමි. ඒ සත්‍යය හේතු කොට ගෙන ඔබ සුවපත් වේවා. දරු ගැබ ද සුවපත් වේවා. මේ සත්‍ය ක්‍රියාවෙන් දරුවා ද සුවසේ බිහි වූ බව සඳහන් වේ.

මෙත් වැඩීමට හොඳම නිදසුන කඳ පිරිතයි.

සැවැත් නුවර එක්තරා භික්ෂුනමක් සර්පයකු විසින් දෂ්ඨ කරනු ලදුව මිය ගියේ ය. භික්ෂූන් වහන්සේ එම පුවත බුදු රජාණන් වහන්සේට දැන්වූ සේක. එසේ නම් ඒ භික්ෂුව සතර සර්පකුලයන්ට මෙත් වඩා නැතැයි බුදු රජාණන් වහන්සේ පැවසූ සේක. මෙත් වැඩුයේ නම් සර්පයෝ දෂ්ඨ නොකරති. **විරූපක්ඛ, එරාපථ ඡබ්‍යාපුත්ත කණ්හා ගොතමක** යන සර්පකුල හතරේ සර්පයිනට මෙත් වඩන්නැයි තොපට මම නියම කරමි යි. තවදුරටත් පැවසූහ. සියලු සර්පයිනටත් අපා දෙපා සිවුපා බහුපා ඇති සතුන්ටත් මෛත්‍රී වඩන්න. බුදුගුණ අනන්තයි. දහම් ගුණය අපමණයි සඟගුණ අසීමිතයි. කිසිදු සතකුගෙන් හෝ පීඩාවක් නොවීමට ආරක්ෂාව සඳහා පිරිත් කරගතිමි. ඒ බුදුරාජාණන් වහන්සේ සත් බුදුවරයින්ටත් නමස්කාර කරමි යි එහි සඳහන් වේ.

පරිත්‍රාණ දේශනාව තරම් බෞද්ධයාගේ සිත් ගත් වෙනත් ආගමික පූජා චාරිත්‍ර විධියක් නැති තරම් ය. එය පෞද්ගලික ජීවිතයට මෙන් ම සමාජ ජීවිතයට ද අතිශයින් සම්බන්ධ ය.

## පිරිත් දේශනාවේ ආරම්භය

ධම්මපදට්ඨ කථාවේ දීඝායු කුමාරයා ගේ කථාවේ පිරිත් මණ්ඩපයක් තනා එහි සිට භික්ෂූන් වහන්සේ නො කඩවා පිරිත් දෙසූ බව සඳහන් වී තිබේ. ක්‍රි.ව. දෙවන සියවසේ මිළිඳු රජු නාගසේන හිමියන් අමතා හිමියනි, බුදුන් වහන්සේ මෙසේ වදරා තිබේ.

යම් තැනෙක සිටියා වූ සත්වතෙම මරණින් මිදෙන්නේ නම් එබඳු භූමි ප්‍රදේශයක් ලෝකයේ කිසිම තැනෙක නැත.

ආකාශයෙහි වත්, සමුද්‍රයෙහි වත්, පර්වත විවරයකට ප්‍රවිෂ්ටවීවත් ගැලවී යෑමක් නොමැත.

"හිමියනි, එසේ නම් භාග්‍යවතුන් වහන්සේ විසින් නිර්දේශිත රතන, ධජග්ග, ඛන්ධ, මොර, ආටානාටිය අංගුලිමාල ආදී පිරිත් ඵල සහිත වන්නේ කෙසේදැ'යි විචාළේය.

කෙනෙකුගේ ජීවිත කාලය අවසන් වූ විට එය දීඝීකරගත හැකි කිසිදු ක්‍රමයක් නොමැත. කර්මාවරණ, කෙලශාවරණ, හා අසද්දහනතා යන කරුණු වලින් යුක්ත වූවෙකුට පිරිතෙන් පලක් නොලැබේ.

විශාලා මහනුවරට පැමිණි ත්‍රිවිධ භය දුරුකර ලනු පිණිස ලිච්ඡවී රජදරුවෝ බුදුරජාණන් වහන්සේ පන්සීයක් භික්ෂූන් වහන්සේ සමග පෙරහරින් තම නුවරට වැඩමවා ගත්හ. විශාලා මහනුවරට තුන් ගව්වකින් ඔබ ගංගාතීරයේ පළමු පියවර තබත් ම මහා මේඝයක් නැගී පොකුරු වැසි වැස්සේ ය. මහා ජල ප්‍රවාහයෙන් මළ මිනී කුණු පාවී ගියේ ය. භූමිය පවිත්‍ර වූයේ ය. ගංගා තීරයේ සිට විශාලාව දක්වා වැඩම කළ තථාගතයන් වහන්සේ ආනන්ද හිමියන් ඇමතූසේක. ආනන්ද, මේ රතන සූත්‍රය ඉගෙන ගෙන පිරිත් පැන් රැගෙන ලිච්ඡවි කුමාරවරුන් සමග විශාලා මහ නුවර තුන් ප්‍රාකාරයන් වටා හැසිරෙමින් රතන සූත්‍රයෙන් පිරිත් කරවයි වදාළහ.

ආනන්ද හිමියෝ රතන සූත්‍රයෙන් පිරිත් බෙණෙමින් බුදුරජාණන් වහන්සේගේ පාත්‍රයෙන් පැන් ගෙන සියලු නුවර ඉසිමින් හැසිරුනාහ. පිරිත පටන්ගත් ඇසිල්ලේම අමනුෂ්‍යයෝ සිවු දෙරටුවෙන් පැන ගියෝ ය. මිනිසුන් ගේ රෝග බිය සංසිඳුනේ ය.

මහා ජනයා නුවර මැද සන්ථාගාර ශාලාව සියලු සුවඳින් ආලේප කොට උඩු වියන් බැඳ සියලු අලංකාරයෙන් සරසා බුඩාසනයක් පනවා බුදුන් වහන්සේ එහි වඩා හිඳවූහ. එහි දී උන්වහන්සේ මෙම

Non-Commercial Distribution

රතන සූත්‍රය දෙසූ සේක. බුදුන් වහන්සේ දෙසන ලද සූත්‍ර අතරින් සත් වරක් දෙසූ සූත්‍රයත් මේ රතන සූත්‍රය පමණකි. රතන සූත්‍රයේ ගාථා දහතකි. එයින් ගාථා දොළසකම බුදු මුවින් 'එතෙන සච්චෙන සුවත්ථි හොතු'යි සඳහන් වේ.

රතන සූත්‍රයේ නිදානය දැක්වෙන්නේ පෙළෙහි නොව අටුවාවෙහිය.

## පිරිත් මණ්ඩපය

වරු පිරිත්වල දී හැර තිස් පැයේ සිට හත් දවස දක්වා පවත්වන පිරිත් දේශනාවල දී පිරිත් මණ්ඩපයක් සාදනු ලැබේ. පිරිත් මණ්ඩපය අටපට්ටම වීම සාමාන්‍ය සිරිත යි. එය සාදන ස්ථානයේ හැටියට සතරැස් ආකාරයට හෝ වෙනත් ආකාරයට තැනීමට කැමැති වෙති. සමහර විහාරස්ථානවල ලීයෙන් සෑදූ ස්ථිර මණ්ඩප ද තිබේ. තාවකාලික මණ්ඩප උඩු වියන් බැඳ, නූල් ඇද නාගවල්ලි බූලත් කැනති හා මල් එල්ලා අලංකාර කරති. ධාතු කරඬුව පිරිත් පොත සංඝයා පිරිත් පැන් එකට සම්බන්ධ වන සේ පිරිත් හුය ඇදිය යුතුය. මණ්ඩපයේ තබන්නේ එක ම දෙරටුවකි. එය නැගෙනහිර හෝ දකුණ බලා සිටින සේ තබනු ලැබේ. කිසි තැනෙක බටහිරට මුහුණලා දෙරටුව නො තබති. ඉන්ද්‍ර ඛීලය සහිත යුගාසනය පිළියෙළ කරන්නේ පිරිත් මණ්ඩපයේ ප්‍රධාන දෙරටුවට මුහුණලා සිටින අයුරකිනි. ප්‍රධාන පුටු දෙකට තරමක් පිටුපස තිබෙන අයුරින් ඉන්ද්‍ර ඛීලය පිළියෙළ කරති.

මාතර පළාතේ තිස්පැයේ පිරිතට ඉන්ද්‍රඛීලය නොතනන නමුත් අගනුවර හා වෙනත් පෙදෙස්වල එය තනති. අගනුවර නම් මේ සඳහා ගන්නේ අතු සහිත පුවක් පැලයකි. වෙනත් පෙදෙස් වල නම් සූරිය හෝ ඉඹුල් කොපිලකි. ධාතු කරඬුව තැන්පත් කිරීමට වෙනම අසුනක් පනවන අතර, පිරිත් පොත් වහන්සේ මේසය මත තබනු ලැබේ. මහා සංඝයා වහන්සේට වැඩ හිඳීමට ඇතිරිලි එලා පුටු තබති.

පිරිත් මණ්ඩපයේ චාරිත්‍රමය අංගොපාංගවල සංකේතාත්මක අගය "අපේ සංස්කෘතික උරුමය නම් කෘතියේ මහාචාර්ය ලිලී ද සිල්වා මහත්මිය මෙසේ සඳහන් කරයි.

> "පිරිත් මණ්ඩපයේ වැදගත්ම අංගය ඉන්ද්‍රඛීලය යි. කපගහ, රාජගහ යන නම් ද එයට ව්‍යවහාර වේ. සම්ප්‍රදායානුකූලව ඉන්ද්‍රඛීලය සාදන විට අඩි 6 ක් පමණ දිගැති කෙලින් පිහිටි අමු සූරිය ලීයක් අවශ්‍ය ය. එය මහ රැළිපාලම් දෙක තුනක් සිටින සේ ඝනකම ඇති රෙදි කඩක් බැඳි මුදුනේ වටාපතක් මෙන් සිටින සේ සරසනු ලැබේ. යුග පුටු දෙක එකට බැඳ ඒ අතරින් මෙසේ සැරසූ සූරිය ලීය බඳිනු ලැබේ. ඒ පසුපස පොල් මලක් බඳින ලද පුවක් පැලයක් සිටුවනු ලැබේ. මේ චාරිත්‍රමය අංගයට ඉන්ද්‍රඛීලය යි කියනු ලැබේ. කපගහ, රාජගහ යන නම්ද මෙයට ම ව්‍යවහාර වේ.
>
> රාජගහ යන්නෙහි තේරුම රාජ වෘක්ෂය යනුයි. බොධි ද්‍රමය බොධි වෘක්ෂ රාජයා යන ගෞරවාදරයෙන් හැඳින් වෙන නිසා රාජගහ යන්නෙන් අදහස් කරන්නේ එය වත් දැයි අනුමාන කළ හැකිය. පිරිත් මණ්ඩපයේ භූමි සැලැස්ම වෛදික යාග ශාලාවක භූමි සැලැස්ම හා සසඳා බලන විට පිරිත් මණ්ඩපයේ ඉන්ද්‍රඛීලය පිහිටුවන ස්ථානයේ හා යාග ශාලාවේ යූපය පිහිටුවන ස්ථානයේ පැහැදිලිව පෙනෙන සමානත්වයක් ඇත. මේ නයින් බලන විට වෛදික යූපය බෞද්ධ ස්තූපයේ ඉන්ද්‍රඛීලය නමින් පරිනාමයට පත් වී ඇත.

අපට බැසගත හැකි නිගමනය නම් ස්තූපයේ වේවා. පිරිත් මණ්ඩපයේ වේවා ඉන්ද්‍රඛීලය මගින් පූජා චාරිත්‍රානුකූලව බොධිමණ්ඩපය නිරූපනය කර තිබෙන බවයි.

ඉන්ද්‍රඛීලයෙන් මෙසේ සංකේතවත් වන බොධි මණ්ඩපය තුළ රත්නත්‍රය සන්නිපාත වේ. බුද්ධ රත්නය ධාතු කරඬුව මගින් ද ධර්ම රත්නය පිරුවානා පොත් වහන්සේ මගින් ද සංඝ රත්නය පිරිත්

Non-Commercial Distribution

දෙසන භික්ෂූන් වහන්සේ මගින් ද නිරූපණය වේ. මෙසේ පිරිත් මණ්ඩපය මගින් කරනු ලබන්නේ මුළුලොව තුළ ඇති උත්තම ස්ථානය වන බෝධි මණ්ඩපය පූජා චාරිත්‍රානුකූලව ඉදිකොට ඒ තුළට ශ්‍රේෂ්ඨ රත්නත්‍රය වැඩම වීම යි.

පිරිත් මණ්ඩපය සඳහා යොදා ගන්නා අනික් ද්‍රව්‍ය ගැන මහාචාර්ය ලිලී ද සිල්වා මහත්මිය මෙසේ සඳහන් කරයි.

"පිරිත් දේශනය සඳහා භාවිතා කෙරෙන අනික් පූජා චාරිත්‍ර ක්‍රමය උපකරන පුළුල් වශයෙන් වර්ග දෙකකට බෙදිය හැකිය. අතුරු උපද්‍රවයන් දුරීභූත කෙරෙන උපකරන එක් වර්ගයකි. සෞභාග්‍යය ළඟා කරන උපකරන අනික් වර්ගයයි. ළද පස්මල් වලට ගන්නා හෙල අබ සහ ඊතණ පළමුවන ගණයට වැටේ. පුවක් මල් ද එම ගණයට අයත්ය. පුවක් මල් කිලි කුණු ඉවත් කරන සශ්‍රීකත්වය ලඟාකරන පූජා චාරිත්‍රමය භාණ්ඩයකි. පොල් මල, පුන් කළස, සමන් කැකුළු සෞභාග්‍යය ලඟා කරන උපකරන වලින් ප්‍රධාන ඒවාය.

"පුරාණයේ සිට ම භාරතීය බ්‍රාහමණික පූජා චාරිත්‍ර විධිවලට වතුර ඉතා වැදගත් තැනක් ඉසිලූ බවට සාක්ෂි තිබේ. එය අනුකරණය කරමින් පිරිතේ අත්‍යවශ්‍ය අංගයක් ලෙස වතුර පාවිච්චි කිරීම ආරම්භ කරන්නට ඇත. පිරිත් පැන් අමනුෂ්‍ය උපද්‍රව දුරීභූත කරන බවත් ඖෂධීය බලයකින් යුක්ත බවත් පිළිගැනේ. පිරිත් නූලේ බලයද එබඳුම පිළිගැනීමකි."

පිරිත් මණ්ඩපයේ උඩු වියනෙහි එල්ලන නාදලු බුලත් කැනති ආදිය අලංකාරය පිණිස නොවන බව දැක්වෙන එම ලිපියේ මෙසේ ද පැවසෙයි.

"මේ කොලවර්ග කාලයෙන් වැසී ගිය පැරණි නාග වන්දනය පිළිබඳ පූජා චාරිත්‍ර සමග නෑ සබඳ කමක් දක්වනවා විය හැකි ය. ලක්දිවට බුදු රදුන් වැඩම කළ අවස්ථාවේදී යක්ෂයන් දමනය කර දිවයිනෙන් පිටමං කළ නමුත් නාගයන් එසේ බැහැර නොකළ සේක. නාගයෝ බුදු රදුන් සරණ ගොස් තමන් ගේ මැණික් ආසනය බුදු රදුන්ට පූජා කිරීමෙන් බුධ ආධිපත්‍යය පිළිගත් බව තව දුරටත් තහවුරු කළහ. කාලයාගේ ඇවෑමෙන් බෞඬ කලාව මගින් නාගයෝ බෞඬ සිඬස්ථානවල ආරක්ෂක දෙරටුපාලයන් බවට පත් වූහ. මෙසේ නාග ඇදහිල්ල බෞඬ සංස්කෘතිය තුළට ක්‍රමයෙන් උකහා ගත් අයුරු පැහැදිලිව පෙනේ. පිරිත් මණ්ඩපයෙහි ද නාග පල්ලව (නා දළු) නාගවල්ලී (බුලත්) නාගලතා (බුලත් වර්ගයක්) ආදිය එල්ලීමෙන් නාගයන් සපයන ආරක්ෂාව බලාපොරොත්තු වන බව නිගමනය කළ හැකිය."

## හමාර දේශනාව

පිරිත් පොතේ ආටානාටිය සූත්‍රයට විශෙෂ ස්ථානයක් හිමිවෙයි. මේ සූත්‍රය දශ ලක්ෂ සීයක් තරම් වූ ලොක පද්ධතීන් කෙරෙහි බලපෑමක් කළ හැකි බැව් දැක්වේ. විපස්සී බුදුන් ගේ පටන් බුදුවරුන් සත් නමක් වෙත නමස්කාර කෙරෙන අතර වෙනත් දෙවි දේවතාවන් ගේ නම් ද මෙහි ඇතුළත් වේ.

භික්ෂු භික්ෂුණී උපාසක උපාසිකා යන සිවු වණක් පිරිසට අමනුෂ්‍යාදීන් ගෙන් පැමිණෙන උවදුරු වලක්වා ගැනීම සඳහා සිවුවරම් දෙවියන් වෙනුවෙන් වෛශ්‍රවණයා විසින් බුදුරදුන්ට පැවසුවේ යයි කියන ආටානාටිය සූත්‍රය ඇසීමට වඩාත් ප්‍රිය කරන්නේ යකුන් එලවීමේ බලයක් මේ සූත්‍රයේ අන්තර්ගත වී ඇත යන විශ්වාසය නිසයි. භික්ෂූන් වහන්සේ ඒ දේශනා කළේ භය සම්ප්‍රයුක්ත ගෞරවයකින් යුක්තවය.

යක්ෂාවෙශ වූ රෝගියකු සුව කිරීමේ දී පිරිත සජ්ඣායනා කළයුතු අන්දම සුමංගල විලාසිනියෙහි විස්තර වශයෙන් දක්වා තිබේ. එහි සඳහන් වන ආකාරයට මෙත්ත රතන සහ ධජග්ග සූත්‍ර සත් දවසක් සජ්ඣායනා කළ යුතුය. එසේ කිරීමෙන් පසුව අමනුෂ්‍යයා මිනිසා අත්හැර නොගියොත් ආටානාටිය සූත්‍රය දේශනා කළ යුතුය.

Non-Commercial Distribution

එහෙත් මුලින් සඳහන් කළ සූත්‍ර නොකියවා ආටානාටිය සූත්‍රය සජ්ඣායනා කරනු සුදුසු නොවේ. පිරිත සජ්ඣායනා කරන භික්ෂූන් හට මෙම කාලය තුළ මස් හෝ පිටියෙන් කළ අහරක් හෝ වැළඳීම නොසුදුසු ය.

සුසාන භූමියක නො විසිය යුතු ය. විහාරයේ සිට ගිහියා ගේ නිවස දක්වා පළිහවලින් මැනවින් කළ ආරක්ෂා සහිතව යා යුතු වේ. පිරිත සජ්ඣායනා කළ යුත්තේ ගෙයක් තුළ ය. එහි දොර කවුළු සියල්ල වසා තැබිය යුතු අතර ආයුධ ගත් අත් ඇති මිනිසුන් භික්ෂූන් වටේ සිට ආරක්ෂා කළ යුතුය. භික්ෂූන් මෛත්‍රී සහගත සිතුවිලි සිතෙහි තබාගෙන පිරිත් සජ්ඣායනාව ඇරඹිය යුතු වේ. එවිට ද අමනුෂ්‍යයන් නොගියහොත් රෝගියා චෛත්‍ය මලුවකට ගෙන ගොස් එහිදී මංගල ගාථා සජ්ඣායනා කළ යුතු ය. සියල්ලම අසාර්ථක වුවහොත් දෙවියන් අයැද දෙවියනි, මෙසේ දනිව්, ඒ අමනුෂ්‍යයා අප කීවක් නොකරයි. දැන් අපි බුදුන්ගේ ආඥාව කරන්නෙමුයි කිව යුතු ය.

අමනුෂ්‍යයකු භික්ෂු නමකට ආවේශ වුවහොත් බුදුනට සුවඳ දුම් මල් පහන් පුද පැමිණි පිරිසට එම පින අනුමෝදන් කොට උපද්‍රෑත භික්ෂුවගේ යහපත පිණිස සෙසු භික්ෂූන් විසින් පිරිත් සජ්ඣායනා කළයුතු වේ. සිල්වත් භික්ෂු නමකට හිරිහැර නො කරන ලෙස ද අමනුෂ්‍යයාට කිව යුතු ය.

ආටානාටිය සූත්‍රය වනාහී අමනුෂ්‍ය උවදුරු වලක්වාලන පිරිතකි. අප බුදුහු රජගහ නුවර ගිජ්ඣකූට පර්වතයේ වැඩ වෙසෙන කළ වෛශ්‍රවණ ධෘතරාෂ්ට්‍ර, විරූඪ, විරූපාක්ෂ යන සතර වරම් දෙව් රජහු බුදු රදුන් කරා එළඹ වැඳ එකත් පසෙක හුන්හ. වෛශ්‍රවණ තෙම නිදුකාණන් වහන්ස, යක්ෂයෝ බොහෝ සෙයින් බුදුන් වහන්සේට අප්‍රසන්නය හ.

බුද්ධ ධර්මයේ අප්‍රසන්න වූ ඒ යක්ෂයන් ගේ ප්‍රසාදය පිණිස ද සිවුවණක් පිරිසගේ ආරක්ෂාදිය පිණිස ද මේ ආටානාටිය පිරිත පිළිගනු මැනවැයි ආරාධනා කොට විපස්සිස්ස නමත්‍ථු යනාදී පිරිත කීයේ ය. අවසන හේ මෙසේ ද පැවසීය.

නිදුකාණන් වහන්ස, භික්ෂු භික්ෂුණී ආදී යමෙක් මෙය ඉගෙන පුහුණු කෙළේ නම් යම්කිසි අමනුෂ්‍යයෙක් ප්‍රදුෂ්‍ය සිත් ඇතිව යන සිටින හිඳින සැතපෙන භික්ෂුවකට හෝ භික්ෂුණියකට ළංව යෑම් ආදියක් කෙළේ නම් ඒ අමනුෂ්‍යයා ගම් නියම් ගම්හි සත්කාර ආදියක් හෝ ආලකමන්දවේ විසීමට හෝ යක්ෂ සමාගමට යෑමට හෝ නොලබයි. ඔහුට මනුෂ්‍යයෝ නින්ද කරන්නා හ. වධ ද කරන්නා හ. ස්වාමීන් වහන්ස, සතර වරම් මහ රජුන්ට පසමිතුරු වූ චණ්ඩ වූ රෞද්‍ර වූ අමනුෂ්‍යයෝ ඇත්තා හ. ඒ යම්කිසි අමනුෂ්‍යයෙක් ප්‍රදූෂිත වූ සිත් ඇතිව සිවු වණක් පිරිසෙහි අනුව යෑම් ඊම් සිටීම් වැද හෙවීම් කෙළේ නම් මේ යක්ෂ සේනාපතීන්ට "අයං යක්ඛො ගණ්හාති" යනාදීන් හඬ ගා කිව යුතුයි. මුරගා කිව යුතුයි.

එකල්හි මහ යක් සෙනෙවි ආදීහු යක්ෂාණත්තිය කරම්හයි උත්සාහවත් වෙති. නිදුකාණන් වහන්ස, මේ ආටානාටිය පිරිත සිවු වණක් පිරිස ගේ ආරක්ෂාව පිණිස යෙහෙන් විසීම පිණිස පවත්නේ යයි දන්වා සිවුවරම් මහ රජ දරුවෝ සපිරිවරින් අතුරුදන්ව ගියහ.

මෙසේ ආටානාටිය පිරිත අමනුෂ්‍ය උවදුරු දුරු කරනු සඳහා පළමුව වෛශ්‍රවණාදීන් විසින් කියන ලදුව පසුව බුදු රදුන් විසින් අනුමත කොට වදාරණ ලද පිරිතකි.

අමනුෂ්‍ය උවදුරු දුරුකරනු සඳහා දේශනා කරන හමාර දේශනාව අනික් පිරිත් දේශනා කරන ක්‍රමයට වඩා වෙනස් ආකාරයෙන් හෝ ග්‍රාමක්ෂෙත්‍රයේ සියලු සංඝයා රැස් කොට දෙසිය යුතු යි. තරංග වෘත්තයෙන් දේශනා කළයුතු යයි අට්ඨකථාවේ සඳහන් වේ. "අයං යක්ඛො ගණ්හාති, ආවිසති, හිංසති, විහිංසති, හෙඨෙති, විහෙඨෙති, යන මේ වචන උස් හඬින් කිව යුතු ය. හඬ ගා කිව යුතු ය. මුරගා කිවයුතු ය.

Non-Commercial Distribution

## සූත්‍ර

සතර බණවර නමින් හැඳින් වෙන පිරිත් පොතෙහි සූත්‍ර නමින් හැඳින්වෙන දේශනා පසළොසකින් ද පරිත්ත දේශනා පහකින් ද බොජ්ඣඞ්ග දේශනා තුනකින් ද මෙත්තානි සංස දේශනාවකින් ද සරණ ගමනා දී පාඨ කීපයකින් ද සමන්විත ය.

සුත්ත යනු අරුත් රැසක් නගන වචනයකි.

**අත්ථානං සූචනතො**
**සුවුත්තතො සවනතො ච සූදනතො**
**සුත්තාණං සුත්ත සභාගතො ච**
**සුත්තං සුත්තනති අක්ඛාතං**

ආත්මාර්ථ පරාර්ථාදී අර්ථය හෙවත් දියුණුව ප්‍රකාශ කරන හෙයින් ද, විනේය ජනයා ගේ මනසට අනුකූලව මනාකොට දේශනා කළ හෙයින් ද, අර්ථය ප්‍රසවය හෙවත් බිහි කරන හෙයින් ද, දියුණුව වගුරුවන හෙයින් ද, යම් සේ අමුණන ලද මල් නො විසිරේ ද, නොනැසේද එසේ ම අරුත් නොවිසිරෙන සේ පාලනය කරන හෙයින් ද, යන මේ පස් අරුතෙන් සූත්‍රයයි කියනු ලැබේ.

සූත්‍ර යනු දීඝ වාක්‍ය කෙටි කිරීමෙන් සකස් කර ගන්නා ලද පාඨ බව ගෘහ්‍ය සූත්‍ර ධර්ම සූත්‍ර යනාදියෙන් ධ්වනිතවන බව වියතුන් ගේ මතය යි.

පාළියෙහි **සුත්ත** යන්නට සමාන අරුත් නගන ශබ්දය වෛදික **සූක්ත** යන්නයි. සම්පූර්ණ ඍෂි වාක්‍යය **සූක්ත** නම්. දෙවියකුට හෝ දෙවියනට ඔප්පු කරන ලද ගීතිකා කීපයක එකතුව **සූක්තයයි** කියනු ලැබේ. පිතෘ ගුරු පරම්පරාවෙන් පරම්පරාවට අඛණ්ඩව පවත්වා ගෙන එන ලද බැවින්, **සූක්ත** ශ්‍රැති නාමයෙන් ද ව්‍යවහාර වෙයි. එම **සූක්ත ඍෂි සූක්ත දෙවතා සූත්‍ර, ඡන්දස් සූක්ත** යයි තෙවැදෑරුම් වෙයි.

## බොජ්ඣඞ්ග

චතුභාණවාර පාළියේ දෙවන බණවර පටන් ගන්නේ **මහාකස්සපත්ථෙර** බොජ්ඣඞ්ගයෙනි. ඊළඟට **මහා මොග්ගල්ලානත්ථෙර** බොජ්ඣඞ්ගයත් අනතුරුව **මහා චුන්දත්ථෙර** බොජ්ඣඞ්ගයත් දැක්වෙයි.

බලවත් ලෙස රෝගාතුර වූ මහසුප් තෙරුන් වෙත හා මහ මුගලන් තෙරුන් වෙත වැඩම වූ බුදුන් වහන්සේ උන්වහන්සේලා ගේ රෝගී තත්ත්වය කුළුණුපිරි හදවතින් යුක්තව විමසා **බොජ්ඣඞ්ග** සූත්‍ර දෙක දෙසූ සේක. මහා කස්සපත්ථෙර, මහා මොග්ගල්ලානත්ථෙර බොජ්ඣඞ්ග දෙකට අනතුරුව මහා චුන්දත්ථෙර බොජ්ඣඞ්ගය දැක්වෙයි.

මහා කස්සප මුගලන් දෙනම හා බුදුරදුන් රොගාතුර වූයේ විෂවෘක්ෂයක පිපුණුමල් පිස එන දූෂිත වාතය ආඝ්‍රාණය කිරීමෙනි. බෞද්ධ සාහිත්‍යයේ කිහිප තැනෙකම පරිසරයේ පවිත්‍රතාවයේ වැදගත් කම දැක්වෙයි බුදුරජාණන් වහන්සේ හැම විටෙකම තමන් පරිභොග කරන භාණ්ඩ වාසය කරන ආරාමය හා අවට පවිත්‍රව ක්‍රමානුකූලව තබාගත යුතුයයි අවවාද කළහ.

බෝධ්‍යඞ්ග ධර්ම යන් ගෙන් මනුෂ්‍යයා ගේ කායික මානසික රෝග ව්‍යපසමනයට ඉවහල් වන අන්දම දැක්වෙයි. මනුෂ්‍යයාගේ සෑම ක්‍රියාවකට ම සිත ප්‍රධාන බව බෞද්ධ ඉගැන්වීම යි. "**මනො පුබ්බඞ්ගමා ධම්මා**" යන බුදු වදනින් බටහිර විද්‍යාඥමතය ද බුදු දහම හා ඉඳුරාම ගැලපෙයි. මනුෂ්‍යයාගේ ඇතැම් කායික රෝගවලට හා ස්නායු රෝග වලට හේතුව සිතේ වෙනස්වීම බව ඔප්පු කර තිබේ. මනුෂ්‍යයාගේ මනස දුර්වල කරන හේතු කාරකයන් **බොධ්‍යඞ්ග** ධර්ම මගින් යටපත් කළ හැකිවේ.

Non-Commercial Distribution

සති, ධම්ම විචය, විරිය, පීති, පස්සද්ධි, සමාධි හා උපෙක්ඛා යනු සත්ත බොධ්‍යාඞ්ග ධර්ම යි. පෘථග්ජන සන්තානයේ හට ගන්නා ප්‍රධාන මානසික දුර්වලතා දෙකකි. එනම් උදාසීන හා නොසන්සුන් බවයි. උදාසීන කම නැමැති මානසික රෝගය දුරුකළ හැකි වන්නේ ප්‍රඥාව වීර්‍යය හා ප්‍රීතිය යන බොධ්‍යඞ්ග ධර්ම භාවිතයෙනි. පස්සද්ධි, සමාධි, උපෙක්ඛා යන බොධ්‍යඞ්ග ධර්ම වැඩීමෙන් සිතේ නොසන්සුන් කම ව්‍යපසමනය වෙයි.

බොධි නම් සිවුසස් නුවණයි, "බොධි වුච්චති චතුමග්ගෙසු ඤාණං" සෝවාන් - සෙදගැමි - අනගැමි හා අරහත් යන සිවුමග නුවණයි. එය උපදවා ගැනීමට හේතුවන කාරණය නම් බොධ්‍යඞ්ග ධර්ම වැඩීමයි. සප්ත බොධ්‍යඞ්ග ඖෂධය කෙලශ රෝග ව්‍යපසමනයට ප්‍රබල ඖෂධයකි.

"යෙ කෙචි ඔසධා ලොකෙ
විජ්ජන්ති විවිධා පුථු
ධම්මොසධ සම නත්ථි
එතං පිබථ භික්ඛවො"

පරිත්‍රාණ ධර්මය නමැති ප්‍රත්‍යක්ෂ ඖෂධය කායික මානසික හා කෙලශ යන ත්‍රිවිධ රෝගයට ම පර්‍යාවන ප්‍රතිකාරයකි.

පිරිත් මණ්ඩපයේ යුග පුටු දෙක සම්බන්ධ කොට එය මැදින් පසුපස අඩි 6 ක් උස සූරිය කොපිලක් බඳිනු ලැබේ. පුටුවේ සීමාවට ඉහලින් සන සුදු රෙදි කඩක් ගෙන රැලි කීපයක් සාදා මුදුනේ වටාපතක් සේ රවුමක් ද සාදනු ලැබේ. එය විචිත්‍ර නිර්මාණයකි. එය පසුපස පොල්මලක් බැඳි පුවක් පැලයක් ද සිටුවනු ලැබේ. සූරිය ගසෙන් බුද්ධත්වය ලැබීමට පිටදුන් අසවත්ථ වෘක්ෂය ද පුවක් පැලයෙන් කල්ප වෘක්ෂයද සංකෙතවත් වෙයි. සූරිය ගහ ගෙමිදුලෙහි වවා ගතයුතු විෂ බීජ නාශක වෘක්ෂයකි. ඉඳු කීලය සඳහා ගන්නා සූරිය කොපිල සිටුවා වවා ගැනීමෙන් විශේෂ ප්‍රයෝජන ලැබෙතැයි විශ්වාස කෙරෙති.

පිරිත් මණ්ඩපය උඩු වියන් බැඳ පියවිලි අතුරා වටතිර ඇද විසිතුරු කැටයමින් රමණීය චිත්‍රයෙන් කලාත්මක ලෙසින් සරසති. ඉක්මනින් නොමැලවෙන මංගල සම්මත විෂබීජ නාශක නාගවල්ලි, නාගලතා, නාදලු, පුවක් මල් ආදී මල් පල්ලවයෙන් අලංකාර කිරීම රත්නත්‍රයට කරන උපහාර පූජාවක් ලෙස සලකති. මණ්ඩපයේ අට කොන පුන් කළස් අටක් තබති. අබ, සුන් සහල්, විළඳ, සමන් පිච්ච කැකුළු හා ඊතණ විසුරුවති. මල් පහන් හඳුන්කූරු, සුවඳ කුඩු, සඳුන් කිරිපැන් පිළියෙළ කොට මණ්ඩපයේ තබති. මෙහි ඇතැම් අංග හින්දුන් ගේ සාන්ති කර්ම අනුව සකස් වී තිබෙන බව මුලින්ද සඳහන් වී ඇත.

## ආසන පැනවීම

මණ්ඩපයේ දොරටුව නැගෙනහිරට නම් එයට දකුණෙන් ද ප්‍රධාන දොරටුව උතුරෙන් නම් එයට ඊසානයෙන් ද ධාතු කරඬුව තැන්පත් කොට තබන ධාතු ආසනය තිබිය යුතු ය. ඊළඟට ථෙරාසනය පැනවිය යුතුය. යුගාසනය ප්‍රධාන දොරටුවට මුහුණ ලා තැබිය යුතු අතර, ගණ සජ්ඣායනාවට අවට අසුන් පැනවිය යුතුය. ආසන සංඛ්‍යාව 'අට්ඨවා සොළසවා' යි අටුවාවේ සඳහන් වෙතත් එයට අඩු වැඩි වීම ගැන සැලකිලිමත් නොවේ.

බුදු රජාණන් වහන්සේ වෙනුවට සධාතුක කරඬුවත් සුවාසූ දහසක් ධර්මස්කන්ධය වෙනුවට පිරුවානා පොත් වහන්සේත් සංඝ රත්නය වෙනුවට පිරිතට ප්‍රමාණවත් සම්මුති සංඝයා වහන්සේත් වැඩම වීමෙන් ඒ ස්ථානය තුනුරුවන් පවතින පූජනීය ස්ථානයක් බවට පත්වෙයි.

Non-Commercial Distribution

සමහර පළාත්වල පමණක් තිස් පැයේ පිරිතටත් තුන් තිස් පැයේ පිරිතේ සිට හත් දවසේ පිරිත දක්වා සෑම පිරිත්වල දී ම පිරිතට ආරාධනා කිරීම සඳහා දායකයන් ලවා මහා සංඝයා වහන්සේ විසින් ගාථා තුනක් කියවනු ලැබේ.

මෙහි සතර බණවර පෙල පදගතාර්ථ, හා භාවය ඇතුළත් වේ. එසේම සතර බණවරට අමතර වශයෙන් උපග්‍රන්ථ සතරක් අන්තර්ගතය.

## පිරිත පේ කිරීම

ත්‍රිවිධ රත්නය පිරිත් මණ්ඩපයට වැඩම වූ පසු ධාතු කරඬුව හා පිරුවානා පොත් වහන්සේ නියමිත තැන්වල තැන්පත් කොට මහා සංඝයා වහන්සේ ආසනවල වඩා හිඳුවා පහන් දල්වා මල් පිදීමෙන් පසුව දැහැත් වට්ටියක් පිළිගන්වා දායකයා පිරිතට ආරාධනා කරයි. අනතුරුව දක්ෂ හිමි නමක් පිරිස පන්සිල්හි පිහිටුවා අවස්ථාවොචිතව පිරිත් අවවාදයක් කරයි. එයට අනතුරුව මඟුල් බෙර වාදනය කෙරෙයි. ඉක්බිති දෙවාරාධනයෙන් පසුව ගණ සජ්ඣායනාව කෙරෙති. එයයි පිරිත පේ කිරීම. එයට අඩංගු වන දහම් කොටස් භාරතීය ධර්ම ශාස්ත්‍ර හා සිංහල සිරිත් නම් ග්‍රන්ථයේ 298 පිටුවේ මෙසේ දැක්වේ.

පිරිත් පේ කිරීම නමින් දෙසීම ආරම්භ කරන්නේ විශේෂ ක්‍රමයක් අනුවය. මේ ඒ ක්‍රමය පහසුවෙන් මතක තබා ගැනීමට පැරණි සම්ප්‍රදායක් අනුව භාවිතා කරන පද්‍යයකි මෙය.

**"අවිජ්ජා අනෙකාඉතිපාථාදී පාථා - බාහුං ච බො භවතු නක්ඛත්ත යක්ඛ**
**කරණීය යං කිඤ්චි යංදුන්නිමිත්තං - සබ්බෙ ච බුද්ධා ඉති සබ්බ බුද්ධා"**

"**අවිජ්ජා** අවිජ්ජා පච්චයා යනාදී පටිච්ච සමුප්පාදය, **අනෙකා,** අනෙක ජාති සංසාර යනාදි ගාථා ය. **ඉතිපාථාදිපාථා,** ඉතිපිසො යනාදි පාඨ තුන ය. **බාහුංච බො,** බාහුං සහස්ස යනාදි ජයමංගලය, **භවතු** භවතු සබ්බ මංගලං යනාදි ගාථා තුන ය. **නක්ඛත්තයක්ඛ,** නක්ඛත්ත යක්ඛ භූතානං යන ගාථාය. **කරණීය,** කරණීය මෙත්ත සූත්‍රය, **යංකිඤ්චි,** යංකිඤ්චි විත්තං යනාදි රතන සූත්‍රය, **යංදුන්නිමිත්තං,** යංදුන්නිමිත්තං යන ගාථා තුන ය, **සබ්බෙච බුද්ධා,** සබ්බෙ බුද්ධා බලප්පත්තා යනාදි ගාථාය. **ඉති සබ්බ බුද්ධා,** මෙසේ සියළු බුදුරදුන් ම දෙසිතය යනු එහි අනුපිළිවෙළයි."

පිරිත් පිරීමට අට නමක් හෝ සොළොස් නමකි. යුග දෙශනය සරණාගමනය හා සූත්‍ර දේශනාව සඳහා දෙනම බැගිනි. හමාර දෙශනාවට එක පොතකට දෙන ම බැගින් පොත් දෙකට සිවු නමකි. අළුයම මහ පිරිත හා සෙත් පිරිත් දෙසා පන්සිල් දී පින් අනුමෝදන් කරවා පිරිත් පැන් දී පිරිත් නූල් බෙදා දීමෙන් තිස් පැයේ පිරිත අවසන් වේ.

තුන්තිස් පැයේ හා තිස් පැ පහේ පිරිත් දෙශනාවේ දී පිරිත පේ කිරීමෙන් පසුව පහත සඳහන් ගාථා තුන දායකයකු ලවා කියවීමෙන් ආරාධනා කරවිය යුතු ය.

## පිරිත කෙසේ දේශනා කළ යුතුද ?

මහණෙනි, ආයත ගීත ස්වරයෙන් ධර්මය නොදෙසිය යුතු යි.

**"ආයත ගීත සසරො නාම තං තං වත්තං භින්දිත්වා අක්ඛරෙහි**
**විනාසං කත්වා පවත්තෙතා"** යි දක්වන ලදී. ආයත ගීතස්වරය නම් ඒ ඒ වෘත්ත බිඳ අකුරු විනාශ කොට පවත්නා ස්වර විශේෂයකි.

**"අනුජානාමි භික්ඛවෙ සරභඤ්ඤං"**

Non-Commercial Distribution

මහණෙනි සරභඤ්ඤ නම් මධුර මනෝහර විලාශයෙන් කර්ණරසායන ගීත ස්වරයෙන් තොරව ධර්මය දෙසීම අනුදනිමි.

**"සරභඤ්ඤන්ති පන වචනතො සරෙන ධම්මං භණිතුං වට්ටති. තරංග වුත්තං දොධක වුත්තං ගණක වුත්තාදීනි අවත්තිංස වුත්තානි අත්ථි, තෙසු යං ඉච්ඡති තං කාතුං වට්ටති."**

"මහණෙනි, සරභඤ්ඤය අනුදනිමියි වදාළ හෙයින් සරභඤ්ඤයෙන් ධර්මය කියන්නට වටී සරභඤ්ඤයෙහි වනාහි තරංග වෘත්තය, දොධක වෘත්තය. ගණක වෘත්තය ආදී වශයෙන් යයි වෘත්ත දෙතිසක් වෙයි. එයින් යමක් යමක් කරන්නට කැමැති නම් එය වටී යනු එහි අදහසයි."

**"ධම්මෙහි සුත්තන්ත වත්තං නාම අත්ථි, ජාතක වත්තං නාම අත්ථි ගාථා වත්තං නාම අත්ථි"**

"ධර්මයෙහි වනාහි සුත්තන්ත්ත නම් වෘත්තයක් ඇත. ජාතක නම් වෘත්තයක් ඇත. ගාථා නම් වෘත්තයක් ඇතැයි දක්වා තිබේ. එබැවින් සරභඤ්ඤයට ඇතුළත් වෘත්තානුකූලව සූත්‍රාන්ත වෘත්ත, ගාථාවෘත්ත ඇතිව පිරිත දෙසිය යුතුය."

බුදු රජාණන් වහන්සේ ගේ ස්වරය මධුරය අෂ්ටාඞ්ග සමුපෙතය. **විස්සට්ඨය, මඤ්ජුය, විඤ්ඤෙය්‍යය, සවණීය ය විසාරණීය ය බින්දුය. ගම්භීරය**, නින්නාදය යන අංග අටෙන් යුක්තය. (1) විස්සට්ඨ පහසුවෙන් ශබ්දය මුවින් පිටවීම. (2) මංජු, මිහිරි බව. (3) විඤ්ඤෙය්‍ය, අදහස වහා අවබෝධ කරවන බව. (4) සවණීය, කණට සැප එලවන බව. (5) අවිසාරිතා, පැහැදිලි ගොවිසුරුණු බව. (6) බිංදු අතර බිඳුම් රහිත බව. (7) ගම්භීරතා, ගැඹුරු බව. (8) නින්නාදිතා, ඈත ඇසෙන බව. ශාසනික ධර්ම දේශනාවේදී අනුගමනය කරන ක්‍රම තුනක් වේ. එනම් ඔසරණ, කථන හා සරභඤ්ඤ යන වශයෙනි, ඔසරන නම් සූත්‍රය ප්‍රකාශ කිරීමයි. සූත්‍රයේ අර්ථ ප්‍රකාශ කිරීම කථන නම්, සරභඤ්ඤ නම් උදාත්ත ස්වර යොදා කරන සජ්ඣායන යයි සරභඤ්ඤ නම් තවත් අරුතක් වෙයි. එනම් උස් හඬින් කීමයි.

**"රුණ්ණමිදං භික්ඛවෙ අරියස්ස විනයෙගීතං"**

"මහණෙනි සසුනෙහි ගායනය අඬාවැටීමෙකැයි බුදුන් වහන්සේ වදාළ සේක. චුල්ල වග්ගපාළියේ ඛුද්දක වත්ථු ඛන්ධකයේ මෙසේ දැක්වෙයි."

"මහණෙනි දික් වූ හඬින් දහම් දෙසන්නහුගේ (**ආයත කෙන ගීත සස්සරෙන ධම්මං ගායන්තස්ස"**) ආදීනව පසෙකි.

1. තමා ද ඒ හඬෙහි ඇලෙයි
2. අන්‍යයෝද ඒ හඬෙහි ඇලෙති
3. ගැහැවියෝ ද ලාමක කොට සිතති.
4. හඬ නැංවීම පතන මහණනුගේ සමාධිය බිඳීයයි
5. පශ්චිම ජනතාව දෘෂ්ටානු ගතියට පැමිණෙයි

එබැවින් දික් වූ හඬින් දහම් නොගැයිය යුතු ය.

අඞ්ගුත්තර නිකායේ දුක නිපාතයේ දෙපිරිස පිළිබඳ කරුණු දැක්වීමේ දී විමසා හික්මුණු පිරිස ගැන කියවෙන කාරණා අතිශයින් මෙහිලා උපයෝගී වෙයි.

"මහණෙනි, විමසා හික්මුණු විනීත පිරිස කවරේද ? මහණෙනි, මේ සසුනෙහි යම් පිරිසක භික්ෂූහු කවීන් කරන ලද කවීන්ට හිත විසිතුරු අක්ෂර ඇති විසිතුරු ව්‍යඤ්ජන ඇති සසුනෙන් බැහැරි සව්වන් විසින් කියන ලද යම්ම සූත්‍රාන්ත කෙනෙක් වෙත්නම් ඒ සූත්‍රාන්තයෙන්ම ඇසීමට කන්

යොමු නොකෙරෙති. දැන ගැනීමට සිත් නොඑළවති. ඒ ධර්ම උගතයුතු කොට පුහුණු කළ යුතු කොට නොගනිති.

බුදුන් වහන්සේ විසින් දෙසන ලද ගැඹුරු ගැඹුරු අරුත් ඇති ලොකෝත්තර සූත්‍රාන්ත ප්‍රතිසංයුක්ත වූ යම් ධර්මයක් වේනම් එය දෙසනු ඇසීමට කැමැති වෙති. එයට කන් යොමු කරති. දැන ගැනීමට රිසි වෙති. ඉගෙනීමට පුහුණු කිරීමට කැමැති වෙති. ඒ දහම් පුහුණු කොට උනුනුන් පිළිවිසිති. අරුත් කෙසේ දැයි විමසති. මේ විනීත පිරිසයි. භික්ෂූන් වහන්සේ යොමු විය යුත්තේ ලොවුතුරු දහම් පසක් කරනු සඳහා බව මෙයින් පසක් වෙයි.

මේ කරුණුවලින් පැහැදිලි වන්නේ ගීත ගායනා කරන ආකාරයෙන් රාග නිශ්‍රිත රාවයෙන් තොරව හස්ත විකාර මුඛ විකාර ආදියෙන් පරිබාහිරව අශ්‍රාමණික අගොචර තාලවලින් ඈත්ව අසන්නන්ගේ ශ්‍රද්ධාව වැඩෙන ආකාරයෙන් පරිත්‍රාණ ධර්ම දේශනාව පැවැත්වීම දෙලොවට ම වැඩ දායක බව ය.

භාරතීය පඬිවරයකු වූ මහාචාර්ය එස්. එන්. රතන් ජන්කර් මහතා මේ රටේ දේශීය සංගීතය පිළිබඳ පයෙර්ෂණයක් කරමින් ලංකාවේ දේශීය සංගීතය සොයා ගැනීමට නම් වන්නම්, අෂ්ටක, සිවුපද, ස්තොත්‍ර, පිරිත් විමසිය යුතු යයි පැවසීය.

## ධාරණී

ථෙරවාදීන් ගේ පිරිත් යන වචනයට සමාන අරුත් දෙන ශබ්දය මහායානිකයින් ගේ ධාරණී යන්නයි. ධාරණී ආරක්ෂාව සඳහා රචිත රචනා විශේෂයකි. වසංගත රෝග වලින් සතුරු කරදරවලින් අමනුෂ්‍ය උපද්‍රව වලින් වසවිස ආදියෙන් ආරක්ෂාවත් දිගු කලක් ජීවත් වීමත් චණ්ඩ සත්වයින් හීළෑවීමත් ධාරණී භාවිතයෙන් සිදු වේ යයි මහා යානිකයෝ තරයේ විශ්වාස කරති. ධාරණී භාවිතය අථර්වන් වේද සමයේ සිට භාරතයේ පවතීයයි කියති. ධාරණී යන්නෙහි තේරුම සිත්හි ලා දරා ගන්නා ලද දේ යන්නයි. මෙසේ මන්ත්‍රයක් සිත තබා ගත් විට හෝ ජප කරන විට එයින් ආරක්ෂාව සැලසේ යයි විශ්වාස කරති. ලක්දිව මහායාන අදහස් නම් ග්‍රන්ථයේ ධාරණී ගැන මෙසේ සඳහන් වෙයි.

"මේ ධාරණී භාවිතයෙන් කොතරම් නියඟ කලක නමුදු වැසි වැස් විය හැකි බැව්ද එසේම නාගයන් ගෙන් අමනුෂ්‍යයන් ගෙන් වස විෂවලින් සොර සතුරන් ගෙන් වසංගත රෝගවලින් ආරක්ෂා විය හැකි බැව්ද සම්මතය. මව ගේ කැමැත්තේ හැටියට දුවක හෝ පුතකු හෝ ලැබීමට ද ධාරණී භාවිතයෙන් පිළිවන. මීළඟ උත්පත්තියෙහි දී සුඛාවතියෙහි ඉපදීමට ද ධාරණී භාවිතය නිසා හැකි වේ. ධාරණී විශාල සංඛ්‍යාවක් ලියැවී ඇති නමුදු දැනට විද්‍යමාන වනුයේ ස්වල්පයකි. නේපාලයේ පඤ්චාරක්ෂා නමින් ධාරණී පඤ්චකයක් විශේෂයෙන් භාවිතා කරති. එනම්,

1. **මහා ප්‍රතිසාරා** (මෙය දන්නවුනට පවු සිදු නොවේ.)
2. **මහා සහශ්‍ර මර්දිනී** (අමනුෂ්‍ය උවදුරු වලකා දහසක් දේ කළ හැකිය.)
3. **මහා මයූරි** (නයි විෂ වැළැක්වීමට පුළුවන)
4. **මහා ශීතවතී** (වන සතුන්ගෙන් ආරක්ෂාව සැලසේ)
5. **මහා රක්ෂා මන්ත්‍රානුසාරිණී** (බෝවන රෝගවලින් වැළකීමට පුළුවන)

නොයෙකුත් රටවල නොයෙකුත් භාෂාවලින් පැතිරී ගිය මේ ධාරණීහු මධ්‍ය ආසියාවේ ද නැගෙනහිර තුර්කිස්තානයේ ද පැතිරී ගියහ. මහා සංඝිකයන් ගේ ධාරණී පිටකය නමින් පිටකයක් ද වේ. ආටානාටිය සූත්‍රය හා රතන සූත්‍රය මේ ධාරණී සංඛ්‍යාවට ගැනෙතියි කියති. පොළොන්නරුවේ රජය කර වූ මහා පරාක්‍රමබාහු රජු විසින් මන්ත්‍ර භාවිතය උදෙසා ධාරණීසර නමින් මන්දිරයක් සාදවන ලදී. ලක්දිව භාවිත වන ගිහි පිරිතෙහි ධාරණී යනු දෙතැනෙක සඳහන් වේ. ගිහි පිරිත මහා යානිකයන් ගෙන් පිටපත්

Non-Commercial Distribution

කරගත් ගිනි බිය ආදිය වළක්වන ධාරණියකි. වට්ටක පිරිතෙහි එන සන්ති පක්ඛා අපතනා ආදි ගාථාව නාගරී අකුරෙන් ලියා ගෙන ගිනි වළක්වන මන්ත්‍රණයක් මෙන් ලක්දිව භාවිතා කරන ලදී.

දඹදිව පැරණි සාහිත්‍යය නම් ග්‍රන්ථයෙහි මෙසේ සඳහන් වේ.

"කර්න් මහතුන් ගේ පිළිගැනීම පරිදි බුද්ධාගමෙහි ඉතා පැරණි සමයයන්හි පටන් ධාරණීහු වූහ. නිර්වාණය පැතීමට තරම් නුවණ නොමේරූ අයට මෙලොව සැප සම්පත් ආදිය ලබා ගැනීම සඳහා ධාරණීහු බුද්ධාගමට ඇතුළත් කරන ලදැයි කියත්, එබඳු අල්ප වේධස්ක වූ අයගේ භාවිතයට යොග්‍ය වූ සූත්‍ර කීපයක් අනුදැන තිබුණු නමුදු එයත් ඔවුන්ට සුමග නොවූ හෙයින් එම සූත්‍ර කොට සිතෙහි දරා ගැනීම සඳහා ධාරණීහු කරන ලදහ. කල්යාමේ දී එම ධාරණීන් ද, වැඩි දුරටත් සංක්ෂිප්ත කිරීමෙන් මන්ත්‍රණයන් ගේ සම්භවය විය. මෙසේ නූගතුන් සිටිය දී උගතුන්ගේ පවා භාවිතයට දුෂ්කරව පැවැති විශාල වූ අෂ්ට සාහස්‍රිකා ප්‍රඥා පාරමිතාව පිඩු කොට ප්‍රඥාපාරමිතා හෘදය සූත්‍රය ද, එය වැඩිදුරටත් සංක්ෂිප්ත කිරීමෙන් ප්‍රඥා පාරමිතා ධාරණීය ද එය තව දුරටත් පිඩු කිරීමෙන් ප්‍රඥා පාරමිතා මන්ත්‍රයද රචනා කරන ලදී. එම මන්ත්‍රයාගේ බීජය ප්‍රං යි ගන්නා ලදි."

ඒ පිළිබඳව ඒ.ජේ. තෝමස් මහතාගේ මතය මෙසේය.

"පුණ්ඩරීකයෙහි 21 පරිච්ඡේදය ධාරණී නමින් හැඳින් වේ. ධාරණී ජනප්‍රිය බුදු සමයෙහි වැදගත් කොටසක් ගත්තේ ය. එහෙත් බුදු සමයට ආවේණික වූ කිසිදු විශේෂ ලක්ෂණයක් දක්නට නොලැබේ. එය ආනුකම්පික මන්ත්‍ර විශේෂයකි. එහි ඇතුළත් වන්නේ අභිමත වූ කිසිවක් (පූජා විධියකුත් සමග) ජපකිරීමෙන් ඉටුකරගත හැකි වචනය. මේ වචන විධිමත් පරිදි ප්‍රයෝග කිරීමෙන් එහි ශක්තිය හේතු කොට ගෙන සිහිය ලැබෙනු ඇත. ඍග්වේද කාලය තරම් පැරණි කලක සිට මන්ත්‍ර ක්‍රම ඉන්දියාවේ තිබිණි."

"

මහායාන ධර්ම සාහිත්‍යයේ අවදාන ගැන මෙසේ සඳහන් කරයි.

"අන්තිමට දැක්වෙන්නේ පාළියෙන් පෙරළා ගත් එහෙත් මාතෘකා සංස්කෘතයෙන් දැක්වෙන සර්වාස්තිවාදයට වැඩි සබඳකම් කියන සූත්‍ර දහතුනකි. මෙයින් දෙකක් පාළියට සමාන නොවේ. ඒවායින් සතරක් මන්ත්‍ර වශයෙන් පරිශීලනය කර තිබීම වැදගත් කරුණකි. මහාසමය සූත්‍ර (දීඝ නිකායෙන් ii) ආටානාටිය සූත්‍රය (දීඝ නිකාය iii) සහ ග්‍රහණ මග හැරවීමට දේශනා කර තිබෙන සූර්ය සූත්‍රය හා චන්ද්‍ර සූත්‍ර (සංයුක්ත 1.50) ද වේ. ලංකාවේ පරිත්ත හෙවත් පිරිත් පොත යනුවෙන් හැඳින් වෙන මන්ත්‍ර සංග්‍රහයෙහි මේ සියල්ලම ඇතුළත් වේ."

අඞ්ගුත්තර නිපාතයේ චතුක්ක නිපාතයේ ඛන්ධ පරිත්තය දේශනා කර තිබෙන්නේ කෙනෙකුට අවශ්‍ය ආරක්ෂණය ප්‍රකට කරනු පිණිසය. එක්තරා භික්ෂු නමක් සර්පයකු විසින් දෂ්ඨ කරන ලදුව මිය ගියේ ය. මේ භික්ෂුනම මිය යෑමට හේතුව බුදුන් වහන්සේ ගෙන් විමසන ලදුව උන්වහන්සේ මෙසේ පිළිතුරු දුන්සේක. ඒ භික්ෂුනම මිය ගියේ විරූපක්ඛ, එරාපථ, ඡබ්‍යාපුත්ත හා කණ්හා ගොතමක යන සර්පයන් කෙරෙහි මෙත් සිත නොපැතිර වූ බැවිනැයි වදාළහ. ඔහු මෙත් සිත ප්‍රගුණ කළේ නම් නොමියනු ඇත.

මේ පුවත ගැන රීස් ඩේවිස් මහතා මෙසේ කියයි.

මිතුරු දම් රැකීම බොදු දහමට අනුව කට වචනයට සීමා වූ එකක් නොවේ. එය තමා කෙරෙහි කිපුණු මිනිස් සතා හෝ ආත්මය කෙරෙහි ප්‍රකාශිත මෛත්‍රියෙන් තෙත් වූ හෝ පැහැපත් වූ මනසින් හා මොලොක් සහෝදරත්වයෙන් පිරුණු හැඟුමෙන් ද යුක්ත විය යුතු ය. සූත්‍ර හා විනය පිටකවල මෙන්ම

Non-Commercial Distribution

බුද්ධ ඝොෂ හිමි ගේ "විශුධි මාර්ගයේ ද සිතුවිලි යනු ද්‍රව්‍යයෝ ය. යන්න වඩාත් තිර ලෙස දැක්වෙයි. මානසික ක්‍රියාව හැඟීම් හෝ අදහස් යන මේවා ක්‍රියාත්මක කිරීමේ හැකියාව ඇති බලයකි මෙය. යුරෝපයට මේ ඉන්දියානු ආකල්පයෙන් සුවපත් වීමට තව දුරටත් හැකිවේ."

**රීස් ඩේවිස් මැතිණිය පිරිත පිළිබඳව මෙසේ සඳහන් කරයි.**

"පිරිත් සජ්ඣායනයෙන් නැගෙන නාදය විනිවිද යන ක්‍රියාකාරී බලවේගයක් සේ සැලකේ. යහපත් අදහස්වල ශක්තිය ශබ්ද තරංග මුසු වී බොහෝ ඈත සිටින සත්වයන් වෙත ද විකාශනය වෙයි. පිරිතෙහි ලයාන්විත නාදය ස්නායු පද්ධතිය පිනවීමට ද, රුධිරයේ පවිත්‍රත්‍වයට ද, මානසික සංහිඳියාව ඇති වීමට ද හේතුවන බැවින් මානසික මෙන්ම ශාරීරික සුවයද දනවතියි සලකනු ලැබේ.

පිරිතෙහි කුසල් බලය ද අන්තර්ගත වේ. ආරම්භයෙහි දී පන්සිල් ගැනීමත් මංගල, පරාභව, වසල, ආලවක සූත්‍රවලින් සැදැහැවත් ජීවිතයේ ප්‍රතිලාභයන් වර්ණනා කිරීමත් ගෞරව සම්ප්‍රයුක්තව ධර්ම ශ්‍රවණය කිරීමත් කුශල පක්‍ෂය සංවර්ධනයට හේතු වේ. කුසල් සිත භාවනාවට පාදක වේ. රෝදුක් ඇති කරන සියලු රෝදුක් දුරු කරන නිසා සියලු අකුසල්වලින් තොර වීමෙන් මනස පිරිසිදු කරයි.

පිරිත් සජ්ඣායනය බුදු දහමට නුහුරු නොවන නමුත් දෙව ආගම්වල යාදිනි හා මැනවින් නොසැසඳෙතැයි නොකිව හැකි ය. වෙනත් ආගමික පුදපූජා වලදී මෙන් උවදුරු කාරකයිනට ශාප කිරීම වෙනුවට කරුණා මෛත්‍රී පෙරදැරිව කටයුතු කිරීම විශේෂ ලක්‍ෂණයකි.

විෂම වූ සත්‍වයන් කෙරෙහි වුව ද දක්වන්නේ බලාපොරොත්තු රහිත සදාතනික ප්‍රතික්‍ෂෙප කළ යුත්තක් ලෙසින් නොව සසර සැරි සරණ අවාසනාවන්තයින් ලෙසයි. පිරිත් සජ්ඣායනයෙන් රෝගීන් කෙරෙහි සුව දැනවීමත් හානිකර දේ මගහැරවීමත් අදහස් කෙරෙයි."

චතුභාණවාර පාලියේ මුලින් සඳහන් වන **සරණ, ගමන, දස සික්ඛා පද, සාමණේර පඤ්හ, පච්ච වෙක්ඛණ** හා **දස ධම්ම සූත්‍රය** සැදහැයෙන් සසුන් වන් හෙරණුන් විසින් සාමණේර බණ දහම් පොතක් ලෙස වන පොත් කොට භාවිතා කළහැකි වෙයි. උපසපන් වී පස් වසක් ගෙවූ භික්‍ෂූන් වහන්සේට **චතුභාණවාර පාළිය නිස්සය මුච්චනක** ධර්ම සංග්‍රහයකි. අනිත් හැමට ආරක්‍ෂක දේශනාවකි.

සතරබණවර ඉගෙනීම ධාරණය වාචොද්ගතව ප්‍රගුණ කිරීම උපසපන් නිස්සය මුච්චනක භික්‍ෂූන් වහන්සේගේ යුතුකම්ය, බුදු රජාණන් වහන්සේ විසින් ම පැවසූ **උග්ගණ්හාථ, පරියාපුණාථ, ධාරෙථ,** යන වදන් වලින් ඉගෙනීමට පුහුණු කිරීමට සිත්හි දරා ගැනීමට අවධාරණය කළයුතු බව තහවුරු වෙයි. එසේ ම අත්ථිය පාළිය මැනවින් නොහදාරා පිරිත් දේසන්නහුගේ දෙසුම පිරිතක් නොවන බව අට්ඨකථාවේ සඳහන් වෙයි. භික්‍ෂු ජීවිතයේ අභ්‍යන්තර ආකෘතිය සහ ආකල්පය පැහැදිලි කරන **දස ධම්ම සූත්‍රය** ත්‍රි ශික්‍ෂාවන් සම්පූර්ණ කොට නිර්වාණ ධර්මය සාක්‍ෂාත් කිරීමට යොමු කරන්නකි. දෙවියන් ඉතා ප්‍රිය කරන දෙවියනට පින් පඬුරු පිණිස ප්‍රකාශ කරන **මංගල සූත්‍රයෙහි** බෞද්ධයාගේ ජීවිතය ළමා කාලයේ සිට අවසානය දක්වා සෑම අවස්ථාවකම ජීවිත මග සකස් කර ගැනීමට උපයෝගී වන බෞද්ධ ජීවිතය ගොඩනගා ගතයුතු ක්‍රමානුකූල සැලැස්ම එහි අන්තර්ගතය. **රතන සූත්‍රයේ** දැක්වෙන **ආකඞ්ඛමානා සොත්ථානං, සබ්බාථ සොත්ථිං ගච්ඡන්ති, සුවත්ථි හොතු** යනාදී යෙදුම් වලින් ආත්මාරක්‍ෂාවත්, පරාරක්‍ෂාවත් උභය ලොකාර්ථ සංසිද්ධියත් අභිප්‍රෙත ය.

**බුධ, ධම්ම, සංඝ** යන ත්‍රිවිධ රත්නයේ අසීමිත ගුණ මහිමය ස්ථිර අධිෂ්ඨාන ශක්තිය හා එක්තැන් වීමෙන් ගොඩනැගෙන මහා බල ශක්තියට භූතයෝ ද අවනත වෙති. ඒ සඳහා ඔවුන් ගේ ප්‍රසාදය ද නොමඳව ලැබෙයි. විශාලා මහනුවර ඇති වූ රෝග අමනුෂ්‍ය හා දුර්භික්‍ෂ යන ත්‍රිවිධ භය ව්‍යපසමනය

Non-Commercial Distribution

කළ රතන සූත්‍රය ශාන්ති කර්මයට අතිශයින් යොග්‍යය, රතන සූත්‍රයේ බුඩ භාෂිත එක් එක් ගාථාවක අණ කෝටි ලක්ෂයක් සක්වල අමනුෂ්‍යයන් විසින් පිළිගන්නා ලදැයි සාරත්ථ සමුච්චය නම් චතුභානවාර අටුවාවේ එන **"ඉමිස්සාපි ගාථාය ආණා කෝටි සත සහස්ස චක්කවාළෙසු අමනුස්සාපි පටිග්ගහිතං"** යන පාඨයෙන් තහවුරු වෙයි.

**ආචාර්ය කිරින්දේ ධම්මානන්ද හිමියෝ මෙසේ පවසති.**

"පිරිත් දෙසීමේ ළයාන්විත හඬින් අවට පරිසරය තුටු පහටු බවට පත් කරයි. ගායනයේ රිද්මය ද වැදගත් ය. විවිධ කොටස් වලට අදාල විය හැකි විවිධ සූත්‍රයන් ගායනා කිරීමේ දී ඒ ඒ සූත්‍රවලට ගැලපෙන සේ විවිධ හැඬවීම නොහොත් නාද රටාවන් පිරිත් දේශනා කරන භික්ෂූන් වහන්සේලා යොදා ගන්නා සැටි දැක්ක හැකි ය. මිනිසාගේ ආධ්‍යාත්මික සංවර්ධනයේ මුල් කාලවලදී සොයාගත් කරුණක් නම් මිනිස් හඬෙහි ඇතැම් රිද්මයන් සාවධානව අසන්නන් තුළ එක්තරා අපූර්වත් මනොගත භාවයන් එනම් සාමය සංහිඳියාව වැනි කරුණු ඇතිවන බවයි.

තවද ඇතැම් නාද රටා දෙවියනට ප්‍රිය වේ. එමෙන් ම තවත් රිද්මයක් පහත් ගණයේ සතුන් කෙරෙහි එනම් සිවුපාවුන් උරගයන් හා භූතයන් වෙත යහපත් බලපෑම් ඇති කරන්නේ යයි ද විශ්වාසයක් තිබේ. එබැවින් උචිත මිහිරි රිද්මයන් පිරිත් දේශනාවේ වැදගත් අංගයක් වී ඇත. රිද්මය භාවිතා කිරීම බුදු සමයට පමණක් සීමා නොවූවකි. සෑම ආගමික අනුගාමිකයෝ තමන් ගේ යාඥා සඳහා ශුඪ වූ ග්‍රන්ථ යොදා ගැනීමේ දී කිසියම් රිද්මයක් යොදා ගනිති. මුස්ලිම් බැතිමතුන්ගේ කෝරාන් පොත කියවීම ද හින්දු පූජක වරුන් වේද මන්ත්‍ර සංස්කෘත භාෂාවෙන් ගායනය ද ඇතැම් කිතු බැතියන් හා ග්‍රීක නිකායිකයන් ගේ මධුර ගායනයන් ද දැක්විය හැකිය. පිරිත් සජ්ඣායනාවේදී ඇතැම් බලවත් බලවේග ක්‍රියාත්මක වේ. එනම් බුඩ ධම්ම සංඝ යන ත්‍රිවිධ රත්නයේ ආරාධනය එකතු වූ කල්හි මිනිස් වර්ගයාට මහත් වූ සාන්තියක් ගෙන දිය හැකි ය.

අපේ සංස්කෘතික උරුමය නම් සංග්‍රහයේ ප්‍රථම භාගයේ පරිත්‍රාණ දේශනාව පිළිබඳ **මහාචාර්ය ලිලී ද සිල්වා මහත්මියගේ** ලිපියේ අවසන් ඡේදය මෙසේ ය :

> පිරිත් දේශනය ඉතා ඈත අතීතයට දිවයන ලේඛන ගත ඉතිහාසයකින් යුක්ත පූජා චාරිත්‍රයකි. එය පරිණාමය වන්නට ඇත්තේ එදිනෙදා ජීවිතයේ ගැටළු නිරාකරණය කර ගැනීම පිණිස සාමාන්‍ය ජනයා තුළ ඇති ඉමහත් සහජ අභිලාශය සංසිඳවා ලීම පිණිස විය යුතු ය. ආගම ධර්මයෙන් මිනිසා බලාපොරොත්තු වන්නේ ලොකොත්තර විමුක්තිය ලබා ගැනීම පමණක් නොවේ. එය අති උත්තම පරමාර්ථය යි. ඒ හැර ලෞකික වශයෙන් අපල උපද්‍රව, ලෙඩ රෝග අමනුෂ්‍ය උවදුරු යනාදි නානා ප්‍රකාර අදෘෂ්‍යමාන බලවේගයන් මැඩලීමේ පිළිවෙතක් ද ආගම ධර්මයෙන් බලාපොරොත්තු වේ. එම බලාපොරොත්තුව බුදු සමයේ මූලික ඉගැන්වීම්වලට පටහැනි නොවන අන්දමින් ඉටු කරනුවස් පිරිත් දේශනය ක්‍රමයෙන් පරිණාමය වන්නට ඇතැයි අපට නිගමනය කළ හැකි ය. ලෞකික සහන ලබාදීමට පොරොන්දුවන ගුප්ත බ්‍රාහමණික පූජාචාරිත්‍රයන් ගෙන් බෞද්ධ ජනතාව බේරා ගැනීම මෙම පිරිත් දේශනයේ ප්‍රධාන කෘත්‍ය සාධනයක් විය හැකි බවද අනුමාන කළ හැකි ය. පිරිත් දේශනය සංකෙතයන් ගෙන් පොහොසත් බවත් ආගමික පූජා චාරිත්‍රයක ඇති වැදගත් ලක්ෂණයන් ගෙන් අනූන බවත්, මෙම අධ්‍යයන යෙන් පැහැදිලි වේ. එය සාමය සෞභාග්‍යය ළඟා කරන පූජා චාරිත්‍රයක් වශයෙන් ථෙරවාදී බෞද්ධ රටවල විශේෂයෙන් ශ්‍රී ලංකාවේ ඉතා ජනප්‍රිය ය. පරිත්‍රාණ දේශනය සිංහල සංස්කෘතිය හා බැඳී ඇත්තේ අන්‍යොන්‍ය උත්තේජක සම්බන්ධයෙනි."

Non-Commercial Distribution

නිවන් මග 34 කලාපයේ පිරිත් දේශනා සහ පිරිත් මණ්ඩපය සැකසීමේ අභිචාර විධි සහ ඒ හා සම්බන්ධ සෞන්දර්යාත්මක හා විද්‍යාත්මක ඇගයීමක් යන ලිපියේ ආචාර්ය ධම්සේන හෙට්ටිආරච්චි මහතා මෙසේ පවසයි.

"පිරිත් දේශනා ශ්‍රී ලාංකික බෞද්ධයන් අතර ඉතා ප්‍රචලිත වැදගත් ආගමික කාර්යයකි. ලාංකේය බෞද්ධයන් ගේ ජීවිතයේ හැම විශේෂ අවස්ථාවක මත් සමාජ ජීවිතයේ හැම වැදගත් අවස්ථාවකමත් සමග පිරිත් දේශනා සම්බන්ධ ය. සාහිත්‍යය ද පුරාවිද්‍යාත්මක සාධකද අනුව පිරිත ලංකා ඉතිහාසයේ ද උසස් ලෙස සලකා ඇති ආගමික කාර්යයක් බව පෙනේ. උත්තර භාරතයේ මෙන්ම දකුණු ඉන්දියාවේ ද ලංකාවේ ද, මිනිසුන් අතර පැතිර පැවති විවිධ ආගමික අදහස් හා අභිචාර විධීන් බෞද්ධ අරමුණුවලට එකඟ වන පරිදි සකසා ගෙන පිරිත් දේශනය හා සම්බන්ධ වී ශාසනික කාර්යයක් වශයෙන් අඛණ්ඩව පැවතෙන අයුරු මේ පිළිබඳව පර්යේෂණ කළ දේශීය හා විදේශීය විද්වතුන් විසින් පෙන්වා දී තිබේ."

**"යස්ස අණක්ඛෙත්තෙ කොටි සත සහස්ස චක්කවාළෙසු ආනුභාවො වත්තති"**

යන වාක්‍යයෙන් ධජග්ග සූත්‍රාදීයෙහි ආනුභාවය ද කෝටි ලක්ෂයක් සක්වළ පවතින බව ප්‍රකාශ වෙයි. පිරිතේ පවතින අනුසස් ගැන බෞද්ධයෝ තරයේ විශ්වාස කෙරෙති. එහි ආනුභාව දැක්වෙන පුවත් අට්ඨකථාවල සඳහන් වී තිබේ. වරක් දීඝවාපි චෛත්‍යයේ සුණු පිරියම් කිරීමෙහි යෙදී සිටි භික්ෂුනමක් චෛත්‍යය මුදුනේ සිට ගිලිහී ඇද වැටුණේ ය. එහෙත් ඒ භික්ෂුනම බේරුණේ ධජග්ග සූත්‍රය මෙනෙහි කිරීමෙන් යයි සංයුත්ත නිකායට්ඨ කථාවේ සඳහන් වෙයි.

ඛන්ධ පරිත්ත, මෙත්තානි සංස, මිත්තානි සංස යන පිරිත් කරණීය මෙත්ත සූත්‍රයට අනුලොමිකය.

තෙසං භික්ඛූනං මෙත්තත්ථං ච විදස්සනා පාදක ඣානත්ථංච ඉමං සුත්තං අභාසි යන්නෙන් ආරක්ෂාවක් ලෙසත් කම්ස්ථානයක් ලෙසත් දේශනා කරන ලද බව කියවෙයි. එහි එන කරුණු ලෞකික ලොකොත්තර සංසිද්ධියට හිතකර ය.

සම්බුද්ධ ගුණානුස්මරණය කරන මොර පරිත්ත, චන්ද පරිත්ත, සූරිය පරිත්ත යන තුන සහ ප්‍රත්‍යෙක බුද්ධ ගුණ ප්‍රකාශිත ඉසිගිලි සූත්‍රයට අනුලෝමව ද යොදා ඇති බව දැක්වෙයි.

පිරිනිවන් මංචකයේ වැඩ සිටි බුදු රජාණන් වහන්සේ ඒ මොහොතේ විජයකුමරු සහ පිරිවරින් ලක්දිවට ගොඩ බසිනු දුටු සේක. ඒ අවස්ථාවේ බුදුන් වහන්සේ සක්දෙවිඳු අමතා විජය ප්‍රධාන පිරිසත් ලක්දිවත් රැක ගන්නට නියම කළ සේක. සක් දෙවිඳු ඒ අනුව ලක්දිව රැක ගන්නට විෂ්ණු දෙවියනට භාර දුන්නේ ය. විෂ්ණු උපුල්වන් දෙවිඳුට ශ්‍රී ලඞ්කාවත් විජය ප්‍රධාන පිරිසත් රැක ගැනීමට භාර දුන්නේ ය. උපුල්වන් දෙවිරද වයොවෘද්ධ තාපසයකුගේ වෙසින් පිරිත් පැන් දී පිරිත් නූල් බැඳ ඔවුන් ආරක්ෂා කර ගත්තේ ය.

ලක්දිව බුදු සසුන පිහිටුවීමේ සිට මේ දක්වාම ලක්වැසි ජනතාව ආරක්ෂාවූයේ පිරිතේ බලමහිමයෙනි. බුදු සසුන භික්ෂු භික්ෂුණී උපාසක උපාසිකා යන සිවු පිරිසගෙන් සමන්විත විය. භික්ෂු ජීවිතය හැඩ ගැසුණේ සතර බණවර අනුවයි. එය සෙල් ලිපිවලත් වංසකථාවලත් අනතගීතවී තිබේ.

ක්‍රි.ව. තුන්වන සියවසට අයත් හේරත් හල්මිල්ලෑව ලිපියේ නවක පැවිද්දන් සතර බණවර ප්‍රගුණ කළයුතුයයි දැක්වේ.

Non-Commercial Distribution

## පස්වෙනි මහා කාශ්‍යප රජුගේ ජේතවනාරාම පුවරු ලිපියේ
# 'මහණ කරත් සතර් බණවර්
# පිණිස් වූවන් මහණ කරනු ඉසා' යි දැක්වේ.

සතර බණවර ප්‍රගුණ කොට ගත්තවුන් මහණ කරවිය යුතු යයි එයින් කියවේ. දුටුගැමුණු රජතුමා උක් සකුරු ගිතෙල් ආදිය මහ සඟනට පිළිගන්වා තුන්යම් රාත්‍රිය මුලුල්ලේ ගණ සජ්ඣායනා කර වූ බව මහාවංසයේ දැක්වේ. එයට පෙරාතුව ස්ථාන පසකදී ද ගණ සජ්ඣායනා කර වූ බව කියවේ. දුටුගැමුණු රජු යුධයෙන් ජය ගැනීමෙන් හටගත් බලවත් ප්‍රීති වේගය නිසා සති හතරක් පමණ නිදි නොලැබ සිටියේ ය. මේ හේතුකොට පීඩාවට පත්ව රෝගාතුර වෙතැයි සිතු මහා සංඝයා වහන්සේ අභිධම් පිටකයේ "චිත්ත යමකය" සජ්ඣායනා කළහ. ඒ මධුර ගායනා ස්වරූපයට සවන් දී සිටි රජතුමා නොදැනුවත්ව ම නින්දට වැටුණේ ය. මෙයින් පැහැදුණු රජතුමා භික්ෂූන් වහන්සේට මුව නො සෑහෙන සේ ස්තුති කළ බව සුමංගල විලාසිනියෙහි සඳහන් වෙයි. දුටු ගැමුණු රජු ගේ අවසාන අවස්ථාවේ ද භික්ෂූන් වහන්සේ ගණ සජ්ඣායනාව කළ බව වංසකථාවේ අන්තර්ගත වී තිබේ.

භාතිය රජ සමයේ රුවන්වැලි සෑය තුළ රහතන් වහන්සේ ගණ සජ්ඣායනා කරනු රජතුමාට ඇසුණු බව මහාවංසය සඳහන් කරයි. මේ අනුව නිගමනය කළ හැක්කේ ගණ සජ්ඣායනා ක්‍රමයක් එකල පැවති බවකි. එහෙත් ඒ සඳහා අනුමත කළ කෙබඳු වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වී ද මොන මොන සූත්‍ර ධම් සජ්ඣායනා කරන්නට ඇත්දැ යනු තීරණය කළ නොහැකි ය.

බුධදාස රජු ගේ පුත්‍ර උපතිස්ස රජතුමා ගේ කාලයේ දුර්භික්ෂයක් හා රෝග බියක් පැතිරිණි. රජතුමා භික්ෂූන් වහන්සේ ගෙන් අතීතයේ එබඳු අවස්ථාවල කෙබඳු ක්‍රමයක් අනුගමනය කරන ලදදැයි විමසී ය. විශාලා නුවර සිදු වූ දුර්භික්ෂයේ දී රතන සූත්‍රය දෙසූ බව උන්වහන්සේලා පැවසූහ. රතන සූත්‍රය මේ අවස්ථාවේදී හඳුන්වා දී තිබෙන්නේ ගංගාරෝහණ සුත්ත යන නමිනි. මෙය ලක්දිව මේ කාලයේ ඉතා උසස් අන්දමින් සිදුකළ පූජෝත්සවය ලෙස හඳුන්වා දිය හැකි ය. බුදු රජාණන් වහන්සේ ගේ පාත්‍රයට පැන් ගෙන සංඝයා වහන්සේ සමග පිරිත් කියමින් වීථි සංචාරය කරන ආකාරය නිරූපනය වන ක්‍රමයට මෙය සිදු කරන ලදී. මාර්ගය සරසා අලංකාර කොට බුධ ප්‍රතිමාවක් තනා ශෛලමය පාත්‍රයක් ප්‍රතිමාවේ දෝතේ තබන ලදී. අනතුරුව මේ ප්‍රතිමාව රථයක තබා සංඝයාවහන්සේ පිරිවරා ගෙන පිරිත් කියමින් නගරය වටා සංචාරය කළහ. මේ අවස්ථාවේ දේශනා කරන ලද්දේ රතන සූත්‍රයයි. තිස්පැය පුරා නගරය සංචාරය කරමින් පිරිත් පැන් ඉස ආරක්ෂාව සැලැස් වූහ. වැස්ස උදැසන ඇරඹිණි. රජතුමා අතිශයින් ප්‍රීතියට පැමිණියේ ය. තමන් ගෙන් පසුව ඇතිවන රජවරුන් ද මෙසේ කළ යුතු යයි සම්මත කරන ලදී. මෙයට පසු සිවුවන අග්බෝ රජු ද පිරිත් දේශනා පැවැත් වීය. දෙවන සේන රජතුමා ද උපතිස්ස රජු අනුගමනයෙන් දුර්භික්ෂයේ දී පිරිත් කියවන ලදැයි සඳහන් වේ. මේ අවස්ථාවේ බුදු රුව වෙනුවට අනඳ හිමි ගේ රූපය තනවා එය රියක නංවා වීථි සංචාරය කරමින් පිරිත් දේශනාව පවත්වන ලදී. මෙහි දී මහාවංසය පරිත්තොදක යන නාමය භාවිතා කොට තිබේ.

පිරිත් දෙසුම මහා විහාර අභය ගිරි යන දෙපක්ෂය විසින් එකසේ අනුගමනය කරන ලද්දකි. මහායානිකයෝ ද රතන සූත්‍රයට වැඩි භක්තියක් දැක්වූහ. පස්වන කසුප් සමයේ ද සාගතයක් ඇති වූ බැවින් පිරිත් දෙසීමක් සිදු කරන ලදී. මේ පිරිත්තට තුන් නිකායේම භික්ෂූන් වහන්සේ සහභාගි වූහයි කියති.

Non-Commercial Distribution

සතර වන මිහිඳු ගේ මිහින්තලා සෙල් ලිපියේ පිරිත ගැන සඳහන්ව තිබේ. උදැසන භික්ෂූන් වහන්සේ කැඳ බත් පිළිගැනීමට පෙරාතුව මෙත් කළ යුතු විය.

මහා පරාක්‍රමබාහු සමය සෞභාග්‍ය සම්පන්න කාලපරිච්ඡේදයකි. රට සමෘද්ධිමත්ව පැවතිනි. බහුශ්‍රැත සංඝ නෙතෘවරයන් ගෙන් සසුන නො හිස්ව තිබුණේ ය. වජ්‍රයානිකයින් ගේ හා බ්‍රාහ්මණයින් ගේ බලපෑම වැඩෙමින් තිබිණි. එයට යට නො වී සිටීමට ථෙරවාදීන්ට ද පිළිවන් කමක් නොවී ය. ඥාන මාර්ගය අභිබවා භක්ති මාර්ගයේ වැඩීමක් මෙකල පෙන්නුම් කෙළේය. හින්දු බලපෑම් අනුව සතර බණවරට සෙත් පිරිත් ආදී විශේෂාංග එකතු වූයේ මෙකල යයි සිතිය හැකි ය.

පොළොන්නරු ගල්විහාර කතිකාවතේ ද "පැවරූ තැනකට යන ගමනක් මුත් සෙසු නිකම් ගමන් බිමන් කිරීමට ඉඩ නොදිය යුතුය යි එහි සඳහන් ව තිබේ. මේ අනුව මහ ජනයා නිතර නිතර පිරිත් දේශනා කරවා ගන්නට ඇතැයි සිතිය හැකිය. දඹදෙණි කතිකාවතේ ද පැවරූ තැනකට යෑම ගැන කියා ඇත. එහි වත පිරිත ගැන ද සඳහන්ව තිබේ. සර්වරාත්‍රික පරිත්‍රාණ දේශනා ඇරඹුනේ දඹදෙණි සමයේ දී යයි සිතිය හැකියි.

කුරුණෑගල සමයට අයත් දළද සිරිතේ ද පිරිත් කීම ගැන සඳහන් කොට තිබේ. රජවරුන් ගේ මාලිගා ප්‍රවේශ උත්සව වලදී මහාසංඝයා වහන්සේ ලවා පිරිත් කියවා පිරිත් පැන් ඉස්සවා ආරක්ෂාව සලසා ගත යුතු බව එහි සඳහන් වෙයි.

ගිනි පිරිත, ජල පිරිත, අටවිසි පිරිත ජින පඤ්ජරය ආදී පිරිත්, පිරිත් පොතට ඇතුල් වූයේ එකල යයි කලපනා කරති.

දළද පෙරහර කරන අවස්ථාවේදී ඇතකු බැඳි රියක දළද වහන්සේ වඩා හිඳුවා එහි බැඳි පිරිත් හුය මහා සංඝයා වහන්සේ අල්ලා ගෙන පිරිත් දෙසමින් යා යුතුයයි දැක්වේ.

කෝට්ටේ සවන පැරකුම්බාවන් ගේ සමයේ පැපිලියානේ සෙල්ලිපියේ පිරිත් උත්සවයක් ගැන සඳහන් කොට තිබේ. මෙකල ලියූ සංදේශවල පිරිත් කියා දෙවියන්ට පින් පෙත් දීමට සංදේශ හරකයාට උපදෙස් දී තිබුණේ ය.

මහත් තෙදැති පුල්වන් දෙවිඳු මුල් කොට
දිමුත් සමන් බොක්සල් සුරිඳු තෙක් කොට
සවත් සුරිඳු විබිසණ ඈ සුරන් හට
පිරිත් කියා පින් දී සිත සතුටු කොට

වීරපරාක්‍රම නරෙන්‍ද්‍රසිංහ රජුට වැළඳුණු ඇස් රෝගයට ප්‍රතිකම් වශයෙන් රත්නත්‍රයේ හා දෙවියන් ගේ ආරක්ෂාව සලසා ගැනීම සඳහා මහනුවර පෝය මළු විහාරයේ දී සති පිරිත් දේශනාවක් පවත්වන ලදැයි කියති. ගම්බාර දෙවියාට පහනක් තබා පින්කම ඇරඹීමේ සිරිත මහනුවර යුගයේ සිට පැවත එන්නකැයි සිතති.

කීර්ති ශ්‍රී රාජසිංහ රජු දවස ලක්දිව උපසම්පදව පිහිට වූ උපාලි හිමියන් ප්‍රමුඛ සියම් දේශීය භික්ෂූන් වහන්සේ එකල ඒ රටේ පැවති පරිත්‍රාණ දේශනා ක්‍රමය මෙහි ඇති කෙළේ යයි දැක්වේ.

පිරිත් දේශනාවේ විකාශනය ගැන සාකච්ඡා කරන විට සරණංකර සංඝරාජ සමයේ අනාගත කාරණා ගැන ද අවධානය යොමු කළ යුතු ය.

Non-Commercial Distribution

"මහනුවර යුගයේ දෙසූ පිරිත් ද හින්දූන් ගේ ශාන්ති කර්මාදියට බෙහෙවින් සමාන විය. බලි තොවිල්වල දී ගන්නා බුලත් නා දළු කුස තණ ආදී ද්‍රව්‍යයන් පිරිතක දී ද ගන්නා ලදී. දෙවියන් යැදීම ශබ්ද පූජා පැවැත්වීම ද මෙයට ඉතා අවශ්‍ය කටයුතු සේ සලකන ලදී. කිල්ලට අසුචි පිරිත් දෙසුම නොමැනවැයි ඔවුන් සිතුයේ පිරිතට දෙවියන් සම්බන්ධ කොට ගත් හෙයිනි. මේ දෙසූ පිරිත් අතර සමහර මහා යාන පිරිත් ද ඇතුළත් ව තිබුණු බව පෙනේ. මේ කාලයේ සිට ම පැවත එන අදත් ඇතැම් තන්හි ශාන්තිය සඳහා කියැවෙන ඇතැම් පිරිත් ගාථාවලින් පැවසෙන්නේ මහායාන අදහස් ය."

"මහනුවර පිරිහීම් යුගයේ භික්ෂූහු තෙවෙනි සතිය රුවන් ගෙයි විසූ බුදුන් ඒ ධර්ම ධාතුව සිහිකළ බව පවසමින් එම බෙලෙන් සෙත් පැතුහ.

එමෙන් ම ජින පංජරය, අටවිසි පිරිත, ගිනි පිරිත, ජල පිරිත ආදිය ද පිරිත්වල දී ඉතා උසස් තැනක් ගත්තේ මේ අවධියෙහි දී ය. වන්දනා ගාථාවල දී කියවෙන

> **යෙ ච බුද්ධා අතීතාච - යෙ ච බුද්ධා අනාගතා**
> **පච්චුප්පන්නාච යෙ බුද්ධා - අහං වන්දාමි සබ්බද**

මේ ගාථාවේ ඇතුළත් "**පච්චුප්පන්නාචයෙ බුද්ධා**" යන්නෙන් කියවෙන්නේ වර්තමාන බුදුවරුන් ය. ථෙරවාද බුද්ධ ධර්මයේ එක ම බුදු වරයකු මිස වර්තමාන බුදුවරුන් විශාල සංඛ්‍යාවක් කොයින් ද? මහායානයේ නම් වර්තමාන බුදුවරු එමට ය.

## දොරකඩ අස්න හා අනුශාසනා අස්න

ශාස්ත්‍රපති කොටගම වාචිස්සර හිමියෝ තවදුරටත් සරණංකර සංඝරාජ සමයේ මෙසේ සඳහන් කරති.

පිරිත මහ ජනයා අතර ජනප්‍රිය වන්නට පටන් ගත්තේ දඹදෙණියුගයෙන් පසුව ය. සර්වරාත්‍රික පරිත්‍රාණ ධර්ම දේශනා ආදිය විධිමත් ලෙස ඇරඹුණේ මේ යුගයේ සිට ය. එහෙත් මහනුවර යුගයේ පිරිත් පින්කම් පවත්වන ලද්දේ එයට වෙනස් අයුරිනි.

මෙකල සති පිරිත් දේශනා අවසානයේ කෙරෙන සියලුම චාරිත්‍ර විධි දෙවියන් හා සම්බන්ධ කොට තිබෙන්නේ වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ රජුගේ ඇස් රෝගය සඳහා දේශනා කළ සති පිරිත් දේශනාව අනුවයි. මගුල් බෙර වයා දෙවියන්ට ආරාධනා කිරීම පිරිතේ අංගයක් ලෙස සලකන ලදී.

පරිත්‍රාණ ධර්ම දේශනයෙන් අත්පත් කරගත් සියලු පින් දෙවියනට අනුමෝදන් කිරීම සඳහා දේව දූතයකු අත පණිවුඩයක් යැවීමත් ඒ සඳහා පැමිණිය යුතු දෙවියන් සහ ඔවුන් වාසය කරන සියලුම විහාරස්ථානවල සහ දෙවස්ථානවල නම් ඇතුළත් විහාර අස්න නම් ඝෝෂනයක් පැවැත්වීමත් ඇරඹුනේ මෙකල ය. මහ පෙරහරින් අසල තිබෙන විහාරස්ථානයකට හෝ දේවස්ථානයකට යන දෙව දූතයා ආපසු විත් තමා ගිය කාරිය ඉටු වූ බවත් සියලු දෙවියන් ම සහ පිරිවරින් පින් ගැනීමට පැමිණි බවත් මහ සඟන ඉදිරිපිට දී මණ්ඩපයේ දෙරටුව ළඟ සිට පවසයි. දෙරකඩ අස්න නමින් අදත් ව්‍යවහාර කරනුලබන්නේ මෙයයි.

එයට පසු ව්‍යක්ත භික්ෂුවක විසින් එහි පැමිණියේ යයි සලකනු ලබන දෙවියනට පින්දීම සඳහා අනුශාසනා අස්න නම් දේශනයක් පවත්වනු ලැබේ. මහනුවර යුගයේ රචිත මේ දෙරකඩ අස්න හා අනුශාසනා අස්න මෙන් ම විහාර අස්න ද යන රචනා ත්‍රයට වෘත්ත ගන්ධි ශෛලියෙන් යුක්තය.

Non-Commercial Distribution

මේ දොරකඩ අස්නෙහි සහ අනුශාසනා අස්නෙහි දකුණු ඉන්දියානු දෙවිවරුන් ගේ සහ ඕලන්ද, පරංගි ආදී අපරදිග රටවල දෙවිවරුන් ගේ ද ආරක්ෂාව අයැද තිබෙන බව පෙනේ. ඔඩ්ඩි වඩිග ආදී වශයෙන් දැක්වෙන දකුණු ඉන්දියානු දෙවිවරුන් බෞද්ධයන් නොවූ නමුත් ඔවුන්ට පින් දීමට අදහස් කොට ඇත්තේ ඔවුන් කෙරෙහි පැවති දෘඪ භක්තිය නිසා ය.

පිරිතේ විකාශය ගැන සාකච්ඡා කිරීමේ දී මේ අවස්ථාවට ගැලපෙන වැදගත් අදහසක් පැරණි ලක්දිව බෞද්ධ ඉතිහාසයේ ඊ.ඩබ්ලිව්. අදිකාරම් මහතා දක්වා තිබේ.

"පිරිත් පොතට අයත් සූත්‍ර වනාහී වැඩි වශයෙන් මිනිසෙකු ගේ එදිනෙදා ජීවිතයෙහි දී පිළි පැදිය යුතු ධර්ම සමූහයකින් යුක්ත වේ. එහෙයින් ක්‍රියාත්මක කළ යුතු මේ ගැඹුරු සරල ධර්මය පිළි පැදීමෙන් වෙන්කොට චාරිත්‍රයකට හා දෘෂ්ටියකට පරිවර්තනය වීම පුදුමයට කරුණකි."

අදිකාරම් මහතා ඒ පරිච්ඡේදය අවසන් කරන්නේ මේ ඡේදයෙනි.

"මෙ වැනි පූජා විධි චාරිත්‍ර ආදිය ධම්ම පද ආදී පොත්වලින් දැක්වෙන පිරිසිදු අමිශ්‍ර මුල් බුදු දහමින් කොතරම් ඈත් දැයි විස්තර කිරීම අනවශ්‍ය ය. මහජනයා කෙරෙහි ආගම් රැඳවීමට නම් මෙවැනි පූජාවිධි චාරිත්‍ර ආදිය ඇති වීම අවශ්‍ය ය. එය ස්වභාවයෙන් ම සිදු වන්නකි. තිබෙන එකම සැනසිල්ල නම් මෙම පූජා විධි ආදිය මහජනයා ගේ ආගමේ කොටසක් බවට පත් වූ නමුදු ලක්දිව භික්ෂූන් විසින් මිශ්‍ර වන්නට ඉඩ නොදී හැකි පමණින් ආරක්ෂා කළ ත්‍රිපිටක ධර්මයෙහි එතරම් වෙනසක් මෙය හේතු කොට ගෙන සිදු නොවීමය."

එසේ නම් මෙහි එන උපග්‍රන්ථය ඇතුළත් කෙළේ කුමකට දැයි ප්‍රශ්නකළ හැකි ය. සියල්ලම මැනවින් පරීක්ෂා කළවිට අවශ්‍ය හරය වෙන්කර ගැනීම බුධිමතුන්ට පහසු වීම සඳහා ය.

අග්ගමහා පණ්ඩිත පොල්වත්තේ බුද්ධ දත්ත මහ නාහිමිපාණන්ගේ පාළි සාහිත්‍යයේ දෙවෙනි කොටසේ සතර බණවර හා එහි අටුවාව ගැන මෙසේ දැක්වේ.

"මේ සතර බණවර දැන් 'මහ පිරිත් පොත' යයි ව්‍යවහාර කරති. මෙහි ඇතුළත් වන්නේ පිරිත් පමණක් නො වේ. ඛුද්දක පාඨය සාමණේර වරුන්ට කට පාඩම් කිරීම සඳහා ගැලපූ පොතකි. මේ සතර බණවර උපසම්පදාව ලබන්නන් විසින් කටපාඩම් කිරීමටත් අර්ථය දැන ගැනීමටත් සම්පාදිත වූවකි. ඛුද්දක පාඨයේ නිධි කණ්ඩ තිරොකුඩ්ඩ සූත්‍ර දෙක ධර්ම දේශනාව සඳහා ඉගෙනීමටයි. ද්වත්තිංසාකාරය භාවනාව සඳහායි. සතර බණවරේ තිබෙන ප්‍රත්‍යවෙක්ෂාව හා දසධම්ම සූත්‍රය පැවිද්දන් විසින් සලකා බැලිය යුතු කරුණු සඳහා ය. කරණීය මෙත්ත මෙත්තානිසංස දෙක මෛත්‍රී භාවනාව සඳහාය. මෙයින් ඒවා පමණක් පිරිත් වශයෙන් සැලකිය හැකි ය.

"දැන් තිබෙන මහ පිරිත් පොතේ ධම්මචක්ක - මහාසමය සූත්‍ර දෙක දකින්නට ලැබෙතත් සතර බණවර අටුවාවේ සූත්‍ර දෙකේ වර්ණනාවක් දක්නට නැත. සරණංකර සංඝරාජ හිමියන් ලියූ සතර බණවර සන්නයෙහිත් ඒ සූත්‍ර දෙක නැත. ඒ සූත්‍ර දෙක ආරක්ෂක පිරිත් කියා කිව නොහැක. පසු කලෙක ඒ දෙක මෙහි ඇතුළත් කරන්නට ඇත. චතුභාණවාරය හෙවත් මේ සතර බණවර කුමක් දැයි තේරුම් ගැනීම මින් පෙර පාලි සාහිත්‍යය ගැන ඉංග්‍රීසියෙන් පොත් ලියූ එක් උගතකුටවත් නො හැකි විය."

සතර බණවර අටුවාව සාරාර්ථ සමුච්චය නම්. එය ආනන්දවනරතන හිමියන්ගේ අන්තේවාසික තෙර නමක විසින් සම්පාදිතය. එහි ප්‍රාරම්භ ගාථා පහක් දැක්වේ.

Non-Commercial Distribution

චිරං සො පාරමී ධම්මා - ගදෙහි භාවිතන්තරො
දෙසනා මන්ත සත්තීහි - සත්තෙ තායි ගදද්දිතො

තෙන කාරුඤ්ඤ පඤ්ඤන - සබ්බසත්ත හිතෙසිනා
භාසිතානි පරිත්තානි - යානි සුත්තානි සත්ථුනා

සබ්බුපද්දව නාසාය - පවත්තෙසුං පුරාතනා
සමාහරිත්වා එකත්ථ - නික්ඛිපිංසු නිකායතො

චතුන්නං භාණවාරානං - තෙසං අට්ඨකථම්පහං
අනොම දස්සි විඛ්‍යාත - මහා සාමි නියොගතො.

පාඨනෙත පරිජානිත්වා කතස්ස ඵල සිද්ධිතො
සමුච්චුනිත්වා එකත්ථ නික්ඛිපිස්සං තතො තතො

“යමෙක් පාරමිතා ධර්ම නමැති මන්ත්‍ර ශක්තියෙන් සත්වයන් රෝගාදියෙන් ආරක්‍ෂා කෙළේ ද, කරුණාව හා ප්‍රඥාවෙන් සම්පූර්ණ වූ සියලු සතුන්ට හිත වැඩ කැමති ඒ ශාස්තෘන් වහන්සේ විසින් වදරණ ලද යම් පිරිත් සූත්‍ර කෙනෙකුන් පුරාතනයේ සියලු උවදුරු නැසීම සඳහා පැවැත්තාහුද, ඒ සූත්‍ර අඞ්ගුත්තරාදි නිකාය වලින් උපුටා එක් තැන් කළාහුය. ඒ බණවර සතරේ අටුවාව අනොමදස්සි නමින් ප්‍රකට වූ මහා සවාමීන්ගේ නියෝගයෙන් කරමි කියන වචනයන්ගේ තේරුම දැන ගෙන කීමෙන් ඵල සිඩිය ඇතිවන බැවින් ඒ ඒ තැනින් වර්ණනාවන් උපුටා එක් තැන් කරමි.”

ඒ සතර බණවර අටුවාව කළ තෙර නම ආනන්‍ද වනරතන මහා සවාමීන් ගේ අතවැසි නමක් බව අටුවාවේ අග එන ගාථාවෙන් හෙළිවෙයි.

“සොයං දයාලු ගරුමෙ ජයතීහ පඤ්ඤා
ආනන්‍ද රඤ්ඤ රතනාදි මහා යති න්‍දෙ
නිස්සාය යස්ස යතයොහි යතිස්ස තෙජං
ජොතෙන්ති ධම්ම මතිසෙමුසි ගොචරම්හි”

‘යම් යතිවරයකුගේ ආනුභාවය නිසා බොහෝ භික්‍ෂූහු මහා ප්‍රඥා ගොචර වූ ධර්මය බබුළුවත් ද කරුණාබහුල වූ මහා ප්‍රාඥ වූ මාගේ ආචාර්ය්‍ය ආනන්‍ද වනරතන යතීන්‍ද්‍රතෙමේ වැජඹේවා.”

විපත්ති පටිබාහාය - සබ්බ සම්පත්ති සිඩියා
සබ්බ දුක්ඛ විනාසාය - පරිත්තං බ්‍රෑථ මඞ්ගලං

විපත්ති පටිබාහාය - සබ්බ සම්පත්ති සිඩියා
සබ්බ භය විනාසාය - පරිත්තං බ්‍රෑථ මඞ්ගලං

විපත්ති පටිබාහාය - සබ්බ සම්පත්ති සිඩියා
සබ්බ රොග විනාසාය - පරිත්තං බ්‍රෑථ මඞ්ගලං

“සියලු විපත් දුරුවීම පිණිසත් හැම දුක් හැම බිය හා හැම රෝග විනාශය පිණිසත් සර්වාර්ථ සංසිද්ධියට හේතුවන පිරිත දේශනා කරනු මැනවි.”

මෙයින් පිරිතක් දේශනා කරවා ගැනීමේ අරමුණ කුමක් ද යන බව ඉඳුරාම පැහැදිලි වෙයි.

Non-Commercial Distribution

තිස් පෑ තුන තිස් පෑ හත, තිස් පෑ පහ සහ හත් දවසේ පිරිත පේ කිරීමෙන් පසුව පිරිත් මණ්ඩපය වසා තබනු ලැබේ. පසුවදා උදේ 5.00 ට පමණ දායකයකු ලවා ආරාධනා කරවා මහ පිරිත දෙසීමෙන් පිරිත සජ්ඣායනය කිරීම සිරිත යි. එතැන් සිට පිරිත හමාර කිරීම දක්වා හිමිනමකගෙන් පිරිත් මණ්ඩපය හිස් කරනු නොලැබේ. සූත්‍ර දෙශනාව පවත්වන දිනය පිරිත පිළිබඳ විශේෂ දිනයක් ලෙස සලකති. අනික් දවස්වලට වඩා දොරකඩ අස්න හා අනුශාසනාව පවත්වන අන්තිම දිනය සුවිශේෂ දිනයක් ලෙස සලකති. හැම දෙනාම ඒ දිනය ගැන උනන්දුවෙති.

මෙහි වැදගත් කාර්‍යය නම් සංඝාඥාව පිහිටුවා දෙව දූතයකු පෙරහරින් දෙවස්ථානයට යැවීමයි. දෙව දූතයා කලින් පුරුදු කරගත් ශ්‍රද්ධා බුද්ධි සම්පන්න කෙනෙකු විය යුතු ය. අනුශාසනාව සඳහා කීමෙහි බිණීමෙහි සමත් මධුරභාණී හිමිනමක් විය යුතුය. අවසන් දින උදයේ මහ පිරිතෙන් පසු මහාසංඝයා වහන්සේ රැස් වී අනුශාසනා අස්න දෙසීමට සූදානම් වී සිටින හිමියන් ලවා විහාර අස්න දේශනා කරවනු ලැබේ.

විහාර අස්නෙහි ඇතුළත් වන්නේ සගම පස්ගම අරත්තන මාදන්වල යන විසින් පටන් ගෙන දංෂ්ට්‍රාධාතු මන්දිරය යන නුවර යුගයේ ඉතා ජනප්‍රියව පැවැති විහාර දේවාල නම් ලැයිස්තුවකි.

මෙහි සඳහන් ස්ථාන ඇතුළුව සියලු විහාර දේවාල වල අධිගෘහිත දෙවි මහ රජාණන් තමනුත් තමන්ගේ සහාය පිරිවර දෙවියනුත් සන්දෘෂ්ට, සවභක්ත දෙවියනුත් උපවෙතෙහි දේවියනුත් කැඳවා ගෙන මංගල සූත්‍රාදී බණ අසනුපිණිස ආ යුතුය යන සංඝාණත්තියයි.

එයට පසුව සංඝාඥාව තල්පත්වල ලියනු ලැබේ. එයද එයට නියමිත හිමියන් සතු කාර්‍යයකි. සංඝාඥාව සහ පොල්මල් ආදිය කදක් මෙන් පිළියෙළ කරනු ලැබේ. එය හේම කද නමින් හැඳින් වේ. සන්ධ්‍යා භාගයේ දේව දූතයා නියමිත දේවස්ථානයට මහා සංඝයා වහන්සේ සමග රැකවරණ සහිතව පෙරහරින් කැඳවා ගෙන ගොස් සංඝාඥාව එහි දී කියවා එසේම පෙරහරින් ආපසු පිරිත දේශනා කරන ස්ථානයට ගෞරවාන්විතව කැඳවා ගෙන එනු ලැබේ. දෙව පෙරහර එහි පැමිණෙන විට මහා සමය සූත්‍රය දේශනා කළ යුතුය.

රාත්‍රි මංගල සූත්‍ර දේශනාවෙන් පසු අනුශාසනා අස්න දෙසීමට සූදානම් වන දේව දූතයා අතර සාකච්ඡාවකි.

අනුශාසනා අස්න දෙසන හිමියන් අසන ප්‍රශ්න තුන මෙසේ ය:

1. **මෙම මණ්ඩප ද්වාරයෙහි මිනිසුන් ඇත.**
2. **සුරේන්ද්‍රාරාධනාවට ගියොත් අවුද?**
3. **වෛශ්‍රාවණාදී දෙවියොත් අවුද?**

**මේ ප්‍රශ්නවලට දෙන පිළිතුර මෙසේය.**

1. මෙම මණ්ඩප ද්වාරයෙහි මිනිස්සු ඇත.
2. දේවතා රාධනාවට ගියෝත් අවුය.
3. පරිවාර දෙවියෝත් අවුය.

දොරකඩ අස්නෙන් කියවෙන්නේ දූතයා ගිය දූත මෙහෙවර අනුව දෙවියන් පැමිණ සිටින බවයි. අනුශාසනා අස්නෙන් කියවෙන්නේ ඒ පැමිණ සිටින දෙවියනට පින් දීමත් පින් අනුමෝදන් වූ දෙවියන් සාන්තිය විසින් පින්කමට සම්බන්ධ දායක කාරකාදීන්ට සලසා දිය යුතු බවත් පෙන්වා දීමයි.

Non-Commercial Distribution

# උපකාරානුස්මෘති

පිණ්ඩපාතික වැලිවිට අසරණ සරණ සරණංකර සංඝරාජයන් වහන්සේ ගේ සතර බණවර සන්නයත්, විද්‍යාලංකාර විශ්ව විද්‍යාලයේ උපකුලපතිව වැඩ සිටි ත්‍රිපිටක වාගීශ්වරාචාර්ය මහොපාධ්‍යාය කිරිවත්තුඩුවේ ශ්‍රී ප්‍රඥාසාන් ප්‍රධාන සංඝ නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ ගේ චතුභාණවාර පාළිය හා සදහම් විස්තර සහිත සිංහල පිරිත් පොතත් තවත් පිරිත් පොත් කීපයකුත් විමසීමෙන් මේ පොත සකස් කළ බව කෘතඥතා පූර්වකව සඳහන් කළ යුතුය.

පිරිත් දේශනාව පිළිබඳ මෙරට මෙන් ම පිටරට ද සුපතළ කීර්තියක් ඇති වැලිගම අග්‍රබොධි විහාරාධිපති කැළණිය රාජමහා විහාරාධිකාරීව වැඩ සිටි කීර්ති ශ්‍රී සද්ධාවාස වත්තල සීල රතන නායක ස්ථවිරයන් වහන්සේ සමගත් ශ්‍රී රොහණ සංඝ සභාවේ විධායක කාරක සභික පිරිත් දේශනාව පිළිබඳ කීර්තිධර සුමධුර භාණි මඤ්ජුස්සර ශිරොමණි උඟුරුමුත්තේ සොමරතන මාතර පළාතේ ප්‍රධාන සංඝ නායක සවාමීන්ද්‍රයන් වහන්සේ සමගත් පිරිත් දේශනාව පිළිබඳ යම් යම් කරුණු ගැන සාකච්ඡා කෙළෙමි.

අපගේ ආරාධනය පරිදි විචාර පූර්වක ප්‍රස්තාවනාවක් සපයා දීමෙන් කළ අනුග්‍රහය පිළිබඳව ස්‍යාමොපාලි මහා නිකායේ ශ්‍රී රෝහණ පාර්ශ්වයේ මහානායක ධුරන්ධරව වැඩ සිටි ත්‍රිපිටක වාගීශ්වරාචාර්ය මහොපාධ්‍යාය, රාජකීය පණ්ඩිත, පුරාවිද්‍යා චක්‍රවර්ති, දර්ශන විශාරද, සාහිත්‍යසූරී අතිගරු කඹුරුපිටියේ වනරතනාභිධාන ස්වාමීන්ද්‍රයන් වහන්සේට කෘතඥතා පූර්වක ගෞරවය පිරිනමමි.

මෙම සංස්කරණය පිළිබඳ ශුද්ධි පත්‍රාව ලොකනයෙන් අනුග්‍රහය දැක්වූ වත්තේගම සුධර්මාධාර විහාරාධිපති අප හිතවත් පණ්ඩිත ගල්වැව ඤාණතිලක ස්වාමීන්ද්‍රයන් වහන්සේට හෘදයංගම ස්තුතිය පිරිනමමි.

මුද්‍රණ කාර්‍ය්‍යය පිළිබඳ විශිෂ්ඨ වාර්තාවක් තබා ඇති සමයවර්ධන පොත්හල (පෞද්ගලික) අධිපති ආරියදාස වීරමන් මහතාණන්ටත් එම කාර්‍ය්‍ය මණ්ඩලයටත් කෘතඥතා පූර්වක ස්තුතිය හිමිවෙයි.

අත්තුඩාවේ සිරි රාහුල
ශ්‍රී සුභද්‍රාරාමය පුරාණ විහාරය,
හිරිකැටිය,
දොඩම්පහළ, දික්වැල්ල
2005 මැයි

# පිරුවානා පොත් වහන්සේ

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස

(1)

## සරණාගමනං

බුද්ධං සරණං ගච්ඡාමි
ධම්මං සරණං ගච්ඡාමි
සඞ්ඝං සරණං ගච්ඡාමි

දුතියම්පි බුද්ධං සරණං ගච්ඡාමි
දුතියම්පි ධම්මං සරණං ගච්ඡාමි
දුතියම්පි සඞ්ඝං සරණං ගච්ඡාමි

තතියම්පි බුද්ධං සරණං ගච්ඡාමි
තතියම්පි ධම්මං සරණං ගච්ඡාමි
තතියම්පි සඞ්ඝං සරණං ගච්ඡාමි

Non-Commercial Distribution

## 2

## දස සික්ඛාපදනි

1. පාණාතිපාතා වෙරමණී සික්ඛාපදං.

2. අදින්නාදනා වෙරමණී සික්ඛාපදං.

3. අබ්‍රහ්මචරියා වෙරමණී සික්ඛාපදං.

4. මුසාවාද වෙරමණී සික්ඛාපදං.

5. සුරාමෙරය මජ්ජ පමාදට්ඨානා වෙරමණී සික්ඛාපදං.

6. විකාලභොජනා වෙරමණී සික්ඛාපදං.

7. නච්ච ගීත වාදිත විසූකදස්සනා වෙරමණී සික්ඛාපදං.

8. මාලා ගන්ධවිලෙපන ධාරණ මණ්ඩන විභූසනට්ඨානා වෙරමණී සික්ඛාපදං.

9. උච්චාසයන-මහාසයනා වෙරමණී සික්ඛාපදං.

10. ජාතරූප-රජත පටිග්ගහණා වෙරමණී සික්ඛාපදං.

Non-Commercial Distribution

## 3

## සාමණෙර පඤ්හා.

1. එක නාම කිං? සබ්බෙ සත්තා ආහාරට්ඨිතිකා.
2. ද්වෙනාම කිං? නාමඤ්ච රූපඤ්ච.
3. තීණි නාම කිං? තිස්සො වෙදනා.
4. චත්තාරි නාම කිං? චත්තාරි අරියසච්චානි.
5. පඤ්ච නාම කිං? පඤ්චුපාදානක්ඛන්ධා.
6. ඡ නාම කිං? ඡ අජ්ඣත්තිකානි ආයතනානි.
7. සත්ත නාම කිං? සත්ත බොජ්ඣඞ්ගා.
8. අට්ඨ නාම කිං? අරියො අට්ඨඞ්ගිකො මග්ගො.
9. නව නාම කිං? නව සත්තාවාසා.
10. දස නාම කිං? දසහඞ්ගෙහි සමන්නාගතො අරහා'ති වුච්චතී'ති.

## 4

## ද්වත්තිංසාකාරො

අත්ථි ඉමස්මිං කායෙ, කෙසා ලොමා නඛා දන්තා තචො, මංසං නහාරු අට්ඨි අට්ඨිමිඤ්ජං වක්කං, හදයං යකනං කිලොමකං පිහකං පප්ඵාසං, අන්තං අන්තගුණං උදරියං කරීසං පිත්තං සෙම්හං පුබ්බො ලොහිතං සෙදෙ මෙදෙ. අස්සු වසා ඛෙළො, සිඞ්ඝාණිකා ලසිකා මුත්තං මත්ථකෙ මත්ථලුඞ්ගං'ති'ති.

Non-Commercial Distribution

5

## පච්චවෙක්ඛණා

1. පටිසඞ්ඛායොනිසො චීවරං පටිසෙවාමි. යාවදෙව සීතස්ස පටිඝාතාය, උණ්හස්ස පටිඝාතාය, ඩංස-මකස-වාතා'තප-සිරිංසප-සම්ඵස්සානං පටි ඝාතාය, යාවදෙව හිරිකොපින පටිච්ඡාදනත්ථං...

2. පටිසඞ්ඛායොනිසො පිණ්ඩපාතං පටිසෙවාමි. නෙව දවාය, න මදාය, න මණ්ඩනාය, න විභූසනාය යාවදෙව ඉමස්ස කායස්ස ඨිතියා යාපනාය, විහිංසූපරතියා බ්‍රහ්මචරියානුග්ගහාය, ඉති පුරාණඤ්ච වෙදනං පටිහංඛාමි. නවඤ්ච වෙදනං න උප්පාදෙස්සාමි. යාත්‍රා ච මෙ භවිස්සති අනවජ්ජතා ච ඵාසුවිහාරොචා'ති...

3. පටිසඞ්ඛායොනිසො සෙනාසනං පටිසෙවාමි. යාවදෙව සීතස්ස පටිඝාතාය, උණ්හස්ස පටිඝාතාය, ඩංස - මකස, වාතා'තප සිරිංසප සම්ඵස්සානං පටිඝාතාය, යාවදෙව උතුපරිස්සය විනොදනං පටිසල්ලානාරාමත්ථං...

4. පටිසඞ්ඛායොනිසො ගිලානපච්චය භෙසජ්ජ පරික්ඛාරං පටිසෙවාමි. යාවදෙව උප්පන්නානං වෙය්‍යාබාධිකානං වෙදනානං පටිඝාතාය, අබ්‍යාපජ්ඣ පරමතායා'ති.

Non-Commercial Distribution

# 6

## දසධම්ම සුත්තං

එවං මෙ සුතං. එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි, භික්ඛවො'ති. භදන්තෙ'ති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච.

දස ඉමෙ භික්ඛවෙ ධම්මා පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බා. කතමෙ දස?

1. වෙවණ්ණියම්හි අජ්ඣුපගතො'ති, පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං..
2. පරපටිබද්ධා මෙ ජීවිකා'ති, පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං..
3. අඤ්ඤො මෙ ආකප්පො කරණීයොති, පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං..
4. කච්චි නු ඛො මෙ අත්තා සීලතො න උපවදතී'ති පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං.
5. කච්චි නු ඛො මං අනුවිච්ච විඤ්ඤූ සබ්‍රහ්මචාරී සීලතො න උප වදන්තී'ති, පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං..

Non-Commercial Distribution

6. සබ්බෙහි මෙ පියෙහි මනාපෙහි නානාභාවො විනාභාවො'ති පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං.

7. කම්මස්සකො'ම්හි කම්මදායාදො, කම්මයොනි, කම්මබන්ධු, කම්මපටිසරණො, යං කම්මං කරිස්සාමි. කල්‍යාණංවාපාපකං වා තස්ස දායාදො භවිස්සාමි'ති පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං.

8. කථම්භූතස්ස මෙ රත්තිං දිවා වීතිපතන්ති'ති, පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං.

9. කච්චි නු බො'හං සුඤ්ඤාගාරෙ අභිරමාමී'ති. පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං.

10. අත්ථිනු බො මෙ උත්තරිමනුස්සධම්මා, අලමරියඤාණදස්සන විසෙසො අධිගතො, සො'හං පච්ඡිමෙ කාලෙ සබ්‍රහ්මචාරීහි පුට්ඨො න මඞ්කු භවිස්සාමි'ති, පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං.

ඉමෙ බො භික්ඛවෙ දස ධම්මා පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බා'ති, ඉදමවොච භගවා. අත්තමනා තෙ භික්ඛු භගවතො භාසිතං අභි නන්දුන්ති.

## 7

## මහා මඞ්ගල සුත්තං

එවං මෙ සුතං එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. අථ ඛො, අඤ්ඤතරා දෙවතා අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණා කෙවලකප්පං ජෙතවනං ඔභාසෙත්වා යෙන භගවා තෙනුපසංකමි. උපසංකමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තා ඨිතා ඛො සා දෙවතා භගවන්තං ගාථාය අජ්ඣභාසි.

1. බහු දෙවා මනුස්සා ච - මඞ්ගලානි අචින්තයුං
   ආකඞ්ඛමානා සොත්ථානං බ්‍රෑහි - මඞ්ගලමුත්තමං.

2. අසෙවනා ච බාලානං - පණ්ඩිතානං ච සෙවනා
   පූජා ච පූජනීයානං - එතං මඞ්ගලමුත්තමං.

3. පතිරූපදෙස වාසො ච- පුබ්බෙච කතපුඤ්ඤතා
   අත්තසම්මාපණිධි ච - එතං මඞ්ගලමුත්තමං.

4. බාහුසච්චං ච සිප්පං ච - විනයො ච සුසික්ඛිතො
   සුභාසිතා ච යා වාචා - එතං මඞ්ගලමුත්තමං.

Non-Commercial Distribution

5. මාතාපිතු උපට්ඨානං-පුත්තදරස්ස සඞ්ගහො
අනාකුලා ච කම්මන්තා-එතං මඞ්ගලමුත්තමං.

6. දනං ච ධම්මචරියා ච- ඤාතකානං ච සඞ්ගහො
අනවජ්ජානි කම්මානි-එතං මඞ්ගලමුත්තමං.

7. ආරති විරති පාපා-මජ්ජපානා ච සඤ්ඤමො
අප්පමාදෙ ච ධම්මෙසු-එතං මඞ්ගලමුත්තමං.

8. ගාරවො ච නිවාතො ච-සන්තුට්ඨි ච
කතඤ්ඤුතා
කාලෙන ධම්මසවණං-එතං මඞ්ගලමුත්තමං.

9. ඛන්ති ච සොවචස්සතා-සමණානං ච දස්සනං
කාලෙන ධම්ම සාකච්ඡා-එතං මඞ්ගලමුත්තමං.

10. තපො ච බ්‍රහ්මචරියං ච-අරියසච්චානදස්සනං
නිබ්බාණසච්ඡිකිරියා ච-එතං මඞ්ගලමුත්තමං.

11. ඵුට්ඨස්ස ලොකධම්මෙහි-චිත්තං යස්ස න කම්පති
අසොකං විරජං ඛෙමං- එතං මඞ්ගලමුත්තමං.

12. එතාදිසානි කත්වාන-සබ්බත්ථ මපරාජිතා
සබ්බත්ථ සොත්ථිං ගච්ඡන්ති තං-තෙසං
මඞ්ගලමුත්තමංති.

Non-Commercial Distribution

# 8

## රතන සුත්තං

1. යානීධ භූතානි සමාගතානි
භුම්මානි වා යානි ව අන්තලික්ඛෙ
සබ්බෙව භූතා සුමනා භවන්තු
අථො 'පි සක්කච්ච සුණන්තු භාසිතං.

2. තස්මා හි භූතා නිසාමෙථ සබ්බෙ
මෙත්තං කරොථ මානුසියා පජාය
දිවා ච රත්තො ච හරන්ති යෙ බලිං
තස්මා හි නෙ රක්ඛථ අප්පමත්තා.

3. යං කිඤ්චි විත්තං ඉධ වා හුරං වා
සග්ගෙසු වා යං රතනං පණීතං
න නො සමං අත්ථි තථාගතෙන
ඉදම්පි බුද්ධෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු.

4. ඛයං විරාගං අමතං පණීතං
යදජ්ඣගා සක්‍යමුනී සමාහිතො
න තෙන ධම්මෙන සමත්ථි කිඤ්චි
ඉදම්පි ධම්මෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු.

Non-Commercial Distribution

5. යං බුද්ධසෙට්ඨො පරිවණ්ණයි සුචිං
සමාධිමානන්තරිකඤ්ඤමාහු
සමාධිනා තෙන සමො න විජ්ජති
ඉදම්පි ධම්මෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු.

6. යෙ පුග්ගලා අට්ඨ සතං පසත්ථා
චත්තාරි එතානි යුගානි හොන්ති
තෙ දක්ඛිණෙය්‍යා සුගතස්ස සාවකා
එතෙසු දින්නානි මහප්ඵලානි
ඉදම්පි සඞ්ඝෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු.

7. යෙ සුප්පයුත්තා මනසා දළ්හෙන
නික්කාමිනො ගොතම සාසනම්හි
තෙ පත්තිපත්තා අමතං විගය්හ
ලද්ධා මුධා නිබ්බුතිං භුඤ්ජමානා
ඉදම්පි සඞ්ඝෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු.

8. යථි'න්දඛීලො පඨවිංසිතො සියා
චතුබ්භි වාතෙහි අසම්පකම්පියො
තථූපමං සප්පුරිසං වදමි
යො අරියසච්චානි අවෙච්ච පස්සති
ඉදම්පි සඞ්ඝෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු.

Non-Commercial Distribution

9. යෙ අරියසච්චානි විභාවයන්ති
ගම්භීර පඤ්ඤෙන සුදෙසිතානි
කිඤ්චාපි තෙ හොන්ති භුසප්පමත්තා
න තෙ භවං අට්ඨමං ආදියන්ති
ඉදම්පි සඞ්ඝෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු.

10. සහාවස්ස දස්සනසම්පදාය
තයස්සු ධම්මා ජහිතා භවන්ති
සක්කායදිට්ඨි විචිකිච්ඡිතං ච
සීලබ්බතං වා පි යදත්ථි කිඤ්චි
චතූහපායෙහි ච විප්පමුත්තො
ඡ චා’භිඨානානි අභබ්බො කාතුං
ඉදම්පි සඞ්ඝෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු.

11. කිඤ්චාපි සො කම්මං කරොති පාපකං
කායෙන වාචා උද චෙතසා වා
අභබ්බො සො තස්ස පටිච්ඡාදාය
අභබ්බතා දිට්ඨපදස්ස වුත්තා
ඉදම්පි සඞ්ඝෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු.

12. වනප්පගුම්බෙ යථා ඵුස්සිතග්ගෙ
ගිම්හානමාසෙ පඨමස්මිං ගිම්හෙ
තථූපමං ධම්මවරං අදෙසයි
නිබ්බාණගාමිං පරමං හිතාය
ඉදම්පි බුද්ධෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු.

Non-Commercial Distribution

13. වරො වරඤ්ඤූවරදෙ වරාහරො
අනුත්තරො ධම්මවරං අදෙසයි
ඉදම්පි බුද්ධෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු.

14. ඛීණං පුරාණං නවං නත්ථි සම්භවං
විරත්තචිත්තා ආයතිකෙ භවස්මිං
තෙ ඛීණබීජා අවිරූළ්හිච්ඡන්දා
නිබ්බන්ති ධීරා යථා යං පදීපො
ඉදම්පි සඞ්ඝෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු.

15. යානීධ භූතානි සමාගතානි
භුම්මානි වා යානි ව අන්තලික්ඛෙ
තථාගතං දෙවමනුස්ස පූජිතං
බුද්ධං නමස්සාම සුවත්ථි හොතු.

16. යානීධ භූතානි සමාගතානි
භුම්මානි වා යානි ව අන්තලික්ඛෙ
තථාගතං දෙවමනුස්ස පූජිතං
ධම්මං නමස්සාම සුවත්ථි හොතු.

17. යානීධ භූතානි සමාගතානි
භුම්මානි වා යානි ව අන්තලික්ඛෙ
තථාගතං දෙවමනුස්ස පූජිතං
සඞ්ඝං නමස්සාම සුවත්ථි හොතු.

Non-Commercial Distribution

# 9
# කරණීය - මෙත්ත සුත්තං

1. කරණීයමත්ථ කුසලෙන
යං තං සන්තං පදං අභිසමෙච්ච
සක්කො උජූ ච සූජූ ච
සුවචො'චස්ස මුදු අනතිමානී.

2. සන්තුස්සකො ච සුභරො ච
අප්පකිච්චො ච සල්ලහුකවුත්ති
සන්තින්ද්‍රියො ච නිපකො ච
අප්පගබ්භො කුලෙසු අනනුගිද්ධො

3. න ච ඛුද්දං සමාචරෙ කිඤ්චි
යෙන විඤ්ඤූ පරෙ උපවදෙය්‍යුං
සුඛිනො වා ඛෙමිනො හොන්තු
සබ්බෙ සත්තා භවන්තු සුඛිතත්තා.

4. යෙ කෙචි පාණභූත'ත්ථි
තසා වා ථාවරා වා අනවසෙසා
දීඝා වා යෙ මහන්තාවා
මජ්ඣිමා රස්සක අණුකථූලා.

Non-Commercial Distribution

5. දිට්ඨා වා යෙව අද්දිට්ඨා
යෙ ච දූරෙ වසන්ති අවිදූරෙ
භූතා වා සම්භවෙසී වා
සබ්බෙ සත්තා භවන්තු සුඛිතත්තා.

6. න පරො පරං නිකුබ්බෙථ
නා'තිමඤ්ඤෙථ කත්ථචි නං කඤ්චි
බ්‍යාරොසනා පටිඝසඤ්ඤා
නාඤ්ඤමඤ්ඤස්ස දුක්ඛමිච්ඡෙය්‍ය.

7. මාතා යථා නියං පුත්තං
ආයුසා එකපුත්ත මනුරක්ඛෙ
එවම්පි සබ්බ භූතෙසු
මානසං භාවයෙ අපරිමාණං

8. මෙත්තං ච සබ්බලොකස්මිං
මානසං භාවයෙ අපරිමාණං
උද්ධං අධො ච තිරියං ච
අසම්බාධං අවෙරං අසපත්තං.

9. තිට්ඨං චරං නිසින්නො වා
සයානො වා යාවතස්ස විගතමිද්ධො
එතං සතිං අධිට්ඨෙය්‍ය
බ්‍රහ්මමෙතං විහාරං ඉධමාහු.

10. දිට්ඨිං ච අනුපගම්ම සීලවා
දස්සනෙන සම්පන්නො
කාමෙසු විනෙය්‍ය ගෙධං
නහි ජාතු ගබ්භසෙය්‍යං පුනරෙතී'ති.

Non-Commercial Distribution

# 10
# ඛන්ධ පරිත්තං

1. එවං මෙ සුතං, එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන සාවත්ථියං අඤ්ඤතරො භික්ඛු අහිනා දට්ඨො කාලකතො හොති.

2. අථ ඛො සම්බහුලා භික්ඛූ යෙන භගවා තෙනුපසංකමිංසු. උපසංකමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නා ඛො තෙ භික්ඛූ භගවන්තං එතදවොචුං.

3. ඉධ භන්තෙ, සාවත්ථියං අඤ්ඤතරො භික්ඛු අහිනාදට්ඨො කාලකතො'ති. නහ නූන සො භික්ඛවෙ භික්ඛු චත්තාරි අහිරාජකුලානි මෙත්තෙන චිත්තෙන ඵරි. සචෙ හි සො භික්ඛවෙ භික්ඛු චත්තාරි අහිරාජකුලානි මෙත්තෙන චිත්තෙන ඵරෙය්‍ය. න හි සො භික්ඛවෙ භික්ඛු අහිනාදට්ඨො කාලංකරෙය්‍ය.

Non-Commercial Distribution

4. කතමානි චත්තාරි අහිරාජකුලානි? විරූපක්ඛං අහිරාජකුලං, ඒරාපථං අහිරාජකුලං, ඡබ්‍යා පුත්තං අහිරාජකුලං, කණ්හාගොතමකං අහිරාජකුලං....

5. න හ නූන සො භික්ඛවෙ භික්ඛු ඉමානි චත්තාරි අහිරාජකුලානි මෙත්තෙන චිත්තෙන ඵරි. ස චෙ හි සො භික්ඛවෙ භික්ඛු ඉමානි චත්තාරි අහිරාජකුලානි මෙත්තෙන චිත්තෙන ඵරෙය්‍ය. න හි සො භික්ඛවෙ භික්ඛු අහිනා දට්ඨො කාලං කරෙය්‍ය.

6. අනුජානාමි භික්ඛවෙ ඉමානි චත්තාරි අහිරාජකුලානි මෙත්තෙන චිත්තෙන ඵරිතුං, අත්ත ගුත්තියා, අත්තරක්ඛාය, අත්තපරිත්තාය'ති....

7. ඉදමවොච භගවා, ඉදං වත්වා සුගතො අථාපරං එත'දවොච සත්ථා....

8. විරූපක්ඛෙහි මෙ මෙත්තං - මෙත්තං
ඒරාපථෙහි මෙ
ඡබ්‍යාපුත්තෙහි මෙ මෙත්තං - මෙත්තං
කණ්හාගොතමකෙහි ච.

9. අපාදකෙහි මෙ මෙත්තං - මෙත්තං
දිපාදකෙහි මෙ
චතුප්පදෙහි මෙ මෙත්තං - මෙත්තං
බහුප්පදෙහි මෙ.

Non-Commercial Distribution

10. මා මං අපාදකො හිංසි - මා මං හිංසි ද්විපාදකො
මා මං චතුපපදො හිංසි - මා මං හිංසි බහුපපදො.

11. සබෙබ සතතා සබෙබ පාණා - සබෙබ
භූතා ච කෙවලා
සබෙබ භද්‍රානි පසසනතු - මා කිඤචි
පාපමාගමා.

12. අපපමාණො බුදෙධා, අපපමාණො ධමෙමා, අපප
මාණො සඞෙඝා. පමාණවනතානි සිරිංසපානි
අහි, විචජිකා, සතපදී, උණණානාභි, සරබූ,
මූසිකා, කතා මෙ රකඛා කතා මෙ පරිතතා,
පටිකකමනතු භූතානි, සො'හං නමො භගවතො
නමො සතතනනං සමමා සමබුදධානනති.

## 11
## මෙතතානිසංස සුතතං

1. එවං මෙ සුතං, එකං සමයං භගවා සාවතථියං
විහරති ජෙතවනෙ අනාථපිණඩිකසස ආරාමෙ. තත්‍ර
ඛො භගවා භිකඛූ ආමනෙතසි භිකඛවො'ති
භදනෙත'ති තෙ භිකඛූ භගවතො පචචසෙසාසුං,
භගවා එතදවොච.

Non-Commercial Distribution

2. මෙත්තාය භික්ඛවෙ චෙතො විමුත්තියා ආසෙවිතාය භාවිතාය බහුලීකතාය යානීකතාය වත්ථුකතාය අනුට්ඨිතාය පරිචිතාය සුසමාරද්ධාය, එකාදසානිසංසා පාටිකඩ්ඛා. කතමෙ එකාදස?

3. 1. සුඛං සුපති, 2. සුඛං පටිබුජ්ඣති, 3. න පාපකං සුපිනං පස්සති, 4. මනුස්සානං පියො හොති, 5. අමනුස්සානං පියො හොති, 6. දෙවතා රක්ඛන්ති, 7. නාස්ස අග්ගිවා විසං වා සත්ථං වා කමති, 8. තුවටං චිත්තං සමාධියති, 9. මුඛ වණ්ණො විප්පසීදති, 10. අසම්මූළ්හො කාලං කරොති, 11. උත්තරිං අප්පටිවිජ්ඣන්තො බ්‍රහ්මලොකූපගො හොති.

4. මෙත්තාය භික්ඛවෙ චෙතොවිමුත්තියා, ආසෙවිතාය භාවිතාය බහුලීකතාය යානීකතාය, වත්ථු කතාය අනුට්ඨිතාය පරිචිතාය සුසමාරද්ධාය, ඉමෙ එකාදසානිසංසා පාටිකඩ්ඛාති.

5. ඉදමවොච භගවා, අත්තමනා තෙ භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්ති.

## 12

## මිත්තානිසංස සුත්තං

1. පහූත භක්ඛො භවති - විප්පවුත්ථො සකා ඝරා බහූනං උපජීවන්ති - යො මිත්තානං න දූහති.

Non-Commercial Distribution

2. යං යං ජනපදං යාති - නිගමෙ රාජධානියො
සබ්බත්ථ පූජිතො හොති - යො මිත්තානං
න දූභති.

3. නාස්ස චොරා පසහන්ති - නාතිමඤ්ඤෙති
ඛත්තියො
සබ්බෙ අමිත්තෙ තරති - යො මිත්තානං න දූභති

4. අක්කුද්ධො සඝරං එති - සභාය පටිනන්දිතො
ඤාතීනං උත්තමො හොති - යො මිත්තානං
න දූභති.

5. සක්කත්වා සක්කතො හොති - ගරු හොති සගාරවො
වණ්ණකිත්තිභතො හොති - යො මිත්තානං
න දූභති.

6. පූජකො ලභතෙ පූජං - වන්දකො පටිවන්දනං
යසො කිත්තිඤ්ච පප්පොති - යො මිත්තානං
න දූභති.

7. අග්ගි යථා පජ්ජලති - දෙවතා ව විරොචති
සිරියා අජහිතො හොති - යො මිත්තානං
න දූභති.

8. ගාවො තස්ස පජායන්ති - ඛෙත්තෙ වුත්තං විරූහති
පුත්තානං ඵලමස්නාති - යො මිත්තානං න දූභති.

9. දරිතො පබ්බතාතො වා - රුක්ඛාතො
පතිතො නරො
චුතො පතිට්ඨං ලභති - යො මිත්තානං න දූභති.

10. විරූළ්හ මූලසන්තානං - නිග්‍රොධමිව මාලුතො
අමිත්තා නප්පසහන්ති - යො මිත්තානං න දූභතීති.

## 13
## මොර පරිත්තං

1. උදෙතයං චක්ඛුමා එකරාජා
හරිස්සවණ්ණො පඨවිප්පභාසො
තං තං නමස්සාමි හරිස්සවණ්ණං පඨවිප්පභාසං
තයජ්ජ ගුත්තා විහරෙමු දිවසං.

2. යෙ බ්‍රාහ්මණා වෙදගූ සබ්බධම්මෙ
තෙ මෙ නමො තෙ ච මං පාලයන්තු
නමත්ථු බුද්ධානං නමත්ථු බොධියා
නමො විමුත්තානං නමො විමුත්තියා
ඉමං සො පරිත්තං කත්වා මොරො චරති එසනා.

3. අපෙතයං චක්ඛුමා එකරාජා
හරිස්සවණ්ණො පඨවිප්පභාසො
තං තං නමස්සාමි හරිස්සවණ්ණං පඨවිප්පභාසං
තයජ්ජගුත්තා විහරෙමු රත්තිං

Non-Commercial Distribution

4. යෙ බ්‍රාහ්මණා වෙදගු සබ්බධම්මෙ
තෙ මෙ නමො තෙ ච මං පාලයන්තු
නමත්‍ථු බුද්ධානං නමත්‍ථු බොධියා
නමො විමුත්තානං නමො විමුත්තියා
ඉමං සො පරිත්තං කත්‍වා මොරො වාසමකප්පයී’ති

## 14
## චන්ද පරිත්තං

1. එවං මෙ සුතං, එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන චන්දිමා දෙව පුත්තො රාහුනා අසුරින්දෙන ගහිතො හොති. අථඛො චන්දිමා දෙව පුත්තො භගවන්තං අනුස්සරමානො තායං වෙලායං ඉමං ගාථං අභාසි.

2. නමො තෙ බුද්ධ වීරත්‍ථු - විප්පමුත්තො’සි සබ්බධි
සම්බාධපටිපන්නොස්මි - තස්ස මෙ සරණං භවා’ති

3. අථ ඛො භගවා චන්දිමං දෙවපුත්තං ආරබ්භ රාහුං අසුරින්දං ගාථාය අජ්ඣභාසි.

4. තථාගතං අරහන්තං චන්දිමා සරණං ගතො
රාහු චන්දං පමුඤ්චස්සු - බුද්ධා ලොකානු
කම්පකා’ති

Non-Commercial Distribution

5. අථ ඛො රාහු අසුරින්දො චන්දිමං දෙවපුත්තං මුඤ්චිත්වා තරමානරූපො යෙන වෙපචිත්ති අසුරින්දො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා සංවිග්ගො ලොමහට්ඨජාතො එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතං ඛො රාහුං අසුරින්දං වෙපචිත්ති අසුරින්දො ගාථාය අජ්ඣභාසි.

6. කින්නු සන්තරමානො ව - රාහු චන්දං පමුඤ්චසි,
සංවිග්ගරූපො ආගම්ම - කින්නු භීතො'ව තිට්ඨසී'ති

7. සත්තධා මෙ ඵලෙ මුද්ධා -ජීවන්තො
න සුඛං ලභෙ
බුද්ධගාථා'භිගීතොම්හි - නො චෙ
මුඤ්චෙය්‍ය චන්දිමන්ති.

## 15
## සූරිය පරිත්තං

1. එවං මෙ සුතං, එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන සූරියො දෙවපුත්තො රාහුනා අසුරින්දෙන ගහිතො හොති. අථ ඛො සූරියො දෙවපුත්තො භගවන්තං අනුස්සරමානො තායං වෙලායං ඉමං ගාථං අභාසි.

Non-Commercial Distribution

2. නමො තෙ බුද්ධවීර'ත්‍ථු - විප්පමුත්තො'සි සබ්බධි,
සම්බාධ පටිපන්නො'ස්මි - තස්ස මෙ සරණං භවා'ති.

3. අථ ඛො භගවා, සූරියං දෙවපුත්තං ආරබ්භ, රාහුං අසුරින්දං ගාථාහි අජ්ඣභාසි.

4. තථාගතං අරහන්තං - සූරියො සරණං ගතො
රාහු සූරියං පමුඤ්චස්සු - බුද්ධා ලොකානුකම්පකා'ති

5. යො අන්ධකාරෙ තමසි පභඞ්කරො
වෙරොචනො මණ්ඩලි උග්ගතෙජො
මා රාහු ගිලී චරං අන්තලික්ඛෙ
පජං මම රාහු පමුඤ්ච සූරියන්ති.

6. අථ ඛො රාහු අසුරින්දො සූරියං දෙවපුත්තං මුඤ්චිත්වා තරමානරූපො යෙන වෙපචිත්ති අසුරින්දො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා සංවිග්ගො ලොමහට්ඨජාතො එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතං ඛො රාහුං අසුරින්දං වෙපචිත්ති අසුරින්දො ගාථාය අජ්ඣභාසි.

7. කින්නු සන්තරමානො ව - රාහු සූරියං පමුඤ්චසි
සංවිග්ගරූපො ආගම්ම - කින්නු භීතො'ව තිට්ඨසී'ති

8. සත්තධා මෙ ඵලෙ මුද්ධා - ජීවන්තො
න සුඛං ලභෙ
බුද්ධගාථාභි ගීතොම්හි - නො චෙ
මුඤ්චෙය්‍ය සූරියං'ති.

Non-Commercial Distribution

# 16
## ධජග්ග පරිත්තං

1. එවං මෙ සුතං, එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවො'ති, භදන්තෙ'ති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං, භගවා එත'දවොච.

2. භූතපුබ්බං භික්ඛවෙ දෙවාසුරසඞ්ගාමො සමුපබ්‍යුළ්හො අහොසි. අථ ඛො භික්ඛවෙ සක්කො දෙවානමින්දො දෙවෙ තාවතිංසෙ ආමන්තෙසි. සචෙ මාරිසා දෙවානං සඞ්ගාමගතානං උප්පජ්ජෙය්‍ය භයං වා ඡම්භිතත්තං වා ලොමහංසො වා මමෙව තස්මිං සමයෙ ධජග්ගං උල්ලොකෙය්‍යාථ, මමං හි වො ධජග්ගං උල්ලොකයතං, යං භවිස්සති භයං වා ඡම්භිතත්තං වා ලොමහංසො වා සො පහීයිස්සති.

3. නො චෙ මෙ ධජග්ගං උල්ලොකෙය්‍යාථ, අථ පජාපතිස්ස දෙවරාජස්ස ධජග්ගං උල්ලොකෙය්‍යාථ, පජාපතිස්ස හි වො දෙවරාජස්ස ධජග්ගං උල්ලොකයතං, යං භවිස්සති භයං වා ඡම්භිතත්තං වා ලොමහංසො වා සො පහීයිස්සති.

Non-Commercial Distribution

4. නො චෙ පජාපතිස්ස දෙවරාජස්ස ධජග්ගං උල්ලොකෙය්‍යාථ. අථ වරුණස්ස දෙවරාජස්ස ධජග්ගං උල්ලොකෙය්‍යාථ. වරුණස්ස හි වො දෙවරාජස්ස ධජග්ගං උල්ලොකයතං, යං භවිස්සති භයං වා ඡම්භිතත්තං වා ලොමහංසො වා සො පහීයිස්සති.

5. නො චෙ වරුණස්ස දෙවරාජස්ස ධජග්ගං උල්ලොකෙය්‍යාථ. අථ ඊසානස්ස දෙවරාජස්ස ධජග්ගං උල්ලොකෙය්‍යාථ. ඊසානස්ස හි වො දෙව රාජස්ස ධජග්ගං උල්ලොකයතං, යං භවිස්සති භයං වා ඡම්භිතත්තං වා ලොමහංසො වා සො පහීයිස්සති.

6. තං ඛො පන භික්ඛවෙ සක්කස්ස වා දෙවා-නමින්දස්ස ධජග්ගං උල්ලොකයතං, පජාපතිස්ස වා දෙවරාජස්ස ධජග්ගං උල්ලොකයතං, වරුණස්ස වා දෙවරාජස්ස ධජග්ගං උල්ලොකයතං, ඊසානස්ස වා දෙවරාජස්ස ධජග්ගං උල්ලොකයතං, යං භවිස්සති භයං වා ඡම්භිතත්තං වා ලොමහංසො වා සො පහීයෙථා’පි නො’පි පහීයෙථ, තං කිස්ස හෙතු?

7. සක්කො භික්ඛවෙ දෙවානමින්දො අවීතරාගො අවීතදොසො අවීතමොහො භීරුඡම්භී උත්‍රාසී පලායී’ති

8. අහං ච ඛො භික්ඛවෙ එවං වදාමි. සචෙ තුම්හාකං භික්ඛවෙ අරඤ්ඤගතානං වා රුක්ඛමූල ගතානං වා සුඤ්ඤාගාරගතානං වා උප්පජ්ජෙය්‍ය භයං වා ඡම්භිතත්තං වා ලොමහංසො වා, මමෙව තස්මිං සමයෙ අනුස්සරෙය්‍යාථ.

9. ඉතිපි සො භගවා අරහං සමමා සමබුදෙධා
විජජාචරණ සමපනෙනා සුගතොලොකවිදූ අනුතත-
රො පුරිස දමමසාරථි සතථා දෙවමනුසසානං බුදෙධා
භගවා'ති.

10. මමං හි වො භිකඛවෙ අනුසසරතං. යං භවිසසති
භයං වා ඡමභිතතතං වා ලොමහංසොවා සො පහියිසසති.

11. නො චෙ මං අනුසසරෙයයාථ. අථ ධමමං
අනුසසරෙයයාථ.

12. සවාකඛාතො භගවතා ධමෙමා, සනදිටඨි-
කො අකාලිකො එහිපසසිකො ඔපනයිකො
පචචතතං වෙදිතබෙබා විඤඤූහී'ති. ධමමංහි වො
භිකඛවෙ අනුසසරතං, යං භවිසසති භයං වා ඡමභි-
තතතං වා ලොමහංසො වා සො පහියිසසති.

13. නො චෙ ධමමං අනුසසරෙයයාථ, අථ
සඞඝං අනුසසරෙයයාථ.

14. සුපටිපනෙනා භගවතො සාවකසඞෙඝා
උජුපටිපනෙනා භගවතො සාවකසඞෙඝා, ඤායපටි-
පනෙනා භගවතො සාවකසඞෙඝා, සාමීචිපටිපනෙනා
භගවතො සාවකසඞෙඝා, යදිදං චතතාරි පුරිසයුගානි
අටඨපුරිසපුගගලා එස භගවතො සාවකසඞෙඝා
ආහුනෙයයො, පාහුනෙයයො, දකඛිණෙයයො,
අඤජලිකරණීයො, අනුතතරං පුඤඤකෙඛතතං
ලොකසසා'ති.

Non-Commercial Distribution

15. සඞ්ඝං හි වො භික්ඛවෙ අනුස්සරතං, යං භවිස්සති භයං වා ඡම්භිතත්තං වා ලොමහංසො වා සො පහීයිස්සති. තං කිස්ස හෙතු?

16. තථාගතො භික්ඛවෙ අරහං සම්මා සම්බුද්ධො, වීතරාගො වීතදොසො වීතමොහො, අභීරු අච්ඡම්භි අනුත්‍රාසි අපලායී'ති.

17. ඉදමවොච භගවා, ඉදං වත්වා සුගතො අථා'පරං එතදවොච සත්ථා.

18. අරඤ්ඤෙ රුක්ඛමූලෙ වා - සුඤ්ඤාගාරෙව භික්ඛවො
අනුස්සරෙථසම්බුද්ධං - භයං තුම්හාක නො සියා.

19. නො චෙ බුද්ධං සරෙය්‍යාථ - ලොකජෙට්ඨං නරාසභං
අථ ධම්මං සරෙය්‍යාථ - නීයාණිකං සුදෙසිතං.

20. නො චෙ ධම්මං සරෙය්‍යාථ - නියාණිකං සුදෙසිතං
අථ සඞ්ඝං සරෙය්‍යාථ - පුඤ්ඤක්ඛෙත්තං අනුත්තරං.

21. එවං බුද්ධං සරන්තානං - ධම්මං සඞ්ඝඤ්ච භික්ඛවො
භයං වා ඡම්භිතත්තං වා - ලොමහංසො න හෙස්සතී'ති.

පඨමක භාණවාරං නිට්ඨිතං.

Non-Commercial Distribution

## දුතියක භාණවාරං

## 17

# මහාකස්සපත්ථෙර බොජ්ඣඞ්ග පරිත්තං

1. එවං මෙ සුතං එකං සමයං භගවා රාජගහෙ විහරති වෙළුවනෙ කලන්දකනිවාපෙ. තෙන ඛො පන සමයෙන ආයස්මා මහාකස්සපො පිප්ඵලි ගුහායං විහරති ආබාධිකො දුක්ඛිතො බාළ්හ ගිලානො.

2. අථ ඛො භගවා සායණ්හසමයං පතිසල්ලානා වුට්ඨිතො, යෙනායස්මා මහා කස්සපො තෙනුප සඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. නිසජ්ජ ඛො භගවා ආයස්මන්තං මහා කස්සපං එතදවොච.

3. කච්චි? තෙ කස්සප ඛමනීයං, කච්චි? යාපනීයං: කච්චි? දුක්ඛා වෙදනා පටික්කමන්ති නො අභික්කමන්ති: පටික්කමොසානං පඤ්ඤායති නො අභික්කමො'ති.

4. න මෙ භන්තෙ ඛමනීයං, න යාපනීයං බාළ්හා මෙ දුක්ඛා වෙදනා අභික්කමන්ති නො පටික්කමන්ති, අභික්කමොසානං පඤ්ඤායති නො පටික්කමො'ති.

5. සත්තිමෙ කස්සප! බොජ්ඣඞ්ගා, මයා සම්ම දක්ඛාතා භාවිතා බහුලීකතා, අභිඤ්ඤාය සම්බෝධාය නිබ්බාණාය සංවත්තන්ති. කතමෙ සත්ත?

6. සති සම්බොජ්ඣඞ්ගො බො කස්සප, මයා සම්මදක්ඛාතො භාවිතො බහුලීකතො, අභිඤ්ඤාය සම්බෝධාය නිබ්බාණාය සංවත්තති.

7. ධම්මවිචය සම්බොජ්ඣඞ්ගො බො කස්සප, මයා සම්මදක්ඛාතො භාවිතො බහුලීකතො, අභිඤ්ඤාය සම්බෝධාය නිබ්බාණාය සංවත්තති.

8. විරිය සම්බොජ්ඣඞ්ගො බො කස්සප, මයා සම්මදක්ඛාතො භාවිතො බහුලීකතො, අභිඤ්ඤාය සම්බෝධාය නිබ්බාණාය සංවත්තති.

9. පීති සම්බොජ්ඣඞ්ගො බො කස්සප, මයා සම්මදක්ඛාතො භාවිතො බහුලීකතො, අභිඤ්ඤාය සම්බෝධාය නිබ්බාණාය සංවත්තති.

10. පස්සද්ධි සම්බොජ්ඣඞ්ගො බො කස්සප, මයා සම්මදක්ඛාතො භාවිතො බහුලීකතො, අභිඤ්ඤාය සම්බෝධාය නිබ්බාණාය සංවත්තති.

11. සමාධි සම්බොජ්ඣඞ්ගො බො කස්සප, මයා සම්මදක්ඛාතො භාවිතො බහුලීකතො, අභිඤ්ඤාය සම්බෝධාය නිබ්බාණාය සංවත්තති.

Non-Commercial Distribution

12. උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගො ඛො කස්සප, මයා සම්මදක්ඛාතො භාවිතො බහුලීකතො, අභිඤ්ඤාය සම්බොධාය නිබ්බාණාය සංවත්තති.

13. ඉමෙ ඛො කස්සප සත්තබොජ්ඣඞ්ගා මයා සම්මදක්ඛාතා භාවිතා බහුලීකතා, අභිඤ්ඤාය සම්බොධාය නිබ්බාණාය සංවත්තන්ති'ති.

14. තග්ඝ භගව බොජ්ඣඞ්ගා, තග්ඝ සුගත බොජ්ඣඞ්ගා'ති.

15. ඉදමවොච භගවා අත්තමනො ආයස්මා මහා කස්සපො භගවතො භාසිතං අභිනන්දි.

16. වුට්ඨාහි චා'යස්මා මහාකස්සපො තම්හා ආබාධා, තථා පහීනො 'චායස්මතො මහාකස්සපස්ස සො ආබාධො අහොසී'ති.

## 18

## මහාමොග්ගල්ලානථෙර බොජ්ඣඞ්ග පරිත්තං.

1. එවං මෙ සුතං, එකං සමයං භගවා රාජගහෙ විහරති, වෙළුවනෙ කලන්දකනිවාපෙ, තෙන ඛො පන සමයෙන ආයස්මා මහාමොග්ගල්ලානො ගිජ්ඣකූටෙ පබ්බතෙ විහරති, ආබාධිකො දුක්ඛිතො බාළ්හ ගිලානො.

Non-Commercial Distribution

2. අථ ඛො භගවා සායණ්හසමයං පතිසල්ලානා වුට්ඨිතො, යෙනායස්මා මහා මොග්ගල්ලානො තෙනුපසංකමි, උපසංකමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි, නිසජ්ජ ඛො භගවා ආයස්මන්තං මහා මොග්ගල්ලානං එතදවොච.

3. කච්චි? තෙ මොග්ගල්ලාන ඛමනීයං, කච්චි? යාපනීයං, කච්චි? දුක්ඛා වෙදනා පටික්කමන්ති නො අභික්කමන්ති, පටික්කමොසානං පඤ්ඤායති නො අභික්කමො'ති.

4. න මෙ භන්තෙ ඛමනීයං න යාපනීයං, බාළ්හා මෙ දුක්ඛා වෙදනා අභික්කමන්ති නො පටික්කමන්ති, අභික්කමොසානං පඤ්ඤායති නො පටික්කමො'ති.

5. සත්තිමෙ මොග්ගල්ලාන බොජ්ඣඞ්ගා, මයා සම්මදක්ඛාත ා භාවිතා බහුලීකතා, අභිඤ්ඤාය සම්බොධාය නිබ්බාණාය සංවත්තන්ති, කතමෙ සත්ත?

6. සති සම්බොජ්ඣඞ්ගො ඛො මොග්ගල්ලාන, මයා සම්මදක්ඛාතො භාවිතො බහුලීකතො, අභිඤ්ඤාය සම්බොධාය නිබ්බාණාය සංවත්තති.

7. ධම්මවිචය සම්බොජ්ඣඞ්ගො ඛො මොග්ග-ල්ලාන, මයා සම්මදක්ඛාතොභාවිතො බහුලීකතො, අභිඤ්ඤාය සම්බොධාය නිබ්බාණාය සංවත්තති.

8. විරිය සම්බොජ්ඣඞ්ගො ඛො මොග්ගල්ලාන, මයා සම්මදක්ඛාතො භාවිතො බහුලීකතො. අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති.

9. පීති සම්බොජ්ඣඞ්ගො ඛො මොග්ගල්ලාන, මයා සම්මදක්ඛාතො භාවිතො බහුලීකතො අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති.

10. පස්සද්ධි සම්බොජ්ඣඞ්ගො ඛො මොග්ගල්ලාන, මයා සම්මදක්ඛාතො භාවිතො බහුලීකතො අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති.

11. සමාධි සම්බොජ්ඣඞ්ගො ඛො මොග්ගල්ලාන, මයා සම්මදක්ඛාතො භාවිතො බහුලීකතො, අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති.

12. උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගො ඛො මොග්ගල්ලාන, මයා සම්මදක්ඛාතො භාවිතො බහුලීකතො අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති.

13. ඉමෙ ඛො මොග්ගල්ලාන සත්ත බොජ්ඣඞ්ගා, මයා සම්මදක්ඛාතා භාවිතා බහුලීකතා, අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තන්ති.

14. තග්ඝ භගව බොජ්ඣඞ්ගා, තග්ඝ සුගත බොජ්ඣඞ්ගා'ති.

Non-Commercial Distribution

15. ඉදමවොච, භගවා, අත්තමනො ආයසමා මහාමොග්ගල්ලානො භගවතො භාසිතං අභිනන්දි.

16. වුට්ඨාහි චායසමා මහාමොග්ගල්ලානො තම්හා ආබාධා, තථා පහීනොචායසමතො මහා මොග්ගල්ලානස්ස සො ආබාධො අහොසී'ති.

## 19

## මහා චුන්දත්ථෙර බොජ්ඣඞ්ග පරිත්තං.

1. එවං මෙ සුතං, එකං සමයං භගවා රාජගහෙ විහරති, වෙළුවනෙ කලන්දකනිවාපෙ. තෙන ඛො පන සමයෙන භගවා ආබාධිකො හොති දුක්ඛිතො බාළ්හගිලානො.

2. අථඛො ආයසමා මහාචුන්දො සායණ්හසමයං පතිසල්ලානා වුට්ඨිතො, යෙනභගවා, තෙනුපසංකමි. උපසංකමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො ආයසමන්තං මහා චුන්දං භගවා එතදවොච. පටිභන්තු තං චුන්ද බොජ්ඣඞ්ගා'ති.

3. සත්තිමෙ භන්තෙ බොජ්ඣඞ්ගා භගවතා සම්මදක්ඛාතා භාවිතා බහුලීකතා, අභිඤ්ඤාය සම්බොධාය නිබ්බාණාය සංවත්තන්ති. කතමෙ සත්ත?

4. සති සම්බොජ්ඣඞ්ගො ඛො භන්තෙ, භගවතා සම්මදක්ඛාතො භාවිතො බහුලීකතො, අභිඤ්ඤාය සම්බොධාය නිබ්බාණාය සංවත්තති.

5. ධම්මවිචය සම්බොජ්ඣඞ්ගො ඛො භන්තෙ භගවතා සම්මදක්ඛාතො භාවිතො බහුලීකතො අභිඤ්ඤාය සම්බොධාය නිබ්බාණාය සංවත්තති.

6. විරිය සම්බොජ්ඣඞ්ගො ඛො භන්තෙ, භගවතා සම්මදක්ඛාතො භාවිතො බහුලීකතො, අභිඤ්ඤාය සම්බොධාය නිබ්බාණාය සංවත්තති.

7. පීති සම්බොජ්ඣඞ්ගො ඛො භන්තෙ භගවතා සම්මදක්ඛාතො භාවිතො බහුලීකතො, අභිඤ්ඤාය සම්බොධාය නිබ්බාණාය සංවත්තති.

8. පස්සද්ධි සම්බොජ්ඣඞ්ගො ඛො භන්තෙ, භගවතා සම්මදක්ඛාතො භාවිතො බහුලීකතො, අභිඤ්ඤාය සම්බොධාය නිබ්බාණාය සංවත්තති.

9. සමාධි සම්බොජ්ඣඞ්ගො ඛො භන්තෙ, භගවතා සම්මදක්ඛාතො භාවිතො බහුලීකතො, අභිඤ්ඤාය සම්බොධාය නිබ්බාණාය සංවත්තති.

10. උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගො ඛො භන්තෙ, භගවතා සම්මදක්ඛාතො භාවිතො බහුලීකතො, අභිඤ්ඤාය සම්බොධාය නිබ්බාණාය සංවත්තති.

Non-Commercial Distribution

11. ඉමෙ ඛො භන්තෙ සත්ත බොජ්ඣඞ්ගා, භගවතා සම්මදක්ඛාතා භාවිතා බහුලීකතා. අභිඤ්ඤාය සම්බොධාය නිබ්බාණාය සංවත්තන්ති.

12. තග්ඝ චුන්ද බොජ්ඣඞ්ගා, තග්ඝ චුන්ද බොජ්ඣඞ්ගා'ති.

13. ඉදමවොච'යස්මා මහාචුන්දො, සමනුඤ්ඤො සත්ථා අහොසි. වුට්ඨාහි ච භගවා තම්හා ආබාධා. තථා පහීනොච භගවතො සො ආබාධො අහොසී'ති.

## 20

## ගිරිමානන්ද සුත්තං

1. එවං මෙ සුතං, එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන ආයස්මා ගිරිමානන්දො ආබාධිකො හොති දුක්ඛිතො බාළ්හගිලානො.

2. අථ ඛො ආයස්මා ආනන්දො, යෙන භගවා තෙනුපසංකමි උපසංකමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච.

Non-Commercial Distribution

3. ආයස්මා භන්තෙ ගිරිමානන්දො ආබාධිකො දුක්ඛිතො බාළ්හගිලානො. සාධු භන්තෙ භගවා යෙනායස්මා ගිරිමානන්දො තෙනුපසංකමතු අනුකම්පං උපාදායා'ති,

4. සචෙ ඛො ත්වං ආනන්ද! ගිරිමානන්දස්ස භික්ඛුනො උපසංකමිත්වා දසසඤ්ඤා භාසෙය්‍යාසි, ඨානං ඛො පනෙතං විජ්ජති යං ගිරිමානන්දස්ස භික්ඛුනො දසසඤ්ඤා සුත්වා, සො ආබාධො ඨානසො පටිප්පස්සම්භෙය්‍ය. කතමෙ දස?

5. අනිච්ච සඤ්ඤා, අනත්ත සඤ්ඤා, අසුභ සඤ්ඤා, ආදීනව සඤ්ඤා, පහාන සඤ්ඤා, විරාග සඤ්ඤා, නිරොධ සඤ්ඤා, සබ්බලොකෙ අනභිරත සඤ්ඤා, සබ්බසංඛාරෙසු අනිච්ච සඤ්ඤා, ආනාපාන සති.

6. කතමාචා'නන්ද අනිච්චසඤ්ඤා?

ඉධා'නන්ද භික්ඛු අරඤ්ඤගතො වා රුක්ඛමූලගතො වා සුඤ්ඤාගාරගතො වා ඉතිපටිසංචික්ඛති, රූපං අනිච්චං, වෙදනා අනිච්චා, සඤ්ඤා අනිච්චා, සංඛාරා අනිච්චා, විඤ්ඤාණං අනිච්චන්ති. ඉති ඉමෙසු පඤ්චසුපාදානක්ඛන්ධෙසු අනිච්චානුපස්සී විහරති.

අයං වුච්චතා'නන්ද අනිච්චසඤ්ඤා.

7. කතමාචා'නන්ද අනත්තසඤ්ඤා ?

ඉධා'නන්ද භික්ඛු අරඤ්ඤගතො වා රුක්ඛමූලගතො වා සුඤ්ඤාගාරගතො වා ඉති පටිසංචික්ඛති, චක්ඛුං අනත්තා, රූපා අනත්තා, සොතං අනත්තා, සද්දා අනත්තා, ඝාණං අනත්තා, ගන්ධා අනත්තා, ජිව්හා අනත්තා, රසා අනත්තා, කායො අනත්තා, ඵොට්ඨබ්බා අනත්තා, මනො අනත්තා, ධම්මා අනත්තා'ති.

ඉති ඉමෙසු ඡසු අජ්ඣත්තික බාහිරෙසු ආයතනෙසු අනත්තානුපස්සී විහරති.

අයං වුච්චතා'නන්ද අනත්තසඤ්ඤා.

8. කතමාචා'නන්ද අසුභසඤ්ඤා ?

ඉධා' නන්ද භික්ඛු ඉමමෙව කායං උද්ධං පාදතලා අධො කෙසමත්ථකා තච පරියන්තං පූරං නානප්පකාරස්ස අසුචිනො පච්චවෙක්ඛති.

අත්ථි ඉමස්මිං කායෙ, කෙසා, ලොමා, නඛා, දන්තා, තචො, මංසං, නහාරු, අට්ඨි, අට්ඨිමිඤ්ජා වක්කං, හදයං යකනං කිලොමකං පිහකං පප්ඵාසං, අන්තං අන්තගුණං උදරියං කරීසං, පිත්තං සෙම්හං පුබ්බො ලොහිතං සෙදො මෙදො, අස්සු වසා ඛෙලො සිඞ්ඝාණිකා ලසිකා මුත්ත'න්ති.

ඉති ඉමස්මිං කායෙ අසුභානුපස්සී විහරති.

අයං වුච්චතා'නන්ද අසුභසඤ්ඤා.

Non-Commercial Distribution

9. කතමාචා'නන්ද ආදීනවසඤ්ඤා?

ඉධා' නන්ද භික්ඛු අරඤ්ඤගතො වා රුක්ඛමූලගතො වා සුඤ්ඤාගාරගතො වා ඉති පටිසංචික්ඛති, බහුදුක්ඛො ඛො අයං කායො, බහු ආදීනවො, ඉති ඉමස්මිං කායෙ විවිධා ආබාධා උප්පජ්ජන්ති, සෙය්‍යථිදං? චක්ඛුරොගො, සොතරොගො, ඝාණරොගො, ජිව්හාරොගො, කායරොගො, සීසරොගො, කණ්ණරොගො, මුඛරොගො, දන්තරොගො, කාසො සාසො, පිනාසො, ඩහො, ජරො, කුච්ඡිරොගො, මුච්ඡා, පක්ඛන්දිකා, සූලා, විසූචිකා, කුට්ඨං, ගණ්ඩා, කිලාසො, සොසො, අපමාරො, දද්දු කණ්ඩු, කච්ඡු, රඛසා, විතච්ඡිකා, ලොහිතපිත්තං මධුමෙහො, අංසා පිළකා, භගන්දළා.

පිත්තසමුට්ඨානා ආබාධා, සෙම්හ සමුට්ඨානා ආබාධා, වාත සමුට්ඨානා ආබාධා, සන්නිපාතිකා ආබාධා, උතුපරිනාමජා ආබාධා, විසමපරිහාරජා ආබාධා, ඔපක්කමිකා ආබාධා, කම්මවිපාකජා ආබාධා, සීතං උණ්හං ජිඝච්ඡා පිපාසා උච්චාරො පස්සාවො'ති. ඉති ඉමස්මිං කායෙ ආදීනවානුපස්සී විහරති.

අයං වුච්චතා'නන්ද ආදීනවසඤ්ඤා?

10. කතමාචා'නන්ද පහානසඤ්ඤා?

ඉධා'නන්ද භික්ඛු උප්පන්නං කාමවිතක්කං නාධිවාසෙති පජහති විනොදෙති බ්‍යන්තිකරොති

Non-Commercial Distribution

අනභාවං ගමෙති, උප්පන්නං ව්‍යාපාදවිතක්කං නාධිවාසෙති පජහති විනොදෙති බ්‍යන්තිකරොති අනභාවං ගමෙති, උප්පන්නං විහිංසා විතක්කං නාධිවාසෙති පජහති විනොදෙති බ්‍යන්තිකරොති අනභාවං ගමෙති, උප්පන්නුප්පන්නෙන පාපකෙ අකුසලෙධම්මෙ නාධිවාසෙති පජහති විනොදෙති බ්‍යන්තිකරොති අනභාවං ගමෙති.

අයං වුච්චතා'නන්ද පහාන සඤ්ඤා

11. කතමාචා'නන්ද විරාග සඤ්ඤා?

ඉධා'නන්ද භික්ඛු අරඤ්ඤගතො වා රුක්ඛමූල ගතො වා සුඤ්ඤාගාරගතො වා ඉතිපටිසංචික්ඛති. එතං සන්තං එතං පණීතං, යදිදං සබ්බසංඛාර සමථො සබ්බූපධිපටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිබ්බාණන්ති.

අයං වුච්චතා'නන්ද විරාග සඤ්ඤා.

12. කතමාචා'නන්ද නිරොධසඤ්ඤා?

ඉධා'නන්ද භික්ඛු අරඤ්ඤගතො වා රුක්ඛමූල-ගතො වා සුඤ්ඤාගාරගතොවා ඉතිපටිසංචික්ඛති, එතං සන්තං එතං පණීතං, යදිදං සබ්බසංඛාර සමථො සබ්බූපධි පටිනිස්සග්ගො තණ්හක්ඛයො නිරොධො නිබ්බාණන්ති.

අයං වුච්චතා'නන්ද නිරොධසඤ්ඤා.

Non-Commercial Distribution

13. කතමාචා'නන්ද සබ්බලොකෙ අනභිරත සඤ්ඤා?

ඉධා'නන්ද භික්ඛු යෙ ලොකෙ උපයුපාදනා චෙතසො අධිට්ඨානාභිනිවෙසානුසයා, තෙ පජහන්තො විරමති න උපාදියන්තො.

අයං වුච්චතා'නන්ද සබ්බලොකෙ අනභිරත-සඤ්ඤා?

14. කතමාචා'නන්ද සබ්බසංඛාරෙසු අනිච්ච සඤ්ඤා?

ඉධා'නන්ද භික්ඛු සබ්බසංඛාරෙහි අට්ටියති හරායති ජිගුච්ඡති.

අයං වුච්චතා'නන්ද සබ්බසංඛාරෙසු අනිච්ච-සඤ්ඤා.

15. කතමාචා'නන්ද ආනාපානසති?

ඉධා'නන්ද භික්ඛු අරඤ්ඤගතො වා රුක්ඛමූලගතො වා සුඤ්ඤාගාරගතොවා නිසීදති පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා.

සො සතොව අස්සසති, සතො පස්සසති, දීඝං වා අස්සසන්තො දීඝං අස්සසාමී'ති පජානාති, දීඝං වා පස්සසන්තො දීඝං පස්සසාමීති පජානාති, රස්සං වා

Non-Commercial Distribution

අස්සසන්තො රස්සං අස්සසාමී'ති පජානාති; රස්සං වා පස්සසන්තො රස්සං පස්සසාමී'ති පජානාති; සබ්බකාය පටිසංවෙදී අස්සසිස්සාමී'ති සික්ඛති; සබ්බකාය පටිසංවෙදී පස්සසිස්සාමී'ති සික්ඛති; පස්සම්භයං කාය සංඛාරං අස්සසිස්සාමී'ති සික්ඛති; පස්සම්භයං කාය සංඛාරං පස්සසිස්සාමී'ති සික්ඛති; පීතිපටිසංවෙදී අස්සසිස්සාමී'ති සික්ඛති; පීතිපටිසංවෙදී පස්සසිස්සාමී'ති සික්ඛති; සුඛපටිසංවෙදී අස්සසිස්සාමී'ති සික්ඛති; සුඛපටිසංවෙදී පස්සසිස්සාමී'ති සික්ඛති; චිත්තසංඛාර පටිසංවෙදී අස්සසිස්සාමී'ති සික්ඛති, චිත්තසංඛාර පටිසංවෙදී පස්සසිස්සාමී'ති සික්ඛති; පස්සම්භයං චිත්තසංඛාරං අස්සසිස්සාමී'ති සික්ඛති, පස්සම්භයං චිත්තසංඛාරං පස්සසිස්සාමී'ති සික්ඛති; චිත්තපටිසංවෙදී අස්සසිස්සාමී'ති සික්ඛති; චිත්තපටිසංවෙදී පස්සසිස්සාමී'ති සික්ඛති, අභිප්පමොදයං චිත්තං අස්සසිස්සාමී'ති සික්ඛති; අභිප්පමොදයං චිත්තං පස්සසිස්සාමී'ති සික්ඛති; සමාදහං චිත්තං අස්සසිස්සාමී'ති සික්ඛති; සමාදහං චිත්තං පස්සසිස්සාමී'ති සික්ඛති; විමොචයං චිත්තං අස්සසිස්සාමී'ති සික්ඛති; විමොචයං චිත්තං පස්සසිස්සාමී'ති සික්ඛති; අනිච්චානුපස්සී අස්සසිස්සාමී'ති සික්ඛති; අනිච්චානුපස්සී පස්සසිස්සාමී'ති සික්ඛති; විරාගානුපස්සී

Non-Commercial Distribution

අසසසිසසාමී'ති සිකඛති; විරාගානුපසසී පසස-සිසසාමී'ති සිකඛති; නිරොධානුපසසී අසසසිසසාමී'ති සිකඛති; නිරොධානුපසසී පසසසිසසාමී'ති සිකඛ'ති; පටිනිසසගගානුපසසී අසසසිසසාමී'ති සිකඛ'ති; පටිනිසසගගානුපසසී පසසසිසසාමීති සිකඛති.

අයං වුචචතා'නනද, ආනාපානසති.

16. සචේ ඛො ත්වං ආනනද, ගිරිමානනදසස භිකඛුනො උපසංකමිත්වා ඉමා දස සඤඤා භාසෙයාසි. ඨානං ඛො පනෙ'තං විජජති, යං ගිරිමානනදසස භිකඛුනො ඉමා දස සඤඤා සුත්වා සො ආබාධො ඨානසො පටිපපසසම්භෙයාති.

17. අථ ඛො ආයසමා ආනනෙද භගවතො සනතිකෙ ඉමා දස සඤඤා උගගහෙත්වා යෙනා-යසමා ගිරිමානනෙද තෙනුපසංකමි. උපසංකමිත්වා ආයසමතො ගිරිමානනදසස ඉමා දස සඤඤා අභාසි.

18. අථ ඛො ආයසමතො ගිරිමානනදසස ඉමා දස සඤඤා සුත්වා සො ආබාධො ඨානසො පටිපපසසම්භි. වුටඨාහි චායසමා ගිරිමානනෙද තමහා ආබාධා, තථා පහීනො ච පනායසමතො ගිරිමානනදසස සො ආබාධො අහොසී'ති.

Non-Commercial Distribution

# 21

## ඉසිගිලි සුත්තං

1. එවං මෙ සුතං, එකං සමයං භගවා රාජගහෙ විහරති ඉසිගිලිස්මිං පබ්බතෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවොති' භදන්තෙ'ති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච.

2. පස්සථ නො තුම්හෙ භික්ඛවෙ එතං වෙභාරං පබ්බතන්ති? එවං භන්තෙ, එතස්ස පි ඛො භික්ඛවෙ වෙභාරස්ස පබ්බතස්ස අඤ්ඤාව සමඤ්ඤා අහොසි, අඤ්ඤා පඤ්ඤත්ති...

3. පස්සථ නො තුම්හෙ භික්ඛවෙ එතං පණ්ඩවං පබ්බතන්ති? එවං භන්තෙ, එතස්ස පි ඛො භික්ඛවෙ පණ්ඩවස්ස පබ්බතස්ස අඤ්ඤාව සමඤ්ඤා අහොසි, අඤ්ඤා පඤ්ඤත්ති...

4. පස්සථ නො තුම්හෙ භික්ඛවෙ එතං වෙපුල්ලං පබ්බතන්ති? එවං භන්තෙ, එතස්සපි ඛො භික්ඛවෙ වෙපුල්ලස්ස පබ්බතස්ස අඤ්ඤාව සමඤ්ඤා අහොසි, අඤ්ඤා පඤ්ඤත්ති...

5. පස්සථ නො තුම්හෙ භික්ඛවෙ එතං ගිජ්ඣකූටං පබ්බතන්ති? එවං භන්තෙ, එතස්සපි ඛො භික්ඛවෙ ගිජ්ඣකූටස්ස පබ්බතස්ස අඤ්ඤාව සමඤ්ඤා අහොසි, අඤ්ඤා පඤ්ඤත්ති...

Non-Commercial Distribution

6. පස්සථ නො තුම්හෙ භික්ඛවෙ ඉමං ඉසිගිලිං පබ්බතන්ති? එවං භන්තෙ, ඉමස්සපි ඛො භික්ඛවෙ ඉසිගිලිස්ස පබ්බතස්ස එසා ච සමඤ්ඤා අහොසි, එසා පඤ්ඤත්ති..

7. භූතපුබ්බං, භික්ඛවෙ පඤ්ච පච්චෙකබුද්ධ සතානි ඉමස්මිං ඉසිගිලිස්මිං පබ්බතෙ චිරනිවාසිනො අහෙසුං. තෙ ඉමං පබ්බතං පවිසන්තා දිස්සන්ති, පවිට්ඨා න දිස්සන්ති. තමෙනං මනුස්සා දිස්වා එවමාහංසු. අයං පබ්බතො ඉමෙ ඉසි ගිලතී ති, ඉසිගිලි ඉසිගිලී'ත්වෙව සමඤ්ඤා උදපාදි..

8. ආචික්ඛිස්සාමි භික්ඛවෙ පච්චෙක බුද්ධානං නාමානි. කිත්තයිස්සාමි භික්ඛවෙ පච්චෙක බුද්ධානං නාමානි. දෙසිස්සාමි භික්ඛවෙ පච්චෙකබුද්ධානං නාමානි. තං සුණාථ සාධුකං මනසි කරොථ, භාසිස්සාමී'ති. එවං භන්තෙ'ති ඛො තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං, භගවා එතදවොච.

9. අරිට්ඨො නාම භික්ඛවෙ 'පච්චෙක බුද්ධො, ඉමස්මිං ඉසිගිලිස්මිං පබ්බතෙ චිරනිවාසී අහොසි..

10. උපරිට්ඨො නාම භික්ඛවෙ 'පච්චෙකබුද්ධො, ඉමස්මිං ඉසිගිලිස්මිං පබ්බතෙ චිරනිවාසී අහොසි..

11. තගරසිඛී නාම භික්ඛවෙ 'පච්චෙක බුද්ධො ඉමස්මිං ඉසිගිලිස්මිං පබ්බතෙ චිරනිවාසී අහොසි..

Non-Commercial Distribution

12. යසස්සී නාම භික්ඛවෙ *පච්චෙක බුද්ධො, ඉමස්මිං ඉසිගිලිස්මිං පබ්බතෙ චිරනිවාසී අහොසි..

13. සුදස්සනො නාම භික්ඛවෙ *පච්චෙකබුද්ධො, ඉමස්මිං ඉසිගිලිස්මිං පබ්බතෙ චිරනිවාසී අහොසි..

14. පියදස්සී නාම භික්ඛවෙ *පච්චෙක බුද්ධො, ඉමස්මිං ඉසිගිලිස්මිං පබ්බතෙ චිරනිවාසී අහොසි..

15. ගන්ධාරො නාම භික්ඛවෙ *පච්චෙක බුද්ධො, ඉමස්මිං ඉසිගිලිස්මිං පබ්බතෙ චිරනිවාසී අහොසි..

16. පිණ්ඩොලො නාම භික්ඛවෙ *පච්චෙක බුද්ධො, ඉමස්මිං ඉසිගිලිස්මිං පබ්බතෙ චිරනිවාසී අහොසි..

17. උපාසභො නාම භික්ඛවෙ *පච්චෙකබුද්ධො, ඉමස්මිං ඉසිගිලිස්මිං පබ්බතෙ චිරනිවාසී අහොසි..

18. නීථො නාම භික්ඛවෙ *පච්චෙක බුද්ධො ඉමස්මිං ඉසිගිලිස්මිං පබ්බතෙ චිරනිවාසී අහොසි..

19. තථො නාම භික්ඛවෙ *පච්චෙක බුද්ධො, ඉමස්මිං ඉසිගිලිස්මිං පබ්බතෙ චිරනිවාසී අහොසි..

20. සුතවා නාම භික්ඛවෙ *පච්චෙක බුද්ධො, ඉමස්මිං ඉසිගිලිස්මිං පබ්බතෙ චිරනිවාසී අහොසි..

21. භාවිතත්තො නාම භික්ඛවෙ *පච්චෙක-බුද්ධො, ඉමස්මිං ඉසිගිලිස්මිං පබ්බතෙ චිරනිවාසී අහොසිති..

---

* බොහෝ පොත්වල පච්චේක සම්බුද්ධො

Non-Commercial Distribution

1. යෙ සත්තසාරා අනිඝා නිරාසා
පච්චෙකමෙවජ්ඣගමුං සුබොධිං;
තෙසං විසල්ලානං නරුත්තමානං
නාමානි මෙ කිත්තයතො සුණාථ.

2. අරිට්ඨො උපරිට්ඨො තගරසිඛී යසස්සී
සුදස්සනො පියදස්සී ච බුද්ධො;
ගන්ධාරො පිණ්ඩොලො උපාසභො ච
නීථො තථො සුතවා භාවිතත්තො.

3. සුම්භො සුභො මෙථුලො අට්ඨමො ච
අථස්සු මෙඝො අනිඝො සුදඨො;
පච්චෙක බුද්ධා භවනෙත්තිඛීණා
හිංගු ච හිංගො ච මහානුභාවා.

4. ද්වෙ ජාලිනො මුනිනො අට්ඨකො ච
අථ කොසලො බුද්ධො අථො සුබාහු;
උපනෙමිසො නෙමිසො සන්තචිත්තො
සච්චො තථො විරජො පණ්ඩිතො ච.

5. කාලූපකාලා විජිතො ජිතො ච
අඞ්ගො ච පඞ්ගො ච ගුත්තිජ්ජිතො ච;
පස්සී ජහී උපධිං දුක්ඛමූලං
අපරාජිතො මාරබලං අජෙසි.

6. සත්ථා පවත්තා සරභඞ්ගො ලොමහංසො
උච්චඞ්ගමායො අසිතො අනාසවො;
මනොමයො මානච්ඡිදො ච බන්ධුමා
තදධිමුත්තො විමලො ච කෙතුමා.

Non-Commercial Distribution

7. කෙතුම්භරාගො ච මාතඞ්ගො අරියො
අථච්චුතො අච්චුතගාමබ්‍යාමකො;
සුමඞ්ගලො දබ්බිලො සුප්පතිට්ඨිතො
අසය්හො ඛෙමාභිරතො ච සොරතො.

8. දුරන්නයො සංඝො අථො පි උජ්ජයො
අපරො මුනි සය්හො අනොමනික්කමො;
ආනන්දො නන්දො උපනන්දො ද්වාදස
භාරද්වාජො අන්තිමදෙහධාරී.

9. බොධි මහානාමො අථො පි උත්තරො
කෙසී සිඛී සුන්දරො භාරද්වාජො;
තිස්සූ'පතිස්සා භවබන්ධනච්ඡිදා
උපසීදරී තණ්හච්ඡිදො ච සීදරී.

10. බුද්ධො අහූ මඞ්ගලො වීතරාගො
උසභච්ඡිදා ජාලිනිං දුක්ඛමූලං;
සන්තං පදං අජ්ඣගමූපනීතො
උපොසථො සුන්දරො සච්චනාමො.

11. ජෙතො ජයන්තො පදුමො උප්පලො ච
පදුමුත්තරො රක්ඛිතො පබ්බතො ච;
මානත්ථද්ධො සොභිතො වීතරාගො
කණ්හො ච බුද්ධො සුවිමුත්තචිත්තො.

12. එතෙ ච අඤ්ඤෙ ච මහානුභාවා
පච්චෙකබුද්ධා භවනෙත්තිඛීණා;
තෙ සබ්බසඞ්ගාතිගතෙ මහෙසී
පරිනිබ්බුතෙ වන්දථ අප්පමෙය්‍යෙ'ති.

දුතියක භාණවාරං නිට්ඨිතං.

Non-Commercial Distribution

# 1

# ධම්මචක්කප්පවත්තන සුත්තං

1. එවං මෙ සුතං, එකං සමයං භගවා බාරාණසියං විහරති ඉසිපතනෙ මිගදායෙ, තත්‍ර ඛො භගවා පඤ්චවග්ගියෙ භික්ඛූ ආමන්තෙසි.

2. ද්වෙ මෙ භික්ඛවෙ අන්තා පබ්බජිතෙන න සෙවිතබ්බා, යො චායං කාමෙසු කාමසුඛල්ලිකානුයොගො හීනො ගම්මො පොථුජ්ජනිකො අනරියො අනත්ථසංහිතො යො චායං අත්තකිලමථානුයොගො දුක්ඛො අනරියො අනුත්ථසංහිතො, එතෙ තෙ භික්ඛවෙ උභො අන්තෙ අනුපගම්ම මජ්ඣිමා පටිපදා තථාගතෙන අභිසම්බුද්ධා, චක්ඛුකරණී ඤාණකරණී උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බාණාය සංවත්තති.

3. කතමා ච සා භික්ඛවෙ මජ්ඣිමා පටිපදා තථාගතෙන අභිසම්බුද්ධා, චක්ඛුකරණී ඤාණකරණී උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බාණාය සංවත්තති, අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො, සෙය්‍යථීදං? සම්මාදිට්ඨි සම්මාසඞ්කප්පො සම්මාවාචා සම්මාකම්මන්තො සම්මාආජීවො සම්මාවායාමො සම්මාසති සම්මාසමාධි. අයං ඛො සා භික්ඛවෙ මජ්ඣිමා පටිපදා තථාගතෙන අභිසම්බුද්ධා චක්ඛුකරණී ඤාණකරණී උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බාණාය සංවත්තති.

Non-Commercial Distribution

4. ඉදං ඛො පන භික්ඛවෙ දුක්ඛං අරියසච්චං, ජාති පි දුක්ඛා ජරා පි දුක්ඛා ව්‍යාධිපි දුක්ඛො මරණම්පි දුක්ඛං, අප්පියෙහි සම්පයොගො දුක්ඛො පියෙහි විප්පයොගො දුක්ඛො, යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛං, සංඛිත්තෙන පඤ්චුපාදානක්ඛන්ධා දුක්ඛා.

5. ඉදං ඛො පන භික්ඛවෙ දුක්ඛසමුදයො අරියසච්චං. යායං තණ්හා පොනොභවිකා නන්දිරාග සහගතා තත්‍ර තත්‍රාභිනන්දිනී, සෙය්‍යථීදං? කාම තණ්හා භව තණ්හා විභව තණ්හා.

6. ඉදං ඛො පන භික්ඛවෙ දුක්ඛනිරොධො අරිය සච්චං. යො තස්සා යෙව තණ්හාය, අසෙස- විරාග නිරොධො චාගො පටිනිස්සග්ගො මුත්ති අනාලයො.

7. ඉදං ඛො පන භික්ඛවෙ දුක්ඛනිරොධගාමිනී පටිපදා අරියසච්චං. අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො: සෙය්‍යථීදං? සම්මාදිට්ඨි සම්මා සංකප්පො සම්මා වාචා සම්මා කම්මන්තො සම්මා ආජීවො සම්මා වායාමො සම්මා සති සම්මා සමාධි.

8. ඉදං දුක්ඛං අරියසච්චන්ති මෙ භික්ඛවෙ පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලොකො උදපාදි. තං ඛො පනිදං දුක්ඛං

Non-Commercial Distribution

අරියසච්චං, පරිඤ්ඤෙය්‍යන්ති මෙ භික්ඛවෙ පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු, චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලොකො උදපාදි. තං ඛො පනිදං දුක්ඛං අරියසච්චං, පරිඤ්ඤාතන්ති මෙ භික්ඛවෙ පුබ්බෙ අනනුස්සු-තෙසු ධම්මෙසු, චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලොකො උදපාදි.

9. ඉදං දුක්ඛසමුදයො අරිය සච්චන්ති මෙ භික්ඛවෙ පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලොකො උදපාදි. තං ඛො පනිදං දුක්ඛ-සමුදයො අරියසච්චං, පහාතබ්බන්ති මෙ භික්ඛවෙ පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු, චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලොකො උදපාදි. තං ඛො පනිදං දුක්ඛසමුදයො අරියසච්චං, පහීනන්ති මෙ භික්ඛවෙ පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු, චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලොකො උදපාදි.

10. ඉදං දුක්ඛනිරොධො අරියසච්චන්ති මෙ භික්ඛවෙ පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු, චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලොකො උදපාදි. තං ඛො පනිදං දුක්ඛනිරොධො අරියසච්චං සච්ඡිකාතබ්බන්ති මෙ

Non-Commercial Distribution

භික්ඛවෙ පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු, චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලොකො උදපාදි. තං ඛො පනිදං දුක්ඛනිරොධො අරියසච්චං, සච්ඡිකතන්ති මෙ භික්ඛවෙ පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලොකො උදපාදි.

11. ඉදං දුක්ඛනිරොධ ගාමිනී පටිපදා අරියසච්චන්ති මෙ භික්ඛවෙ පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලොකො උදපාදි. තං ඛො පනිදං දුක්ඛනිරොධගාමිනී පටිපදා අරියසච්චං භාවෙතබ්බන්ති මෙ භික්ඛවෙ පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු, චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලොකො උදපාදි. තං ඛො පනිදං දුක්ඛනිරොධ ගාමිනී පටිපදා අරියසච්චං, භාවිතන්ති මෙ භික්ඛවෙ පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු, චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලොකො උදපාදි.

12. යාවකීවඤ්ච මෙ භික්ඛවෙ ඉමෙසු චතූසු අරියසච්චෙසු එවං තිපරිවට්ටං ද්වාදසාකාරං යථාභූතං ඤාණදස්සනං න සුවිසුද්ධං අහොසි, නෙව තාවාහං භික්ඛවෙ සදෙවකෙ ලොකෙ සමාරකෙ

Non-Commercial Distribution

සබ්‍රහ්මකෙ සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙව-මනුස්සාය අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුද්ධො පච්චඤ්ඤාසිං.

13. යතො ච ඛො මෙ භික්ඛවෙ ඉමෙසු චතූසු අරියසච්චෙසු එවං තිපරිවට්ටං ද්වාදසාකාරං යථාභූතං ඤාණදස්සනං සුවිසුද්ධං අහොසි, අථාහං භික්ඛවෙ සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණ බ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුද්ධො පච්චඤ්ඤාසිං. ඤාණං ච පන මෙ දස්සනං උදපාදි, අකුප්පා මෙ චෙතොවිමුත්ති අයමන්තිමා ජාති, නත්ථිදානි පුනබ්භවො ති.

14. ඉදමවොච භගවා, අත්තමනා පඤ්චවග්ගියා භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්ති.

15. ඉමස්මිං ච පන වෙය්‍යාකරණස්මිං භඤ්ඤමානෙ ආයස්මතො කොණ්ඩඤ්ඤස්ස විරජං වීතමලං ධම්මචක්ඛුං උදපාදි, යං කිඤ්චි සමුදයධම්මං සබ්බං තං නිරොධ ධම්මන්ති.

16. පවත්තිතෙ ච පන භගවතා ධම්මචක්කෙ භුම්මා දෙවා සද්දමනුස්සාවෙසුං, එතං භගවතා බාරාණසියං ඉසිපතනෙ මිගදයෙ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං, අප්පතිවත්තියං සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මින්ති.

Non-Commercial Distribution

භුම්මානං දෙවානං සද්දං සුත්වා චාතුම්මහා-රාජිකා දෙවා සද්දමනුස්සාවෙසුං. එතං භගවතා බාරාණසියං ඉසිපතනෙ මිගදයෙ අනුත්තරං ධම්ම-චක්කං පවත්තිතං, අප්පතිවත්තියං සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මින්ති.

චාතුම්මහාරාජිකානං දෙවානං සද්දං සුත්වා තාවතිංසා දෙවා සද්දමනුස්සාවෙසුං. එතං භගවතා බාරාණසියං ඉසිපතනෙ මිගදයෙ අනුත්තරං ධම්ම-චක්කං පවත්තිතං අප්පතිවත්තියං සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මින්ති.

තාවතිංසානං දෙවානං සද්දං සුත්වා යාමා දෙවා සද්දමනුස්සාවෙසුං. එතං භගවතා බාරාණසියං ඉසිපතනෙ මිගදයෙ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං, අප්පතිවත්තියං සමණෙන වා බ්‍රාහ්ම-ණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මින්ති.

යාමානං දෙවානං සද්දං සුත්වා තුසිතා දෙවා සද්දමනුස්සාවෙසුං. එතං භගවතා බාරාණසියං ඉසිපතනෙ මිගදයෙ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං, අප්පතිවත්තියං සමණෙන වා බ්‍රාහ්ම-ණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මින්ති.

Non-Commercial Distribution

තුසිතානං දෙවානං සද්දං සුත්වා නිම්මාණරති දෙවා සද්දමනුස්සාවෙසුං. එතං භගවතා බාරාණසියං ඉසිපතනෙ මිගදයෙ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං, අප්පතිවත්තියං සමණෙන වා බ්‍රාහම-ණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මින්ති.

නිම්මාණරතීනං දෙවානං සද්දං සුත්වා පරනිම්මිත වසවත්තිනොදෙවා සද්දමනුස්සාවෙසුං. එතංභගවතා බාරාණසියං ඉසිපතනෙ මිගදයෙ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං, අප්පතිවත්තියං සමණෙනවා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මින්ති.

පරනිම්මිතවසවත්තිනං දෙවානං සද්දං සුත්වා බ්‍රහ්මපාරිසජ්ජා දෙවා සද්දමනුස්සාවෙසුං. එතං භගවතා බාරාණසියං ඉසිපතනෙ මිගදයෙ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං, අප්පතිවත්තියං සමණෙනවා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මින්ති.

බ්‍රහ්මපාරිසජ්ජානං දෙවානං සද්දං සුත්වා බ්‍රහ්මපුරොහිතා දෙවා සද්දමනුස්සාවෙසුං. එතං භගවතා බාරාණසියං ඉසිපතනෙ මිගදයෙ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං, අප්පතිවත්තියං සම-ණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මින්ති.

Non-Commercial Distribution

බ්‍රහ්මපුරොහිතානං දෙවානං සද්දං සුත්වා මහාබ්‍රහ්මා දෙවා සද්දමනුස්සාවෙසුං. එතං භගවතා බාරාණසියං ඉසිපතනෙ මිගදයෙ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං, අප්පතිවත්තියං සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මින්ති.

මහා බ්‍රහ්මානං දෙවානං සද්දං සුත්වා පරිත්තාභා දෙවා සද්දමනුස්සාවෙසුං. එතං භගවතා බාරාණසියං ඉසිපතනෙ මිගදයෙ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං, අප්පතිවත්තියං සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මින්ති.

පරිත්තාභානංදෙවානං සද්දං සුත්වා අප්පමාණාභා දෙවා සද්දමනුස්සාවෙසුං. එතං භගවතා බාරාණසියං ඉසිපතනෙ මිගදයෙ, අනුත්තරං ධම්මචක්කං පවත්තිතං, අප්පතිවත්තියං සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මින්ති.

අප්පමාණාභානං දෙවානං සද්දං සුත්වා ආභස්සරා දෙවා සද්දමනුස්සාවෙසුං එතං භගවතා බාරාණසියං ඉසිපතනෙ මිගදයෙ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං, අප්පතිවත්තියං සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මින්ති.

Non-Commercial Distribution

ආභස්සරානං දෙවානං සද්දං සුත්වා පරිත්තසුභා දෙවා සද්දමනුස්සාවෙසුං. එතං භගවතා බාරාණසියං ඉසිපතනෙ මිගදායෙ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං, අප්පතිවත්තියං සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මින්ති.

පරිත්තසුභානං දෙවානං සද්දං සුත්වා අප්පමාණසුභා දෙවා සද්දමනුස්සාවෙසුං. එතං භගවතා බාරාණසියං ඉසිපතනෙ මිගදායෙ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං, අප්පතිවත්තියං සමණෙනවා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මින්ති.

අප්පමාණසුභානං දෙවානං සද්දං සුත්වා සුභකිණ්හකා දෙවා සද්දමනුස්සාවෙසුං. එතං භගවතා බාරාණසියං ඉසිපතනෙ මිගදායෙ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං, අප්පතිවත්තියං සමණෙනවා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මින්ති.

සුභකිණ්හකානං දෙවානං සද්දං සුත්වා වෙහප්ඵලා දෙවාසද්දමනුස්සාවෙසුං. එතං භගවතා බාරාණසියං ඉසිපතනෙ මිගදායෙ, අනුත්තරං ධම්මචක්කං පවත්තිතං, අප්පතිවත්තියං සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මින්ති.

Non-Commercial Distribution

වෙහප්ඵලානං දෙවානං සද්දං සුත්වා අවිහා දෙවා සද්දමනුස්සාවෙසුං. එතං භගවතා බාරාණසියං ඉසිපතනෙ මිගදයෙ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං, අප්පතිවත්තියං සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මින්ති.

අවිහානං දෙවානං සද්දං සුත්වා අතප්පා දෙවා සද්දමනුස්සාවෙසුං. එතං භගවතා බාරාණසියං ඉසිපතනෙ මිගදයෙ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං, අප්පතිවත්තියං සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මින්ති.

අතප්පානං දෙවානං සද්දං සුත්වා සුදස්සා දෙවා සද්දමනුස්සාවෙසුං. එතං භගවතා බාරාණසියං ඉසිපතනෙ මිගදයෙ, අනුත්තරං ධම්මචක්කං පවත්තිතං, අප්පතිවත්තියං සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මින්ති.

සුදස්සානං දෙවානං සද්දං සුත්වා සුදස්සී දෙවා සද්දමනුස්සාවෙසුං. එතං භගවතා බාරාණසියං ඉසිපතනෙ මිගදයෙ අනුත්තරං ධම්මචක්කං

Non-Commercial Distribution

පවත්තිතං, අප්පතිවත්තියං සමණේන වා බ්‍රාහ්මණේන වා දේවේන වා මාරේන වා බ්‍රහ්මුනා වා කේනචි වා ලොකස්මින්ති.

සුදස්සීනං දේවානං සද්දං සුත්වා අකණිට්ඨකා දේවා සද්දමනුස්සාවේසුං. ඒතං භගවතා බාරාණසියං ඉසිපතනේ මිගදායේ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං, අප්පතිවත්තියං සමණේන වා බ්‍රාහ්මණේන වා දේවේන වා මාරේන වා බ්‍රහ්මුනා වා කේනචි වා ලොකස්මින්ති.

17. ඉතිහ තේන ඛණේන තේන මුහුත්තේන යාව බ්‍රහ්මලොකා සද්දෝ අබ්භුග්ගඤ්ඡි, අයං ච දස සහස්සී ලොකධාතු සංකම්පි සම්පකම්පි සම්පවේධි, අප්පමාණෝච උළාරෝ ඔභාසො ලොකේ පාතුරහොසි අතික්කම්ම දේවානං දේවානුභාවන්ති.

18. අථ ඛො භගවා උදානං උදානේසි. අඤ්ඤාසි වත භො කොණ්ඩඤ්ඤෝ අඤ්ඤාසි වත භො කොණ්ඩඤ්ඤෝති. ඉතිහිදං ආයස්මතො කොණ්ඩඤ්ඤස්ස අඤ්ඤාකොණ්ඩඤ්ඤෝ ත්වේව නාමං අහොසීති.

---

Non-Commercial Distribution

2

# මහාසමය සුත්තං

1. එවං මෙ සුතං එකං සමයං භගවා සක්කෙසු විහරති කපිලවත්ථුස්මිං මහාවනෙ මහතා භික්ඛු-සංඝෙන සද්ධිං පඤ්චමත්තෙහි භික්ඛුසතෙහි සබ්බෙහෙව අරහන්තෙහි. දසහි ච ලොකධාතූහි දෙවතා යෙභුය්‍යෙන සන්නිපතිතා හොන්ති භග-වන්තං දස්සනාය භික්ඛුසඞ්ඝං ච.

2. අථ ඛො චතුන්නං සුද්ධාවාසකායිකානං දෙවානං එතදහොසි: අයං ඛො භගවා සක්කෙසු විහරති කපිලවත්ථුස්මිං මහාවනෙ මහතා භික්ඛු-සංඝෙන සද්ධිං පඤ්චමත්තෙහි භික්ඛුසතෙහි සබ්බෙහෙව අරහන්තෙහි, දසහි ච ලොකධාතූහි දෙවතා යෙභුය්‍යෙන සන්නිපතිතා හොන්ති භගවන්තං දස්සනාය භික්ඛුසඞ්ඝං ච, යන්නූන මයම්පි යෙන භගවා තෙනුපසංකමෙය්‍යාම. උපසංකමිත්වා භගවතො සන්තිකෙ පච්චෙකගාථං භාසෙය්‍යාමාති.

3. අථ ඛො තා දෙවතා, සෙය්‍යථාපි නාම බලවා පුරිසො සම්මිඤ්ජිතං වා බාහං පසාරෙය්‍ය. පසාරිතං වා බාහං සම්මිඤ්ජෙය්‍ය, එවමෙවං සුද්ධාවාසෙසු දෙවෙසු අන්තරහිතා භගවතො පුරතො පාතුරහංසු.

Non-Commercial Distribution

4. අථ ඛො තා දෙවතා භගවන්තං අභිවා-දෙත්වා එකමන්තං අට්ඨංසු. එකමන්තං ඨිතා ඛො එකා දෙවතා භගවතො සන්තිකෙ ඉමං ගාථං අභාසි.

මහා සමයො පවනස්මිං - දෙවකායා සමාගතා
ආගතම්හ ඉමං ධම්මසමයං - දක්ඛිතායෙ
අපරාජිත සඞ්ඝන්ති.

5. අථ ඛො අපරා දෙවතා භගවතො සන්තිකෙ ඉමං ගාථං අභාසි.

තත්‍ර භික්ඛවො සමාදහංසු - චිත්තං
අත්තනො උජුකමකංසු
සාරථීව නෙත්තානි ගහෙත්වා - ඉන්ද්‍රියානි
රක්ඛන්ති පණ්ඩිතා ති

6. අථ ඛො අපරා දෙවතා භගවතො සන්තිකෙ ඉමං ගාථං අභාසි.

ඡෙත්වා ඛීලං ඡෙත්වා පලිඝං - ඉන්දඛීලං
ඌහච්ච මනෙජා
තෙ චරන්ති සුද්ධා විමලා - චක්ඛුමතා
සුදන්තා සුසුනාගාති

7. අථ ඛො අපරා දෙවතා භගවතො සන්තිකෙ ඉමං ගාථං අභාසි.

Non-Commercial Distribution

යෙ කෙචි බුද්ධං සරණං ගතාසෙ - න තෙ
ගමිස්සන්ති අපායං
පහාය මානුසං දෙහං - දෙවකායං
පරිපූරෙස්සන්ති ති

8. අථ ඛො භගවා භික්ඛූ ආමන්තෙසි, යෙභුය්‍යෙන භික්ඛවෙ දසසු ලොකධාතුසු දෙවතා සන්නිපතිතා තථාගතං දස්සනාය භික්ඛුසංඝංච, යෙ පි තෙ භික්ඛවෙ අහෙසුං අතීතමද්ධානං අරහන්තො සම්මාසම්බුද්ධා, තෙසම්පි භගවන්තානං එතපරමා යෙව දෙවතා සන්නිපතිතා අහෙසුං සෙය්‍යථාපි මය්හං එතරහි.

9. යෙ පි තෙ භික්ඛවෙ භවිස්සන්ති අනාගතමද්ධානං අරහන්තො සම්මාසම්බුද්ධා, තෙසම්පි භගවන්තානං එතපරමා යෙව දෙවතා සන්නිපතිතා භවිස්සන්ති. සෙය්‍යථාපි මය්හං එතරහි. ආචික්ඛිස්සාමි භික්ඛවෙ දෙවකායානං නාමානි. කිත්තයිස්සාමි භික්ඛවෙ දෙවකායානං නාමානි. දෙසෙස්සාමි භික්ඛවෙ දෙවකායානං නාමානි. තං සුණාථ සාධුකං මනසිකරොථ, භාසිස්සාමීති. එවමභන්තෙ ති ඛො තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච.

10. සිලොක මනුකස්සාමි - යත්ථ භුම්මා තදස්සිතා
යෙ සිතා ගිරි ගබ්භාරං - පහිතත්තා සමාහිතා
පුථු සීහාව සල්ලීණා - ලොමහංසාභි සම්භුනො
ඔදාත මනසා සුද්ධා විප්පසන්න මනාවිලා

Non-Commercial Distribution

11. හිය්‍යො පංචදුව සතෙ ඍද්තවා - වනෙ
කාපිලවත්ථවෙ
තතො ආමනතයි සත්ථා - සාවකෙ සාසනෙ රතෙ

12. දෙවකායා අභික්කනතා - තෙ විජානාථ භික්ඛවො
තෙ ච ආතප්ප මකරුං - සුත්වා බුද්ධස්ස සාසනං

13. තෙසං පාතුරහු ඤාණං- අමනුස්සාන දස්සනං,
අප්පෙකෙ සත මද්දක්ඛුං - සහස්සං අථ සත්තතිං

14. සතං එකෙ සහස්සානං - අමනුස්සාන මද්දසුං
අප්පෙකෙ නනත මද්දක්ඛුං - දිසා සබ්බාඵුටා අහු

15. තංඤදුව සබ්බං අභිඤ්ඤාය - වවකඛිත්වාන චක්ඛුමා
තතො ආමනතයි සත්ථා - සාවකෙ සාසනෙ රතෙ

16. දෙවකායා අභික්කනතා - තෙ විජානාථ භික්ඛවෙ
යෙ වො හං කිත්තයිස්සාමි - ගිරාහි අනුපුබ්බසො

17. සත්ත සහස්සා යක්ඛා - භුම්මා කාපිලවත්ථවා
ඉද්ධිමනෙතා ජුතිමනෙතා- වණ්ණවනෙතා
යසස්සිනො
මොදමානා අභික්කාමුං - භික්ඛූනං සමිතිං වනං

18. ඡ සහස්සා හෙමවතා - යක්ඛා නානත්ත
වණ්ණිනො
ඉද්ධිමනෙතා ජුතිමනෙතා - වණ්ණවනෙතා
යසස්සිනො
මොදමානා අභික්කාමුං - භික්ඛූනං සමිතිං වනං

Non-Commercial Distribution

19\. සාතාගිරා තිසහසසා - යකඛා
නානත්තවණ්ණිනො
ඉද්ධිමන්තො ජුතිමන්තො - වණ්ණවන්තො
යසස්සිනො
මොදමානා අභික්කාමුං - භික්ඛූනං සමිතිං වනං

20\. ඉච්චෙතෙ සොළස සහසසා - යකඛා
නානත්තවණ්ණිනො
ඉද්ධිමන්තො ජුතිමන්තො - වණ්ණවන්තො
යසස්සිනො
මොදමානා අභික්කාමුං - භික්ඛූනං සමිතිං වනං

21\. වෙස්සාමිත්තා පඤ්චසතා - යකඛා
නානත්තවණ්ණිනො
ඉද්ධිමන්තො ජුතිමන්තො - වණ්ණවන්තො
යසස්සිනො
මොදමානා අභික්කාමුං - භික්ඛූනං සමිතිං වනං

22\. කුම්භීරො රාජගහිකො- වෙපුල්ලස්ස නිවෙසනං
භියේ‍යා නං සතසහස්සං - යක්ඛානං පයිරුපාසති
කුම්භීරො රාජගහිකො - සොපාග සමිතිං වනං

23\. පුරිමං ච දිසං රාජා - ධතරට්ඨො තං පසාසති
ගන්ධබ්බානං ආධිපති - මහාරාජා යසස්සිසො
පුත්තා පි තස්ස බහවො - ඉන්දනාමා මහබ්බලා
ඉද්ධිමන්තො ජුතිමන්තො - වණ්ණවන්තො
යසස්සිනො
මොදමානා අභික්කාමුං - භික්ඛූනං සමිතිං වනං

Non-Commercial Distribution

24. දක්ඛිණං ච දිසං රාජා - විරූළ්හො තං පසාසති
කුම්භණ්ඩානං ආධිපති - මහාරාජා යසස්සිසො
පුත්තාපි තස්ස බහවො - ඉන්දනාමා මහබ්බලා
ඉද්ධිමන්තො ජුතිමන්තො - වණ්ණවන්තො
යසස්සිනො
මොදමානා අභික්කාමුං - භික්ඛූනං සමිතිං වනං

25. පච්ඡිමං ච දිසං රාජා - විරූපක්ඛො තං පසාසති
නාගානං ආධිපති - මහාරාජා යසස්සිසො
පුත්තාපි තස්ස බහවො - ඉන්දනාමා මහබ්බලා
ඉද්ධිමන්තො ජුතිමන්තො - වණ්ණවන්තො
යසස්සිනො
මොදමානා අභික්කාමුං - භික්ඛූනං සමිතිං වනං

26. උත්තරංච දිසං රාජා - කුවෙරො තං පසාසති
යක්ඛානං ආධිපති - මහාරාජා යසස්සිසො
පුත්ත පි තස්ස බහවො ඉන්දනාමා මහබ්බලා
ඉද්ධිමන්තො ජුතිමන්තො - වණ්ණවන්තො
යසස්සිනො
මොදමානා අභික්කාමුං - භික්ඛූනං සමිතිං වනං

27. පුරිමං දිසං ධතරට්ඨො - දක්ඛිණෙන
විරූළ්හකො
පච්ඡිමෙන විරූපක්ඛො - කුවෙරො උත්තරං දිසං
චත්තාරො තෙ මහාරාජා - සමන්තා චතුරො දිසා
දද්දල්ලමානා අට්ඨංසු - වනෙ කාපිලවත්ථවෙ

Non-Commercial Distribution

28. තෙසං මායාවිනො දසා - ආගු වඤ්චනිකා සඨා
මායා කුටෙණ්ඩු වෙටෙණ්ඩු - විටුච්ච විටුඩො සහ
චන්දනො කාමසෙට්ඨො ච - කින්නුඝණ්ඩු
නිඝණ්ඩු ච

29. පනාදො ඔපමඤ්ඤො ච - දෙවසූතො ච මාතලි
චිත්තසෙනො ච ගන්ධබ්බො - නළො
රාජා ජනෙසභො
ආගු පඤ්චසිඛො චෙව - තිම්බරූ සූරියවච්චසා

30. එතෙ චඤ්ඤෙ ච රාජානො - ගන්ධබ්බා සහ රාජුභි
මොදමානා අභික්කාමුං - භික්ඛූනං සමිතිං වනං

31. අථාගු නාභසා නාගා - වෙසාලා සහ තච්ඡකා
කම්බලස්සතරා ආගු - පායාගා සහ ඤාතිභි
යාමුනා ධතරට්ඨා ච - ආගු නාගා යසස්සිනො
එරාවණො මහානාගො සොපාග සමිතිං වනං

32. යෙ නාගරාජෙ සහසා හරන්ති
දිබ්බා දිජා පක්ඛි විසුද්ධචක්ඛු
වෙහාසයා තෙ වනමජ්ඣපත්තා
චිත්‍රා සුපණ්ණා ඉති තෙසං නාමානි

33. අභයංතද නාගරාජානමාසි
සුපණ්ණතො ඛෙම මකාසි බුද්ධො
සණ්හාහි වාචාහි උපව්හයන්තා
නාගා සුපණ්ණා සරණමගංසු බුද්ධං

Non-Commercial Distribution

34. පිතා වපිරහතෙථන - සමුද්දං අසුරා සිතා
භාතරො වාසවසෙසතෙ- ඉද්ධිමන්තො යසස්සිනො
කාලකඤ්ජා මහාභිංසා - අසුරා දන වෙඝසා
වෙපචිත්ති සුචිත්ති ච - පහාරාදෙ නමුචි සහ

35. සතං ච බලිපුත්තානං - සබ්බෙ වෙරොච නාමකා
සන්නය්හිත්වා බලිං සෙනං - රාහුභද්ද මුපාගමුං
සමයො දනි භද්දන්තෙ - භික්ඛූනං සමිතිං වනං

36. අපොච දෙවා පඨවී ච - තෙජො වායො තදගමුං
වරුණා වාරුණා දෙවා - සොමො ච යසසා සහ
මෙත්තා කරුණා කායිකා - ආගු දෙවා යසස්සිනො
දසෙතෙ දසධා කායා - සබ්බෙ නානත්තවණ්ණිනො
ඉද්ධිමන්තො ජුතිමන්තො වණ්ණවන්තො යසස්සිනො
මොදමානා අභික්කාමුං භික්ඛූනං සමිතිං වනං

37. වෙණ්හු ච දෙවා සහලි ච - අසමා ච දුවෙ යමා
චන්දස්සූපනිසා දෙවා - චන්දමාගු පුරක්ඛත්වා
සූරියස්සූප නිසා දෙවා - සූරිය මාගු පුරක්ඛත්වා
නක්ඛත්තානි පුරක්ඛත්වා - ආගු මන්ද වළාහකා
වසූනං වාසවො සෙට්ඨො - සක්කොපාගපුරින්දදෙ
දසෙ තෙ දසධා කායා - සබ්බෙ නානත්ත වණ්ණිනො
ඉද්ධිමන්තො ජුතිමන්තො - වණ්ණවන්තො යසස්සිනො
මොදමානා අභික්කාමුං - භික්ඛූනං සමිතිං වනං

Non-Commercial Distribution

38. අට්ඨාගු සහභූ දේවා - ජලමග්ගි සිඛාරිව
අරිට්ඨකා ච රොජා ච - උම්මා පුප්ඵනිභාසිනො
වරුණා සහධම්මා ච අච්චුතා ච අනෙජකා
සුලෙය්‍ය රුචිරා ආගූ - ආගූ වාස වනෙසිනො
දසෙ තෙ දසධා කායා - සබ්බෙ
නානත්තවණ්ණිනො
ඉද්ධිමන්තො ජුතිමන්තො - වණ්ණවන්තො
යසස්සිනො
මොදමානා අභික්කාමුං - භික්ඛූනං සමිතිං වනං
39. සමානා මහාසමානා - මානුසා මානුසුත්තමා
ඛිඩ්ඩාපදූසිකා ආගූ - ආගූ මනොපදූසිකා
අථාගු හරයො දේවා - යෙ ච ලොහිතවාසිනො
පාරගා මහාපාරගා - ආගූ දේවා යසස්සිනො
දසෙ තෙ දසධා කායා - සබ්බෙ
නානත්තවණ්ණිනො
ඉද්ධිමන්තො ජුතිමන්තො - වණ්ණවන්තො
යසස්සිනො
මොදමානා අභික්කාමුං- භික්ඛූනං සමිතිං වනං
40. සුක්කා කරුම්හා අරුණා - ආගූ වෙඝනසා සහ
ඔදාතගය්හා පාමොක්ඛා - ආගූ දේවා විචක්ඛණා
සදා මත්තා හාරගජා - මිස්සකා ච යසස්සිනො
ථනයං ආග පජ්ජුන්නො - යො දිසා අභිවස්සති
දසෙ තෙ දසධා කායා - සබ්බෙ නානත්තවණ්ණිනො
ඉද්ධිමන්තො ජුතිමන්තො - වණ්ණවන්තො යසස්සිනො
මොදමානා අභික්කාමුං - භික්ඛූනං සමිතිං වනං

Non-Commercial Distribution

41. ඛෙමියා තුසිතා යාමා - කටඨකා ච යසස්සිනො
ලම්බීතකා ලාමසෙට්ඨා-ජොතිනාමා ච ආසවා
නිම්මාණරතිනො ආගු - අථාගු පරනිම්මිතා
දසෙ තෙ දසධා කායා - සබ්බෙ
නානත්තවණ්ණිනො
ඉද්ධිමන්තො ජුතිමන්තො - වණ්ණවන්තො
යසස්සිනො
මොදමානා අභික්කාමුං - භික්ඛූනං සමිතිං වනං

42. සට්ඨේ තෙ දෙවනිකායා - සබ්බෙ
නානත්තවණ්ණිනො
නාමන්වයෙන ආගඤ්ඡුං - යෙ චඤ්ඤෙ
සදිසා සහ
පවුත්ථජාතිං අඛිලං - ඔඝතිණ්ණමනාසවං
දක්ඛෙ මොඝතරං නාගං - චන්දංව අසිතාතිගං

43. සුබ්‍රහ්මා පරමත්තො ච - පුත්තා ඉද්ධිමතො සහ
සනං කුමාරො තිස්සො ච- සොපාග සමිතිං වනං

44. සහස්සං බ්‍රහ්මලොකානං - මහාබ්‍රහ්මා'භිතිට්ඨති
උප්පන්නො ජුතිමන්තො - භිස්මාකායො යසස්සිසො

45. දසෙත්ථ ඉස්සරා ආගු - පච්චෙක වසවත්තිනො
තෙසං ච මජ්ඣතො ආග - හාරිතො පරිවාරිතො

46. තෙ ච සබ්බෙ අභික්කන්තෙ - ස ඉන්දෙ
දෙවෙ සබ්‍රහ්මකෙ
මාරසෙනා අභික්කාමුං - පස්ස කණ්හස්ස මන්දියං

47. එථ ගණ්හථ - බන්ධථ -රාගෙන බද්ධමත්ථු වෙ
සමන්තා පරිවාරෙථ - මා වො මුඤ්චිත්ථ කොචි නං

48. ඉති තත්ථ මහාසෙනො - කණ්හසෙනං අපෙසයි
පාණිනා ථල මාහච්ච - සරං කත්වාන භෙරවං

49. යථා පාවුස්සකො මෙඝො - ථනයන්තො සවිජ්ජුකො
තදා සො පච්චුදාවත්ති - සංකුද්ධො අසයං වසී

50. තං ච සබ්බං අභිඤ්ඤාය - වවක්ඛිත්වාන චක්ඛුමා
තතො ආමන්තයී සත්ථා - සාවකෙ සාසනෙ රතෙ

51. මාරසෙනා අභික්කන්තා - තෙ විජානාථ භික්ඛවො
තෙ ච ආතප්ප මකරුං - සුත්වා බුද්ධස්ස සාසනං

52. විතරාගෙ හ'පක්කාමුං - නෙ සං• ලොමම්පි
ඉඤ්ජයුං
සබ්බෙ විජිත සංගාමා - භයාතිතා යසස්සිනො
මොදන්ති සහ භූතෙහි සාවකා තෙ ජනෙසුතා ති.

---

•නසං, ඇතැම් පොත්වල

Non-Commercial Distribution

3

# ආලවක සුත්තං

1. එවං මෙ සුතං එකං සමයං භගවා ආලවියං විහරති ආලවකස්ස යක්ඛස්ස භවනෙ. අථ ඛො ආලවකො යක්ඛො යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා භගවන්තං එතදවොච.

2. නික්ඛම සමණාති, සාධාවුසොති භගවා නික්ඛමි. පවිස සමණාති; සාධාවුසොති භගවා පාවිසි. දුතියම්පි ඛො ආලවකො යක්ඛො භගවන්තං එතදවොච. නික්ඛම සමණාති සාධාවුසොති භගවා නික්ඛමි. පවිස සමණාති, සාධාවුසොති භගවා පාවිසි. තතියම්පි ඛො ආලවකො යක්ඛො භගවන්තං එතදවොච, නික්ඛම සමණාති, සාධාවුසොති භගවා නික්ඛමි. පවිස සමණාති, සාධාවුසොති භගවා පාවිසි.

3. චතුත්ථම්පි ඛො ආලවකො යක්ඛො භගවන්තං එතදවොච, නික්ඛම සමණාති. නඛ්වාහං ආවුසො නික්ඛමිස්සාමි, යං තෙ කරණීයං තං කරොහී ති.

4. පඤ්හං තං සමණ පුච්ඡිස්සාමි, සචෙ මෙ න ව්‍යාකරිස්සසි. චිත්තං වා තෙ ඛිපිස්සාමි, හදයං වා තෙ ඵාලෙස්සාමි, පාදෙසු වා ගහෙත්වා පාරගඞ්ගාය ඛිපිස්සාමී ති.

Non-Commercial Distribution

5. නඛ්වාහනත්තං ආවුසො පස්සාමි, සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ, සස්සමණ බ්‍රාහ්මණියා පජාය සදෙව මනුස්සාය. යො මෙ චිත්තං වා ඛිපෙය්‍ය, හදයං වා ඵාලෙය්‍ය, පාදෙසු වා ගහෙත්වා පාරගඞ්ගාය ඛිපෙය්‍ය, අපි ච ත්වං ආවුසො පුච්ඡ යද කඞ්ඛසීති.

6. අථඛො ආලවකො යක්ඛො භගවන්තං ගාථාය අජ්ඣභාසි.

1. කිංසූධ චිත්තං පුරිසස්ස සෙට්ඨං
කිංසු සුචිණ්ණො සුඛමාවහාති
කිංසු හවෙ සාධු තරං රසානං
කථං ජීවිං ජීවිතමාහු සෙට්ඨන්ති.

2. සද්ධීධ චිත්තං පුරිසස්ස සෙට්ඨං
ධම්මො සුචිණ්ණො සුඛමාවහාති
සච්චං හවෙ සාධුතරං රසානං
පඤ්ඤාඤ්ඤ ජීවිං ජීවිතමාහු සෙට්ඨන්ති.

3. කථංසු තරති ඔඝං - කථංසු තරති අණ්ණවං
කථංසු දුක්ඛං අච්චෙති - කථංසු පරිසුජ්ඣති

4. සද්ධාය තරති ඔඝං - අප්පමාදෙන අණ්ණවං
විරියෙන දුක්ඛං අච්චෙති පඤ්ඤාඤ්ඤය පරිසුජ්ඣති

5. කථංසු ලභතෙ පඤ්ඤාඤ්ඤං - කථංසු වින්දතෙ ධනං
කථංසු කිත්තිං පප්පොති - කථං මිත්තානි ගන්ථති
අස්මා ලොකා පරං ලොකං - කථං
පෙච්ච න සොචති.

6. සද්දහානො අරහතං - ධම්මං නිබ්බාණ පත්තියා
සුස්සූසා ලභතෙ පඤ්ඤං - අප්පමත්තො
විචක්ඛණො

7. පතිරූපකාරී ධුරවා - උට්ඨාතා වින්දතෙ ධනං
සච්චෙන කිත්තිං පප්පොති - දදං මිත්තානි
ගන්ථති

8. යස්සෙතෙ චතුරො ධම්මා - සද්ධස්ස ඝරමෙසිනො
සච්චං ධම්මො ධිතී චාගො - ස වෙ පෙච්ච
න සොචති
අස්මා ලොකා පරං ලොකං - එවං පෙච්ච
න සොචති

9. ඉඞ්ඝ අඤ්ඤෙපි පුච්ඡස්සු -පුථු සමණ
බ්‍රාහ්මණෙ
යදි සච්චා දමා චාගා - ඛන්ත්‍යා භිය්‍යො
න විජ්ජති.

10. කථන්නුදානි පුච්ඡෙය්‍යං - පුථු සමණ බ්‍රාහ්මණෙ
සොහං අජ්ජ පජානාමි - යො චත්ථො
සම්පරායිකො.

11. අත්ථාය වත මෙ බුද්ධො - වාසායාලවි මාගමි
සො හං අජ්ජ පජානාමි - යත්ථ දින්නං මහප්ඵලං

12. සො අහං විචරිස්සාමි - ගාමාගාමං පුරාපුරං
නමස්සමානො සම්බුද්ධං - ධම්මස්ස ච
සුධම්මතන්ති

Non-Commercial Distribution

7. එවං වුත්තෙ ආලවකො යක්ඛො භගවන්තං එතදවොච, අභික්කන්තං භො ගොතම අභික්කන්තං භො ගොතම, සෙය්‍යථාපි භො ගොතම නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය, පටිච්ඡන්නං වා විවරෙය්‍ය මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය, අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය, චක්ඛුමන්තො රූපානි දක්ඛින්ති ති, එවමෙවං භොතා ගොතමෙන අනෙකපරියායෙන ධම්මො පකාසිතො. එසාහං භගවන්තං ගොතමං සරණං ගච්ඡාමි. ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච උපාසකං මං භවං ගොතමො ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

4

## කසීභාරද්වාජ සුත්තං

1. එවං මෙ සුතං එකං සමයං භගවා මගධෙසු විහරති දක්ඛිණාගිරිස්මිං එකනාළායං බ්‍රාහ්මණගාමෙ. තෙන ඛො පන සමයෙන කසීභාරද්වාජස්ස බ්‍රාහ්මණස්ස පඤ්චමත්තානි නඞ්ගලසතානි පයුත්තානි හොන්ති වප්පකාලෙ.

2. අථ ඛො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය යෙන කසීභාරද්වාජස්ස බ්‍රාහ්මණස්ස කම්මන්තො තෙනුපසඞ්කමි. තෙන ඛො පන සමයෙන, කසීභාරද්වාජස්ස බ්‍රාහ්මණස්ස පරිවෙසනා වත්තති. අථ ඛො භගවා යෙන පරිවෙසනා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා එකමන්තං අට්ඨාසි.

Non-Commercial Distribution

3. අද්දසා ඛො කසිභාරද්වාජො බ්‍රාහමණො භගවන්තං පිණ්ඩාය ඨිතං, දිස්වාන භගවන්තං එතදවොච. අහං ඛො සමණ කසාමි ච වපාමි ච කසිත්වා ච වපිත්වා ච භුඤ්ජාමි, ත්වම්පි සමණ කසස්සු ච වපස්සු ච කසිත්වා ච ව පිත්වා ච භුඤ්ජස්සූති, අහම්පි ඛො බ්‍රාහමණ කසාමි ච වපාමි ච කසිත්වා ච වපිත්වා ච භුඤ්ජාමී ති.

4. න ඛො පන මයං පස්සාම භොතො ගොතමස්ස යුගං වා නඞ්ගලං වා ඵාලං වා පාචනං වා බලිවද්දෙ වා. අථ ච පන භවං ගොතමො එව මාහ, අහම්පි ඛො බ්‍රාහමණ කසාමි ච වපාමි ච කසිත්වා ච වපිත්වා ච භුඤ්ජාමී ති. අථ ඛො කසිභාරද්වාජො බ්‍රාහමණො භගවන්තං ගාථාය අජ්ඣභාසි.

1. කස්සකො පටිජානාසි - න ච පස්සාම තෙ කසිං,
කසිං නො පුච්ඡිතො බ්‍රෑහි - යථා
ජානෙමු තෙ කසිං ති,
2. සද්ධාබීජං තපොවුට්ඨි - පඤ්ඤා මෙ යුගනඞ්ගලං
හිරි ඊසා මනො යොත්තං - සති මෙ ඵාලපාචනං
3. කායගුත්තො වචීගුත්තො - ආහාරෙ
උදරෙ යතො,
සච්චං කරොමි නිද්දානං - සොරච්චං මෙ
පමොචනං

Non-Commercial Distribution

4. විරියං මෙ ධුරධොරය්‍යං - යොගක්ඛෙමාධිවාහනං
ගච්ඡති අනිවත්තන්තං - යත්ථ ගන්ත්වා
න සොචති.

5. එවමෙසා කසී කට්ඨා - සා හොති අමතප්ඵලා,
එතං කසිං කසිත්වාන - සබ්බදුක්ඛා පමුච්චතීති.

අථ ඛො කසීභාරද්වාජො බ්‍රාහ්මණො මහතියා කංසපාතියා පායාසං වඩ්ඪෙත්වා භගවතො උපනාමෙසි. භුඤ්ජතු භවං ගොතමො පායාසං, කස්සකො භවං. යං භවං ගොතමො අමතප්ඵලං කසිං කසති ති.

6. ගාථා'භිගීතං මෙ අභොජනෙය්‍යං
සම්පස්සතං බ්‍රාහ්මණ නෙස ධම්මො
ගාථා'භිගීතං පනුදන්ති බුද්ධා
ධම්මෙ සති බ්‍රාහ්මණ වුත්තිරෙසා

7. අඤ්ඤෙන ච කෙවලිනං මහෙසිං
ඛීණාසවං කුක්කුච්ච වූපසන්තං,
අන්නෙන පානෙන උපට්ඨහස්සු
ඛෙත්තං හි තං පුඤ්ඤපෙඛස්ස හොතී'ති.

6. අථ කස්ස චාහං භො ගොතම ඉමං පායාසං දම්මී ති, නඛ්වාහන්තං බ්‍රාහ්මණ පස්සාමි, සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණ-බ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය, යස්ස සො

Non-Commercial Distribution

පායාසො භුත්තො සම්මා පරිණාමං ගච්ඡෙය්‍ය, අඤ්ඤත්‍ර තථාගතස්ස වා තථාගතසාවකස්ස වා, තෙන හි ත්වං බ්‍රාහ්මණ තං පායාසං අප්පහරිතෙ වා ඡඩ්ඩෙහි අප්පාණකෙ වා උදකෙ ඔපිලාපෙහී ති.

7. අථ ඛො කසිභාරද්වාජො බ්‍රාහ්මණො තං පායාසං අප්පාණකෙ උදකෙ ඔපිලාපෙසි. අථ ඛො සො පායාසො උදකෙ පක්ඛිත්තො චිච්චිටායති චිටිච්චිටායති සන්ධූපායති සම්පධූපායති. සෙය්‍යථාපි නාම ඵාලො දිවසසන්තත්තො උදකෙ පක්ඛිත්තො චිච්චිටායති චිටිච්චිටායති සන්ධූපායති සම්පධූපායති එවමෙව සො පායාසො උදකෙ පක්ඛිත්තො චිච්චිටායති චිටිච්චිටායති සන්ධූපායති සම්පධූපායති.

8. අථ ඛො කසිභාරද්වාජො බ්‍රාහ්මණො සංවිග්ගො ලොමහට්ඨජාතො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතො පාදෙසු සිරසා නිපතිත්වා භගවන්තං එතදවොච.

9. අභික්කන්තං භො ගොතම අභික්කන්තං භො ගොතම, සෙය්‍යථාපි භො ගොතම නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය, පටිච්ඡන්නං වා විවරෙය්‍ය, මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය, අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය, චක්ඛුමන්තො රූපානි දක්ඛින්ති ති. එවමෙවං භොතා ගොතමෙන අනෙක පරියායෙන ධම්මො පකාසිතො, එසාහං භගවන්තං ගොතමං

Non-Commercial Distribution

සරණං ගච්ඡාමි ධම්මඤ්ච භික්ඛුසංඝඤ්ච. ලභෙය්‍යාහං භොතො ගොතමස්ස සන්තිකෙ පබ්බජ්ජං, ලභෙය්‍යං උපසම්පදන්ති. අලත්ථ ඛො කසිභාරද්වාජො බ්‍රාහ්මණො භගවතො සන්තිකෙ පබ්බජ්ජං, අලත්ථ උපසම්පදං.

10. අචිරූපසම්පන්නො ඛො පනායස්මා භාරද්වාජො එකො වූපකට්ඨො අප්පමත්තො ආතාපී පහිතත්තො විහරන්තො න චිරස්සෙව යස්සත්ථාය කුලපුත්තා සම්මදෙව අගාරස්මා අනගාරියං පබ්බජන්ති. තදනුත්තරං බ්‍රහ්මචරිය පරියොසානං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහාසි. ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායා'ති අබ්භඤ්ඤාසි. අඤ්ඤතරො ච ඛො පනායස්මා භාරද්වාජො අරහතං අහොසී ති.

## 5

## පරාභව සුත්තං

එවං මෙ සුතං එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. අථ ඛො අඤ්ඤතරා දෙවතා අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණා, කෙවලකප්පං ජෙතවනං ඔභාසෙත්වා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසංකමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතා ඛො සා දෙවතා භගවන්තං ගාථාය අජ්ඣභාසි.

Non-Commercial Distribution

1. පරාභවන්තං පුරිසං-මයං පුච්ඡාම ගොතමං
භගවන්තං පුට්ඨුමාගම්ම-කිං පරාභවතො මුඛං

2. සුවිජානො භවං හොති-සුවිජානො පරාභවො
ධම්මකාමො භවං හොති-ධම්මදෙස්සී පරාභවො

3. ඉති හෙතං විජානාම-පඨමො සො පරාභවො,
දුතියං භගවා බ්‍රෑහි-කිං පරාභවතො මුඛං.

4. අසන්තස්ස පියා හොන්ති-සන්තෙ න කුරුතෙ පියං,
අසතං ධම්මං රොචෙති-තං පරාභවතො මුඛං.

5. ඉති හෙතං විජානාම-දුතියො සො පරාභවො,
තතියං භගවා බ්‍රෑහි-කිං පරාභවතො මුඛං.

6. නිද්දාසීලි සභාසීලි-අනුට්ඨාතා ච යො නරො,
අලසො කොධපඤ්ඤාණො-තං පරාභවතො මුඛං

7. ඉති හෙතං විජානාම-තතියො සො පරාභවො.
චතුත්ථං භගවා බ්‍රෑහි-කිං පරාභවතො මුඛං.

8. යො මාතරං වා පිතරංවා-ජිණ්ණකං ගත යොබ්බනං,
පහූසන්තො න භරති-තං පරාභවතො මුඛං.

Non-Commercial Distribution

9. ඉති හෙතං විජානාම-චතුත්ථො සො පරාභවො,
පඤ්චමං භගවා බ්‍රෑහි-කිං පරාභවතො මුඛං.

10. යො බ්‍රාහ්මණං වා සමණං වා-අඤ්ඤං
වා' පි වණිබ්බකං,
මුසාවාදෙන වඤ්චෙති-තං පරාභවතො මුඛං

11. ඉති හෙතං විජානාම-පඤ්චමො සො පරාභවො,
ඡට්ඨමං භගවා බ්‍රෑහි-කිං පරාභවතො මුඛං.

12. පහුතවිත්තො පුරිසො-සහිරඤ්ඤො සභොජනො
එකො භුඤ්ජති සාදූනි-තං පරාභවතො මුඛං

13. ඉති හෙතං විජානාම-ඡට්ඨමො සො පරාභවො,
සත්තමං භගවා බ්‍රෑහි-කිං පරාභවතො මුඛං.

14. ජාතිත්ථද්ධො ධනත්ථද්ධො-
ගොත්තත්ථද්ධො ච යො නරො,
සඤ්ඤාතිං අතිමඤ්ඤෙති-
තං පරාභවතො මුඛං.

15. ඉති හෙතං විජානාම-සත්තමො සො
පරාභවො,
අට්ඨමං භගවා බ්‍රෑහි-කිං පරාභවතො මුඛං.

Non-Commercial Distribution

16. ඉත්ථිධුත්තො සුරාධුත්තො-අක්ඛධුත්තො ච
යො නරො,
ලද්ධං ලද්ධං විනාසෙති-තං පරාභවතො මුඛං

17. ඉති හෙතං විජානාම-අට්ඨමො සො පරාභවො,
නවමං හගවා බ්‍රෑහි-කිං පරාභවතො මුඛං

18. සෙ හි දරෙහි සන්තුට්ඨො-වෙසියාසු පදිස්සති,
දිස්සති පරදරෙසු-තං පරාභවතො මුඛං

19. ඉති හෙතං විජානාම-නවමො සො පරාභවො
දසමං හගවා බ්‍රෑහි-කිං පරාභවතො මුඛං.

20. අතීත යොබ්බනො පොසො-ආනෙති
තිම්බරුත්ථනිං,
තස්සා ඉස්සා න සුපති-තං පරාභවතො මුඛං

21. ඉති හෙතං විජානාම-දසමො සො පරාභවො.
එකාදසමං හගවා බ්‍රෑහි-කිං පරාභවතො මුඛං

22. ඉත්ථිං සොණ්ඩිං විකිරණිං-පුරිසං වා 'පි තාදිසං,
ඉස්සරියස්මිං ඨපාපෙති-තං පරාභවතො මුඛං

23. ඉති හෙතං විජානාම-එකාදසමො සො
පරාභවො,
ද්වාදසමං හගවා බ්‍රෑහි-කිං පරාභවතො මුඛං

Non-Commercial Distribution

24. අප්පභොගො මහාතණ්හො-ඛත්තියෙ ජායතෙ කුලෙ,
සො ච රජ්ජං පත්ථයති-තං පරාභවතො මුඛං.

25. එතෙ පරාභවෙ ලොකෙ-පණ්ඩිතො සමවෙක්ඛිය,
අරියො දස්සන සම්පන්නො-සලොකං භජතෙ සිවන්ති.

6

## අග්ගිකභාරද්වාජ සුත්තං

වසල සුත්තං වා

1. එවං මෙ සුතං එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ, අථ ඛො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදය සාවත්ථියං පිණ්ඩාය පාවිසි.

2. තෙන ඛො පන සමයෙන අග්ගිකභාරද්වාජස්ස බ්‍රාහ්මණස්ස නිවෙසනෙ අග්ගි පජ්ජලිතො හොති ආහුති පග්ගහිතා.

3. අථ ඛො භගවා සාවත්ථියං සපදනං පිණ්ඩාය චරමානො යෙන අග්ගිකභාරද්වාජස්ස බ්‍රාහ්මණස්ස නිවෙසනං තෙනුපසංකමි, අද්දසා ඛො අග්ගිකභාරද්වාජො බ්‍රාහ්මණො භගවන්තං දූරතො ච ආගච්ඡන්තං, දිස්වාන භගවන්තං එතදවොච, තත්‍රෙව මුණ්ඩක, තත්‍රෙව සමණක, තත්‍රෙව වසලක තිට්ඨාහී'ති.

Non-Commercial Distribution

4. එවං වුත්තෙ භගවා අග්ගිකභාරද්වාජං බ්‍රාහ්මණං එතදවොච. ජානාසි පන ත්වං බ්‍රාහ්මණ වසලං වා වසලකරණෙ වා ධම්මෙ ති. නඛ්වාහං භො ගොතම ජානාමි වසලං වා වසලකරණෙ වා ධම්මෙ, සාධු මෙ භවං ගොතමො තථා ධම්මං දෙසෙතු. යථාහං ජානෙය්‍යං වසලං වා වසල කරණෙ වා ධම්මෙ ති.

5. තෙන හි බ්‍රාහ්මණ සුණාහි සාධුකං මනසි කරොහි භාසිස්සාමීති. එවංභොති ඛො අග්ගිකභාරද්වාජො බ්‍රාහ්මණො භගවතො පච්චස්සොසි. භගවා එතදවොච.

1. කොධනො උපනාහී ච-පාපමක්ඛී ච යො නරො
විපන්නදිට්ඨි මායාවී-තං ජඤ්ඤා වසලො ඉති

2. එකජං වා ද්විජං වා පි-යොධ පාණානි හිංසති
යස්ස පාණෙ දයා නත්ථි-තං ජඤ්ඤා
වසලො ඉති.

3. යො හන්ති පරිරුන්ධති-ගාමානි නිගමානි ච
නිග්ගාහකො සමඤ්ඤාතො තං ජඤ්ඤා
වසලො ඉති

4. ගාමෙ වා යදි වා රඤ්ඤෙ-යං පරෙසං මමායිතං
ථෙය්‍යා අදින්නං ආදියති-තං ජඤ්ඤා
වසලො ඉති

Non-Commercial Distribution

5. යො හවෙ ඉණ මාදය-චුජ්ජමානො පලායති
න හි තෙ ඉණමත්ථීති-තං ජඤ්ඤා
වසලො ඉති.

6. යො වෙ කිඤ්චික්ඛකම්‍යතා-පන්ථස්මිං වජතං ජනං
හන්ත්වා කිඤ්චික්ඛ මාදෙති-තංජඤ්ඤා
වසලො ඉති.

7. යො අත්තහෙතු පරහෙතු ධනහෙතු ච යො නරො
සක්ඛිපුට්ඨො මුසා බ්‍රෑති-තං ජඤ්ඤා වසලො ඉති.

8. යො ඤාතීනං සඛානං වා-දරෙසු පතිදිස්සති
සහසා සම්පියෙන වා-තං ජඤ්ඤා වසලො ඉති.

9. යො මාතරං වා පිතරංවා-ජිණ්ණකං
ගතයොබ්බනං
පහූසන්තො න භරති-තං ජඤ්ඤා වසලො ඉති.

10. යො මාතරං වා පිතරං වා-භාතරං භගිනිං සසුං
හන්ති රොසෙති වාචාය-තං ජඤ්ඤා
වසලො ඉති.

Non-Commercial Distribution

11. යො අත්ථං පුච්ඡිතො සන්තො - අනත්ථ
මනුසාසති
පටිච්ඡන්නෙන මන්තෙති-තං ජඤ්ඤා වසලො ඉති.

12. යො කත්වා පාපකං කම්මං-මා මං ජඤ්ඤාති ඉච්ඡති
යො පටිච්ඡන්නකම්මන්තො-තං ජඤ්ඤා
වසලො ඉති.

13. යො වෙ පරකුලං ගන්ත්වා-භුත්වාන සුචිභොජනං
ආගතං න පටිපූජෙති-තං ජඤ්ඤා වසලො ඉති.

14. යො බ්‍රාහ්මණං වා සමණං වා-අඤ්ඤං
වා පි වණිබ්බකං
මුසාවාදෙන වඤ්චෙති-තං ජඤ්ඤා වසලො ඉති.

15. යො බ්‍රාහ්මණං වා සමණං වා-භත්තකාලෙ උපට්ඨිතෙ
රොසෙති වාචා න ච දෙති-තං ජඤ්ඤා
වසලො ඉති.

16. අසතං යො'ධ පබ්‍රෑති-මොහෙන පලිගුණ්ඨිතො
කිඤ්චික්ඛං නිජිගිංසානො-තං ජඤ්ඤා
වසලො ඉති.

Non-Commercial Distribution

17. යො චත්තානං සමුක්කංසෙ-පරංචඤ්ච මවජානති
නිහීනො සෙන මානෙන-තං ජඤ්ඤා වසලො ඉති.

18. රොසකො කදරියො ච-පාපිච්ඡො මච්ඡරී සඨො
අහිරිකො අනොත්තාපි-තං ජඤ්ඤා වසලො ඉති.

19. යො බුද්ධං පරිභාසති-අථ වා තස්ස සාවකං
පරිබ්බාජං ගහට්ඨං වා-තං ජඤ්ඤා වසලො ඉති.

20. යො වෙ අනරහා සන්තො - අරහං පටිජානති
චොරො සබ්‍රහ්මකෙ ලොකෙ-එස ඛො වසලාධමො

21. එතෙ ඛො වසලා වුත්තා-මයා වො යෙ පකාසිතා
න ජච්චා වසලො හොති-න ජච්චා හොති බ්‍රාහ්මණො
කම්මනා වසලො හොති-කම්මනා හොති බ්‍රාහ්මණො

22. තදමිනාපි ජානාථ-යථා මෙදං නිදස්සනං
චණ්ඩාලපුත්තො සොපාකො-මාතඞ්ගො

ඉති විස්සුතො.

23. සො යසං පරමං පත්තො-මාතඞ්ගො යං සුදුල්ලභං
ආගඤ්ඡුං තස්සුපට්ඨානං-ඛත්තියා බ්‍රාහ්මණා බහූ.

Non-Commercial Distribution

24. සො දෙවයාන මාරුය්හ-විරජං සො මහාපථං
කාමරාගං විරාජෙත්වා-බ්‍රහ්මලොකූපගො අහු.

25. න නං ජාති නිවාරෙසි-බ්‍රහ්මලොකූපපත්තියා
අජ්ඣායක කුලෙ ජාතා-බ්‍රාහ්මණා මන්තබන්ධුනො.

26. තෙ ච පාපෙසු කම්මෙසු-අභිණ්හ මුපදිස්සරෙ
දිට්ඨෙව ධම්මෙ ගාරය්හා-සම්පරායෙ ච දුග්ගතිං
න තෙ ජාති නිවාරෙති-දුග්ගච්චා ගරහාය වා.
න ජච්චා වසලො හොති න ජච්චා හොති බ්‍රාහ්මණො
කම්මනා වසලො හොති-කම්මනා හොති
බ්‍රාහ්මණො ති.

එවං වුත්තෙ අග්ගිකභාරද්වාජො බ්‍රාහ්මණො භගවන්තං එතදවොච. අභික්කන්තං භො ගොතම අභික්කන්තං භො ගොතම, සෙය්‍යථාපි භො ගොතම නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය පටිච්ඡන්නං වා විවරෙය්‍ය, මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය, අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය චක්ඛුමන්තො රූපානි දක්ඛින්තීති. එවං මෙවං භොතා ගොතමෙන අනෙකපරියායෙන ධම්මො පකාසිතො, එසාහං භගවන්තං ගොතමං සරණං ගච්ඡාමි. ධම්මං ච භික්ඛුසංඝංච, උපාසකං මං භවං ගොතමො ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

Non-Commercial Distribution

7

# සච්චවිභඞ්ග සුත්තං

1. එවං මෙ සුතං, එකං සමයං භගවා බාරාණසියං විහරති ඉසිපතනෙ මිගදායෙ, තත්‍රඛො භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවොති භදන්තෙ'ති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං භගවා එතදවොච.

2. තථාගතෙන භික්ඛවෙ අරහතා සම්මාසම්බුද්ධෙන, බාරාණසියං ඉසිපතනෙ මිගදායෙ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං, අප්පතිවත්තියං සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මිං. යදිදං චතුන්නං අරියසච්චානං ආචික්ඛනා දෙසනා පඤ්ඤාපනා පට්ඨපනා විවරණා විභජනා උත්තානීකම්මං.

3. කතමෙසං චතුන්නං? දුක්ඛස්ස අරියසච්චස්ස, ආචික්ඛනා දෙසනා පඤ්ඤාපනා පට්ඨපනා විවරණා විභජනා උත්තානීකම්මං, දුක්ඛසමුදයස්ස අරියසච්චස්ස. ආචික්ඛනා දෙසනා පඤ්ඤාපනා පට්ඨපනා විවරණා විභජනා උත්තානීකම්මං. දුක්ඛනිරොධස්ස අරියසච්චස්ස, ආචික්ඛනා දෙසනා පඤ්ඤාපනා පට්ඨපනා විවරණා විභජනා උත්තානීකම්මං, දුක්ඛනිරොධගාමිනියා පටිපදාය අරියසච්චස්ස, ආචික්ඛනා දෙසනා පඤ්ඤාපනා පට්ඨපනා විවරණා විභජනා උත්තානී කම්මං.

Non-Commercial Distribution

4. තථාගතෙන භික්ඛවෙ අරහතා සම්මාසම්බුද්ධෙන, බාරාණසියං ඉසිපතනෙ මිගදායෙ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං, අප්පතිවත්තියං සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුණා වා කෙනචි වා ලොකස්මිං යදිදං ඉමෙසං චතුන්නං අරියසච්චානං ආචික්ඛනා දෙසනා පඤ්ඤාපනා පට්ඨපනා විවරණා විභජනා උත්තානීකම්මං.

5. සෙවෙථ භික්ඛවෙ සාරිපුත්තමොග්ගල්ලානෙ භජථ භික්ඛවෙ සාරිපුත්ත මොග්ගල්ලානෙ පණ්ඩිතා භික්ඛූ අනුග්ගාහකා සබ්‍රහ්මචාරීනං, සෙය්‍යථාපි භික්ඛවෙ ජනෙත්ති, එවං සාරිපුත්තො, සෙය්‍යථාපි ජාතස්ස ආපාදෙතා එවං මොග්ගල්ලානො, සාරිපුත්තො භික්ඛවෙ සොතාපත්තිඵලෙ විනෙති, මොග්ගල්ලානො උත්තමත්ථෙ විනෙති, සාරිපුත්තො භික්ඛවෙ පහොති චත්තාරි අරියසච්චානි විත්ථාරෙන ආචික්ඛිතුං දෙසෙතුං පඤ්ඤාපෙතුං පට්ඨපෙතුං විවරිතුං විභජිතුං උත්තානීකාතුන්ති. ඉදමවොච භගවා, ඉදං වත්වා සුගතො උට්ඨායාසනා විහාරං පාවිසි.

6. තත්‍ර ඛො ආයස්මා සාරිපුත්තො අචිර පක්කන්තස්ස භගවතො භික්ඛූ ආමන්තෙසි ආවුසො භික්ඛවොති. ආවුසො'ති ඛො තෙ භික්ඛූ ආයස්මතො සාරිපුත්තස්ස පච්චස්සොසුං, ආයස්මා සාරිපුත්තො එතදවොච.

7. තථාගතෙන ආවුසො අරහතා සම්මාසම්බුද්ධෙන බාරාණසියං ඉසිපතනෙ මිගදායෙ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං අප්පතිවත්තියං සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මිං යදිදං චතුන්නං අරියසච්චානං ආචික්ඛනා දෙසනා පඤ්ඤපනා* පට්ඨපනා විවරණා විභජනා උත්තානීකම්මං: කතමෙසං චතුන්නං? දුක්ඛස්ස අරියසච්චස්ස, ආචික්ඛනා දෙසනා පඤ්ඤපනා පට්ඨපනා විවරණා විභජනා උත්තානීකම්මං, දුක්ඛසමුදයස්ස අරියසච්චස්ස ආචික්ඛනා දෙසනා පඤ්ඤපනා පට්ඨපනා විවරණා විභජනා උත්තානීකම්මං: දුක්ඛනිරොධස්ස අරියසච්චස්ස ආචික්ඛනා දෙසනා පඤ්ඤපනා පට්ඨපනා විවරණා විභජනා උත්තානීකම්මං; දුක්ඛ නිරොධගාමිනියා පටිපදා අරියසච්චස්ස ආචික්ඛනා දෙසනා පඤ්ඤපනා පට්ඨපනා විවරණා විභජනා උත්තානීකම්මං.

8. කතමඤ්චාවුසො දුක්ඛං අරියසච්චං? ජාති පි දුක්ඛා, ජරාපි දුක්ඛා, ව්‍යාධිපි දුක්ඛා, මරණම්පි දුක්ඛං, සොක පරිදෙව දුක්ඛ දෙමනස්සුපායාසා දුක්ඛා, යම්පිච්ඡං නලභති තම්පි දුක්ඛං, සංඛිත්තෙන පඤ්චුපාදනක්ඛන්ධා දුක්ඛා.

9. කතමා චාවුසො ජාති? යා තෙසං තෙසං සත්තානං තම්හි තම්හි සත්තනිකායෙ ජාති

* පඤ්ඤපනා

Non-Commercial Distribution

සඤ්ජාති, ඔක්කන්ති, අභිනිබ්බත්ති, ඛන්ධානං පාතුභාවො, ආයතනානං පටිලාභො, අයං වුච්චතාවුසො ජාති.

10. කතමා චාවුසො ජරා? යා තෙසං තෙසං සත්තානං තම්හි තම්හි සත්තනිකායෙ ජරා, ජීරණතා, ඛණ්ඩිච්චං, පාලිච්චං, වලිත්තචතා, ආයුනො සංහානි, ඉන්ද්‍රියානං පරිපාකො, අයං වුච්චතාවුසො ජරා.

11. කතමඤ්චාවුසො මරණං? යා තෙසං තෙසං සත්තානං තම්හා තම්හා සත්තනිකායා චුති, චවනතා, භෙදො, අන්තරධානං මච්චු මරණං, කාලකිරියා, ඛන්ධානං භෙදො, කලෙබරස්ස නික්ඛෙපො, ඉදං වුච්චතාවුසො මරණං.

12. කතමො චාවුසො සොකො? යො ඛො ආවුසො අඤ්ඤතරඤ්ඤතරෙන ව්‍යසනෙන සමන්නාගතස්ස, අඤ්ඤතරඤ්ඤතරෙන දුක්ඛ-ධම්මෙන ඵුට්ඨස්ස සොකො, සොචනා, සොචිතත්තං අන්තො සොකො, අන්තො පරිසොකො, අයං වුච්චතාවුසො සොකො.

13. කතමො චාවුසො පරිදෙවො? යො ඛො ආවුසො අඤ්ඤතරඤ්ඤතරෙන ව්‍යසනෙන සමන්නාගතස්ස, අඤ්ඤතරඤ්ඤතරෙන දුක්ඛ-

Non-Commercial Distribution

ධම්මෙන ඵුට්ඨස්ස ආදෙවො, පරිදෙවො, ආදෙවනා, පරිදෙවනා, ආදෙවිතත්තං, පරිදෙවිතත්තං අයං වුච්චතාවුසො පරිදෙවො.

14. කතමඤ්චාවුසො දුක්ඛං? යං ඛො ආවුසො කායිකං දුක්ඛං, කායිකං අසාතං, කායසම්ඵස්සජං දුක්ඛං අසාතං වෙදයිතං, ඉදං වුච්චතාවුසො දුක්ඛං.

15. කතමඤ්චාවුසො දොමනස්සං? යං ඛො ආවුසො චෙතසිකං දුක්ඛං චෙතසිකං අසාතං, මනොසම්ඵස්සජං දුක්ඛං අසාතං වෙදයිතං ඉදං වුච්චතාවුසො දොමනස්සං.

16. කතමො චාවුසො උපායාසො? යො ඛො ආවුසො අඤ්ඤතරඤ්ඤතරෙන ව්‍යසනෙන සමන්නාගතස්ස, අඤ්ඤතරඤ්ඤතරෙන දුක්ඛධම්මෙන ඵුට්ඨස්ස ආයාසො, උපායාසො, ආයාසිතත්තං උපායාසිතත්තං, අයං වුච්චතාවුසො උපායාසො.

17. කතමඤ්චාවුසො යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛං? ජාතිධම්මානං ආවුසො සත්තානං එවං ඉච්ඡා උප්පජ්ජති. අහො වත මයං න ජාතිධම්මා අස්සාම, න ච වත නො ජාති ආගච්ඡෙය්‍යාති න ඛො පනෙතං ඉච්ඡාය පත්තබ්බං ඉදම්පි යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛං.

Non-Commercial Distribution

18. ජරා ධම්මානං ආවුසො සත්තානං එවං ඉච්ඡා උප්පජ්ජති. අහො වත මයං න ජරාධම්මා අස්සාම, න ච වත නො ජරා ආගච්ඡෙය්‍යාති. න ඛො පනෙතං ඉච්ඡාය පත්තබ්බං ඉදම්පි යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛං.

19. ව්‍යාධි ධම්මානං ආවුසො සත්තානං එවං ඉච්ඡා උප්පජ්ජති අහො වත මයං න ව්‍යාධිධම්මා අස්සාම, න ච වත නො ව්‍යාධි ආගච්ඡෙය්‍යාති න ඛො පනෙතං ඉච්ඡාය පත්තබ්බං, ඉදම්පි යම්පිච්ඡං නලභති තම්පි දුක්ඛං.

20. මරණ ධම්මානං ආවුසො සත්තානං එවං ඉච්ඡා උප්පජ්ජති, අහො වත මයං න මරණධම්මා අස්සාම, න ච වත නො මරණං ආගච්ඡෙය්‍යාති, න ඛො පනෙතං ඉච්ඡාය පත්තබ්බං, ඉදම්පි යම්පිච්ඡං නලභති තම්පි දුක්ඛං.

21. සොක පරිදෙව දුක්ඛදෙමනස්සුපායාස ධම්මානං ආවුසො සත්තානං එවං ඉච්ඡා උප්පජ්ජති. අහො වත මයං න සොක පරිදෙව දුක්ඛදෙමනස්සුපායාසධම්මා අස්සාම, න ච වත නො සොක පරිදෙව දුක්ඛදෙමනස්සුපායාසා ආගච්ඡෙය්‍යුන්ති, න ඛො පනෙතං ඉච්ඡාය පත්තබ්බං, ඉදම්පි යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛං.

Non-Commercial Distribution

22. කතමා චාවුසො සංඛිත්තෙන පඤ්චුපාදානක්ඛන්ධා දුක්ඛා? සෙය්‍යථීදං? රූපූපාදානක්ඛන්ධො, වෙදනුපාදානක්ඛන්ධො, සඤ්ඤුපාදානක්ඛන්ධො, සඞ්ඛාරූපාදානක්ඛන්ධො, විඤ්ඤාණුපාදානක්ඛන්ධො, ඉමෙ වුච්චන්තාවුසො සංඛිත්තෙන පඤ්චුපාදානක්ඛන්ධා දුක්ඛා. ඉදං වුච්චතාවුසො දුක්ඛං අරියසච්චං.

23. කතමඤ්චාවුසො දුක්ඛසමුදයො අරියසච්චං, යා යං තණ්හා පොනොභවිකා නන්දිරාගසහගතා තත්‍රතත්‍රාභිනන්දිනී, සෙය්‍යථීදං? කාමතණ්හා භවතණ්හා විභවතණ්හා, ඉදං වුච්චතාවුසො දුක්ඛසමුදයො අරියසච්චං.

24. කතමඤ්චාවුසො දුක්ඛනිරොධො අරියසච්චං යො තස්සායෙව තණ්හාය අසෙසවිරාගනිරොධො චාගො පටිනිස්සග්ගො මුත්ති අනාලයො, ඉදං වුච්චතාවුසො දුක්ඛනිරොධො අරියසච්චං.

25. කතමඤ්චාවුසො දුක්ඛනිරොධගාමිනීපටිපදා අරියසච්චං, අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො. සෙය්‍යථීදං?

සම්මාදිට්ඨි සම්මාසඞ්කප්පො සම්මාවාචා සම්මාකම්මන්තො, සම්මා ආජීවො, සම්මාවායාමො සම්මාසති, සම්මාසමාධි.

Non-Commercial Distribution

26. කතමා චාවුසො සම්මාදිට්ඨි? යං ඛො ආවුසො දුක්ඛෙ ඤාණං, දුක්ඛසමුදයෙ ඤාණං, දුක්ඛනිරොධෙ ඤාණං, දුක්ඛනිරොධගාමිනියා පටිපදාය ඤාණං, අයං වුච්චතාවුසො සම්මාදිට්ඨි.

27. කතමො චාවුසො සම්මාසඞ්කප්පො? නෙක්ඛම්ම සඞ්කප්පො, අව්‍යාපාද සඞ්කප්පො, අවිහිංසා සඞ්කප්පො, අයං වුච්චතාවුසො සම්මාසඞ්කප්පො.

28. කතමා චාවුසො සම්මාවාචා? මුසාවාදා වෙරමණී, පිසුණාවාචා වෙරමණී, ඵරුසා වාචා වෙරමණී, සම්ඵප්පලාපා වෙරමණී, අයං වුච්චතාවුසො සම්මාවාචා.

29. කතමො චාවුසො සම්මාකම්මන්තො? පාණාතිපාතා වෙරමණී, අදින්නාදානා වෙරමණී, කාමෙසුමිච්ඡාචාරා වෙරමණී, අයං වුච්චතාවුසො සම්මා කම්මන්තො.

30. කතමො චාවුසො සම්මා ආජීවො? ඉධාවුසො අරියසාවකො මිච්ඡාආජීවං පහාය සම්මාආජීවෙන ජීවිකං කප්පෙති, අයං වුච්චතාවුසො සම්මාආජීවො.

31. කතමො චාවුසො සම්මාවායාමො? ඉධාවුසො භික්ඛු අනුප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං අනුප්පාදාය ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති, උප්පන්නානං

Non-Commercial Distribution

පාපකානං අකුසලානං ධම්මානං පහාණාය ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති, අනුප්පන්නානං කුසලානං ධම්මානං උප්පාදාය ඡන්දං ජනෙති වායමති, විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති, උප්පන්නානං කුසලානං ධම්මානං ඨිතියා අසම්මොසාය භීය්‍යොභාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති. අයං වුච්චතාවුසො සම්මාවායාමො.

32. කතමා චාවුසො සම්මාසති? ඉධාවුසො භික්ඛු කායෙ කායානුපස්සී විහරති, අතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣා දෙමනස්සං, වෙදනාසු වෙදනානුපස්සී විහරති, ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදෙමනස්සං, චිත්තෙ චිත්තානුපස්සී විහරති, ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣා දෙමනස්සං, ධම්මෙසු ධම්මානුපස්සී විහරති, ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣා දෙමනස්සං, අයං වුච්චතාවුසො සම්මාසති.

33. කතමො චාවුසො සම්මා සමාධි? ඉධාවුසො භික්ඛු, විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමජ්ඣානං උපසම්පජ්ජ විහරති, විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං

Non-Commercial Distribution

අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියජ්ඣානං උපසම්පජ්ජ විහරති. පීතියා ච විරාගා උපෙක්ඛා[1] ච විහරති; සතො ච සම්පජානො සුඛං ච කායෙන පටිසංවෙදෙති, යන්තං අරියා ආචික්ඛන්ති උපෙක්ඛා සතිමා සුඛවිහාරීති තතියජ්ඣානං උපසම්පජ්ජ විහරති, සුඛස්ස ච පහාණා දුක්ඛස්ස ච පහාණා පුබ්බෙව සොමනස්ස දෙමනස්සානං අත්ථංගමා අදුක්ඛං අසුඛං උපෙඛාසති[2] පාරිසුද්ධිං චතුත්ථජ්ඣානං උපසම්පජ්ජ විහරති, අයං වුච්චතාවුසො සම්මාසමාධි, ඉදං වුච්චතාවුසො දුක්ඛනිරොධ ගාමිනීපටිපදා අරියසච්චං.

34. තථාගතෙන ආවුසො අරහතා සම්මාසම්බුද්ධෙන, බාරාණසියං ඉසිපතනෙ මිගදායෙ, අනුත්තරං ධම්මචක්කං පවත්තිතං අප්පතිවත්තියං සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මින්ති, යදිදං ඉමෙසං චතුන්නං අරියසච්චානං ආචික්ඛනා දෙසනා පඤ්ඤාපනා පට්ඨපණා විවරනා විභජනා උත්තානී කම්මන්ති.

35. ඉදමවොචායස්මා සාරිපුත්තො, අත්තමනා තෙ භික්ඛූ ආයස්මතො සාරිපුත්තස්ස භාසිතං අභිනන්දුන්ති.

(නිට්ඨිතානි අතිරෙකානි සත්ත සුත්තානි.)

1. උපෙක්ඛතො 2. උපෙක්ඛා සති හරිසුද්ධි

Non-Commercial Distribution

# ආටානාටිය සුත්තං

## පඨමක භාණවාරො

නමො තස්ස භගවතො අරහතො
සම්මා සම්බුද්ධස්ස

1. එවං මෙ සුතං එකං සමයං භගවා රාජගහෙ විහරති ගිජ්ඣකූටෙ පබ්බතෙ.

අථ ඛො චත්තාරො මහාරාජා මහතියා ච යක්ඛ සෙනාය, මහතියාච ගන්ධබ්බසෙනාය, මහතියා ච කුම්භණ්ඩසෙනාය, මහතියාච නාගසෙනාය, චතුද්දිසං රක්ඛං ඨපෙත්වා, චතුද්දිසං ගුම්බං ඨපෙත්වා, චතුද්දිසං ඔවරණං ඨපෙත්වා, අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණා, කෙවලකප්පං ගිජ්ඣකූටං ඔභාසෙත්වා යෙන භගවා තෙනුපසංකමිංසු, උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු.

2. තෙපි ඛො යක්ඛා අප්පෙකච්චෙ භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. අප්පෙකච්චෙ භගවතා සද්ධිං සම්මොදිංසු. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදිංසු. අප්පෙ කච්චෙ යෙන භගවා, තෙනඤ්ජලිං පණාමෙත්වා එකමන්තං නිසීදිංසු, අප්පෙකච්චෙ නාමගොත්තං සාවෙත්වා එකමන්තං නිසීදිංසු, අප්පෙකච්චෙ තුණ්හීභූතා එකමන්තං නිසීදිංසු.

එකමන්තං නිසින්නො ඛො වෙස්සවණො මහාරාජා භගවන්තං එතදවොච....

3. සන්ති හි භන්තෙ උළාරා යක්ඛා භගවතො අප්පසන්නා, සන්ති හි භන්තෙ උළාරා යක්ඛා, භගවතො පසන්නා, සන්ති හි භන්තෙ මජ්ඣිමා යක්ඛා භගවතො අප්පසන්නා, සන්ති හි භන්තෙ මජ්ඣිමා යක්ඛා භගවතො පසන්නා. සන්ති හි භන්තෙ නීචා යක්ඛා භගවතො අප්පසන්නා, සන්ති හි භන්තෙ නීචා යක්ඛා භගවතො පසන්නා.

4. යෙභුය්‍යෙන ඛො පන භන්තෙ යක්ඛා, අප්පසන්නායෙව භගවතො. තං කිස්සහෙතු? භගවා හි භන්තෙ පාණාතිපාතා වෙරමණියා ධම්මං දෙසෙති, අදින්නාදනා වෙරමණියා ධම්මං දෙසෙති, කාමෙසු මිච්ඡාචාරා වෙරමණියා ධම්මං දෙසෙති, මුසාවාද වෙරමණියා ධම්මං දෙසෙති, සුරාමෙරය මජ්ජපමාදට්ඨානා වෙරමණියා ධම්මං දෙසෙති....

5. යෙභුය්‍යෙන ඛො පන භන්තෙ යක්ඛා, අප්පටිවිරතා යෙව පාණාතිපාතා, අප්පටිවිරතා අදින්නාදනා, අප්පටිවිරතා කාමෙසුමිච්ඡාචාරා, අප්පටිවිරතා මුසාවාද, අප්පටිවිරතා සුරාමෙරයමජ්ජපමාදට්ඨානා, තෙසං තං හොති අප්පියං අමනාපං:-

Non-Commercial Distribution

6. සන්ති හි භන්තෙ භගවතො සාවකා, අරඤ්ඤෙ වනපත්ථානි පන්තානි සෙනාසනානි පටිසෙවන්ති, අප්පසද්දානි අප්පනිග්ඝොසානි, විජනවාතානි මනුස්සරාහසෙය්‍යකානි පටිසල්ලානසාරුප්පානි, තත්ථ සන්ති උළාරා යක්ඛා නිවාසිනො. යෙ ඉමස්මිං භගවතො පාවචනෙ අප්පසන්නා, තෙසං පසාදාය.

7. උග්ගණ්හාතු භන්තෙ භගවා ආටානාටියං රක්ඛං, භික්ඛූනං භික්ඛුණීනං, උපාසකානං උපාසිකානං, ගුත්තියා රක්ඛාය අවිහිංසාය ඵාසුවිහාරායා'ති.

8. අධිවාසෙසි භගවා තුණ්හීභාවෙන අථ ඛො වෙස්සවණො මහාරාජා භගවතො අධිවාසනං විදිත්වා, තායං වෙලායං ඉමං ආටානාටියං රක්ඛං අභාසි.

9. විපස්සිස්ස නමත්ථු-චක්ඛුමන්තස්ස සිරීමතො,
සිඛිස්ස පි නමත්ථු-සබ්බභූතානුකම්පිනො.
වෙස්සභුස්ස නමත්ථු-න්හාතකස්ස තපස්සිනො,
නමත්ථුකකුසන්ධස්ස-මාරසෙනා පමද්දිනො.
කොණාගමනස්ස නමත්ථු-බ්‍රාහ්මණස්සවුසීමතො,
කස්සපස්ස නමත්ථු-විප්පමුත්තස්ස සබ්බධි.
අඞ්ගීරසස්ස නමත්ථු-සක්‍යපුත්තස්ස සිරීමතො,
යො ඉමං ධම්ම'මදෙසෙසි-සබ්බදුක්ඛාපනූදනං.

10. යෙ චා'පි නිබ්බුතා ලොකෙ-යථාභූතං විපස්සිසුං,
තෙ ජනා අපිසුණා-මහන්තා වීතසාරදා.

Non-Commercial Distribution

11\. හිතං දෙව මනුසසානං-යං නමසසනති ගොතමං
විජජාචරණ සමපනනං-මහනතං වීතසාරදං.

12\. යතො උගගචඡති සුරියො-ආදිචෙචා
මණඩලී මහා
යසසචුගගචඡමානසස-සංවරී'පි නිරුජඣති
යසස'චුගගතෙ සුරියෙ-දිවසො'ති පවුචචති
රහදෙ'පිතතථ ගමභීරො-සමුදෙද සරිතොදකො.
එවං නං තතථ ජානනති-සමුදෙද
සරිතොදකො.

13\. ඉතො සා පුරිමා දිසා-ඉතිනං ආචිකඛති ජනො
යං දිසං අභිපාලෙති-මහාරාජා යසසසිසො.
ගනධබබානංආධිපති-ධතරටෙඨා ඉති නාමසො
රමතී නචචගීතෙහි-ගනධබෙබහි පුරකඛතො
පුතතාපි තසස බහවො-එකනාමා ති මෙ සුතං
අසීතිං දස එකො ච-ඉනදනාමා මහබබලා.
තෙචා'පි බුධං දිසවාන-බුධං ආදිචචබනධුනං
දූරතො'ච නමසසනති-මහනතං වීතසාරදං
නමො තෙ පුරිසාජඤඤ-නමො තෙ
පුරිසුතතම.

14\. කුසලෙන සමෙකඛසි. අමනුසසා පි තං වනදනති
සුතං නෙතං අභිණහසො, තසමා එවං වදෙමසෙ
ජිනං වනදථ ගොතමං ජිනං වනදම ගොතමං,
විජජාචරණසමපනනං, බුධං වනදම ගොතමං.

Non-Commercial Distribution

15. යෙන පෙතා පවුච්චන්ති-පිසුණා පිට්ඨිමංසිකා,
පාණාතිපාතිනො ලුද්දා-චොරා නෙකතිකා ජනා.
ඉතො සා දක්ඛිණාදිසා-ඉතිනං ආචික්ඛති ජනො
යං දිසං අභිපාලෙති-මහා රාජා යසස්සිසො.
කුම්භණ්ඩානං ආධිපති-විරූළ්හො ඉති නාමසො,
රමති නච්චගීතෙහි-කුම්භණ්ඩෙහි පුරක්ඛතො.
පුත්තා පි තස්ස බහවො-එකනාමාති මෙ සුතං,
අසීතිං දස එකොච-ඉන්දනාමා මහබ්බලා.
තෙ චා පි බුද්ධං දිස්වාන-බුද්ධං ආදිච්චබන්ධුනං,
දූරතො'ව නමස්සන්ති-මහන්තං වීතසාරදං,
නමො තෙ පුරිසාජඤ්ඤ-නමො තෙ පුරිසුත්තම..

16. කුසලෙන සමෙක්ඛසි. අමනුස්සා පි තං වන්දන්ති සුතං
නෙතං අභිණ්හසො, තස්මා එවං වදෙමසෙ ජිනං වන්දථ
ගොතමං ජිනං වන්දම ගොතමං, විජ්ජාචරණ සම්පන්නං
බුද්ධං වන්දම ගොතමං..

17. යත්ථ චොග්ගච්ඡති සූරියො-ආදිච්චො
මණ්ඩලී මහා,
යස්ස චොග්ගච්ඡමානස්ස-දිවසො පි නිරුජ්ඣති,
යස්ස චොග්ගතෙ සූරියෙ-සංවරීති පවුච්චති
රහදෙ පි තත්ථ ගම්භීරො-සමුද්දෙ සරිතොදකො,
එවන්තං තත්ථ ජානන්ති-සමුද්දෙ
සරිතොදකො.

Non-Commercial Distribution

18. ඉතො සා පච්ජිමා දිසා-ඉති නං ආචික්ඛති ජනො
යං දිසං අභිපාලෙති-මහාරාජා යසස්සිසො.
නාගානං ආධිපති විරූපක්ඛො-ඉති නාමසො
රමති නච්චගීතෙහි-නාගෙහි පුරක්ඛතො.
පුත්තාපි තස්ස බහවො-එකනාමා'ති මෙ සුතං,
අසීතිං දස එකො ච-ඉන්දනාමා මහබ්බලා
තෙ චා'පි බුද්ධං දිස්වාන-බුද්ධං ආදිච්චබන්ධුනං,
දූරතො'ව නමස්සන්ති-මහන්තං වීතසාරදං,
නමො තෙ පුරිසා ජඤ්ඤ-නමො තෙ
පුරිසුත්තම..

19. කුසලෙන සමෙක්ඛසි. අමනුස්සා පි තං වන්දන්ති සුතං නෙතං අභිණ්හසො, තස්මා එවං වදෙමසෙ ජිනං වන්දථ ගොතමං ජිනං වන්දම ගොතමං, විජ්ජාචරණසම්පන්නං බුද්ධං වන්දම ගොතමන්ති..

20. යෙන උත්තරකුරූරම්මා-මහානෙරු සුදස්සනො,
මනුස්සා තත්ථ ජායන්ති-අමමා අපරිග්ගහා.
න තෙ බීජං පවපන්ති-න පි නීයන්ති නඞ්ගලා,
අකට්ඨපාකිමං සාලිං-පරිභුඤ්ජන්ති මානුසා
අකණං අථුසං සුද්ධ-සුගන්ධං තණ්ඩුලප්ඵලං
තුණ්ඩිකීරෙ පචිත්වාන-තතො
භුඤ්ජන්ති භොජනං..

Non-Commercial Distribution

21. ගාවිං එක ඛුරං කත්වා-අනුයන්ති දිසොදිසං,
පසුං එක ඛුරං කත්වා-අනුයන්ති දිසොදිසං,
ඉත්ථි වාහනං කත්වා-අනුයන්ති දිසොදිසං,
පුරිසවාහනං කත්වා-අනුයන්ති දිසොදිසං,
කුමාරිවාහනං කත්වා-අනුයන්ති දිසොදිසං,
කුමාරවාහනං කත්වා-අනුයන්ති දිසො දිසං.

තෙ යානෙ අභිරූහිත්වා සබ්බාදිසා අනුපරියන්ති පචාරා තස්ස රාජිනො.

22. හත්ථියානං අස්සයානං-දිබ්බං යානං උපට්ඨිතං
පාසාද සිවිකා චෙ'ව-මහාරාජස්ස යසස්සිනො.

23. තස්ස ච නගරා අහු-අන්තලික්ඛෙ සුමාපිතා
ආටානාටා කුසිනාටා-පරකුසිනාටා
නාටපුරියා පරකුසිතනාටා.
උත්තරෙන කපීවනෙතා-ජනොඝ'ම පරෙන ච
නව නවතියො අම්බර අම්බරවතියො-
ආලකමන්ද නාම රාජධානි

24. කුවෙරස්ස ඛො පන මාරිස මහාරාජස්ස විසාණා නාම රාජධානි, තස්මා කුවෙරො මහාරාජා වෙස්සවණො'ති පවුච්චති.

25. පච්චෙසන්තො පකාසෙන්ති තතොලා තත්තලා තතොතලා. ඔජසිතෙජසී තතොජසී සූරො රාජා අරිට්ඨො

Non-Commercial Distribution

නෙමි. රහදෙ'පි තත්‍ථ ධරණී නාම. යතො මෙඝා පවස්සන්ති වස්සා යතො පතායන්ති සභා'පි තත්‍ථ භගලවති නාම යත්‍ථ යක්ඛා පයිරුපාසන්ති......

26. තත්‍ථ නිච්චඵලා රුක්ඛා-නානාදිජගණායුතා, මයූර කොඤ්චා'භිරුද-කොකිලාහි හි වග්ගුහි. ජීවඤ්ජීවක සද්දෙ'ත්‍ථ - අථො ඔට්ඨව චිත්‍තකා කුක්කුට්ඨකා කුළීරකා - වනෙ පොක්ඛරසාතකා. සුක සාලික සද්දෙ'ත්‍ථ - දණ්ඩමානවකානි ච, සොහති සබ්බකාලං සා - කුවෙර නලිනී සදා......

27. ඉතො සා උත්‍තරාදිසා - ඉති නං ආචික්ඛතී ජනො,
යං දිසං අභිපාලෙති-මහාරාජා යසස්සිසො.
යක්ඛානං ආධිපති-කුවෙරො ඉති නාමසො,
රමතී නච්චගීතෙහි-යක්ඛෙහි පුරක්ඛතො,
පුත්‍තා'පි තස්ස බහවො-එකනාමා'ති මෙසුතං,
අසීතිං දස එකොච-ඉන්‍දනාමා මහබ්බලා.
තෙ චා'පි බුද්ධං දිස්වාන-බුද්ධං ආදිච්චබන්‍ධුනං,
දූරතො'ව නමස්සන්ති-මහන්‍තං වීතසාරදං,
නමො තෙ පුරිසාජඤ්ඤ-නමො තෙ
පරිසුත්‍තම......

කුසලෙන සමෙක්ඛසි. අමනුස්සා පි තං දින්‍නි සුතං නෙතං අභිණ්හසො. තස්මා එවං

Non-Commercial Distribution

වදෙමසෙ ජිනං වන්දථ ගොතමං ජිනං වන්දම ගොතමං, විජ්ජාචරණසම්පන්නං බුද්ධං වන්දම ගොතමං'ති..

28. අයං ඛො සා මාරිස ආටානාටියා රක්ඛා, භික්ඛූනං භික්ඛුණීනං, උපාසකානං උපාසිකානං, ගුත්තියා රක්ඛාය අවිහිංසාය ඵාසුවිහාරායා'ති.

29. යස්ස කස්සචි මාරිස, භික්ඛුස්ස වා භික්ඛුණියා වා. උපාසකස්ස වා උපාසිකාය වා, අයං ආටානාටියා රක්ඛා, සුග්ගහිතා භවිස්සති සමත්තා පරියාපුතා. තඤ්චෙ අමනුස්සො..

30. යක්ඛො වා යක්ඛිණී වා, යක්ඛපොතකො වා යක්ඛපොතිකා වා, යක්ඛමහාමත්තො වා යක්ඛ පාරිසජ්ජො වා යක්ඛපචාරො වා..

31. ගන්ධබ්බො වා ගන්ධබ්බී වා, ගන්ධබ්බ පොතකො වා ගන්ධබ්බපොතිකා වා ගන්ධබ්බ මහාමත්තො වා ගන්ධබ්බපාරිසජ්ජො වා ගන්ධබ්බ පචාරො වා..

32. කුම්භණ්ඩො වා කුම්භණ්ඩී වා, කුම්භණ්ඩ-පොතකො වා කුම්භණ්ඩපොතිකා වා, කුම්භණ්ඩමහාමත්තො වා කුම්භණ්ඩපාරිසජ්ජො වා කුම්භණ්ඩ පචාරො වා.

Non-Commercial Distribution

33. නාගො වා නාගිනී වා, නාගපොතකො වා නාගපොතිකා වා, නාගමහාමත්තො වා නාගපාරි සජ්ජො වා, නාගපචාරො වා, පදුට්ඨචිත්තො:-

34. ගච්ඡන්තං වා අනුගච්ඡෙය්‍ය. ඨිතං වා උප-තිට්ඨෙය්‍ය, නිසින්නං වා උපනිසීදෙය්‍ය නිපන්නං වා උපනිපජ්ජෙය්‍ය.

න මෙ සො මාරිස! අමනුස්සො ලභෙය්‍ය ගාමෙසු වා නිගමෙසු වා, සක්කාරංවා ගරුකාරංවා....

න මෙ සො මාරිස! අමනුස්සො ලභෙය්‍ය, ආලකමන්දය රාජධානියා වත්ථුං වා වාසං වා....

න මෙ සො මාරිස! අමනුස්සො ලභෙය්‍ය, යක්ඛාණං සමිතිං ගන්තුං....

අපිස්සු නං මාරිස! අමනුස්සා, අනවය්හම්පි නං කරෙය්‍යුං අවිවය්හං....

අපිස්සු නං මාරිස! අමනුස්සා, අත්තාහි පි පරි-පුණ්ණාහි පරිභාසාහි පරිභාසෙය්‍යුං....

අපිස්සු නං මාරිස! අමනුස්සා, රිත්තම්පි පත්තං සීසෙ නික්කුජ්ජෙය්‍යුං....

අපිස්සු නං මාරිස! අමනුස්සා සත්තධා පිස්ස මුද්ධං ඵාලෙය්‍යුං.

Non-Commercial Distribution

35. සන්ති හි මාරිස! අමනුස්සා චණ්ඩා රුද්දා රභසා, තෙ නෙව මහාරාජානං ආදියන්ති. න මහා රාජානං පුරිසකානං ආදියන්ති. න මහාරාජානං පුරිසකානං පුරිසකානං ආදියන්ති. තෙ ඛො තෙ මාරිස! අමනුස්සා, මහාරාජානං අවරුද්ධා නාම වුච්චන්ති..

36. සෙය්‍යථා'පි මාරිස! රඤ්ඤො මාගධස්ස විජිතෙ චොරා, තෙ නෙව රඤ්ඤො මාගධස්ස ආදියන්ති. න රඤ්ඤො මාගධස්ස පුරිසකානං ආදියන්ති. න රඤ්ඤො මාගධස්ස පුරිසකානං පුරිසකානං ආදියන්ති. තෙ ඛො තෙ මාරිස! මහාචොරා, රඤ්ඤො මාගධස්ස අවරුද්ධා. නාම වුච්චන්ති..

37. එව මෙව ඛො මාරිස! සන්තිහි අමනුස්සා චණ්ඩා රුද්දා රභසා තෙ නෙව මහාරාජානං ආදියන්ති. න මහාරාජානං පුරිසකානං ආදියන්ති, න මහාරාජානං පුරිසකානං පුරිසකානං ආදියන්ති. තෙ ඛො තෙ මාරිස! අමනුස්සා මහාරාජානං අවරුද්ධා නාම වුච්චන්ති..

38. යො හි කොචි මාරිස! අමනුස්සො යක්ඛො වා යක්ඛිණී වා, යක්ඛපොතකො වා යක්ඛපොතිකා වා, යක්ඛමහාමත්තො වා යක්ඛපාරිසජ්ජො වා යක්ඛපචාරො වා..

Non-Commercial Distribution

ගන්ධබ්බො වා ගන්ධබ්බී වා, ගන්ධබ්බපොතකො වා ගන්ධබ්බපොතිකා වා, ගන්ධබ්බමහා මත්තො වා ගන්ධබ්බපාරිසජ්ජො වා ගන්ධබ්බ පචාරො වා..

39. කුම්භණ්ඩො වා කුම්භණ්ඩී වා කුම්භණ්ඩපොතකො වා කුම්භණ්ඩ පොතිකා වා, කුම්භණ්ඩ මහාමත්තො වා කුම්භණ්ඩපාරිසජ්ජො වා කුම්භණ්ඩ පචාරො වා..

40. නාගො වා නාගිනී වා, නාගපොතකො වා නාගපොතිකා වා, නාග මහාමත්තො වා නාග පාරිසජ්ජො වා නාගපචාරො වා..

41. පදුට්ඨචිත්තො:- භික්ඛුං වා භික්ඛුණිං වා, උපාසකං වා උපාසිකං වා, ගච්ඡන්තං වා අනුගච්ඡෙය්‍ය. ඨිතං වා උපතිට්ඨෙය්‍ය. නිසින්නං වා උපනිසිදෙය්‍ය නිපන්නං වා උපනිපජ්ජෙය්‍ය..

42. ඉමෙසං යක්ඛානං මහායක්ඛානං, සෙනාපතීනං මහාසෙනාපතීනං, උජ්ඣාපෙතබ්බං වික්කන්දි තබ්බං විරවිතබ්බං..

43. අයං යක්ඛො ගණ්හාති, අයං යක්ඛො ආවිසති. අයං යක්ඛො හෙඨෙති, අයං යක්ඛො විහෙඨෙති. අයං යක්ඛො හිංසති, අයං යක්ඛො විහිංසති. අයං යක්ඛො න මුඤ්චතීති.

Non-Commercial Distribution

44. කතමෙසං යක්ඛානං මහායක්ඛානං, සෙනාපතීනං මහාසෙනාපතීනං...

ඉන්දො සොමො වරුණො ච-භාරද්වාජො පජාපති
චන්දනො කාමසෙට්ඨො ච-කින්නුඝණ්ඩු නිඝණ්ඩු ච.
පනාදො ඔපමඤ්ඤො ච-දෙවසූතො ච මාතලි
චිත්තසෙනො ච ගන්ධබ්බො-නලො රාජා ජනෙසභො.
සාතාගිරො හෙමවතො-පුණ්ණකො කරතියො ගුලො
සීවකො මුචලින්දො ච-වෙස්සාමිත්තො යුගන්ධරො.
ගොපාලො සුප්පගෙධො ච- හිරීනෙත්ති ච මන්දියො
පඤ්චාලචණ්ඩො ආලවකො-පජ්ජුනෙනා
සුමනො සුමුඛො දධිමුඛො
මණී මාණී චරො දීඝො-අථො
සෙරීස්සකො සහ...

45. ඉමෙසං යක්ඛානං මහායක්ඛානං, සෙනාපතීනං මහාසෙනාපතීනං, උජ්ඣාපෙතබ්බං වික්කන්දි තබ්බං විරවිතබ්බං. අයං යක්ඛො ගණ්හාති. අයං යක්ඛො ආවිසති. අයං යක්ඛො හෙඨෙති. අයං යක්ඛො විහෙඨෙති. අයං යක්ඛො හිංසති. අයං යක්ඛො විහිංසති. අයං යක්ඛො න මුඤ්චතී'ති.

Non-Commercial Distribution

46. අයං බො සා මාරිස! ආටානාටියා රක්ඛා භික්ඛූනං භික්ඛුණීනං. උපාසකානං, උපාසිකානං ගුත්තියා රක්ඛාය අවිහිංසාය ඵාසුවිහාරායාති.

47. හන්ද ච දනි මයං මාරිස! ගච්ඡාම. බහුකිච්චා මයං බහුකරණීයා ති. යස්සදනි තුම්හෙ මහාරාජානො කාලං මඤ්ඤථා'ති.

අථ බො චත්තාරො මහාරාජා උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා තත්ථෙව න්තරධායිංසු.

48. තෙ'පි බො යක්ඛා උට්ඨායාසනා, අප්පෙකච්චෙ භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා තත්ථෙවන්තරධායිංසු.

අප්පෙකච්චෙ භගවතා සද්ධිං සම්මොදිංසු. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා තත්ථෙව-න්තරධායිංසු.

අප්පෙකච්චෙ යෙන භගවා, තෙනඤ්ජලිං පණාමෙත්වා තත්ථෙව'න්තරධායිංසු.

අප්පෙකච්චෙ නාමගොත්තං සාවෙත්වා තත්ථෙ-වන්තරධායිංසු.

අප්පෙකච්චෙ තුණ්හීභූතා තත්ථෙවන්තරධායිං සු'ති.

තතියක භාණවාරං.

Non-Commercial Distribution

# ආටානාටිය සුත්තං

## දුතියක භාණවාරං

නමො තස්ස භගවතො අරහතො
සම්මා සම්බුද්ධස්ස

1. අථ ඛො භගවා තස්සා රත්තියා අච්චයෙන භික්ඛූ ආමන්තෙසි. ඉමං භික්ඛවෙ රත්තිං චත්තාරො මහාරාජා මහතියා ච යක්ඛසෙනාය, මහතියා ච ගන්ධබ්බ සෙනාය, මහතියා ච කුම්භණ්ඩ සෙනාය, මහතියා ච නාගසෙනාය, චතුද්දිසං රක්ඛං ඨපෙත්වා, චතුද්දිසං ගුම්බං ඨපෙත්වා, චතුද්දිසං ඔවරණං ඨපෙත්වා, අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණා, කෙවලකප්පං ගිජ්ඣකූටං ඔභාසෙත්වා, යෙනාහං තෙනුපසංකමිංසු. උපසඞ්කමිත්වා මං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු.

2. තෙපි ඛො භික්ඛවෙ යක්ඛා, අප්පෙකච්චෙ මං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. අප්පෙකච්චෙ මම සද්ධිං සම්මොදිංසු. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදිංසු. අප්පෙකච්චෙ යෙනාහං තෙනඤ්ජලිං පනාමෙත්වා එකමන්තං නිසීදිංසු. අප්පෙකච්චෙ නාමගොත්තං සාවෙත්වා එකමන්තං නිසීදිංසු අප්පෙකච්චෙ තුණ්හීභූතා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නො ඛො භික්ඛවෙ වෙස්සවණො මහාරාජා මං එතදවොච.

Non-Commercial Distribution

3. සන්ති හි භන්තෙ උළාරා යක්ඛා භගවතො අප්පසන්නා, සන්ති හි භන්තෙ උළාරා යක්ඛා භගවතො පසන්නා, සන්ති හි භන්තෙ මජ්ඣිමා යක්ඛා භගවතො අප්පසන්නා, සන්ති හි භන්තෙ මජ්ඣිමා යක්ඛා භගවතො පසන්නා. සන්ති හි භන්තෙ නීචා යක්ඛා භගවතො අප්පසන්නා. සන්ති හි භන්තෙ නීචා යක්ඛා භගවතො පසන්නා.

4. යෙභුය්‍යෙන ඛො පන භන්තෙ යක්ඛා, අප්පසන්නායෙ ව භගවතො. තං කිස්සහෙතු? භගවා හි භන්තෙ! පාණාතිපාතා වෙරමණියා ධම්මං දෙසෙති, අදින්නාදනා වෙරමණියා ධම්මං දෙසෙති, කාමෙසු මිච්ඡාචාරා වෙරමණියා ධම්මං දෙසෙති, මුසාවාද වෙරමණියා ධම්මං දෙසෙති, සුරාමෙරය මජ්ජපමාදට්ඨානා වෙරමණියා ධම්මං දෙසෙති.

5. යෙභුය්‍යෙන ඛො පන භන්තෙ යක්ඛා, අප්පටිවිරතා යෙව පාණාතිපාතා, අප්පටිවිරතා අදින්නාදනා අප්පටිවිරතා කාමෙසුමිච්ඡාචාරා, අප්පටිවිරතා මුසාවාද, අප්පටිවිරතා සුරාමෙරයමජ්ජපමාදට්ඨානා, තෙසං තං හොති අප්පියං අමනාපං.

6. සන්ති හි භන්තෙ භගවතො සාවකා, අරඤ්ඤෙ වනපත්ථානි පන්තානි සෙනාසනානි පටිසෙවන්ති අප්පසද්දානි අප්පනිග්ඝොසානි,

විජනවාතානි මනුස්සරාහසෙය්‍යකානි පටිසල්ලාන-සාරුප්පානි, තත්ථ සන්ති උළාරා යක්ඛා නිවාසිනො, යෙ ඉමස්මිං භගවතො පාවචනෙ අප්පසන්නා, තෙසං පසාදය.

7. උග්ගණ්හාතු භන්තෙ භගවා ආටානාටියං රක්ඛං භික්ඛුනං භික්ඛුණීනං උපාසකානං උපාසි-කානං ගුත්තියා රක්ඛාය අවිහිංසාය ඵාසුවිහාරායා'ති.

8. අධිවාසෙසිං ඛො අහං භික්ඛවෙ තුණ්හී භාවෙන, අථ ඛො භික්ඛවෙ වෙස්සවණො මහාරාජා මං අධිවාසනං විදිත්වා, තායං වෙලායං ඉමං ආටානාටියං රක්ඛං අභාසි.

9. විපස්සිස්ස නමත්ථු-චක්ඛුමන්තස්ස සිරීමතො
සිඛිස්ස පි නමත්ථු-සබ්බභූතානු කම්පිනො
වෙස්සභුස්ස නමත්ථු-න්හාතකස්ස තපස්සිනො
නමත්ථු කකුසන්ධස්ස-මාරසෙනා පමද්දිනො
කොණාගමනස්ස නමත්ථු-බ්‍රාහ්මණස්ස වුසීමතො
කස්සපස්ස නමත්ථු-විප්පමුත්තස්ස සබ්බධි
අඞ්ගීරසස්ස නමත්ථු-සක්‍යපුත්තස්ස සිරීමතො
යො ඉමං ධම්ම මදෙසෙසි-සබ්බ දුක්ඛා පනූදනං

10. යෙ චා පි නිබ්බුතා ලොකෙ-යථාභූතං විපස්සිසුං
තෙ ජනා අපිසුනා-මහන්තා වීතසාරද

Non-Commercial Distribution

11. හිතං දෙව මනුස්සානං-යං නමස්සන්ති ගොතමං,
විජ්ජාචරණ සම්පන්නං-මහන්තං වීතසාරදං.

12. යතො උග්ගච්ඡති සූරියො-ආදිච්චො
මණ්ඩලි මහා,
යස්සචුග්ගච්ඡමානස්ස-සංවරී'පි නිරුජ්ඣති,
යස්සචුග්ගතෙ සූරියෙ-දිවසොති පවුච්චති.
රහදෙපි තත්ථගම්භීරො-සමුද්දෙ සරිතොදකො,
එවං නං තත්ථ ජානන්ති-සමුද්දෙ සරිතොදකො.

13. ඉතො සා පුරිමා දිසා-ඉති නං ආචික්ඛ ති ජනො,
යං දිසං අභිපාලෙති-මහාරාජා යසස්සිසො.
ගන්ධබ්බානං ආධිපති-ධතරට්ඨො ඉති නාමසො,
රමතී නච්චගීතෙහි-ගන්ධබ්බෙහි පුරක්ඛතො.
පුත්තා'පි තස්ස බහවො-එකනාමා ති මෙ සුතං,
අසීතිං දස එකො ච-ඉන්දනාමා මහබ්බලා.
තෙ චා'පි බුද්ධං දිස්වාන-බුද්ධං ආදිච්චබන්ධුනං,
දූරතො'ව නමස්සන්ති-මහන්තං වීතසාරදං,
නමො තෙ පුරිසා ජඤ්ඤ-නමො තෙ පුරිසුත්තම.

14. කුසලෙන සමෙක්ඛසි, අමනුස්සාපි තං වන්දන්ති සුතං නෙ තං අභිණ්හසො. තස්මා එවං වදෙමසෙ ජිනං වන්දථ ගොතමං ජිනං වන්දම ගොතමං විජ්ජාචරණසම්පන්නං බුද්ධං වන්දම ගොතමං..

Non-Commercial Distribution

15. යෙන පෙතා පවුච්චන්ති-පිසුණා පිට්ඨිමංසිකා,
පාණාතිපාතිනො ලුද්දා-චොරා නෙකතිකාජනා.
ඉතො සා දක්ඛිණා දිසා-ඉති නං ආචික්ඛති ජනො,
යං දිසං අභිපාලෙති-මහාරාජා යසස්සිසො.
කුම්භණ්ඩානං ආධිපති-විරූළ්හො ඉති නාමසො,
රමතී නච්චගීතෙහි-කුම්භණ්ඩෙහි පුරක්ඛතො.
පුත්තා'පි තස්ස බහවො-එකනාමා'ති මෙ සුතං,
අසීතිං දස එකො ච-ඉන්දනාමා මහබ්බලා.
තෙ චා පි බුද්ධං දිස්වාන-බුද්ධං ආදිච්චබන්ධුනං,
දූරතො'ව නමස්සන්ති-මහන්තං වීතසාරදං,
නමො තෙ පුරිසාජඤ්ඤ-නමො තෙ
පුරිසුත්තම..

16. කුසලෙන සමෙක්ඛසි, අමනුස්සා'පි තං වන්දන්ති සුතං නෙතං අභිණ්හසො, තස්මා එවං වදෙමසෙ ජිනං වන්දථ ගොතමං ජිනං වන්දාම ගොතමං, විජ්ජාචරණ සම්පන්නං බුද්ධං වන්දාම ගොතමං.

17. යත්ථ චොග්ගච්ඡති සූරියො-ආදිච්චො
මණ්ඩලි මහා.
යත්ථ චොග්ගච්ඡමානස්ස-දිවසො'පි නිරුජ්ඣති.
යස්ස චොග්ගතෙ සූරියෙ-සංවරීති පවුච්චති,
රහදෙ'පි තත්ථ ගම්භීරො-සමුද්දො සරිතොදකො.
එවං නං තත්ථ ජානන්ති-සමුද්දො සරිතොදකො

Non-Commercial Distribution

18. ඉතො සා පච්ඡිමා දිසා - ඉති නං
ආචික්ඛති ජනො,
යං දිසං අභිපාලෙති - මහාරාජා යසස්සිසො.
නාගානං ආධිපති - විරූපක්ඛො ඉති නාමසො,
රමති නච්චගීතෙහි - නාගෙහි පුරක්ඛතො.
පුත්තා පි තස්ස බහවො - එකනාමාති මෙ සුතං,
අසීතිං දස එකො ච - ඉන්දනාමා මහබ්බලා.
තෙ චා පි බුද්ධං දිස්වාන - බුද්ධං ආදිච්චබන්ධුනං,
දූරතො ච නමස්සන්ති - මහන්තං වීතසාරදං,
නමො තෙ පුරිසාජඤ්ඤ - නමො තෙ පුරිසුත්තම.

19. කුසලෙන සමෙක්ඛසි, අමනුස්සා පි තං වන්දන්ති සුතං නෙතං අභිණ්හසො තස්මා එවං වදෙමසෙ ජිනං වන්දථ ගොතමං ජිනං වන්දම ගොතමං, විජ්ජාචරණසම්පන්නං බුද්ධං වන්දම ගොතමං.

20. යෙන උත්තරකුරූරම්මා-මහානෙරූ සුදස්සනො,
මනුස්සා තත්ථ ජායන්ති-අමමා අපරිග්ගහා.
න තෙ බීජං පවපන්ති - න පි නීයන්ති නඞ්ගලා,
අකට්ඨපාකිමං සාලිං - පරිභුඤ්ජන්ති මානුසා.
අකණං අථුසං සුද්ධං - සුගන්ධං තණ්ඩුලප්ඵලං,
තුණ්ඩිකීරෙ පචිත්වාන - තතො භුඤ්ජන්ති
භොජනං,

Non-Commercial Distribution

21. ගාවිං එක ඛුරං කත්වා - අනුයන්ති දිසෝදිසං,
පසුං එක ඛුරං කත්වා - අනුයන්ති දිසෝදිසං.
ඉත්ථි වාහනං කත්වා - අනුයන්ති දිසෝදිසං,
පුරිස වාහනං කත්වා - අනුයන්ති දිසෝදිසං,
කුමාරී වාහනං කත්වා - අනුයන්ති දිසෝදිසං,
කුමාර වාහනං කත්වා - අනුයන්ති දිසෝදිසං.
තෙ යානෙ අභිරූහිත්වා - සබ්බාදිසා
අනුපරියන්ති පචාරා තස්ස රාජිනො.

22. හත්ථියානං අස්සයානං - දිබ්බං යානං උපට්ඨිතං
පාසාද සිවිකාචෙ ච - මහාරාජස්ස
යසස්සිනො.

23. තස්ස ච නගරා අහු - අන්තලික්ඛෙ සුමාපිතා
ආටානාටා කුසිනාටා පරකුසිනාටා නාටපුරියා පරකුසිතනාටා, උත්තරෙන කපිවන්තො ජනොඝමපරෙන ච, නවනවතියො අම්බර අම්බරවතියො ආලකමන්දා නාම රාජධානි, කුවෙරස්ස ඛො පන මාරිස! මහාරාජස්ස විසාණා නාම රාජධානි, තස්මා කුවෙරො මහාරාජා වෙස්සවණොති පවුච්චති.

24. පච්චෙසන්තො පකාසෙන්ති තතොලා තත්තලා තතොතලා, ඔජසි තෙජසි තතොජසි සූරො රාජා අරිට්ඨො නෙමි, රහදෙ පි තත්ථ

ධරණී නාම, යතො මෙඝා පවස්සන්ති වස්සා යතො පතායන්ති. සභා පි තත්ථ භගලවතී නාම යත්ථ යක්ඛා පයිරුපාසන්ති.

25. තත්ථ නිච්චඵලා රුක්ඛා - නානා දිජගණායුතා,
මයූර කොඤ්චාභිරුද - කොකිලාභි හි වග්ගුහි.
ජීවඤ්ජීවක සද්දෙත්ථ - අථො ඔට්ඨව චිත්තකා,
කුකුත්ථකා කුළීරකා - වනෙ පොක්ඛරසාතකා.
සුක සාලික සද්දෙත්ථ - දණ්ඩමානවකානි ච.
සොභති සබ්බකාලං සා - කුවෙර නලිනී සදා.

26. ඉතොසා උත්තරා දිසා-ඉති නං ආචික්ඛති ජනො,
යං දිසං අභිපාලෙති - මහාරාජා යසස්සිසො.
යක්ඛානං ආධිපති - කුවෙරො ඉති නාමසො,
රමතී නච්චගීතෙහි - යක්ඛෙහි පුරක්ඛතො.
පුත්තා පි තස්ස බහවො - එකනාමා'ති මෙ සුතං.
අසීතිං දස එකො ච - ඉන්දනාමා මහබ්බලා.
තෙ චා'පි බුද්ධං දිස්වාන - බුද්ධං ආදිච්චබන්ධුනං,
දූරතො'ව නමස්සන්ති - මහන්තං වීතසාරදං.
නමොතෙ පුරිසාජඤ්ඤ - නමො තෙ පුරිසුත්තම!

27. කුසලෙන සමෙක්ඛසි. අමනුස්සා පි තං වන්දන්ති සුතං නෙතං අභිණ්හසො, තස්මා එවං වදෙමසෙ ජිනං වන්දථ ගොතමං ජිනං වන්දම ගොතමං, විජ්ජාචරණසම්පන්නං බුද්ධං වන්දම ගොතමන්ති...

Non-Commercial Distribution

28. අයං ඛො සා මාරිස! ආටානාටියා රක්ඛා, භික්ඛූනං භික්ඛුණීනං, උපාසකානං උපාසිකානං, ගුත්තියා රක්ඛාය අවිහිංසාය ඵාසුවිහාරායා'ති.

29. යස්ස කස්සචි මාරිස, භික්ඛුස්ස වා භික්ඛුණියා වා, උපාසකස්ස වා උපාසිකාය වා. අයං ආටානාටියා රක්ඛා, සුග්ගහිතා භවිස්සති සමත්තා පරියාපුතා. තඤ්චෙ අමනුස්සො......

30. යක්ඛො වා යක්ඛිණී වා, යක්ඛපොතකො වා යක්ඛපොතිකා වා, යක්ඛමහාමත්තො වා යක්ඛ පාරිසජ්ජො වා යක්ඛපචාරො වා......

31. ගන්ධබ්බො වා ගන්ධබ්බී වා, ගන්ධබ්බ පොතකො වා ගන්ධබ්බපොතිකා වා, ගන්ධබ්බ මහාමත්තො වා ගන්ධබ්බපාරිසජ්ජො වා ගන්ධබ්බ පචාරො වා......

32. කුම්භණ්ඩො වා කුම්භණ්ඩී වා, කුම්භණ්ඩ-පොතකො වා කුම්භණ්ඩපොතිකා වා, කුම්භණ්ඩමහා මත්තො වා කුම්භණ්ඩපාරිසජ්ජො වා කුම්භණ්ඩ පචාරො වා.

33. නාගො වා නාගිනී වා, නාගපොතකො වා නාගපොතිකා වා, නාග මහාමත්තො වා නාගපාරි සජ්ජො වා නාගපචාරො වා. පදුට්ඨචිත්තො:-

Non-Commercial Distribution

34. ගච්ඡන්තං වා අනුගච්ඡෙය්‍ය, ඨිතං වා උපතිට්ඨෙය්‍ය, නිසින්නං වා උපනිසීදෙය්‍ය, නිපන්නං වා උපනිපජ්ජෙය්‍ය.

35. න මෙ සො මාරිස! අමනුස්සො ලභෙය්‍ය ගාමෙසු වා නිගමෙසු වා, සක්කාරං වා ගරුකාරංවා...

36. න මෙ සො මාරිස! අමනුස්සො ලභෙය්‍ය, ආලකමන්දය රාජධානියා වත්ථුං වා වාසං වා...

37. න මෙ සො මාරිස! අමනුස්සො ලභෙය්‍ය යක්ඛානං සමිතිං ගන්තුං...

38. අපිස්සු නං මාරිස! අමනුස්සා, අනවය්හම්පි නං කරෙය්‍යුං අවිවය්හං...

39. අපිස්සු නං මාරිස! අමනුස්සා, අත්තාහි'පි පරිපුණ්ණාහි පරිභාසාහි පරිභාසෙය්‍යුං...

40. අපිස්සු නං මාරිස! අමනුස්සා, රිත්ත'ම්පි පත්තං සීසෙ නික්කුජ්ජෙය්‍යුං...

41. අපිස්සු නං මාරිස! අමනුස්සා, සත්තධා-පි'ස්ස මුද්ධං ඵාලෙය්‍යුං.

42. සන්ති හි මාරිස! අමනුස්සා චණ්ඩා රුද්දා රභසා. තෙ නෙව මහාරාජානං ආදියන්ති, න මහාරාජානං පුරිසකානං ආදියන්ති, න මහාරාජානං පුරිසකානං පුරිසකානං ආදියන්ති, තෙ ඛො තෙ මාරිස අමනුස්සා, මහාරාජානං අවරුද්ධා නාම වුච්චන්ති.

Non-Commercial Distribution

43. සෙය්‍යථා'පි මාරිස! රඤ්ඤො මාගධස්ස විජිතෙ චොරා, තෙ නෙව රඤ්ඤො මාගධස්ස ආදියන්ති, න රඤ්ඤො මාගධස්ස පුරිසකානං ආදියන්ති, න රඤ්ඤො මාගධස්ස පුරිසකානං පුරිසකානං ආදියන්ති, තෙ ඛො තෙ මාරිස! මහාචොරා, රඤ්ඤො මාගධස්ස අවරුද්ධා නාම වුච්චන්ති..

44. එව'මෙව ඛො මාරිස! සන්ති හි අමනුස්සා චණ්ඩා රුද්දා රභසා, තෙ නෙව මහාරාජානං ආදියන්ති, න මහාරාජානං පුරිසකානං ආදියන්ති, න මහාරාජානං පුරිසකානං පුරිසකානං ආදියන්ති, තෙ ඛො තෙ මාරිස! අමනුස්සා, මහාරාජානං අවරුද්ධා නාම වුච්චන්ති..

45. යො හි කොචි මාරිස! අමනුස්සො, යක්ඛො වා යක්ඛිණී වා, යක්ඛපොතකො වා යක්ඛපොතිකා වා, යක්ඛමහාමත්තො වා යක්ඛපාරිසජ්ජො වා යක්ඛ-පචාරො වා..

46. ගන්ධබ්බො වා ගන්ධබ්බී වා, ගන්ධබ්බ-පොතකො වා ගන්ධබ්බපොතිකා වා, ගන්ධබ්බ මහාමත්තො වා ගන්ධබ්බපාරිසජ්ජො වා ගන්ධබ්බ පචාරො වා..

Non-Commercial Distribution

47. කුම්භණ්ඩො වා කුම්භණ්ඩී වා, කුම්භණ්ඩපොතකො වා, කුම්භණ්ඩපොතිකා වා, කුම්භණ්ඩමහාමත්තො වා කුම්භණ්ඩ පාරිසජ්ජො වා කුම්භණ්ඩ පචාරො වා.

48. නාගො වා නාගිනී වා, නාගපොතකො වා නාගපොතිකා වා, නාගමහාමත්තො වා නාග පාරිසජ්ජො වා නාගපචාරො වා…

49. පදුට්ඨචිත්තො භික්ඛුං වා භික්ඛුනිං වා, උපාසකං වා, උපාසිකං වා, ගච්ඡන්තං වා අනුගච්ඡෙය්‍ය, ඨිතං වා උපතිට්ඨෙය්‍ය නිසින්නං වා උපනිසීදෙය්‍ය, නිපන්නං වා උපනිපජ්ජෙය්‍ය…

50. ඉමෙසං යක්ඛානං මහායක්ඛානං, සෙනාපතීනං මහාසෙනාපතීනං, උජ්ඣාපෙතබ්බං වික්කන්දිතබ්බං විරවිතබ්බං…

51. අයං යක්ඛො ගණ්හාති, අයං යක්ඛො ආවිසති, අයං යක්ඛො හෙඨෙති, අයං යක්ඛො විහෙඨෙති, අයං යක්ඛො හිංසති, අයං යක්ඛො විහිංසති, අයං යක්ඛො න මුඤ්චතී ති…

කතමෙසං යක්ඛානං මහායක්ඛානං, සෙනාපතීනං මහාසෙනාපතීනං.

Non-Commercial Distribution

52. ඉන්දො සොමො වරුණො ච-භාරද්වාජො පජාපති,
චන්දනො කාමසෙට්ඨො ච - කින්නුඝණ්ඩු නිඝණ්ඩුච.
පණ්ණාදො ඔපමඤ්ඤො ච-දෙවසූතො ච මාතලි,
චිත්තසෙනොච ගන්ධබ්බො-නළොරාජාජනෙසභො.
සාතාගිරො හෙමවතො-පුණ්ණකො කරතියො ගුළො,
සිවකො මුචලින්දො ච - වෙස්සාමිත්තො යුගන්ධරො.
ගොපාලො සුප්පගෙධො ච-හිරිනෙත්තිච මන්දියො,
පඤ්චාලචණ්ඩො ආළවකො - පජ්ජුන්නො
සුමනො සුමුඛො දධිමුඛො,
මණිමාණිචරො දීඝො-අථො සෙරීස්සකො සහ.

53. ඉමෙසං යක්ඛානං මහායක්ඛානං, සෙනාපතීනං මහාසෙනාපතීනං, උජ්ඣාපෙතබ්බං වික්කන්දිතබ්බං විරවිතබ්බං.

54. අයං යක්ඛො ගණ්හාති, අයං යක්ඛො ආවිසති, අයං යක්ඛො හෙඨෙති, අයං යක්ඛො විහෙඨෙති, අයං යක්ඛො හිංසති, අයං යක්ඛො විහිංසති, අයං යක්ඛො න මුඤ්චතී'ති.

55. අයං ඛො සා මාරිස! ආටානාටියා රක්ඛා භික්ඛූනං භික්ඛුණීනං, උපාසකානං උපාසිකානං, ගුත්තියා රක්ඛාය අවිහිංසාය ඵාසුවිහාරායා'ති.

56. හන්ද ච දානි මයං මාරිස! ගච්ඡාම බහුකිච්චා මයං බහුකරණීයා'ති. යස්ස'දානි තුම්හෙ මහාරාජානො කාලං මඤ්ඤථා'ති.

Non-Commercial Distribution

57. අථ ඛො භික්ඛවෙ චත්තාරො මහාරාජා උට්ඨායාසනා, මං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා තත්ථෙවන්තරධායිංසු.

58. තෙ පි ඛො භික්ඛවෙ යක්ඛා උට්ඨායාසනා, අප්පෙකච්චෙ මං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා තත්ථෙවන්තරධායිංසු. අප්පෙකච්චෙ මම සද්ධිං සම්මොදිංසු, සම්මොදනීයං කථං සාරාණීයං විති සාරෙත්වා තත්ථෙව'න්තරධායිංසු. අප්පෙකච්චෙ යෙනා'හං. තෙනඤ්ජලිං පණාමෙත්වා තත්ථෙ වන්තරධායිංසු. අප්පෙකච්චෙ නාමගොත්තං සාවෙත්වා තත්ථෙවන්තරධායිංසු. අප්පෙකච්චෙ තුණ්හීභූතා තත්ථෙව'න්තරධායිංසු'ති.

59. උග්ගණ්හාථ භික්ඛවෙ ආටානාටියං රක්ඛං පරියාපුණාථ භික්ඛවෙ ආටානාටියං රක්ඛං, ධාරෙථ භික්ඛවෙ ආටානාටියං රක්ඛං, අත්ථසංහිතාය භික්ඛවෙ ආටානාටියාරක්ඛා, භික්ඛූනං භික්ඛුණීනං, උපාසකානං උපාසිකානං, ගුත්තියා රක්ඛාය අවිහිංසාය ඵාසු විහාරාය'ති.

60. ඉදමවොච භගවා. අත්තමනා තෙ භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්ති.

ආටානාටිය සුත්තං නිට්ඨිතං

**චතුත්ථක භාණවාරං නිට්ඨිතං**

Non-Commercial Distribution

# නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස

ඒ භාග්‍යවත් අර්හත් සම්මා සම්බුදුරදුන් වහන්සේට නමස්කාර වේවා.

## 1. සරණා ගමනං. - සරණාගමනය.

බුද්ධං සරණං ගච්ඡාමි. - බුදුන් සරණ කොට යෙමි;
ධම්මං සරණං ගච්ඡාමි. - දහම් සරණ කොට යෙමි;
සංඝං සරණං ගච්ඡාමි. - සඟුන් සරණ කොට යෙමි;

දුතියම්පි බුද්ධං සරණං ගච්ඡාමි. - දෙවනුව ද බුදුන් සරණ කොට යෙමි;
දුතියම්පි ධම්මං සරණං ගච්ඡාමි. - දෙවනුව ද දහම් සරණ කොට යෙමි;
දුතියම්පි සංඝං සරණං ගච්ඡාමි. - දෙවනුව ද සඟුන් සරණ කොට යෙමි;

තතියම්පි බුද්ධං සරණං ගච්ඡාමි. - තෙවනුව ද බුදුන් සරණ කොට යෙමි;
තතියම්පි ධම්මං සරණං ගච්ඡාමි. - තෙවනුව ද දහම් සරණ කොට යෙමි;
තතියම්පි සංඝං සරණං ගච්ඡාමි. - තෙවනුව ද සඟුන් සරණ කොට යෙමි;

## 2. දස සික්ඛාපදානි. - දශ ශික්ෂා පද.

පාණාතිපාතා, ප්‍රාණඝාතයෙන්; වෙරමණී සික්ඛාපදං, වැළකීමේ ශික්ෂා පද ය; අදින්නාදානා, නුදුන් දෙය ගැනීමෙන්; වෙරමණී සික්ඛාපදං, වැළකීමේ ශික්ෂා පද ය; අබ්‍රහ්මචරියා, අබ්‍රහ්මචරියාවෙන්; වෙරමණී සික්ඛා පදං, වැළකීමේ ශික්ෂා පද ය; මුසාවාදා, මුසාවාදයෙන්; වෙරමණී සික්ඛාපදං, වැළකීමේ ශික්ෂා පද ය; සුරා මෙරය මජ්ජපමාදට්ඨානා, මදයට හා ප්‍රමාදයට කාරණ වූ රහමෙරින්; වෙරමණී සික්ඛාපදං, වැළකීමේ ශික්ෂා පද ය; විකාල භොජනා, විකල් බොජුනෙන්; වෙරමණී සික්ඛාපදං, වැළකීමේ ශික්ෂා පද ය; නච්ච ගීත වාදිත විසූක දස්සනා, නැටීම, ගැයීම, වැයීම, විසුලු බැලීම යන මෙයින්; වෙරමණී සික්ඛා පදං, වැළකීමේ ශික්ෂා පද ය, මාලා ගන්ධ විලේපන ධාරණ මණ්ඩන විභූසනට්ඨානා, මල්, ගඳ, විලවුන් දැරීම, සැරසීම, වෙසෙසින් සැරසීම යන කාරණයෙන්; වෙරමණී සික්ඛාපදං, වැළකීමේ ශික්ෂා පද ය; උච්චාසයන මහාසයනා, උසසුන් මහ අස්නෙන්; වෙරමණී සික්ඛාපදං, වැළකීමේ ශික්ෂා පද ය; ජාතරූප රජත පටිග්ගහණා, රන්, රිදී, මසු, කහවණු පිළිගැනීමෙන්; වෙරමණී සික්ඛාපදං, වැළකීමේ ශික්ෂා පද ය.

## 3. සාමණෙරපඤ්හො. - සාමණේර ප්‍රශ්නය.

එක නාම කිං ? (මේ සසුනෙහි) එක නම් කිම ? සබ්බෙ සත්තා, හැම සත්හු; ආහාරට්ඨිතිකා, ආහාර හේතුවෙන් සිටිති; ද්වෙ නාම කිං ? දෙක නම් කිම ? නාමඤ්ච රූපඤ්ච, නාමය හා රූපය යි; තීණි නාම කිං ? තුන නම් කිම ? තිස්සො වෙදනා, තුන් වෙදනාවෝ ය. චත්තාරි නාම කිං ? සතර නම් කිම ? චත්තාරි අරිය සච්චානි, සතර ආර්ය සත්‍යයෝ ය. පඤ්ච නාම කිං? පස නම් කිම? පඤ්චුපාදානක්ඛන්ධා, පස් උපාදානස්කන්ධයෝ ය. ඡනාම කිං ? සය නම් කිම ? ඡඅජ්ඣත්තිකානි

Non-Commercial Distribution

ආයතනානි, ආධ්‍යාත්මික ආයතනයෝ සය ය. සත්ත නාම කිං ? සත නම් කිම ? සත්ත බොජ්ඣඞ්ගා, බොජ්ඣඞ්ග සත ය. අට්ඨ නාම කිං ? අට නම් කිම ? අරියො අට්ඨඞ්ගිකො මග්ගො, අරි අටඟි මග ය. නව නාම කිං? නවය නම් කිම ? නව සත්තාවාසා, සත්තාවාස නවය ය. දස නාම කිං? දස නම් කිම ? දසහඞ්ගෙහි දසඟින්; සමන්නාගතො, යුක්ත වූයේ; අරහාති, අරහත්‍ය යි; වුච්චති ඉති, කියනු ලැබේ.

## 4. ද්වත්තිංසාකාරො. - ද්වත්තිංසාකාරය.

ඉමස්මිං කායෙ, මේ සිරුරෙහි; කෙසා, කේසයෝ ය; ලොමා, ලෝමයෝ ය; නඛා, නිය ය; දන්තා, දත් ය; තචො, සම ය; මංසං, මස් ය; නහාරු, නහර ය; අට්ඨී, ඇට ය; අට්ඨිමිඤ්ජා, ඇටමිදුලු ය; වක්කං, වකුගඩුව ය; හදයං හෘදය මාංසය ය; යකනං, අක්මාව ය; කිලොමකං, දලබුව ය; පිහකං, බඩදිව ය; පප්ඵාසං, පපුව ය; අන්තං, බඩවැල ය; අන්තගුණං, අතුණු බහන් ය; උදරියං, (නොපැසුණු අහරය;) උදරිය ය; කරිසං, අහර මල ය; පිත්තං, පිත ය; සෙම්හං, සෙම ය; පුබ්බො, (සැරවය) පූයා ය; ලොහිතං, ලෙහෙ ය; සෙදො සෝදිය ය; මෙදො, මේද ය; අස්සු, කඳුලු ය; වසා, වුරුණු ය; ඛෙලො, කෙළ ය; සිංඝානිකා, මුකුණු ය; (සොටු ය); ලසිකා, සඳමිදුලු ය; මුත්තං, මූත්‍ර ය; මත්ථකෙ, හිස මුදුනෙහි; මත්ථලුඞ්ගන්ති, හිස් මොලය යි යන මේ දෙතිස් කුණපයෝ; අත්‍ථි, ඇත්තාහ.

## 5. පච්ච වෙක්ඛණා. - පස් විකුම්.

යොනිසො, නුවණින්; පටිසංඛාය, මෙනෙහි කොට; යාවදෙව, යම්තාක්; සීතස්ස පටිඝාතාය, සීත නසනු පිණිස; උණ්හස්ස පටිඝාතාය, උෂ්ණ නසනු පිණිස; ඩංස, ඩැහ ලේ බොන මැසි ය; (ඇටමැසිය) මකස, මදුරු ය; වාත, වාත ය; ආතප, අව්ව ය; සිරිංසප, සිරිංසප ය; (සර්පයෝ ය) යන මොවුන් ගේ; සම්ඵස්සානං, ස්පර්‍ශයි; පටිඝාතාය, නසනු පිණිස; යාවදෙව, යම්තාක්; හිරිකොපින, ලජ්ජා කෝපන ස්ථානය; (ලැජ්ජා නසන තැන) පටිච්ඡාදනත්‍ථං, වැසීම පිණිස; චීවරං පටිසෙවාමි, සිවුර පරිභෝග කරමි.

යොනිසො, නුවණින්; පටිසංඛාය, මෙනෙහි කොට; පිණ්ඩපාතං, පිණ්ඩපාතය; පටිසෙවාමි, වළඳමි; නෙවදවාය, ක්‍රීඩා පිණිස නොවේ; නමදාය, මදය පිණිස; (පුරුෂ මද, බලමද ආදිය පිණිස) නමණ්ඩනාය, අලංකාර පිණිස නොවේ; නවිභූසනාය, සැරසීම පිණිස නොවේ; යාවදෙව, යම්තාක්; ඉමස්ස කායස්ස, මේ ශරීරයා ගේ; ඨිතියා, පැවැත්ම පිණිස; යාපනාය, යැපීම පිණිස; විහිංසූපරතියා, විහිංසාහරණ පිණිස; (බඩගිනි නැසීමට) බ්‍රහ්මචරියානුග්ගහාය, බඹසර සපයනු පිණිස; (බඹසර රැකීමට අනුග්‍රහ පිණිස) අහර වළඳමි; ඉති, මෙසේ; පුරාණඤ්ච වෙදනං, පුරාණ දුක් වේදනාව. පටිහංඛාමි, නසන්නෙමි; නවං ච වෙදනං, අලුත් දුක් වේදනාව, න උප්පාදෙස්සාමි, නො උපදවමි; මෙ, මට; යාත්‍රාව, ඉරියව් පැවැත්ම ද; අනවජ්ජතාව, නිවරද බව ද; ඵාසුවිහාරො ච, පහසු විහරණය ද, භවිස්සති, වන්නේය යි; (සළකා අහර වළඳමි.)

යොනිසො, නුවණින්; පටිසංඛාය, මෙනෙහි කොට; යාවදෙව, යම්තාක්; සීතස්ස පටිඝාතාය, සීත පීඩා නසනු පිණිස; උණ්හස්ස පටිඝාතාය, උෂ්ණ පීඩා නසනු පිණිස; ඩංස, ඩැහැ ලේ බොන මැසි ය; මකස, විද ලේබොන මදුරු ය; වාත, වාතය; ආතප, අව්ව ය; සිරිංසප සිරිංසප ය; (සර්පයෝ ය) යන මොවුන්ගේ; සම්ඵස්සානං පටිඝාතාය, ස්පර්‍ශ නසනු පිණිස; යාවදෙව, යම්තාක්; උතුපරිස්සය, ඍතු උපද්‍රව; විනොදනං, දුරු කිරීම පිණිස; පටි සල්ලානාරාමත්‍ථං, සිත එකඟ කිරීමෙහි ඇලෙනු පිණිස; සෙනාසනං, සෙනසුන්; පටිසෙවාමි, වැළඳ ගනිමි; (පරිභෝග කරමි.)

Non-Commercial Distribution

යොනිසො, නුවණින්; පටිසංඛාය, මෙනෙහි කොට; යාවදෙව, යම්තාක්; උප්පන්නානං, උපන්; වෙය්‍යාබාධිකානං, සිරුර පෙළන; වෙදනානං, වේදනාවන්; පටිඝාතාය, නසනු පිණිස; අබ්‍යාපජ්ඣ, නිරෝගිබව; පරමතාය, උතුම් බැවින්; ගිලානපච්චය භෙසජ්ජ පරික්ඛාරං ගිලන්පස බෙහෙත් පිරිකර; පටිසෙවාමි, වළඳමි.

## 6. දසධම්ම සුත්තං. - දස ධම්ම සූත්‍රය.

එවං මෙ සුතං, මා විසින් මෙසේ අසන ලදී. එකං සමයං, එක් සමයෙක; භගවා, භාග්‍යවතුන් වහන්සේ; සාවත්ථියං, සැවැත් නුවර; ජෙතවනෙ, ජේතවන නම් වූ; අනාථ පිණ්ඩිකස්ස, අනේපිඬු සිටුහු ගේ; ආරාමේ, ආරාමයෙහි; විහරති, වැඩ වසන සේක, තත්‍ර ඛො, එකල්හි; භගවා, භාග්‍යවතුන් වහන්සේ; භික්ඛවො ඉති, මහණෙනි, කියා; භික්ඛූ ආමන්තෙසි, භික්ෂූන් ඇමතූසේක, තෙ භික්ඛූ, ඒ භික්ෂූහු; භදන්තෙ ඉති, ස්වාමීන් වහන්සැ'යි කියා; භගවතො, භාග්‍යවතුන් වහන්සේට; පච්චස්සොසුං, පිළිවදන් දුන්හු ය; භගවා, බුදුරජාණන් වහන්සේ; එතදවොච, මෙය වදාළ සේක;

භික්ඛවෙ, මහණෙනි; ඉමෙ දස ධම්මා, මේ දස ධර්මයෝ; පබ්බජිතෙන, පැවිද්දහු විසින්; අභිණ්හං, නිතොර; පච්චවෙක්ඛිතබ්බං, ප්‍රත්‍යවේක්ෂා කටයුත්තාහු ය; කතමෙ දස ? කවර දස ධර්මයෝ ද යත් -

වෙවණ්ණියං, විවණ් බවට; අජ්ඣුපගතො ඉති, පැමිණියේ වෙමි'යි; පබ්බජිතෙන, පැවිද්දහු විසින්; අභිණ්හං, නිරතුරුව; පච්චවෙක්ඛිතබ්බං, ප්‍රත්‍යවේක්ෂා කටයුතු යි; මෙ ජීවිකා, මාගේ දිවි පැවත්ම; පරපටිබද්ධා ඉති, පරා පිළිබඳය යි; පබ්බජිතෙන, පැවිද්දහු විසින්, අභිණ්හං, නිතොර; පචවවෙක්ඛිතබ්බං, මෙනෙහි කටයුතු යි. මෙ, මා විසින්; අඤ්ඤො ආකප්පො, අන්‍ය වූ ආකල්පයෙක්; කරණියො, කටයුතුය යි; පබ්බජිතෙන, පැවිද්දහු විසින්; අභිණ්හං, නිතොර; පච්චවෙක්ඛිතබ්බං, ප්‍රත්‍යවේක්ෂා කටයුතු යි;

කච්චිනු ඛො, කිම හෝ; මෙ අත්තා, මාගේ ආත්මය; (සිත) සීලතො, සීලයෙන්; න උපවදතිති, උපවාද නො කෙරේ හෝයි; පබ්බජිතෙන, පැවිද්දහු විසින්; අභිණ්හං, නිතොර; පච්චවෙක්ඛිතබ්බං, මෙනෙහි කටයුතු ය; කච්චිනු ඛො, කිම හෝ; මං, මා; අනුවිච්ච, විචාරා; විඤ්ඤූ සබ්‍රහ්මචාරී, නුවණැති සබ්‍රම්සරහු; සීලතො, සීලයෙන්; න උපවදන්ති' ති, පරිභව නො බෙණෙද්දෝ හෝ යි; පබ්බජිතෙන, පැවිද්දහු විසින්; අභිණ්හං, නිතොර; පච්චවෙක්ඛිතබ්බං, ප්‍රත්‍යවේක්ෂා කටයුතු යි; පියෙහි, ප්‍රිය වූ; මනාපෙහි, මනාප වූ; සබ්බෙහි, සියලුදෙනා ගෙන්; මෙ, මාගේ; නානාභාවො, නානාභාවය; විනාභාවොති, විනාශ භාවය යි; පබ්බජිතෙන, පැවිද්දහු විසින්; අභිණ්හං, නිතොර; පච්චවෙක්ඛිතබ්බං, ප්‍රත්‍යවේක්ෂා කටයුතු යි; කම්මස්සකොම්හි, කර්මය තමා අයත් කොට ඇත්තේ වෙමි; කම්ම දායාදො, කර්මය දායාද කොට ඇත්තෙමි; කම්ම යොනි, කර්මය යෝනි කොට ඇත්තෙමි; කම්ම බන්ධු, කර්මය නෑ කොට ඇත්තෙමි; කම්ම පටිසරණො, කර්මය පිළිසරණ කොට ඇත්තෙමි; කල්‍යාණං වා යහපත් වූ හෝ; පාපකං වා, පවිටු වූ හෝ; යං කම්මං, යම් කර්මයක්; කරිස්සාමි, කෙරෙම් ද; තස්ස දායාදො භවිස්සාමි ති, ඒ කර්මය විසින් දෙන ලද්ද අයත් වෙමි යි; පබ්බජිතෙන, පැවිද්දහු විසින්; අභිණ්හං, නිතොර; පච්චවෙක්ඛිතබ්බං, ප්‍රත්‍යවේක්ෂා කටයුතු යි; කථම්භූතස්සමෙ, කෙසේ වූ මට; රත්තිං දිවා, රෑ දවල්හු; විතිපතන්ති'ති, ඉක්මෙත් දෝහෝ යි; පබ්බජිතෙන, පැවිද්දහු විසින්; අභිණ්හං, නිතොර; පච්චවෙක්ඛිතබ්බං, ප්‍රත්‍යවේක්ෂා කටයුතු යි; කච්චිනු ඛො අහං, කිමැ හෝ මම; සුඤ්ඤාගාරෙ, ශූන්‍යාගාරයෙහි; (හිස් පෙදෙසෙහි) අභිරමාමි ඉති, ඇලෙම්දෝ හෝ යි; පබ්බජිතෙන, පැවිද්දහු විසින්; අභිණ්හං, නිතොරඃ පච්චවෙක්ඛිතබ්බං, ප්‍රත්‍යවේක්ෂා කටයුතු යි;

Non-Commercial Distribution

(මෙනෙහි කටයුතු යි;) මෙ, මා වෙත; උත්තරිමනුස්සධම්මා, උතුරු මිනිස් දම්; අත්ථිනු ඛො, ඇද්දෝ හෝ යි; අලමරියඤාණදස්සන විසෙසො අධිගතො, පොහොසත් ආර්යඥාණදර්ශන විශේෂයෙක් ලබන ලද්දේ හෝ; සො අහං, ඒ මම; පච්ඡිමෙ කාලෙ පශ්චිම කාලයෙහි; (මරණ කාලයෙහි) සබ්‍රහ්මචාරීහි, සබ්‍රම්සරුන් විසින්; පුට්ඨො, විචාරණ ලද්දෙම්; න මංකුභවිස්සාමි; ඉති, තේජස් රහිත නො වෙම් දෝ හෝ යි; පබ්බජිතෙන, පැවිද්දහු විසින්; අභිණ්හං, නිතොර; පච්චවෙක්ඛිතබ්බං, මෙනෙහි කටයුතු යි; භික්ඛවෙ, මහණෙනි; ඉමෙ ඛො දස ධම්මා, මෙ දස ධම්යෝ; පබ්බජිතෙන, පැවිද්දහු විසින්; අභිණ්හං, නිතොර; පච්චවෙක්ඛිතබ්බාති, මෙනෙහි කළ යුත්තාහු ය'යි; භගවා, බුදුරදුන් වහන්සේ; ඉදං අවොච, මේ දේශනාව වදාළ සේක;

අත්තමනා, සතුටු සිත් ඇති; තෙ භික්ඛු, ඒ භික්ෂූහු; භගවතො, භාග්‍යවතුන් වහන්සේ ගේ; භාසිතං, දේශනාවට; අභිනන්දුං ඉති, විශේෂයෙන් සතුටු වූවාහු ය.

## 7. මහා මංගල සුත්තං. - මහා මංගල සූත්‍රය.

මෙ, මා විසින්; එවං සුතං, මෙසේ අසන ලදී; එකං සමයං, එක් සමයෙක; භගවා, භාග්‍යවතුන් වහන්සේ; සාවත්ථියං, සැවැත් නුවර; ජෙතවනෙ, ජේතවන නම් වූ; අනාථ පිණ්ඩිකස්ස, අනේපිඬු මහ සිටුහු ගේ; ආරාමෙ, අරම්හි; විහරති, වැඩ වසන සේක; අථ ඛො, එකල්හි; අඤ්ඤතරා දෙවතා, එක්තරා දෙවියෙක්; අභික්කන්තාය රත්තියා, රෑ ඉක්ම ගිය කල්හි; අභික්කන්ත වණ්ණා, විශිෂ්ඨ ශෝභා ඇත්තේ; කෙවලකප්පං ජෙතවනං, සියලු දෙව්රම් වෙහෙර; ඔභාසෙත්වා, ස්වකීය ශරීර ශොභාවෙන් බබුලුවා; යෙන භගවා, භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක ද; තෙන උපසංකමි, එතැනට එළඹියේ ය; උපසංකමිත්වා, එළඹ; භගවන්තං, භාග්‍යවතුන් වහන්සේ; අභිවාදෙත්වා, වැඳ; එකමන්තං, එකත් පසෙක; අට්ඨාසි, සිටියේ ය; එකමන්තං, එකත් පසෙක; ඨිතා ඛො සා දෙවතා, සිටි ඒ දෙවිතෙම; භගවන්තං, භාග්‍යවතුන් වහන්සේට; ගාථාය, ගාථායෙන්; අජ්ඣභාසි, (මෙසේ) කීයේ ය.

1. සොත්ථානං, මෙලොව පරලොව සැප; ආකංඛමානා, කැමැති වන්නා වූ; බහූදෙවා, බොහෝ දෙවියෝ ද; මනුස්සා ච, මනුෂ්‍යයෝද; මංගලානි, මංගල්‍යයන්; අචින්තයුං, සිතූහ; උත්තමං මංගලං, වැඩ සලසන උතුම් මඟුල්; බ්‍රෑහි, වදාළ මැනැවි;

2. බාලානං, බාලයන් ගේ නොහොත් අසත් පුරුෂයන් ගේ; අසෙවනා ච, සේවනය නො කිරීම ද; පණ්ඩිතානං ච සෙවනා, පණ්ඩිතයන් නොහොත් සත්පුරුෂයන් සේවනය කිරීම ද; පූජනීයානං පූජා ච, පිදිය යුත්තන් පිදීම ද (යන); එතං, මෙය; උත්තමං මංගලම්, උතුම් මඟුලෙකි.

3. පතිරූප දෙස වාසො ච, සුදුසු පෙදෙස්හි විසීම ද; පුබ්බෙ ච කතපුඤ්ඤතා, පෙරකළ පින් ඇති බව ද; අත්තසම්මා පණිධි ච, සිය අත් බව මනා දහම්හි පිහිටුවීම ද; (යන) එතං, මෙය; උත්තමං මංගලං, උතුම් මඟුලෙකි.

4. බාහුසච්චඤ්ච, බොහෝ ඇසූපිරූ තැන් ඇති බව ද; සිප්පඤ්ච, ශිල්ප දැනීම ද; සුසික්ඛිතො විනයො ච, මනාව හික්මුණු විනය ඇති බව ද; යා වාචා සුභාසිතා ච, යම් වචනයක් මොනවට කියන ලද ද; (යන) එතං, මෙය; උත්තමං මංගලං, උතුම් මඟුලෙකි;

5. මාතා පිතු උපට්ඨානං, මවුට උපස්ථාන කිරීමද, පියාට උපස්ථාන කිරීම ද; පුත්තදාරස්ස සංගහො, අඹුදරුවන්ට සංග්‍රහ කිරීම ද; අනාකුලා ච කම්මන්තා, නිරවුල් කර්මාන්ත ඇති බව ද; (යන) එතං, මෙය; උත්තමං මංගලං, උතුම් මඟුලෙකි;

Non-Commercial Distribution

6. දානං ච, දන්දීම ද; ධම්ම චරියා ච, දශ කුශලයෙහි හැසිරීම ද; ඤාතකානං, ඤාතීන්ට; සංගහො ච, සංග්‍රහ කිරීම ද; අනවජ්ජානි කම්මානි, නිවැරැදි ක්‍රියා ද; (යන) එතං, මෙය; උත්තමං මංගලං, උතුම් මඟුලෙකි.

7. ආරති විරති පාපා, පාපයෙහි නො ඇලීම ද, පවින් වැළකීම ද; මජ්ජපානා ච සඤ්ඤමො, මත්පැනෙන් වැළකීම ද; ධම්මෙසු, කුශල ධර්මයෙහි; අප්පමාදො ච, නොපමා බව ද; (යන) එතං, මෙය; උත්තමං මංගලං, උතුම් මඟුලෙකි.

8. ගාරාවො ච, ගරු කටයුත්තන්ට ගරු කිරීම ද; නිවාතො ච, නිහතමාන බව ද; සන්තුට්ඨී ච, ලද දෙයින් සතුටුවන බව ද; කතඤ්ඤුතා, කෙළෙහිගුණ දන්නා බව ද; කාලෙන ධම්ම සවණං, සුදුසු කල්හි බණ ඇසීම ද; (යන) එතං, මෙය; උත්තමං මංගලං, උතුම් මඟුලෙකි;

9. ඛන්තී ච, ඉවසීම ද; සොවචස්සතා, සුවච බවද; (කීකරු බවද) සමණානඤ්ච දස්සනං, ශ්‍රමණයන් දැකීම ද; කාලෙන ධම්ම සාකච්ඡාව ද; (යන) එතං, මෙය; උත්තමං මංගලං, උතුම් මඟුලෙකි.

10. තපො ච, තපස ද; බ්‍රහ්මචරියඤ්ච, බඹසර ද; (යහපත් හැසිරීම ද) අරිය සච්චාන දස්සනං, චතුරාර්‍ය්‍ය සත්‍යයන් දැකීම ද; නිබ්බාන සච්ඡිකිරියා ච, නිවන් පසක් කිරීම ද; (යන) එතං, මෙය; උත්තමං මංගලම්, උතුම් මඟුලෙකි;

11. ලොක ධම්මෙහි, අටලෝ දහමින්; ඵුට්ඨස්ස, ස්පර්‍ශ කරන ලද; යස්ස, යමක්හු ගේ; චිත්තං, සිත; න කම්පති, නො සැලේ ද; අසොකං, ශෝක රහිත ද; විරජං, රාගාදි රජස් රහිත ද; ඛෙමං, නිර්භය ද; (යන) එතං, මෙය; උත්තමං මංගලං, උතුම් මඟුලෙකි;

12. එතාදිසානි, (අසත් පුරුෂයන් සේවනය නො කිරීම ආදි) මෙබඳු මංගලයන්; කත්වාන, කොට; සබ්බත්ථමපරාජිතා, හැම තන්හි නොපැරැදුනෝව; සබ්බත්ථ, සියලු තැන; සොත්ථිං ගච්ඡන්ති, සැපයට යෙත් ද; තං, එය; තෙසං, ඔවුනට; උත්තමං මංගලං, උතුම් මඟුලෙකි;

මංගල සුත්තං - මංගල සූත්‍රය යි.

## 8. රතන සුත්තං - රතන සූත්‍රය.

1. ඉධ, මෙතැන්හි; සමාගතානි, රැස්වූ; භුම්මානිවා, පොළොවෙහි වූ හෝ; යානීභූතානි, යම් අමනුෂ්‍ය කෙනෙක් ඇද්ද; අන්තලික්ඛෙව, අහසෙහි වූ ද; යානි, යම් අමනුෂ්‍ය කෙනෙක් ඇද්ද; සබ්බෙව භූතා, ඒ සියලු අමනුෂ්‍යයෝ ම; සුමනා භවන්තු සතුටු සිතැත්තෝ වෙත්වා; අථොපි, තවද; භාසිතං, මගේ වචනය; සක්කච්ච, සකසා; සුණන්තු, අසත්වා;

2. භූතා, භූතයිනි; තස්මාහි, එබැවින්; සබ්බෙ, සියලු තොපි; නිසාමෙථ, (මගේ වචනය) අසවු; මානුසියා පජාය, මිනිස් ප්‍රජාවට, මෙත්තං කරොථ, මෛත්‍රිය කරවු; යෙ, යම් කෙනෙක්; දිවා ච රත්තො ච, දහවල් ද රෑ ද, බලි, පුද පඬුරු; හරන්ති, එළවත් ද; තස්මාහි, එහෙයින් ; අප්පමත්තා, නොපමාවම; තෙ, ඔවුන්, රක්ඛථ, රකිවු.

3. ඉධ වා, මේ මිනිස් ලොව හෝ; හුරං වා, නාලෝ ආදී අන් ලොවෙක හෝ; යං කිඤ්චි විත්තං, යම් ධනයෙක් වේ ද; සග්ගෙසු වා, ස්වර්ගයෙහි හෝ; යං පණීතං රතනං, යම්කිසි උතුම් රත්නයක් වේ ද; (ඔවුන් අතුරෙහි) තථාගතෙන සමං, තථාගතයන් හා සදෘශයෙක්; න නො අත්ථි, නොම ඇත්තේ ය; බුද්ධෙ, බුදුරදුන් කෙරෙහි; ඉදම්පි රතනං, මේ රත්න බව ද; පණීතං, (ප්‍රණීතය) උතුම් ය; එතෙන සච්චේන, මේ සත්‍ය බලයෙන්; සුවත්ථි හොතු සෙත් වේවා.

Non-Commercial Distribution

4. සමාහිතො, එකඟ වූ සිත් ඇති; සක්‍යමුනී, ශාක්‍යමුනි තෙම; ඛයං, (කෙලෙසුන් දුරුකරන හෙයින්) ක්ෂය නම් වූ; විරාගං, (රාගයෙන් වෙන්වීමට නිමිති වූ) විරාග නම් වූ; අමතං, (මරණයක් නැති හෙයින්) අමත නම් වූ; යදජ්ඣගා, යම් නිවනක් අවබෝධ කළේ ද?; තෙන ධම්මෙන, ඒ ධර්මය හා; සමං, සම වූ; කිඤ්චි, කිසිවක්; න අත්ථි, නොමැත; ධම්මෙ, ධර්මයෙහි; ඉදම්පි රතනං, මේ රත්න භාවය ද; පණීතං, උතුම් ය; එතෙන සච්චෙන, මේ සත්‍ය බලයෙන්; සුවත්ථි හොතු, සෙත් වේවා.

5. බුද්ධ සෙට්ඨො, බුද්ධ ශ්‍රේෂ්ඨතෙමේ; සුචිං පිරිසුදු වූ; යං, යම් ආර්යමාර්ගයක්; පරිවණ්ණයි, වර්ණනා කෙළේ ද; යං, යම් මාර්ගයක්; ආනන්තරිකං සමාධිං, ආනන්තරික සමාධිය යි; ආහු, (බුද්ධාදී ආර්යයෝ) කියද්ද; තෙන සමාධිනා, ඒ සමාධිය හා; සමො, සම වූ සමාධියෙක්; න විජ්ජති, නැත; ධම්මෙ, ධර්මයෙහි; ඉදම්පි රතනං, මේ රත්න භාවය ද; පණීතං, උතුම් ය; එතෙන සච්චෙන, මේ සත්‍ය බලයෙන්; සුවත්ථි හොතු සෙත් වේවා.

6. සතං පසත්ථා, සත්පුරුෂයන් විසින් පසස්නා ලද; යෙ පුග්ගලා අට්ඨ, යම් ආර්ය පුද්ගලයෝ අටදෙනෙක් වෙත් ද; නොහොත්; පසත්ථා, ප්‍රශස්ත වූ; යෙ, යම්; අට්ඨසතං, එකසිය අටක්; පුග්ගලා, අර්ය පුද්ගලයෝ වෙත් ද; එතානි, මොහු හැම දෙන; චත්තාරියුගානි, සතර යුග කෙනෙක් වෙති; සුගතස්ස, සුගත් බුදුරජුන්ගේ; සාවකා, ශ්‍රාවක වූ; තෙ, ඒ අර්ය පුද්ගලයෝ; දක්ඛිණෙය්‍යා, දක්ෂිණාවට සුදුස්සෝ වෙති; එතෙසු, මේ බුදු සව්වන් කෙරෙහි; දින්නානි, දෙන ලද දානයෝ; මහප්ඵලානි, මහත් පල ඇත්තෝ වෙත්; සංඝෙ, සංඝයා කෙරෙහි; ඉදම්පි රතනං, මේ රත්න භාවය ද; පණීතං, උතුම් ය; එතෙන සච්චෙන, මේ සත්‍ය බලයෙන්; සුවත්ථි හොතු, සෙත් වේවා.

7. යෙ, යම් කෙනෙක්; දළ්හෙන මනසා, සථිරවූ සිතින්, සුප්පයුත්තා, මනාකොට යෙදුණාහු ද; ගොතම සාසනම්හි, ගෞතම නම් වූ තථාගත ශාසනයෙහි; නික්කාමිනො, සියලු කෙළෙසුන් කෙරෙන් මිදුනාහු ද; තෙ, ඔවුහු; අමතං, නිවණට; විගය්හ, බැස; මුධා ලද්ධා, නොමිලයේ ලත්; නිබ්බුතිං, නිවන්සුව; භුඤ්ජමානා, වළඳන්නාහු; පත්තිපත්තා, රහත් ඵලයට පැමිණියාහු නම් වෙත්; සංඝෙ, සංඝයා කෙරෙහි; ඉදම්පි රතනං, මේ රත්න භාවය ද; පණීතං, උතුම් ය; එතෙන සච්චෙන, මේ සත්‍ය බලයෙන්; සුවත්ථි හොතු, සෙත් වේවා;

8. යථා, යම්සේ; පඨවිංසිතො ඉන්දඛිලො, පොළොවෙහි යටට බැසගත් ඉන්ද්‍රඛීලය තෙම; චතුබ්භි වාතෙහි, සිවු දිගින් හමන සුළඟින්; අසම්ප කම්පියො සියා, සෙළවිය හැකි නොවේ ද; යො, යම් ආර්ය පුද්ගලයෙක්; අරිය සච්චානි, චතුරාර්ය සත්‍යය; අවෙච්ච පස්සති, නුවණින් අවබෝධ කෙළේ ද; සප්පුරිසං, ඒ සත්පුරුෂයා; තථූපමං, ඒ ඉන්ද්‍ර ඛීලය බඳු ය යි; වදාමි, කියමි; සඞ්ඝෙ, සංඝයා කෙරෙහි; ඉදම්පි රතනං, මේ රත්න භාවය ද; පණීතං, උතුම් ය; එතෙන සච්චෙන, මේ සත්‍ය බලයෙන්; සුවත්ථි හොතු, සෙත් වේවා;

9. යෙ, යම් සෝවාන් පුගුල් කෙනෙක්; ගම්භීරපඤ්ඤෙන, ගැඹුරු නුවණැති බුදුරජුන් විසින්; සුදෙසිතානි, මනාකොට දෙසන ලද; අරිය සච්චානි, චතුරාර්ය සත්‍යයන්; විභාවයන්ති, තුමු අවබෝධ කෙරෙත් ද; තෙ, ඔවුහු; භුසප්පමත්තා හොන්ති, බෙහෙවින් පමාවූවාහු නමුදු; කිඤ්චාපි, කිසිසේත්; තෙ, ඔවුහු; අට්ඨමංභවං, අටවන භවයක්; න ආදියන්ති, නොගනිති; සඞ්ඝෙ, සංඝයා කෙරෙහි; ඉදම්පි රතනං, මේ රත්න භාවය ද; පණීතං, උතුම් ය; එතෙන සච්චෙන, මේ සත්‍ය බලයෙන්; සුවත්ථි හොතු, සෙත් වේවා;

10. අස්ස, මේ සෝවාන් පුද්ගලයා ගේ; දස්සන සම්පදාය සහ එව, දර්ශන සම්පත්තිය හා සමගම; (සෝවාන් මග නුවණ පහළවීම සමග) සක්කාය දට්ඨි, සත්කායදෘෂ්ටිය ද; විචිකිච්ඡිතං ච, විචිකිත්සාව ද; (සැකය ද) යංකිඤ්චි, යම්කිසි; සීලබ්බතංවාපි අත්ථි, ශීලව්‍රතාදියක් හෝ ඇද්ද; තයො ධම්මා, කියන ලද සංයොජන ධර්මයෝ තිදෙන; ජහිතා භවන්ති අස්සු, දුරුකරන ලද්දාහු වෙත් ද

Non-Commercial Distribution

හෙතෙම; චතුහි අපායෙහි ච, සිවු අපායෙන් ද; විප්පමුත්තො, මිදුනේ වේ, ඡචාභිඨානානි, සවැදෑරුම් බරපතල පාපයන්; කාතුං, කරන්නට; අභබ්බො, නුසුදුසු ය. ඉදම්පි, මෙය ද, සඞ්ඝෙ, සංඝයා කෙරෙහි; පණීතං රතනං, උතුම් රත්න භාවය වේ; එතෙන සච්චේන, මේ සත්‍ය බලයෙන්; සුවත්ථි හොතු, සෙත් වේවා.

11. සො, ඒ සෝවාන් පුද්ගල තෙමේ; කායෙන, කයින් හෝ; වාචා, වචනයෙන් හෝ; උද, නොහොත්; චෙතසා වා, සිතින් හෝ; කිඤ්චාපි, කිසියම්; පාපකං කම්මං කරොති, පාප කර්මයක් කෙරේ ද; සො, හෙතෙම; තස්ස, ඒ පාපකර්මයා ගේ; පටිච්ඡාදාය, සැඟවීමට; අභබ්බො, අභව්‍ය ය; දිට්ඨපදස්ස, දක්නා ලද නිවන් පද ඇති සෝවාන් පුද්ගලයා ගේ; අභබ්බතා, වරද සැඟවීමෙහි අභව්‍ය බව; වුත්තා, බුදුරදුන් වදාරන ලදී; ඉදම්පි, මෙය ද; සඞ්ඝෙ, සංඝයා කෙරෙහි; පණීතං රතනං, උතුම් රත්න භාවය වේ; එතෙන සච්චේන, මේ සත්‍ය බලයෙන්; සුවත්ථි හොතු, සෙත් වේවා.

12. වනප්පගුම්බෙ, වනලැහැබතෙම; ගිම්හෙ, ග්‍රීෂ්ම ඍතුවෙහි; ගිම්හාන මාසෙ, පළමු ග්‍රීෂ්ම මාසයෙහි; යථා ඵුස්සිතග්ගෙ, සුපිපි අක් ඇත්තේ යම්සේ ද; තථා උපමං, එබඳු වූ; නිබ්බාණගාමී, නිවනට පමුණුවන; ධම්මවරං, උතුම් වූ ධර්මය; පරමං හිතාය, නිවන් පිණිස; අදෙසයි. (බුදුරජාණන්වහන්සේ) දෙසූ සේක. ඉදම්පි, මෙය ද; බුද්ධෙ, බුදුරදුන් කෙරෙහි; පණීතං රතනං, උතුම් රත්න භාවය වේ; එතෙන සච්චේන, මේ සත්‍ය බලයෙන්; සුවත්ථි හොතු සෙත් වේවා.

13. වරො, උතුම් වූ; වරඤ්ඤූ, නිවන්දන්නා වූ; වරදො, උතුම් නිවන් දෙන්නා වූ; වරාහරො, උතුම් නිවන් මග ගෙනහැර පාන්නා වූ; අනුත්තරො, නිරුත්තර වූ බුදුරජතෙම; ධම්මවරං, උතුම් දහමක්; අදෙසයි, දෙසී ද; ඉදම්පි, මෙය ද; බුද්ධෙ, බුදුරදුන් කෙරෙහි; පණීතං රතනං, උතුම් රත්න භාවය වේ; එතෙන සච්චේන, මේ සත්‍ය බලයෙන්; සුවත්ථි හොතු, සෙත් වේවා.

14. (යම් රහත් කෙනකුගේ) පුරාණං පුරාතන කම්; ඛීණං, ක්ෂීණවූයේ ද; නවං සම්භවං නත්ථි, අලුත් භවයක් නැත්තේ ද; ආයතිකෙභවස්මිං, මතුභවයක් කෙරෙහි; විරත්ත චිත්තා, නොඇලුණු සිත් ඇති; ඛීණ බීජා, ක්ෂීණ වූ ප්‍රතිසන්ධි විඥාන සංඛ්‍යාත බීජ ඇති; අවිරූළ්හිච්ඡන්දා, පුනරුත්පත්තියෙහි ආශාවක් නැති; ධීරා, ධෛර්යසම්පන්න වූ; තෙ, ඒ රහත්හු; අයං පදීපො යථා, මේ පහන මෙන්; නිබ්බන්ති, (නිවෙත්) පිරිනිවෙත්; ඉදම්පි, මෙය ද; සඞ්ඝෙ, සංඝයා කෙරෙහි; පණීතං රතනං, උතුම් රත්න භාවය වේ; එතෙන සච්චේන, මේ සත්‍ය බලයෙන්; සුවත්ථි හොතු, සෙත් වේවා.

15. ඉධ, මෙතන්හි; සමාගතානි, රැස් වූ; භුම්මානි වා, පොළොවෙහි හෝ; යානිභූතානි, යම් අමනුෂ්‍ය කෙනෙක් ඇද්ද; අන්තලික්ඛෙ වා, අහසෙහි වූ හෝ; යානි, යම් අමනුෂ්‍ය කෙනෙක් ඇද්ද; (අපි හැම දෙනා ම) තථාගතං, තථාගත නම් වූ; දෙවමනුස්ස පූජිතං, දෙව්මිනිසුන් විසින් පුදනලද; බුද්ධං, බුදුරදුන්; නමස්සාම, නමදිමු; සුවත්ථි හොතු, (සත්හට) සෙත් වේවා.

16. ඉධ, මෙතැන්හි; සමාගතානි, රැස් වූ; භුම්මානි වා, පොළොවෙහි වූ හෝ; යානිභූතානි, යම් අමනුෂ්‍ය කෙනෙක් ඇද්ද; අන්තලික්ඛෙ වා, අහසෙහි වූ ද; යානි, යම් අමනුෂ්‍ය කෙනෙක් ඇද්ද; දෙවමනුස්ස පූජිතං, දෙව් මිනිසුන් විසින් පුදනලද; තථාගතං වූ; ධම්මං, ධර්මය; නමස්සාම, නමදිමු, සුවත්ථි හොතු (සත්හට) සෙත් වේවා.

17. ඉධ, මෙතැන්හි; සමාගතානි, රැස් වූ; භුම්මානි වා, පොළොවෙහි වූ හෝ; යානිභූතානි, යම් අමනුෂ්‍ය කෙනෙක් ඇද්ද; අන්තලික්ඛෙ වා, අහසෙහි වූ ද; යානි, යම් අමනුෂ්‍ය කෙනෙක් ඇද්ද; දෙවමනුස්ස පූජිතං, දෙව් මිනිසුන් විසින් පුදනලද; තථාගතං; තථාගත වූ; සංඝං, සංඝයා; ධම්මං, ධර්මය; නමස්සාම, නමදිමු; සුවත්ථි හොතු (සත්හට) සෙත් වේවා.

**රතන සුත්තං. - රතන සූත්‍රය යි.**

Non-Commercial Distribution

## කරණීය මෙත්ත සුත්තං. — කරණීය මෙත්ත සූත්‍රය.

1. සන්තං පදං, ශාන්ත පදය යි කියනු ලබන නිවනට; අභිසමෙච්ච, පැමිණ වසන්නහු විසින්; යං කරණීයං, යමක් කටයුතු ද; අත්‍ථකුසලෙන, අභිවෘද්ධියෙහි දක්ෂයා විසින්; තං කරණීයං, එය කටයුතු යි; (හෙතෙම) සක්කො අස්ස, දක්ෂයෙක් වන්නේ ය; උජු අස්ස, ඍජු වන්නේ ය; සූ උජූ අස්ස, මනාකොට ඍජු වන්නේ ය; සුවචො 'අස්ස, කීකරු වන්නේ ය; මුදු අස්ස, මෘදු වන්නේ ය; අනතිමානි අස්ස, නිහතමානී වන්නේ ය.

2. සන්තුස්සකො ච, ලද දෙයින් සතුටු වන්නේ ය; සුභරො ච, පහසුවෙන් පෝෂණය කළ හැක්කේ ය; අප්ප කිච්චො ච, ස්වල්ප කටයුතු ඇත්තෙක් වන්නේ ය; සල්ලහුක වුත්ති, සැහැල්ලු පැවතුම් ඇත්තෙක් වන්නේ ය; සන්තින්ද්‍රියො ච, සන්සුන් ඉඳුරන් ඇත්තෙක් වන්නේ ය; නිපකො ච, නුවණ ඇත්තෙක් වන්නේ ය; අප්ප ගබ්භො, ප්‍රගල්භය නැති වන්නේ ය; කුලෙසු අනනුගිද්ධො, කුලයන් කෙරෙහි නො ඇලුනෙක් වන්නේ ය.

3. යෙන, යම් ක්‍රියාවකින්; විඤ්ඤූපරෙ, නුවණැති අන් කෙනෙක්; උපවදෙය්‍යුං, නින්දා කෙරෙත් ද; නච ඛුද්දං සමාචරෙ කිඤ්චි. (එබඳු) ස්වල්ප වූ වරදකුදු නො කරන්නේ ය; සබ්බෙ සත්තා, සියලු සත්වයෝ; සුඛිනො වා හොන්තු, සැප ඇත්තෝ වෙත්වා; ඛෙමිනො හොන්තු, භය නැත්තෝ වෙත්වා; සුඛිතත්තා භවන්තු, සුඛිත සිත් ඇත්තෝ වෙත්වා;

4. තසා වා, (කෙලෙස් සහිත බැවින්) භයින් ත්‍රස්ත වූ හෝ; ථාවරා වා, නිර්භය හෙයින් ස්ථාවර වූ; අනවසෙසා යෙකෙචි, සියලු යම්කිසි; පාණභූතා අත්‍ථි, සත්ව කෙනෙක් වෙත් ද; යෙ, යම් සත්ව කෙනෙක්; දීඝා වා, දීර්ඝ ජාති ඇත්තාහු ද; මහන්තා වා, මහත් සිරුරු ඇත්තාහු ද; මජ්ඣිමා, මධ්‍යම ප්‍රමාණ සිරුරු ඇත්තෝ ද; රස්සකා, මිටි සිරුරු ඇත්තෝ ද; අණුක, ඉතා සියුම් සිරුරු ඇත්තෝ ද; ථූලා, ස්ථූල සිරුරු ඇත්තෝ ද

5. දිට්ඨා වා, ඇසට පෙනෙන්නා වූ හෝ; යෙච අද්දිට්ඨා, නොපෙනෙන්නා වූ යම් සත්ව කෙනෙක් වෙත් ද; යෙච දූරෙ වසන්ති, යම් සත්ව කෙනෙක් දුර වෙසෙත් ද; අවිදූරෙ, නුදුරෙහි වෙසෙත් ද; භූතා වා, ඉපදීම අවසන් කළ සත්වයෝ වෙත් ද; සම්භවෙසී වා, ඉපදීම සොයන සත්වයෝ ද; (යන) සබ්බෙ සත්තා, සියලු සත්වයෝ; සුඛිතත්තා, සුඛිත සිත් ඇත්තෝද; භවන්තු, වෙත්වා;

6. පරො, අනිකෙක්; පරං, අනිකකු; න නිකුබ්බෙථ, නො රවටන්නේ ය; කත්‍ථචි, කිසි තැනෙක්හි; නං කඤ්චි, ඒ කිසිවක් හට; න අතිමඤ්ඤෙථ, අවමන් නො කරන්නේ ය; ඛ්‍යාරොසනා, කාය වාක් විකාරයෙන් වූ කෝපයෙන් ද; පටිඝසඤ්ඤා, (මනෝ විකාරයෙන් වූ) පටිඝ සංඥායෙන් ද; අඤ්ඤං අඤ්ඤස්ස, එකෙක් අනෙකකුට; දුක්ඛං, දුකක්; න ඉච්ඡෙය්‍ය, නොකමැති වන්නේ ය.

7. යථා, යම්සේ; මාතා, මවක්; නියං පුත්තං, තමාගෙන් ඇති වූ; එක පුත්තං, එකම පුතු; ආයුසා, දිවි පිදීමෙන් හෝ; අනුරක්ඛෙ, රකී ද? එවම්පි මෙසේ ද, සබ්බ භූතෙසු, හැම සතුන් කෙරෙහි; අපරිමාණං, අප්‍රමාණ වූ; මානසං, මෛත්‍රී සිත; භාවයෙ, වඩන්නේ ය;

8. උද්ධං ච, උඩ ද, අධො ච, යට ද, තිරියඤ් ච, සරස ද; අසම්බාධං, සම්බාධ නැතිව; අවෙරං, වෛර නැතිව; අසපත්තං, සතුරන් නැති; සබ්බ ලොකස්මිං, සියලු සත්වයන් කෙරෙහි; අපරිමාණං, අප්‍රමාණ වූ; මෙත්තං ච මානසං, මෛත්‍රී සහගත සිත; භාවයෙ, වඩන්නේ ය.

Non-Commercial Distribution

9. තිට්ඨං, සිටින්නේ හෝ; චරං, ඇවිදින්නේ හෝ; නිසින්නො වා, උන්නේ හෝ; සයානො වා, නිදන්නේ හෝ; යාවතස්ස විගතමිද්ධො, යම්තාක් කල් නොනිදා ද; (ඒතාක්) එතං සතිං, මේ මෛත්‍රී සහගත සිහිය; අධිට්ඨෙය්‍ය, ඉටන්නේ ය; එතං, මෙය; ඉධ, මේ ශාසනයෙහි; බ්‍රහ්ම විහාරං, බ්‍රහ්ම විහාරය යි; ආහු, (බුද්ධාදී උතුමෝ) කීහ.

10. දිට්ඨිඤ්ච, මිථ්‍යාදෘෂ්ටියට; අනුපගම්ම, නො පැමිණ; සීලවා, සිල්වත් වූයේ; දස්සනෙන සම්පන්නෝ, දර්ශනයෙන් යුක්ත වූයේ; කාමෙසු, වස්තුකාමයන්හි; ගෙධං, ගිජු බව; විනෙය්‍ය, දුරු කොට; ජාතු, ඒකාන්තයෙන්; ගබ්භසෙය්‍යං, මවු කුස පිළිසිඳ ගැනීමට; නහි පුනරෙති ති, නැවත නො එන්නේ යි.

කරණීය මෙත්ත සූත්‍රයයි

## ඛන්ධ පරිත්තං. — කඳ පිරිත.

1. මෙ, මා විසින්; එවං, මෙසේ; සුතං, අසන ලදී. එකං සමයං, එක් සමයෙක්හි; භගවා, භාග්‍යවතුන් වහන්සේ; සාවත්ථියං, සැවතෙහි; අනාථ පිණ්ඩිකස්ස, අනේපිඬු සිටුහු ගේ; ජෙතවනෙ, ජේතවන නම් වූ; ආරාමෙ, ආරාමෙහි; විහරති, වැඩ වසන සේක; තෙන ඛො පන සමයෙන, එසමයෙහි, සාවත්ථියං, සැවැත් නුවර; අඤ්ඤතරො භික්ඛු, එක්තරා භික්ෂු නමෙක්; අහිනා දට්ඨො, සර්පයකු විසින් දෂ්ට කරන ලදුව; කාලකතො හොති, කළුරිය කෙළේය.

2. අථ ඛො, එකල්හි; සම්බහුලා භික්ඛූ, බොහෝ භික්ෂූන් වහන්සේලා; යෙන භගවා, භාග්‍යවතුන් වහන්සේ යම් තැනක ද; තෙන, එතන්හි; උපසංකමිංසු, එළඹුනාහු ය; උපසංකමිත්වා, එළඹ; භගවන්තං, භාග්‍යවතුන් වහන්සේට; අභිවාදෙත්වා, වැඳ; එකමන්තං, එකත් පසෙක; නිසීදිංසු, හුන්නාහු ය; එකමන්තං, එකත් පසෙක; නිසින්නො ඛො, හුන්නා වූ; තෙ භික්ඛූ, ඒ භික්ෂූහු; භගවන්තං, භාග්‍යවතුන් වහන්සේට; එතදවොචුං, මේ පුවත දැන්වූහ.

3. භන්තෙ, ස්වාමීන් වහන්ස; ඉධ සාවත්ථියං, මේ සැවැත්නුවර සමීපයෙහි; අඤ්ඤතරො භික්ඛු, එක්තරා භික්ෂු නමෙක්; අහිනා දට්ඨො, සර්පයකු විසින් දෂ්ට කරන ලද්දේ; කාල කතො' ති, කළුරිය කෙළේ ය. භික්ඛවෙ, මහණෙනි; සො භික්ඛු; ඒ භික්ෂු තෙම; චත්තාරි අහිරාජ කුලානි, සතර අහිරාජකුලය; නූන, ඒකාන්තයෙන්; මෙත්තෙන චිත්තෙන, මෙත් සිතින්; නහි ඵරි, නොපැතිර වී ය; භික්ඛවෙ, මහණෙනි, සචෙහි, ඉදින් වනාහි; චත්තාරි අහිරාජ කුලානි, සතර අහිරාජකුලයන්; මෙත්තෙන චිත්තෙන මෙත් සිතින්; ඵරෙය්‍ය, පැතිරවී නම්; භික්ඛවෙ, මහණෙනි; සො භික්ඛු, ඒ භික්ෂු තෙම; අහිනා දට්ඨො, සර්පයා විසින් දෂ්ට කරන ලද්දේ; නහි කාලංකරෙය්‍ය, නොම කළුරිය කරන්නේ ය.

4. චත්තාරි අහිරාජකුලානි, සතර අහිරාජකුලයෝ; කතමානි, කවරහුද යත්?; විරූපක්ඛං අහිරාජකුලං, විරූපාක්ෂ නම් සර්ප රාජකුලය; එරාපථං අහිරාජකුලං, ඒරාපථ නම් සර්ප රාජකුලය; ඡබ්‍යාපුත්තං අහිරාජකුලං ඡබ්‍යාපුත්ත නම් සර්ප රාජකුලය; කණ්හා ගොතමකං අහිරාජකුලං, කණ්හා ගොතමක නම් සර්ප රාජකුලය; (යන මේ සතරයි.)

5. භික්ඛවෙ, මහණෙනි; සො භික්ඛු, ඒ භික්ෂු තෙම; ඉමානි චත්තාරි අහිරාජකුලානි, මේ සතර සර්ප රාජකුලයන්; නූන, ඒකාන්තයෙන්; මෙත්තෙන චිත්තෙන, මෙත් සිතින් : නහිඵරි, නො පැතිර විය . භික්ඛවෙ, මහණෙනි; සචෙහි, ඉදින් වනාහි; සො භික්ඛු, ඒ භික්ෂු තෙම; ඉමානි චත්තාරි

Non-Commercial Distribution

අභිරාජ කුලානි, මේ සතර සර්ප රාජකුලයන්; මෙත්තෙන චිත්තෙන, මෙත් සිතින්; ඵරෙය්‍ය, පැතිර වී නම්; භික්ඛවෙ, මහණෙනි; සො භික්ඛු, ඒ භික්ෂු තෙම; අභිනා දට්ඨො, සර්පයා විසින් දෂ්ට කරන ලද්දේ; නහි කාලං කරෙය්‍ය, නොම කලුරිය කරන්නේ ය.

6. භික්ඛවෙ, මහණෙනි, ඉමානි චත්තාරි අභිරාජකුලානි, මේ සතර සර්ප රාජකුලයන්; මෙත්තෙන චිත්තෙන, මෙත් සිතින්; ඵරිතුං, පතුරු වන්නට; අනුජානාමි, (අවසර දෙමි) අනුදනිමි; (කුමක් හෙයින්ද යත්?) අත්ත ගුත්තියා, තමාගේ සංවරණය පිණිස; අත්තරක්ඛාය, තමහට ආරක්ෂාව පිණිස; අත්තපරිත්තායාති, තමාහට පිරිත් පිණිස, පවත්නා හෙයිනි.

7. භගවා, භාග්‍යවතුන් වහන්සේ; ඉදං අවොච; මෙසේ වදාළ සේක, ඉදං වත්වා, මෙසේ වදාරා; සුගතො, සුගත නම් වූ; සත්ථා, ශාස්තෘන් වහන්සේ; අථාපරං, නැවත ද මත්තෙහි; එතදවොච, (එතං අවොච) මෙය වදාළ සේක.

8. මෙ, මාගේ; මෙත්තං, මෛත්‍රීය; විරූපක්ඛෙහි, විරූපාක්ෂ නම් සර්ප කුලයන් සමග ය; මෙ, මාගේ; මෙත්තං මෛත්‍රිය; එරාපථෙහි, ඒරාපථ නම් සර්ප රාජකුලයන් සමඟ ය; මෙ මාගේ, මෙත්තං, මෛත්‍රිය; ඡබ්‍යාපුත්තෙහි, ඡබ්‍යාපුත්ත නම් නාග කුලයන් සමඟ ය; මෙ, මාගේ; මෙත්තං, මෛත්‍රීය; කණ්හාගොතමකෙහි ච, කණ්හාගොතමක නම් සර්ප කුලයන් සමඟ ය;

9. මෙ, මගේ; මෙත්තං, මෛත්‍රිය; අපාදකෙහි, පා නැති දීර්ඝ ජාතීන් සමග ය; මෙ, මගේ; මෙත්තං, මෛත්‍රිය; දීපාදකෙහි, (දෙපා ඇති මිනිස් ආදී) දීපාදකයන් සමඟ ය; මෙ, මගේ; මෙත්තං, මෛත්‍රීය; චතුප්පදෙහි, සිවුපා සතුන් සමඟ ය; මෙ, මගේ; මෙත්තං, මෛත්‍රිය; බහුප්පදෙහි, (පත්තෑ ආදී) බොහෝ පා ඇත්තවුන් සමඟ ය;

10. අපාදකො, අපාදක සත්වයෙක්; මං, මා; මා හිංසි, නහමක් පෙළාවා; (නො පෙළාවා) දිපාදකො, දීපාදක සත්වයෙක්; මං, මා; මාහිංසි, නහමක් පෙළාවා, චතුප්පදො, සිවුපා සත්වයෙක්; මං, මා; මාහිංසි, නහමක් පෙළාවා; බහුප්පදො, බොහෝ පා ඇති සත්වයෙක්; මං, මා; මාහිංසි, නොපෙළාවා;

11. සබ්බෙ සත්තා, සියලු සත්හු ද; සබ්බෙ පාණා, සියලු ප්‍රාණීහුද; සබ්බෙ භූතා ච කෙවලා, හුදෙක් සියලු භූතයෝ ද; සබ්බෙ, හැමදෙන; භද්‍රානි, යහපතක්ම; පස්සන්තු, දකිත්වා; කඤ්චි, කිසිවකුත් කරා; පාපං, දුකෙක්; මාගමා, නො පැමිණේවා!

12. බුද්ධො අප්පමාණො, බුද්ධ ගුණය අපමණය; ධම්මො අප්පමාණො, දහම් ගුණය අපමණ ය; සංඝො අප්පමාණො, සංඝ ගුණය අපමණ ය; සිරිංසපානි, සිරිංසපයෝ හෙවත් දීර්ඝ ජාතීහු; පමාණවන්තානි, ප්‍රමාණවත් හ; (එනම්) අභි, සර්පයෝ ය; විච්ඡිකා, ගෝනුස්සෝ ය; සතපදී, සතපදීහු ය; (පත්තෑ ආදීහු) උණ්ණානාභි, මකුළුවෝ ය; සරබූ, සිකනල්ලු ය; මූසිකා, මූසිකය හ; (යන මේ වශයෙනි) මෙ රක්ඛා කතා, මා විසින් ආරක්ෂා කරන ලද්දාහ; පරිත්තා කතා, පිරිත් කරන ලද්දාහ; භූතානි, භූතයෝ; පටික්කමන්තු, පහවෙත්වා; සො අහං, ඒ මම; භගවතො, භාග්‍යවතුන් වහන්සේට; නමො, නමස්කාර කරමි; සත්තන්නං සම්මා සම්බුද්ධානං, සත් බුදුවරයන්ට; නමො, නමස්කාර කරමි.

**කඳ පිරිත යි.**

Non-Commercial Distribution

## මෙත්තානිසංස සුත්තං. — මෙත්තානිසංස සූත්‍රය.

1. මෙ, මා විසින්; එවං, මෙසේ; සුතං, අසන ලදී. භගවා, භාග්‍යවතුන් වහන්සේ; එකං සමයං, එක් සමයෙක; සාවත්ථියං, සැවැත් නුවර; අනාථ පිණ්ඩිකස්ස, අනේපිඬු සිටුහු ගේ; ජෙතවනෙ, ජේතවන නම් වූ; ආරාමෙ, ආරාමයෙහි; විහරති, වැඩ වසන සේක; තත්‍ර ඛො, එකල්හි වනාහි; භගවා, භාග්‍යවත්හු; භික්ඛවො'ති, මහණෙනි කියා; භික්ඛු, භික්ෂූන්; ආමන්තෙසි, ඇමතූහ; තෙ භික්ඛු, ඒ භික්ෂූහු; භදන්තෙ ඉති, වහන්සැ'යි; භගවතො, භාග්‍යවතුන් වහන්සේට; පච්චස්සොසුං, පිළිවදන් දුන්හ. භාගවා, භාග්‍යවතුන් වහන්සේ; එතං අවොච, මෙය වදාළ සේක;

2. භික්ඛවෙ, මහණෙනි; ආසෙවිතාය, ආදරයෙන් සෙවුනා ලද; භාවිතාය, භාවිතා කරන ලද; බහුලීකතාය, බහුල වශයෙන් වඩනා ලද; යානීකතාය, යානාවක් මෙන් කරන ලද; වත්ථුකතාය, වස්තුවක් මෙන් කරන ලද; අනුට්ඨිතාය, එළඹ සිටියා වූ; පරිචිතාය, පුරුදු කරන ලද; සුසමාරද්ධාය, මොනවට පටන් ගන්නා ලද; මෙත්තාය චෙතොවිමුත්තියා, මෛත්‍රී චේතෝ විමුක්තිය ගේ; ඉමෙ එකාදසානිසංසා, මේ එකොළොස් අනුසස්හු; පාටි කංඛා'ති, කැමැති විය යුත්තාහ. කතමෙ එකාදස?, කවර එකොළොසෙක් ද යත්.-

3. 1. සුඛංසුපති, සැපසේ නිද යි; 2. සුඛං පටිබුජ්ඣති, සැපසේ පුබුදි යි; 3. පාපකං සුපිනං න පස්සති, නපුරු සීන නොදකි යි; 4. මනුස්සානං පියො හොති, මිනිසුන්ට ප්‍රිය වෙයි; 5. අමනුස්සානං පියො හොති, නොමිනිසුන්ට ද ප්‍රිය වෙ යි; 6. දෙවතා රක්ඛන්ති, දෙවියෝ රකිති; 7. අස්ස, මෛත්‍රී විහරණ ඇති පුද්ගලයා ගේ සිරුරෙහි; අග්ගි වා, ගිනි හෝ; විසං වා, විස හෝ; සත්ථං වා, සැත් හෝ; නඛමති, නොවදි යි; 8. තුවටං, වහා; චිත්තං, සිත; සමාධියති, සමාහිත වෙයි; 9. මුඛවණ්ණො විප්පසීදති, මුහුණ පැහැපත් වෙයි; 10. අසම්මූල්හො, නො මුළාව; කාළංකරොති, කලුරිය කෙරෙයි; 11. උත්තරීං අප්පටි විජ්ඣන්තො, මතුයෙහි රහත් වීමට නො හැකි වී නම්; බ්‍රහ්මලොකුපගොහොති, බඹ ලොව උපදී.

2. භික්ඛවෙ, මහණෙනි, ආසෙවිතාය, සෙවුනා ලද; භාවිතාය, භාවිතා කරන ලද; බහුලීකතාය, බොහෝ කරන ලද; යානිකතාය, යානාවක් මෙන් කරන ලද; වත්ථුකථාය, වස්තුවක් මෙන් කරන ලද; අනුට්ඨිතාය, එළඹසිටියා වූ; පරිචිතාය, පුරුදු කරන ලද්දා වූ; සුසමාරද්ධාය, මොනවට පටන් ගන්නා ලද්දා වූ; මෙත්තාය චෙතොවිමුත්තියා, මෛත්‍රී චෙතෝවිමුක්තිය පිළිබඳ; ඉමෙ එකාදසානිසංසා, මේ එකොළොස් අනුසස්හු; පාටිකං ඛා' ති, කැමතිවිය යුක්තාහ; භගවා, භාග්‍යවතුන් වහන්සේ; ඉදං අවොච, මෙම සූත්‍රය වදාළ සේක; අත්ත මනා, සතුටු සිත් ඇති; තෙ භික්ඛු, ඒ භික්ෂූහු; භගවතො, භාග්‍යවත්හු ගේ; භාසිතං, භාෂිතයට; (දේශනාවට) අභිනන්දුංති සතුටු වූහ.

**මෙත්ත සූත්‍රය යි.**

## 12. මිත්තානිසංසං. — මිත්තානිසංසය.

1. යො, යම්පුද්ගලයෙක් තෙම; මිත්තානං, මිතුරන්ට; නදූහති, ද්‍රෝහ නො කෙරේ ද; සො, හෙතෙම; සකාසරා, ස්වකීය ගෙයින්; විප්පවුත්ථො, බැහැර තැනක ගියේ; පහූතභක්ඛො. බොහෝ කනු, බොනු ලැබෙයි; නං, ඒ මිතුරා ඇසුරු කොට; බහු, බොහෝ දෙනෙක්; උපජීවන්ති, ජීවත්වෙති.

Non-Commercial Distribution

2. යො. යමෙක්; මිත්තානං, මිතුරන් හට; න දූහති, ද්‍රෝහ නො කෙරේ ද; සො, හෙතෙම; යංයංජනපදං යාති, යම් යම් ජනපදයකට ගියේ ද; නිගමෙ, නියම් ගමකට; රාජධානියො, රාජධානියකට ගියේ ද; සබ්බත්‍ථ, ඒ හැම තන්හි ම; පූජිතොහොති, පුදනු ලැබෙයි.

3. යො. යමෙක්; මිත්තානං, මිතුරන් හට; න දූහති, ද්‍රෝහ නොවේ ද; අස්ස, ඔහුට; චොරා, සොරු; න පසහන්ති, ළං නො වෙත්; ඛත්තියො, රජතෙම; න අතිමඤ්ඤෙති, අවමන් නො කෙරෙයි; සබ්බෙ අමිත්තෙ, හැම සතුරන්; තරති, දුරු කෙරෙයි.

4. යො. යමෙක්; මිත්තානං, මිතුරන් හට; න දූහති, ද්‍රෝහ නො වේද; සො, හෙතෙම; අක්කුද්ධො, නොදැහැවියේ (කෝප නොවී); සඝරං, සියගෙට; එති, එයි; සභාය, සභාවෙහි; පටිනන්දිතො, සතුටු වූයේ; ඤාතීනං, ඤාතීන් හට; උත්තමො හොති, උතුම් වෙයි.

5. යො. යමෙක්; මිත්තාන, මිතුරන් හට; න දූහති, ද්‍රෝහ නො වේද; සක්කත්වා, අනුන්ට සත්කාර කොට; සක්කතො හොති, සත්කාර ලබන්නෙක් වෙයි; සගාරවො, අනුන් කෙරෙහි ගෞරව සහිත වූයේ ; ගරු හොති, තෙමේ ද ගරු කටයුතු වෙයි; වණ්ණ කිත්ති භතො හොති, වර්ණකීර්ති දෙක උසුලන්නේ ය;

6. යො. යමෙක්; මිත්තානං, මිතුරන් හට; න දූහති, ද්‍රෝහ නොවේද; පූජකො, මිත්‍රයන් පුදන තැනැත්තේ; පූජං ලභතෙ, තෙමේ ද පුද ලබයි; වන්දකො, බුද්ධාදි කලණ මිතුරන් වැන්දේ; පටිවන්දනං, තෙමේ ද පෙරළා වැඳුම් ලබයි; යසො, යසසට ද; කිත්තිං ච, කීර්තියට ද; පප්පොති, පැමිණෙයි.

7. යො, යමෙක්; මිත්තානං, මිතුරන් හට; න දූහති, ද්‍රෝහි නොවේ ද; (හෙතෙම) අග්ගි යථා, දිලිසෙන ගිනි සෙයින්; පජ්ජලති, ඉසුරෙන් දිලිසෙයි; දෙවතාව, දෙවියකු මෙන්; විරොචති, බබලයි; සිරියා, ශ්‍රීය විසින්; අජහිතො, හොති; අත් නොහරන ලද්දේ වෙයි.

8. යො, යමෙක්; මිත්තානං, මිතුරන් හට; න දූහති, ද්‍රෝහ නොවේද; ගාවො, ගෙරිහු; තස්ස, ඕහට; පජායන්ති, පලදෙති; ඛෙත්තෙ, ක්ෂෙත්‍රයෙහි; වුත්තං, වපුළතාක්; විරූහති, පැල හටගනී; පුත්තානං ඵලමස්නාති, දරු සැප වළඳයි.

9. යො, යමෙක්; මිත්තානං, මිතුරන් හට; න දූහති, ද්‍රෝහ නො කෙරේද; (හෙතෙම) දරිතො, ඇඳුරෙන් හෝ; පබ්බතො වා, පර්වතයෙන් හෝ; රුක්ඛාතො, රුකින් හෝ; පතිතො, වැටුණා වූ; චුතො, යමකින් ගිලිහුණා වූ; නරො, සත්වතෙම; පතිට්ඨං ලභති, පිහිට ලබයි.

10. යො, යමෙක්; මිත්තානං, මිතුරන් හට; න දූහති, ද්‍රෝහ නො වේද; (හෙතෙම) විරූළ්හමූල සන්තානං, වැඩුණු මුල් හා නුග අරළු ඇති; නිග්‍රොධං, නුගරුකක්; මාලුතො ඉව, (සොලවා ඵලන්ට නො හැකි) සුළඟ සෙයින්; අමිත්තා, සතුරෝ; නප්පසහන්ති; ඔහු මැඩපවත්වන්නට නො හැකි වෙත්.

**මිත්තානිසංසය යි.**

Non-Commercial Distribution

## 13. මොරපරිත්තං. — මෝර පිරිත.

1. චක්ඛුමා, ඇස් ඇති; එකරාජා, ඒකරාජ වූ; හරිස්සවණ්ණො, රන්වන් වූ; පඨවිප්පභාසො, පොළොව බබුළුවන්නා වූ; අයං, මේ හිරු තෙම; උදෙති, නැගෙයි; තං, එහෙයින්; හරිස්සවණ්ණං, රන්වන් වූ; පඨවිප්ප භාසං, පොළොව බබුළුවන; තං, තා; නමස්සා මි, වඳිමි; තයා, තා විසින්; අජ්ජ, අද; ගුත්තා, රක්නා ලද; අපි දිවසං, මේ දවස; විහරෙමු, (සුවසේ) වසමු.

2. යෙ බ්‍රහ්මණා, යම් ක්ෂීණාශ්‍රව බ්‍රාහ්මණ කෙනෙක්; සබ්බ ධම්මෙ, සියළු ඥෙය ධර්‍මයන් දැන; වෙදගු සම්‍යක්සම්බෝධියට පැමිණියෝ ද; තෙ, ඔවුන්ට; මෙ, මාගේ; නමො, නමස්කාරය වේවා; තෙ, ඒ භාග්‍යවත්හුදු; මං, මා; පාලයන්තු, රකිත්වා; බුද්ධානං, පෙර බුදුවරුනට; නමත්ථු, නමස්කාරය වේවා; බොධියා, (සතර මග සතර ඵලයයි කියන ලද) බොධියට; නමත්ථු, නමස්කාර වේවා; විමුත්තානං, කෙලෙසුන් කෙරෙන් මිදුනා වූ ඒ බුදුවරයන්ට; නමො අත්ථු, නමස්කාර වේවා; විමුක්තියා, (තදංගවිමුක්ති ආදී) පඤ්ච විමුක්තියට; නමො, නමස්කාර වේවා; සො මොරො, ඒ මයුර තෙම; ඉමං පරිත්තං කත්වා, මේ පිරිත (ආරක්ෂා) කොටගෙන; එසනා, අහර සෙවීමෙහි; චරති, හැසිරෙයි.

3. චක්ඛුමා, ඇස් ඇති; එකරාජා, ඒක රාජ වූ; හරිස්සණ්ණො, රන්වන් වූ; පඨවිප්පභාසො, පොළොව බබුළුවන්නා වූ; අයං, මේ හිරු තෙම; අපෙති, පහවෙයි; තං, එහෙයින්; හරිස්සවණ්ණං, රන්වන් වූ; පඨවිප්පභාසං, පොළොව බබුළුවන; තං, තා; නමස්සාමි, වඳිමි; තයා, තා විසින්; අජ්ජ, අද; ගුත්තා, රක්නා ලද, අපි; රත්තිං, රැයෙහි; විහරෙමු. (සුවසේ) වසමු.

යෙ බ්‍රාහ්මණා, යම් ක්ෂීණා ශ්‍රව බමුණු කෙනෙක්; සබ්බ ධම්මෙ, සියලු ධර්‍මයන් දැන; වෙදගු සම්‍යක් සම්බෝධියට පැමිණියෝ ද; තෙ, ඔවුනට; මෙ, මාගේ, නමො, නමස්කාරය වේවා; තෙ ච, ඒ භාග්‍යවත්හු ද; මං, මා; පාලයන්තු, රක්ෂා කෙරෙත්වා;

බුද්ධානං, අතීත බුදුවරුනට; නමො අත්ථු, නමස්කාර වේවා; නමත්ථු බොධියා, ඔවුන්ගේ බෝධියට ද නමස්කාර වේවා; විමුත්තානං, කෙලෙසුන් කෙරෙන් මිදුනා වූ ඒ බුදුවරුනට; නමො අත්ථු, නමස්කාර වේවා;

සො මොරො, ඒ මයුරතෙම; පරිත්තං කත්වා, පිරිත් ආරක්ෂා කොට ගෙන; වාසං අකප්පයි, වාසය කෙළේ යි.

මෝර පිරිත යි.

## 14. චන්දපරිත්තං. — චන්ද පිරිත.

1. මෙ, මා විසින්; එවං සුතං, මෙසේ අසන ලදී, එකං සමයං, එක් සමයෙක; භගවා, භාග්‍යවතුන් වහන්සේ; සාවත්ථියං, සැවැත්නුවර සමීපයෙහි; ජේතවනෙ, ජෙතවන නම් වූ; අනාථ පිණ්ඩිකස්ස, අනේ පිඬු සිටුහු ගේ; ආරාමෙ, ආරාමයෙහි; විහරති, වැඩ වසන සේක.

තෙන ඛො පන සමයෙන, එ සමයෙහි වනාහි; චන්දිමා දෙවපුත්තො, සඳ දෙව්පුත් තෙමේ; රාහුනා අසුරින්දෙන, රාහු අසුරේන්ද්‍රයා විසින්; ගහිතො හොති, ගන්නා ලද්දේ වෙයි; අථ ඛො, ඉක්බිති; චන්දිමා දෙවපුත්තො, සඳ දෙව්පුත් තෙමේ; තායං වේලායං, එ වේලෙහි; භගවන්තං, බුදුරදුන්; අනුස්සරමානො, සිහි කරමින්; ඉමං ගාථං, මේ ගාථාව; අභාසි, කීය.

Non-Commercial Distribution

2. බුද්ධවීර, බුද්ධවීරයන් වහන්ස; (ඔබ වහන්සේ) සබ්බධි, සියලු කල්හි; විප්පමුත්තොසි, කෙලෙසුන් කෙරෙන් විශේෂයෙන් මිදුණු සේක. (එසේ වූ) තෙ, නුඹ වහන්සේට; නමො අත්ථු, නමස්කාර වේවා; සම්බාධ පටිපන්නො අස්මි, (මම) සම්බාධයකට පැමිණියෙමි; තස්ස මෙ, ඒ මට; සරණං භව, පිළිසරණ වුව මැනව.

3. අථ බො, එකල්හි; භගවා, භාග්‍යවතුන් වහන්සේ; චන්දිමං දෙවපුත්තං, සඳ දෙව් පුතුන්; ආරබ්භ, අරභයා; රාහුං අසුරින්දං, රාහු අසුරිඳු හට; ගාථාය, ගයකින්; අජ්ඣභාසි, මෙසේ වදාළ සේක:

4. රාහු, රාහු අසුරේන්ද්‍රය; චන්දිමා, සඳදෙව් පුත් තෙමේ; අරහන්තං, අර්හත් වූ; තථාගතං, තථාගතයන් වහන්සේ; සරණගතො, සරණ ගියේ ය; බුද්ධා, බුදුවරයෝ; ලොකානුකම්පකා, ලොවට අනුකම්පා කරන්නෝ ය. (එහෙයින්) චන්දං පමුඤ්චස්සු, සඳු අතහැරව යි වදාළ සේක;

5. අථ බො, ඉක්බිති; රාහු අසුරින්දො, රාහු අසුරේන්ද්‍ර තෙම; චන්දි මං දෙවපුත්තං, සඳු දෙව්පුතු; මුඤ්චිත්වා, හැර; තරමාණ රූපො, වෙළෙව් වූයේ; වෙපචිත්ති අසුරේන්දො, වේපචිත්ති අසුරේන්ද්‍රයා; යෙන, යම් තැනක් හි ද; තෙන, එතැන්හි; උපසංකමි, එළඹියේ ය; උපසංකමිත්වා, එළඹ; සංවිග්ගො, සංවේග ඇත්තේ; ලොමහට්ඨජාතො, ලොමුදැහැගත් සිරුරු ඇත්තේ; එකමන්තං, එකත් පසෙක; අට්ඨාසි, සිටියේ ය; එකමන්තං ඨිතං බො රාහුං අසුරින්දං, එකත් පස්ව සිටියා වූ රාහු අසුරිඳු හට; වෙපචිත්ති අසුරින්දො, වේපචිත්ති නම් අසුරේන්ද්‍ර තෙම; ගාථාය, ගාථාවකින්; අජ්ඣභාසි, මෙසේ කීයේ ය;

6. රාහු, රාහු අසුරේන්ද්‍රය; සන්තරමානොව, වෙලෙව් වූවකු මෙන්; චන්දං, සඳු; කින්නු පමුඤ්චසි, කුමක් පිණිස අත්හැරියෙහි ද?; සංවිග්ගරූපො, ආගමම, කැළඹුණු සිත් ඇත්තෙක් වැ අවුත්; භීතොව, බියවූවකු මෙන්; කින්නු තිට්ඨසී'ති, කුමක් හෙයින් සිටිනෙහි ද? යනුයි.

7. බුද්ධගාථාභි, බුදුන් විසින් (සඳු හරුව යි) ගාථා දෙකකින්; ගීතොම්හි, ගයන ලද්දක් ඇසුවෙමි; චෙ, ඉදින්; චන්දිමං, සඳු; නොමුඤ්චෙය්‍ය, නො හැරියේ නම්; මෙ මුද්ධා, මගේ හිස; සත්තධා, සත්කඩක් ව; ඵලෙ, පැළෙයි; ජීවන්තො, ජීවත්වන්නේ ද; සුඛං න ලභෙ, සැපයක් නො ලබයි.

**චන්ද පිරිත යි.**

## 15. සූරියපරිත්තං. — සූරිය පිරිත.

1. මෙ, මා විසින්; එවං, මෙසේ; සුතං, අසන ලදී, එකං සමයං, එක් සමයෙක; භගවා, භාග්‍යවතුන් වහන්සේ; සාවත්ථියං, සැවැත්නුවර; ජේතවනෙ, ජෙතවනයෙහි වූ; අනාථ පිණ්ඩිකස්ස, අනේ පිඬු සිටුහු ගේ; ආරාමෙ, ආරාමයෙහි; විහරති, වැඩ වසන සේක.

තෙන බො පන සමයෙන, එ සමයෙහි වනාහි; සූරියො දෙවපුත්තො, හිරු දෙව්පුත් තෙමේ; රාහුනා අසුරින්දෙන, රාහු අසුරිඳු විසින්; ගහිතො හොති, ගන්නා ලද්දේ වෙයි; අථ බො, ඉක්බිති; සූරියො දෙව පුත්තො, හිරු දෙව්පුත් තෙමේ; භගවන්තං, බුදුන්; අනුස්සරමානො, සිහි කරමින්; තායං වේලායං, එ වේලෙහි; ඉමං ගාථං, මේ ගාථාව; අභාසි, කීයේ ය;

Non-Commercial Distribution

2. බුද්ධවීර, බුද්ධ වීරයාණෙනි; තෙ, නුඹවහන්සේට; නමො අත්ථු, නමස්කාර වේවා; සබ්බධි, හැම කල්හි ම; විප්පමුත්තො අසි, කෙලෙසුන් ගෙන් වෙසෙසින් මිදුණු සේක; සම්බාධපටිපන්නොස්මි, සම්බාධයකට පැමිණියෙමි; තස්ස මෙ, එසේ වූ මට; සරණං භව ඉති, පිළිසරණ වනු මැනව.

3. අථ ඛො, ඉක්බිති; භගවා, භාග්‍යවතුන් වහන්සේ; සූරියං දෙවපුත්තං ආරබ්භ, හිරු දෙව්පුත් අරභයා; රාහුං අසුරින්දං, රාහු අසුරිඳු හට; ගාථාහි, ගාථාවලින්; අජ්ඣභාසි, මෙසේ වදාළ සේක:

4. රාහු, රාහු අසුරේන්ද්‍රය; සූරියො, හිරුදෙව්පුත් තෙමේ; අරහන්තං තථාගතං, නිකෙලෙස් වූ තථාගතයන් වහන්සේ; සරණං ගතො, සරණ ගියේ ය; බුද්ධා, බුදුවරු; ලොකානුකම්පකා, ලොවට අනුකම්පා කෙරෙති; (එහෙයින්) සූරියං, හිරු; පමුඤ්චස්සු මුදව;

5. යො, යම් සූර්යයෙක්; අන්ධකාරෙ තමසි, ගන අඳුරු දුරහැර; පභංකරො, පහන් කෙරේ ද; වෙරොචනො මණ්ඩලී, බබලන මඬුලු ඇත්තේ ද; උග්ගතෙජො, මහතෙද ඇත්තේ ද; රාහු, එම්බල රාහු; අන්තලික්ඛෙ, අහසෙහි; චරං, හැසිරෙන හිරු; මා ගිලි, නො ගිලව; රාහු, එම්බල රාහු; මම පජං, මගේ පුත්‍ර වූ; සූරියං, හිරු; පමුඤ්ච ඉති, මුදවයි වදාළ සේක.

6. අථඛො, ඉක්බිති; රාහු අසුරින්දො, රාහු අසුරිඳු තෙම; සූරියං දෙව පුත්තං හිරුදෙව් පුතුන්; මුඤ්චිත්වා, අත්හැර; තරමාණ රූපො, වෙලෙව් වූයේ; වෙපචිත්ති අසුරින්දො, වේපචිත්ති අසුරිඳු තෙම; යෙන, යම් තැනෙක ද; තෙන, එතැනට; උපසංකමි, එළඹියේ ය; උපසංකමිත්වා, එළඹ; සංවිග්ගො, කළකිරුණු සිත් ඇත්තේ; ලොමහට්ඨජාතො, ලොමුදැහැගන්නා ලද්දේ; එකමන්තං, එකත් පසෙක; අට්ඨාසි, සිටියේ ය; එකමන්තං ඨිතං ඛො, එකත් පස්ව හුන්නාවූ ද; රාහුං අසුරින්දං, රාහු අසුරිඳු හට; වෙපචිත්ති අසුරින්දො, වේපචිත්ති අසුරිඳු තෙම; ගාථාය, ගාථාවකින්; අජ්ඣභාසි, මෙසේ කීය:

7. රාහු, එම්බල රාහු; කින්නු, කිම; සන්තරමානොව, වෙලෙව් වූයේ; සූරියං, හිරු; පමුඤ්චසි, මුදාහැරියෙහි; සංවිග්ගරූපො, කළකිරුණු ස්වභාව ඇත්තේ; ආගම්ම, අවුත්; භීතොව, බියවූයේ ම; කින්නු තිට්ඨසි ඉති, කුමක් පිණිස සිටින්නෙහි ද?;

8. බුද්ධගාථාභි ගීතොම්හි, බුදුරදුන් දේශිත ගාථා දෙකක් අසන ලද්දෙමි; නො චෙ මුඤ්චෙය්‍ය සූරියං ඉති, ඉදින් හිරු අත් නො හළෙම් නම්; මෙ මුද්ධා, මගේ හිස; සත්ත ධා, සත්පරිද්දකින්; ඵලෙ, පැලෙයි; ජීවන්තො, ජීවත් වන්නේ ද; සුඛං, සැපයක්; න ලභෙ, නො ලබමි;

**සූරිය පිරිත යි.**

## 16. ධජග්ග සුත්තං. — ධජග්ග සූත්‍රය.

1. මෙ, මා විසින්; එවං, මෙසේ; සුතං, අසන ලදී. එකං සමයං, එක් සමයෙක; භගවා, භාග්‍යවතුන් වහන්සේ; සාවත්ථියං, සැවැත්නුවර; ජෙතවනෙ, ජෙතවනයෙහි වූ; අනාථ පිණ්ඩිකස්ස, අනේ පිඬු සිටුහු ගේ; ආරාමෙ, ආරාමයෙහි; විහරති, වැඩ වසන සේක; තත්‍ර ඛො, එකල්හි වනාහි; භගවා, භාග්‍යවතුන් වහන්සේ; භික්ඛවො ඉති, මහණෙනි යි; භික්ඛූ, භික්‍ෂූන්; ආමන්තෙසි, ඇමතූ සේක; තෙ භික්ඛූ, ඒ භික්‍ෂූහු; භදන්තෙ ඉති, ස්වාමීනි'යි; භගවතො, භාග්‍යවතුන් වහන්සේට; පච්චස්සොසුං, පිළිවදන් දුන්හ; භගවා, භාග්‍යවතුන් වහන්සේ; එතදවොච, මේ කරුණ වදාළ සේක:

Non-Commercial Distribution

2. භික්ඛවෙ, මහණෙනි; භූතපුබ්බං, පෙර වූ දෙයක් කියමි; දෙවාසුරසංගාමො, දෙවියන් හා අසුරයන් අතර සංග්‍රාමයක්; සමූපබ්බූළ්හො අහොසි, එළඹුනේ විය; භික්ඛවෙ, මහණෙනි, අථ බො, ඉක්බිති; සක්කො දෙවානමින්දො, සක්දෙව් රජතෙම; තාවතිංසෙ දෙවෙ, තව්තිසා වැසි දෙවියන්; ආමන්තෙසි, ඇමතී ය;

මාරිසා, නිදුකාණෙනි; සංගාමගතානං, යුද්ධයට ගිය; දෙවානං, දෙවියන්ට; භයං වා, බියෙක් හෝ; ඡම්භිතත්තං වා, තැතිගැන්මෙක් හෝ; ලොමහංසො වා, ලොමුදැහැගැන්මෙක් හෝ; සචෙ උප්පජ්ජෙය්‍ය, ඉදින් උපන්නේ නම්; තස්මිං සමයෙ, එ සමයෙහි; මම එව, මගේ ම; ධජග්ගං, ධ්වජාග්‍රය; උල්ලොකෙය්‍යාථ, බලව්; මමංහි, මගේ වනාහි; ධජග්ගං, ධ්වජාග්‍රය; උල්ලොකයතං, බලන්නා වූ; වො, තොපට; යං භයං වා, යම් බියෙක් හෝ; ඡම්භිතත්තං වා, තැතිගැන්මෙක් හෝ; ලොමහංසො වා, ලොමුදැහැගැන්මෙක් හෝ; භවිස්සති, වේ ද; සො, හේ; පහීයිස්සති, දුරු වෙයි;

3. මෙ ධජග්ගං, මාගේ ධ්වජාග්‍රය; නො චෙ උල්ලොකෙය්‍යාථ, ඉදින් නොබලා නම්; අථ, ඉක්බිති; පජාපතිස්ස දෙවරාජස්ස, ප්‍රජාපති දෙව්රජහු ගේ; ධජග්ගං, ධ්වජාග්‍රය; උල්ලොකෙය්‍යාථ, බලව්; පජා පතිස්සහි දෙවරාජස්ස, ප්‍රජාපති නම් දෙව්රජහු ගේ; ධජග්ගං, ධ්වජාග්‍රය; උල්ලොකයතං, බලන්නා වූ; වො, තොපට; භයං වා, යම් බියෙක් හෝ; ඡම්භිතත්තං වා, තැති ගැන්මෙක් හෝ; ලොමහංසො වා, ලොමුදැහැගැන්මෙක් හෝ; භවිස්සති, වේ ද; සො, හේ; පහීයිස්සති, දුරුවෙයි.

4. පජාපතිස්ස දෙවරාජස්ස, ප්‍රජාපතී දෙව් රජහු ගේ; ධජග්ගං, ධ්වජාග්‍රය; නො චෙ උල්ලොකෙය්‍යාථ, ඉදින් නොබලව් නම්; අථ, ඉකිබිති; වරුණස්ස දෙවරාජස්ස, වරුණ දෙව්රජහු ගේ; ධජග්ගං, ධ්වජාග්‍රය, උල්ලොකෙය්‍යාථ, බලව්; වරුණස්සහි දෙවරාජස්ස, වරුණ නම් දෙව් රජහු ගේ; ධජග්ගං, ධ්වජාග්‍රය; උල්ලොකයතං, බලන්නා වූ; වො, තොපට; යං භයං වා, යම් බියෙක් හෝ; ඡම්භිතත්තං වා, තැතිගැන්මෙක් හෝ; ලොමහංසො වා, ලොමුදැහැගැන්මෙක් හෝ; භවිස්සති, වෙයි ද; සො, හේ; පහීයිස්සති, පහවෙයි.

5. වරුණස්ස දේවරාජස්ස, වරුණ දෙව් රජහු ගේ; ධජග්ගං, ධ්වජාග්‍රය; නො චෙ උල්ලොකෙය්‍යාථ, ඉදින් නො බලව් නම්; අථ, නැවත; ඊසානස්ස දෙවරාජස්ස, ඊසාන දෙව්රජහු ගේ; ධජග්ගං, ධ්වජාග්‍රය; උල්ලොකෙය්‍යාථ, බලව්; ඊසානස්සහි දෙවරාජස්ස, ඊසාන නම් දෙව්රජහු ගේ; ධජග්ගං, ධ්වජාග්‍රය; උල්ලොකයතං, බලන්නා වූ; වො, තොපට; යං භයං වා, යම් බියෙක් හෝ; ඡම්භිතත්තං වා, තැති ගැන්මෙක් හෝ; ලොමහංසො වා, ලොමුදැහැගැන්මෙක් හෝ; භවිස්සති, වේද; සො, හේ, පහීයිස්සති, පහවෙයි.

6. භික්ඛවෙ, මහණෙනි, සක්කස්ස වා, දෙවානමින්දස්ස, සක්දෙව් රජුහු ගේ හෝ; තං බො පන ධජග්ගං, ඒ ධ්වජාග්‍රය; උල්ලෙකයතං, බලන්නහුට; පජාපතිස්සවා දෙවරාජස්ස, ප්‍රජාපති දෙව්රජු ගේ හෝ; ධජග්ගං, ධ්වජාග්‍රය; උල්ලෙකයතං, බලන්නහුට; ඊසානස්ස වා දෙවරාජස්ස, ඊසාන නම් දෙව්රජහු ගේ හෝ; ධජග්ගං, ධ්වජාග්‍රය; උල්ලෙකයතං, බලන්නහුට; යං භයං වා, යම්, බියෙක් හෝ; ඡම්භිතත්තං වා, තැති ගැනීමක් හෝ; ලොමහංසො වා, ලොමුදැහැගැනීමක් හෝ; භවිස්ති, වේ ද; සො, හේ; පහීයෙථාපි, දුරු වන්නේ හෝ වේද ?; නො පි පහියෙථ, දුරු නො වන්නේ හෝ වෙයි; තංකිස්සහෙතු? එයට හේතු කවරේ ද යත්?;

Non-Commercial Distribution

7. භික්ඛවෙ, මහණෙනි, සක්කොහි දෙවානමින්දො, සක්දෙව් රජතෙම වනාහි; අවිතරාගො, දුරු නො කළ රාග ඇත්තේ ය; අවිතදොසො, දුරු නොකළ ද්වේෂ ඇත්තේ ය; අවිතමොහො. දුරු නො කළ මෝහ ඇත්තේ ය; භීරු, බියවන සුලු ය; ඡම්භි, තැති ගන්නා සුලුය; උත්‍රාසි, අතිශයින් ම බියවන සුලුය; පලායි ඉති, පලා යන සුලුය;

8. භික්ඛවෙ, මහණෙනි; අහඤ්ච ඛො, මම ද; තුම්හාකං, නුඹලාට; එවං වදාමි, මෙසේ කියමි; භික්ඛවෙ, මහණෙනි; සචෙ, ඉදින්; අරඤ්ඤගතානං වා, වනයට ගියා වූ හෝ; රුක්ඛමූලගතානං වා, රුක්මුලට ගියා වූ හෝ; සුඤ්ඤාගාරගතානං වා, ගෙවලින් හිස් තැනකට ගියා වූ හෝ; තුම්හාකං, නුඹලාට; භයං වා, බියෙක් හෝ; ඡම්භිතත්තං වා, තැති ගැන්මෙක් හෝ; ලොමහංසො වා, ලොමුදැහැගැන්මෙක් හෝ; උප්පජ්ජෙය්‍ය, උපදනේ වී නම්; තස්මිං සමයෙ, ඒ සමයෙහි; මං එව, මා ම; අනුස්සරෙය්‍යාථ, සිහි කරව්; (කෙසේ ද?)

9. සො භගවා, ඒ භාග්‍යවතුන් වහන්සේ; ඉතිපි, මේ කරුණෙනුදු; අරහං, අර්හත් ය; සම්මා සම්බුද්ධො, සම්‍යක් සම්බුද්ධ ය; විජ්ජා චරණ සම්පන්නො, විද්‍යාචරණ ධර්‍මයන් ගෙන් යුක්ත ය; සුගතො, සුගත ය; ලොකවිදූ, ලෝකවිදූ ය; අනුත්තරො, අනුත්තර ය; පුරිස දම්ම සාරථී, පුරිස දම්ම සාරථී ය; සත්‍ථා දෙවාමනුස්සානං, දෙව් මිනිසුනට අනුශාසක ය; බුද්ධො, බුද්ධ ය; භගවා ඉති, භාග්‍යවත් ය (කියායි)

10. භික්ඛවෙ, මහණෙනි, මමංහි අනුස්සරතං, මා සිහි කරන්නා වූ; වො, තොපට; යං භයං වා, යම් බියෙක් හෝ; ඡම්භිතත්තං වා, තැති ගැන්මෙක් හෝ; ලොමහංසො වා, ලොමුදැහැගැන්මෙක් හෝ; භවිස්සති, වේ ද; සො, හේ; පහීයිස්සති, දුරුවේ;

11. නො වෙ මං අනුස්සරෙය්‍යාථ, ඉදින් මා සිහි නො කරව් නම්; අථ, ඉක්බිති; ධම්මං, ධර්‍මය; අනුස්සරෙය්‍යාථ, සිහි කරව්;

12. භගවතා, බුදුරදුන් විසින්; ස්වාක්ඛාතො, මොනවට දෙසන ලද; ධම්මො, ධර්‍මය තෙම; සන්දිට්ඨිකො, සාන්දෘෂ්ටික ය; අකාලිකො, කල් නො යවා විපාක දෙන්නේ ය; එහිපස්සිකො, එව බලව යන විදියට සුදුසු ය; ඔපනයිකො, එළඹීමට සුදුසු ය; පච්චත්තං, තම තමන් කෙරෙහි ලා; විඤ්ඤූහි, නුවණැත්තන් විසින්; වෙදිතබ්බො 'ඉති, දතයුත්තේ ය; (යනුයි) භික්ඛවෙ, මහණෙනි; ධම්මංහි අනුස්සරතං, ධර්‍මය සිහි කරන්නා වූ; වො, තොපට; යං භයං වා, යම් බියෙක් හෝ; ඡම්භිතත්තං වා, තැති ගැන්මෙක් හෝ; ලොමහංසො වා, ලොමු දැහැගැනීමෙක් හෝ; භවිස්සති, වේ ද; සො, හේ; පහීයිස්සති, පහවෙයි.

13. නො වෙ ධම්මං අනුස්සරෙය්‍යාථ, ඉදින් ධර්‍මය සිහි නො කරන්නහු නම්; අථ, ඉක්බිති; සංඝං, සඟුන්; අනුස්සරෙය්‍යාථ, සිහි කරව්; (කෙසේ ද?)

14. භගවතො සාවක සංඝො, භාග්‍යවතුන් වහන්සේ ගේ ශ්‍රාවක සංඝ තෙමේ; සුපටිපන්නො, මනාව පිළිපන්නේ ය; භගවතො සාවක සංඝො උජුපටිපන්නො, භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝ තෙමේ ඍජු වූ පිළිවෙතින් යුක්ත ය; භගවතො සාවක සංඝො ඤායපටිපන්නො, භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝ තෙමේ නිවන් සඳහා පිළිපන්නේ ය; භගවතො සාවක සංඝො

Non-Commercial Distribution

සාමීචිපටිපන්නො, භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝ තෙමේ ත්‍රිශික්ෂාවෙහි ගරු කිරීමට සුදුසු පිළිවෙත්හි පිළිපන්නේ ය. යදිදං, යම් මේ; චත්තාරි පුරුෂ යුගානි?, පුරුෂ යුගල වශයෙන් සතර කොටසක් වෙත් ද; අට්ඨපුරිස පුග්ගලා, පුරුෂ පුද්ගල වශයෙන් අට දෙනෙක් වෙත් ද?; භගවතො, භාග්‍යවතුන් වහන්සේ ගේ; එස සාවක සංඝො, මේ ශ්‍රාවක සංඝ තෙමේ; ආහුනෙය්‍යො, දුරිනිදු ගෙන හැර දිය යුතු ප්‍රත්‍යයට සුදුසු ය; පාහුනෙය්‍යො, අමුතු ප්‍රත්‍යයන් පිළි ගැනීමට සුදුසු ය; දක්ඛිණෙය්‍යො, දක්ෂිණාවට සුදුසු ය; අඤ්ජලිකරණීයො, දොහොත් මුදුන් දී වැඳීමට සුදුසු ය; ලොකස්ස, සියලු ලෝකයාට; අනුත්තරං, උතුම් වූ; පුඤ්ඤක්ඛෙත්තං ඉති, පින් කෙතකැයි කියායි;

15. භික්ඛවෙ, මහණෙනි; සංඝංහි අනුස්සරතං, සංඝයා සිහි කරන; වො, තොපට; යං භයං වා, යම් බියෙක් හෝ; ඡම්භිතත්තං වා, තැති ගැන්මෙක් හෝ; ලොමහංසො වා, ලොමු දැහැගැන්මෙක් හෝ; භවිස්සති, වන්නේ ද; සො, හේ; පහීයිස්සති, දුරු වෙයි; තංකිස්ස හෙතු?, එයට කාරණා කිම යත්?

16. භික්ඛවෙ, මහණෙනි; අරහං, අරහත් වූ; සම්මා සම්බුද්ධො, සම්‍යක් සම්බුද්ධ වූ; තථාගතො, තථාගත තෙම; වීතරාගො, නසන ලද රාග ඇත්තේ ය; වීතදොසො, නසන ලද ද්වේෂ ඇත්තේ ය; වීතමොහො, නසන ලද මෝහ ඇත්තේ ය; අභීරු, බිය නොවන සුලුය; අච්ඡම්භි, තැති නො ගන්නා සුලුය; අනුත්‍රාසි, ත්‍රාස නො වන සුලුය; අපලා යි ඉති, බියෙන් පලා නො යන්නේ ය;

17. භගවා, භාග්‍යවත් තෙම; ඉදං අවොච, මේ ධජග්ග පරිත්තය වදාළේ ය; සුගතො, සුගත වූ; සත්‍ථා, ශාස්තෲන්වහන්සේ; ඉදතංවත්‍වා, මේ වදාරා; අථ, නැවත; අපරං අන්‍ය වූ; එතං, මේ කාරණය; අවොච, වදාළ සේක;

18. භික්ඛවෙ, මහණෙනි, අරඤ්ඤෙ, ආරණ්‍යයෙහි හෝ; රුක්ඛමූලෙ වා, රුක් මුල්හි හෝ; සුඤ්ඤාගාරෙ වා, ජන ශූන්‍ය ස්ථානයක හෝ; සම්බුද්ධං, සම්බුදුන්; අනුස්සරෙථ, සිහි කරව්; තුම්හාකං, තොපට; භයං, බියෙක්; නොසියා, නො වන්නේ යි;

19. ලොකජෙට්ඨං, ලොවට ජ්‍යෙෂ්ඨ වූ; නරාසභං, නරෝත්තම වූ; බුද්ධං, බුදුරදුන්; නො චෙ සරෙය්‍යාථ, ඉදින් සිහි නො කරව් නම්; අථ, ඉක්බිති; නිය්‍යාණිකං, නෛර්යානික වූ; සුදෙසිතං, මනාකොට දෙසන ලද; ධම්මං, ධර්මය; සරෙය්‍යාථ, සිහි කරව්;

20. නිය්‍යාණිකං, නෛර්යානික වූ; සුදෙසිතං, මොනවට දෙසන ලද; ධම්මං, සද්ධර්මය; නො චෙ සරෙය්‍යාථ, ඉදින් සිහි නො කරව් ද; අථ, ඉක්බිති; පුඤ්ඤක්ඛෙත්තං, පින් කෙතක් වූ; අනුත්තරං, අනුත්තර වූ; සංඝං, සංඝයා; සරෙය්‍යාථ, සිහි කරව්;

21. භික්ඛවෙ, මහණෙනි; බුද්ධං, බුදුන් ද; ධම්මං, ධර්මය ද; සංඝං ච, සංඝයා ද; එවං, මෙසේ; සරන්තානං, සිහි කරන්නවුනට; භයං වා, බියෙක් හෝ; ඡම්භිතත්තං වා, තැති ගැන්මෙක් හෝ; ලොමහංසො, ලොමු දැහැගැන්මෙක්; න හි එස්සති, නොවේ.

**ධජග්ග පිරිත යි.**

**පළමුවන බණවර යි.**

● ● ● ● ● ● ● ● ● ● ● ● ● ● ●

Non-Commercial Distribution

# දුතියක භාණවාරං. — දෙවන බණවර.

## මහාකස්සප ථෙර බොජ්ඣංග පරිත්තං
## මහාකස්සප ථෙර බොජ්ඣංග පිරිත.

1. මෙ, මා විසින්; එවං, මෙසේ; සුතං, අසන ලදී. එකං සමයං, එක් සමයෙක; භගවා, භාග්‍යවතුන් වහන්සේ; රාජගහෙ, රජගහ නුවර; කලන්දක නිවාපෙ, ලෙහෙනුන්ට දෙන ලද නිවාප ඇති හෙයින් කලන්දක නිවාප නම් වූ; වෙළුවනෙ, වේළුවන නම් වූ මහා විහාරයෙහි; විහරති, වැඩ වසන සේක; තෙන ඛො පන සමයෙන, එ සමයෙහි වනාහි; ආයස්මා මහාකස්සපො, ආයුෂ්මත් මහා කාශ්‍යප ස්ථවිර තෙම; ආබාධිකො, පීඩිත වූයේ; දුක්ඛිතො, දුකට පත් වූයේ; බාළ්හගිලානො, දැඩි ගිලන්වූයේ; පිප්ඵලි ගුහායං, පිප්ඵලි ගුහාවෙහි; විහරති, වෙසෙයි.

2. අථ ඛො, ඉක්බිති; භගවා, භාග්‍යවතුන් වහන්සේ; සායණ්හ සමයං, සවස් වේලෙහි; පතිසල්ලානා, ඵල සමවතින්; වුට්ඨිතො, නැගිටියේ; ආයස්මා මහාකස්සපො, ආයුෂ්මත් මහා කාශ්‍යප ස්ථවිරයන් වහන්සේ යෙන, යම් තැනක වෙසෙත් ද; තෙන, එතැනට; උපසංකමි, එළඹි සේක; උපසංකමිත්වා, එළඹ; පඤ්ඤත්තෙ ආසනෙ, පැණ වූ අස්නෙක; නිසීදි, වැඩහුන් සේක; නිසජ්ජ ඛො, වැඩහිඳ ම; භගවා, භාග්‍යවතුන් වහන්සේ; ආයස්මන්තං මහා කස්සපං, ආයුෂ්මත් මහා කාශ්‍යපයන් වහන්සේ හට; එතං අවොච, මෙය වදාළ සේක;

3. කච්චි?, කිමෙක් ද?; කස්සප, කාශ්‍යප; තෙ, තොපට; ඛමනීයං, ඉවසිය හැකි ද?; කච්චි?, කිම?; යාපනීයං, යැපිය හැකිද ?; කච්චි?, කිම?; දුක්ඛා වේදනා, දුක්ඛ වේදනාවෝ; පටික්කමන්ති, පිරිහෙත් ද?; නො අභික්කමන්ති, කිම දියුණු නොවෙත් ද?; පටික්කමොසානං පඤ්ඤායති, ප්‍රතික්‍රමණාවසානය පෙනේ ද? (ඒ දුක්ඛ වේදනාවන් ගේ කෙළවරක් පැනේ ද?) නො අභික්කමොති, වැඩීමක් නොපෙනේ දැ'යි වදාළ සේක.

4. භන්තෙ, ස්වාමීන් වහන්ස; මෙ, මට; න ඛමනීයං, ඉවසීමට නො හැකි ය; යාපනීයං, ඉරියව් පවත්වන්නට නො හැකි ය; බාළ්හා මෙ දුක්ඛා වෙදනා, මගේ දුක්ඛ වේදනාවෝ බලවත් හ; අභික්කමන්ති, දියුණු වෙත්; නො පටික්කමන්ති, ප්‍රතික්‍රමණය නොවෙත්; (අඩු නොවෙත්) අභික්කමොසානං, දුක්ඛ වේදනාවන් ගේ වැඩීම; පඤ්ඤායති, පෙනෙයි; නො පටික්කමොති, අඩුවක් නො පෙනෙයි.

5. කස්සප, කාශ්‍යප; සත්තිමෙ බොජ්ඣංගා, මේ සප්ත බොජ්ඣංගයෝ; මයා, මා විසින්; සම්ම දක්ඛාතා, මොනවට ප්‍රකාශ කරන ලදහ; භාවිතා, භාවිතා කරන ලදහ; බහුලීකතා, නැවත නැවත පුරුදු කරන ලදහ; අභිඤ්ඤාය, සත්‍යය ප්‍රතිවේධය පිණිස; සම්බොධාය, මනා අවබෝධය පිණිස; නිබ්බාණාය, නිවන් පිණිස; සංවත්තන්ති, පවතිත්; කතමෙ සත්ත?, කවර සප්ත බෝධ්‍යංගයෝ ද යත්?

6. කස්සප, කාශ්‍යපය; සතිසම්බොජ්ඣංගො ඛො, සතිසම්බොධ්‍යංගය වනාහි; මයා, මා විසින්; සම්ම දක්ඛාතො, මොනවට කියන ලදි; භාවිතො, වඩනා ලදි; බහුලීකතො, බහුල වශයෙන් කරන ලදී; අභිඤ්ඤාය, සත්‍යය ප්‍රතිවේධය පිණිස; සම්බොධාය, මනා අවබෝධය පිණිස; නිබ්බාණාය, නිවන් පිණිස; සංවත්තතී, පවතියි.

7. කස්සප, කාශ්‍යපය; ධම්ම විචය සම්බොජ්ඣංගො ඛො, ධම්ම විචය සම්බොධ්‍යංගය වනාහි; මයා, මා විසින්; සම්ම දක්ඛාතො; මොනවට කියන ලදි; භාවිතො, භාවිතා කරන ලදී;

Non-Commercial Distribution

බහුලීකතො, බහුල වශයෙන් කරන ලදී; අභිඤ්ඤාය, සත්‍ය ප්‍රතිවේධය පිණිස; සම්බොධාය, මනා අවබෝධය පිණිස; නිබ්බාණාය, නිවන් පිණිස; සංවත්තති, පවතියි.

8. කස්සප, කාශ්‍යපය; විරිය සම්බොජ්ඣංගො ඛො, විරිය සම්බොධ්‍යංගය වනාහි; මයා, මා විසින්; සම්ම දක්ඛාතො; මොනවට කියන ලදී; භාවිතො, භාවිතය; බහුලීකතො, බහුලීකෘත ය; අභිඤ්ඤාය, සත්‍ය ප්‍රතිවේධය පිණිස; සම්බොධාය, මනා අවබෝධය පිණිස; නිබ්බාණාය, නිවන් පිණිස; සංවත්තති, පවතියි.

9. කස්සප, කාශ්‍යපය; පීති සම්බොජ්ඣංගො ඛො, ප්‍රීති සම්බොධ්‍යංගය වනාහි; මයා, මා විසින්; සම්ම දක්ඛාතො; මොනවට කියන ලදී; භාවිතො, භාවිත ය; බහුලීකතො, බහුලීකෘත ය; අභිඤ්ඤාය, සත්‍ය ප්‍රතිවේධය පිණිස; සම්බොධාය, මනා අවබෝධය පිණිස; නිබ්බාණාය, නිවන් පිණිස; සංවත්තති, පවතියි.

10. කස්සප, කාශ්‍යපය; පස්සද්ධි සම්බොජ්ඣංගො ඛො, පස්සද්ධි සම්බොධ්‍යංගය වනාහි; මයා, මා විසින්; සම්ම දක්ඛාතො; මොනවට කියන ලදී; භාවිතො, භාවිත ය; බහුලීකතො, බහුලීකෘත ය; අභිඤ්ඤාය, සත්‍ය ප්‍රතිවේධය පිණිස; සම්බොධාය, මනා අවබෝධය පිණිස; නිබ්බාණාය, නිවන් පිණිස; සංවත්තති, පවතියි.

11. කස්සප, කාශ්‍යපය; සමාධි සම්බොජ්ඣංගො ඛො, සමාධි සම්බොධ්‍යංගය වනාහි; මයා, මා විසින්; සම්ම දක්ඛාතො; මොනවට කියන ලදී; භාවිතො, භාවිත ය; බහුලීකතො, බහුලීකෘත ය; අභිඤ්ඤාය, සත්‍ය ප්‍රතිවේධය පිණිස; සම්බොධාය, මනා අවබෝධය පිණිස; නිබ්බාණාය, නිවන් පිණිස; සංවත්තති, පවතියි.

12. කස්සප, කාශ්‍යපය; උපෙක්ඛා සම්බොජ්ඣංගො ඛො, උපෙක්‍ෂා සම්බොධ්‍යංගය වනාහි; මයා, මා විසින්; සම්ම දක්ඛාතො; මොනවට කියන ලදී; භාවිතො, භාවිත ය; බහුලීකතො, බහුලීකෘත ය; අභිඤ්ඤාය, සත්‍ය ප්‍රතිවේධය පිණිස; සම්බොධාය, මනා අවබෝධය පිණිස; නිබ්බාණාය, නිවන් පිණිස; සංවත්තති, පවතියි.

13. කස්සප, කාශ්‍යපය; ඉමෙ ඛො සත්තබොජ්ඣංගා, මේ සප්ත බොධ්‍යංගයෝ වනාහි; මයා, මා විසින්; සම්ම දක්ඛාතා; මොනවට කියන ලදහ; භාවිතා, භාවිතය හ; බහුලීකතා, බහුලීකෘතය හ; අභිඤ්ඤාය, සත්‍ය ප්‍රතිවේධය පිණිස; සම්බොධාය, ඔවුන්ගේ මනා අවබෝධය පිණිස; නිබ්බාණාය, නිවන් පිණිස; සංවත්තති, පවතිත්.

14. භගවා, භාග්‍යවතුන් වහන්ස; බොජ්ඣංගා, බොධ්‍යංග ධර්මයෝ; තග්ස, මැනව; සුගත, සුගතයන් වහන්ස; බොජ්ඣංගා, බොධ්‍යංගයෝ; තග්ස ඉති, මැනව'යි කසුප් තෙරහු දැන්වූහ.

15. භගවා, භාග්‍යවතුන් වහන්සේ: ඉදමවොච, මේ ධර්මය වදාළ සේක; අත්තමනො, එයට සතුටු වූ; ආයස්මා මහා කස්සපො, ආයුෂ්මත් මහා කාශ්‍යප ස්ථවිර තෙම; භගවතො, භාග්‍යවතුන් වහන්සේ ගේ; භාසිතං, දේශනාවට; අභිනන්දි, කැමති විය; ආයස්මා මහා කස්සපො, ආයුෂ්මත් මහා කාශ්‍යප ස්ථවිර තෙම; තම්හා ආබාධා, ඒ ආබාධයෙන්: උට්ඨාහි ච, නැගී සිටියේ ම ය; ආයස්මතො මහා කස්සපස්ස, ආයුෂ්මත් මහා කාශ්‍යප ස්ථවිරයන් වහන්සේ ගේ; සො ආබාධො, ඒ ආබාධය; තථා, එසේ ම; පහීනො ච අහොසි ඉති, පහවී ගියේ ම ය.

**මහා කස්සපත්ථෙර බොජ්ඣංගය යි.**

Non-Commercial Distribution

# මහා මොග්ගල්ලාන ථෙර බොජ්ඣංගං
## මහා මොග්ගල්ලාන ථෙර බොජ්ඣංගය

1. මෙ, මා විසින්; එවං, මෙසේ; සුතං, අසන ලදී; එකං සමයං, එක් සමයෙක; භගවා භාග්‍යවතුන් වහන්සේ; රාජගහෙ, රජගහ නුවරෙහි; කලන්දක නිවාපෙ, කලන්දක නිවාප නම් වූ; වෙළුවනෙ, වේළුවන නම් විහාරයෙහි; විහරති, වැඩ වසන සේක; තෙන ඛො පන සමයෙන, එ සමයෙහි වනාහි; ආයස්මා මහා මොග්ගල්ලානො, ආයුෂ්මත් මහා මෞද්ගල්‍යායන ස්ථවිර තෙම; ආබාධිකො, ආබාධ ඇති වූයේ; දුක්ඛිතො, දුකින් පෙළුනේ; බාළ්හගිලානො, දැඩිසේ ගිලන් වූයේ; ගිජ්ඣකූටෙ පබ්බතෙ, ගිජුකුළු පව්වෙහි; විහරති, වාසය කෙරෙයි.

2. අථ ඛො, ඉක්බිති; භගවා, භාග්‍යවතුන් වහන්සේ; සායණ්හ සමයං, සවස් කාලයෙහි; පතිසල්ලානා වුට්ඨිතො, ඵල සමවතින් නැගීසෙක්; ආයෂ්මා මහා මොග්ගල්ලානො, ආයුෂ්මත් මහා මෞද්ගල්‍යායන ස්ථවිරයන් වහන්සේ; යෙන, යම් තැනෙක්හි ද; තෙන, එතැනට; උපසංකමි, එළඹි සේක; උපසංකමිත්වා, එළඹ; පඤ්ඤත්තෙ ආසනෙ, පැණ වූ අස්නෙහි; නිසීදි, වැඩහුන් සේක; නිසජ්ජ ඛො, එසේ වැඩහිඳ; භගවා, භාග්‍යවතුන් වහන්සේ; ආයස්මන්තං මහා මොග්ගල්ලානං, ආයුෂ්මත් මහ මුගලන් තෙරුන් වහන්සේට; එතං අවොච, මෙය වදාළ සේක:

3. කච්චි?, කිම?; මොග්ගල්ලාන, මෞද්ගල්‍යායනය; තෙ ඛමනීයං, තට සැප ද?, කච්චි ?, කිම?; යාපනීයං, හොඳින් ඉරියව් පවත්නේ ද?; කච්චි?, කිම?; දුක්ඛා වෙදනා, දුඃඛ වේදනාවෝ; පටික්කමන්ති, පිරිහෙත් ද?; නො අභික්කමන්ති, නො නගිත් ද?; පටික්කමොසානං, ප්‍රතික්‍රමණ මාර්ගය (බස්නා මග) ; පඤ්ඤායති, පෙනෙයි ද?; නො අභික්කමොති, නැගෙන මාර්ගය නො පෙනේ ද?;

4. භන්තෙ, ස්වාමීනි; න මෙ ඛමනීයං, මට ඉවසිය නො හැක්කේ ය; න යාපනීයං, ඉරියව් පැවැත්විය නො හැක්කේ ය; මෙ, මගේ; බාළ්හාදුක්ඛා වෙදනා, බලවත් දුක් වේදනාවෝ; අභික්කමන්ති, වැඩෙත්; නො පටික්කමන්ති, නොබසිත්; අභික්කමොසානං පඤ්ඤායති, වැඩෙන මග පෙනෙයි; නො පටික්කමොති, බස්නා මග නො පෙනෙයි.

5. මොග්ගල්ලාන, මොග්ගල්ලානය; ඉමෙ සත්ත බොජ්ඣංගා, මේ සප්ත බෞධ්‍යංග ධර්මයෝ; මයා, මා විසින්; සම්ම දක්ඛාතා, මොනවට කියන ලදහ; භාවිතා, භාවිතයහ; බහුලීකතා, බහුල වශයෙන් කරන ලදහ; අභිඤ්ඤාය, සත්‍යය ප්‍රතිවේධය පිණිස; සම්බොධාය, මනා අවබෝධය පිණිස; නිබ්බාණාය, නිවන් පිණිස; සංවත්තන්ති, පවතිත්; කතමෙ සත්ත?, ඒ සත කවරහු ද යත්?

6. මොග්ගල්ලාන, මෞද්ගල්‍යායනය; සතිසම්බොජ්ඣංගො ඛො, සතිසම්බොධ්‍යංගය; මයා, මා විසින්; සම්ම දක්ඛාතො, මනාව කියන ලදී; භාවිතො, භාවිතය; බහුලීකතො, බහුලී කෘතය; අභිඤ්ඤාය, අභිඥාව පිණිස; සම්බොධාය, මනා අවබොධය පිණිස; නිබ්බාණාය, නිවන් පිණිස; සංවත්තති, පවති යි.

7. මොග්ගල්ලාන, මෞද්ගල්‍යායනය; ධම්ම විචය සම්බොජ්ඣංගො ඛො, ධම්ම විචය සම්බොධ්‍යාංගය වනාහි; මයා, මා විසින්; සම්මදක්ඛාතො; මනාව කියන ලදි; භාවිතො, භාවිතය; බහුලීකතො, බහුල වශයෙන් කරන ලදී; අභිඤ්ඤාය, සත්‍යය ප්‍රතිවේධය පිණිස; සම්බොධාය, මනා අවබෝධය පිණිස; නිබ්බාණාය, නිවන් පිණිස; සංවත්තති, පවති යි.

Non-Commercial Distribution

8. මොග්ගල්ලාන, මෞද්ගල්‍යායනය; විරිය සම්බොජ්ඣංගො බො, විරිය සම්බොධ්‍යාංගය වනාහි; මයා, මා විසින්; සම්මදක්ඛාතො; මනාකොට කියන ලදි; භාවිතො, භාවිතා කරන ලදි; බහුලීකතො, බහුල වශයෙන් පුරුදු කරන ලදි; අභිඤ්ඤාය, සත්‍යය ප්‍රතිවේධය පිණිස; සම්බොධාය, මනා අවබෝධය පිණිස; නිබ්බාණාය, නිවන් පිණිස; සංවත්තති, පවති යි.

9. මොග්ගල්ලාන, මෞද්ගල්‍යායනය; පීති සම්බොජ්ඣංගො බො, ප්‍රීති සම්බොධ්‍යාංගය වනාහි; මයා, මා විසින්; සම්මදක්ඛාතො; මනාකොට කියන ලදි; භාවිතො, භාවිතා කරන ලදි; බහුලීකතො, බහුල වශයෙන් පුරුදු කරන ලදි; අභිඤ්ඤාය, සත්‍යය ප්‍රතිවේධය පිණිස; සම්බොධාය, මනා අවබෝධය පිණිස; නිබ්බාණාය, නිවන් පිණිස; සංවත්තති, පවති යි.

10. මොග්ගල්ලාන, මෞද්ගල්‍යායනය; පස්සද්ධි සම්බොජ්ඣංගො බො, පස්සද්ධි සම්බොධ්‍යාංගය වනාහි; මයා, මා විසින්; සම්මදක්ඛාතො; මනාකොට කියන ලදි; භාවිතො, භාවිතා කරන ලදි; බහුලීකතො, බහුල වශයෙන් පුරුදු කරන ලදි; අභිඤ්ඤාය, සත්‍යය ප්‍රතිවේධය පිණිස; සම්බොධාය, මනා අවබෝධය පිණිස; නිබ්බාණාය, නිවන් පිණිස; සංවත්තති, පවති යි.

11. මොග්ගල්ලාන, මෞද්ගල්‍යායනය; සමාධි සම්බොජ්ඣංගො බො, සමාධි සම්බොධ්‍යාංගය වනාහි; මයා, මා විසින්; සම්මදක්ඛාතො; මොනවට කියන ලදි; භාවිතො, භාවිතා කරන ලදි; බහුලීකතො, බහුල වශයෙන් පුරුදු කරන ලදි; අභිඤ්ඤාය, සත්‍යය ප්‍රතිවේධය පිණිස; සම්බොධාය, මනා අවබෝධය පිණිස; නිබ්බාණාය, නිවන් පිණිස; සංවත්තති, පවති යි.

12. මොග්ගල්ලාන, මෞද්ගල්‍යායනය; උපෙක්ඛා සම්බොජ්ඣංගො බො, උපෙක්ඛා සම්බොජ්ඣංගය වනාහි; මයා, මා විසින්; සම්ම දක්ඛාතො; මොනවට කියන ලදි; භාවිතො, භාවිතා කරන ලදි; බහුලීකතො, බහුල වශයෙන් කරන ලදී; අභිඤ්ඤාය, සත්‍යය ප්‍රතිවේධය පිණිස; සම්බොධාය, මනා අවබෝධය පිණිස; නිබ්බාණාය, නිවන් පිණිස; සංවත්තති, පවති යි.

13. මොග්ගල්ලාන, මෞද්ගල්‍යායනය; ඉමෙ බො සත්තබොජ්ඣංගා, මේ සප්ත බොජ්ඣංගයෝ වනාහි; මයා, මා විසින්; සම්මදක්ඛාතා; මොනවට කියන ලදහ; භාවිතා, භාවිතා කරන ලදහ; බහුලීකතා, බහුල වශයෙන් කරන ලදහ; අභිඤ්ඤාය, සත්‍යය ප්‍රතිවේධය පිණිස; සම්බොධාය, මනා අවබෝධය පිණිස; නිබ්බාණාය, නිවන් පිණිස; සංවත්තන්ති, පවතිත්.

14. භගවා, භාග්‍යවතුන් වහන්ස; බොජ්ඣංගා, බොජ්ඣංග ධර්මයෝ; තග්ඝ, මැනව; සුගත, සුගතයන් වහන්ස; බොජ්ඣංගා, බොජ්ඣංග ධර්මයෝ; තග්ඝ ඉති, මැනව'යි මුගලන් තෙරහු දැක්වූහ.

15. භගවා, භාග්‍යවතුන් වහන්සේ; ඉදං අවොච, මෙය වදාළ සේක; අත්තමනො, සතුටු සිත් ඇති; ආයස්මා, ආයුෂ්මත් වූ; මහා මොග්ගල්ලානො, මහා මෞද්ගල්‍යාන තෙමෙ; භගවතො, භාග්‍යවතුන් වහන්සේ ගේ; භාසිතං, දේශනාවට; අභිනන්දි, කැමැති විය.

16. ආයස්මා මහා මොග්ගල්ලානො, ආයුෂ්මත් මහා මෞද්ගල්‍යාන තෙමේ; තම්හා ආබාධා, ඒ ආබාධයෙන්; වුට්ඨාහි ච, නැගිටියේ ම ය; ආයස්මතො මහා මොග්ගල්ලානස්ස, ආයුෂ්මත් මහා මුගලන් ස්ථවිරයන් වහන්සේ ගේ; සො ආබොධො, ඒ ආබාධය; තථා, එසේ ම; පහීනො ච අහොසි ඉති, පහවී ගියේ ය.

**මහා මොග්ගල්ලානත්ථෙර බොජ්ඣඞ්ග ය යි.**

Non-Commercial Distribution

# මහාචුන්දත්ථෙර බොජ්ඣඞ්ග පරිත්තං

## මහාචුන්දත්ථෙර බොජ්ඣඞ්ග පිරිත.

1. මෙ, මා විසින්; එවං සුතං, මෙසේ අසන ලදී. එකං සමයං, එක් සමයෙක; භගවා, භාග්‍යවතුන් වහන්සේ; රාජගහෙ, රජගහ නුවර; කලන්දක නිවාපෙ, කලන්දක නිවාප නම් වූ; වෙළුවනෙ, වෙළුවන මහා විහාරයෙහි; විහරති, වැඩ වසන සේක; තෙන ඛො පන සමයෙන, එසමයෙහි වනාහි; භගවා, භාග්‍යවත් තෙම; ආබාධිකො, හටගත් ආබාධ ඇත්තේ; දුක්ඛිතො, දුක්ඛිත වූයේ; බාළ්හගිලානො හොති, දැඩි ගිලන් වූයේ වෙයි.

2. අථ ඛො, ඉක්බිති; ආයස්මා මහා චුන්දො, ආයුෂ්මත් මහා චුන්ද තෙම; සායණ්හ සමයං, සවස් කාලයෙහි; පතිසල්ලානා, එල සමවතින්; වුට්ඨිතො, නැගී සිටියේ; භගවා, භාග්‍යවතුන් වහන්සේ; යෙන, යම් තැනෙක ද; තෙන, එතැනට: උපසංකමි, එළඹියේ ය; උපසංකමිත්වා, එළඹ; භගවන්තං, භාග්‍යවතුන් වහන්සේට; අභිවාදෙත්වා, වැඳ; එකමන්තං, එකත්පසෙක; නිසීදි, හුන්නේ ය; එකමන්තං නිසින්නං ඛො, එකත් පසෙක හුන්නා වූ; ආයස්මන්තං මහා චුන්දං, ආයුෂ්මත් මහා චුන්ද ස්ථවිරයන් වහන්සේට; භගවා, භාග්‍යවතුන් වහන්සේ; එතං අවොච, මෙය වදාළ සේක; චුන්ද, චුන්දය; බොජ්ඣංගා, බොජ්ඣංග ධර්මයෝ; තං, තොපට; පටිභන්තු, වැටහෙත්වා.

3. භන්තෙ, වහන්ස; ඉමෙ සත්ත බොජ්ඣංගා, මේ සප්ත බොජ්ඣංගයෝ; භගවතා, භාග්‍යවතුන් වහන්සේ විසින්; සම්මදක්ඛාතා, මනාකොට කියන ලද්දා හ; භාවිතා, භාවිතා කරන ලදහ; බහුලීකතා, බහුල වශයෙන් භාවිතා කරන ලදහ; අභිඤ්ඤාය, සත්‍යය ප්‍රතිවේධය පිණිස; සම්බොධාය, මනා අවබෝධය පිණිස; නිබ්බාණාය, නිවන් පිණිස; සංවත්තන්ති, පවතිත්; කතමෙ සත්ත?, කවර සත් බොධ්‍යංගයෝ ද යත්?

4. භන්තෙ, වහන්ස; සතිසම්බොජ්ඣංගො ඛො, සතිසම්බොධ්‍යංගය වනාහි; භගවතා, භාග්‍යවතුන් වහන්සේ විසින්; සම්මදක්ඛාතො, මනාකොට කියන ලදී; භාවිතො, භාවිතා කරන ලදී; බහුලීකතො, බහුලී කෘත ය; අභිඤ්ඤාය, සත්‍යය ප්‍රතිවේධය පිණිස; සම්බොධාය, මනා අවබෝධය පිණිසː නිබ්බාණාය, නිවන් පිණිස; සංවත්තති, පවති යි.

5. භන්තෙ, වහන්ස; ධම්මවිචය සම්බොජ්ඣංගො ඛො, ධම්මවිචය සම්බොධ්‍යඞ්ගය වනාහි; භගවතා, භාග්‍යවතුන් වහන්සේ විසින්; සම්මදක්ඛාතො, මනාකොට කියන ලදි; භාවිතො, භාවිතා කරන ලදි; බහුලීකතො, බහුල වශයෙන් කරන ලදි; අභිඤ්ඤාය, සත්‍යය ප්‍රතිවේධය පිණිස; සම්බොධාය, සම්බෝධිය පිණිස; නිබ්බාණාය, නිවන් පිණිස; සංවත්තති, පවති යි.

6. භන්තෙ, වහන්ස; විරිය සම්බොජ්ඣංගො ඛො, විරිය සම්බොධ්‍යඞ්ගය වනාහි; භගවතා, භාග්‍යවතුන් වහන්සේ විසින්; සම්මදක්ඛාතො, මනාකොට කියන ලදි. භාවිතො, භාවිතා කරන ලදි; බහුලීකතො, බහුල වශයෙන් කරන ලදි; අභිඤ්ඤාය. සත්‍යය ප්‍රතිවේධය පිණිස; සම්බොධාය, සම්බෝධිය පිණිස; නිබ්බාණාය, නිවන් පිණිස; සංවත්තති, පවති යි.

7. භන්තෙ, වහන්ස; පීතිසම්බොජ්ඣංගො ඛො, ප්‍රීති සම්බොධ්‍යඞ්ගය වනාහි; භගවතා, භාග්‍යවතුන් වහන්සේ විසින්; සම්මදක්ඛාතො, මනාකොට කියන ලදි; භාවිතො, භාවිතා කරන ලදි; බහුලීකතො, බහුල වශයෙන් කරන ලදී; අභිඤ්ඤාය, සත්‍යය ප්‍රතිවේධය පිණිස; සම්බොධාය, සම්බෝධිය පිණිස; නිබ්බාණාය, නිවන් පිණිස; සංවත්තති, පවති යි.

Non-Commercial Distribution

8. භන්තෙ, වහන්ස; පස්සද්ධි සම්බොජ්ඣංගො ඛො, පස්සධි සම්බොජ්ඣංගය වනාහි; භගවතා, භාග්‍යවතුන් වහන්සේ විසින්; සම්මදක්ඛාතො, මනාකොට කියන ලදී; භාවිතො, භාවිතා කරන ලදි; බහුලීකතො, බහුලී කෘත ය; අභිඤ්ඤාය, අභිඥාව පිණිස; සම්බොධාය, සම්බෝධිය පිණිස; නිබ්බාණාය, නිවන් පිණිස; සංවත්තති, පවති යි.

9. භන්තෙ, වහන්ස; සමාධි සම්බොජ්ඣංගො ඛො, සමාධි සම්බොධ්‍යඞ්ගය වනාහි; භගවතා, භාග්‍යවතුන් වහන්සේ විසින්; සම්මදක්ඛාතො, මනාකොට කියන ලදි; භාවිතො, භාවිතා කරන ලදී; බහුලීකතො, බහුල වශයෙන් කරන ලදි; අභිඤ්ඤාය, අභිඥාව පිණිස; සම්බොධාය, සම්බෝධිය පිණිස; නිබ්බාණාය, නිවන් පිණිස; සංවත්තති, පවති යි.

10. භන්තෙ, වහන්ස; උපෙක්ඛා සම්බොජ්ඣංගො ඛො, උපෙක්ඛා සම්බොධ්‍යඞ්ගය වනාහි; භගවතා, භාග්‍යවතුන් වහන්සේ විසින්; සම්මදක්ඛාතො, මනාකොට කියන ලදි; භාවිතො, භාවිතා කරන ලදී; බහුලීකතො, බහුලී කෘතය; අභිඤ්ඤාය, අභිඥාව පිණිස; සම්බොධාය, සම්බෝධිය පිණිස; නිබ්බාණාය, නිවීන් පිණිස; සංවත්තති, පවති යි.

11. භන්තෙ, ස්වාමීන් වහන්ස; ඉමෙ ඛො සත්ත බොජ්ඣංගා, මේ සත්ත බොධ්‍යංගයෝ වනාහි; භගවතා, භාග්‍යවතුන් වහන්සේ විසින්; සම්මදක්ඛාතා, මනාකොට කියන ලදහ; භාවිතා, භාවිතය හ; බහුලීකතා, බහුලී කෘතය හ; අභිඤ්ඤාය, අභිඥාව පිණිස; සම්බොධාය, සම්බෝධිය පිණිස; නිබ්බාණාය, නිවන් පිණිස; සංවත්තන්ති, පවතිත්.

12. චුන්ද, චුන්දය; බොජ්ඣංගා, බොධ්‍යංග ධර්මයෝ; තග්ඝ, මැනව; චුන්ද, චුන්දය; බොජ්ඣංගා, බොධ්‍යංග ධර්මයෝ; තග්ඝ ඉති, මැනව යනුයි.

13. ආයස්මා මහා චුන්දො, ආයුෂ්මත් මහා චුන්ද ස්ථවිර තෙම; ඉදං අවොච, මෙය වදාළේ ය. සත්ථා, ශාස්තෘන්වහන්සේ; සමනුඤ්ඤො අහොසි, මනාකොට අනුදැන වදාළ හ; භගවා, භාග්‍යවතුන්වහන්සේ; තම්හා ආබාධා, ඒ ආබාධයෙන්; වුට්ඨාහී ච, නැගී සිටි සේක් ම ය; භගවතා, භාග්‍යවතුන් වහන්සේ ගේ; සො ආබාධො, ඒ ආබාධය; තථා පහී නො ච අහොසි, එයින් ම ප්‍රහීන වී ගියේ ම ය.

මහා චුන්දත්ථෙර බොජ්ඣඞ්ග ය යි.

## ගිරිමානන්ද සුත්තං. — ගිරිමානන්ද සූත්‍රය.

1. මෙ, මා විසින්; එවං සුතං, මෙසේ අසන ලදී. එකං සමයං, එක් සමයෙක; භගවා, භාග්‍යවතුන් වහන්සේ; සාවත්ථියං, සැවත් නුවර; ජෙතවනෙ, ජේතවනයෙහි වූ; අනාථපිණ්ඩිකස්ස, අනේපිඬු මහ සිටුහු ගේ; ආරාමෙ, ආරාමයෙහි; විහරති, වැඩ වසන සේක; තෙන ඛො පන සමයෙන, එ සමයෙහි වනාහි; ආයස්මා ගිරිමානන්දො, ආයුෂ්මත් ගිරිමානන්ද ස්ථවිර තෙම; ආබාධිකො, ආබාධ ඇති වූයේ; දුක්ඛිතො, දුඃඛිත වූයේ; බාළ්හගිලානො හොති, දැඩි ගිලන් වූයේ වෙයි.

2. අථ ඛො, ඉක්බිති; ආයස්මා ආනන්දො, ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙම; භගවා, භාග්‍යවතුන් වහන්සේ; යෙන, යම් තැනෙක ද?; තෙන, එතැනට; උපසංකමි, එළඹියේ ය; උපසංකමිත්වා, එසේ එළඹ; භගවන්තං, බුදුරදුන්; අභිවාදෙත්වා, වැඳ; එකමන්තං, එකත්පසෙක; නිසීදි, හුන්නේ ය; එකමන්තං, එකත්පසෙක; නිසින්නො ඛො, හුන්නාවූ ම; ආයස්මා ආනන්දො, ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙම; භගවන්තං, භාග්‍යවතුන් වහන්සේට; එතදවොච, මෙය කීයේ ය;

Non-Commercial Distribution

3. භන්තෙ, වහන්ස; ආයස්මා ගිරිමානන්දො, ආයුෂ්මත් ගිරිමානන්ද ස්ථවිර තෙම; ආබාධිකො, ආබාධයෙන් යුක්ත ය; දුක්ඛිතො, දුඃඛිත ය; බාළ්හගිලානො, ඇඩි සේ ගිලන් වූයේ වෙයි.

4. භන්තෙ, ස්වාමීනි; භගවා, භාග්‍යවතුන් වහන්සේ; ආයස්මා ගිරිමානන්දො, ආයුෂ්මත් ගිරිමානන්ද ස්ථවිර තෙම; යෙන, යම් තැනෙක වෙසේද?; තෙන, එතැනට; අනුකම්පං උපාදාය, අනුකම්පා පිණිස; උපසංකමතු සාධු, එළඹෙන සේක් නම් මැනවි; ආනන්ද, ආනන්දය; සචෙ ඛො, ඉදින් වනාහි; ත්වං, තෝ; ගිරිමානන්දස්ස භික්ඛුනො, ගිරිමානන්ද භික්ෂූහු ගේ සමීපයට; උපසංකමිත්වා, එළඹ; දසසඤ්ඤා, දශසංඥාවන්; සාධු භාසෙය්‍යාසි, කියන්නෙහි නම් මැනවි; දසසඤ්ඤා සුත්වා, දසසංඥාවන් අසා; ගිරිමානන්දස්ස භික්ඛුනො, ගිරිමානන්ද භික්ෂූහුගේ; සො ආබාධො, ඒ ආබාධය; ඨානසො පටිප්පස්සම්භෙය්‍ය, වහා සංසිඳෙන්නේ ය; ඒ රෝගය සංසිඳීමට එය කාරණයක් ද වෙයි; කතමෙ දශ?, කවර දසසංඥාවක් ද යත්?

5. අනිච්ච සඤ්ඤා, අනිත්‍ය සංඥා ය; අනත්ත සඤ්ඤා, අනාත්ම සංඥා ය; අසුබ සඤ්ඤා, අසුබ සංඥා ය; ආදීනව සඤ්ඤා, ආදීනව සංඥා ය; පහාණ සඤ්ඤා, ප්‍රහාණ සංඥා ය; විරාග සඤ්ඤා, විරාග සංඥා ය; නිරොධ සංඤ්ඤා නිරෝධ සංඥා ය; සබ්බලෝකෙ අනභිරත සඤ්ඤා, සියලු ලෝකයෙහි අනභිරත සංඥා ය; සබ්බ සංඛාරෙසු, අනිච්ච සංඥා, සියලු සංස්කාරයන් කෙරෙහි අනිත්‍ය සංඥා ය; ආනාපාන සති, ආනාපාන සතිය යනු යි.

6. ආනන්ද, ආනන්දය; අනිච්ච සඤ්ඤා, අනිත්‍ය සංඥාව; කතමා ච?; කවරීද ?; ආනන්ද, ආනන්දය; ඉධ, මේ සස්නෙහි; භික්ඛු, මහණතෙම; අරඤ්ඤගතොවා, ආරණ්‍යගත වූයේ හෝ; රුක්ඛමූල ගතො වා, රුක්මුලකට ගියේ හෝ; සුඤ්ඤාගාර ගතො වා, ශුන්‍යාගාරයකට ගියේ හෝ; ඉති පටිසංචික්ඛති, මෙසේ නුවණින් සලකයි; රූපං අනිච්චං, රූපස්කන්ධය අනිත්‍ය ය; වෙදනා අනිච්චා, වේදනාස්කන්ධය අනිත්‍ය ය; සඤ්ඤා අනිච්චා, සංඥාස්කන්ධය අනිත්‍ය ය; සංඛාරා අනිච්චා, සංස්කාරස්කන්ධය අනිත්‍ය ය; විඤ්ඤාණං අනිච්චං ඉති, විඤ්ඤාණස්කන්ධය අනිත්‍යය කියායි; ඉති, මෙසේ; ඉමෙසු පඤ්චසු උපාධානක්ඛන්ධෙසු, මේ උපාදානස්කන්ධ පඤ්චකයෙහි; අනිච්චානුපස්සි විහරති, අනිත්‍ය ලක්ෂණය නැවත නැවත බලමින් වෙසෙයි; ආනන්ද, ආනන්දය; අයං; මේ අනිච්චසඤ්ඤා, අනිත්‍ය සංඥාය'යි; වුච්චති, කියනු ලැබේ.

7. ආනන්ද, ආනන්දය; අනත්තසඤ්ඤා, අනාත්ම සංඥාව; කතමා ච? කවරී ද?.

ආනන්ද, ආනන්දය; ඉධ, මේ සසුන්හි; භික්ඛු, මහණතෙම; අරඤ්ඤගතො වා, අරණ්‍යගත වූයේ හෝ; රුක්ඛමූලගතො වා, රුක්මුලකට ගියේ හෝ; සුඤ්ඤාගාර ගතො වා, ශුන්‍යාගාර ගත වූයේ හෝ; ඉති, මෙසේ; පටිසංචික්ඛති, නුවණින් සිතයි; චක්ඛුං අනත්තා, ඇස අනාත්ම ය; රූපං අනත්තා, රූපය අනාත්ම ය; සද්දා අනත්තා, ශබ්දයෝ අනාත්මය; ඝාණං අනත්තා, නාසය අනාත්මය; ගන්ධා අනත්තා, ගන්ධයෝ අනාත්ම ය; ජිව්හා අනත්තා, දිව අනාත්ම ය; රසො අනත්තා, රසයෝ අනාත්ම ය හ; කායෝ අනත්තා, කය අනාත්ම ය; පොට්ඨබ්බා අනත්තා, ස්පර්ශයෝ අනාත්ම ය හ; මනො අනත්තා, මනස අනාත්ම ය; ධම්මා අනත්තා, ධර්මයෝ අනාත්ම ය හ; ඉති, යනුයි.

ඉති, මෙසේ; අජ්ඣත්තික බාහිරෙසු, ආධ්‍යාත්මික වූ ද, බාහිර වූ ද; ඉමෙසු ඡසු ආයතනෙසු, මේ ෂඩායතනයන් කෙරෙහි; අනත්තානු පස්සි විහරති, අනාත්ම ලක්‍ෂණ අනුව බලමින් වාසය කෙරෙයි; ආනන්ද, ආනන්දය; අයං වුච්චති අනත්ත සඤ්ඤා, මේ අනාත්ම සංඥාය යි කියනු ලැබේ.

8. ආනන්ද, ආනන්දය; අසුභ සඤ්ඤා, අශුභ සංඥාව; කතමා ච?, කවරී ද?; ආනන්ද, ආනන්දය; ඉධ, මේ සසුන්හි; භික්ඛු, මහණතෙම; උද්ධං පාදතලා, පත්ලෙන් උඩ; අධො කෙසමත්ථකා, කෙස්

Non-Commercial Distribution

මතුයෙන් යට; තචපරියන්තං, සම කෙළවර කොට ඇති; ඉමමෙවකායං, මේ ශරීරය ම; නානප්පකාරස්ස, නානාප්‍රකාර වූ; අසුචිනො පූරං, අසූචියෙන් පිරුණේය යි; පච්චවෙක්ඛති, ප්‍රත්‍යවේක්ෂා කෙරේද?; ඉමස්මිං කායෙ, මේ ශරීරයෙහි; කෙසා, කේසයෝ ය; ලොමා, ලෝමයෝ ය; නඛා, නිය ය; දන්තා, දත් ය; තචො, සම ය; මංසං, මස් ය; නහාරු, නහර ය; අට්ඨී, ඇට ය; අට්ඨී මිඤ්ජා, ඇට මිදුලු ය; වක්කං, වකුගඩු ය; හදයං, හෘදය මාංශ ය; යකනං, අක්මාව ය; කිලොමකං, දලබුව ය; පිහකං, බඩදිව ය; පප්ඵාසං, පපුව ය; අන්තං, බඩවැල ය; අන්තගුණං, අතුනුබහන ය; උදරියං, අමු අහර ය; කරිසං, මල ය; පිත්තං, පිත ය; සෙම්හං, සෙම ය; පුබ්බො, පූයා ය; ලොහිතං, ලේ ය; සෙදො, ඩහදිය ය; මෙදෙ, මේද තෙල ය; අස්සු, කඳුළු ය; වසා, වුරුණු තෙල ය; ඛෙලො, කෙළ ය; සිංඝාණිකා, මුකුණු ය; (සොටු ය) ලසිකා, සඳමිදුලු ය; මුත්තං ඉති, මූත්‍ර ය යන මොහු මේ ශරීරයෙහි ඇත්තාහු ය'යි; ඉති, මෙසේ; ඉමස්මිං කායෙ, මේ ශරීරයෙහි; අසුභානුපස්සි, අසුභය අනුව බලමින්; විහරති, වාසය කෙරෙයි.

9. ආනන්ද, ආනන්දය; ආදීනව සඤ්ඤා කතමා ච?, ආදීනව සඤ්ඤාව කවරී ද?; ආනන්ද, ආනන්දය; ඉධ මේ සසුනෙහි; භික්ඛු, මහණතෙම; අරඤ්ඤගතො වා, අරණ්‍ය ගතවූයේ හෝ; රුක්ඛමූලගතො වා, රුක්මුලකට ගියේ හෝ; සුඤ්ඤාගාරගතො වා, ශුන්‍යාගාර ගතවූයේ හෝ; ඉති, මෙසේ; පටිසංචික්ඛති, නුවණින් සිතයි; අයං කායො, මේ ශරීරය තෙම; බහුදුක්ඛො ඛො, බොහෝ දුක් ඇත්තේ වෙයි; බහු ආදීනවො, බොහෝ ආදීනව ඇත්තේ වෙයි; ඉති, මෙසේ; ඉමස්මිං කායෙ, මේ ශරීරයෙහි; විවිධා ආබාධා, බොහෝ ආබාධයෝ; උප්පජ්ජන්ති, උපදිති; සෙය්‍යථීදං?, ඒ කවරහුද යත්?; චක්ඛු රොගො, ඇස් රෝගය ද; සොත රොගො, කණී රෝගය ද; ඝාණ රොගො, නාසිකා රෝගය; ජිව්හා රොගො, දිවේ ඇතිවන රෝගය; කාය රොගො, කයෙහි ඇතිවන රෝග ය; සීස රොගො, හිසෙහි ඇතිවන රෝගය; කණ්ණ රොගො, කණී මූලයෙහි ඇතිවන රෝග ය; මුඛ රොගො, මුඛයෙහි ඇතිවන රෝගය; දන්ත රොගො, දන්ත රෝගය; කාසො, කාස ය; සාසො, ස්වාස ය; පිනාසො, පීනස ය; ඩහො, ඇවිල්ල ය; ජරො, උණ ය; කුච්ඡි රොගො, උදර රෝගය; මුච්ඡා, මූර්ජාව; පක්ඛන්දිකා, අතීසාරය; සූලා, ඉදිමීම ය; විසූචිකා, විසූචිකා ය; කුට්ඨං, කුෂ්ඨ ය; ගණ්ඩො, ගඩු ය; කිලාසො, කිලාස ය; සොසො, සෝස ය; අපමාරො, අපස්මාරය; දද්දු, දද ය; කණ්ඩු, කන්ඩුති ය; කච්ඡු, කච්ඡු නම් වූ කුෂ්ඨ රෝග ය; රඛසා, නියෙන් කැසූ තැන වන රෝග ය; විතච්ඡිකා, විචර්චිකා නම් වූ කුෂ්ඨ රෝග ය; ලොහිත පිත්තං, රත් පිත ය; මධුමෙහො, මධුමෙහ ය; අංසා, අංශ රෝග ය; පිළිකා, පිළිකා ය; භගන්දලා, භගන්දලා ය; පිත්ත සමුට්ඨානා ආබාධා, පිතෙන් ඇතිවන රෝග ය; සෙම්හ සමුට්ඨානා ආබාධා, සෙමෙන් හට ගන්නා රෝග ය; වාත සමුට්ඨානා ආබාධා, වාතයෙන් හට ගන්නා රෝග ය; සන්නිපාතිකා ආබාධා, තුන් දොසින් වන රෝග ය; උතුපරිණාමජා ආබාධා, ඍතු පෙරළියෙන් ඇතිවන රෝග ය; විසමපරිහාරජා ආබාධා, විෂම පරිහාරයෙන් ඇතිවන රෝග ය; ඔපක්කමිකා ආබාධා, උපක්‍රමයෙන් වන රෝග ය; කම්මවිපාකජා ආබාධා, කර්ම විපාකයෙන් වන රෝග ය; සීතං, සීත ය; උණ්හං, උෂ්ණය; ජිඝච්ඡා, ක්ෂුධා ය; පිපාසා, පිපාස ය; උච්චාරො, අහර මල ය; පස්සාවො'ති, පස්සාව ය යි (මුත්‍රය); ඉති, මෙසේ; ඉමස්මිං කායෙ, මේ සිරුරෙහි; ආදීනවානුපස්සී, ආදීනව අනුව බලමින්; විහරති, වෙසෙයි; ආනන්ද, ආනන්දය; අයං, මේ; ආදීනව සඤ්ඤා වුච්චති, ආදීනව සංඥාවය යි කියනු ලැබේ.

10. ආනන්ද, ආනන්දය; පහාන සඤ්ඤා, ප්‍රහාණ සඤ්ඤාව; කතමා ච?, කවරී ද?; ආනන්ද, ආනන්දය; ඉධ, මේ සස්නෙහි; භික්ඛු, මහණතෙම; උප්පන්නං කාම විතක්කං, උපන් කාම විතර්කය; නාධි වාසෙති, නො ඉවසා ද; පජහති, අත්හරී ද; විනොදෙති, දුරු කෙරේ ද; බ්‍යන්ති කරොති නැති කෙරේ ද; අනභාවං ගමෙති, අභාවයට පමුණුවා ද; උප්පන්නං ව්‍යාපාද විතක්කං, උපන් ව්‍යාපාද

විතර්කය; නාධි වාසෙති, නො ඉවසා ද; පජහති, අත්හරී ද; විනොදෙති, දුරු කෙරේ ද?; බ්‍යන්ති කරොති, නැති කෙරේ ද?; අනභාවං ගමෙති, අභාවයට පමුණුවා ද; උප්පන්නං විහිංසා විතක්කං, උපන්නා වූ විහිංසා විතර්කය; නාධි වාසෙති, නො ඉවසා ද; පජහති, අත්හරී ද; විනොදෙති, දුරු කෙරේ ද; බ්‍යන්ති කරොති, නැති කෙරේ ද?; අනභාවං ගමෙති, අභාවයට පමුණුවා ද; උප්පන්නුප්පන්නෙ, උපනුපන්; පාපකෙ අකුසලෙ ධම්මෙ, පවිටු අකුසල ධර්මයන්; නාධි වාසෙති, නො ඉවසා ද; පජහති, අත්හරී ද; විනොදෙති, දුරු කෙරේ ද; බ්‍යන්ති කරොති, නැති කෙරේ ද; අනභාවං ගමෙති, අභාවයට පමුණුවා ද?; ආනන්ද, ආනන්දය; අයං වුච්චති පහාණ සඤ්ඤා, මේ ප්‍රහාන සඤ්ඤා'යි කියනු ලැබේ.

11. ආනන්ද, ආනන්දය; විරාග සඤ්ඤා, විරාග සංඥාව; කතමා ච?, කවරී ද?; ආනන්ද, ආනන්දය; ඉධ, මේ සසුනෙහි; භික්ඛු, මහණතෙම; අරඤ්ඤගතො වා, අරණ්‍ය ගතවූයේ හෝ; රුක්ඛමූලගතො වා, වෘක්‍ෂ මූලයකට ගියේ හෝ; ඉති පටිසංචික්ඛති, මෙසේ සිතයි; එතං සන්තං, මේ ශාන්ත ය; එතං පණීතං, මේ ප්‍රණීත ය; යදිදං, යම් මේ; සබ්බ සංඛාර සමථො, සියලු සංස්කාරයන්ගේ සංසිඳී ම ය; සබ්බූපධිපටිනිස්සගො, සියලු කෙලෙසුන් දුරලීම ය; තණ්හක්ඛයො, තෘෂ්ණාව ක්ෂය කිරීම ය; විරාගො, නො ඇලීම ය; නිබ්බාණන්ති, නිර්වාණය යනු යි; ආනන්ද, ආනන්ද ය; අයං වුච්චති විරාග සඤ්ඤා, මේ විරාග සංඥාව යි කියනු ලැබේ.

12. ආනන්ද, ආනන්දය; නිරොධ සඤ්ඤා කතමා ච?, නිරෝධ සංඥා නම් කවරී ද යත්?; ආනන්ද, ආනන්දයඃ ඉධ, මේ සසුනෙහි; භික්ඛු, මහණතෙම; අරඤ්ඤගතො වා, අරණ්‍යගත වූයේ හෝ; රුක්ඛමූලගතො වා, වෘක්ෂ මූලයකට ගියේ හෝ; සුඤ්ඤාගාරගතො වා, ශූන්‍යාගාරයකට ගියේ හෝ; ඉති පටිසංචික්ඛති, මෙසේ සිතයි; එතං සන්තං, මේ ශාන්ත ය; එතං පණීතං, මේ ප්‍රණීත ය; යද්දිං, යම් මේ; සබ්බ සංඛාර සමථො, සියලු සංස්කාරයන්ගේ සංසිඳී ම ය; සබ්බූපධිපටිනිස්සග්ගො, සියලු කෙලෙසුන් දුරලීම ය; තණ්හක්ඛයො, තෘෂණාව ක්‍ෂය කිරීම ය; නිරොධො, නිරෝධ ය; නිබ්බාණන්ති, නිර්වානය යනුයි; ආනන්ද, ආනන්දය; අයං වුච්චති නිරොධ සඤ්ඤා, මෙය නිරෝධ සංඥව යයි කියනු ලැබේ.

13. ආනන්ද, ආනන්දය සබ්බ ලොකෙ අනභිරත සඤ්ඤා, මුලුලොව නො ඇලීමේ සංඥව; කතමා ච?, කවරී ද?; ආනන්ද, ආනන්දය; ඉධ, මේ සසුනෙහි; භික්ඛු, මහණතෙම; ලොකෙ, ලෝකයෙහි; යෙ උපායා, තෘෂ්ණා දෘෂ්ටි යයි කියන ලද යම් උපායයෝ වෙත් ද?; යෙ උපාදානා, යම් උපාදාන කෙනෙක් වෙත් ද?; චෙතසො, සිත පිළිබඳ; අධිට්ඨානාභිනිවෙසා, පිහිටියා වූ ශාස්වත නම් ලද අභිනිවෙසයෝ වෙත් ද; අනුසයො, අනුසය නම් ලද යම් වැදහෙව පැවැති කෙලෙස් වෙත් ද; තෙ පජහන්තො, ඔවුන් පහකරමින්; න උපාදින්තො, නො ගනිමින්; විරමති, නො ඇලේ ද; ආනන්ද, ආනන්දය; සබ්බ ලොකෙ, මුලු ලෙව්හි; අයං, මෙය; අනභිරතසඤ්ඤා, අනභිරත සඤ්ඤාය යි; වුච්චති, කියනු ලැබේ.

14. ආනන්ද, ආනන්දය; සබ්බ සංඛාරෙසු, සියලු සංස්කාර ධර්මයන්හි; අනිච්ච සඤ්ඤා, අනිත්‍ය සංඥව; කතමා ච?, කවරී ද?; ආනන්ද, ආනන්දය; ඉධ, මේ සසුනෙහි; භික්ඛු, මහණතෙම; සබ්බ සංඛාරෙහි, සියලු සංස්කාර ධර්මයන් කෙරෙන්; අට්ටියති, පීඩාවට පත් වේ ද; හරායති, ලජ්ජාවේ ද?; ජිගුච්ඡති, පිළිකුල් කෙරේ ද; ආනන්ද, ආනන්දය; අයං, මේ; සබ්බ සංඛාරෙසු, සියලු සංස්කාර ධර්මයන් කෙරෙහි; අනිච්ච සඤ්ඤා, අනිච්ච සංඥවය'යි කියනු ලැබේ.

15. ආනන්ද, ආනන්දය; ආනාපාන සති, ආනාපාන සතිය; කතමා ච?, කවරී ද?; ආනන්ද, ආනන්දය; ඉධ, මේ සසුනෙහි; භික්ඛු, මහණතෙම; අරඤ්ඤගතො වා, අරණ්‍යගත වූයේ හෝ; රුක්ඛමූලගතො වා, වෘක්ෂ මූලයකට ගියේ හෝ; සුඤ්ඤාගාරගතො වා, ශූන්‍යාගාරයකට ගියේ

Non-Commercial Distribution

හෝ; පල්ලකං ආභුජිත්වා, පලක් බැඳ; උජුං කායං පණිධාය, උඩුකය ඇද නැතිව මනාව පිහිටුවා ගෙන; පරිමුඛං සතිං උපට්ඨපෙත්වා, අරමුණෙහි සිහිය එළවා; නිසිදති, හිඳියි ද; සො, ඒ මහණතෙම; සතොව, සිහි ඇත්තේ ම; අස්ස සති, ආශ්වාස කෙරේ ද?; සතො, සිහි ඇත්තේ ම; පස්ස සති, ප්‍රශ්වාස කෙරේ ද?; දීඝං, දීර්ඝ කොට; අස්ස සන්තො, ආශ්වාස කරන්නේ හෝ; දීඝං, අස්ස සාමීති පජනාති, දීර්ඝ කොට ආශ්වාස කෙරෙමි'යි දන්නේ ය; දීඝං වා පස්ස සන්තො, දීර්ඝ කොට ප්‍රශ්වාස කරන්නේ හෝ; දීඝං පස්ස සාමි'ති, දීර්ඝ කොට ප්‍රශ්වාස කෙරෙමි'යි; පජනාති, දනියි; රස්සං වා අස්ස සන්තො, කෙටිව ආශ්වාස කරන්නේ හෝ; රස්සං අස්ස සාමීති පජනාති, ලුහුඬු කොට ආශ්වාස කෙරෙමි'යි දනියි; රස්සං වා පස්ස සන්තො, කෙටිව ප්‍රශ්වාස කරන්නේ හෝ; රස්සං පස්ස සාමි'ති පජනාති, ලුහුඬු කොට ප්‍රශ්වාස කෙරෙමි'යි දනියි; සබ්බකාය පටිසංවේදී, සියලු ආශ්වාස කය දන්නේ; අස්ස සාමීති, ආශ්වාස කෙරෙමි'යි; සික්ඛති, හික්මෙයි; සබ්බකාය පටිසංවේදී, සියලු ප්‍රශ්වාස කය දන්නේ; පස්ස සිස්සාමීති, ප්‍රශ්වාස කෙරෙමි'යි; සික්ඛති, හික්මෙයි.

කාය සංඛාරං, කාය සංස්කාරය හෙවත් ආශ්වාසය; පස්සංභයං, සංසිඳුවන්නෙමි; අස්සසාමි'ති, ආශ්වාස කෙරෙමි'යි; සික්ඛති, හික්මෙයි; කාය සංඛාරං, කාය සංස්කාරය හෙවත් ප්‍රශ්වාසය; පස්සංභයං, සංසිඳුවන්නෙමි; පස්සසිස්සාමි'ති, ප්‍රශ්වාස කෙරෙමි'යි; සික්ඛති, හික්මෙයි; පීති පටිසංවේදී, ප්‍රීතිය විඳිමින්; අස්සසිස්සාමි; ති, ආශ්වාස කෙරෙමි'යි; සික්ඛති, හික්මෙයි; පීතිපටිසංවේදී, ප්‍රීතිය විඳිමින්; පස්සසිස්සාමි'ති; ප්‍රශ්වාස කෙරෙමි'යි; සික්ඛති, හික්මෙයි; සුඛපටිසංවේදී, සුව විඳිමින්; අස්සසිස්සාමි'ති, ආශ්වාස කෙරෙමි'යි; සික්ඛති, හික්මෙයි; සුඛපටිසංවේදී, සුව විඳිමින්; පස්සසිස්සාමි'ති, ප්‍රශ්වාස කෙරෙමි'යි; සික්ඛති, හික්මෙයි; චිත්තසංඛාර පටිසංවේදී, චිත්ත සංස්කාරය විඳිමින්; අස්සසිස්සාමි'ති, ආශ්වාස කෙරෙමි'යි; සික්ඛති, හික්මෙයි; චිත්ත සංඛාර පටිසංවේදී, චිත්ත සංස්කාරය විඳිමින්; පස්සසිස්සාමි'ති, ප්‍රශ්වාස කෙරෙමි'යි; සික්ඛති, හික්මෙයි.

චිත්ත සංඛාරං, චිත්ත සංස්කාරය; පස්සම්භයං, සංසිඳු වන්නෙමි; අස්සසිස්සාමි'ති, ආශ්වාස කෙරෙමි'යි; සික්ඛති, හික්මෙයි; චිත්ත සංඛාරං චිත්ත සංස්කාරය; පස්සම්භයං, සංසිඳු වන්නෙමි; පස්සසිස්සාමි'ති, ප්‍රශ්වාස කෙරෙමි'යි; සික්ඛති, හික්මෙයි; චිත්තපටිසංවේදී, සිත් පහළ කෙරෙමින්; අස්සසිස්සාමි'ති ආශ්වාස කෙරෙමි'යි; සික්ඛති, හික්මෙයි.

චිත්ත පටිසංවේදි, සිත් පහළ කෙරෙමින්; පස්සසිස්සාමි'ති, ප්‍රශ්වාස කෙරෙමි'යි; සික්ඛති, හික්මෙයි; අධිප්පමොදයං චිත්තං, සමථ විදර්ශනා දෙකින් සිත ඉතා සතුටු කෙරෙමින්; අස්සසිස්සාමි'ති, ආශ්වාස කෙරෙමි'යි; සික්ඛති, හික්මෙයි; අභිප්පමොදයං චිත්තං, සිත අතිශයින් සතුටු කෙරෙමින්; පස්සසිස්සාමි'ති, ප්‍රශ්වාස කෙරෙමි'යි; සික්ඛති, හික්මෙයි; සමාදහං චිත්ත, ආශ්වාසයෙහි (අරමුණෙහි) සිත පිහිටු වන්නේමි'යි; අස්සසිස්සාමි'ති, ආශ්වාස කෙරෙමි'යි; සික්ඛති, හික්මෙයි.

විමොචයං චිත්තං, නීවරණයන් ගෙන් සිත මුදන්නෙමි; අස්සසිස්සාමි'ති, ආශ්වාස කෙරෙමි'යි; සික්ඛති, හික්මෙයි; විමොචයං චිත්තං, නීවරණයන් ගෙන් සිත මුදන්නෙමි; පස්සසිස්සාමි'ති, ප්‍රශ්වාස කෙරෙමි'යි; සික්ඛති, හික්මෙයි; අනිච්චානු පස්සි, අනිත්‍ය ලක්ෂණ නැවත නැවත දකින්නේ; අස්සසිස්සාමි'ති, ආශ්වාස කෙරෙමි'යි; සික්ඛති, හික්මෙයි; අනිච්චානු පස්සි, අනිත්‍ය ලක්ෂණ නැවත නැවත දකින්නේ; පස්සසිස්සාමි'ති, ප්‍රශ්වාස කෙරෙමි'යි; සික්ඛති, හික්මෙයි; විරාගානු පස්සි, විරාගය නැවත නැවත දකින්නේ; අස්සසිස්සාමි'ති, ආශ්වාස කෙරෙමි'යි; සික්ඛති, හික්මෙයි; විරාගානු පස්සි, විරාගය නැවත නැවත දකින්නේ; පස්සසිස්සාමි'ති, ප්‍රශ්වාස කෙරෙමි'යි; සික්ඛති, හික්මෙයි; නිරෝධානු පස්සි, නිරෝධය නැවත නැවත දකින්නේ; අස්සසිස්සාමි'ති, ආශ්වාස කෙරෙමි'යි; සික්ඛති, හික්මෙයි; නිරෝධානු පස්සි, නිරෝධය නැවත නැවත දකින්නේ; පස්සසිස්සාමි'ති, ප්‍රශ්වාස කෙරෙමි'යි; සික්ඛති, හික්මෙයි; පටිනිස්සග්ගානුපස්සි, කෙලෙසුන්ගෙන් මිදීම නැවත නැවත දකින්නේ; අස්සසිස්සාමි'ති, ආශ්වාස කෙරෙමි'යි; සික්ඛති, හික්මෙයි; පටිනිස්සග්ගානුපස්සි, කෙලෙසුන්ගෙන්

Non-Commercial Distribution

මිදීම නැවත නැවත දකින්නෙමි; පස්සසිස්සාමී'ති, ප්‍රශ්වාස කෙරෙමී'යි; සික්ඛති, හික්මෙයි.

ආනන්ද, ආනන්දය; අයං, මෙය; ආනාපාන සති, ආනාපාන සතිය'යි; වුච්චති, කියනු ලැබේ.

16. ආනන්ද, ආනන්දය; සචෙ බො, ඉදින් වනාහි; ත්‍වං, ඔබ; ගිරිමානන්දස්ස භික්ඛුනො, ගිරිමානන්ද භික්ෂුනම වෙත; උපසංකමිත්වා, එළඹ; ඉමා දස සඤ්ඤා, මේ දශ සංඥවන්; භාසෙය්‍යා'සි, කියන්නෙහි නම්; ගිරිමානන්දස්ස භික්ඛුනො, ගිරිමානන්ද භික්ෂු නම; ඉමා දස සඤ්ඤා සුත්වා, මේ දශ සංඥවන් අසා; සො ආබාධො, ඒ ආබාධය තෙම; ඨානසො, වහා; පටිප්පස්සම්භෙය්‍ය ඉති, සංසිඳෙන්නේ ය යන; යං, යමක් වේද; එතං ඨානං බො පන, මේ කාරණය වනාහි; විජ්ජති, විද්‍යමාන වෙයි.

17. අථ බො, ඉක්බිති; ආයස්මා ආනන්දො, ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙම; භගවතො සන්තිකෙ, භාග්‍යවතුන් වහන්සේ ගේ සමීපයෙහි; ඉමා දස සඤ්ඤා, මේ දශ සංඥවන්; උග්ගහෙත්වා, උගෙන; ආයස්මා, ආයුෂ්මත්; ගිරිමානන්දො, ගිරිමානන්ද භික්ෂුනම; යෙන, යම් තැනෙක ද; තෙන, එ තැනට; උපසංකමි, එළඹියේ ය; උපසංකමිත්වා, එළඹ; ආයස්මතො ගිරිමානන්දස්ස, ආයුෂ්මත් ගිරිමානන්ද භික්ෂු නමට; ඉමා දස සඤ්ඤා, මේ දස සංඥවන්; අභාසි, වදාළේ ය.

18. අථ බො, ඉක්බිති; ආයස්මතො ගිරිමානන්දස්ස, ආයුෂ්මත් ගිරිමානන්ද භික්ෂු නමගේ; සො ආබාධො ඒ ආබාධය; ඉමා දස සඤ්ඤා සුත්වා, මේ දස සංඥවන් අසා; ඨානසො, වහා; පටිප්පස්සම්භි, සංසිඳුනේ ය.

ආයස්මා ගිරිමානන්දො ච, ආයුෂ්මත් ගිරිමානන්ද ස්ථවිර තෙමේ ද; තම්හි ආබාධා, ඒ ආබාධයෙන්; වුට්ඨාහි, නැගී සිටියේ ය; ආයස්මතො ගිරිමානන්දස්ස පන, ආයුෂ්මත් ගිරිමානන්ද භික්ෂු නම ගේ වනාහි; සො ආබාධො, ඒ ආබාධය; කථා පහීනොව අහොසි ඉති, එසේ ම ප්‍රහීණ විය යනුයි.

ගිරිමානන්ද සූත්‍රය යි

## ඉසිගිලි සුත්තං. — ඉසිගිලි සූත්‍රය.

1. මෙ, මා විසින්; එවං සුතං, මෙසේ අසන ලදී. එකං සමයං, එක් සමයෙක; භගවා, භාග්‍යවතුන් වහන්සේ; රාජගහෙ, රජගහ නුවර; ඉසිගිලිස්මිං පබ්බතෙ, ඉසිගිලි පව්වෙහි; විහරති, වැඩ වසන සේක; තත්‍ර බො, එ කල්හි වනාහි; භගවා, භාග්‍යවතුන් වහන්සේ; භික්ඛවොති, මහණෙනි කියාඃ භික්ඛු, භික්ෂූන්; ආමන්තෙසි, ඇමැතූ සේක; තෙ භික්ඛු, ඒ භික්ෂූහු; භදන්ත ඉති, පින්වතුන් වහන්ස'යි කියා; භගවතො, භාග්‍යවතුන් වහන්සේට; පච්චස්සොසුං, පිළිවදන් දුන්හ; භගවා, භාග්‍යවතුන් වහන්සේ; එතදවොච, මෙසේ වදාළ සේක.

2. භික්ඛවෙ, මහණෙනි; තුම්හෙ, තෙපි; එතං වේභාරං පබ්බතං; මේ වේභාර පර්වතය; පස්සථනො, දක්නහු ද?; භන්තෙ, ස්වාමීනි; එවං, එසේ ය; භික්ඛවෙ, මහණෙනි; එතස්සපි බො වෙභාරස්ස පබ්බතස්ස, මේ වේභාර පර්වතයට ද?; අඤ්ඤාව සමඤ්ඤා අහොසි, අනෙක් නමෙක් විය; අඤ්ඤා පඤ්ඤත්ති අහොසි, අනික් පැණවීමක් විය.

3. භික්ඛවෙ, මහණෙනි; තුම්හෙ, තෙපි; එතං පාණ්ඩව පබ්බතං; මේ පාණ්ඩව පර්වතය; පස්සථනො ඉති, දක්නහු ද?; භන්තෙ, ස්වාමීනිඃ එවං, එසේ ය; භික්ඛවෙ, මහණෙනි; එතස්සපි බො පණ්ඩවස්ස පබ්බතස්ස, මේ පාණ්ඩව පර්වතයට ද?; අඤ්ඤාව සමඤ්ඤා අහොසි, අනෙක් නමෙක් විය; අඤ්ඤා පඤ්ඤත්ති අහොසි, අනික් පැණවීමක් විය.

4. භික්ඛවෙ, මහණෙනි; තුම්හෙ, තෙපි; එතං වෙපුල්ලං පබ්බතං; මේ වෙපුල්ල පර්වතය; පස්සථනො ඉති, දක්නහු ද?; භන්තෙ, ස්වාමීනි; එවං, එසේ ය; භික්ඛවෙ, මහණෙනි; එතස්සපි ඛො වෙපුල්ලස්ස පබ්බතස්ස, මේ වෙපුල්ල පර්වතයට ද; අඤ්ඤාව සමඤ්ඤා අහොසි, අනෙක් ම නමෙක් විය; අඤ්ඤා පඤ්ඤත්ති අහොසි, අනික් පැණවීමක් විය.

5. භික්ඛවෙ, මහණෙනි; තුම්හෙ, තෙපි; එතං ගිජ්ඣකූටං පබ්බතං; මේ ගිජ්ඣකූට පර්වතය; පස්සථනො ඉති, දක්නහු ද?; භන්තෙ, ස්වාමීනි; එවං, එසේ ය; භික්ඛවෙ, මහණෙනි; එතස්සපි ඛො ගිජ්ඣකූටස්ස පබ්බතස්ස, මේ ගිජ්ඣකූට පර්වතයට ද; අඤ්ඤාව සමඤ්ඤා අහොසි, අනෙක් ම නමෙක් විය; අඤ්ඤා පඤ්ඤත්ති අනික් පැණවීමක් ම විය.

6. භික්ඛවෙ, මහණෙනි; තුම්හෙ, තෙපි; ඉමං ඉසිගිලිං පබ්බතං; මේ ඉසිගිලි පර්වතය; පස්සථනො ඉති, දක්නහු ද?; එවං භන්තෙ, එසේ ය ස්වාමීනි; භික්ඛවෙ, මහණෙනි; එතස්සපි ඛො ඉසිගිලිස්ස, පබ්බතස්ස, මේ ඉසිගිලි පර්වතයට වූ කලී; එසාව සමඤ්ඤා අහොසි, මේ නාමය ම විය; එසා පඤ්ඤත්ති, මේ ප්‍රඥප්තිය ම විය.

7. භික්ඛවෙ, මහණෙනි; භූත පුබ්බං, පෙර වූවක් කියමි; පඤ්ච පච්චෙක බුද්ධසතානි, පන්සියක් පසේ බුදුවරු; ඉමස්මිං ඉසිගිලිස්මිං පබ්බතෙ, මේ ඉසිගිලි පව්වෙහි; චිර නිවාසිනො අහෙසුං, බොහෝ කල් විසූහ; තෙ, උන්වහන්සේලා; ඉමං පබ්බතං, මේ පර්වතයට; පවිසන්තා, පිවිසෙන්නාහු; දිස්සන්ති, දක්නා ලැබෙත්; පවිට්ඨා, පිවිසියාහු; න දිස්සන්ති, දක්නා නො ලැබෙත්.

තං එතං, ඒ කාරණය; මනුස්සා, මනුෂ්‍යයෝ; දිස්වා, දැක; එවං ආහංසු, මෙසේ කීවාහු ය; අයං පබ්බතො, මේ පර්වතය තෙම; ඉමෙ ඉසිගිලතී'ති, මේ ඍෂින් ගිල ගනියි කියා යි; ඉසිගිලි ඉසිගිලිත්තෙව සමඤ්ඤා උදපාදි, ඉසිගිලි, ඉසිගිලි යන නම පහළ විය.

8. භික්ඛවෙ, මහණෙනි; පච්චෙක බුද්ධානං, පසේ බුදුවරුන්ගේ; නාමානි, නාමයන්; ආචික්ඛිස්සාමි, ප්‍රකාශ කරන්නෙමි; භික්ඛවෙ, මහණෙනි; පච්චෙක බුද්ධානං, පසේ බුදුවරුන්ගේ; නාමානි, නාමයන්; කිත්තයිස්සාමි, ප්‍රකාශ කරන්නෙමි; භික්ඛවෙ, මහණෙනි; පච්චෙක බුද්ධානං, නාමානි, පසේ බුදුවරුන් ගේ නාමයන්; දෙසිස්සාමි, දේශනා කරන්නෙමි; තං සුණාථ, එය අසව්; සාධුකං, මනාකොට; මනසි කරොථ, මෙනෙහි කරව්; භාසිස්සාමි'ඉති, කියන්නෙමි'යි වදාළහ; භන්තෙ'ඉති, වහන්ස; එවං ඛො, එසේය යි; තෙ භික්ඛු, ඒ භික්ෂූහු; භගවතො, භාග්‍යවතුන් වහන්සේට; පච්චංසොසුං, පිළිවදන් දුන්හ; භගවා, භාග්‍යවතුන් වහන්සේ; එතදවොච, මේ කාරණය වදාළ සේක;

9. භික්ඛවෙ, මහණෙනි, අරිට්ඨො නාම පච්චෙක බුද්ධො, අරිට්ඨ නම් වූ පසේ බුදුතෙම; ඉමස්මිං ඉසිගිලිස්මිං පබ්බතෙ, මේ ඉසිගිලි පව්වෙහි; චිරනිවාසී අහොසි, බොහෝ කල් විසූයේ විය.

10. භික්ඛවෙ, මහණෙනි; උපරිට්ඨො නාම පච්චෙක බුද්ධො, උපරිට්ඨ නම් වූ පසේ බුදුතෙම; ඉමස්මිං ඉසිගිලිස්මිං පබ්බතෙ, මේ ඉසිගිලි පව්වෙහි; චිරනිවාසී අහොසි, බොහෝ කල් විසූයේ විය.

11. භික්ඛවෙ, මහණෙනි; තගරසිඛී නාම පච්චෙක බුද්ධො, තගරසිඛී නම් වූ පසේ බුදුතෙම; ඉමස්මිං ඉසිගිලිස්මිං පබ්බතෙ, මේ ඉසිගිලි පව්වෙහි; චිරනිවාසී අහොසි, බොහෝ කල් විසූයේ විය.

12. භික්ඛවෙ, මහණෙනි; යසස්සී නාම පච්චෙක බුද්ධො, යසස්සී නම් වූ පසේ බුදුතෙම; ඉමස්මිං ඉසිගිලිස්මිං පබ්බතෙ, මේ ඉසිගිලි පව්වෙහි; චිරනිවාසී අහොසි, බොහෝ කල් විසූයේ විය.

13. භික්ඛවෙ, මහණෙනි; සුදස්සනො නාම පච්චෙක බුද්ධො, සුදස්සන නම් වූ පසේ බුදුතෙම; ඉමස්මිං ඉසිගිලිස්මිං පබ්බතෙ, මේ ඉසිගිලි පව්වෙහි; චිරනිවාසී අහොසි, බොහෝ කල් විසූයේ විය.

Non-Commercial Distribution

14. භික්ඛවෙ, මහණෙනි; පියදස්සී නාම පච්චෙක බුද්ධො, පියදස්සී නම් වූ පසේ බුදුතෙම; ඉමස්මිං ඉසිගිලිස්මිං පබ්බතෙ, මේ ඉසිගිලි පව්වෙහි; චිරනිවාසී අහොසි, බොහෝ කල් විසූයේ විය.

15. භික්ඛවෙ, මහණෙනි; ගන්ධාරො නාම පච්චෙක බුද්ධො, ගන්ධාර නම් වූ පසේ බුදුතෙම; ඉමස්මිං ඉසිගිලිස්මිං පබ්බතෙ, මේ ඉසිගිලි පව්වෙහි; චිරනිවාසී අහොසි, බොහෝ කල් විසූයේ විය.

16. භික්ඛවෙ, මහණෙනි; පිණ්ඩොලො නාම පච්චෙක බුද්ධො, පිණ්ඩෝල නම් වූ පසේ බුදුතෙම; ඉමස්මිං ඉසිගිලිස්මිං පබ්බතෙ, මේ ඉසිගිලි පව්වෙහි; චිරනිවාසී අහොසි, බොහෝ කල් විසූයේ විය.

17. භික්ඛවෙ, මහණෙනි; උපාසභො නාම පච්චෙක බුද්ධො, උපාසභ නම් වූ පසේ බුදුතෙම; ඉමස්මිං ඉසිගිලිස්මිං පබ්බතෙ, මේ ඉසිගිලි පව්වෙහි; චිරනිවාසී අහොසි, බොහෝ කල් විසූයේ විය.

18. භික්ඛවෙ, මහණෙනි; නීථො නාම පච්චෙක බුද්ධො, නීථ නම් වූ පසේ බුදුතෙම; ඉමස්මිං ඉසිගිලිස්මිං පබ්බතෙ, මේ ඉසිගිලි පව්වෙහි; චිරනිවාසී අහොසි, බොහෝ කල් විසූයේ විය.

19. භික්ඛවෙ, මහණෙනි; තථො නාම පච්චෙක බුද්ධො, තථ නම් වූ පසේ බුදුතෙම, ඉමස්මිං ඉසිගිලිස්මිං, පබ්බතෙ, මේ ඉසිගිලි පව්වෙහි; චිරනිවාසී අහොසි, බොහෝ කල් විසූයේ විය.

20. භික්ඛවෙ, මහණෙනි; සුතවා නාම පච්චෙක බුද්ධො, සුතවන්තු නම් වූ පසේ බුදුතෙම; ඉමස්මිං ඉසිගිලිස්මිං පබ්බතෙ, මේ ඉසිගිලි පව්වෙහි; චිරනිවාසී අහොසි, බොහෝ කල් විසූයේ විය.

21. භික්ඛවෙ, මහණෙනි; භාවිතත්තො නාම පච්චෙක බුද්ධො, භාවිතත්ත නම් වූ පසේ බුදුතෙම; ඉමස්මිං ඉසිගිලිස්මිං පබ්බතෙ, මේ ඉසිගිලි පව්වෙහි, චිරනිවාසී අහොසි, බොහෝ කල් විසූයේ විය.

1. අනීඝා, දුක් නැත්තා වූ; නිරාසා, ආශා රහිත වූ; යෙ සත්තසාරා, යම් සත්වෝත්තම කෙනෙක්; පච්චෙකං එව, වෙන වෙනම; සුබොධිං සම්‍යක්සම්බෝධිය; අජ්ඣගමුං, අවබෝධ කළාහු ද; විසල්ලානං, කෙලෙස් උල් උදුළා වූ; තෙසං නරුත්තමානං, ඒ නරෝත්තමයන් ගේ; නාමානි, නම්; කිත්තයතො, ප්‍රකාශ කරන; මෙ. මාගේ වචන; සුණාථ, අසව්;

2. අරිට්ඨො, අරිට්ඨ ය; උපරිට්ඨො, උපරිට්ඨය; තගරසිඛී, තගරසිඛී ය; යසස්සි, යසස්සි ය; සුදස්සනො, සුදස්සන ය; පියදස්සි, පියදර්ශී ය; ගන්ධාරො ච බුද්ධො, ගන්ධාර නම් බුද්ධ ය; පිණ්ඩොලො, පිණ්ඩෝල ය; උපාසභො, උපාසභ ය; නීථො, නීථ ය; තථො, තථ ය; සුතවා, සුතවන්තු ය; භාවිතත්තො, භාවිතත්ත ය;

3. සුම්භො, සුම්භ ය; සුභ, සුභ ය; මෙථුලො, මෙථුල ය; අට්ඨමො ච, අට්ඨමය; අථස්සු, තවද; මෙඝො, මේඝ ය; අනීඝො, අනීඝ ය; සුදාඨො; සුදාඨ ය යන මොහු; භවනෙත්ති ඛීණා, භව ආශාව ක්ෂය කළා වූ ද; පච්චෙක බුද්ධා, පසේ බුදුවරු ද; හිංගු ච, හිංගු ය; හිංගො ච, හිංග ය යන පසේ බුදුවරු; මහානුභාවා, මහත් ආනුභාව ඇත්තාහ.

4. ද්වෙජාලිනො, චුල්ලජාලිය, මහාජාලිය යන; මුනිනො, මුනිවරයෝ දෙනම ද; අට්ඨකො ච, අට්ඨක ය; අථ, තවද; කොසලො බුද්ධො, කෝසල බුද්ධ ය; අථ, තවද; සුබාහු, සුබාහු ය; උපනෙමිසො, උපනෙමිස ය; නෙමිසො, නෙමිස ය; සන්තචිත්තො, සන්තචිත්ත ය; සච්චො, සච්ච ය; තථො, තථ ය; විරජො, විරජ ය; පණ්ඩිතො, පණ්ඩිත ය;

Non-Commercial Distribution

5. කාලුපකාලා, කාල ය, උපකාල ය; විජිතො, විජිත ය; ජිතො ච, ජිත ය; අංගො ච, අංග ය; පංගො ච, පංග ය; ගුතිජ්ජිතො ච, ගුතිජ්ජිත ය; දුක්ඛ මූලං, දුකට මුල් වූ; උපධිං, කෙලෙස්; ජහි, දුරු කළා වූ; පස්සී, පස්සී ය; මාරබලං අජේසි, මාරබල දිනූ; අපරාජිතො, අපරාජිත ය; සත්‍ථා, සත්‍ථා ය; පවත්තා, පවත්තා ය; සරභංගො, සරභංග ය; ලොමහංසො, ලෝමහංස ය; උච්චංගමායො, උච්චංගමාය ය; අසිතො, අසිත ය; අනාසවො, අනාසව ය; මනොමයො, මනෝමය ය; මානච්ඡිද්දො, මානය දුරු කළා වූ; බන්ධුමා, බන්ධුමන්තු ය; තදාධි මුත්තො, තදාධි මුත්ත ය; විමලොච, විමල ය; කෙතුමා, කේතුමන්තු ය;

6. කෙතුම්බරාගො ච, කේතුම්බරාග ය; මාතංගො, මාතංග ය; අරියො, අරිය ය; අථ, තවද; අච්චුතො, අච්චුත; අච්චුතගාමබ්‍යාමකො, අච්චුතගාමබ්‍යාමක ය; සුමංගලො, සුමංගල ය; දබ්බිලො, දබ්බිල ය; සුප්පතිට්ඨිතො, සුප්පතිට්ඨිත ය; අසය්හො, අසය්හ ය; ඛෙමාභිරතො ච, ඛෙමාභිරත ය; සොරතො, සෝරත ය;

7. දුරන්නයො, දුරන්නය ය; සංසො, සංස ය; අථො අපි, නැවත; උච්චයො, උච්චය ය; අපරොමුනි, අපරමුනි වූ; අනොමනික්කමො, අලාමක වීර්ය ඇති; සය්හො, සය්හ ය; ආනන්ද, ආනන්ද ය; නන්දො, නන්ද ය; උපනන්දො, උපනන්ද ය යන නම්වලින් යුත්; ද්වාදස, දොළොස් බුදුහු ද; අන්තිම දෙහධාරි, අවසාන පඤ්චස්කන්ධධාරි වූ; භාරද්වාජො, භාරද්වාජ ය;

8. බොධී, බෝධි ය; මහානාමො, මහානාම ය; අථො අපි, නැවත ද; උත්තරො, උත්තර ය; කෙසී, කේසී ය; සිඛී, සිඛී ය; සුන්දරො, සුන්දර ය; භාරද්වාජො, භාරද්වාජ ය; භවබන්ධනච්ඡිදා, සසර බැඳුම් දුරු කළා වූ; තිස්සොපතිස්සා, තිස්ස ය, උපතිස්ස ය (යන දෙනම ය); උපසීදරී, උපසීදරී ය; තණ්හච්ඡිදො ච, තෘෂ්ණාව සිඳ දැමූ; සිදරි, සිදරී ය;

9. වීතරාගො, දුරු කළ රාගය ඇති; මංගලො බුද්ධො අහූ, මංගල නම් බුදුවරයෙක් විය; උසභො, උසභ නම් බුද්ධ තෙමේ; ජාලිනී, ජාලිනී නම් වූ දුක්ඛ මූලං දුක් මුල; අච්ඡිද, කැපී ය; උපනීතො, උපනීත නම් බුද්ධ තෙමේ; සන්තං වදං, ශාන්ත පදයට; අජ්ඣගමා, පැමිණියේ ය; උපොසථො, උපෝසථ ය; සුන්දරො, සුන්දර ය; සච්චනාමො, සච්චනාම ය;

10. ජෙතො, ජෙත ය; ජයන්තො, ජයන්ත ය; පදුමො, පදුම ය; උප්පලො ච, උප්පල ය; පදුමුත්තරො, පදුමුත්තර ය; රක්ඛිතො, රක්ඛිත ය; පබ්බතො ච, පබ්බත ය; මානත්‍ථද්ධො, මානත්‍ථද්ධ ය; සොභිතො, සොභිත ය; වීතරාගො, වීතරාග ය; සුවිමුත්ත චිත්තො, මොනවට කෙලෙසුන් කෙරෙන් මිදුණු සිත් ඇති; කණ්හො ච බුද්ධො, කණ්හ නම් බුද්ධ ය;

11. එතෙ ච, මෙහි කී පසේ බුදුවරු ද; අඤ්ඤෙ ච මහානුභාවා, මෙහි නොකී මානුභාව ඇති අන්‍ය වූ; පච්චෙක බුද්ධා, පසේ බුදුවරු ද; භවනෙත්ති ඛීණා, භව තෘෂ්ණාව ක්‍ෂය කළ හු වෙති; මහේසී, මහාර්ෂි වූ; සබ්බ සංගාතිගතෙ, සියළු කෙලෙස් සතුරන් දිනූ; අප්පමෙය්‍ය, අපමණ ගුණවත් වූ; පරිනිබ්බුතෙ, පිරිනිවි පසේ බුදුවරුන්; වන්දථ ඉති, වඳිව්.

දුතියක භාණ වාරං. දෙවෙනි බණවර යි.

Non-Commercial Distribution

# ධම්මචක්කපවත්තන සුත්තං. — දම්සක් පැවතුම් සුතුර.

1. මෙ, මා විසින්; එවං සුතං, මෙසේ අසන ලදී. එකං සමයං, එක් සමයෙක්හි; භගවා, භාග්‍යවතුන් වහන්සේ; බාරාණසියං, බරණැස් නුවරෙහි; මිගදායෙ, මුවන්ට අභය දානය කළ හෙයින් මිගදාය නම් වූ; ඉසිපතනෙ, ඉසිපතනාරාමයෙහි; විහරති, වැඩ වසන සේක.

තත්‍ර බො, එකල්හි වනාහි; භගවා, භාග්‍යවතුන් වහන්සේ; පඤ්ච වග්ගියෙ භික්ඛූ, පස්වග මහණුන්; ආමන්තෙසි, ඇමතූ සේක.

2. භික්ඛවෙ, මහණෙනි; පබ්බජිතෙන, පැවිද්දෙකු විසින්; න සෙවිතබ්බා, නො සෙවිය යුතු; ඉමෙ ද්වෙ අන්තා, මේ අන්තයෝ දෙකෙකි: එනම් - හීනො, ලාමක වූ; ගම්මො, ග්‍රාම්‍ය වූ; පොථුජ්ජනිකො, පෘථග්ජනයන් විසින් පුරුදු කරන ලද; අනරියො, අනාර්‍ය්‍ය වූ; අනත්ථසංහිතො, අනර්ථයක් ම සිදු කරන්නා වූ; කාමෙසු, වස්තු කාමයන් කෙරෙහි; යොචායං, යම් මේ; කාමසුඛල්ලිකානුයොගො, කාමසුඛල්ලිකානුයෝගයක් ඇද්ද; (එසේ ම), දුක්ඛො, දුක් උපදවන්නා වූ; අනරියො, අනාර්‍ය්‍ය වූ; අනත්‍ථසංහිතො, අනර්ථයක් ම ඇසුරු කරන්නා වූ; යොචායං, යම් මේ; අත්තකිලමථානුයොගො, අත්තකිලමථානුයෝගයක් ඇද්ද; භික්ඛවෙ, මහණෙනි; තෙ එතෙ උභො අන්තෙ, ඒ මේ අන්ත දෙකට; අනුපගම්ම, නො පැමිණ; තථාගතෙන, තථාගතයන් වහන්සේ විසින්; මජ්ඣිමා පටිපදා, මධ්‍යම ප්‍රතිපදා තොමෝ; අභිසම්බුද්ධා, අවබෝධ කරන ලදු; (ඕතොමෝ) චක්ඛුකරණී, ප්‍රඥාචක්ෂුස පිරිසිදු කරන්නී ය; ඤාණකරණී, නුවණැස ඇති කරන්නී ය; උපසමාය, කෙලෙසුන් සංසිඳීම පිණිස; අභිඤ්ඤාය, චතුරාර්‍ය්‍ය සත්‍යය ප්‍රතිවේධය පිණිස; සම්බොධාය, ඔවුන්ගේ ම අවබෝධය පිණිස; නිබ්බාණාය, නිවන් පිණිස; සංවත්තති, පවත්නී ය.

3. භික්ඛවෙ, මහණෙනි; තථාගතෙන, තථාගතයන් වහන්සේ විසින්; අභිසම්බුද්ධා, මනාකොට අවබෝධ කරන ලද; කතමා ච සා මජ්ඣිමා පටිපදා, ඒ කවර මධ්‍යම ප්‍රතිපදාවක් තොමෝ; චක්ඛුකරණී, ප්‍රඥා ඇස පිරිසිදු කරන්නී; ඤාණකරණී, නුවණ ඇස ඇති කරන්නී; උපසමාය, කෙලෙසුන් සංසිඳීම පිණිස; අභිඤ්ඤාය, චතුරාර්‍ය්‍ය සත්‍යය අවබෝධය පිණිස; සම්බොධාය, ඔවුන්ගේ ම අවබෝධය පිණිස; නිබ්බාණාය, නිවන් පිණිස; සංවත්තති?. පවත්නීද?; අයං එව අරියො අට්ඨංගිකො මග්ගො, මේ ආර්‍ය්‍ය අෂ්ඨාංගික මාර්‍ගය මැ යි; සෙය්‍යථීදං?, ඒ කවරේ ද යත්?; සම්මාදිට්ඨි, සම්‍යක්දෘෂ්ටි ය; සම්මාසංකප්පො, සම්‍යක්සංකල්පනාව ය; සම්මාවාචා, සම්‍යක්වචන ය; සම්මාකම්මන්තො, සම්‍යක්කර්මාන්ත ය; සම්මාආජීවො, සම්‍යක්ආජීව ය; සම්මාවායාමො, සම්‍යක්ව්‍යායාම ය; සම්මාසති, සම්‍යක්ස්මෘති ය; සම්මාසමාධි, සම්‍යක්සමාධි ය යනු මොහු යි; භික්ඛවෙ, මහණෙනි; තථාගතෙන, තථාගතයන් වහන්සේ විසින්; අභිසම්බුද්ධා, අවබෝධ කරන ලද; අයං බො සා මජ්ඣිමා පටිපදා, මේ ඒ මධ්‍යම ප්‍රතිපදාතොමෝ; චක්ඛුකරණී, ප්‍රඥා ඇස පිරිසිදු කරන්නී ය; ඤාණකරණී, නුවණැස ඇති කරන්නී ය; උපසමාය, කෙලෙසුන් සංසිඳීම පිණිස; අභිඤ්ඤාය, චතුස්සත්‍යය ප්‍රතිවේධය පිණිස; සම්බොධාය, සම්බෝධිය පිණිස; නිබ්බාණාය, නිවන් පිණිස; සංවත්තති, පවත්නී ය.

4. භික්ඛවෙ, මහණෙනි; ඉදං බො පන, මේ වනාහි; දුක්ඛං අරියසච්චං, දුක්ඛ ආර්‍ය්‍ය සත්‍යය වේ; ජාතිපි දුක්ඛා, ඉපදීම දුක ය; ජරාපි දුක්ඛා, ජරාව ද දුක ය; ව්‍යාධිපි දුක්ඛො, රෝගීවීම දුක ය; මරණම්පි දුක්ඛං, මරණය ද දුක ය; අප්පියෙහි සම්පයොගො දුක්ඛො, අප්‍රියයන් හා එක්වීම දුක ය; පියෙහි විප්පයොගො දුක්ඛො, ප්‍රියයන් ගෙන් වෙන්වීම දුක ය; යම්පිච්ඡං න ලභති, කැමති යමක් නො ලැබේ ද; තම්පි දුක්ඛං, එද දුක ය; සංඛිත්තෙන, සැකෙවින්; පඤ්ච උපාදානක්ඛන්ධා, පඤ්ච උපාදානස්කන්ධයෝ; දුක්ඛා, දුක් වන්නාහු ය.

5. භික්ඛවෙ, මහණෙනි; ඉදං ඛො පන, මේ වනාහි; දුක්ඛ සමුදයං අරිය සච්චං, දුක්ඛ සමුදය ආර්‍ය්‍ය සත්‍යය නම් වේ; යායං තණ්හා, යම් මේ තෘෂ්ණාවක්; පොනොභවිකා, පුනරුප්පත්තිය ඇති කෙරේ ද; නන්දිරාග සහගතා, නන්දිරාග සම්ප්‍රයුක්ත වන්නී ද; තත්‍රතත්‍රාභි නන්දිනී, ඒ ඒ භවයෙහි විශේෂයෙන් සතුට ඇති කරන්නී ද; සෙය්‍යථීදං?, ඕ තෘෂ්ණාව කවරීද යත්?; කාම තණ්හා, කාම තෘෂ්ණාව ය; භව තණ්හා, භව තෘෂ්ණාව ය හෙවත් ශාස්වත දෘෂ්ටිය හා යෙදෙන තෘෂ්ණාව ය; විභව තණ්හා, විභව තෘෂ්ණාව ය හෙවත් උච්ඡෙද දෘෂ්ටිය හා යෙදෙන තෘෂ්ණාව ය යන මොහු යි.

6. භික්ඛවෙ, මහණෙනි; තස්සාය එව තණ්හාය, ඒ තෘෂ්ණාවගේ ම; යො අසෙස විරාග නිරොධො, යම් සම්පූර්ණ නො ඇලීමක් නැති කිරීමක් වේ ද; චාගො, අත්හැරීමක් වේ ද; පටිනිස්සගො, දුරලීමක් වේ ද; මුත්ති, මිදීමක් වේ ද; අනාලයො, නො ඇලීමක් වේ ද; ඉදං ඛො පන, මෙය වනාහි; දුක්ඛ නිරෝධං අරියසච්චං, දුක්ඛ නිරොධ ආර්‍ය්‍ය සත්‍යය යි.

7. භික්ඛවෙ, මහණෙනි; ඉදං ඛො පන, මෙය වනාහි; දුක්ඛනිරොධ ගාමිනිපටිපදා අරියසච්චං, දුක්ඛ නිරෝධ ගාමිනී ප්‍රතිපදාආර්‍ය්‍ය සත්‍යය වේ, එනම්; අයමෙව අරියො අට්ඨංගිකො මග්ගො, මේ ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගය ම ය. සෙය්‍යථීදං?, ඒ කවරේ ද යත්?; සම්මාදිට්ඨි, සම්‍යක්දෘෂ්ටිය ය; සම්මාසංකප්පො, සම්‍යක්සංකල්පනාව ය; සම්මාවාචා, සම්‍යක්වචන ය; සම්මාකම්මන්තො, සම්‍යක්කර්මාන්ත ය; සම්මාආජීවො, සම්‍යක්ආජීවය ය; සම්මාවායාමො, සම්‍යක්ව්‍යායාමය ය; සම්මාසති, සම්‍යක්ස්මෘතිය ය; සම්මාසමාධි, සම්‍යක්සමාධිය යනු මේයි.

8. භික්ඛවෙ, මහණෙනි; මෙ, මට; ඉදං දුක්ඛං අරියසච්චන්ති, මේ දුක්ඛ ආර්‍ය්‍ය සත්‍යය යි; පුබ්බෙ, පෙර; අනනුස්සුතෙසු ධම්මෙසු, නො ඇසූ විරූ ධර්‍මයන්හි; චක්ඛුං උදපාදි, සත්‍යඥාන චක්‍ෂුස පහළ විය; ඥාණං උදපාදි, එහි දැනීම ඇති ඥානය පහළ විය; පඤ්ඤා උදපාදි, ප්‍රඥාව පහළ විය; විජ්ජා උදපාදි, විද්‍යාව හෙවත් කෙලෙසුන් දුරුකිරීමෙහි නුවණ ඇති විය; ආලොකො උදපාදි, අවිද්‍යාන්ධකාරය දුරු කරන ඥානාලෝකය පහළ විය; තං ඛො පන ඉදං දුක්ඛං, ඒ මේ දුක්ඛායර්‍ය සත්‍යය පරිඤ්ඤෙය්‍යංති, පිරිසිඳ දත යුතුය යි; භික්ඛවෙ, මහණෙනි; මෙ, මට; පුබ්බෙ, පෙර; අනනුස්සුතෙසු ධම්මෙසු, නො ඇසූ විරූ ධර්‍මයන්හි; චක්ඛුං උදපාදි, සත්‍ය ඥානය වූ; ප්‍රඥා චක්ෂු පහළ විය; ඤාණං උදපාදි, ඥානය පහළ විය; පඤ්ඤා උදපාදි; ප්‍රඥාව පහළ විය; විජ්ජා උදපාදි, විද්‍යාව පහළ විය; අලොකො, ප්‍රඥා නමැති ආලෝකය; උදපාදි, පහළ විය.

භික්ඛවෙ, මහණෙනි; මෙ, මට; තං ඛො පන ඉදං දුක්ඛං අරිය සච්චං, ඒ මේ දුක්ඛායර්‍ය සත්‍යය; පරිඤ්ඤාතංති, පිරිසිඳ දක්නා ලදැ'යි; පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු, පෙර නො ඇසූ විරූ ධර්‍මයන් හි; චක්ඛුං උදපාදි, චතුස්සත්‍යය පිළිබඳ ඤාණචක්ෂුස පහළ විය; ඤාණං උදපාදි, ඤාණය පහළ විය; පඤ්ඤා උදපාදි, ප්‍රඥාව පහළ විය; විජ්ජා උදපාදි, විද්‍යාව පහළ විය. ආලොකො උදපාදි, ආලෝකය පහළ විය.

9. භික්ඛවෙ, මහණෙනි; මෙ, මට; ඉදං දුක්ඛ සමුදයං අරිය සච්චං ඉති, මේ දුක්ඛ සමුදායායර්‍ය සත්‍යය'යි කියා; පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු, පෙර නො ඇසූ විරූ ධර්‍මයන්හි; චක්ඛුං උදපාදි, චතුස්සත්‍ය පිළිබඳ ඤාණචක්ෂුස පහළ විය; ඤාණං උදපාදි, ඤාණය පහළ විය; පඤ්ඤා උදපාදි, ප්‍රඥාව පහළ විය; විජ්ජා උදපාදි, විද්‍යාව පහළ විය; ආලොකො උදපාදි, ආලෝකය පහළ විය.

භික්ඛවෙ, මහණෙනි; මෙ, මට; තං ඛො පන ඉදං දුක්ඛ සමුදයං අරිය සච්චං, ඒ මේ දුක්ඛ සමුදායායර්‍ය සත්‍යය වනාහී; පහාතබ්බං ඉති, ප්‍රහාණය කළ යුතුය'යි; පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු, පෙර නො ඇසූ විරූ ධර්‍මයන්හි; චක්ඛුං උදපාදි, කෘත්‍යඤාණ චක්ෂුස පහළ විය; ඤාණං උදපාදි, ඤාණය පහළ විය; පඤ්ඤා උදපාදි, ප්‍රඥාව පහළ විය; විජ්ජා උදපාදි, විද්‍යාව පහළ විය; ආලොකො උදපාදි, ආලෝකය පහළ විය.

Non-Commercial Distribution

භික්ඛවෙ, මහණෙනි; මෙ, මට; තංඛොපනිදං දුක්ඛ සමුදයං අරිය සච්චං, ඒ මේ දුක්ඛ සමුදයායර්‍ය සත්‍යය වනාහි; පහීණං ඉති, ප්‍රහිණය විය යි; පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු, පෙර නො ඇසූ විරූ ධර්‍මයන්හි; චක්ඛුං උදපාදි, චතුස්සත්‍ය පිළිබඳ ඥාණචක්ෂුස පහළ විය; ඥාණං උදපාදි, ඥානය පහළ විය; පඤ්ඤා උදපාදි, ප්‍රඥාව පහළ විය. විජ්ජා උදපාදි, විද්‍යාව පහළ විය; ආලොකො උදපාදි, ආලෝකය පහළ විය.

10. භික්ඛවෙ, මහණෙනි; මෙ, මට; ඉදං දුක්ඛ නිරොධං අරිය සච්චං ඉති, මේ දුක්ඛ නිරෝධ ආයර්‍ය සත්‍යය'යි කියා; පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු, පෙර නො ඇසූ විරූ ධර්‍මයන්හි; චක්ඛුං උදපාදි, චතුස්සත්‍ය පිළිබඳ ඥාණචක්ෂුස පහළ විය; ඥාණං උදපාදි, ඥාණය පහළ විය; පඤ්ඤා උදපාදි, ප්‍රඥාව පහළ විය; විජ්ජා උදපාදි, විද්‍යාව පහළ විය; ආලොකො උදපාදි, ආලෝකය පහළ විය.

භික්ඛවෙ, මහණෙනි; මෙ, මට; තං ඛො පන ඉදං දුක්ඛ නිරොධං අරිය සච්චං, ඒ මේ දුක්ඛ නිරොධ ආයර්‍ය සත්‍යය වනාහි; සච්ඡිකාතබ්බං, සාක්ෂාත් කටයුතු ය'යි; පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු, පෙර නො ඇසූ විරූ ධර්‍මයන්හි; චක්ඛුං උදපාදි, ඥාණචක්ෂුස පහළ විය. ඥාණං උදපාදි, ඥාණය පහළ විය; පඤ්ඤා උදපාදි, ප්‍රඥාව පහළ විය; විජ්ජා උදපාදි, විද්‍යාව පහළ විය; ආලොකො උදපාදි, ආලෝකය පහළ විය.

භික්ඛවෙ, මහණෙනි; මෙ, මා විසින්; තං ඛො පන ඉදං දුක්ඛ නිරොධං අරිය සච්චං, ඒ මේ දුක්ඛ නිරෝධ ආයර්‍ය සත්‍යය වනාහි; සච්ඡිකතංති, සාක්ෂාත් කරන ලදැ'යි කියා; පුබ්බෙ, පෙර; අනනුස්සුතෙසු ධම්මෙසු, නො ඇසූ විරූ ධර්‍මයන්හි; චක්ඛුං උදපාදි, ඥාණචක්ෂුස පහළ විය; ඤාණං උදපාදි, ඥාණය පහළ විය; පඤ්ඤා උදපාදි, ප්‍රඥාව පහළ විය; විජ්ජා උදපාදි, විද්‍යාව පහළ විය; ආලොකො උදපාදි, ආලෝකය පහළ විය.

11. භික්ඛවෙ, මහණෙනි; මෙ, මට; ඉදං දුක්ඛනිරොධ ගාමිනි පටිපදා අරිය සච්චං ඉති, මේ දුක්ඛ නිරොධ ගාමිනි පටිපදා ආයර්‍ය සත්‍යය'යි කියා; පුබ්බෙ, පෙර; අනනුස්සුතෙසු, නොඇසූ විරූ ධර්‍මයන්හි; චක්ඛුං උදපාදි, ඥාණචක්ෂුස පහළ විය; ඥාණං උදපාදි, ඥාණය පහළ විය; පඤ්ඤා උදපාදි, ප්‍රඥාව පහළ විය; විජ්ජා උදපාදි, විද්‍යාව පහළ විය; ආලොකො උදපාදි, ආලෝකය පහළ විය.

භික්ඛවෙ, මහණෙනි; මෙ, මා විසින්; තං ඛො පන ඉදං දුක්ඛ නිරොධ ගාමිනි පටිපදා අරිය සච්චං, ඒ මේ දුක්ඛ නිරෝධ ගාමිනි පටිපදා ආයර්‍ය සත්‍යය; භාවෙතබ්බං ඉති, භාවිතා කටයුතු'යි; පුබ්බෙ, පෙර; අනනුස්සුතෙසු ධම්මෙසු, නො ඇසූ විරූ ධර්‍මයන්හි; චක්ඛුං උදපාදි, ඥාණචක්ෂුස පහළ විය; ඤාණං උදපාදි, ඥානය පහළ විය; පඤ්ඤා උදපාදි, ප්‍රඥාව පහළ විය; විජ්ජා උදපාදි, විද්‍යාව පහළ විය; ආලොකො උදපාදි, ආලෝකය පහළ විය.

භික්ඛවෙ, මහණෙනි; මෙ, මා විසින්; තං ඛො පන ඉදං දුක්ඛ නිරොධ ගාමිනි පටිපදා අරිය සච්චං, ඒ මේ දුක්ඛ නිරොධ ගාමිනි ප්‍රතිපදා ආයර්‍ය සත්‍යය; භාවිතං, ඉති භාවිතා කරන ලදැ'යි කියා; පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු, පෙර නො ඇසූ විරූ ධර්‍මයන්හි; චක්ඛුං උදපාදි, ඥාණචක්ෂුස පහළ විය; ඤාණං උදපාදි, ඥාණය පහළ විය; පඤ්ඤා උදපාදි, ප්‍රඥාව පහළ විය; විජ්ජා උදපාදි, විද්‍යාව පහළ විය; ආලොකො උදපාදි, ආලෝකය පහළ විය.

12. භික්ඛවෙ, මහණෙනි; යාවකීවඤ්ච, යම්තාක් කල්; එවං, මෙසේ; තිපරිවට්ටං, සත්‍යඥාන, කෘත්‍යඥාන, කෘතඥාන සංඛ්‍යාත වූ ත්‍රිපරිවෘත්තයක් ඇති; ද්වාදසාකාරං. (එකී එකී සත්‍යය තුන් ආකාරයන් ගේ වශයෙන්) දොළොස් ආකාරයක් ඇති; ඉමෙසු චතුසු අරියසච්චෙසු, මේ චතුරායර්‍යසත්‍යයන් කෙරෙහි; යථා භූතං ඤාණදස්සනං, යථාභූත ඥානදර්‍ශනය; මෙ, මට; න සුවිසුද්ධං

අහොසි, අතිපරිශුද්ධ නො වී ද; භික්ඛවෙ, මහණෙනි; තාව, ඒ තාක් කල්; සදෙවකෙ, දෙවියන් සහිත වූ; සමාරකෙ, මරුන් සහිත වූ; සබ්‍රහ්මකෙ, බඹුන් සහිත වූ; ලොකෙ, ලෝකයෙහි; සස්සමණබ්‍රාහ්මණියා, මහණ බමුණන් සහිත වූ; සදෙවමනුස්සාය, දෙවි මිනිසුන් සහිත වූ; පජාය, ප්‍රජාවෙහි; අහං, මම; අනුත්තරං, අනුත්තර වූ; සම්මාසම්බොධිං, සම්‍යක් සම්බෝධිය; අභිසම්බුද්ධො, ප්‍රත්‍යක්ෂ කෙළෙමි'යි; නෙව පච්චඤ්ඤාසිං, නොම ප්‍රතිඥා කෙළෙමි.

13. භික්ඛවෙ, මහණෙනි; යතොච ඛො, යම් තැනෙක පටන්; එවං තිපරිවට්ටං, මෙසේ ත්‍රිපරිවෘත්තයක් ඇති; ද්වාදසාකාරං, දොළොස් ආකාර ඇති; ඉමෙසු චතුසු අරිය සච්චෙසු, මේ චතුරාර්‍ය්‍ය සත්‍යයන් කෙරෙහි; යථා භූතං ඤාණදස්සනං, යථාභූත ඥානදර්ශනය; මෙ, මට; සුවිසුද්ධං අහොසි, අතිපරිශුද්ධ වී ද; භික්ඛවෙ, මහණෙනි; අථ, එකල්හි; අහං, මම; සදෙවකෙ, දෙවියන් සහිත වූ; සමාරකෙ, මරුන් සහිත වූ; ලොකෙ, ලෝකයෙහි ද; සස්සමණබ්‍රාහ්මණියා, මහණබමුණන් සහිත වූ; සදෙවමනුස්සාය, දෙවිමිනිසුන් සහිත වූ; පජාය, ප්‍රජාවෙහි ද; අනුත්තරං, නිරුත්තර වූ; සම්මාසම්බොධිං, සම්‍යක්සම්බෝධිය; අභිසම්බුද්ධො, ප්‍රත්‍යක්ෂ කෙළෙමි'යි; පච්චඤ්ඤාසිං, දැනගතිමි; මෙ, මට; දස්සනඤ්ච ඤාණං පන, ප්‍රත්‍යවෙක්ෂාඥනය වනාහි; උදපාදි, පහළ විය; මෙ, මාගේ; චෙතො විමුත්ති, චෙතොවිමුක්තිය (අරහත්ඵලය) අකුප්පව, අකෝප්‍ය ය; අයං අන්තිමා ජාති, මෝතොමෝ පශ්චිම ජාතිය වන්නී ය; ඉදානි, දැන්; පුනබ්භවො, පුනර්භවයෙක්; නත්ථි ඉති, නැත්තේ ය'යි වදාළ සේක.

14. භගවා, භාග්‍යවතුන් වහන්සේ; ඉදං අවොච, මේ සූත්‍ර ධර්මය වදාළ සේක.

අත්තමනා, සතුටු සිත් ඇති; පඤ්චවග්ගියා භික්ඛු, පඤ්ච වර්ගීය භික්ෂූහු; භගවතො, භාග්‍යවතුන් වහන්සේගේ; භාසිතං, දේශනාවට; අභිනන්දුං ඉති, ප්‍රීතිය ප්‍රකාශ කළහ.

15. ඉමස්මිඤ්ච පන වෙය්‍යාකරණස්මිං, මේ වෙය්‍යාකරණ ධර්මය; භඤ්ඤමානෙ, වදාළ කල්හි; ආයස්මතො කොණ්ඩඤ්ඤස්ස, ආයුෂ්මත් කොණ්ඩඤ්ඤ ස්ථවිරයන් වහන්සේට; විරජං, රජස් රහිත වූ; වීතමලං, පහ වූ කෙලෙස් මල ඇති; ධම්ම චක්ඛුං, දහම් ඇස (සෝවාන් මාර්ග ඥාණය) උදපාදි, පහළ විය; කෙසේ ද?; යංකිඤ්චි, යම් කිසිවක්; සමුදය ධම්මං, හටගන්නා ස්වභාවය ඇත්තේ ද; සබ්බං තං, ඒ සියල්ල; නිරොධ ධම්මං ඉති, නිරුද්ධවන ස්වභාවය ඇත්තේ ය.

16. භගවතා, භාග්‍යවතුන් වහන්සේ විසින්; ධම්ම චක්කෙ, මේ ධර්ම චක්‍රය; පවත්තිතෙ ච පන, පවත්වන ලද කල්හි; භුම්මා දෙවා, බූමාටු දෙවියෝ; සද්දං අනුස්සාවෙසුං, සාධු නාදය පැවැත්වූහ; (කෙසේ ද?) භගවතා, භාග්‍යවතුන් වහන්සේ විසින්; බාරාණසියං, බාරාණසි පුරයෙහි; ඉසිපතනෙ මිගදායෙ, මිගදාය නම් වූ ඉසිපතනාරාමයෙහි දී සමණෙන වා, ශ්‍රමණයෙකු විසින් හෝ; බ්‍රාහ්මණෙන වා, බමුණෙකු විසින් හෝ; දෙවෙන වා, දෙවියකු විසින් හෝ; මාරෙන වා, මාරයකු විසින් හෝ; බ්‍රහ්මුණා වා, බ්‍රහ්මයකු විසින් හෝ; ලොකස්මිං, ලෝකයෙහි; කෙනචි වා, අන් කිසිවකු විසින් හෝ; අප්පතිවත්තියං, නොපැවැත්විය හැකි වූ; අනුත්තරං ධම්ම චක්කං, (මේ) නිරුත්තර වූ ධර්ම චක්‍රය; පවත්තිතං, පවත්වන ලද්දේ ය කියා යි.

භුම්මානං දෙවානං, භූමි නිශ්‍රිත දෙවියන් ගේ; සද්දං සුත්වා, සාධු නාදය අසා; චාතුම්මහාරාජිකා දෙවා, චතුර්මහාරාජික දෙවියෝ ද; සද්දං අනුස්සාවෙසුං, ශබ්දය අනුශ්‍රාවණය කළාහු ය (කෙසේ ද); භගවතා, භාග්‍යවතුන් වහන්සේ විසින්; බාරාණසියං, බාරාණසියෙහි; මිගදායෙ, මිගදාය නම් වූ; ඉසිපතනෙ, ඉසිපතනාරාමයෙහි දී; සමණෙන වා, ශ්‍රමණයෙකු විසින් හෝ; බ්‍රාහ්මණෙන වා, බ්‍රාහ්මණයකු විසින් හෝ; දෙවෙන වා, දෙවියකු විසින් හෝ; මාරෙන වා, මාරයකු විසින් හෝ; බ්‍රහ්මුණා වා, බ්‍රහ්මයකු විසින් හෝ; ලොකස්මිං, ලෝකයෙහි; කෙනචි වා, අන් කිසිවකු විසින් හෝ; අප්පතිවත්තියං, නො පැවැත්විය හැකි වූ; එතං, මේ; නිරුත්තරං, නිරුත්තර වූ ධම්ම චක්කං, ධර්ම

Non-Commercial Distribution

චක්‍රය; පවත්තිතං, පවත්වන ලද්දේ ය කියා යි; චාතුම්මහාරාජිකානං, චාතුර්මහාරාජික දිව්‍යලෝක වාසී වූ; දෙවානං, දෙවියන් ගේ; සද්දං සුත්වා, සාධුකාර ශබ්දය අසා; තාවතිංසා දෙවා, තව්තිසා වැසි දෙවියෝ; සද්දං අනුස්සාවෙසුං, ශබ්දය අනුශ්‍රවණය කළහ; භගවතා, භාග්‍යවතුන් වහන්සේ විසින්; බාරාණසියං, බරණැස් නුවරෙහි; මිගදාය නම් වූ; ඉසිපතනෙ, ඉසිපතනාරාමයෙහි දී; සමණෙන වා, ශ්‍රමණයෙකු විසින් හෝ; බ්‍රාහ්මණෙන වා, බමුණකු විසින් හෝ; දෙවෙන වා, දෙවියකු විසින් හෝ; මාරෙන වා, මාරයකු විසින් හෝ; බ්‍රහ්මුණා වා, බ්‍රහ්මයකු විසින් හෝ; ලොකස්මිං, ත්‍රිවිධ ලෝකයෙහි; කෙනචි වා, කිසිවකු විසින් හෝ; අප්පතිවත්තියං, නො පැවැත්විය හැක්කා වූ; අනුත්තරං, අනුත්තර වූ; එතං ධම්ම චක්කං, මේ ධර්ම චක්‍රය; පවත්තිතං, පවත්වන ලද්දේ ය කියා යි.

තාවතිංසානං දෙවානං, තව්තිසා වැසි දෙවියන් ගේ; සද්දං සුත්වා, සාධුකාර ශබ්දය අසා; යාමා දෙවා, යාම දෙව්ලොව දෙවියෝ; සද්දං, සාධුකාර ශබ්දය; අනුස්සාවෙසුං, අනුශ්‍රාවණය කළහ; භගවතා, භාග්‍යවතුන් වහන්සේ විසින්; බාරාණසියං, බරණැස් නුවරෙහි; මිගදායෙ, මිගදාය නම් වූ; ඉසිපතනෙ, ඉසිපතනාරාමයෙහි දී; සමණෙන වා, ශ්‍රමණයකු විසින් හෝ; බ්‍රාහ්මණෙන වා, බමුණකු විසින් හෝ; දෙවෙන වා, දෙවියකු විසින් හෝ; මාරෙන වා, මාරයකු විසින් හෝ; බ්‍රහ්මුණා වා, බ්‍රහ්මයකු විසින් හෝ; ලොකස්මිං, ත්‍රිවිධ ලෝකයෙහි; කෙනචි වා, අන් කිසිවකු විසින් හෝ; අප්පතිවත්තියං, නො පැවැත්විය හැකි වූ; අනුත්තරං, අනුත්තර වූ; එතං ධම්ම චක්කං, මේ ධර්ම චක්‍රය; පවත්තිතං, පවත්වන ලද්දේ ය කියා යි; යාමානං දෙවානං, යාම දෙව් ලොව වැසි දෙවියන්ගේ; සද්දං සුත්වා, සාධුකාර ශබ්දය අසා; තුසිතා දෙවා, තුසිත දෙව් ලොව වැසි දෙවියෝ; සද්දං, සාධුකාර ශබ්දය; අනුස්සාවෙසුං, අනුශ්‍රාවණය කළහ; භගවතා, භාග්‍යවතුන් වහන්සේ විසින්; බාරාණසියං, බරණැස් නුවරෙහි; මිගදායෙ, මිගදාය නම් වූ; ඉසිපතනෙ, ඉසිපතනාරාමයෙහි; සමණෙන වා, ශ්‍රමණයෙකු විසින් හෝ; බ්‍රාහ්මණෙන වා, බමුණකු විසින් හෝ; දෙවෙන වා, දෙවියකු විසින් හෝ; මාරෙන වා, මාරයකු විසින් හෝ; බ්‍රහ්මුණා වා, බ්‍රහ්මයකු විසින් හෝ; ලොකස්මිං, ලෝකයෙහි; කෙනෙචි වා, අන් කිසිවකු විසින් හෝ; අප්පතිවත්තියං, නො පැවැත්විය හැකි වූ; අනුත්තරං, අනුත්තර වූ; එතං ධම්ම චක්කං, මේ ධර්ම චක්‍රය; පවත්තිතං, පවත්වන ලද්දේ ය කියා යි; තුසිතානං දෙවානං, තුසිත දෙව් ලොව වැසි දෙවියන් ගේ; සද්දං සුත්වා, සාධුකාර ශබ්දය අසා; නිම්මාණරති දෙවා, නිර්මාණරති දෙව් ලොව වැසි දෙවියෝ; සද්දං, සාධුකාර දෙමින්; අනුස්සාවෙසුං, අනුශ්‍රාවණය කළහ.

- පෙ - නිම්මාණරතිනං දෙවානං, නිර්මාණරති දෙවියන් ගේ; සද්දං සුත්වා, සාධුකාර ශබ්දය අසා; පරනිම්මිත වසවත්තිනො දෙවා, පරනිම්මිත වසවර්ති දෙවියෝ; සද්දං අනුස්සාවෙසුං, සාධුකාර දෙමින් ශබ්දය අනුශ්‍රාවණය කළහ, - පෙ - පරනිම්මිත වසවත්තිනොදෙවානං, පරනිර්මිත වසවර්ති දෙවියන් ගේ; සද්දං සුත්වා, සාධුකාර ශබ්දය අසා; බ්‍රහ්මපාරිසජ්ජා දෙවා, බ්‍රහ්මපාරිසජ්ජ නම් බඹලෝ වැසි දෙවියෝ; සද්දං අනුස්සාවෙසුං, සාධුකාර දෙමින් ශබ්දය අනුශ්‍රාවණය කළහ. - පෙ - බ්‍රහ්මපාරිසජ්ජානං දෙවානං, බ්‍රහ්මපාරිසජ්ජ නම් බඹලෝ වැසි දෙවියන් ගේ; සද්දං සුත්වා, සාධුකාර ශබ්දය අසා; බ්‍රහ්මපුරොහිතා දෙවා, බ්‍රහ්මපුරෝහිත නම් බඹලොව වැසි දෙවියෝ; සද්දං අනුස්සාවෙසුං, සාධුකාර දෙමින් ශබ්දය අනුශ්‍රාවණය කළහ. - පෙ - බ්‍රහ්මපුරොහිතානං දෙවානං, බ්‍රහ්මපුරෝහිත නම් බඹලෝ වැසි දෙවියන් ගේ; සද්දං සුත්වා, සාධුකාර ශබ්දය අසා; මහාබ්‍රහ්මා දෙවා, මහා බ්‍රහ්ම වැසිදෙවියෝ; සද්දං, සාධුකාර දෙමින්; අනුස්සාවෙසුං, අනුශ්‍රාවණය කළහ. - පෙ - මහාබ්‍රහ්මාණං දෙවානං, මහාබ්‍රහ්ම දෙවියන් ගේ; සද්දං සුත්වා, සාධුකාර ශබ්දය අසා; පරිත්තාභා දෙවා, පරිත්තාභ නම් දෙවියෝ; සද්දං, සාධුකාර දෙමින්; අනුස්සාවෙසුං, ශබ්දය අනුශ්‍රාවණය කළහ; - පෙ - පරිත්තාභානං දෙවානං, පරිත්තාභ නම් දෙවියන් ගේ; සද්දං සුත්වා, සාධුකාර ශබ්දය අසා; අප්පමාණාභා දෙවා, අප්පමාණාභා නම් බඹලොව වැසි දෙවියෝ; සද්දං, සාධුකාර දෙමින්; අනුස්සාවෙසුං, ශබ්දය අනුශ්‍රාවණය කළහ; - පෙ - අප්පමාණාභානං දෙවානං, අප්පමාණාභා නම් බඹලෝ වැසි දෙවියන් ගේ; සද්දං සුත්වා, සාධුකාර ශබ්දය අසා; ආභස්සරා දෙවා, ආභස්සර නම් බඹලෝ වැසි දෙවියෝ;

Non-Commercial Distribution

සද්දං, සාධුකාර දෙමින්; අනුස්සාවෙසුං, ශබ්දය අනුශ්‍රාවණය කළහ - පෙ - ආභස්සරානං දෙවානං, ආභස්සර නම් බඹලෝ වැසි දෙවියන් ගේ; සද්දං සුත්වා, සාධුකාර ශබ්දය අසා; පරිත්තසුභා දෙවා, පරිත්තසුභ නම් බඹලෝ වැසි දෙවියෝ; සද්දං, සාධුකාර දෙමින්; අනුස්සාවෙසුං, ශබ්දය අනුශ්‍රාවණය කළහ - පෙ - පරිත්තසුභානං දෙවානං, පරිත්තසුභා නම් බඹලෝ වැසි දෙවියන් ගේ; සද්දං සුත්වා, සාධුකාර ශබ්දය අසා; අප්පමාණසුභා දෙවා, අප්පමාණසුභ නම් බඹලෝ වැසි දෙවියෝ; සද්දං, සාධුකාර දෙමින්; අනුස්සාවෙසුං, ශබ්දය අනුශ්‍රාවණය කළහ; - පෙ - අප්පමාණසුභානං දෙවානං, අප්පමාණසුභ නම් බඹලෝ වැසි දෙවියන් ගේ; සද්දං සුත්වා, සාධුකාර ශබ්දය අසා; සුභකිණ්හකා දෙවා, සුභකිණ්හක නම් බඹලෝ වැසියෝ; සද්දං, සාධුකාර දෙමින්; අනුස්සාවෙසුං, ශබ්දය අනුශ්‍රාවණය කළහ - පෙ - සුභකිණ්හකානං දෙවානං, සුභකිණ්හක නම් බඹලෝ වැසි දෙවියන් ගේ; සද්දං සුත්වා, සාධුකාර ශබ්දය අසා; වෙහප්ඵලා දෙවා, වෙහප්ඵල නම් බඹලෝ වැසි දෙවියෝ; සද්දං, අනුස්සාවෙසුං, ශබ්දය අනුශ්‍රාවණය කළහ - පෙ - වෙහප්ඵලානං දෙවානං, වෙහප්ඵල නම් බඹලෝ වැසි දෙවියන් ගේ; සද්දං සුත්වා, සාධුකාර ශබ්දය අසා; අවිහා දෙවා, අවිහ නම් බඹලෝ වැසි දෙවියෝ; සද්දමනුස්සාවෙසුං, ශබ්දය අනුශ්‍රාවණය කළහ. - පෙ - අවිහානං දෙවානං, අවිහ නම් බඹලෝ වැසි දෙවියන් ගේ; සද්දං සුත්වා, සාධුකාර ශබ්දය අසා; අතප්පා දෙවා, අතප්ප නම් බඹලෝ වැසි දෙවියෝ; සද්දමනුස්සාවෙසුං, ශබ්දය අනුශ්‍රාවණය කළහ; - පෙ - අතප්පානං දෙවානං, අතප්ප නම් බඹලෝ වැසි දෙවියන් ගේ; සද්දං සුත්වා, සාධුකාර ශබ්දය අසා; සුදස්සා දෙවා, සුදස්ස නම් බඹලෝ වැසි දෙවියෝ; සද්ද මනුස්සාවෙසුං, ශබ්දය අනුශ්‍රාවණය කළහ; - පෙ - සුදස්සානං දෙවානං, සුදස්ස නම් බඹලෝ වැසි දෙවියන් ගේ; සද්දං සුත්වා, සාධුකාර ශබ්දය අසා; සුදස්සී දෙවා, සුදස්සී නම් බඹලෝ වැසි දෙවියෝ; සද්දං අනුස්සාවෙසුං, ශබ්දය අනුශ්‍රාවණය කළහ - පෙ - සුදස්සීනං දෙවානං, සුදස්සී නම් බඹලෝ වැසි දෙවියන් ගේ; සද්දං සුත්වා, සාධුකාර ශබ්දය අසා; අකනිට්ඨකා දෙවා, අකනිට්ඨක නම් බඹලෝ වැසි දෙවියෝ; සද්ද මනුස්සාවෙසුං, ශබ්දය අනුශ්‍රාවණය කළහ; කෙසේ ද? භගවතා, භාග්‍යවතුන් වහන්සේ විසින්; බාරාණසියං, බරණැස් නුවරෙහි; මිගදායෙ, මිගදාය නම් වූ; ඉසිපතනෙ, ඉසිපතනාරාමයේ දී; සමණෙන වා, ශ්‍රමණයෙකු විසින් හෝ; බ්‍රාහ්මණෙන වා, බමුණකු විසින් හෝ; දෙවෙන වා, දෙවියකු විසින් හෝ; මාරෙන වා, මාරයකු විසින් හෝ; බ්‍රහ්මුණා වා, බ්‍රහ්මයකු විසින් හෝ; ලොකස්මිං, ලෝකයෙහි; කෙනචි වා, කිසිවෙකු විසින් හෝ; අප්පතිවත්තියං, නො පැවැත්විය හැකි වූ; අනුත්තරං, අනුත්තර වූ; එතං ධම්ම චක්කං, මේ ධර්ම චක්‍රය; පවත්තිතං, පවත්වන ලද්දේ ය කියා යි.

17. ඉතිහ, මේ ආකාරයෙන්; තෙන ඛනෙන, එකෙණෙහි; තෙන මුහුත්තෙන, ඒ මොහොතෙහි; යාව බ්‍රහ්මලොකො, බඹලොව දක්වා; සද්දො, සාධුකාර ශබ්දය; අබ්භුග්ගඤ්ඡි, ඉතා උස්ව පැන නැංගේ ය; අයඤ්ච, දස සහස්සි ලොකධාතු මේ දශ සහශ්‍රී ලෝක ධාතුව ද; සංකම්පි, බොහෝ සෙයින් කම්පා විය; සම්පකම්පි, අතිශයින් ම කම්පා විය; සම්පවෙධි, විශේෂයෙන් ම කම්පිත විය; දෙවානං, දෙවියන් ගේ; දෙවානුභාවය; අතික්කම්ම, ඉක්මවා; අප්පමාණො ච, අප්‍රමාණ වූ; උළාරො, මහත් වූ; ඕභාසො, ආලෝකය; ලොකෙ, ලෝකයෙහි; පාතුරහොසි පහළ විය.

18. අථ ඛො, ඉක්බිති; භගවා, භාග්‍යවතුන් වහන්සේ; භො කොණ්ඩඤ්ඤො, භවත් කොණ්ඩඤ්ඤ තෙමේ; වත, ඒකාන්තයෙන්; අඤ්ඤාසි, චතුස්සත්‍යය දත්තේ ය; භො කොණ්ඩඤ්ඤා, භවත් කොණ්ඩඤ්ඤ තෙමේ; වත, ඒකාන්තයෙන්; අඤ්ඤාසි ඉති, චතුස්සත්‍යය අවබෝධ කළේ ය යි; උදානං, ප්‍රීති වාක්‍යයක්; උදානෙසි, පැවැත් වූ සේක; ඉති ඉහ ඉදං, මෙසේ මේ කාරණයෙහි දි; ආයස්මතො කොණ්ඩඤ්ඤස්ස, කොණ්ඩඤ්ඤ ආයුෂ්මතුන් වහන්සේට; අඤ්ඤාකොණ්ඩඤ්ඤොත්තෙව, අඤ්ඤාකොණ්ඩඤ්ඤය යන; නාමං, නාමය; අහොසි ඉති, වූයේ ය.

**දම්සක් පැවතුම් සුතුර යි.**

Non-Commercial Distribution

## (2)
## මහාසමය සුත්තං. — මහා සමය සූත්‍රය.

මෙ, මා විසින්; එවං සුතං, මෙසේ අසන ලදී. කෙසේ ද?; එකං සමයං, එක් සමයෙක්හි; භගවා, භාග්‍යවතුන් වහන්සේ; සක්කෙසු, ශාක්‍ය ජනපදයෙහි; කපිලවත්‍ථුස්මිං, කිඹුල්වත්පුර සමීපයෙහි වූ; මහා වනෙ, මහා වනයෙහි; සබ්බෙහි එව අරහන්තෙහි, සියලුදෙනා වහන්සේ ම රහත් බවට පැමිණියා වූ; පඤ්චමත්තෙහි භික්ඛු සතෙහි, පන්සියයක් භික්ෂූන් ගෙන් යුක්ත වූ; මහතා භික්ඛු සංඝෙන සද්ධිං, මහත් භික්ෂු සංඝයා සමග; විහරති, වැඩ වසන සේක; දසහි ච ලොකධාතුහි, දස දහසක් ලෝකධාතුවලින් ද; දෙවතා, දෙවියෝ; භගවන්තං, භාග්‍යවතුන් වහන්සේ ද; භික්ඛු සංඝඤ්ච, භික්ෂු සංඝයා ද; දස්සනාය, දැකීම පිණිස; යෙභුයෙ‍යන, බොහෝ සෙයින්; සන්නිපතිතා හොන්ති, රැස්වූවෝ වෙත්.

2. අථ බො, ඉක්බිති; චතුන්නං සුද්ධාවාස කායිකානං දෙවානං, සුද්ධාවාස බඹලොව වසන දෙවියන් සතර දෙනකුන්ට; එතදහොසි, මෙබඳු අදහසෙක් විය; අයං බො භගවා, මේ භාග්‍යවතුන් වහන්සේ; සක්කෙසු, ශාක්‍ය ජනපදයෙහි; කපිලවත්ථුස්මිං, කිඹුල්වත් නුවරෙහි වූ; මහාවනෙ, මහා වනයෙහි; සබ්බෙහිඑව අරහන්තෙහි, සියල්ලන් ම රහත් වූ; පඤ්චසතෙහි භික්ඛු සතෙහි, පන්සියයක් භික්ෂූන්ගෙන් යුක්ත වූ; මහතා භික්ඛු සංඝෙන සද්ධිං, මහත් භික්ෂු සංඝයා සමග; විහරති, වැඩවසන සේක; දසහි ච ලොක ධාතුහි දෙවතා, දස දහසක් ලෝක ධාතුවලින් ද දෙවියෝ; භගවන්තං, භාග්‍යවතුන් වහන්සේ ද; භික්ඛු සංඝඤ් ච, භික්ෂු සංඝයා ද; දස්සනාය, දැකීම පිණිස; යෙභුයෙ‍යන, බොහෝ සෙයින්; සන්නිපතිතා හොන්ති, රැස්වූවෝ වෙත්; මයම්පි, අපිදු; භගවා, භාග්‍යවතුන් වහන්සේ; යෙන, යම් තැනෙක්හි ද; තෙන, එතනට; උපසංකයෙ‍යාම, එළඹෙන්නෙමු නම්; උපසංකමිත්වා, එළඹ; භගවතො සන්තිකෙ; භාග්‍යවතුන් වහන්සේ ගේ සමීපයෙහි; පච්චෙක ගාථං, එක එක ගාථාවක්; භාසෙය්‍යාමා'ති, කියන්නෙමු නම්; යන්නූන, ඉතා යහපතැ'යි සිතූහ.

3. අථ බො, ඉක්බිති; තා දෙවතා, ඒ දේවතාවෝ; බලවා පුරිසො, බලවත් පුරුෂයෙක්; සම්මිඤ්ජිතං වා බාහං, හකුළුවන ලද අතක්; පසාරෙය්‍ය, දිගු කරන්නේ යම් සේ ද; පසාරිතං වා බාහං, දිගු කරන ලද අතක්; සම්මිඤ්ජෙය්‍ය, හකුල වන්නේ යම්සේ ද; එවමෙවං, එපරිද්දෙන් ම; සුද්ධාවාසෙසු, සුද්ධාවාස දෙවියන් කෙරෙහි; අන්තරහිතා, අතුරුදන් වූවෝ; භගවතො පුරතො, බුදුන් ගේ ඉදිරියෙහි; පාතුරහංසු, පහළ වූහ.

4. අථ බො, ඉක්බිති; තා දෙවතා, ඒ දේවතාවෝ; භගවන්තං, භාග්‍යවතුන් වහන්සේ; අභිවාදෙත්වා, මනාකොට වැඳ; එකමන්තං අට්ඨංසු, එකත් පසෙක සිටියාහු ය; එකමන්තං ඨිතා බො, එකත් පසෙක සිටියා ම වූ; එකා දෙවතා, එක් දේවතාවෙක්; භගවතො සන්තිකෙ, භාග්‍යවතුන් වහන්සේ ගේ සමීපයෙහි; ඉමං ගාථං අභාසි, මේ ගාථාව කීයේ යඃ

1. පවනස්මිං, මහා වනයෙහි; මහා සමයො, මහත් සමාගමයෙහි; දේවකායා, දිව්‍ය සමූහයෝ; සමාගතා, එක්රැස් වූහ; (අපි) අපරාජිත සංඝං, නො පරදවන ලද ආර්ය සංඝයා; දත්ඛිතායෙ, දක්නා පිණිස; ඉමං ධම්ම සමයං, මේ ධර්ම සමාගමයට; ආගතම්හ ඉති, ආවෝ වෙමු.

5. අථ බො, ඉක්බිති; අපරා දෙවතා, අන්‍ය දේවතාවෙක්; භගවතො සන්තිකෙ, භාග්‍යවතුන් වහන්සේ ගේ සමීපයෙහි; ඉමං ගාථං, මේ ගාථාව; අභාසි, කීයේ යඃ

2. තත්‍ර, ඒ ධර්ම සමාගමයෙහි; භික්ඛවො, භික්ෂූහු; අත්තනො චිත්තං, තමන්ගේ සිත; සමාදහංසු, එකඟ කළාහු ය; උජුකමකංසු, ඍජු කළාහු ය; නෙත්තානි ගහෙත්වා, රැහැන් ගත්; සාරථී ඉව, රියදුරකු මෙන්; පණ්ඩිතා, නුවණැත්තෝ; ඉන්ද්‍රියානි, ඉඳුරන්; රක්ඛන්ති, රකිති.

Non-Commercial Distribution

6. අථ ඛො, ඉක්බිති; අපරා දෙවතා, අන්‍ය දේවතාවෙක්; භගවතො සන්තිකෙ, භාග්‍යවතුන් වහන්සේ ගේ සමීපයෙහි; ඉමං ගාථං, මේ ගාථාව; අභාසි, කීයේ ය:

3. ඛීලං, රාගාදි කෙලෙස් නමැති හුල; ඡෙත්වා, සිඳ; පලිඝං ඡෙත්වා, රාගාදි කෙලෙස් පලිඝය හෙවත් කනයම; (දොර අගුල) සිඳ; ඉන්දඛීලං, රාගාදි ඉන්ද්‍රඛීලය; ඌහච්ච, උදුරා; අනෙජා, ඒ ජාය යි කියන ලද තෘෂ්ණා රහිත වූ; සුද්ධා, පිරිසිදු වූ; විමලා, නිර්මල වූ; චක්ඛුමතා, පසැස් ඇත්තා වූ බුදුන් විසින්; සුදන්තා, මොනවට දමනය කරන ලද; තෙ සුසුනාගා, ඒ තරුණ රහත්හු; චරන්ති, සිව්දිගින් හැසිරෙත්.

7. අථ ඛො, ඉක්බිති; අපරා දෙවතා, අනෙක් දේවතාවෙක්; භගවතො සන්තිකෙ, භාග්‍යවතුන් වහන්සේ ගේ සමීපයෙහි; ඉමං ගාථං, මේ ගාථාව; අභාසි, කීයේ ය:

4. යෙ කෙචි, යම්කිසි කෙනෙක්; බුද්ධං සරණං, බුදුන් සරණ; ගතාසෙ, ගියාහු ද; තෙ, ඔවුහු; අපායං, අපායට; න ගමිස්සන්ති, නො යෙත්; මානුසං දෙහං, මිනිස් සිරුර; පාහාය, හැර; දෙවකායං, දේව සමූහයා; පරිපූරෙස්සන්ති, සම්පූර්ණ කරන්නාහු ය.

8. අථ ඛො, ඉක්බිති; භගවා, භාග්‍යවතුන් වහන්සේ; භික්ඛූ, භික්ෂූන්; ආමන්තෙසි, ඇමතූ සේක; භික්ඛවෙ, මහණෙනි; දසසු ලොකධාතුසු දෙවතා, දස දහසක් සක්වල දෙවියෝ; තථාගතං, තථාගතයන් වහන්සේ ද; භික්ඛු සංඝඤ්ච, භික්ෂු සංඝයා ද; දස්සනාය, දැකීම පිණිස; යෙභුයෙ‍්‍යන, බොහෝ සෙයින්; සන්නිපතිතා, රැස්වූහ; භික්ඛවෙ, මහණෙනි; අතීතමද්ධානං, අතීත කාලයෙහි; අරහන්තො, අර්හත් වූ; යෙ පි තෙ, යම් ඒ; සම්මාසම්බුද්ධා, සම්‍යක් සම්බුද්ධයන් වහන්සේලා; අහෙසුං, වූවාහු ද; තෙසම්පි භගවන්තානං, ඒ භාග්‍යවතුන් වහන්සේලාට ද; එතපරමායෙව දෙවතා, මෙපමණ ම දේවතාවෝ; සන්නිපතිතා අහෙසුං, රැස්වූහ; සෙය්‍යථාපි මය්හං එතරහි, දැන් මගේ දැක්මට යම්සේ රැස්වූහු ද, එපරිද්දෙනි.

9. භික්ඛවෙ, මහණෙනි; අනාගත මද්ධානං, අනාගත කාලයෙහි; අරහන්තො, අර්හත් වූ; යෙතෙ සම්මාසම්බුද්ධා, යම් ඒ සම්‍යක් සම්බුදුවරයෝ; භවිස්සන්ති, වන්නාහු ද; තෙසම්පි භගවන්තානං, ඒ භාග්‍යවතුන් වහන්සේලාට ද; එතපරමායෙව, මෙපමණ ම; දෙවතා, දේවතාවෝ; සන්නිපතිතා භවිස්සන්ති, රැස්වන්නාහු ය; මය්හං සෙය්‍යථාපි එතරහි, මට දැන් යම්සේ ද, එපරිද්දෙනි.

භික්ඛවෙ, මහණෙනි; දෙවකායානං නාමානි, දිව්‍ය සමූහයන් ගේ නාමයන්; ආචික්ඛිස්සාමි, කියන්නෙමි; භික්ඛවෙ, මහණෙනි; දෙවකායානං නාමානි, දිව්‍ය සමූහයන් ගේ නාමයන්; කිත්තයිස්සාමි, කීර්තනය කරන්නෙමි; භික්ඛවෙ, මහණෙනි; දෙවකායානං නාමානි, දේව සමූහයන් ගේ නාමයන්; දෙසිස්සාමි, දේශනා කරන්නෙමි; තංසුනාථ, එය අසව්; සාධුකං මනසිකරොථ, මනාකොට මෙනෙහි කරව්; භාසිස්සාමි ඉති, කියන්නෙමි'යි වදාළ සේක; තෙ භික්ඛූ, ඒ භික්ෂූහු; එවං භන්තෙති ඛො, එසේ ය ස්වාමීනි'යි කියා; භගවතො, භාග්‍යවතුන් වහන්සේට; පච්චස්සොසුං, පිළිවදන් දුන්හ; භගවා, භාග්‍යවතුන් වහන්සේ; එතං අවොච, මෙය වදාළ සේක:

10. සිලොකං අනුකස්සාමි, ගාථා ප්‍රබන්ධ වශයෙන් වර්ණණයක් ප්‍රකාශ කරන්නෙමි; යත්‍ථ, යම් තැනෙක්හි; භුම්මා, භූම්‍යාඝථ දෙවියෝ වෙත් ද; (ඔවුහු) තදස්සිතා, ඒ ඒ ස්ථාන ඇසුරු කළාහු ය; පහිතත්තා, භාවනාවට යවන ලද සිත් ඇති; සමාහිතා, එකඟ වූ සිත් ඇති; ලොමහංසාභි සම්භූනො, ලොමු දැහැගැනීම් අභිභවන කළා වූ; ඔදාතමනසා, පිරිසිදු සිත් ඇති; සුද්ධා, එහෙයින් පිරිසිදු වූ; විප්පසන්නං අනාවිලා. අතිශයින් ප්‍රසන්න වූ නො කැළඹුනා වූ සිත් ඇති; පුථුසිහාවසල්ලිනා, කේශර සිංහරාජයන් මෙන් සැඟවුනා වූ; යෙ, යම් බොහෝ රහත්හු ද; ගිරිගබ්භාරං ඨිතා, පර්වත ගුහා ඇසුරු කළාහු ය.

Non-Commercial Distribution

11. තතො, ඉක්බිති; සත්‍ථා, ශාස්තෘන් වහන්සේ; කාපිලවත්‍ථුවෙ, කිඹුල්වත් නුවර සමීප වූ; වනෙ, මහ වනයෙහි; සාසනෙ රතෙ, බුදු සස්නෙහි ඇලුනා වූ; භීයොයා පඤ්චසෙත, බුදුරදුන් අධික කොට ඇති පන්සියයක්; සාවකෙ, ශ්‍රාවකයන්; ඤත්‍වා, දැන; ආමන්තෙසි, ආමන්ත්‍රණය කළ සේක:

12. භික්ඛවෙ, මහණෙනි; දෙවකායා අභික්කන්තා, දිව්‍ය සමූහයා රැස්වූවාහු ය; තෙ විජානාථ, ඒ දේව සමූහයා මනා කොට දිවැසින් දනිව්; තෙ ච, ඒ භික්ෂූහු ද; බුද්ධස්ස සාසනං, බුදුරදුන් ගේ හස්න; සුත්‍වා, අසා; ආතප්පං, වියඪිය; අකරුං, කළාහු ය.

13. තෙසං, ඒ භික්ෂූන්ට; අමනුස්සාන දස්සනං, අමනුෂ්‍යයන්ගේ දැකීම ඇති; ඤාණං, දිව්‍යඥනය; පාතුරහු, පහළ විය; අප්පෙ කෙ, ඇතැම් රහත්හු; සතං අද්දක්ඛුං, අමනුෂ්‍යයන් සියයක් දුටහ; අප්පෙකෙ, ඇතැම් රහත්හු; සහස්සං, දහසක් ද; අථ, නැවත; සත්තතිං සහස්සං, සැත්තෑ දහසක් දුටහ.

14. එකෙ, ඇතැම් රහත්හු; අමනුස්සානං, දෙවාදි, අමනුෂ්‍යයන්; සතං සහස්සානං අද්දසුං, සියක් දහසක් ද දුටහ; අප්පෙකෙ, සමහර රහත්හු; අනන්තමද්දක්ඛුං, අප්‍රමාණ දිව්‍ය බ්‍රහ්මයන් දුටහ; කෙසේ ද? සබ්බාදිසා, සියලු දිසාවෝ; ඵුටා අහු, (අවකාශ රහිත වූහ) දෙවි බඹුන්ගෙන් පිරී ගියහ.

15. චක්ඛුමා, පසස් ඇත්තාවූ ශාස්තෘන් වහන්සේ; තඤ්ච සබ්බං, ඒ සියල්ලම; අභිඤ්ඤාය, විශිෂ්ට ඥනයෙන් දැන; වවක්ඛිත්‍වාන, තීරණය කොට; තතො, නැවත; සාසනෙ රතෙ, සසුනෙහි ඇලුනා වූ; සාවකෙ, ශ්‍රාවකයන් ආමන්තයි, ඇමැතූ සේක:

16. භික්ඛවෙ, මහණෙනි; දෙවකායා, දිව්‍ය සමූහයා; අභික්කන්තා, රැස්වූහ; අහං, මම; වො, තොපට; යෙ, යම් දේව බ්‍රහ්මාදි කෙනෙකුන්; ගිරාහි, වචනවලින්; අනුපුබ්බසො, පිළිවෙලින්; කිත්තයිස්සාමි, ප්‍රකාශ කරන්නෙමි; තෙ, ඔවුන්; විජානාථ, දනිව්:

17. කාපිලවත්ථවා, කිඹුල්වත්පුර වැසි; ඉද්ධිමන්තො, ඍද්ධිමත් වූ; ජුතිමන්තො, බැබලීම් ඇති; වණ්ණවන්තො, ශරීර වර්‍ණවත් වූ; යසස්සිනො, යසස් ඇති; සත්ත සහස්සා, සත් දහසක්; භුම්මා යක්ඛා, භූමිනිශ්‍රිත දෙවියෝ; මොදමානා, සතුටු වෙමින්; භික්ඛුනං, භික්ෂූන් ගේ; සමිතිං, සමාගමය වූ; වනං,මහාවනයට; අභික්කාමුං, පැමිණියාහු ය.

18. හෙමවතා, හිමවත්හි වූ; නානත්තවණ්ණිනො, නොයෙක් ශරීර වර්‍ණ ඇති; ඉද්ධිමන්තො, ඍද්ධිය ඇත්තා වූ; ජුතිමන්තො, බැබලීම් ඇත්තා වූ; වණ්ණවන්තො, වර්‍ණවත් වූ; යසස්සිනො, යස පිරිවර ඇති; ඡසහස්සා යක්ඛා, ස දහසක් දෙවියෝ; මොදමානා, සතුටු වූවා හු; භික්ඛුනං සමිතිං, භික්ෂූන් ගේ සමාගමය වූ; වනං, මහාවනයට; අභික්කාමුං, පැමිණියාහු ය.

19. සාතාගිරා, සාතාගිරි නම් පර්‍වත වාසි වූ; නානත්තවණ්ණිනො, නොයෙක් ශරීර වර්‍ණ ඇති; ඉද්ධිමන්තො, ඍද්ධිය ඇත්තා වූ; ජුතිමන්තො, බැබලීම් ඇත්තා වූ; වණ්ණවන්තො, වර්‍ණවත් වූ; යසස්සිනො, යස පිරිවර ඇත්තා වූ; ති සහස්සා යක්ඛා, තුන් දහසක් (යක්ෂයෝ) දෙවියෝ; මොදමානා, සතුටු වූවා හු; භික්ඛුනං සමිතිං, භික්ෂූන් ගේ සමාගම වූ; වනං, මහාවනයට; අභික්කාමුං, පැමිණියාහු ය.

20. ඉති, මෙසේ; නානත්තවණ්ණිනො, නානාවිධ ශරීර වර්‍ණ ඇති; ඉද්ධිමන්තො, ඍද්ධි ඇත්තා වූ; ජුතිමන්තො, කාන්තිමත් වූ; වණ්ණවන්තො, ශරීර වර්ණ ඇති; යසස්සිනො, යසස් ඇත්තා වූ; එතෙ සොළස සහස්සා යක්ඛා, මේ සොළොස් දහසක් යක්ෂයෝ (දෙවියෝ); මොදමානා, සතුටු වූවා හු; භික්ඛුනං සමිතිං, භික්ෂූන් ගේ සමාගමය වූ; වනං, මහාවනයට; අභික්කාමුං, පැමිණියාහු ය.

Non-Commercial Distribution

21. වෙස්සාමිත්තා; වෙස්සාමිත්ත නම් පර්වත වැසි; නානත්තවණ්ණිනො, නොයෙක් ශරීර වර්ණ ඇති; ඉද්ධිමන්තො, සෘද්ධිමත් වූ; ජුතිමන්තො, කාන්තිමත් වූ; වණ්ණවන්තො, වර්ණවත් වූ; යසස්සිනො, යසස් ඇත්තා වූ; පඤ්චසතා යක්ඛා, පන්සියයක් යක්ෂයෝ (දෙවියෝ); මොදමානා, සතුටු වූවා හු; භික්ඛූනං සමිතිං, භික්ෂූන් ගේ සමාගමය වූ; වනං, මහාවනයට; අභික්කාමුං, පැමිණියාහු ය.

22. රාජගහිකො, රජගහනුවර වැසි; කුම්භීරො, කුම්භීර නම් යක් සෙනෙවියෙක් වෙයි; අස්ස නිවෙසනං, ඔහු ගේ නිවාසස්ථානය; වෙපුල්ලං, වේපුල්ල පර්වතය යි; තං, යක්ෂ සමූහයා අතුරෙන්; භියොයා යක්ඛානං සතසහස්සං, ලක්ෂයකට වැඩි යක්ෂයන්; පයිරුපාසති, හේ ඇසුරු කෙරෙයි; රාජගහිකො සොපිකුම්භීරො, රජගහනුවර උපන් ඒ කුම්භීර තෙමේත්; සමිතිං, භික්ෂු සමාගමය වූ; වනං, මහාවනයට; ආග, පැමිණියේ ය.

23. පුරිමඤ්ච දිසං රාජා, පූර්වදිසා භාගයෙහි රජ වූ; යසස්සි, යසස් ඇත්තා වූ; ධතරට්ඨො, ධෘතරාෂ්ට්‍ර නම් වූ වරම් රජතෙමේ; තං, ඒ පූර්ව දිසාවට; පසාසති, අනුශාසනා කෙරේ ද?; ගන්ධබ්බානං ආධිපති, ගාන්ධර්වයන්ට අධිපති වූ; සො මහාරාජා, ඒ වරම් මහරජ තෙමේ ද;

තස්ස, ඔහු ගේ; ඉන්ද නාමා, ඉන්ද යන නම් ඇති; මහබ්බලා, මහත් බල ඇති; ඉද්ධිමන්තො, සෘද්ධි ඇත්තා වූ; ජුතිමන්තො, කාන්තිමත් වූ; වණ්ණවන්තො, වර්ණවත් වූ; යසස්සිනො, යස පිරිවර ඇති; බහවො පුත්තාපි, බොහෝ පුත්‍රයෝ ද; මොදමානා, සතුටු වූවා හු; භික්ඛූනං, භික්ෂූන් ගේ; සමිතිං, සමාගමය වූ; වනං, මහාවනයට; අභික්කාමුං, පැමිණිය හ.

24. දක්ඛිණඤ්ච දිසං රාජා, දකුණු දිසා භාගයෙහි රජ වූ; විරුළ්හො, විරූඪ නම් වරම් රජතෙමේ; තං, ඒ දකුණුදිග වැසි කුම්භාණ්ඩයන්ට; පසාසති, අනුශාසනා කෙරේ; කුම්භාණ්ඩානං ආධිපති, කුම්භාණ්ඩයන්ට අධිපති වූ; යසස්සී, යසස් ඇති; සො මහාරාජා, ඒ මහාරජ තෙමේ ද;

තස්ස, ඔහු ගේ; ඉද්ධිමන්තො, සෘද්ධිමත් වූ; ජුතිමන්තො, කාන්තිමත් වූ; වණ්ණවන්තො, ශරීරවර්ණ ඇති; යසස්සිනො, යසස් පිරිවර ඇත්තා වූ; මහබ්බලා, මහත් බල ඇති; ඉන්ද නාමා, ඉන්ද යන නම් ඇති; පුත්තාපි බහවො, බොහෝ වූ පුත්‍රයෝ ද; මොදමානා, සතුටු වූවා හු; භික්ඛූනං, සමිතිං; භික්ෂූන් ගේ සමාගමය වූ; වනං, මහාවනයට; අභික්කාමුං, පැමිණිය හ.

25. පච්ඡිමඤ්ච දිසං රාජා, පශ්චිම දිසාවෙහි රජ වූ; විරූපක්ඛො, විරූපාක්ෂ නම් වරම් රජතෙමේ; තං, ඒ පශ්චිම දිශාවට; පසාසති, අනුශාසනා කෙරේ; නාගානං ආධිපති, නාගයන්ට අධිපති වූ; යසස්සී, යසස් ඇති; සො මහාරාජා, ඒ වරම් මහාරජ තෙමේ ද; තස්ස, ඒ මහරජහු ගේ; ඉන්ද නාමා, ඉන්ද යන නම් ඇති; මහබ්බලා, මහත් බල ඇති; ඉද්ධිමන්තො, සෘද්ධිමත් වූ; ජුතිමන්තො, කාන්ති ඇත්තා වූ; වණ්ණවන්තො, වර්ණවත් වූ; යසස්සිනො, යස පිරිවර ඇති; බහවො පුත්තාපි, බොහෝ පුත්‍රයෝ ද; මොදමානා, සතුටු වූවා හු; භික්ඛූනං, සමිතිං; භික්ෂූන් ගේ සමාගමය වූ; වනං, මහාවනයට; අභික්කාමුං, පැමිණිය හ.

26. උත්තරං ච දිසා රාජා, උත්තර දිසාවෙහි රජ වූ; කුවෙරො, කුවේර නම් වූ වෙසමුණි රජතෙමේ; තං, ඒ උතුරු දිශාවට; පසාසති අනුශාසනා කෙරේ; යක්ඛානං ආධිපති, යක්ෂයන්ට අධිපති වූ; යසස්සී, යසස් ඇත්තා වූ: සො මහාරාජා, ඒ වරම් මහාරජ තෙමේ ද; තස්ස, ඒ මහරජහු ගේ; ඉන්ද නාමා, ඉන්ද යන නම් ඇති; මහබ්බලා, මහත් බලවත් වූ; ඉද්ධිමන්තො, සෘද්ධිමත් වූ; ජුතිමන්තො, කාන්තිමත් වූ; වණ්ණවන්තො, වර්ණවත් වූ; යසස්සිනො, යස පිරිවර ඇති; බහවො පුත්තාපි, බොහෝ පුත්‍රයෝ ද; මොදමානා, සතුටු වූවා හු; භික්ඛූනං සමිතිං භික්ෂූන් ගේ සමාගමය වූ; වනං, මහාවනයට; අභික්කාමුං, පැමිණිය හ.

Non-Commercial Distribution

27. පුරිමං දිසං, පෙරදිග; ධතරට්ඨො, ධෘතරාෂ්ට්‍ර නම් වරම් රජ ද; දක්ඛිණෙන, දකුණුදිග, විරූළ්හකො, විරූඪ නම් වරම් රජ ද; පච්ඡිමෙන, පැසුළුදිග; විරූපක්ඛො, විරූපාක්ෂ නම් වරම් රජ ද; උත්තරං දිසං, උතුරුදිග; කුවෙරො, කුවේර නම් වෛශ්‍රවණ වරම් රජ ද යන; තෙ චත්තාරො මහාරාජා, ඒ සතරවරම් මහරජ දරුවෝ; සමන්තා, හාත්පසින්; චතුරො දිසා, සිව්දිග; කාපිලවත්ථවෙ, කිඹුල්වත්පුරයෙහි වූ; වනෙ, මහාවනයෙහි; දද්දල්ලමානා, බබලවන්නා හු; අට්ඨංසු, සිටියාහු ය.

28. තෙසං, ඒ වරම් මහරජුන් ගේ; මායාවිනො, මායා ඇත්තා වූ; වඤ්චනිකා, වංචා කරන්නා වූ; සඨා, කෛරාටික වූ; දාසා, දාස බවට ගියා වූ; මායා, මායාකාර වූ; කුටෙණ්ඩු කුටෙණ්ඩු ය; වෙටෙණ්ඩු, වේටෙණ්ඩු ය; විටුච්ච, විටුච්ච ය යන මොහු ද; සහ, ඔවුන් සමග; විටුඩො, විටුඩ තෙමේ ද; ආගු, පැමිණියේ ය; චන්දනො, චන්දන ය; කාමසෙට්ඨො ච, කාමසෙට්ඨ ය; කින්නුඝණ්ඩු, කින්නුඝණ්ඩු ය; නිඝණ්ඩු ච, නිඝණ්ඩු ය යන නම් ඇති දාසයෝ පැමිණියාහු ය.

29. පනාදො, පනාද ය; ඔපමඤ්ඤො ච, ඔපමඤ්ඤ ය; දෙවසූතො ච, දිව්‍ය රථාචාරී වූ; මාතලී, මාතලී දිව්‍ය පුත්‍ර ය; ගන්ධබ්බො, ගාන්ධර්ව වූ; චිත්තසෙනො, චිත්තසේන නම් ගාන්ධර්ව දිව්‍ය පුත්‍ර ය; නළො, නළකාර නම් වූ දිව්‍ය පුත්‍ර තෙමේ ද; ජනසභො, ජනේසභ නම් දිව්‍ය පුත්‍ර තෙමේ ද; ආගු පැමිණියෝ ය; පඤ්චසිඛො, පඤ්චසිඛ නම් දිව්‍ය පුත්‍ර තෙමේ ද; තිම්බරූ, තිම්බරූ නම් ගාන්ධර්ව දිව්‍ය පුත්‍ර තෙමේ ද; සූරියවච්චසා, සූරියවච්චසා නම් දේවතා දුව ද පැමිණියා ය.

30. එතෙ ච රාජානො, මේ ගාන්ධර්ව රජහු ද; අඤ්ඤෙ ච ගන්ධබ්බා, අන්‍ය ගාන්ධර්වයෝ ද; රාජුහි සහ, රජුන් සමග; මොදමානා, සතුටු වූවාහු; භික්ඛූනං සමිතිං, භික්ෂූන් ගේ සමිතිය වූ; වනං, මහාවනයට; අභික්කාමුං, පැමිණිය හ.

31. අථ, ඉක්බිති; නාභසානාගා, නාභස නම් විල වැසි නාගයෝද; වෙසාලා, විශාලා වැසි නාගයෝ; තච්ඡකා සහ ආගු තච්ඡක නම් නා පිරිස සමග ආවෝ ය; කම්බල අස්සතරා, කම්බල අස්සතර කුල දෙක්හි නාගයෝ ද; පායාගා, පායාග නම් තීර්ථයෙහි වැසි නාගයෝ ද; ඤාතිහි සහ, ඤාතීන් සමග ආවෝ ය; යසස්සිනො, යසස් ඇති; යාමුනා, යමුනා නාගයෝ ද; ධතරට්ඨා නාගා ච, ධෘතරාෂ්ට්‍ර නම් නාගයෝ ද; ආගු ආවෝ ය; සොපි එරාවණො මහා නාගො, එරාවණ නම් ඒ මහා නාග තෙමේ ද; සමිතිං, භික්ෂූන් ගේ සමාගමය වූ; වනං, මහා වනයට; ආග, පැමිණියේ ය.

32. යෙ, යම් පක්ෂී කෙනෙක්; නාගරාජෙ සහසා හරන්ති, නාරජුන් සැහැසිව ගෙන යෙද්ද; දිබ්බා, දිව්‍ය ආනුභාව ඇති; දිජා, දෙවරක් උපන්නා වූ; පක්ඛී, පියාපත් ඇති; විසුද්ධ චක්ඛු, පිරිසිදු ඇස් ඇති; තෙ, ඒ පක්ෂීහු ද; වෙහාසයා, අහසින්; වනමජ්ඣපත්තා, මහවන මැදට පැමිණියාහු ය; චිත්‍රාසුපණ්ණා ඉති, චිත්‍රය, සුපණ්ණය යනු; තෙසං, ඒ ගරුඬ පක්ෂීන් ගේ; නාමානි, නාමයෝ යි.

33. තදා, එකල්හි; නාගරාජානං, නා රජුන්ට; අභයං ආසි, අභය වූයේ ය; බුද්ධො, බුදුරජතෙම; සුපණ්ණතො, ගුරුළන් කෙරෙන්; ඛෙමං අකාසි, නිර්භය කෙළේ ය; නාගා, නාගයෝ ද; සුපණ්ණා, ගුරුළෝ ද; සණ්හාහි වාචාහි, මොළොක් වචනවලින්; උපව්හයන්තා, කැඳවනු ලබන්නෝ; බුද්ධං සරණං අගංසු, බුදුන් සරණ ගියෝ ය.

34. වජිරහත්ථෙන, විදුරත් නම් සක්දෙව් රජහු විසින්; සමුද්දං සිතා, මුහුද ඇසුරු කරන්නා වූ; අසුරා, අසුරයෝ; ජිතා, ජයගන්නා ලද හ; වාසවස්ස භාතරො, සක්දෙව් රජහු ගේ සහෝදර වූ; එතෙ, තෙල අසුරයෝ; ඉද්ධිමන්තො, ඍද්ධි ඇත්තා හ; යසස්සිනො, යසස් ඇත්තාහු ද වෙති.

මහාභිංසි, මහත් බියකරු වූ; කාලකඤ්ජා, කාලකඤ්ජ නම් අසුරයෝ ද; දානවෙඝසා, දානවෙඝස ය නම් අසුරා, අසුරයෝ ද; වෙපචිත්ති, වෙපචිත්ති ය; සුචිත්ති ච, සුචිත්තී ය; පහාරාදො, පහාරාද ය යන අසුරයෝ ද; සහනමුචි, වසවත් මරු සමග ආවෝ ය.

Non-Commercial Distribution

35. සබ්බෙ, සියල්ලෝ; වෙරොච නාමකා, වෙරෝච නම් ඇත්තාහු; බලිපුත්තානං සතඤ්ච, බලි අසුරේන්ද්‍රයා ගේ පුත්‍රයෝ සියයක් ද; බලිංසෙනං, බලසෙනග ගෙන; සන්නයිහිත්වා, සැරසී; රාහුභද්දං උපාගමුං, රාහු අසුරේන්ද්‍රයා වෙත පැමිණියෝ ය; භද්දං තෙ, ඔබවහන්සේට යහපතක් වේවා; ඉදානි, දැන්; භික්ඛූනං සමිතිං, රහත් භික්ෂූන් ගේ සමාගමය වූ; වනං, මහාවනයට යෑමට; සමයො, සුදුසු කාලයයි.

36. ආපො ච දෙවා, ආපෝ කසින වැඩූ ආපෝ දේවතාවෝ ද; පඨවිච, පෘථිවි දේවතාවෝ ද; තෙජො, තේජෝ දේවතාවෝ ද; වායො, වායෝ දේවතාවෝ ද; වරුණා, වරුණ දෙවියෝ ද; වාරුණා දෙවා, වාරුණය යන දෙවියෝ ද; සොමො ච, සෝම නම් දෙවි තෙමේ ද; යසසා සහ, යස නම් දෙවියන් සමග; තදාගමුං, එදා ආහ.

යසස්සිනො, යසස් ඇත්තා වූ; මෙත්තා කරුණා කායිකා, මෙත්තා කායික, කරුණා කායික යන; දෙවා, දෙවියෝ ද; ආගු පැමිණිය හ; සබ්බෙ, සියල්ලෝ ම; නානත්තවණ්ණිනො, නානා වර්ණවත් වූහු; දසධාකායා, දසවිධ කොටසක් වූ; ඉද්ධිමන්තො, ඍද්ධි ඇත්තා වූ; ජුතිමන්තො, කාන්තිමත් වූ; වණ්ණවන්තො, වර්ණවත් වූ; යසස්සිනො, යස පිරිවර ඇත්තා වූ; එතෙ දස, මේ දසවිධ දේව සමූහයා; මොදමානා, සතුටු වූවා හු; භික්ඛූනං සමිතිං, රහත් භික්ෂූන් ගේ සමාගමය වූ; වනං, මහාවනයට; අභික්කාමුං, පැමිණියාහු ය.

37. වෙණ්හු ච දෙවා, වෙණ්හු නම් දෙවියෝ ද; සහලී ච දෙවා, සහලී නම් දෙවියෝ ද; අසමා ච, අසම නම් දෙවියෝ ද; ද්වෙයමා, යමක නම් දෙවියෝ දෙදෙනා ද; චන්දං පුරක්ඛත්වා, සඳ දෙව්රදුන් පෙරටුකොට; චන්දස්සූපනිසා දෙවා, සඳ දෙව්රදුන් ඇසුරු කරන දෙවියෝ ද; ආගු පැමිණියාහු ය.

සුරිස්සූපනිසා දෙවා, හිරු ඇසුරු කරන දෙවියෝ ද; සූරියං, පුරක්ඛත්වා, හිරු දෙව්රදුන් පෙරටුකොට ද; නක්ඛත්තානි පුරක්ඛත්වා, නැකත් තරු ආශ්‍රිත දෙවියෝ නැකත් තරු පෙරටුකොට ද; ආගු ආහ; මන්දවලාහකා, මන්දවලාහක නම් දෙවියෝ ද; ආගු, පැමිණියාහු ය; වසුනං සෙට්ඨො. වසු දෙවියන්ට ශ්‍රේෂ්ඨ වූ; වාසවො, වාසව නම් වූ ද; පුරින්දදො, පුරින්දද නම් වූ; සක්කො අපි, සක්දෙව් රජ තෙමේත්; ආගු ආයේ ය; සබ්බෙ, සියල්ලෝ ම; නානත්තවණ්ණිනො, නානා වර්ණ ඇත්තා හු; ඉද්ධිමන්තො, ඍද්ධිමත් වූහු; ජුතිමන්තො, කාන්තිමත් වූහු; වණ්ණවන්තො, වර්ණවත් වූහ; යසස්සිනො, යස පිරිවර ඇත්තා වූ; එතෙ දස, මේ දසදෙන; දසධාකායා, දස පරිද්දක් ව; මොදමානා, සතුටු වූවා හු; භික්ඛූනං සමිතිං, අර්හත් භික්ෂූන්ගේ සමාගමය වූ; වනං, මහාවනයට; අභික්කාමුං, පැමිණියාහු ය.

38. අථ, නැවත; ජලමග්ගිසිඛාරිව, ගිනිසිළු මෙන් දිලිසෙන; සහභූ දෙවා, සහභූ නම් දෙවියෝ ද; අරිට්ඨකා ච, අරිට්ඨක නම් දෙවියෝ ද; රොජා ච, රෝජ නම් දෙවියෝ ද; උම්මාපුප්ඵ නිභාසිනො, දියබෙරලිය මල් පැහැයෙන් බබලමින්; ආගු පැමිණියාහු ය.

වරුණා, වරුණ ය; සහධම්මා ච, සහධම්ම ය; අච්චුතා ච, අච්චුත ය; අනෙජකා, අනේජකා ය; සූලෙය්‍යාය, සූලෙය්‍ය ය; රුචිරා, රුචිර ය යන දෙවියෝ ද; ආගු ආවාහු ය; වාසවනෙසිනො, වාසවනෙසි නම් දෙවියෝ ද; ආගු ආවෝ ය.

සබ්බෙ, සියල්ලෝ; නානත්ත වණ්ණිනො, නානා ශරීර වර්ණයෙන් බබලන්නා හු; දසධාකායා, දස පරිද්දකින් සමූහ වූ; ඉද්ධිමන්තො, ඍද්ධිය ඇත්තා වූ; ජුතිමන්තො, කාන්තිමත් වූ; වණ්ණවන්තො, වර්ණවත් වූ; යසස්සිනො, යසස් ඇත්තා වූ; එතෙ දස, මේ දසදෙන; මොදමානා, සතුටු වූවා හු; භික්ඛූනං සමිතිං, රහත් භික්ෂූන් ගේ සමාගමය වූ; වනං, මහාවනයට; අභික්කාමුං, පැමිණියාහු ය.

Non-Commercial Distribution

39. සමානා, සමාන ය; මහා සමානා, මහා සමාන ය; මානුසා, මානුස ය; මානුසුත්තමා, මානුසුත්තම ය යන දෙවියෝ; ආගු, ආවෝ ය; ඛිඩ්ඩාපදූසිකා, ඛිඩ්ඩාපදූසිකා ය; මනෝපදූසිකා, මනෝපදූසිකා ය යන දෙවියෝ ද; ආගු ආවෝ ය.

අථ, නැවත; හරයො දෙවා, හරි නම් ඇති දෙවියෝ ද; යෙ ච ලොහිත වාසිනො, ලෝහිතවාසි නම් වූ යම් දෙවි කෙනෙක් වෙත් ද ඔවුහු ද; ආගු, පැමිණියාහු ය; පාරගා, පාරග නම් වූ ද; මහාපාරගා, මහාපාරග නම් වූ ද; යසස්සිනො දෙවා, යසස් ඇත්තා වූ දෙවියෝ ද; ආගු පැමිණියෝ ය.

සබ්බෙ, සියල්ලෝ ම; නානත්තවණ්ණිනො, නානා වර්ණවත් වූ; දසධාකායා, දස ආකාර දේව සමූහයක් වූ; ඉන්ධිමන්තො, ඍද්ධි ඇත්තා වූ; ජුතිමන්තො, කාන්ති ඇත්තා වූ; වණ්ණවන්තො, ශරීර වර්ණවත් වූ; යසස්සිනෝ, යස පිරිවර ඇති; එතෙ දස, මේ දශ ආකාර දේව සමූහයෝ; මොදමානා, සතුටු වූවා හු; භික්ඛූනං සමිතිං, අර්හත් භික්ෂූන් ගේ සමාගමය වූ; වනං, මහාවනයට; අභික්කාමුං, පැමිණියාහු ය.

40. සුක්කා, සුක්කා ය; කරුම්හා, කරුම්හා ය; අරුණා අරුණ ය යන දෙවියෝ; වෙඝනසාසහ, වේඝනස නම් දෙවියන් සමග; ආගු, පැමිණියාහු ය; පාමොක්ඛා, ප්‍රධාන වූ; ඔදාතගයිහා, ඕදාතගයිහ නම් වූ දෙවියෝ ද; විචක්ඛණා දෙවා, විචක්ඛණ නම් දෙවියෝ ද; ආගු, ආවාහු ය.

සදාමත්තා, සදාමත්ත නම් දෙවියෝ ද; හාරගජා, හාරගජ නම් දෙවියෝ ද; යසස්සිනො, යසස් ඇත්තා වූ; මිස්සකා ච, මිස්සක නම් දෙවියෝ ද; ආගු, ආවාහු ය; යො දිසා අභිවස්සති, යම් දෙවියෙක් දිශාවන්හි වර්ෂා කෙරේ ද; පජ්ජුන්නො, ඒ ප්‍රද්‍යුම්න නම් දෙවි තෙමේ ද; ථනයං, මේඝනාද කෙරෙමින්ද; ආග ආයේ ය; සබ්බෙ, සියල්ලෝ ම; නානත්තවණ්ණිනො, නානා වර්ණවත් වූ; දසධාකායා, දස ආකාර දේව සමූහය වූ; ඉද්ධිමන්තො, ඍද්ධිමත් වූ; ජුතීමන්තො, කාන්තිමත් වූ; වණ්ණවන්තො, ශරීර වර්ණවත් වූ; යසස්සිනො, යස පිරිවර ඇත්තා වූ; එතෙ දස, මේ දශ ආකාර දේව සමූහයෝ; මොදමානා, සතුටු වූවා හු; භික්ඛූනං සමිතිං අර්හත් භික්ෂූන් ගේ සමාගමය වූ; වනං, මහාවනයට; අභික්කාමුං, පැමිණියාහු ය.

41. ඛෙමියා, ඛේමිය නම් දෙවියෝ ද; තුසිතා, තුසිත නම් දෙවියෝ ද; යාමා, යාම දෙවියෝ ද; යසස්සිනො, යසස් ඇත්තා වූ; කට්ඨකා, කට්ඨක නම් දෙවියෝ ද; ලම්බිතකා, ලම්බිතක නම් දෙවියෝ ද; ලාමසෙට්ඨා, ලාමසෙට්ඨ නම් දෙවියෝ ද; ජොති නාමා ච, ජෝති නම් ඇති දෙවියෝ ද; ආසවා, ආසව නම් දෙවියෝ ද ආවාහු ය; නිම්මාණරතිනො, නිම්මානරති නම් දෙවියෝ ද; ආගු, ආවාහු ය; අථ, නැවත; පරනිම්මිතා, පරනිම්මිත වසවත්ති දෙවියෝ ද; ආගු ආවාහු ය; සබ්බෙ, සියල්ලෝ ම; නානත්තවණ්ණිනො, නොයෙක් වර්ණවත් වූ; දසධාකායා, දස ප්‍රකාර දේව සමූහය වූ; ඉද්ධිමන්තො, ඍද්ධිමත් වූ; ජුතිමන්තො, කාන්තිමත් වූ; වණ්ණවන්තො, ශරීර වර්ණවත් වූ; යසස්සිනො, යස පිරිවර ඇත්තා වූ; එතෙ දස, මේ දශ ආකාර දේව සමූහයෝ; මොදමානා, සතුටු වූවා හු; භික්ඛූනං සමිතිං, රහත් භික්ෂූන් ගේ සමාගමය වූ; වනං, මහාවනයට; අභික්කාමුං, පැමිණියාහු ය.

42. සට්ඨෙතෙ දෙවනිකායා, මේ සැටක් දේව සමූහයෝ; සබ්බෙ, සියල්ලෝ ම; නානත්තවණ්ණිනො, නොයෙක් ප්‍රභාවත් වූවෝ ම; නාමන්වයෙන, තමන් ගේ නම් ගොත් වශයෙන්; ආගඤ්ජුං, ආවාහු ය; යෙච අඤ්ඤෙ, යම් අනෙක් දේවතාවෝත්; සදිසා සහ, නම් ආදියෙන් සමාන වෙත් නම් ඔවුහු ද ඔවුන් සමග ආවාහු ය.

පවුත්ථජාතිං, වැස නිමවන ලද ජාති ඇති; අඛිලං, කෙලෙස් උල් රහිත වූ; ඔඝතිණ්ණං, චතුරෝඝය තරණය කළා වූ; අනාසවං, ආශ්‍රව රහිත වූ ආයෂ්‍ය සංඝයා ද; ඔඝතරං, ඕඝයන් තරණය කළා වූ; නාගං, ඡන්ද ආදියෙන් අගතියට නො යන හෙයින් නාග නම් වූ; චන්දංව අසිතාතිගං, ඉක්මගිය තෘෂ්ණාභාවය ඇති සඳ වැනි සම්බුදුරදුන්; දක්ඛෙම, දකින්නෙමු.

Non-Commercial Distribution

43. ඉද්ධිමතො, සෘද්ධි ඇත්තා වූ; පුත්තා, ආයුෂ්‍ය පුත්‍ර වූ; සුබ්‍රහ්ම, සුබ්‍රහ්මයා; පරමත්තො ච, පරමත්තය යන බ්‍රහ්මයෝ සහ බඹ පිරිස් සමග ආවාහු ය; සනංකුමාරො, සනංකුමාර නම් බඹ පුත් ද; සො තිස්සො ච, ඒ තිස්ස නම් මහබඹු ද; වනං සමිතිං, මහාවනයෙහි වූ; භික්ඛු සමාගමයට; උපාග, පැමිණියේ ය.

44. බ්‍රහ්ම ලොකානං සහස්සං, බඹලෝ වැසි බ්‍රහ්මයෝ දහසක් ආවෝ ය; මහා බ්‍රහ්මා, ඒ එක් එක් මහා බඹෙක්; උපපන්නො, බඹලොව උපන්නේ වෙයි; ජුතිමන්තො, ආනුභාව සම්පන්න ය; හිස්මා කායො, මහත් කයක් ඇත්තේ වෙයි; යසස්සිසො, යසස් ඇත්තේ වෙයි; අභිතිට්ඨති, අනික් බ්‍රහ්මයන් මැඩගෙන සිටියි.

45. එත්‍ථ, මේ බඹ පිරිසෙහි; පච්චෙක වසවත්තිනො, වෙන් වශයෙන් තම තමන් ගේ පිරිස වසඟයට පමුණුවා, වාසය කරන්නා වූ; ඉස්සරා, අධිපති වූ; දස, බ්‍රහ්ම රාජයෝ දස දෙනෙක්; ආගු, ආවෝ ය; තෙසඤ්ච මජ්ඣතො, ඔවුන් ගේ මැද; පරිවාරිතො, පිරිවරන ලද; හාරිතො, හාරිත නම් බ්‍රහ්ම රාජතෙමේ; ආග, ආයේ ය.

46. අභික්කන්තො, මනෝඥ වූ හෙවත් මහ වනයට පැමිණියා වූ; සඉන්දෙ, සක්දෙව් රජ සහිත වූ; සබ්‍රහ්මකෙ, හරිත බ්‍රහ්ම රාජයා ප්‍රධාන කොට ඇති; තෙ ච සබ්බෙ දෙවෙ, ඒ සියලු දෙවියන් වෙතට; මාරසෙනා, මාර සේනාව; අභික්කාමුං, පැමිණියා ය; කණ්හස්ස මන්දියං, මාරයාගේ මූඪතාව; පස්ස බලව.

47. එථ, එවු; ගණ්හථ, අල්ලා ගනිව්; බන්ධථ, බඳිව්; රාගෙන, රාගය නැමැති පාසයෙන්; බද්ධමත්ථූ වෙ, බඳනා ලද්දේ වේවා!; සමන්තා, හාත්පස; පරිවාරෙථ, පිරිවරා සිටිව්; වො කොචි, තෙපි කිසිවෙක්; නං, ඒ දෙව් පිරිස අතුරෙන් කිසිවකු; මා මුඤ්චිත්ථ, මුදා නො හරිව්.

48. ඉති, මෙසේ; මහා සෙනො, ඒ වසවත් තෙමේ; පාණිනා, අත්ලෙන්; ථලං ආහච්ච, පොළෝ තලයට ගසා; භෙරවං සරං කත්වාන, බිහිසුණු ශබ්ද කොට; කණ්හසෙනං, මර සෙනඟ; තත්‍ථ, ඒ දෙව් පිරිස මැද; අපෙසධ, යැවී ය.

49. පාවුස්සකො, වැසි කල්හි වූ; සවිජ්ජුකො, විදුලි කෙටීම සහිත වූ; ථන යන්තො, මහා ගර්ජනා කරන්නා වූ; මෙඝො යථා, මේඝය යම් සේ ද, එසේ; තදා, එකල්හි; සො, ඒ වසවත් තෙමේ; අසයංවසී, දෙව් පිරිස වසඟයට ගත නො හැක්කේ; සංකුද්ධො, අතිශයින් කිපියේ; පච්චුදාවත්තී, ආපසු ගියේ ය.

50. තතො, ඉක්බිති; චක්ඛුමා, පණැස් ඇත්තා වූ; සත්‍ථා, ශාස්තෲන් වහන්සේ; තඤ්ච සබ්බං, ඒ සියල්ල; වවක්ඛිත්වානා, තීරණය කොට; අභිඤ්ඤාය, මනාසේ දැන; සාසනෙ රථෙ, ශාසනයෙහි ඇලුනා වූ; සාවකෙ, ශ්‍රාවකයන්; ආමන්තයි, ඇමතූ සේක;

51. භික්ඛවෙ, මහණෙනි; මාරසෙනා, මාරසෙන්හු; අභික්කන්තා, පැමිණියාහු ය; තෙ විජානාථ, ඔවුන් දනිව්; තෙව, ඒ භික්ෂූහු ද; බුද්ධස්ස සාසනං, බුදුරදුන් ගේ අනුශාසනාව; සුත්වා, අසා; ආතප්පං අකරුං, එල සමවත සඳහා උත්සාහ කළෝ ය.

52. විතරාගෙහි, වීතරාගීන් කෙරෙන්; අපක්කාමුං, මාරසේනාවෝ පහව ගියහ; නෙසං, ඒ වීතරාගීන් ගේ; ලොමංපි, රෝමයකුදු; න ඉඤ්ජයුං, කම්පා නො කළහු ය.

විජිත සංගාමා, ජයගත් මරයුද්ධ ඇති; භයාතීතා, ඉක්මවන ලද බිය ඇති; යසස්සිනො, යසස් ඇත්තා වූ; ජනෙසුතා, ජනයා අතුරෙහි ප්‍රකට වූ; සබ්බෙ තෙ සාවකා, ඒ සියලු ශ්‍රාවකයෝ; භූතෙහි සහ, සස්නෙහි උපන් ආයුෂ්‍යයන් සමග; මොදන්ති, සතුටු වෙත්.

මහා සමය සූත්‍රය යි.

Non-Commercial Distribution

## (3)
## ආලවක සුත්තං. — ආලවක සූත්‍රය.

1. මෙ, මා විසින්; එවං සුතං, මෙසේ අසන ලදි; එකං සමයං, එක් සමයෙක්හි; භගවා, භාග්‍යවතුන් වහන්සේ; ආලවියං, අලව් නුවර සමීපයෙහි වූ; ආලවකස්ස යක්ඛස්ස, ආලවක නම් යක්ෂයා ගේ; භවනෙ, භවනයෙහි; විහරති, වැඩ වාසය කරන සේක; අථ ඛො, ඉක්බිති; ආලවකො යක්ඛො, ආලවක යක්ෂ තෙමේ; භගවා, භාග්‍යවතුන් වහන්සේ; යෙන, යම් තැනෙක්හි ද; තෙන, එතැනට; උපසංකමි, එළඹියේ ය; උපසංකමිත්වා, එළඹ; භගවන්තං, භාග්‍යවතුන් වහන්සේට; එතං, මෙය; අවොච, කීයේ ය.

2. සමණ, ශ්‍රමණය; නික්ඛම ඉති, නික්මෙව; භගවා, භාග්‍යවතුන් වහන්සේ; ආවුසො, ඇවැත්නි; සාධු ඉති, යහපතැ'යි; නික්ඛමි, නික්මුණ සේක; සමණ, ශ්‍රමණය; පවිස ඉති, මාගේ භවනයට පිවිසෙව; භගවා, භාග්‍යවතුන් වහන්සේ; ආවුසො, ඇවැත් යක්ෂය; සාධු ඉති, යහපතැ'යි; පාවිසි, පිවිසි සේක; දුතියම්පි ඛො, දෙවන වර ද; ආලවකො යක්ඛො, ආලවක යක්ෂ තෙමේ; භගවන්තං, භාග්‍යවතුන් වහන්සේට; එතං මෙය; අවොච, කීයේ ය; සමණ, ශ්‍රමණය; නික්ඛම ඉති, නික්මෙව; භගවා, භාග්‍යවතුන් වහන්සේ; ආවුසො, ඇවැත් යක්ෂය; සාධු ඉති, යහපතැ'යි; නික්ඛමි, නික්මුණු සේක; සමණ, ශ්‍රමණය; පවිස ඉති, පිවිසෙව; භගවා, භාග්‍යවතුන් වහන්සේ; ආවුසො, ඇවැත් යක්ෂය; සාධු ඉති, යහපතැ'යි; පාවිසි, පිවිසි සේක; තතියම්පි ඛො, තෙවෙනි වර ද; ආලවකො යක්ඛො, ආලවක යක්ෂයා; භගවන්තං, භාග්‍යවතුන් වහන්සේට; එතං අවොච, මෙය කීයේ ය; සමණ, ශ්‍රමණය; නික්ඛම ඉති, නික්මෙව; භගවා, භාග්‍යවතුන් වහන්සේ; ආවුසො, ඇවැත් යක්ෂය; සාධු ඉති, යහපතැ'යි; නික්ඛමි, නික්මුණු සේක; සමණ, ශ්‍රමණය; පවිස ඉති, පිවිසෙව; භගවා, භාග්‍යවතුන් වහන්සේ; ආවුසො, ඇවැත් යක්ෂය; සාධු ඉති, යහපතැ'යි; පාවිසි, පිවිසි සේක.

3. චතුත්ථම්පි ඛො, සතරවැනි වරටත්; ආලවකො යක්ඛො, ආලවක යක්ෂ තෙමේ; භගවන්තං, භාග්‍යවතුන් වහන්සේට; එතං අවොච, මෙය කීයේ ය; සමණ, ශ්‍රමණය; නික්ඛම ඉති, නික්මෙව; ආවුසො, ඇවැත් යක්ෂය; අහං, මම; න ඛො නික්ඛමිස්සාමි, නො නික්මෙමි; යං තෙ කරණීයං, යමක් තට කරන්නට පිළිවන්නම්; තං, එය; කරොහි ඉති, කරව'යි වදාළහ.

4. සමණ, ශ්‍රමණය; තං, තා අතින්; පඤ්හං, ප්‍රශ්නයක්; පුච්ඡිස්සාමි, විචාරන්නෙමි; සචෙ, ඉදින්; මෙ, මට; න ව්‍යාකරිස්සසි, නො විසඳන්නෙහි නම්; තෙ, තාගේ; චිත්තං වා, සිත හෝ; ඛිපිස්සාමි, පෙරළන්නෙමි; තෙ, තා ගේ; හදයං වා, ළය හෝ; ඵාලෙස්සාමි, පලන්නෙමි; පාදෙසු ගහෙත්වා, දෙපා ගෙන; පාරගංගායං වා, පරමුහුදු හෝ; ඛිපිස්සාමි ඉති, දමන්නෙමි'යි කීය.

5. ආවුසො, ඇවැත් යක්ෂය; සදෙවකෙ, දෙවියන් සහිත වූ; සමාරකෙ, මරුන් සහිත වූ; සබ්‍රහ්මකෙ, බ්‍රහ්මයන් සහිත වූ; ලොකෙ, ලෝකයෙහි; සස්සමණ බ්‍රාහ්මණියා, ශ්‍රමණ බ්‍රාහ්මණයන් සහිත වූ; සදෙවමනුස්සාය, දෙවියන් හා මිනිසුන් සහිත වූ; පජාය, සත්වයා කෙරෙහි; යො, යමෙක්; මෙ, මාගේ; චිත්තං වා, සිත හෝ; ඛිපෙය්‍ය, පෙරළන්නේ ද; හදයං වා, හෘදයවස්තුව හෝ; ඵාලෙය්‍ය, පලන්නේ ද; පාදෙසු වා, දෙපා හෝ; ගහෙත්වා, ගෙන; පාරගංගායං ඛිපෙය්‍ය, මුහුදු පරතෙර දමන්නේ ද?; තං, එබන්දෙකු; අහං, මම; න ඛො පස්සාමි, නො දකිමි; අපි ච, තව ද; ආවුසො, ඇවැත් යක්ෂය; ත්වං, තෝ; යදා කංඛසි, යමක් කැමැත්තෙහි නම් එය; පුච්ඡ ඉති, අසව'යි වදාළහ.

6. අථ ඛො, ඉක්බිති; ආලවකො යක්ඛො, ආලවක යක්ෂ තෙමේ; භගවන්තං, භාග්‍යවතුන් වහන්සේට; ගාථාය, ගාථාවකින්; අජ්ඣභාසි, මෙසේ ප්‍රකාශ කළේ ය:

Non-Commercial Distribution

1. ඉධ, මේ ලෝකයෙහි; පුරිසස්ස, පුරුෂයාහට; කිංසු විත්තං, කවර නම් වස්තුවක්; සෙට්ඨං, ශ්‍රේෂ්ඨවේ ද; සුචිණ්ණො, මනාව පුරුදු කරන ලද හෙවත් රැස් කරන ලද; කිංසු, කිනම් ධර්මයෙක්; සුඛං ආවහති, සැප එළවා ද; හවෙ, ඒකාන්තයෙන්; රසානං, රසයන් අතුරෙන්; කිංසු, කවර නම් රසයෙක්; සාධුතරං, අතිශයින් මනෝඥ වේ ද; කථං, කෙසේ; ජීවිං, දිවි පවත්නහු ගේ; ජීවිතං, ජීවිතය; සෙට්ඨං, ශ්‍රේෂ්ඨය යි; ආහු, කියත් ද?.

2. ඉධ, මේ ලෝකයෙහි; සද්ධා, ශ්‍රද්ධා තොමෝ; පුරිසස්ස, පුරුෂයාහට; සෙට්ඨං, ශ්‍රේෂ්ඨ වූ; විත්තං, ධනය වේ; සුචිණ්ණො, මනාකොට පුරුදු කරන ලද; ධම්මො, කුශල ධර්මය තෙම; සුඛං, සැප; ආවහති, එළවයි; රසානං, රසයන් අතුරෙන්; සච්චං, සත්‍ය වචන රසය; හවෙ, ඒකාන්තයෙන්; සාධුතරං, අතිශයින් මනෝඥ වෙයි; පඤ්ඤා ජීවිං, ප්‍රඥාවෙන් ජීවත් වන්නා හු ගේ; ජීවිතං, ජීවිතය; සෙට්ඨං ආහු, ශ්‍රේෂ්ඨය යි කියති.

3. ඔඝං, චතුර්විධ ඕඝය; කථංසු, කෙසේ නම්; තරති, එතෙර කෙරේ ද?; අණ්ණවං, සංසාර සාගරය; කථංසු, කෙසේ නම්; තරති, එතෙර කෙරේ ද?; දුක්ඛං, දුක; කථංසු, කෙසේ නම්; අච්චෙති, ඉක්මවා ද හෙවත් පහ කෙරේ ද?; කථංසු, කෙසේ නම්; පරිසුජ්ඣති, පිරිසිදු වේ ද?;

4. සද්ධාය, ශ්‍රද්ධාවෙන්; ඔඝං, චතුර්විධ ඕඝය; තරති, තරණය කෙරෙයි; අප්පමාදෙන, අප්‍රමාදයෙන්; අණ්ණවං, භව සාගරය තරණය කෙරෙයි; විරියෙන, වීර්යයෙන්; දුක්ඛං, දුක; අච්චෙති, පහ කෙරෙයි; පඤ්ඤාය, ප්‍රඥාවෙන්; පරිසුජ්ඣති, පිරිසිදු වේ.

5. කථංසු, කෙසේ නම්; පඤ්ඤං, ලෞකික ලෝකෝත්තර ප්‍රඥාව; ලභතෙ, ලබා ද; කථංසු, කෙසේ නම්; ධනං, ධනය; වින්දතෙ, ලබා ද; කථංසු, කෙසේ නම්; කිත්තිං, කීර්තියට; පප්පොති, පැමිණේ ද; කථං, කෙසේ නම්; මිත්තානි, මිත්‍රයන්; ගන්ථති, ලබා ද; කථංසු, කෙසේ නම්; අස්මා ලොකා, මෙලොවින්; පරංලොකං, පරලොවට; පෙච්ච, ප්‍රතිසන්ධි වශයෙන් පැමිණ; න සොචති, ශෝක නො කෙරේ ද?

6. විචක්ඛණො, නුවණැත්තා වූ; අප්පමත්තො, අප්‍රමත්ත වූ ජනතෙම; අරහතං, රහතුන් ගේ; ධම්මං, සද්ධර්මය; සද්දහානො, අදහන්නේ; සුස්සූසා, සුශ්‍රෑසාව හේතු කොට ගෙන; නිබ්බාණ පත්තියා, නිර්වාණ ප්‍රාප්තිය පිණිස; පඤ්ඤා, ලෞකික ලෝකෝත්තර ප්‍රඥාව; ලභතෙ, ලබයි.

7. පතිරූපකාරී, ලෞකික ලෝකෝත්තර ධනයා ගේ අධිගමෝපකාරී වූ; ධුරවා, චෛතසික වීර්‍ය්‍ය ඇති; උට්ඨාතා, කායික වීර්‍ය්‍ය සම්පන්න ජනතෙම; ධනං, ලෞකික ලෝකෝත්තර ධනය; වින්දතෙ, ලබයි; සච්චෙන, වාක් සත්‍ය කරණ කොට ගෙන; කිත්තිං, කීර්තියට; පප්පොති, පැමිණෙයි; දදං, දෙන්නා වූ ජනතෙමේ; මිත්තානි, මිත්‍රයන්; ගන්ථති, සම්පාදනය කෙරේ.

8. ඝරමෙසිනො, ගිහිගෙයි වසන්නා වූ; සද්ධස්ස, ශ්‍රද්ධාව ඇති; යස්ස, යම් කිසිවෙකුහට; සච්චං, සත්‍යයත්; ධම්මො, ඉන්ද්‍රිය දමනයත්; ධිති, ධෘතියත්; චාගො, ත්‍යාගයත් යන;

Non-Commercial Distribution

එතෙ චතුරො ධම්මා, මේ ධර්‍ම සතර වෙත් නම්; සො, ඒ ගෘහස්ත ජනතෙමේ; පෙච්ච, පරලොව දී; වෙ, ඒකාන්තයෙන්; න සොචති, ශෝක නො කෙරෙයි.

9. සච්චං, සත්‍යයට වඩා කීර්තිය ලබා දෙන; දමා, ඉන්ද්‍රිය දමනයට වඩා ලෞකික ලෝකෝත්තර ප්‍රඥාව සිදු කරන; චාගා, පරිත්‍යාගයට වඩා මිත්‍රයන් ඇති කරන; ඛන්ත්‍යා භීයෙ‍ය්‍යා, අධිවාසනා ශාන්තියට වඩා ලෞකික ලෝකෝත්තර ධනය ලබා දෙන; න විජ්ජති, අන් කිසිවක් නොමැත; යදි, ඉදින් ඇතැ'යි හැඟෙන්නෙහි ද; ඉංඝ, එසේ නම්; අඤ්ඤෙපි, ඒ අනික් කාරණයන් ද; පුථු, බොහෝ වූ; සමණ බ්‍රාහ්මණෙ, මහණ බමුණන්; පුච්ඡස්සු, විචාරව'යි කියා වදාළ සේක.

10. යො අත්‍ථො, ප්‍රඥාලාභාදියට හේතු වූ යම් අර්ථයක් වේ නම් හෙ ද; සම්පරායිකො, පරලොව ශෝක නොකිරීමට කාරණයකුත් වේ නම් එය ද; අජ්ජ, අද පටන්; පජානාමි, දනිමි; ඉදානි, දැන්; අහං, ඒ මම; පුථු සමණ බ්‍රාහ්මණෙ, බොහෝ වූ මහණ බමුණන්; කථන්නු, කුමකට; පුච්ඡෙය්‍යාං, විචාරම් ද;

11. බුද්ධො, බුදුරජාණන් වහන්සේ; වත, ඒකාන්තයෙන්; මෙ අත්‍ථාය, මට ම හිත වැඩ පිණිස; වාසාය, විසීම පිණිස; ආලවිං, මේ අලව් නුවරට; අගමා, වැඩ වදාළ සේක; යත්‍ථ, යම් තැනෙක; දින්නං, දෙන ලද්ද; මහප්ඵලං, මහත්ඵල වේ ද; සො අහං, ඒ මම; අජ්ජ, අද; පජානාමි, විශේෂයෙන් දැන ගතිමි.

12. සො අහං, ඒ මම; සම්බුද්ධං, සම්බුදුරදුන්ද; ධම්මස්ස, සද්ධර්‍මයා ගේ; සුධම්මතං, ස්වාක්ඛාතාදී සුධර්මය ද සංඝයා ද; නමස්සමානො, වදිමින්; ගාමා ගාමං, ගමින් ගමට; පුරා පුරං, පුරයෙන් පුරයට; විචරිස්සාමි, හැසිරෙන්නෙමි.

7. එවං වත්වා, මෙසේ කියා; ආලවකො යක්ඛො, ආලවක යක්ෂ තෙමේ; භගවන්තං, භාග්‍යවතුන් වහන්සේට; එතද වොච, මෙසේ කීය; භො ගොතම, භවත් ගොතමයන් වහන්ස; අභික්කන්තං, දහම් දෙසුම ඉතා යහපත; අභික්කන්තං භො ගොතම, භවත් ගෞතමයන් වහන්ස දේශනාව ඉතා යහපත; භො ගොතම, භවත් ගෞතමයන් වහන්ස; සෙය්‍යථාපි, යම් සේ වනාහි; නික්කුජ්ජිතං වා, මුනින් තබන ලද භාජනයක් යම් සේ; උක්කුජ්ජෙය්‍ය, උඩුකුරු කොට හෝ; පටිච්ඡන්නං වා, වැසී තිබුණු යමක්; විවරෙය්‍ය වා, විවෘත කොට තබන්නේ යම් සේ ද; මූළ්හස්ස, මංමුළාවූවෙකුට; මග්ගං වා, මාර්ගය හෝ; ආචික්ඛෙය්‍ය, කියන්නේ ද; චක්ඛුමන්තො රූපානිදක්ඛින්ති ඉති, ඇස් ඇත්තෝ රූපයන් දකිත්වා යි; අන්ධකාරෙ, අඳුරෙහි; තෙලපජ්ජෝතං ධාරෙය්‍ය වා, යම් සේ තෙල් පහනක් දරන්නේ ද; එවං එව, එපරිද්දෙන් ම; හොතා ගොතමෙන, භවත් ගෞතමයන් වහන්සේ විසින්; අනේක පරියායෙන, නොයෙක් අයුරින්; ධම්මො පකාසිතො, ධර්‍මය දෙසන ලදී.

එසා'හං, මේ මම; භවන්තං ගොතමං, භවත් ගෞතමයන් වහන්සේ ද; ධම්මඤ්ච, ධර්‍මය ද; භික්ඛු සංඝඤ්ච, භික්ඛු සංඝයා ද; සරණං ගච්ඡාමි, පිහිට කොට යමි; භවං ගොතමො, භවත් ගෞතමයන් වහන්සේ; අජ්ජතග්ගෙ, අද පටන්; පාණුපෙතං, දිවිහිමි කොට; සරණං ගතං, සරණ ගියා වූ; උපාසකං, උපාසකයකු කොට; මං, මා; ධාරෙතු ඉති, දරන සේක්වා.

**ආලවක සූත්‍රය යි.**

Non-Commercial Distribution

## (4)

## කසීභාරද්වාජ සුත්තං. — කසීභාරද්වාජ සූත්‍රය.

1. මෙ, මා විසින්; එවං සුතං, මෙසේ අසන ලදී. එකං සමයං, එක් සමයෙක්හි; භගවා, භාග්‍යවතුන් වහන්සේ; මගධෙසු, මගධ දනව්වෙහි; එකනාලායං බ්‍රාහ්මණ ගාමේ, ඒකනාලා නම් බමුණු ගම; දක්ඛිණාගිරිස්මිං, දකුණුගිරි නම් විහාරයෙහි; විහරති, වැඩ වසන සේක; තෙන ඛො පන සමයෙන, එසමයෙහි වනාහි; කසීභාරද්වාජස්ස, කසීභාරද්වාජ නම් බමුණා ගේ; වප්ප කාලෙ, වප් කල්හි; පඤ්චමත්තානි නංගල සතානි, පන්සියයක් පමණ නඟුල්; පයුත්තානි, යොදනු ලද්දාහු වෙත්.

2. අථ ඛො, ඉක්බිති; භගවා, භාග්‍යවතුන් වහන්සේ; පුබ්බණ්හ සමයං, පෙරවරු කාලයෙහි; නිවාසෙත්වා, හැඳපෙරව; පත්තචීවරං ආදාය, පාසිවුරු ගෙන; කසීභාරද්වාජස්ස බ්‍රාහ්මණස්ස, කසීභාරද්වාජ නම් බ්‍රාහ්මණයා ගේ; කම්මන්තො, කර්මාන්ත ස්ථානය; යෙන, යම් තැනෙක්හි වේ ද; තෙන, එතැනට; උපසංකමි, එළඹීසේක; තෙන ඛො පන සමයෙන, එසමයෙහි වනාහි; කසීභාරද්වාජස්ස බ්‍රාහ්මණස්ස, කසීභාරද්වාජ නම් බ්‍රාහ්මණයා ගේ; පරිවෙසනා, පරිවෙශනාව (බත් බෙදවීම, අනුභව කරවීම); පවත්තති, පවත්නේ ය; අථ ඛො, ඉක්බිති; භගවා, භාග්‍යවතුන් වහන්සේ; යෙන පරිවෙසනා, අනුභව කරවන තැන යම් තැනෙක්හි ද; තෙන, එතැන්හි; උපසංකමි, එළඹී සේක; උපසංකමිත්වා, එළඹ; එකමන්තං, එකත් පසෙක; අට්ඨාසි, වැඩ සිටි සේක.

3. කසීභාරද්වාජ බ්‍රාහ්මණො, කසීභාරද්වාජ නම් බ්‍රාහ්මණ තෙමේ; පිණ්ඩාය, පිඩු පිණිස වැඩ සිටියා වූ; භගවන්තං, භාග්‍යවතුන් වහන්සේ; අද්දසා ඛො, දුටුයේ ය; දිස්වාන, දැක; භගවන්තං, භාග්‍යවතුන් වහන්සේට; එතදවොච, මෙසේ කීයේ ය; සමණ, ශ්‍රමණය; අහං ඛො, මම වනාහි; කසාමි, සාන්නෙම් ද වෙමි; වපාමි ච, වපුරන්නෙම් ද වෙමි; කසිත්වා ච, සා ද; වපිත්වා ච, වපුරා ද; භුඤ්ජාමි, අනුභව කරමි; සමණ, ශ්‍රමණය; ත්වම්පි, ඔබ ද; කසස්සු ච, සෑම ද කරව; වපස්සු ච, වැපිරීම ද කරව; කසිත්වා ච, සා ද; වපිත්වා ච, වපුරා ද; භුඤ්ජස්සු ඉති, අනුභව කරව; බ්‍රාහ්මණ, බ්‍රාහ්මණය; අහම්පි ඛො, මම ද; කසාමි ච, සාන්නෙම් ද වෙමි; වපාමි ච, වැපිරීම ද කරමි; කසිත්වා ච, සා ද; වපිත්වා ච, වපුරා ද; භුඤ්ජාමි ඉති, අනුභව කරමි'යි වදාළ සේක.

4. මයං, අපි; හොතො ගොතමස්ස, භගවත් ගෞතමයන් ගේ; යුගං වා, වියදණ්ඩක් හෝ; නංගලං වා, නඟුලක් හෝ; ඵාලං වා, සීවැලක් හෝ; පාචනං වා, කැවිටක් හෝ; බලිවද්දෙ වා, ගොනුන් හෝ; න ඛො පන පස්සාම, නොම දැකුම් හ; අථවපන, එතකුදුවුවත්; භවං ගොතමො, පින්වත් ගෞතම තෙමේ; බ්‍රාහ්මණ, බ්‍රාහ්මණය; අහම්පි ඛො, මම ද වනාහි; කසාමි ච, සෑම ද කරමි; වපාමි ච, වැපැරීම ද කරමි; කසිත්වා ච, සා ද; වපිත්වා ච, වපුරා ද; භුඤ්ජාමී ඉති, අනුභව කරමි යි; එවමාහ, මෙසේ කියයි; අථ ඛො, ඉක්බිති; කසිභාරද්වාජො බ්‍රාහ්මණො, කසිභාරද්වාජ බමුණු තෙමේ; භගවන්තං, භාග්‍යවතුන් වහන්සේට; ගාථාය, ගාථාවකින්; අජ්ඣභාසි, මෙසේ සැළ කෙළේ ය.

1. කස්සකො, සාන්නෙකැ යි; පටිජානාසි, ප්‍රතිඥ කෙරෙහි ය; තෙ, නුඹ වහන්සේ ගේ; කසිං, සෑමෙහි උපකරණ; න ච පස්සාම, නො දකිම් හ; නො, අප විසින්; පුච්ඡිතො, විචාරන ලද්දෙහි; තෙ, ඔබ ගේ; කසිං, කෘෂි භාණ්ඩ; යථා, යම් පරිද්දකින්; ජානෙමු, දැන ගන්නෙමු ද; කසිං, එසේ වූ උපකරණ; බ්‍රෑහි, දේශනා කළ මැනව:

2. සද්ධා, ශ්‍රද්ධා තොමෝ; මෙ, මාගේ; බීජං, බිජුවට වේ; තපො, තපස; වුට්ඨි, වර්ෂාව වේ; පඤ්ඤා, ප්‍රඥ තොමෝ; යුගනංගලං, විය හා නඟුල වෙයි; හිරි, ලජ්ජා තොමෝ;

Non-Commercial Distribution

ඊසා, නඟුලිස වේ; මනෝ, සිත හෙවත් චිත්ත සමාධිය; යොත්තං, යොත වේ; සති, ස්මෘති තොමෝ; මෙ, මාගේ; ඵාලපාචනං, සීවැල හා කැවිට වේ.

3. කාය ගුත්තො, රක්නා ලද කාය සුචරිතය ඇත්තෙක්මි; වචී ගුත්තො, රක්නා ලද වාක් සුචරිතය ඇත්තෙක්මි; ආහාරෙ, ආහාරය යි කියන ලද සිව්පසයෙහි; උදරෙ, උදරයෙහි; යතො, පමණ දැන වළඳන්නේ වෙමි; සච්චං, සත්‍යයෙන්; නිද්දානං කරොමි, කෙලෙස් නමැති තණ ඡේදනය කරමි; සොරච්චං, සෝරච්ච නම් වූ අර්හත් ඵල විමුක්තිය; මෙ, මාගේ; පමොචනං, මිදීම යි.

4. ධුරධොරය්හං, ධුරවහනක්ෂම වූ; මෙ, මාගේ; තං විරියං, ඒ කායික, මානසික වීයඞීය; යොගක්ඛෙමාධි වාහනං, නිවන් අභිමුඛව පමුණුවනු ලබන්නේ; අනිවත්තන්තං, නො නවතිමින්; ගච්ඡති, යෙයි; යත්ථ, යම් තැනකට; ගන්ත්වා, ගොස්; න සොචති, ශෝක නො කෙරේ ද; ඒ නිවණට යන්නේ ය.

5. එවං, මෙසේ; එසාකසි, මේ සීය; කට්ඨා, මා විසින් සාන ලදී; සා, ඒ සීය; අමතප්ඵලා හොති, අමෘත ඵල ඇතිවේ; එතංකසිං, මේ සීය; කසිත්වාන, සා; සබ්බ දුක්ඛා, සියලු වෘත්ත දුක්ඛයෙන්; පමුච්චති, මිදේ.

5. අථ ඛො, ඉක්බිති; කසීභාරද්වාජො බ්‍රාහ්මණො, කසීභාරද්වාජ බ්‍රාහ්මණ තෙම; මහතියා කංසපාතියා, මහත් රන්තලියෙක්හි; පායාසං වඩ්ඪෙත්වා, කිරිබත් වඩා; යං හි, යම් හෙයකින්; භවං, පින්වත් තෙමේ; අමතඵලං, අමෘත ඵල ඇති; කසිං, සීයක්; කසතී'ති, සාන සේක් ද? (එහෙයින්) භවං කස්සකො, පින්වතුන් වහන්සේ කර්ෂක සේක; භවං ගොතමො, එසේ සාන්නා වූ පින්වත් ගෞතමයන් වහන්සේ; පායාසං, කිරිබත්; භුඤ්ජතු, වළඳන සේක් වා යි; භගවතො, භාග්‍යවතුන් වහන්සේට; උපනාමෙසි, එළවූයේ ය.

6. බ්‍රාහ්මණ, බමුණ; මෙ, මා විසින්; ගාථාභිගිතං, ගාථා කියා ලබන ලද පායාසය; අභොජනෙය්‍යං, වැළඳිය යුතු නො වේ; සම්පස්සනං, අර්ථ ධර්මයන් දන්නා වූ හෙවත් ආජීව පාරිශුද්ධිය දක්නා ලද සර්‍වඥවරයා ගේ; න එසො ධම්මො, මේ ගාථා කියා ලද දේ වැළඳී ම චාරිත්‍ර ධර්‍මයෙක් නො වේ; බුද්ධා, බුදුවරු; ගාථාභිගීතං, ගාථා කියා ලැබූ භෝජනය; පනුදහති, බැහැර කෙරෙත්; බ්‍රාහ්මණ, බමුණ; ධම්මෙ, ආර්යයන් ගේ ආජීවපාරිශුද්ධි ධර්මය හෝ ආචාර ධර්මය; සති, ඇති කල්හි; එසාවුත්ති, මේ ආයඞී වූ ජීවිකා වෘත්තිය යි.

7. කෙවලිනං, සියලු ගුණයෙන් යුක්ත වූ; මහෙසිං, මහාර්ෂි වූ; කුක්කුච්චුපසන්තං, සංසුන් හස්තපාදා දී සියලු කුකුස් ඇති; ඛීණාසවං, ක්ෂය කළ ආශ්‍රව ඇති රහත්හු; අඤ්ඤෙන, මේ පායාසයෙන් අන්‍ය වූ; අන්නෙන, ආහාරයෙන් ද; පානෙන, අෂ්ටවිධ පානයෙන් ද; උපට්ඨහස්සු, උපස්ථාන කරව; තංහි, ඒ ක්ෂිණාශ්‍රව ගණය වනාහි; පුඤ්ඤපෙඛස්ස, පුණ්‍යාර්ථී පුද්ගලයා හට; ඛෙත්තං හොති, පින්බිජු වැපිරීමට ක්ෂේත්‍රය වේ.

6. අථ, එසේ නම්; භො ගොතම, භගවත් ගෞතමයන් වහන්ස; ඉමං පායාසං, මේ කිරිබත; අහං, මම; කස්ස වා, කවරෙකුට හෝ; දම්මිති, දෙම්දැයි විචාළේ ය; බ්‍රාහ්මණ, බමුණ; සදෙවකෙ, දෙවියන් සහිත වූ; සමාරකෙ, මාරයා සහිත වූ; සබ්‍රහ්මකෙ, ලොකෙ, ලෝකයෙහි ද; සස්සමණ බ්‍රාහ්මණියා, ශ්‍රමණ බ්‍රාහ්මණයන් සහිත වූ; පජාය, ප්‍රජාව කෙරෙහි ද; තථාගතස්ස වා, තථාගතයන් වහන්සේ විසින් හෝ; තථාගත සාවකස්ස වා, තථාගත ශ්‍රාවකයකු විසින් හෝ; අඤ්ඤත්‍ර, මෙයින්

Non-Commercial Distribution

පිටත්; යස්ස, යමකු විසින්; සො පායාසො, ඒ කිරිබත; භුත්තො, වළඳන ලද්දේ; සම්මා පරිණාමං ගච්ඡෙය්‍ය, මනාකොට පිරිනැමීමට යන්නේ ද; තං, එබන්දෙකු; අහං, මම; න ඛො පස්සාමි, නොම දක්නෙමි; බ්‍රාහ්මණ, බමුණ; තෙනහි, එහෙයින්; ත්වං, තෝ; තං පායාසං, ඒ කිරිබත; අප්පහරිතෙ වා ඡඩ්ඩෙහි, නිල්තණ රහිත වූ තැනෙක්හි දමව්; අප්පාණකෙ වා උදකෙ, ප්‍රාණීන් රහිත වූ ජලයෙහි හෝ; ඔපිලාපෙහි ඉති, උපුල්වා හරුව යි වදාළෝ ය.

7. අථ ඛො, ඉක්බිති; කසීභාරද්වාජො බ්‍රාහ්මණො, කසීභාරද්වාජ බමුණු තෙමේ; තං පායාසං, ඒ කිරිබත; අප්පාණකෙ උදකෙ, ප්‍රාණීන් රහිත ජලයෙහි; ඔපිලාපෙසි, උපුල්වා හැරියේ ය; අථ ඛො, ඉක්බිත්තෙන්; සො පායාසො, ඒ කිරිබත; උදකෙ, ජලයෙහි; පක්ඛිත්තො, බහාලන ලද්දේ; චිච්චිටායති, චිච්චිට යන ශබ්ද කෙරේ; චිටිච්චිටායති, චිටිච්චිට යන ශබ්ද කෙරේ; සන්ධූපායති, හාත්පසින් දුමයි; සම්පධූපායති, වැඩියක් දුමයි; කෙසේ ද?; දිවසසන්තත්තො, දිවාභාගය මුළුල්ලෙහි රත් කරන ලද; ඵාලො, සීවැල; උදකෙ, ජලයෙහි; පක්ඛිත්තො, බහන ලද්දේ; සෙය්‍යථාපි නාම, යම්සේ; චිච්චිටායති, චිච්චිට යන ශබ්ද කෙරේ ද; චිටිච්චිටායති, චිටිච්චිට යන ශබ්ද කෙරේ ද; සන්ධූපායති, හාත්පසින් දුමා ද; සම්පධූපායති, වැඩියෙන් ම දුමා ද; එවමෙව ඛො, එපරිද්දෙන් ම; සො පායාසො, ඒ කිරිබත; උදකෙ පක්ඛිත්තො, ජලයෙහි බහන ලද්දේ; චිච්චිටායති, චිච්චිට යන ශබ්ද කෙරේ; චිටිච්චිටායති, චිටිච්චිට යන ශබ්ද කෙරේ; සම්ධූපායති, හාත්පසින් දුමයි; සම්පධූපායති, වැඩියක්දුමයි.

8. අථ ඛො, ඉක්බිත්තෙන්; කසීභාරද්වාජො බ්‍රාහ්මණො, කසීභාරද්වාජ බ්‍රාහ්මණ තෙමේ; සංවිග්ගො, සංවේගයට පැමිණියේ; ලොම හට්ඨජාතො, ලොමුදැහැ ගැනීම් ඇත්තේ; භගවා, භාග්‍යවතුන් වහන්සේ; යෙන, යම් තැනෙක්හි ද; තෙන, එතැන්හි; උපසංකමි, එළඹියේ ය; උපසංකමිත්වා, එළඹ; භගවතො, භාග්‍යවතුන් වහන්සේ ගේ; පාදෙසු, පාදයන්හි; සිරසා නිපතිත්වා, හිසින් වැටී; භගවන්තං, භාග්‍යවතුන් වහන්සේට; එතදවොච, මෙසේ සැල කෙළේ ය:

9. භො ගොතම, භවත් ගෞතමයන් වහන්ස; අභික්කන්තං, දම්දෙසුම ඉතා යෙහෙක; භො ගොතම, භවත් ගෞතමයන් වහන්ස; නික්කුජ්ජිතං, යටිකුරු කොට තබන ලද්දක්; සෙය්‍යථාපි, යම්සේ; උක්කුජ්ජෙය්‍යො වා, උඩුකුරු කරන්නේ ද; පටිච්ඡන්නං, ප්‍රතිච්ඡන්න වූවක්; විවරෙය්‍ය වා, යම්සේ විවෘත තරන්නේ ද; මූළ්හස්ස, මංමුළාවූවෙකුට; මග්ගං ආචික්ඛෙය්‍ය වා, යම්සේ මග කියන්නේ ද; චක්ඛුමන්තො, ඇස් ඇත්තෝ; රූපානි දක්ඛින්ති ඉති, රූපයන් දකිත්වා යි; අන්ධකාරෙ අඳුරෙහි; තෙලපජ්ජොතං, යම්සේ තෙල් පහනක්; ධාරෙය්‍ය වා, දරන්නේ ද?; එවමෙවං, එපරිද්දෙන් ම; භොතා ගොතමෙන, භවත් ගෞතමයන් වහන්සේ විසින්; අනෙක පරියායෙන, නොයෙක් ආකාරයෙන්; ධම්මො පකාසිතො, ධර්මය ප්‍රකාශ කරන ලද්දේ ය; එසංහං, ඒ මම; භගවන්තං, ගොතමං භවත් ගෞතමයන් වහන්සේ ද; ධම්මඤ්ච, ධර්මය ද; භික්ඛුසංඝඤ්ච, භික්ෂුසංඝයා ද; සරණං ගච්ඡාමි, සරණ කොට යමි; භොතො ගොතමස්ස, භවත් ගෞතමයන් වහන්සේ ගේ; සන්තිකෙ, සමීපයෙහි; අහං, මම; පබ්බජ්ජං, පැවිද්ද; ලභෙය්‍යාමි, ලබන්නෙමි; උපසම්පදං ඉති, උපසම්පදාව ද; ලභෙය්‍යං, ලබන්නෙමි; කසීභාරද්වාජො බ්‍රාහ්මණො, (එසේ ම) කසීභාරද්වාජ බමුණු තෙමේ; භගවතො සන්තිකෙ, භාග්‍යවතුන් වහන්සේ ගේ සමීපයෙහි; පබ්බජ්ජං, පැවිද්ද; අලත්ථ, ලැබුයේ ය; උපසම්පදං, උපසම්පදාව; අලත්ථ, ලැබුයේ ය.

10. අචිරූප සම්පන්නො ඛො පන, උපසම්පදා වූ නොබෝ කල් ඇති; ආයස්මා භාරද්වාජො, ආයුෂ්මත් භාරද්වාජ තෙමේ; එකො, හුදකලා වූයේ; වූපකට්ඨො, වෙන් වූයේ; අප්පමත්තො, ප්‍රමාද නො වූයේ; ආතාපි, කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇත්තේ; පහිතත්තො, කාය ජීවිත නිරපේක්ෂව නිවනට මෙහෙයවන ලද සිත් ඇතිව; විහරන්තො, වාසය කරන්නේ; න චිරස්සෙව, නොබෝ කලකින් ම;

Non-Commercial Distribution

යස්සත්ථාය, යම් අර්හත් ඵලයක් පිණිස; කුලපුත්තා, කුලපුත්‍රයෝ; සම්මදෙව, මනාකොට ම; අගාරස්මා, ගිහිගෙන් නික්ම; අනගාරියං පබ්බජන්ති, සස්නෙහි පැවිදි වෙද්ද; තදනුත්තරං, ඒ උතුම් කොට ඇති; බ්‍රහ්මචරිය පරියොසානං, මාර්ග බ්‍රහ්මචරියාව කෙළවර කොට ඇති අර්හත්ඵලය; දිට්ඨෙව ධම්මෙ, ඉහාත් ම භාවයෙහි ම; සයං, තෙමේ; අභිඤ්ඤා සච්ඡිකත්වා, විශිෂ්ට ඤාණයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට; උපසම්පජ්ජ, ඊට පැමිණ; විහාසි, වාසය කළ සේක; ජාති, ජාතිය; ඛීණා, ක්ෂය කරන ලද්දී ය; බ්‍රහ්මචරියං, මාර්ග බ්‍රහ්මචර්‍ය්‍යාව; වුසිතං, වැස නිමවන ලද්දේ ය; කතං කරණීයං, සතර මාර්ග කටයුතු නිමවන ලද්දේ ය; නාපරං ඉත්ථත්තායාති, කෙලෙසුන් දුරු කිරීම පිණිස වැඩිය යුතු අනෙක් මාර්ග භාවනාවක් නැත්තේ ය යි; අබ්භඤ්ඤාසි, ප්‍රත්‍යවෙක්ෂා ඥනයෙන් දැන ගත්තේ ය; ආයස්මා භාරද්වාජො, ආයුෂ්මත් භාරද්වාජ ස්ථවිරයන් වහන්සේ; අඤ්ඤතරො ච බො පන අරහතං අහොසීති, රහතුන් වහන්සේලා අතුරෙන් එක්තරා කෙනෙක් ද වූ සේක.

**කසීභාරද්වාජ සූත්‍රය යි.**

## (5)

## පරාභව සුත්තං. — පරාභව සූත්‍රය.

1. මෙ, මා විසින්; එවං සුතං, මේ සූත්‍ර ධර්මය මෙසේ අසන ලදී. එකං සමයං, එක් සමයෙක්හි; භගවා, භාග්‍යවතුන් වහන්සේ; සාවත්ථියං, සැවත් නුවර සමීපයෙහි වූ; ජෙතවනෙ, ජේතවනයෙහි; අනාථ පිණ්ඩිකස්ස ආරාමෙ, අනේ පිඬු සිටුහුගේ ආරාමයෙහි; විහරති, වැඩ වසන සේක; අථ බො, ඉක්බිත්තෙන්; අඤ්ඤතරා දෙවතා, එක්තරා දේවතාවෙක්; අභික්කන්තාය රත්තියා, රාත්‍රිය පිළිබඳ ප්‍රථම යාමය ඉක්ම ගිය කල්හි; අභික්කන්ත වණ්ණා, අතිශයින් මනෝඥ වූ වර්ණයෙන්; කෙවලකප්පං ජෙතවනං, මුළු ජේතවන විහාරය; ඔභාසෙත්වා, බබුළුවා; භගවා, භාග්‍යවතුන් වහන්සේ; යෙන, යම් තැනෙක්හි' ද; තෙන, එතැනට; උපසංකමි, එළඹියේ යː උපසංකමිත්වා, එළඹ; භගවන්තං, භාග්‍යවතුන් වහන්සේට; අභිවාදෙත්වා, මනාකොට වැඳ; එකමන්තං, එකත්පසෙක්හි; අට්ඨාසි, සිටියේ ය; එකමන්තං ඨිතා බො, එකත් පසෙක සිටියාම වූ; සා දෙවතා, ඒ දේවතාවා; භගවන්තං, භාග්‍යවතුන් වහන්සේට; ගාථාය, ගාථාවකින්; අජ්ඣභාසි, මෙසේ සැළ කළේ ය.

1. මයං, අපි හැමදෙන ම; පරාභවන්තං, පිරිහෙන්නා වූ; පුරිසං, පුරුෂයා; ගොතමං, ගෞතමයන් වහන්සේ වෙතින්; පුච්ඡාම, අසා දැනගනු පිණිස විචාරම් හ; භගවන්තං, භාග්‍යවතුන් වහන්සේ; පුට්ඨුං, විචාරනු පිණිස; ආගම්ම, ආම් හ; පරාභවතො, පිරිහෙන්නා වූ සත්වයාට; මුඛං, ද්වාරය; කිං?, කවරේ දැ? යි විචාළා ය.

2. ධම්මකාමො, දසකුසල ධර්‍මයට කැමැති තැනැත්තේ; භවං හොති, ලෞකික ලොකෝත්තර සැපතින් වැඩෙන්නේ වෙ යි; ධම්ම දෙස්සී, ඒ දස කුසල ධර්‍මයට ද්වේෂිව පිළි නො පදින තැනැත්තේ; පරාභවො, ලෞකික ලොකෝත්තර සැපතින් පිරිහෙයි; භවං, වැඩෙන්නා වූ තැනැත්තා; සුවිජානො හොති, සුවසේ දතහැකි වන්නේ'ය; පරාභවො, පිරිහෙන පුරුෂ තෙමේද; සවිජානො හොති, සුවසේ දතහැකි වන්නේය වදාළ සේක.

3. එතං, මේ පරිහානි කාරණය; ඉති හි, වදාළ පරිද්දෙන් ම; විජානාම, දනුම්හ; සො පඨමො පරාභවො, ඒ පළමුවැනි පරිහානි කාරණය යි; භගවා, භාග්‍යවතුන් වහන්ස!; දුතියං, දෙවැනි පිරිහෙන කාරණය; බ්‍රෑහි, වදාළ මැනවි; පරාභවතො, පිරිහීමට; මුඛං, පෙරටුව; කිං?, කවරේ ද?

Non-Commercial Distribution

4. අස්ස, සද්ධර්මයට අකැමැති පිරිහීමට පැමිණෙන පුරුෂයා හට; අසන්තො, (මිසදිටුගත්) අසත්පුරුෂයෝ; පියා හොන්ති, ප්‍රිය වෙති; සන්තං, (බුද්ධාදි) සත්පුරුෂයන් කෙරෙහි; න කුරුතෙ පියං, ප්‍රිය නො කෙරෙති; අසතං ධම්මං, අසත්පුරුෂයන් ගේ මිසදිටු දහම; රොචෙති, රුචි කෙරේ; තං, එය; පරාභවතො, පිරිහෙන පුද්ගලයාගේ; මුඛං, කරුණු වෙයි.

5. එතං, මේ දෙවෙනි පරිහානි කාරණය; ඉති හි, වදාළ පරිදි ම; විජානාම, දනුම්හ; සො දුතියො පරාභවො, හේ දෙවෙනි පරිහානි කාරණය වන්නේ ය; භගවා, භාග්‍යවතුන් වහන්ස!; පරාභවතො, පිරිහෙන පුද්ගලයා ගේ; තතියං මුඛං, තුන්වැනි පරිහානි කාරණය; කිං?, කිමැ? යි වදාළ මැනවි.

6. යො නරො, යම් මිනිසෙක්; නිද්දාසීලී, නිදනසුලු වේ ද?; සභාසීලී, ගණයා කෙරෙහි ඇලෙන සුලු වේ ද?; අනුට්ඨාතා ච, උට්ඨාන වීර්‍ය්‍ය නැතියේ ද; අලසො, අලස ද; කොධපඤ්ඤාණෙ, ක්‍රෝධය ම ලකුණු කොට ඇත්තේ ද; තං, එය; පරාභවතො, පිරිහෙන පුඟුල්හු ගේ; මුඛං, දොර යි.

7. ඉති හි, මෙසේ හෙයින්; එතං, තෙල කාරණය; විජානාම, දනුම්හ; සො, ඒ; තතියො පරාභවො, තෙවෙනි පරාභවයැ යි; භගවා, භාග්‍යවතුන් වහන්ස!; පරාභවතො, පිරිහෙනුහු ගේ; චතුත්‍ථං මුඛං, සතරවන දොර; කිං?, කිමැ? යි; බ්‍රෑහි, වදාළ මැනවි.

8. යො, යමෙක්; පහුසන්තො, පොහොසත් වූයේ; ජිණ්ණකං, ජරාජීණ වූ; ගතයොබ්බනං, ඉක්මගිය යොවුන් බව ඇති; මාතරං වා, මව හෝ; පිතරං වා, පියා හෝ; න භරති, නො පුස්නේ ද; තං, එය; පරාභවතො, පිරිහෙන්නහු ගේ; මුඛං, දොර යි.

9. ඉති හි, මෙසෙයින්; එතං, තෙල කරුණ; විජානාම, දනුම්හ; සො, ඒ චතුත්ථො, සතරවන; පරාභවො, පරාභවය යි; භගවා, භාග්‍යවතුන් වහන්ස!; පරාභවතො, පිරිහෙන පුඟුල්හු ගේ; පඤ්චමං මුඛං, පස්වන කරුණ; කිං?, කිමැ? යි; බ්‍රෑහි, වදාළ මැනවි.

10. යො, යමෙක්; බ්‍රාහ්මණං වා, බමුණකු වේව යි; සමණං වා, මහණකු වේව යි; අඤ්ඤං වා පි වණිබ්බකං, අන්කිසි යදියෙකු වේව යි; මුසාවාදෙන, මුසාවාදයෙන්; වඤ්චෙති, රවටා ද; තං, එය; පරාභවතො, පිරිහෙන පුඟුල්හු ගේ; මුඛං, දොර යි.

11. ඉති හි, මෙසේ හෙයින්; එතං, ඒ කරුණ; විජානාම, දනුම්හ; සො, ඒ ලක්ෂණය; පඤ්චමො, පස්වන; පරාභවො, පරාභවය යි; භගවා, භාග්‍යවතුන් වහන්ස!; පරාභවතො, පිරිහෙන පුඟුල්හු ගේ; ඡට්ඨමං මුඛං, සයවන දොර; කිං?, කිමැ?යි; බ්‍රෑහි, වදාළ මැනවි.

12. පහූතවිත්තො, බොහෝ රන් රිදී ආදී වස්තුව ඇති; සහිරඤ්ඤො, බොහෝ කහවණු සහිත වූ; සභොජනො, නොයෙක් සූපව්‍යංජනයෙන් යුත් බොජුන් ඇති; පුරිසො, පුරුෂයෙක් තෙමේ; එකො, හුදකලා වූයේ; සාදූනි, මියුරු රස ඇති භෝජන; භුඤ්ජති, තම අඹුදරුවන්ටත් නොදී අනුභව කෙරේ ද; තං, එය; පරාභවතො, පිරිහෙන පුඟුල්හු ගේ; මුඛං, දොර යි.

13. ඉති හි, මෙසේ හෙයින්; එතං, ඒ කරුණ; විජානාම, දනුම්හ; සො, ඒ ලක්ෂණය; ඡට්ඨමො, සයවන; පරාභවො, පරාභවය යි; භගවා, භාග්‍යවතුන් වහන්ස!; පරාභවතො, පිරිහෙන පුඟුල්හු ගේ; සත්තමං මුඛං, සත්වන දොර; කිං?, කිමැ? යි; බ්‍රෑහි, වදාළ මැනවි.

Non-Commercial Distribution

14. යො නරො, යම් මිනිසෙක්; ජාතිත්‍ථද්ධො, ජාතිමානයෙන් තද වූයේ; ධනත්‍ථද්ධො, ධනමානයෙන් තද වූයේ; සඤ්ඤාතිං, සිය ඤාතීන්; අතිමඤ්ඤෙති, ඉක්ම සිතා ද; තං පරාභවතො, පිරිහෙන්නහු ගේ; මුඛං, දොර යි.

15. ඉති හි, මෙසේ හෙයින්; එතං, ඒ කරුණ; විජානාම, දනුම්හ; සො, ඒ ලක්ෂණය; සත්තමො, සත්වන; පරාභවො, පරාභවය යි; භගවා, භාග්‍යවතුන් වහන්ස!; පරාභවතො, පිරිහෙන පුග්ගල්හු ගේ; අට්ඨමං මුඛං, අටවන පිරිහීමේ දොර; කිං?, කිමැ?යි; බෲහි, වදාළ මැනවි.

16. යො නරො, යම් මිනිසෙක්; ඉත්ථිධුත්තො, ස්ත්‍රීධූර්ත වූයේ; සුරාධුත්තො, සුරාධූර්ත වූයේ; අක්ඛධුත්තො, අක්ෂධූර්ත වූයේ; ලද්ධං ලද්ධං, ලද ලද දෑ; විනාසෙති, වනසා ද; තං, එය; පරාභවතො, පිරිහෙන පුග්ගල්හු ගේ; මුඛං, දොර යි.

17. ඉති හි, මෙසෙයින්; එතං, ඒ කරුණ; විජානාම, දනුම්හ; සො, ඒ ලක්ෂණය; අට්ඨමො පරාභවො; අටවන පරාභවය යි; භගවා, භාග්‍යවතුන් වහන්ස!; පරාභවතො, පිරිහෙන පුග්ගල්හු ගේ; නවමං මුඛං, නවවන පිරිහීමේ දොර; කිං?, කිමැ? යි; බෲහි, වදාළ මැනවි.

18. සෙහිදාරෙහි, සියදාරයන් විසින්; අසන්තුට්ඨො, නො සතුටු වූයේ, වෙසියාසු, වේශ්‍යාවන් කෙරෙහි; පදිස්සති, පැමිණේ ද; පරදාරෙසු, පරඅඹුවන් වෙත; දිස්සති, පැමිණේ ද; තං, එය; පරාභවතො, පිරිහෙන පුග්ගල්හු ගේ; මුඛං දොර යි.

19. ඉති හි, මෙසෙයින්; එතං, ඒ කරුණ; විජානාම, දනුම්හ; සො, ඒ ලක්ෂණය; නවමො, පරාභවො, නවවන පරාභවය යි; භගවා, භාග්‍යවතුන් වහන්ස!; පරාභවතො, පිරිහෙන්නහු ගේ; දසමං මුඛං, දසවන දොර; කිං?, කිමැ?යි; බෲහි, වදාළ මැනවි.

20. අතීත යොබ්බනොපොසො, ඉක්මගිය යොවුන් විය ඇති පුරුෂ තෙමේ; තිම්බරුත්‍ථනිං, තිඹිරිපල බඳු පියොවුරු ඇති තරුණ දැරියන්; ආනෙති, විවාහ කොට ගනී ද (හේ); තස්සා, ඇට; ඉස්සා; ඊර්ෂ්‍යායෙන්; න සුපති, නොනිදා ද; තං එය; පරාභවතො මුඛං, පිරිහෙන පුග්ගල්හු ගේ දොර යි.

21. ඉති හි, මෙසෙයින්; එතං, ඒ කරුණ; විජානාම, දැනගනුම්හ; සො, ඒ ලක්ෂණය; දසමො පරාභවො, දසවන පරාභවය යි; භගවා, භාග්‍යවතුන් වහන්ස!; පරාභවතො, පිරිහෙන පුග්ගල්හු ගේ; එකාදසමං, එකොළොස් වන; මුඛං, පිරිහීමේ කරුණ; කිං?, කිමැ?යි; බෲහි, වදාළ මැනවි.

22. සොණ්ඩිං, මත්ස්‍යමාංස මත්පැන් ආදියෙහි ලොල් වූ; විකිරණිං, ඒ මාංසාදිය සඳහා ධනය විසුරුවන; ඉත්ථිං වා, මාගමක් හෝ; තාදිසං, එබඳු වූ; පුරුසං වා පි, පුරුෂයකු; ඉස්සරියස්මිං, ඉසුරෙහි; ඨපාපෙති, තබා ද; තං, එය; පරාභවතො, පිරිහෙන පුග්ගල්හුගේ; මුඛං දොර යි.

23. ඉති හි, මෙසෙයින්; එතං, ඒ කරුණ; විජානාම, දැනගනුම්හ; සො, ඒ ලක්ෂණය; එකාදසමො, පරාභවො, එකොළොස්වන පරාභවය යි; භගවා, භාග්‍යවතුන් වහන්ස!; පරාභවතො, පිරිහෙන පුග්ගල්හු ගේ; ද්වාදසමං, දොළොස්වන; මුඛං, පිරිහීමේ කරුණ; කිං?, කිමැ?යි; බෲහි, වදාළ මැනවි.

24. අප්පභොගො, අල්ප භෝග ඇති, මහා තණ්හො; මහත් වූ භෝග තෘෂ්ණා ඇති යමෙක්; ඛත්තියෙ කුලෙ, ක්‍ෂත්‍රීය කුලයෙහි; ජායතෙ, උපදී ද; සො ච, හෙද; රජ් ජං, රාජ්‍යය; පත්‍ථයති, පතා ද; තං, එය; පරාභවතො, පිරිහෙන පුග්ගල්හුගේ; මුඛං, දොර යි.

Non-Commercial Distribution

25. පණ්ඩිතා, පණ්ඩිත වූ; දස්සන සම්පන්නො, පරාභවයන් දක්නා නුවණැති; සො අරියො, ඒ ආර්‍ය්‍ය පුද්ගල තෙම; ලොකෙ, ලෙව්හි; එතෙ පරාභවෙ, තෙල පරාභවයන්; සමවෙක්ඛිය, නුවණැසින් පිරිසිඳ දැන; සිවං ලොකං, දෙව්ලොව, භජතෙ, භජනය කරන්නේ ය යි වදාළ සේක.

**පරාභව සුත්තං. - පරාභව සූත්‍රය යි.**

## (6)

## අග්ගික භාරද්වාජ සුත්තං — අග්ගික භාරද්වාජ සූත්‍රය.
## (වසල සුත්තං. - වසල සූත්‍රය.)

1. මෙ, මා විසින්; එවං සුතං, මෙසේ අසන ලදි. එකං සමයං, එක් සමයෙක්හි; භගවා, භාග්‍යවතුන් වහන්සේ; සාවත්ථියං, සැවත් නුවර; ජෙතවනෙ, ජේතවන නම්; අනාථ පිණ්ඩිකස්ස, අනේපිඬු සිටුහු ගේ; ආරාමෙ, අරම්හි; විහරති, වැඩ වසන සේක; අථ බො, එකල්හි; භගවා, භාග්‍යවතුන් වහන්සේ; පුබ්බණ්හ සමයං, පෙරවරු සමයෙහි; නිවාසෙත්වා, හැඳ පෙරවැ; පත්තචීවරං, පාසිවුරු; ආදාය, ගෙන; සාවත්ථියං, සැවැත් නුවරට; පිණ්ඩාය, පිඩු පිණිස; පාවිසි, වැඩි සේක.

2. තෙන බො පන සමයෙන, එසමයෙහි වනාහි; අග්ගික භාරද්වාජස්ස, අග්ගික භාරද්වාජ නම් වූ; බ්‍රාහ්මණස්ස, බමුණා ගේ; නිවෙසනෙ, නිවෙස්න සමීපයෙහි; අග්ගි, හෝම ගිනි; පජ්ජලිතො හොති, දල්වන ලද්දේ වෙයි; ආහුති පග්ගහිතා, අග්ගිහෝමය පටන් ගන්නා ලද්දේ ය.

3. අථ බො, ඉක්බිති; භගවා, භාග්‍යවතුන් වහන්සේ; සාවත්ථියං, සැවැත් නුවර; සපදානං, ගෙපිළිවෙළින්; පිණ්ඩාය, පිඩු පිණිස; චරමානො, වඩනා සේක්; අග්ගික භාරද්වාජස්ස, අග්ගික භාරද්වාජ; බ්‍රාහ්මනස්ස, බ්‍රාහ්මණයා ගේ; නිවෙසනං, නිවෙස්න; යෙන, යම් තැනක ද; තෙන, එතැනට; උපසංකමි, එළඹී සේක.

අග්ගික භාරද්වාජො බ්‍රාහ්මණො, අග්ගික භාරද්වාජ බමුණු තෙමේ; ආගච්ඡන්තං, වැඩමවන්නා වූ; භගවන්තං, භාග්‍යවතුන් වහන්සේ; දූරතොව, දුරදීම; අද්දසා බො, දුටුයේ ම ය; දිස්වාන, දැක; භගවන්තං, භාග්‍යවතුන් වහන්සේට; එතදවොච, මේ වචනය කීයේ ය; මුණ්ඩක, මුණ්ඩකය; තත්‍රෙව තිට්ඨහි, එහි ම සිටුව; සමණක, ශ්‍රමණකය; තත්‍රෙව, එහි ම සිටුව; වසලක, වසලකය; තත්‍රෙව තිට්ඨාහීති, එහි ම සිටුව යි;

4. එවං වුත්තෙ, මෙසේ කී කල්හි; භගවා, භාග්‍යවතුන් වහන්සේ; අග්ගික භාරද්වාජං බ්‍රාහ්මණං, අග්ගික භාරද්වාජ බමුණා හට; එතදවොච, මෙසේ වදාළ සේක; බ්‍රාහ්මණ, බමුණ; ත්වං, තෝ; වසලං වා, සැඩොලා හෝ; වසලකරණෙ වා ධම්මෙ, සැඩොල් බවට පමුණුවන කාරණයන් හෝ; ජානාසි පන ඉති, හි මෙක දන්නෙහි ද?

භො, ගොතම, භවත් ගෞතමයන් වහන්ස; අහං, මම; වසලං වා, වසලයා හෝ; වසලකරණං වා ධම්මෙ, වසලකරන ධර්ම වේව යි; න බො පන ජනාමි, නො දනිමි; භවං ගොතමො, භවත් ගෞතමයාණෙනි; වසලං වා, වසලයා හෝ; වසලකරණෙවා ධම්මෙ, වසලකරන ධර්‍ම වේව යි; යථාහං, යම්සේ මම; ජානෙය්‍යං, දැන ගනිම් ද; මෙ, මට; තථා ධම්මං දෙසෙතු, එසේ දහම් දෙසන සේක් වා; සාධු ඉති, මැනැවැ යි සැළ කෙළේ ය.

Non-Commercial Distribution

තෙන හි, එසේ නම්; බ්‍රාහ්මණ, බ්‍රාහ්මණය; සුණාහි, අසව; සාධුකං මනසි කරොහි, මොනවට මෙනෙහි කරව; භාසිස්සාමී'ති කියන්නෙමි'යි; භොති, පින්වත; එවං බො, එසේ යයි කියා; අග්ගික භාරද්වාජො බ්‍රාහ්මණො, අග්ගික භාරද්වාජ බ්‍රාහ්මණ තෙම; භගවතො, භාග්‍යවතුන් වහන්සේට; පච්චස්සොසි, පිළිවදන් ඇස්විය; භගවා, භාග්‍යවතුන් වහන්සේ; එතදවොච, මේ ධර්මය වදාළ සේක.

1. යො නරො, යම් මිනිසෙක්; කොධනො, කිපෙන සුලු වේ ද; උපනාහී ච, බඳනා ලද වෙර ඇත්තේ වේ ද; පාපමක්ඛී ච, පවිටු ලාමක ගුණමකු වූයේ ද; විපන්නදිට්ඨී, විපර්යාස වූ දෘෂ්ටි ඇත්තේ ද; මායාවි, මායාවීත් වේ ද; තං ජඤ්ඤා වසලො ඉති, ඔහු වසලයෙකැ යි දන්නේ ය.

2. ඉධ, මේ ලෝකයෙහි; යො, යමෙක්; එකජං වා, එක්වරක් උපන්නා වූ හෝ; ද්විජං වා, දෙවරක් උපන්නා වූ හෝ; පාණාති, ප්‍රාණීන්; හිංසති, දිවි ගලවා ද; යස්ස, යමක්හට; පාණෙ, ප්‍රාණීන් කෙරෙහි; දයා නත්ථි, දයා නැත් ද; තං, ඔහු; වසලො ඉති, වසලයෙකැ'යි; ජඤ්ඤා, දන්නේ ය.

3. යො, යමෙක්; ගාමානී ච, ගමුදු; නිගමානී ච, නියගම්ගමුදු; හන්ති, නසා ද; පරිරුන්ධති, වටලා ගනී ද; නිග්ගාහකො සමඤ්ඤාතො, නිග්‍රහ කරන්නෙකැ යි ප්‍රසිද්ධ වේ ද; තං, ඔහු; වසලො ඉති, වසලයෙකැ යි; ජඤ්ඤා, දන්නේ ය.

4. යං, යමෙක්; ගාමෙ වා, ගමෙහි හෝ; යදි, ඉදින්; අරඤ්ඤෙ වා, වනයෙහි හෝ; පරෙසං, අනුන් ගේ; මමායිතං, මමත්වය ඇති; අදින්නං, නුදුන් වස්තුවක්; ථෙය්‍යා, සොර සිතින්; ආදියති, ගනී ද; තං, ඔහු; වසලො ඉති, වසලයෙකැ යි; ජඤ්ඤා, දන්නේ ය.

5. යො, යමෙක්; හවෙ, ඒකාන්තයෙන්; ඉණං ආදාය, ණය රැගෙන; චුජ්ජමානො, චෝදනා කරනු ලබන්නේ; නහි තෙ ඉණං අත්ථි, තට මගෙන් ණයක් නැත්තේ ය යි; පලායති, පලායේ නම්; තං, ඔහු; වසලො ඉති, වසලයෙකැ යි; ජඤ්ඤා, දන්නේ ය.

6. යො, යමෙක්; වෙ, ඒකාන්තයෙන්; කිඤ්චික්ඛකම්‍යතා, කිසි වස්තුවක් කැමැත්තෙන්; පන්ථස්මිං, මාර්ගයෙහි; වජතං ජනං, යන්නා වූ ජනයා; හන්ත්වා, නසා; කිඤ්චික්ඛමාදෙති, කිසි වස්තුවක් පැහැර ගනී ද; තං, ඔහු; වසලො ඉති, වසලයෙකැ යි; ජඤ්ඤා, දන්නේ ය.

7. යො නරො, යම් මිනිසෙක්; සක්ඛිපුට්ඨො, සාක්ෂි විචාරන ලද්දේ; අත්තහෙතු, තමා හේතුකොට ගෙන හෝ; පරහෙතු, අනුන් හේතු කොට ගෙන හෝ; යො ධනහෙතු ච, යම් ධනයක් හේතුකොට ගෙන හෝ; මුසා බ්‍රූති, බොරු කියා ද; තං, ඔහු; වසලො ඉති, වසලයෙකැ යි; ජඤ්ඤා, දන්නේ ය.

8. යො, යමෙක්; ඤාතිනං වා, ඤාතීන් ගේ හෝ; සඛානං වා, යහළුවන් ගේ හෝ; දාරෙසු, භාර්‍ය්‍යාවන් කෙරෙහි; සහසා, බලහත්කාරයෙන්; සම්පියෙන වා, දෙදෙනා ගේ සහායෙන් හෝ; පතිදිස්සති, අනාචාරයෙහි හැසිරේ ද; තං, ඔහු; වසලො ඉති, වසලයෙකැ යි; ජඤ්ඤා, දන්නේ ය.

9. යො, යමෙක් තෙම; පහුසන්තො, බොහෝ ධනධාන්‍ය ඇත්තේ; ජිණ්ණකං, ජරාපත් වූ; ගක යොබ්බනං, පහව ගිය යොවුන් බව ඇති; මාතරං වා, මව හෝ; පිතරං වා,

පියා හෝ; න හරති, පෝෂණය නො කෙරේ ද; තං, ඔහු; වසලො ඉති, වසලයෙකැ යි; ජඤ්ඤා, දන්නේ ය.

10. යො, යමෙක් තෙම; මාතරං වා, මවට හෝ; පිතරං වා, පියාට හෝ; භාතරං, භගිනිං, සසුං, සහෝදර සහෝදරියන්ට හෝ නැදිමයිලන්ට හෝ; හන්ති, හිංසා කෙරේ ද; වාචා ය, වචනයෙන්; රොසෙති, කෝප උපදවා ද; තං, ඔහු; වසලො ඉති, වසලයෙකැ යි; ජඤ්ඤා, දන්නේ ය.

11. යො, යමෙක් තෙම; අත්‍ථං, අර්ථයක් ම; පුච්ඡිතො සන්තො, විචාරන ලද්දේ ම; අනත්‍ථං අනුසාසති, අනර්ථයක් ම ප්‍රකාශ කෙරේ ද; පටිච්ඡන්නෙන, සැඟවීම් වශයෙන්; මන්තෙති, මන්ත්‍රණය කෙරේ ද; තං, ඔහු; වසලො ඉති, වසලයෙකැ යි; ජඤ්ඤා, දන්නේ ය.

12. යො, යමෙක් තෙම; පාපකං කම්මං කත්වා, පව් කම් කොට; මං, මා; මාජඤ්ඤාති ඉච්ඡති, නොදනීවා යි කැමැතිවේ ද; යො, යමෙක්; පටිච්ඡන්න කම්මන්තො, ප්‍රතිච්ඡන්න කර්ම ඇති සේක් වේ ද; තං, ඔහු; වසලො ඉති, වසලයෙකැ යි; ජඤ්ඤා, දන්නේ ය.

13. යො, යමෙක් තෙම; පරකුලං ගන්ත්වා, ඤාතිමිත්‍රාදී අන්කුලයකට ගොස්; සුචිභොජනං, යහපත් භෝජනයන්; භුත්වාන, අනුභව කොට; ආගතං, තම නිවෙසට පැමිණි ඔවුන්ට; න පටිපූජෙති, ප්‍රතිපූජා නො කෙරේ ද; තං, ඔහු; වසලො ඉති, වසලයෙකැ යි; ජඤ්ඤා, දන්නේ ය.

14. යො, යමෙක් තෙම; බ්‍රාහ්මණං වා සමණං වා, බමුණකු හෝ මහණකු හෝ; අඤ්ඤං වණිබ්බකං වා පි, අන්කිසි යාචකයකු හෝ; මුසාවාදෙන, මුසාවාදයෙන්, වඤ්චෙති, රවටා ද; තං, ඔහු; වසලො ඉති, වසලයෙකැ යි; ජඤ්ඤා, දන්නේ ය.

15. යො, යමෙක් තෙම; බ්‍රාහ්මණං වා සමණං වා, බමුණකු හෝ මහණකු හෝ; භත්තකාලෙ උපට්ඨිතෙ, භෝජන කාලයෙහි පැමිණි කල්හි; රොසෙති වාචා, පරොස් බසින් කෝප උපදවා ද; න දෙති, කිසිවක් නොදේ ද; තං, ඔහු; වසලො ඉති, වසලයෙකැ යි; ජඤ්ඤා, දන්නේ ය.

16. ඉධ, මේ ලෝකයෙහි; යො, යමෙක්තෙම; මොහෙන, මෝහයෙන්; පළිගුණ්ඨිතො, වෙළුණේ; කිඤ්චික්ඛං, කිසියම් දෙයක්; නිජිගිංසානො, නොදී වලකමින්; අසතං, අසත්පුරුෂ වචන; පබ්‍රූති, කියා ද; තං, ඔහු; වසලො ඉති, වසලයෙකැ යි; ජඤ්ඤා, දන්නේ ය.

17. යො, යමෙක් තෙම; සෙන මානෙන, ස්වකීය මානයෙන්; නිහීනො, ඉතා හීනවූයේ; අත්තානං, තමන්; සමුක්කංසෙ, හුවාදක්වා ද; පරං වා, මෙරමාහට; අවජානති, නින්දා කෙරේ ද; තං, ඔහු; වසලො ඉති, වසලයෙකැ යි; ජඤ්ඤා, දන්නේ ය.

18. රොසකො, යමෙක් කෝප උපදවනුයේ ද; කදරියො ච, තද මසුරු වූයේ ද; පාපිච්ඡො, පවිටු අදහස් ඇත්තේ ද; මච්ඡරී, මසුරු බැව් ඇත්තේ ද; සඨො, ශඨභාවයෙන් යුක්ත වේ ද; අහිරිකො, පවට ලජ්ජා නැත්තේ ද; අනොත්තාපි, පවට බිය නැත්තේ වේ ද; තං, ඔහු; වසලො ඉති, වසලයෙකැ යි; ජඤ්ඤා, දන්නේ ය.

Non-Commercial Distribution

19. යො, යමෙක් තෙම; බුද්ධං, සම්මාසම්බුදුනට; පරිභාසති, පරිභව බෙණේ ද; අථවා, නොහොත්; තස්ස, උන්වහන්සේ ගේ; සාවකං, ශ්‍රාවක වූ; පරිබ්බාජං, පැවිද්දකුට වේව යි; ගහට්ඨං වා, ගැහැවියකුට වේව යි; පරිභාසති, අපවාද කෙරේ ද; තං, ඔහු; වසලො ඉති; වසලයෙකැ යි; ජඤ්ඤා, දන්නේ ය.

20. යො, යමෙක් තෙම; අනරහා සන්තො, රහත් නො වූයේ ම; තමා අරහං, රහත්ය'යි; පටිජානාති, ප්‍රතිඥා කෙරේ ද; සබ්‍රහ්මකෙ, බ්‍රහ්මයා සහිත වූ; ලොකෙ, ලෝකයෙහි; එස ඛො, මෙ තෙම; වෙ, ඒකාන්තයෙන්: චොරො, මහ සොරෙක; වසලාධමො, අධම වූ චණ්ඩාලයෙක; මෙ, මා විසින්; වො, තොපට; යෙ වසලා, යම් වසල කෙනෙක්; පකාසිතා, ප්‍රකාශ කරන ලද්දාහු ද; එතෙ ඛො, ඒ වසලයෝ; වුත්තා, කියන ලද්දා හ.

21. නජච්චා වසලො හොති, ජාතියෙන් වසලයෙක් නොවේ; නජච්චා හොති බ්‍රාහ්මණො, ජාතියෙන් බමුණෙක් ද නොවේ; කම්මනා, අපිරිසිදු කර්මයෙන්; වසලො හොති, වසලයෙක් වෙයි; කම්මනා, පිරිසිදු කර්මයෙන්; බ්‍රාහ්මණො හොති, බමුණෙක් වෙයි.

22. යථා, යම් ප්‍රකාරයකින්; මෙ, මාගේ; ඉදං නිදස්සනං, මේ නිදසුන වේ ද; තං, ඒ කරුණ; ඉමිනා, මේ ප්‍රකාරයෙනුදු; විජානාථ, දැනගනිවු; සොපාකො, බලුමස් උයා කන හෙයින් සොපාක නම්; චණ්ඩාල පුත්තො, සැඩොල් පුතෙක්; මාතංගො ඉති, මාතංගය'යි; විස්සුතො, ප්‍රසිද්ධ විය.

23. සො අයං මාතංගො, ඒ මේ මාතංග තෙමේ; සුදුල්ලභං, ඉතා දුර්ලභ වූ; පරමං යසං, හීන කුලිකයකුට නො ලැබිය හැකි උතුම් යසසට; පත්තො, පැමිණියේ ය; ඛත්තියා බ්‍රාහ්මණා බහූ, බොහෝ ක්ෂත්‍රියයෝ ද; බ්‍රාහ්මණයෝ ද; තස්ස, ඕ හට; උපට්ඨානං, උපස්ථානයට; ආගච්ඡුං, පැමිණියාහු ය.

24. සො, ඒ සෝපාක තෙමේ; විරජං, රාගාදි රජස් රහිත වූ; මහාපථං, බුද්ධාදී උතුමන් ගේ මහාමාර්ගය වූ; දෙවයානං, අටසමවත් සංඛ්‍යාත දේවයානයට; ආරුය්හ, නැගී; කාමරාගං; කාමරාග; විරාජෙත්වා, පහකොට; බ්‍රහ්මලොකූපගො අහු, බඹලොවට පැමිණියේ විය.

25. බ්‍රහ්මලොකූප පත්තියා, ඒ බඹලොව ඉපදීම හේතු කොටගෙන; න නං ජාති නිවාරෙසි, ඒ චණ්ඩාල ජාතිය නො වැළැක් වූයේ ද; මන්තබන්ධුනො, මන්ත්‍රධ්‍යානයෙන් කල් යවන; අජ්ඣායක කුලෙ ජාතා, වේද හදාරන කුලයෙහි උපන්; බ්‍රාහ්මණා, බ්‍රාහ්මණයෝ ද (නිතර පව්කම්හි ගැලුනාහු දක්නා ලැබෙත්)

26. පාපකම්මෙසු, පව්කම්හි; අභිණ්හං, නිතර පව් කරන බව දක්නා ලැබෙද්ද; තෙ ච, ඒ බ්‍රාහ්මණයෝ; දිට්ඨෙවධම්මෙ, මෙලොවදී ම; ගාරය්හා, නින්දාවට පැමිණෙන්නෝ වෙත්; සම්පරායෙ ච, පරලෙව්හි දී; දුග්ගතිං, දුගතියට පැමිණෙන්නෝ වෙත්: ජාති, ජාති තොමෝ; නං, ඔවුන්; න නිවාරෙසි, දුගතියෙන් හෝ ගැරහීමෙන් හෝ නො වළහ යි.

27. ජච්චා, ජාතිය හේතු කොට ගෙන; වසලො න හොති, වසලයෙක් නො වේ; ජච්චා, ජාතිය හේතු කොට ගෙන; බ්‍රාහ්මණො න හොති, බ්‍රාහ්මණයෙක් ද නොවෙයි; කම්මනා වසලො හොති, කර්මයෙන් වසලයෙක් වේ; කම්මනා බ්‍රාහ්මණො හොති, යහපත් ක්‍රියාවෙන් බ්‍රාහ්මණයෙක් වේ.

Non-Commercial Distribution

5. එවං වුත්තෙ, මෙසේ වදාළ කල්හි; අග්ගික භාරද්වාජො බ්‍රාහ්මණො, අග්ගික භාරද්වාජ බ්‍රාහ්මණ තෙම; භගවන්තං භාග්‍යවතුන් වහන්සේට; එතදවොච, මෙසේ සැළ කෙළේ ය; භො ගොතම, භවත් ගෞතමයන් වහන්ස; අභික්කන්තං, ඉතා මනහර ය; භො ගොතම, භවත් ගෞතමයන් වහන්ස; අභික්කන්තං, ඉතා මනහර ය; භො ගොතම, භවත් ගෞතමයන් වහන්ස; නික්කුජ්ජිතං වා, යටිකුරු කොට තබන ලද්දක්; උක්කුජ්ජෙය්‍යා, උඩුකුරු කොට තබන්නේ; සෙය්‍යථාපි, යම් සේ ද; පටිච්ඡන්නං වා, වැසී තිබුණ යමක්; විවරෙය්‍ය වා, විවෘත කොට දක්වන්නේ හෝ යම්සේ ද; මූළ්හස්ස, මං මුලාවූවකුට; මග්ගං, මාර්ගය; ආචික්ඛෙය්‍ය වා, කියන්නේ හෝ යම් සේ ද; චක්ඛුමන්තො, ඇස් ඇත්තෝ; රූපානි, රූපයන්; දක්ඛින්ති ඉති, දකිත්වා යි; අන්ධකාරෙ, අඳුරෙහි; තෙල පජ්ජොතං ධාරෙය්‍ය වා, තෙල් පහනක් දරන්නේ හෝ යම් සේ ද; එවං එව, එපරිද්දෙන් ම; භොතා ගොතමෙන, භවත් ගෞතමයන් විසින්; අනෙක පරියායෙන, නොයෙක් පරිද්දෙන්; ධම්මො, ධර්මය; පකාසිතො දේශනා කරන ලද්දේ ය; එසාහං, මේ මම; භගවන්තං ගොතමං, භවත් ගෞතමයන් වහන්සේ ද; ධම්මං ච, ධර්මය ද; භික්ඛුසංඝඤ්ච, භික්ෂු සංඝයා ද; සරණං ගච්ඡාමි, පිහිට කොට යමි; භවං ගොතමො, භවත් ගෞතමයන් වහන්සේ; අජ්ජතග්ගෙ, අද පටන්; පාණුපෙතං, දිවිහිමි කොට; සරණං ගතං, සරණ ගියා වූ; උපාසකං, උපාසකය කැයි; මං, මා; ධාරෙතු, දරාගන්නා සේක් වා.

වසල සූත්‍රය යි.

## (7)
## සච්චවිභඞ්ග සුත්තං. — සච්චවිභඞ්ග සූත්‍රය.

1. මෙ, මා විසින්; එවං සුතං, මෙසේ අසන ලදි. එකං සමයං, එක් සමයෙක්හි; භගවා, භාග්‍යවතුන් වහන්සේ; බාරාණසියං, බරණැස් නුවර; මිගදායෙ, මිගදාය නම් ලද; ඉසිපතනෙ, ඉසිපතනාරාමයෙහි; විහරති, වැඩ වාසය කරන සේක; තත්‍ර ඛො, එකල්හි වනාහි; භගවා, භාග්‍යවතුන් වහන්සේ; භික්ඛවො ඉති, මහණෙනි කියා; භික්ඛූ, භික්ෂූන්; ආමන්තෙසි, ඇමතූ සේක; තෙ භික්ඛූ, ඒ භික්ෂූහු; භදන්තෙ ඉති, පින්වතුන් වහන්සැ'යි; භගවතො, භාග්‍යවතුන් වහන්සේට; පච්චස්සොසුං, පිළිවදන් දුන්හ; භගවා, භාග්‍යවතුන් වහන්සේ; එතං, මෙය; අවොච, වදාළ සේක;

2. භික්ඛවෙ, මහණෙනි; අරහතා, අර්හත් වූ; සම්මාසම්බුද්ධෙන, සම්‍යක්සම්බුද්ධ වූ; තථාගතෙන, තථාගතයන් වහන්සේ විසින්; බාරාණසියං, බරණැස් නුවර; මිගදායෙ, මිගදාය නම් වූ; ඉසිපතනෙ, ඉසිපතනාරාමයෙහි දී; ලොකස්මිං, ලොකයෙහි; සමණෙන වා, ශ්‍රමණයකු විසින් හෝ; බ්‍රාහ්මණෙන වා, බ්‍රාහ්මණයකු විසින් හෝ; දෙවෙන වා, දෙවියකු විසින් හෝ; මාරෙන වා, මාරයකු විසින් හෝ; බ්‍රහ්මුණා වා, බ්‍රහ්මයකු විසින් හෝ; කෙනචි වා, කිසිවකු විසින් හෝ; අප්පතිවත්තියං, නො පැවැත්විය හැකි; යදිදං, යම් මේ; චතුන්නං, අරියසච්චානං, චතුරාර්‍ය්‍යසත්‍යයන් ගේ; ආචික්ඛණා, ප්‍රකාශ කිරීම ය; දෙශනා, දේශනා කිරීම ය; පඤ්ඤපනා, පැමිණවීම ය; පට්ඨපනා, තැබීම ය; විවරණා, විස්තර කිරීම ය; විභජනා, විභාග කිරීම ය; උත්තානිකම්මං, අති ප්‍රකට කිරීම ය යන; අනුත්තරං ධම්මචක්කං, අනුත්තර වූ ධර්මචක්‍රය; පවත්තිතං, පවත්වන ලද්දේ ය.

3. කතමෙසං චතුන්නං?, කවර චතුරාර්‍ය්‍යසත්‍යයන් ගේ ද යත්?; දුක්ඛස්ස අරියසච්චස්ස, දුක්ඛාර්‍ය්‍යසත්‍යයා ගේ; ආචික්ඛණා, ප්‍රකාශ කිරීම ය; දෙසනා, දේශනා කිරීම ය; පඤ්ඤපනා, පැනවීම ය; පට්ඨපනා, පිහිටුවීම ය; විවරණා, විස්තර කිරීම ය; විභජනා, විභාග කිරීම ය; උත්තානීකම්මං, අති ප්‍රකට කිරීම ය යන මේ ධර්මය ද; දුක්ඛසමුදයස්ස, අරියසච්චස්ස, දුක්ඛසමුදයාර්‍යසත්‍යයා ගේ;

Non-Commercial Distribution

ආචික්ඛණා, ප්‍රකාශ කිරීම ය; දෙසනා, දේශනා කිරීම ය; පඤ්ඤපනා, පැනවීම ය; පට්ඨපනා, පිහිටුවීම ය; විවරණා, විස්තර කිරීම ය; විභජනා, විභාග කිරීම ය; උත්තානිකම්මං, අති ප්‍රකට කිරීම ය යන මේ ධර්මය ද; දුක්ඛනිරොධස්ස අරියසච්චස්ස, දුක්ඛනිරෝධායඝ්සත්‍යයා ගේ; ආචික්ඛණා ප්‍රකාශ කිරීම ය; දෙසනා, දේශනා කිරීම ය; පඤ්චපනා, පැනවීම ය; පට්ඨපනා, පිහිටුවීම ය; විවරණා, විස්තර කිරීම ය; විභජනා, විභාග කිරීම ය; උත්තානිකම්මං, අති ප්‍රකට කිරීම ය යන මේ ධර්මය ද; දුක්ඛනිරොධගාමිනීපටිපදා අරියසච්චස්ස, දුක්ඛනිරොධගාමිනී ප්‍රතිපදාර්යසත්‍යයා ගේ; ආචික්ඛණා, ප්‍රකාශ කිරීම ය; දෙසනා, දේශනා කිරීම ය; පඤ්ඤපනා, පැනවීම ය; පට්ඨපනා, පිහිටුවීම ය; විවරණා, විස්තර කිරීම ය; විභජනා, විභාග කිරීම ය; උත්තානීකම්මං, අති ප්‍රකට කිරීම ය යන මේ ධර්මය ද; දුක්ඛනිරොධගාමිනීපටිපදා අරියසච්චස්ස. දුක්ඛනිරොධගාමිනීප්‍රතිපාදර්යසත්‍යයා ගේ; ආචික්ඛණා, ප්‍රකාශ කිරීම ය; දෙසනා, දේශනා කිරීම ය; පඤ්ඤපනා, පැනවීම ය; පට්ඨපනා, පිහිටුවීම ය; විවරණා, විස්තර කිරීම ය; විභජනා, විභාග කිරීම ය; උත්තානිකම්මං, අති ප්‍රකට කිරීම ය යන මේ ධර්ම දේශනාව යි.

4. භික්ඛවෙ, මහණෙනි; අරහතා, අර්හත් වූ; සම්මාසම්බුද්ධෙන, සම්‍යක්සම්බුද්ධ වූ; තථාගතෙන, තථාගතයන් වහන්සේ විසින්; බාරාණසියං, බරණැස; මිගදායෙ, මිගදාය නම් ලද; ඉසිපතනෙ, ඉසිපතනාරාමයෙහි දී; ලොකස්මිං, ලෝකයෙහි; සමණෙන වා, ශ්‍රමණයකු විසින් හෝ; බ්‍රාහ්මණෙන වා, බමුණකු විසින් හෝ; දෙවෙන වා, දෙවියකු විසින් හෝ; මාරෙන වා, මාරයකු විසින් හෝ; බ්‍රහ්මුණා වා, බ්‍රහ්මයකු විසින් හෝ; කෙනචි වා, කවරකු විසින් හෝ; අප්පතිවත්තියං, නො පැවැත්විය හැකි වූ; අනුත්තරං ධම්මචක්කං, අනුත්තර වූ ධර්මචක්‍රය; පවත්තිතං, පවත්වන ලදි.

යදිදං, යම්බඳු වූ මේ; ඉමෙසං චතුන්නං අරියසච්චානං, මේ චතුරායඝ්සත්‍යයන් ගේ; ආචික්ඛණා, ප්‍රකාශ කිරීම ය; දෙසනා, දේශනා කිරීම ය; පඤ්ඤපනා, පැනවීම ය; පට්ඨපනා, පිහිටුවීම ය; විවරණා, විස්තර කිරීම ය; විභජනා, විභාග කිරීම ය; උත්තානීකම්මං, අති ප්‍රකට කිරීම ය යන මේ ධම්දේශනාව යී.

5. භික්ඛවෙ, මහණෙනි, සාරිපුත්ත මොග්ගල්ලානෙ, සැරියුත් මුගලන් දෙදෙන; සෙවෙථ, සේවනය කරවු; භික්ඛවෙ, මහණෙනි; සාරිපුත්ත මොග්ගල්ලානෙ, සැරියුත් මුගලන් දෙදෙන; භජන, භජනය කරවු; බ්‍රහ්මචාරීනං, බඹසර ඇත්තවුනට; පණ්ඩිතා, පණ්ඩිත වූ; භික්ඛු, භික්ෂූහු; අනුග්ගාහකා, ධර්ම - ආමිස දෙකින් අනුග්‍රහ කරන්නාහු ය; භික්ඛවෙ, මහණෙනි; ජනෙත්ති, වැදූ මව; සෙය්‍යථාපි, යම් සේ ද; සාරිපුත්තො, සාරිපුත්‍ර තෙමේ; එවං, එබඳු ම ය; ජාතස්ස, උපන්නා හට; සෙය්‍යථාපි, යම් සේ; ආපාදෙතා, පෝෂ්‍යය කරන්නාහු ද; මොග්ගල්ලානො, මෞද්ගල්‍යායන තෙමේ; එවං, එබඳු ම ය; භික්ඛවෙ, මහණෙනි; සාරිපුත්තො, සාරිපුත්‍ර තෙමේ; සොතාපත්ති ඵලෙ, සොවාන් ඵලයෙහි; විනෙති, සත්වයන් හික්මවයි; මොග්ගල්ලානො, මෞද්ගල්‍යායන තෙම; උත්තමත්‍ථෙ, අර්හත්ඵලයෙහි; විනෙති, සත්‍වයන් හික්මවයි.

භික්ඛවෙ, මහණෙනි; සාරිපුත්තො, සාරිපුත්‍ර තෙම; චත්තාරි අරියසච්චානි, සතර ආයඝ්සත්‍යයන්; විත්‍ථාරෙන, විස්තර වශයෙන්; ආචික්ඛිතුං, කියන්නට ද; දෙසෙතුං, දේශනා කරන්නට ද; පඤ්ඤපෙතුං, පනවන්නට ද; පට්ඨපෙතුං, පිහිටුවන්නට ද; විවරිතුං, විවෘත කරන්නට ද; විභජිතුං, විභජනය කරන්නට ද; උත්තානීකාතුං, ප්‍රකට කරන්නට ද' පහොති, සමත්වෙයි; භගවා, භාග්‍යවතුන් වහන්සේ; ඉදං, මේ චතුරායඝ්සත්‍ය ධර්මය; අවොච, වදාළ සේක; ඉදං වත්‍වා, මේ ධර්මය වදාරා; සුගතො, සුගතයන් වහන්සේ; ආසනා උට්ඨාය, ආසනයෙන් නැගිට; විහාරං, විහාරයට; පාවිසි, පිවිසි සේක.

6. තත්‍ර ඛො, එකල්හි වනාහි; ආයස්මා සාරිපුත්තො, ආයුෂ්මත් සාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ; භගවතො, බුදුරදුන්; අචිරපක්කන්තස්ස, විහාරයට වැඩි නොබෝ කලක දී; ආවුසො, ඇවැත්නි, භික්ඛවො'ති, මහණෙනි'යි කියා; භික්ඛූ, භික්ෂූන්; ආමන්තෙසි, ඇමතූ සේක; තෙ භික්ඛූ ඛො, ඒ භික්ෂූහු ද; ආවුසො'ති ඇවැත්නි'යි; ආයුස්මතො සාරිපුත්තස්ස, ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේට; පච්චස්සොසුං, පිළිවදන් ඇස්වූහ; ආයස්මා සාරිපුත්තො, ආයුෂ්මත් සාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ; එතං අවොච, මතු ප්‍රකාශ වන ධර්‍මය කී සේක.

7. ආවුසො, ඇවැත්නි; අරහතා, අර්හත් වූ; සම්මා සම්බුද්ධෙන, සම්‍යක්සම්බුද්ධ වූ; තථාගතෙන, තථාගතයන් වහන්සේ විසින්; බාරාණසියං, බරණැස; මිගදායෙ, මිගදාය නම් වූ; ඉසිපතනෙ, ඉසිපතනාරාමයේ දී; සමණෙන වා, ශ්‍රමණයකු විසින් හෝ; බ්‍රාහ්මණෙන වා, බමුණකු විසින් හෝ; දෙවෙන වා, දෙවියකු විසින් හෝ; මාරෙන වා, මාරයකු විසින් හෝ; බ්‍රහ්මුණා වා, බ්‍රහ්මයකු විසින් හෝ; ලොකස්මිං, ත්‍රිවිධ ලෝකයෙහි; කෙනචි වා, කිසිවෙකු විසින් හෝ; අප්පතිවත්තියං, නො පැවැත්විය හැකි; අනුත්තරං ධම්මචක්කං, අනුත්තර වූ ධර්‍මචක්‍රය; පවත්තිතං, පවත්වන ලදී.

යදිදං, යම් බඳු වූ මේ; චතුන්නං අරියසච්චානං, චතුරාර්‍ය්‍යසත්‍යයන් ගේ; ආචික්ඛණා, කීම ය; දෙසනා, දේශනා කිරීම ය; පඤ්ඤපනා, පැනවීම ය; පට්ඨපනා, පිහිටුවීම ය; විවරණා, විවෘත කිරීම ය; විභජනා, විභජනය කිරීම ය; උත්තානීකම්මං, ප්‍රකට කිරීම ය යන මේ දේශනාව යි; කතමෙසං චතුන්නං?, කවර ආර්‍ය්‍යසත්‍යයන් සතර දෙනෙකුන් ගේ ද යත්?; දුක්ඛස්ස අරියසච්චස්ස, දුක්ඛාර්‍ය්‍යසත්‍යයා ගේ; ආචික්ඛණා, කීම ය; දෙසනා, දේශනා කිරීම ය; පඤ්ඤපනා, පැනවීම ය; පට්ඨපනා, පිහිටුවීම ය; විවරණා, විවෘත කිරීම ය; විභජනා, විභජනය කිරීම ය; උත්තානීකම්මං, ප්‍රකට කිරීම ය; දුක්ඛසමුදයස්ස, අරියසච්චස්ස, දුක්ඛසමුදයාර්‍ය්‍යසත්‍යයා ගේ; ආචික්ඛණා, කීම ය; - පෙ - දුක්ඛනිරොධස්ස අරියසචස්ස,දුක්ඛනිරෝධාර්‍ය්‍යසත්‍යයාගේ; ආචික්ඛණ, කීමය; - පෙ - දුක්ඛනිරෝධස්ස අරියසචස්ස, දුක්ඛනිරෝධාර්‍ය්‍ය සත්‍යයාගේ ආචික්ඛණ, කීමය; - පෙ - දුක්ඛනිරොධගාමිනීපටිපදා අරියසච්චස්ස, දුක්ඛනිරොධගාමිනීප්‍රතිපදාර්‍ය්‍ය සත්‍යයා ගේ; ආචික්ඛණා, කීම ය; දෙසනා, දේශනා කිරීම ය; පඤ්ඤපනා, පැනවීම ය; පට්ඨපනා, පිහිටුවීම ය; විවරණා, විවෘත කිරීම ය; විභජනා, විභජනය කිරීම ය; උත්තානීකම්මං, ප්‍රකට කිරීම ය යන මේ දේශනාව යි.

8. ආවුසො, ඇවැත්නි; දුක්ඛං, අරියසච්චං, දුක්ඛාර්‍ය්‍යසත්‍යය; කතමං ච?, කවරේ ද?; ජාතිපි, ඉපදීම ද; දුක්ඛා, දුක්වන්නී ය; ජරාපි, ජරාව ද; දුක්ඛා, දුක්වන්නී ය; මරණංපි, මරණය ද; දුක්ඛං, දුක්වන්නේ ය: සොක, ශෝක කිරීම ය; පරිදෙව, වැළපීම ය; දුක්ඛ, කය හටගන්නා දුක ය; දොමනස්ස, සිත හටගන්නා දොම්නස ය; උපායාසා, ඇඩි ආයාසය යන මොහු; දුක්ඛා, දුක්වන්නාහු ය; යම් පිචඡං, යම් කැමැති දෙයක්; න ලභති, නො ලබා ද; තම්පි, හෙද; දුක්ඛං, දුක්වන්නේ ය; සංඛිත්තෙන, සංක්‍ෂෙපයෙන්; පඤ්චුපාදානක්ඛන්‍ධා; උපාදානස්කන්‍ධයෝ පස්දෙන; දුක්ඛා, දුක්වන්නාහු ය.

9. ආවුසො, ඇවැත්නි; ජාති ජාති තොමෝ; කතමා ච?, කවරී ද?; තෙසං තෙසං සත්තානං, ඒ ඒ සත්වයන් ගේ; තම්හි තම්හි සත්ත නිකායෙ, ඒ ඒ සත්‍ව සමූහයෙහි; යා ජාති, යම්බඳු ඉපදීමක් ඇද්ද; සඤ්ජාති, හටගැනීමක් වේ ද; ඔක්කන්ති, උත්පත්තිස්ථානයට ඇතුළුවීමක් වේ ද; අභිනිබ්බත්ති, විශේෂයෙන් ඉපදීමක් ඇද්ද; ඛන්‍ධානං, ස්කන්‍ධයන් ගේ; පාතුභාවො, පහළවීමෙක් ඇද්ද; ආයතනානං, ආයතනයන් ගේ; පටිලාභො, ප්‍රතිලාභයක් වේ ද; ආවුසො, ඇවැත්නි; අයං. මෝ තොමෝ; ජාති වුච්චති, ජාතිය යි කියනු ලැබේ.

Non-Commercial Distribution

10. ආවුසො, ඇවැත්නි; ජරා ජරා තොමෝ; කතමා ච?, කවරී ද?; තෙසං තෙසං සත්තනිකායෙ, ඒ ඒ සත්ව නිකායෙහි උපන්නා වූ; තෙසං සෙතං සත්තානං, ඒ ඒ සත්වයන් ගේ; යා ජරා, යම් ජරාවක්වන්නී ද; ජීරණතා, දිරන බව ද; ඛණ්ඩිච්චං, දත් ඇට කැඩුණු බව ද; පාලිච්චං, කෙස් ලොම් පැසී සුදු වූ බවද; වලිත්තචතා, රැලි නැගුණු සම් ඇති බවද; ආයුනො, ආයුෂයා ගේ; සංහාති, හානිය ද; ඉන්ද්‍රියානං, චක්ෂුරාදි ඉන්ද්‍රියයන් ගේ; පරිපාකො, මුහුකුරා යමෙක් ඇද්ද; ආවුසො, ඇවැත්ති; අයං, මෝ තොමෝ; ජරා වුච්චති, ජරාවය යි කියනු ලැබේ.

11. ආවුසො, ඇවැත්නි; මරණං, මරණය තෙම; කතමං ච?, කවරේ ද; තෙසං තෙසං සත්තානං, ඒ ඒ සත්වයන් ගේ; තම්හා තම්හා සත්ත නිකායා, ඒ ඒ සත්ව නිකායයෙන්; යා චුති, යම් චුතවීමක් ඇද්ද; චවනතා, ජීවිතය ගැලවුන බව ද; භෙදො, බිඳීම ද; අන්තරධානං, අතුරුදහන් වීම ද; මච්චුමරණං, මරණීන් මියයාම ද; කාලකිරියා, කාලක්‍රියාව ද; කලෙබරස්ස, ශරීරයා ගේ; නික්ඛෙපො, දැමීමක් ඇද්ද; ආවුසො, ඇවැත්නි; ඉදං, මේ කාරණය තෙම; මරණං වුච්චති, මරණය යි කියනු ලැබේ.

12. ආවුසො, ඇවැත්නි; සොකො, ශෝකය; කතමො ච?, කවරේ ද?; ආවුසො, ඇවැත්නි; අඤ්ඤතර'ඤ්ඤතරෙන, ව්‍යසනෙන (නොයෙක් ප්‍රභේද ව්‍යසනයන්ගෙන්) එක්තරා ව්‍යසනයකින්; සමන්නාගකස්ස, යුක්ත වූ සත්වයා ගේ ද; අඤ්ඤතර'ඤ්ඤරෙන දුක්ඛධම්මමෙන, නානාප්‍රකාර වූ දුක්ඛස්වභාවයන් අතුරෙන් එක්තරා එකක් විසින්; ඵුට්ඨස්ස, ස්පර්ශ කොට වැළඳ ගත්තාහු ගේ ද; යො ඛො සොකා, යම් ශෝක කිරීමෙක් ඇද්ද; සොචනා, ශෝක කරන බව ය; සොචිතත්තං, ශෝක කළ බව ය; අන්තො සොකො, ශරීරාභ්‍යන්තරය වියලන ස්වභාව වූ; අන්තො පරිසොකො, ශරීරාභ්‍යන්තරය හාත්පසින් වියලන ලද ස්වභාව වූ යමෙක් වේ ද; ආවුසො, ඇවැත්නි; අයං, මේ තෙම; සොකො වුච්චති, ශෝකය යි කියනු ලැබේ.

13. ආවුසො, ඇවැත්නි; පරිදෙවො, පරිදේවයතෙම; කතමො ච?;, කවරේ ද?; ආවුසො, ඇවැත්නි; අඤ්ඤතර'ඤ්ඤතරෙන ව්‍යසනෙන, නානාප්‍රකාර ව්‍යසනයන් අතුරෙන් එක්තරා ව්‍යසනයකින්; සමන්නාගතස්ස, සමන්විත වූ සත්වයා ගේ ද; අඤ්ඤතර'ඤ්ඤතරෙන දුක්ඛධම්මෙන ඵුට්ඨස්ස, එක්තරා කිසියම් දුකකට යටකරන ලද පුද්ගලයා ගේ ද; යො ඛො ආදෙවො, (නම් පමණක් කියා හැඬීම වූ) යම් ආදේවයක් ඇද්ද; පරිදෙවො, (ගුණ වර්ණනා කොට හැඬීම වූ) පරිදේවය; ආදෙවනා, හැඬීම ය; පරිදෙවනා, (ගුණ වර්ණනා කොට හැඬීම වූ) පරිදේවනාය; ආදෙවිතත්තං, නම් කියා හැඬීමේ ස්වභාවය; පරිදෙවිතත්තං, ගුණ වර්ණනාකොට හැඬීමේ ස්වභාවය; ආවුසො, ඇවැත්නි; අයං, මේතෙම; පරිදෙවො වුච්චති, පරිදේවය යි කියනු ලැබේ.

14. ආවුසො, ඇවැත්නි; දුක්ඛං, දුක්ඛ ය; කතමං ච?, කවරේ ද?; ආවුසො, ඇවැත්නි; යං ඛො කායිකං දුක්ඛං, යම් කයෙහි හටගන්නා වූ කායික දුකක් ඇද්ද; කායිකං, කයෙහි හටගන්නා වූ; අසාතං, අමිහිරි වූ; අඵාසු, කාරණය; කායසම්ඵස්සජං, කය හා එක් ව ස්පර්ශවීමෙන් උපන්නා වූ කර්කශ වේදනාව වූ; දුක්ඛං, දුකක් වේ ද; ආවුසො, ඇවැත්නිඃ ඉදං, මේ කයෙහි උපන් දුක; දුක්ඛං වුච්චති, ස්වභාවයෙන් ම දුක ය යි කියනු ලැබේ.

15. ආවුසො, ඇවැත්නි; දොමනස්සං, දොම්නස; කතමං ච?, කවරේ ද?; ආවුසො, ඇවැත්නි; අසාතං, සිතෙහි හටගන්නා වූ; යං ඛො දුක්ඛං, යම්බඳු වූ දුකෙක් වේ ද; චෙතසිකං, සිතෙහි හටගන්නා වූ; අමධුරභාවයක් හෙවත් පැසුණු බවෙක් වේ ද; මනො සම්ඵස්සජං, සිතට ස්පර්ෂවීමෙන් උපන්නා වූ; දුක්ඛං, දුකක් වේ ද; අසාතං, සැප නො වූ; වෙදයිතං, විඳීමක් වේ ද; ආවුසො, ඇවැත්නි; ඉදං, මෙතෙම; දොමනස්සං වුච්චති, දොම්නස ය යි කියනු ලැබේ.

Non-Commercial Distribution

16. ආවුසො, ඇවැත්නි; උපායාසො, උපායාසය තෙම; කතමො ච?, කවරේ ද?; ආවුසො, ඇවැත්නි; අඤ්ඤතර'ඤ්ඤතරෙනව්‍යසනෙන, නානාප්‍රකාර ව්‍යසනයන් අතුරෙන් එක්තරා යම් ව්‍යසනයකින්; සමන්නාගතසස, යුක්ත වූවහු ගේ අඤ්ඤතර'ඤ්ඤතරෙන දුක්ඛධම්මෙන, එක්තරා යම් දුක් ස්වභාවයකින්; ඵුට්ඨසස, යට කරන ලද්දාහු ගේ; යො බො ආයාසො, යම් ආයාසයෙක් ඇද්ද; උපායාසො, බලවත් ආයාසයෙක් ඇද්ද; ආයාසිතත්තං, ක්ලාන්ත වූ ස්වභාවය; උපායාසිතත්තං, ඇඩි ක්ලාන්ත වූ ස්වභාවය; ආවුසො, ඇවැත්නි; අයං, මෙතෙම; උපායාසො, උපායාසය යි; වුච්චති, කියනු ලැබේ.

17. ආවුසො, ඇවැත්නි; යම්පිච්ඡං, කැමති දෙයක්; න ලභති, නො ලබා ද; තම්පි දුක්ඛං, හෙද දුක් වන්නේ ය යනු; කතමොච?, කවරේ ද?; ආවුසො, ඇවැත්නි; ජාතිධම්මානං, සසර නොයෙක් ජාතිවල පිළිසිඳ ගන්නා ස්වභාවය ඇති; සත්තානං, සත්වයන්ට; එවං ඉච්ඡා, මෙසේ වූ තණ්හාවෙක්; උප්පජ්ජති, උපදී; මයං, අපි; න ජාති ධම්මා අස්සාම, භවයෙහි උපදින ස්වභාව නැති වන්නහු නම්; නො, අපට; වත, ඒකාන්තයෙන්; ජාති, භවයෙහි හටගැන්ම; න ච ආගච්ඡෙය්‍ය, නො ම එන්නේ නම්; අහො වත, ඉතා යෙහෙක; එතං, මේ කාරණය; ඉච්ජෙය්‍ය, කැමැත්තෙන්; න බො පන පත්තබ්බං, පැමිණිය හැකි නොවේ. ඉදම්පි, මෙය ද; යම්පිච්ඡං, ආසාකරන ලද යමක් නොලබා ද; තම්පි දුක්ඛං, හෙද දුක් වන්නේ ය.

18. ආවුසො, ඇවැත්නි; ජරාධම්මානං, ජරාව ස්වභාව කොට ඇති; සත්තානං, සත්වයන්ට; එවං ඉච්ඡා, මෙසේ ආසාවක්; උපජ්ජති, උපදනේ ය; මයං, අපි; නජරා ධම්මා අසසාම, ජරා ස්වභාව ඇති නොවෙමු නම්; නො, අපට; වත, ඒකානතයෙන්; නචජරා ආගච්ඡෙය්‍යය, ජරාව නො එන්නේ නම්; අහො වත, ඉතා යෙහෙක; එතං, මේ කාරණය; ඉච්ඡාය, කැමැත්තෙන්; න බො පන පත්තබ්බං, නො පැමිණිය යුත්තේ ය; ඉදම්පි, මෙය ද; යම්පිච්ඡං, කැමැති වූ යමක්; න ලභති, නො ලබා නම්; තම්පි දුක්ඛං, හෙද දුක් වන්නේ ය.

19. ආවුසො, ඇවැත්නි; ව්‍යාධි ධම්මානං, රෝග ඇතිවීම ස්වභාව කොට ඇත්තා වූ; සත්තානං, සත්වයන්ට; එවං, මෙසේ; ඉච්ඡා, කැමැත්තක්; උප්පජ්ජති, උපදී; මයං, අපි; න ව්‍යාධි ධම්මා අසසාම, රෝග ස්වභාව කොට ඇත්තේ නො වෙමු නම්; නො, අපට; වත, ඒකාන්තයෙන්; ත ච ව්‍යාධි ආගච්ඡෙය්‍ය, ව්‍යාධියක් නො ම පැමිණෙන්නේ නම්; අහො වත ඉති, ඉතා යෙහෙකැ යි; එතං, මේ කාරණය; ඉච්ඡාය, ආසාවෙන්; න බො පන පත්තබ්බං, නො පැමිණිය හැක්කේ ම ය; ඉදම්පි, මෙය ද; යම්පිච්ඡං න ලභති, යම් කැමති දෙයක් නො ලබා ද; තම්පි දුක්ඛං, ඒ ද දුක්වන්නේ ය.

20. ආවුසො, ඇවැත්නි; මරණධම්මානං, මැරීම ස්වභාවය කොට ඇති; සත්තානං, සත්වයන්ට; එවං ඉච්ඡා, මෙසේ කැමැත්තක්; උප්පජ්ජති, උපදී; මයං, අපි; න මරණ ධම්මා අසසාම, මරණ ස්වභාව නැති වමු නම්; නො, අපට; වත, ඒකාන්තයෙන්; මරණං, මරණය ද; න ච ආගච්ඡෙය්‍ය, නොම පැමිණෙන්නේ නම්; අහො වත ඉති, ඉතා යෙහෙකැ යි; එතං, මේ කාරණය; ඉච්ඡාය, ආසාවෙන්: න බො පන පත්තබ්බං, නො ද පැමිණිය හැක්කේ ම ය; ඉදම්පි, මෙ ද; යම්පිච්ඡං න ලභති, යම් කැමති දෙයක් නො ලබා ද; තම්පි දුක්ඛං, එ ද දුක්වන්නේ ය.

21. ආවුසො, ඇවැත්නි; සොක පරිදෙව දුක්ඛ දොමනස්සු'පායාස ධම්මානං, ශෝක පරිදේව කායික දුක් දොම්නස් ඇඩි ආයාස ස්වභාවයෙන් යුක්ත වූ; සත්තානං, සත්වයන්ට; එවං, මෙසේ; ඉච්ඡා, ආශාවක්; උප්පජ්ජති, උපදී; මයං, අපි; න සොක පරිදෙව දුක්ඛ දොමනස්සූපායාසා ධම්මා අස්සාම, ශෝක පරිදේව දුක් දොම්නස් ඇඩි ආයාස ස්වභාව ඇත්තේ නො වමු නම්; නො, අපට; සොකපරිදෙව දුක්ඛ දොමනස්පායාසා, ශෝක පරිදේව දුක් දොම්නස් ඇඩි ආයාසයෝ; න ච වත

ආගච්ඡෙය්‍යුංති නො ම එන්නාහු නම්; අහො වත ඉති, ඉතා යෙහෙකැ යි; එතං, මේ කාරණය; ඉච්ඡාය, ආසාවෙන්; න බො පන පත්තබ්බං, නො පැමිණිය හැකි ය; ඉදම්පි, මෙ ද; යම්පිච්ඡං න ලභති, යම් කැමති දෙයක් නො ලබා ද; තම්පි දුක්ඛං, එ ද දුක්වන්නේ ය.

22. ආවුසො, ඇවැත්නි; සංඛිත්තෙන, සංක්‍ෂෙපයෙන්; දුක්ඛා, දුක් වූ; පඤ්චුපාදානක්ඛන්ධා, පඤ්චවිධ උපාදානස්කන්ධයෝ; කතමා ච?, කවරහු ද?; සෙය්‍යථීදං, ඔහු කවරහු ද යත්; රූපුපාදානක්ඛන්ධො, කෙලෙස් සහිත රූප උපාදානස්කන්ධය; වෙදනුපාදානක්ඛන්ධො, වේදනාඋපාදානස්කන්ධය; සඤ්ඤුපාදානක්ඛන්ධො, සංඥා රාසි වූ සංඥා උපාදානස්කන්ධ ය; සංඛාරූපාදානක්ඛන්ධො, සංස්කාර උපාදානස්කන්ධය; විඤ්ඤාණුපාදානක්ඛන්ධො, විඤ්ඤාණ උපාදානස්කන්ධය; ආවුසො, ඇවැත්නි; සංඛිත්තෙන, සංක්‍ෂෙපයෙන්; දුක්ඛා, දුක් වූ; පඤ්චුපාදානක්ඛන්ධා, පස් උපාදාන ස්කන්ධයෝ; ඉමෙ වුච්චන්ති, මොහු ය යි කියනු ලැබෙත්; ඉදං, මේ තෙම; දුක්ඛං අරියසච්චං, දුක්ඛාර්ය සත්‍යය යි; වුච්චති, කියනු ලැබේ.

23. ආවුසො, ඇවැත්නි; දුක්ඛ සමුද යං අරියසච්චං, දුක්ඛ සමුද ය නම් වූ ආර්ය සත්‍යය; කතමඤ්ච?, කවරේ ද?; පොනොභවිකා, නැවත සසරෙහි ඉපදීම කරන්නා වූ; නන්දිරාග සහගතා, සතුටුවන ඇලෙන රාගය සමග එකතු වූ; තත්‍රතත්‍රාභි නන්දනී, ඒ ඒ අත්බැව්හි ඇල්ම කරන්නා වූ; යා අයං තණ්හා, යම් මේ තණ්හාවක් වේ ද; සෙය්‍යථී දං?, ඒ කවරේ ද?; කාමතණ්හා, කාමරාග වශයෙන් පවත්නා තණ්හාව ය; භව තණ්හා, ශාස්වත දෘෂ්ටිය සමග පවත්නා ආසාව ය; විභව තණ්හා, උච්ඡෙද දෘෂ්ටිය සමග පවත්නා ආසාව ය; ආවුසො, ඇවැත්නි; ඉදං, මෙය; දුක්ඛ සමුදයං අරියසච්චං, දුක්ඛ සමුදයාර්ය සත්‍යය යි; වුච්චති, කියනු ලැබේ.

24. ආවුසො, ඇවැත්නි; දුක්ඛනිරොධං අරියසච්චං, දුක්ඛ නිරෝධාර්ය සත්‍යය; කතමඤ්ච?, කවරේ ද?; තස්සායෙව තණ්හාය, එම තණ්හාව ගේ; යො අසෙස විරාග නිරොධො, නිරවශේෂ වූ යම් නො ඇලීමෙන් නිරුද්ධ කිරීමක් වේ ද; චාගො, යම් ආලය ඇරීමක් වේ ද; පටිනිස්සග්ගො, ඒ ආලයා ගේ දුරලීමක් වේ ද; මුත්ති, මිදීමක් වේ ද; අනාලයො, යම් ආලය නැතිවීමෙක් ඇද්ද; ආවුසො, ඇවැත්නි; ඉදං, මේ දුක්ඛ නිරොධං අරියසච්චං, දුක් නැති කිරීම වූ ආර්ය සත්‍යය යි; වුච්චති, කියනු ලැබේ.

25. ආවුසො, ඇවැත්නි; දුක්ඛ නිරොධගාමිනී පටිපදා අරියසච්චං, දුක්ඛ නිරෝධගාමිනී ප්‍රතිපදාර්ය සත්‍යය තෙම; කතමඤ්ච?, කවරේ ද?; අයං එව, මේ; අරියො, උත්තම වූ; අට්ඨංගිකො, අංග අටක් ඇත්තා වූ; මග්ගො, මාර්ගය යි; ඒ කවරේ ද?

> සම්මා දිට්ඨි, සම්‍යක් දෘෂ්ටිය; සම්මා සංකප්පො, සම්‍යක් සංකල්පනාව ය; සම්මා වාචා, සම්‍යක් වචන ය; සම්මා කම්මන්තො, සම්‍යක් කර්මාන්ත ය; සම්මා ආජීවො, සම්‍යක් ආජීව ය; සම්මා වායාමො, සම්‍යක් ව්‍යායාම ය (හෙවත්) මනාකොට උත්සාහ ය; සම්මා සති, මනාකොට සිහිකිරීම ය; සම්මා සමාධි, මනාකොට සිත එකඟ කිරීම ය යන මෙයි.

26. ආවුසො, ඇවැත්නි; සම්මා දිට්ඨි සම්‍යක් දෘෂ්ටි තොමෝ; කතමා ච?, කවරී ද?; ආවුසො, ඇවැත්නි; යං බො දුක්ඛෙ ඤාණං, දුක කෙරෙහි මේ දුක යයි යම් දැනීමක් වේ ද; දුක්ඛ සමුදයෙ ඤාණං, දුක්ඛ සමුදය කෙරෙහි දැනීමක් වේ ද; දුක්ඛනිරොධෙ ඤාණං, දුක්ඛනිරෝධය කෙරෙහි දැනීමක් වේ ද; දුක්ඛනිරොධ ගාමිනියා පටිපදාය ඤාණං, දුක් නිරුද්ධ කිරීමට යන පිළිපැදීමෙහි යම් දැනීමක් වේ ද; ආවුසො, ඇවැත්නි; අයං, මෝ තොමෝ; සම්මා දිට්ඨි වුච්චති; සම්‍යක් දෘෂ්ටිය යි කියනු ලැබේ.

Non-Commercial Distribution

27. ආවුසො, ඇවැත්නි; සම්මා සංකප්පො, සම්‍යක් සංකල්පනාව; කතමො ච?, කවරේ ද?; නෙක්ඛම්ම සංකප්පො, ගිහි ගෙයින් නික්මීමෙහි වූ නෛෂ්ක්‍රම්‍ය සංකල්පනාව ය; අව්‍යාපාද සංකප්පො, අනුන් කෙරෙහි වෛර රහිත වූ අව්‍යාපාද සංකල්පනාව ය; අවිහිංසා සංකප්පො, අවිහිංසා සංකල්පනාව ය; ආවුසො, ඇවැත්නි; අයං සම්මා සංකප්පො, මේ සම්‍යක් සංකල්පනාවය යි; වුච්චති, කියනු ලැබේ.

28. ආවුසො, ඇවැත්නි; සම්මා වාචා, සම්‍යක් වචනය; කතමා ච?, කවරී ද?; මුසාවාදා වෙරමණී, බොරු කීමෙන් වැලකීම ය; පිසුනා වාචා වෙරමණී, කේලාම් කීමෙන් වැලකීම ය; ඵරුසා වාචා වෙරමණී, අනුන් සටා රළු වචන කීමෙන් වැලකීම ය; සම්ඵප්පලාපා වෙරමණී, හිස් මිත්‍යා කථා කිරීමෙන් වැලකීම ය; ආවුසො, ඇවැත්නි; අයං, මෝ තොමෝ; සම්මා වාචා, සම්‍යක් වචනය යි; වුච්චති, කියනු ලැබේ.

29. ආවුසො, ඇවැත්නි; සම්මා කම්මන්තො, සම්‍යක් කර්මාන්තය; කතමො ච?, කවරේ ද?; පාණාතිපාතා වෙරමණී, සතුන් දිවි හැරීමෙන් වැලකීම ය; අදින්නාදානා වෙරමණී, අදත්තාදානයෙන් වැලකීම ය; කාමෙසු මිච්ඡාචාරා වෙරමණී, කාමයන් හි වරදවා යෙදීමෙන් වැලකීම ය; අයං, මෙ තෙම; සම්මා කම්මන්තො, සම්‍යක් කර්මාන්තය යි; වුච්චති, කියනු ලැබේ.

30. ආවුසො, ඇවැත්නි; සම්මා ආජීවො, සම්‍යක් ආජීවය; කතමො ච?, කවරේ ද?; ආවුසො, ඇවැත්නි; ඉධ, මේ ශාසනයෙහි; අරියසාවකො, ආර්ය ශ්‍රාවක තෙමේ; මිච්ඡා ආජීවං පහාය, මිථ්‍යා ආජීවය හැර; සම්මා ආජීවෙන; නිවැරද වූ සම්‍යක් ආජීවයෙන්; ජීවිකං කප්පෙති, ජීවිකාව කෙරෙයි; ආවුසො, ඇවැත්නි; අයං, මේ; සම්මා ආජීවො, සම්‍යක් ආජීවය යි; වුච්චති, කියනු ලැබේ.

31. ආවුසො, ඇවැත්නි; සම්මා වායාමො, සම්‍යක් ව්‍යායාමය; කතමො ච?, කවරේ ද?; ආවුසො, ඇවැත්නි; ඉධ, මේ ශාසනයෙහි; භික්ඛු, මහණතෙම; අනුප්පන්නානං, නූපන්නා වූ; පාපකානං, ළාමක වූ; අකුසලානං ධම්මානං; අකුසල ධර්මයන් ගේ; අනුප්පාදාය, නො ඉපදීම පිණිස; ඡන්දං ජනෙති, කැමැත්ත උපදවන්නේ ය; වායමති, උත්සාහ කරයි; විරියං ආරභති, වීර්යය පවත්වන්නේ ය; චිත්තං පග්ගණ්හාති, වීර්‍ය කිරීමෙන් චිත්ත පරිග්‍රහණය කරයි; පදහති, වීර්‍යය පවත්වයි.

උප්පන්නානං, උපන්නා වූ; පාපකානං, ළාමක වූ; අකුසලානං ධම්මානං, අකුසල ධර්මයන් ගේ; පහාණාය, ප්‍රහාණය පිණිස; ඡන්දං ජනෙති. (ඒ ඒ පාපකර්මය නූපදනා පිළිවෙත් පිරීමට) ආලය උපදවයි; වායමති, නිසිව්‍යායාම කරයි; වීරියං අරභති, වීර්‍යය පවත්වයි; චිත්තං පග්ගණ්හාති, වීර්ය කිරීමෙන්; චිත්ත පරිග්‍රහණය කරයි; පදහති, කළමනා වීරිය පවත්වයි; අනුප්පන්නානං කුසලානං ධම්මානං, තමා කෙරෙහි නූපන්නා වූ ප්‍රථමධ්‍යානාදී කුශල ධර්මයන් ගේ; උප්පාදාය, ඉපදීම පිණිස; ඡන්දං ජනෙති, (ප්‍රථමධ්‍යානාදී නූපන් කුසල ධර්මයන් ගේ) ප්‍රතිලාභය පිණිස කැමැත්ත උපදවයි; වායමති, ව්‍යායාම කරයි; විරියං ආරභති, නිසි පිළිවෙත් සාධක වීර්යය සිත්හි පවත්වයි; චිත්තං පග්ගණ්හාති, වීර්‍යය කිරීමෙන් චිත්ත පරිග්‍රහණය කරයි; පදහති, කළමනා වීර්‍යය පවත්වයි; උප්පන්නානං, උපන්නා වූ; කුසලානං ධම්මානං, ප්‍රථමධ්‍යානාදී කුසල ධර්මයන් ගේ; ඨිතියා, ස්ථිරව තමා කෙරෙහි පිහිටුවා ගන්නා පිණිස; අසම්මොසාය, එම කුසල ධර්මයන් ගේ විනාස නො වීම පිණිස; භියො භාවාය, වඩ වඩා වර්ධනය වීම පිණිස; වෙපුල්ලාය, විපුලව පතළ වීම පිණිස; භාවනාය, භාවනාව ගේ; පාරිපූරියා, පරිපූර්ණත්වය පිණිස; ඡන්දං ජනෙති, කැමැත්ත උපදවයි ද; වායමති, ව්‍යායාම කෙරේ ද; විරියං ආරභති, වීර්‍යාරම්භ කෙරේ ද; චිත්තං පග්ගණ්හාති, සිත්හි ඔසවා තබා ගනී ද; පදහති, සිත පිහිටුවා ද; ආවුසො, ඇවැත්නි; අයං සම්මා වායාමො, මෙය සම්‍යක් ව්‍යායාමය යි; වුච්චති, කියනු ලැබේ.

Non-Commercial Distribution

32. ආවුසො, ඇවැත්නි; සම්මා සති, සම්‍යක් ස්මෘතිය; කතමා ච?; කවරීද?; ආවුසො, ඇවැත්නි; ඉධ, මේ සස්නෙහි; භික්ඛු, යෝගාවචර භික්ෂු තෙම; ආතාපි, කෙලෙසුන් තවන වීර්‍ය්‍ය ඇතිව; සම්පජානො, නුවණ ඇතිව; සතිමා, සිහිය ඇතිව; ලොකෙ, ශරීර සංඛ්‍යාත ලෝකයෙහි; අභිජ්ඣා දොමනස්සං, දැඩි ලෝභය හා ක්‍රෝධය; විනෙය්‍ය, දුරුකොට; කායෙ, කායගතානුසති භාවනාවෙහි; කායානුපස්සී, ශරීරය අනුව නුවණින් කල්පනා කර බලමින්; විහරති, වාසය කෙරේ ද; ආතාපි, කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇතිව; සම්පජානො, නුවණ ඇතිව; සතිමා, සිහිය ඇතිව, ලොකෙ, ශරීර සංඛ්‍යාත ලෝකයෙහි; අභිජ්ඣා දොමනස්සං, දැඩි ලෝභය හා ක්‍රෝධය; විනෙය්‍ය, දුරුකොට; වෙදනාසු, වේදනාවන්හි; වෙදනානුපස්සී, වේදනාව අනුව බලමින්; විහරති, වාසය කෙරේ ද; ලොකෙ, ශරීර සංඛ්‍යාත ලෝකයෙහි; ආතාපි, කෙලෙසුන් තවන වීර්‍ය්‍ය ඇතිව; සම්පජානො, නුවණ ඇතිව; සතිමා, සිහිය ඇතිව; අභිජ්ඣා දොමනස්සං, දැඩි ලෝභය හා ක්‍රෝධය; විනෙය්‍ය, දුරුකොට; චිත්තෙ, සිතෙහි; චිත්තානුපස්සී, සිත අනුව බලමින්; විහරති, වාසය කෙරේ ද; ලොකෙ, ශරීර සංඛ්‍යාත ලෝකයෙහි; ආතාපි, කෙලෙසුන් තවන වීර්‍ය්‍ය ඇතිව; සම්පජානො, නුවණ ඇතිව; සතිමා, සිහිය ඇතිව; අභිජ්ඣා දොමනස්සං, දැඩි ලෝභය හා ක්‍රෝධය; විනෙය්‍ය, දුරුකොට; ධම්මෙසු, නීවරණාදී ධර්මයන් කෙරෙහි; ධම්මානුපස්සී, ධර්මය අනුව බලමින්; විහරති, වාසය කෙරේ ද; ආවුසො, ඇවැත්නි; අයං, මෝ තොමෝ; සම්මා සති, සම්‍යක් ස්මෘතිය යි; වුච්චති, කියනු ලැබේ.

33. ආවුසො, ඇවැත්නි; සම්මා සමාධි, සම්‍යක් සමාධිය; කතමා ච?, කවරේ ද?; ආවුසො, ඇවැත්නි; ඉධ, මේ සස්නෙහි; භික්ඛු, යෝගාවචර භික්ෂු තෙම; විවිච්චෙව කාමෙහි, පඤ්චකාමයන්ගෙන් වෙන්ව ම; විවිච්ච අකුසලෙහි ධම්මෙහී, පඤ්චනීවරණී අකුසලයන් ගෙන් වෙන්ව; සවිතක්කං, විතර්ක සහිත වූ; සවිචාරං, විචාර සහිත වූ; විවෙකජං විවේකයෙන් උපන්නා වූ; පීතිසුඛං, ප්‍රීතිය හා සැපය ඇති; පඨමජ්ඣානං, ප්‍රථමධ්‍යාන කුසල් සිතට; උපසම්පජ්ජ, පැමිණ; විහරති, වාසය කෙරෙයි.

විතක්ක විචාරතං, විතර්ක විචාරයන් ගේ; වූපසමං, සංසිඳීමෙන්; අජ්ඣත්තං, තමා කෙරෙහි පැවැති; සම්පසාදනං, මනා පැහැදීම ඇති; චෙතසො එකොදිභාවං, සිත පිළිබඳ එකඟ බවක් ඇති; අවිතක්කං, විතර්කයක් නැති; අවිචාරං, විචාරයක් නැති; සමාධිජං, සමාධියෙන් උපන්; පීති සුඛං, ප්‍රීතිය හා සැපය ඇති; දුතියජ්ඣානං, දෙවෙනි ධ්‍යානයට; උපසම්පජ්ජ, පැමිණ; විහරති, වාසය කෙරෙයි; පීතියා ච විරාගා, ප්‍රීතියෙහි ද නො ඇලීමෙන්; උපෙක්ඛකො ච, උපේක්ෂකව හෙවත් මැදහත්ව; විහරති, වාසය කෙරෙයි.

සතො ච, සිහි ඇති ව; සම්පජානො, නුවණ ඇති ව; කායෙන, නාම කයින්; සුඛං පටිසංවෙදෙති, ධ්‍යාන සැපය විඳියි; යං, යම්බඳු වූ ඒ තුන්වැනි ධ්‍යානයෙන් යුත් පුද්ගලයා; උපෙක්ඛා, මධ්‍යස්ථ වූයේ; සතිමා, සිහි ඇත්තෙක; සුඛවිහාරීති, ධ්‍යාන සැප විහරණ ඇත්තෙකැ යි; අරියා, ආර්‍ය්‍යයෝ; ආචික්ඛන්ති, කියත් ද; තං තතියජ්ඣානං, ඒ තුන්වෙනි ධ්‍යානයට; උපසම්පජ්ජ, පැමිණ; විහරති, වාසය කෙරෙයි.

සුඛස්ස ච පහානා, කායික සැපය දුරු කිරීමෙන් හා; දුක්ඛස්ස ච පහානා, කායික දුක්ඛය දුරු කිරීමෙන්; පුබ්බෙච, පළමු කොට ම; සොමනස්ස දොමනස්සානං, සිත පිළිබඳ වූ සොම්නස් දොම්නස් දෙදෙනා ගේ; අත්ථංගමා, නැති වී යාමෙන්; අදුක්ඛං අසුඛං, දුකක් නැති සැපක් නැති; උපෙක්ඛා, මධ්‍යස්ථ බැවින් වූ; සති පාරිසුද්ධිං, සිහි පිරිසුදු බැව් ඇති; චතුත්ථජ්ඣානං, චතුර්ථධ්‍යාන කුසල සිතට; උපසම්පජ්ජ, පැමිණ; විහරති, වාසය කෙරෙයි; ආවුසො, ඇවැත්නි; අයං, මේ ධර්මය තෙම; සම්මා සමාධි, සම්‍යක් සමාධිය යි; වුච්චති, කියනු ලැබේ; ආවුසො, ඇවැත්නි; ඉදං, මෙය; දුක්ඛ

Non-Commercial Distribution

නිරොධ ගාමිනිපටිපදා අරිසච්චං, දුක්ඛ නිරෝධ ගාමිණීප්‍රතිපදා ආර්‍ය්‍ය සත්‍යය යි; වුච්චති, කියනු ලැබේ.

34. ආවුසො, ඇවැත්නි; අරහතා, අර්හත් වූ; තථාගතෙන, තථාගත වූ; සම්මා සම්බුද්ධෙන, සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ විසින්; බාරාණසියං, බරණැසෙහි; මිගදායෙ, මිගදාය නම් වූ; ඉසිපතනෙ, ඉසිපතනාරාමයෙහි; සමණෙන වා, ශ්‍රමණයකු විසින් හෝ; බ්‍රාහ්මණෙන වා, බමුණකු විසින් හෝ; දෙවෙන වා, දෙවියකු විසින් හෝ; මාරෙන වා, මාරයකු විසින් හෝ; බ්‍රහ්මුණා වා, බ්‍රහ්මයකු විසින් හෝ; ලොකස්මිං, ලෝකයෙහි; කෙනචි වා, අන්කිසිවකු විසින් හෝ; අප්පතිවත්තියං, නො පැවැත්විය හැකි; යං, යම්බඳු වූ; ඉමෙසං චතුන්නං, අරියසච්චානං, මේ චතුරාර්‍ය්‍ය සත්‍යය ධර්මයන් ගේ; ආචික්ඛණා, කීම ය; දෙශනා, දේශනා කිරීම ය; පඤ්ඤපනා, පැණවීම ය; පට්ඨපනා, පිහිටුවීම ය; විවරණා, විස්තර කිරීම ය; විභජනා, විභාග කිරීම ය; උත්තානීකම්මං ඉති, ප්‍රකට කිරීම ය යන; ඉදං, මේ; අනුත්තරං, උතුම් වූ; ධම්මචක්කං, ධර්මචක්‍රය; පවත්තිතං, පවත්වන ලදී.

35. ආයස්මා, ආයුෂ්මත් වූ; සාරිපුත්තො, සාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ; ඉදං, මේ ධර්ම දේශනාව; අවොච, වදාළ සේක; අත්තමනා, සතුටු වූ; තෙ භික්ඛූ, ඒ භික්ෂූන් වහන්සේලා; ආයස්මතො සාරිපුත්තස්ස, ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් ගේ; භාසිතං, දේශනාව; අභිනන්දුං ඉති, සතුටින් පිළිගත්හ.

**සච්ච විභංග සූත්‍රය යි.**

**(අතිරෙකානි, අතිරේක වූ; සත්ත සුත්තානි, සප්ත සූත්‍රයෝ; නිට්ඨිතානි, නිම කරන ලදී.)**

* * *

Non-Commercial Distribution

# ආටානාටිය සුත්තං. – ආටානාටිය සූත්‍රය.

## පඨමක භාණවාරෝ - පළමුවන බණවර

භගවතො, භාග්‍යවත් වූ; අරහතො, අර්හත් වූ;
තස්ස සම්මා සම්බුද්ධස්ස, ඒ සම්මා සම්බුදුරදුන් වහන්සේට; නමො, නමස්කාරය වේවා!

1. මෙ, මා විසින්; එවං සුතං, මේ සූත්‍ර ධර්මය මෙසේ අසන ලදී. එකං සමයං, එක් සමයෙක්හි; භගවා, භාග්‍යවතුන් වහන්සේ; රාජගහෙ, රජගහ නුවර; ගිජ්ඣකූටෙ පබ්බතෙ, ගිජ්ඣකූට පර්වතයෙහි; විහරති, වැඩ වාසය කරන සේක; අථ බො, එකල්හි වනාහී; චත්තාරො මහා රාජා, සතරවරම් රජදරුවෝ; මහතියා ච යක්ඛ සෙනාය, මහත් වූ යක්ෂ සේනාවකින් ද; මහතියා ච ගන්ධබ්බ සෙනාය. මහත් වූ ගන්ධර්ව සේනාවකින් ද; මහතියා ච කුම්භාණ්ඩ සෙනාය, මහත් වූ කුම්භාණ්ඩ සේනාවකින් ද; මහතියා ච නාග සෙනාය. මහත් වූ නාග සේනාවකින් ද; චතුද්දිසං, සිවුදිග; රක්ඛං ඨපෙත්වා, ආරක්ෂා පිහිටුවා; චතුද්දිසං, සිව්දිග; ගුම්බං ඨපෙත්වා, මහත් බල සේනාව තබා; චතුද්දිසං, සිවුදිග; ඔවරණං ඨපෙත්වා, සේනාව තරකොට සිටුවා; අභික්කන්තාය රත්තියා, පෙරයම් රැය ඉක්ම ගිය කල්හි; අභික්කන්තවණ්ණා, මනෝඥ වූ වණී ඇත්තා හු; කෙවලකප්පං ගිජ්ඣකූටං, මුළු ගිජ්ඣකූට පර්වතය; ඔභාසෙත්වා, හාත්පසින් බබුළුවා; භගවා, භාග්‍යවතුන් වහන්සේ; යෙන, යම් තැනෙක ද; තෙන, එතැනට; උපසංකමිංසු, එළඹියාහු ය; උපසංකමිත්වා, එළඹ; භගවන්තං, භාග්‍යවතුන් වහන්සේට; අභිවාදෙත්වා, මනාකොට වැඳ; එකමන්තං, එකත්පසෙක; නිසිදිංසු, හුන්නාහු ය.

2. තෙ පි බො යක්ඛා, සිවුවරම් රජුන් සමග පැමිණි ඒ යක්ෂයෝ ද; අප්පෙකච්චෙ, ඇතැම් කෙනෙක්; භගවන්තං, භාග්‍යවතුන් වහන්සේ; අභිවාදෙත්වා, සකසා වැඳ; එකමන්තං, එකත්පසෙක; නිසීදිංසු, හුන්හ; අප්පෙකච්චෙ, ඇතැම් යක්ෂ කෙනෙක්; භගවතා සද්ධිං, භාග්‍යවතුන් වහන්සේ හා සමග; සම්මොදිංසු, සතුටු වූහ; සම්මොදනීයං, සතුටු විය යුතු වූ; සාරාණීයං, සිහිකටයුතු වූ; කථං, කථාව; වීතිසාරෙත්වා, කොට නිමවා; එකමන්තං, එකත්පසෙක; නිසීදිංසු, හුන්නාහු ය; අප්පෙකච්චෙ, ඇතැම් යක්ෂ කෙනෙක්; භගවා, භාග්‍යවතුන් වහන්සේ; යෙන, යම් තැනෙක්හි ද; තෙන, එදෙසට; අඤ්ජලිං පණාමෙත්වා, අඤ්ජලි ප්‍රණාමය කොට; එකමන්තං, එකත්පසෙක; නිසීදිංසු, හුන්හ; අප්පෙකච්චෙ, ඇතැම් යක්ෂ කෙනෙක්; නාම ගොත්තං සාවෙත්වා, නම් ගොත් අස්වා; එකමන්තං, එකත්පසෙක; නිසිදිංසු, හුන්හ; අප්පෙකච්චෙ, ඇතැම් යක්ෂ කෙනෙක්; තුණ්හී භූතා, නිශ්ශබ්ද වූවා හු; එකමන්තං, එකත්පසෙක; නිසීදිංසු, හුන්හ; එකමන්තං නිසින්නො බො, එකත් පස්ව හුන්නාවූ ම; වෙස්සවණො මහාරාජා, වෙසමුනි මහරජ තෙමේ; භගවන්තං, භාග්‍යවතුන් වහන්සේට; එතදවොච, මෙය සැළ කෙළේ ය;

3. භන්තෙ, ස්වාමීනි; භගවතො, භාග්‍යවතුන් වහන්සේ හට; අප්පසන්නා, අප්‍රසන්න වූ; උළාරා යක්ඛා, මහේශාක්‍ය යක්ෂයෝ; සන්තිහි, ඇත්තාහු ම ය; භන්තෙ, ස්වාමීනි; භගවතො, භාග්‍යවතුන් වහන්සේහට; පසන්නා, ප්‍රසන්න වූ; උළාරා යක්ඛා, මහේශාක්‍ය යක්ෂයෝ; සන්තිහි, ඇත්තාහු ම ය; භන්තෙ, ස්වාමීනි; භගවතො, භාග්‍යවත් හට; අප්පසන්නා, අප්‍රසන්න වූ; මජ්ඣිමා යක්ඛා, මධ්‍යම අනුභාව ඇති යක්ෂයෝ; සන්තිහි, ඇත්තාහු ම ය; භන්තෙ, ස්වාමීනි; භගවතො, භාග්‍යවතුන් වහන්සේට; පසන්නා, ප්‍රසන්න වූ; මජ්ඣිමා යක්ඛා, මධ්‍යම අනුභාව ඇති යක්ෂයෝ; සන්තිහි, ඇත්තාහු ම ය; භන්තෙ, ස්වාමීනි; භගවතො, භාග්‍යවත් හට; අප්පසන්නා, අප්‍රසන්න වූ; නීචා යක්ඛා, අල්පේශාක්‍ය යක්ෂයෝ ද; සන්තිහි, ඇත්තාහු ම ය; භන්තෙ, ස්වාමීනි; භගවතො, භාග්‍යවත් හට; පසන්නා, ප්‍රසන්න වූ; නීචා යක්ඛා, අල්පේශාක්‍ය යක්ෂයෝ ද; සන්තිහි, ඇත්තාහු ම ය.

Non-Commercial Distribution

4. භන්තෙ, ස්වාමීනි; යක්ඛා, යක්ෂයෝ; යෙභුය්‍යෙන ඛො පන, බොහෝ සෙයින් ම වනාහි; භගවතො, භාග්‍යවතුන් වහන්සේට; අප්පසන්නා යෙව, අප්‍රසන්නයෝ ම ය; තං කිස්ස හෙතු; ඊට හේතුව කවරේ ද?; භන්තෙ, ස්වාමීනි; භගවාහි, භාග්‍යවතුන් වහන්සේ වනාහි; පාණාතිපාතා වෙරමණියා, ප්‍රාණඝාතයෙන් වැළකීම පිණිස; ධම්මං, ධර්මය; දෙසෙති, දෙසන සේක; අදින්නාදානා වෙරමණියා, අයිනාදනින් වැළකීම පිණිස; ධම්මං, ධර්මය; දෙසෙති, දෙසන සේක; කාමෙසුමිච්ඡාචාරා වෙරමණියා, කාමමිථ්‍යාචාරයෙන් වැළකීම පිණිස; ධම්මං, ධර්මය; දෙසෙති, දෙසන සේක; මුසාවාදා වෙරමණියා, මුසාවාදයෙන් වැළකීම පිණිස; ධම්මං දෙසෙති, දහම දෙසන සේක; සුරාමෙරය මජ්ජපමදට්ඨානා වෙරමණියා, මද ප්‍රමාද දෙකට කාරණ වූ රහමෙර පීමෙන් වැළකීම පිණිස; ධම්මං, දහම; දෙසෙති, දෙසන සේක. (එහෙයිනි)

5. භන්තෙ, වහන්ස; යක්ඛා, යක්ෂයෝ; යෙභුය්‍යෙන ඛො පන, බොහෝ සෙයින් ම වනාහි; පාණාතිපාතා, ප්‍රාණඝාතයෙන්; අප්පටිවිරතා යෙව, නො වැළැක්කාහු ම ය; අදින්නාදානා, අදත්තාදානයෙන්; අප්පටිවිරතා, නො වැළැක්කාහු ම ය; කාමෙසුමිච්ඡාචාරා, කාමමිථ්‍යාචාරයෙන්; අප්පටිවිරතා, නො වැළැක්කාහු ම ය; මුසාවාදා, බොරු කීමෙන්; අප්පටිවිරතා, නොවැළැක්කාහු ම ය; සුරාමෙරය මජ්ජපමාදට්ඨානා, මදයට හා ප්‍රමාදයට හේතු වන රහමෙර පීමෙන්; අප්පටිවිරතා, නො වැළැක්කාහු ම ය; තෙසං, ඒ යක්ෂයින්ට; තං, ඒ ධර්ම දේශනාව; අප්පියං අමනාපං හොති, අප්‍රිය වන්නේ ය, අමනාප වන්නේ ය.

6. භන්තෙ, ස්වාමීනි; භගවතො, භාග්‍යවතුන් වහන්සේ ගේ; සාවකා, ශ්‍රාවක වූ භික්ෂූන් වහන්සේ; සන්තිහි, ඇත්තාහු ම ය; (ඒ ශ්‍රාවකයෝ) අරඤ්ඤෙ; ආරණ්‍යයෙහි වූ; සෙනාසනානි, සේනාසන ද; වනපත්ථානි, වනයට ඇතුළත් වූ; පන්ථානි, ප්‍රාන්ත වූ ද හෙවත් ඉතා දුර වූ ද; අප්ප සද්දානි, අල්ප ශබ්ද ඇති; අප්පනිග්ඝොසානි, මහත් ඝෝෂා නැති හෙවත් කෝලාහල නැත්තා වූ; විජනවාතානි, ජනවාසයෙන් උපදනා පවන් නැත්තා වූ; මනුස්සරාහසෙය්‍යකානි, මිනිසුන් ගේ රහසට සුදුසු වූ; පටිසල්ලානං, සිත එකඟ කිරීමට; සාරුප්පානි, සුදුසු වූ; සෙනාසනානි, සෙනසුන්; පටිසෙවන්ති, සේවනය කෙරෙත්; තත්‍ථ, ඒ වනසෙනසුන්හි; නිවාසිනො, නිබඳ වාසය කරන්නා වූ; උළාරා යක්ඛා, මහානුභාව සම්පන්න යක්ෂයෝ; සන්ති, ඇත්තාහු ම ය; යෙ, යම් යක්ෂ කෙනෙක්; භගවතො, භාග්‍යවත්හු ගේ; ඉමස්මිං පාවචනෙ, මේ ත්‍රිපිටක ධර්මයෙහි; අප්පසන්නා, නො පැහැදුනාහු ද; තෙසං, ඔවුන් ගේ; පසාදාය, ප්‍රසාදය ඇති කරවනු පිණිස ය.

7. භන්තෙ, ස්වාමීනි; භගවා, භාග්‍යවතුන් වහන්සේ; භික්ඛූනං, භික්ෂූන් ගේ ද; භික්ඛුණීනං, භික්ෂුණීන් ගේ ද; උපාසකානං, උපාසකවරුන් ගේ ද; උපාසිකානං, උපාසිකාවරුන් ගේ ද; ගුත්තියා, උවදුරු වැළැක්වීම පිණිස ද; රක්ඛාය, ආරක්ෂාව පිණිස ද; අවිහිංසාය, හිංසා නොවන බැව් පිණිස ද; ඵාසුවිහාරාය, පහසු විහරණය පිණිස ද; ආටානාටියං රක්ඛං, ආටානාටිය නම් ආරක්ෂාව හෙවත් පිරිත; උග්ගණ්හාතු ඉති, ඉගෙන වදාරණ සේක්වා;

8. භගවා, භාග්‍යවතුන් වහන්සේ; තුණ්හීභාවෙන, නිශ්ශබ්දතාවෙන්; අධිවාසෙසි, ඉවසා වදාළ සේක; අථ ඛො, ඉක්බිති; වෙස්සවණො මහාරාජා, වෙසවුණු මහරජ තෙමේ; භගවතො, භාග්‍යවත්හු ගේ; අධිවාසනං, ඉවසීම; විදිත්වා, දැන; තායං වෙලායං, ඒ වේලායෙහි; ඉමං ආටානාටියං රක්ඛං, මේ ආටානාටිය පිරිත; අභාසි, කීයේ ය හෙවත් ප්‍රකාශ කෙළේ ය;

9. (1) චක්ඛුමන්තස්ස, ප්‍රඥ චක්ෂුස ඇත්තා වූ; සිරිමතො, ශ්‍රීමත් වූ; විපස්සිස්ස, විපස්සී නම් බුදුරජ හට; නමත්‍ථු, නමස්කාර වේවා; සබ්බභූතානුකම්පිනො, සියලු සතුන් කෙරෙහි අනුකම්පා ඇත්තා වූ; සිඛිස්සපි, සිඛී නම් බුදුරජාණන් වහන්සේට ද; නමත්‍ථු, නමස්කාර වේවා.

Non-Commercial Distribution

(2) නහාතකස්ස, නිහත ක්ලේසි වූ; තපස්සිනො, කෙලෙසුන් තවන වීර්‍යය ඇති; වෙස්සභුස්ස, වෙස්සභූ නම් බුදුරජ හට ද; නමත්‍ථු, නමස්කාර වේවා; මාරසෙනා පමද්දිනො, පංචවිධ මාරසේනාව මර්දනය කළා වූ; කකුසන්ධස්ස, කකුසඳ බුදුරජාණන් වහන්සේට ද; නමත්‍ථු, නමස්කාර වේවා.

(3) බ්‍රාහ්මණස්ස, බහා තබන ලද පව් ඇති; වුසීමතො, වැස නිමවන ලද මාර්ග බ්‍රහ්මචර්‍යය ඇති; කොණාගමනස්ස, කෝණාගමන නම් බුදුරජාණන් වහන්සේට; නමත්‍ථු, නමස්කාර වේවා; විප්පමුත්තස්ස සබ්බධි, සියලු කෙලෙසුන් කෙරෙන් විශේෂයෙන් මිදුනා වූ; කස්සපස්ස, කාශ්‍යප බුදුරජාණන් වහන්සේට ද; නමත්‍ථු, නමස්කාර වේවා.

(4) යො, යම් සර්වඥ කෙනෙක්; සබ්බ දුක්ඛා පනූදනං, සියලු දුක් දුරු කරන්නා වූ; ඉමං ධම්මං, මේ ධර්මය; අදෙසෙයි වදාළ සේක් ද; අංගීරසස්ස, අංගීරස නම් වූ; සිරිමතො, ශ්‍රීමත් වූ; සක්‍යපුත්තස්ස, ශාක්‍යපුත්‍ර වූ; ගෞතම බුදුරජාණන් වහන්සේට; නමත්‍ථු, නමස්කාර වේවා.

10. ලොකෙ, සත්ව ලෝකයෙහි; යෙවාපි නිබ්බුතා, යම් රහත් කෙනෙක් පිරිනිවියාහු ද; යථාභූතං, තත්වූ පරිද්දෙන්; විපස්සිසුං, උදයව්‍යයාදී විදර්ශනා කළාහු ද; තෙ ජනා, ඒ නික්ලේශී වූ ජනයෝ; අපිසුණා, පෙහෙසුන් වදන් නැත්තාහ; මහන්තා, මහත් බවට පැමිණියා හ; විතසාරදා, පහවූ සංසාර භය ඇත්තා වූ හෙවත් නිර්භය හ. (ඒ රහතන් වහන්සේලාට නමස්කාර වේවා.)

11. විජ්ජාචරණ සම්පන්නං, අෂ්ට විද්‍යා පසළොස් චරණ ධර්‍මයන් ගෙන් යුක්ත වූ; මහන්තං, මහත් බවට ගියා වූ; වීතසාරදං පහ වූ බිය ඇති; හිතං දෙවමනුස්සානං, දෙව් මිනිසුන්ට හිත වූ; යං ගොතමං, යම් ගෞතම ගෝත්‍රයෙහි වූ බුදු කෙනෙකුට; නමස්සන්ති, නමස්කාර කෙරෙත් ද; (ඒ සර්වඥයන් වහන්සේට නමස්කාර වේවා.)

12. ආදිච්චො, අදිති පුත්‍ර වූ; මණ්ඩලිමහා, දිලිසෙන මහත් මඩුළු ඇති; සූරියො, සූර්ය තෙම; යතො උග්ගච්ඡති, යම් තැනෙකින් උදාවේ ද; යස්සවුග්ගච්ජමානස්ස, යම් සූර්යයකු උදාවන කල්හි; සංවරිපි, රාත්‍රිය; නිරුජ්ඣති, නිරුද්ධ වේ ද;

සූරියෙ, හිරු; යස්ස චුග්ගතෙ, යම් දිගකින් උදා වූ කල්හි; දිවසොති පවුච්චති, දවස ය යි කියනු ලැබේ; තත්ථ, එතැන්හි; ගම්භීරො, ගැඹුරු වූ; රහදොපි, පතළා වූ; සරිතොදකො, ජලය ඇති; සමුද්දො, සමුද්‍ර නම් වූ; ජල නිධියක් ද ඇත්තේ ය; තත්ථ, එතැන්හි පතළා වූ ජලය ඇති; නං සරිතොදකො, ඒ ජලනිධිය; සමුද්දො, සමුද්‍ර ය යි; එවං, මෙසේ; ජානන්ති, දනිත්.

13. ඉතො, මේ මහමෙරින්; සා, ඕ තොමෝ; පුරිමාදිසා, පෙරදිග වන්නී ය; ජනො, ජන තෙම; නං, ඒ දිසාවට; ඉති, මෙසේ; ආචික්ඛති, පෙරදිග ය යි කියයි.

යසස්සී, යසස් ඇත්තා වූ; සො මහාරාජා, ඒ වරම් මහරජ තෙමේ; යං දිසං, යම් දිසාවක්; අභිපාලෙති, මනා කොට රක්ෂා කෙරේ ද; ගන්ධබ්බානං, ගන්ධර්වයන්ට; ආධිපති, අධිපති වූ; සො, හෙතෙමේ; ධතරට්ඨො නාම ඉති, ධෘතරාෂ්ට්‍ර නම් වන්නේ ය. සො, හෙතෙම; ගන්ධබ්බෙහි, ගන්ධර්වයන් විසින්; පුරක්ඛතො, පෙරටු කරන ලද්දේ; නච්චගීතෙහි, නැටුමෙන් හා ගැයුමෙන්; රමති, සිත් අලවා වෙසෙයි; තස්ස, ඔහු ගේ; බහවො පුත්තාපි, බොහෝ පුත්‍රයෝ ද; එකනාමාති, එක් නම් ඇත්තාහු ය යි; මෙ සුතං, මා විසින් අසන ලදී.

ඉන්දනාමා, ඉන්ද්‍රය යන නම ඇති; මහබ්බලා, මහත් බල ඇත්තා වූ; අසිතිං දස එකොච, ඒකානූවක් පමණ වූ; තෙවා, පි, ඒ පුත්‍රයෝ ද; මහන්තං, මහත්බවට ගියා වූ; විතසාරදං,

Non-Commercial Distribution

චතුර්වෛශාරද්‍ය ඥානයෙන් විශාරද වූ; බුද්ධං, බුද්ධ නම් වූ; ආදිච්ච බන්ධුනං, සූර්ය වංශයෙහි උපත් හෙයින් ආදිච්ච බන්ධු නම් වූ; බුද්ධං, සර්වඥයන් වහන්සේ; දිස්වාන, දැක; දූරතොව, දුරදී ම; නමස්සන්ති, නමස්කාර කෙරෙති; පුරිසාජඤ්ඤ, පුරුසාජානීය ය; තෙ, නුඹ වහන්සේට; නමො, නමස්කාර වේවා; පුරිසුත්තම, පුරිසෝත්තමය; තෙ, නුඹ වහන්සේට; නමො, නමස්කාර වේවා.

14. කුසලෙන, නිරවද්‍ය වූ නිපුණ වූ සර්වඥතාඥනයෙන්; සමෙක්ඛසී, මහජනයා බලන්නෙහි ය යි කියා; අමනුස්සාපි, අමනුෂ්‍යයෝ ද; තං, නුඹ වහන්සේට; වන්දන්ති; වඳිති; එතං, ඒ එසේය කියා; නො, අප විසින්; අභිණ්හසො, නිතර; සුතං, අසන ලදී; තස්මා, ඒ කාරණයෙන්; එවං, මෙසේ; වදෙමසෙ, කියම් හ; ගොතමං, ගෞතම ගෝත්‍රයෙහි උපන්නා වූ; ජිනං, සර්වඥයන් වහන්සේට; වන්දථ, නමස්කාර කරව් දැ යි; වන්දාම, සර්වඥයන් වහන්සේ අපි වඳුම් හ; විජ්ජාචරණ සම්පන්නං බුද්ධං, විද්‍යාචරණ සම්පන්න වූ බුදුරජාණන් වහන්සේට අපි නමස්කාර කරම්හ. (ඒ අමනුෂ්‍යයෝ අපට) කියත්.

15. යෙන, යම් දිසා භාගයකින්; පෙතා, මළ සිරුරු; පවුච්චන්ති, ගෙන යෙති'යි කියනු ලැබෙත් ද; පිසුණා, කේලම් කියන්නෝත්; පිට්ඨිමංසිකා, අනභිමුඛයෙහි නින්දා බණන්නෝත්; පාණාතිපාතිනො, සතුන් මරන්නෝත්; එද්දා, රෞද්‍ර වූ; චොරා, සොරසිත් ඇත්තා වූ; නෙකතිකා ජනා, වඤ්චා දන්නා වූ ජනයෝ ද; යම් දිසාවකින් බැහැර කෙරෙති'යි කියනු ලැබෙත් ද; ඉතො, මේ මහමෙරු පර්වතයෙන්; සා, ඕ තොමෝ; දක්ඛිණා දිසා, දක්ෂිණා දිසා නම් වන්නී ය; ජනො, ජන තෙමේ; නං, ඒ දිසාවට; ඉති ආචික්ඛති, දකුණු දිසාව ය යි මෙසේ කියන්නේ ය; යසස්සී, යසස් ඇති; සො මහාරාජා, ඒ වරම් මහරජ තෙමේ; යංදිසං, යම් දිසා භාගයක්; අභිපාලෙති, රක්ෂා කෙරේ ද; කුම්භණ්ඩානං ආධිපති, කුම්භාණ්ඩයන්ට අධිපති වූ; විරුළ්හො ඉති, විරුළ්හ යන නම ඇති; සො, ඒ වරම් රජ තෙමේ; කුම්භණ්ඩෙහි පුරක්ඛතො, කුම්භාණ්ඩයන් විසින් පිරිවරන ලද්දේ; නච්චගීතෙහි, නෘත්‍යගීතයෙන්; රමති, සිත් අලවා වාසය කරයි.

තස්ස, ඒ විරුළ්හ නම් මහරජහු ගේ; බහවො පුත්තාපි, බොහෝ පුත්‍රයෝ ද; ඉන්ද නාමා, ඉන්ද්‍රය යන නම් ඇති; මහබ්බලා, මහත් වූ බල ඇති; එකනාමාති, එක නම් ඇත්තාහු; අසීතිං, දස එකො ච, ඒකානූවක් වන්නහු ය යි; මෙ සුතං, මා විසින් අසන ලදී.

තෙ චා පි, ඒ පුත්‍රයෝ ද; ආදිච්ච බන්ධුනං, සූර්ය බන්ධු වූ; බුද්ධං, සර්වඥයන් වහන්සේ; දිස්වාන, දැක; මහන්තං, මහත් බවට පැමිණියා වූ; විතසාරදං, විතසාරද වූ; බුද්ධං, සර්වඥයන් වහන්සේ; දූරතොව, දුරදී ම; නමස්සන්ති, නමස්කාර කෙරෙති; පුරිසාජඤ්ඤ, පුරුෂශ්‍රේෂ්ඨයාණන් වහන්ස; තෙ, නුඹ වහන්සේට; නමො, නමස්කාර වේවා; පුරිසුත්තම, පුරුෂෝත්තමය; තෙ, නුඹ වහන්සේට; නමො, නමස්කාර වේවා.

16. කුසලෙන, සර්වඥතාඥනයෙන්; සමෙක්ඛසි, මහජනයා බලන සේක; (ඒ කාරණයෙන්) අමනුස්සාපි, අමනුෂ්‍යයෝ ද; තං, නුඹ වහන්සේට; වන්දන්ති, නමස්කාර කෙරෙති; එතං, මේ වචනය; නො, අප විසින්; අභිණ්හසො, නිතර; සුතං, අසන ලදි; තස්මා, ඒ කාරණයෙන්; එවං, මෙසේ; වදෙමසෙ, කියම්හ; ගොතමං, ගෞතම ගෝත්‍රයෙහි උපන්නා වූ; ජිනං, සර්වඥයන් වහන්සේ; වන්දාම, නමස්කාර කරම්හ; විජ්ජාචරණ සම්පන්නං, විද්‍යාචරණ ගුණයෙන් යුක්ත වූ; බුද්ධං, සර්වඥයන් වහන්සේට; වන්දාම, අපි නමස්කාර කරම්හ'යි කියති.

17. යත්ථ, යම් දිසා භාගයෙක්හි; ආදිච්චො, අදිති පුත්‍ර වූ; මණ්ඩලී මහා, මහත් මණ්ඩලයක් ඇති; සුරියො, සූර්ය දිව්‍ය පුත්‍ර තෙමේ; වොග්ගච්ඡති, අස්තයට යේ ද; යස්ස වොග්ගච්ඡමානස්ස,

Non-Commercial Distribution

අස්තයට යන්නා වූ යම් සූර්යයකු සම්බන්ධව; දිවසොපි, දිවා භාගය; නිරුජ්ඣති, අන්තර්ධාන වේ ද; යස්ස චුග්ගතෙ සුරියෙ, යම් සූර්යයකු අස්තයට ගිය කල්හි; සංවරීති පවුච්චති, ඕ තොමෝ රාත්‍රිය යි කියනු ලැබේ ද; තත්ථ, ඒ පශ්චිම දිශා භාගයෙහි; ගම්භීරො, ගැඹුර ඇති; සරිතොදකො, පතළා වූ ජලය ඇති; සමුද්දො, සමුද්‍ර සංඛ්‍යාත වූ; රහදොපි, තඩාගයෙක් ඇත්තේ ය.

තත්‍ථ, ඒ දිශා භාගයන්හි; නං, ඒ තඩාගය; සමුද්දො, සමුද්‍ර සංඛ්‍යාත වූ; සරිතොදකො, පතළා වූ ජලය ඇත්තේ යි; එවං ජානන්ති, මෙසේ දනිති.

18. ඉතො, මේ මහාමේරු පර්වතයෙන්; සා, ඒ දිසාව; පච්ඡිමා දිසා, පශ්චිම දිසා නම් වන්නිය යි; ජනො, ජන තෙමේ; ඉති ආචික්ඛති, මෙසේ කියන්නේ ය; යසස්සී, යසස් ඇත්තා වූ; සො මහාරාජා, ඒ වරම් රජ තෙමේ; යං දිසං, යම් දිසා භාගයක්; අභිපාලෙති, රක්ෂා කෙරෙයි.

නාගානං, නාගයන්ට; ආධිපති, ආධිපත්‍යය කරන්නා වූ; විරූපක්ඛො ඉති නාම, විරූපාක්ෂ නම් වූ; සො, ඒ වරම් මහරජ තෙමේ; නාගෙහි පුරක්ඛතො, නාගයන් විසින් පිරිවරන ලද්දේ; නච්චගීතෙහි රමති, නෘත්‍ය ගීතයෙන් සිත් අලවා වාසය කරයි.

තස්ස, ඒ වරම් මහරජහු ගේ; බහවො, බොහෝ වූ; පුත්තාපි, පුත්‍රයෝ ද; ඉන්ද නාමා, ඉන්ද්‍ර යන නම් ඇති; මහබ්බලා, මහත් බල ඇත්තා වූ; අසීතිං දස එකො ච, ඒකානූවක් පමණ වූ ඔවුහු ද; එක නාමාති, එක නම් ඇත්තා හු ය යි; මෙ සුතං, මා විසින් අසන ලදී.

තෙ වා පි, ඉන්ද්‍ර නම් වූ ඒ පුත්‍රයෝ ද; ආදිච්ච බන්ධුනං, සූර්ය වංශ ඇති; බුද්ධං, ක්ලේශ නිද්‍රාපගමයෙන් ප්‍රබුද්ධ වූ; මහන්තං, මහත් බවට පැමිණි; විතසාරදං, විසාරද වූ; බුද්ධං, සර්වඥයන් වහන්සේ; දිස්වාන, දැක; දූරතොව, දුරදී ම; නමස්සන්ති, නමස්කාර කෙරෙත්; පුරිසාජඤ්ඤ, පුරුෂශ්‍රේෂ්ඨයන් වහන්ස; තෙ, නුඹ වහන්සේට; නමො, නමස්කාර වේවා; පුරිසුත්තම, පුරුෂෝත්තමයන් වහන්ස; තෙ, නුඹ වහන්සේට; නමො, නමස්කාර වේවා.

19. කුසලෙන සමෙක්ඛසි, සර්වඥතාඥනයෙන් මහජනයා බලන සේකැ'යි කියා; අමනුස්සාපි, අමනුෂ්‍යයෝ ද; තං, නුඹ වහන්සේට; වන්දන්ති, නමස්කාර කෙරෙත්; එතං, මේ කාරණය; නො, අප විසින්; අභිණ්හසො, නැවත නැවත; සුතං, අසන ලදි; තස්මා, එහෙයින්; එවං වදෙමසෙ, මෙසේ කියම්හ; ගොතමං, ගෞතම ගෝත්‍රයෙහි උපන්නා වූ; ජිනං, සර්වඥයන් වහන්සේ; වන්දාම, වඳිමු යයි; (කියත්) විජ්ජාචරණ සම්පන්නං, විද්‍යාචරණ ගුණයෙන් යුක්ත වූ; ගොතමං, ගෞතම ගෝත්‍රයෙහි උපන්නා වූ; බුද්ධං, සර්වඥයන් වහන්සේ; වන්දාම, අපි නමස්කාර කරම්හ'යි (කීහ).

20. යෙන, යම් දිශා භාගයෙක්හි; රම්මා, අභිරමණයට යෝග්‍ය වූ; උත්තරකුරු, උතුරුකුරු දිවයින පිහිටියේ ද; සුදස්සනො, අතිශයින් දැකුම්කළු වූ; මහානෙරු, මහමේරු පර්වතය වන්නේ ද; තත්ථ, ඒ උතුරුකුරු දිවයිනෙහි; අමමා, මමත්වයක් නැති; අපරිග්ගහා, මාගේ පුත්‍රයා ය මගේ භාර්යාව ය යන විශේෂ ගැන්මක් නැත්තා වූ; මනුස්සා, මනුෂ්‍යයෝ; ජායන්ති, උපදිත්.

තෙ, ඒ මනුෂ්‍යයෝ; බීජං, ධාන්‍ය බීජ ය; න පවපන්ති, නො වපුරත්; නංගලා, නඟුල් ද; න පිනියන්ති, නො ගෙනයනු ලැබෙති; මානුසා, මනුෂ්‍යයෝ; අකට්ඨපාකිමං, කෘෂිකර්ම නොකළ වනයෙහි ස්වයංජාතව පැසුණා වූ; සාලිං, හැල්සාල්; පරිභුඤ්ජන්ති, අනුභව කෙරෙත්.

අකණං අථුසං, කුඩු පොතු නැති; සුද්ධං, පිරිසිදු වූ; සුගන්ධං, සුවඳ ඇති; තණ්ඩුලප්ඵං, සහල් ඵලකොට ඇති; සාලිං, හැල්සාල්; තුණ්ඩිකිරෙ පචිත්වාන, රන්බඳුනෙහි පිස; තතො, එයින් ගෙන; භෝජනං භුඤ්ජන්ති, භෝජනය අනුභව කෙරෙත්.

Non-Commercial Distribution

21. ගාවිං එකඛුරං කත්වා, ගවදෙනුන් අල්වාගෙන එකඛුර වාහන කොට හෙවත් අශ්වයානාවකට මෙන් පිටට පැන නැගී; දිසොදිසං, දිශානුදිශායෙහි; අනුයන්ති, සඤ්චාරය කෙරෙති; පසුං එකඛුරං කත්වා, චතුස්පද ජාතීන් එකඛුර වාහනයක් කොට හෙවත් අශ්වයානාවකට මෙන් පිටට පැන නැගී; දිසොදිසං, දිශානුදිශායෙහි; අනුයන්ති, සඤ්චාරය කෙරෙත්, ඉත්ථිවාහනං කත්වා, ස්ත්‍රීන් වාහන කොට; දිසොදිසං, දිශානුදිශායෙහි; අනුයන්ති, සඤ්චාරය කෙරෙත්; පුරිසවාහනං, පුරුෂයන් වාහනය කොට; දිසොදිසං, දිශානුදිශායෙහි; අනුයන්ති, සඤ්චාරය කෙරෙත්.

කුමාරි වාහනං කත්වා, කුමාරිකාවන් වාහනය කොට රථයෙහි යොදා; දිසොදිසං, දිශානුදිශායෙහි; අනුයන්ති, සඤ්චාරය කෙරෙති; කුමාර වාහනං කත්වා, කුමාරවරුන් වාහනය කොට රථයෙහි යොදා; දිසොදිසං, දිශානුදිශායෙහි; අනුයන්ති, සඤ්චාරය කෙරෙති.

තස්ස රාජිනො, ඒ වෙසවුණු මහරජහු ගේ; තෙ පචාරා, ඒ පිරිවර යක්ෂයෝ; යානෙ අභිරුහිත්වා, හස්ත්‍යශ්වාදී වූ, අනේකප්‍රකාර වූ; යානාවන් නැගී; සබ්බාදිසා, සියලු දිසා භාගයෙහි; අනුපරියන්ති, වටකොට ඇවිදිති.

22. හත්ථි යානං, ඇත් වාහනයට ද; අස්ස යානං, අශ්ව යානාවට ද; දිබ්බං යානං, දිව්‍ය යානාවට ද; උපට්ඨිතං, එළඹ සිටින්නේ ය; මහාරාජා යසස්සිනො, යස පිරිවර ඇත්තා වූ වෙසවුණු මහරජ හට; පාසාදා, ප්‍රාසාදයෝ ද; සිවිකාවෙව සිවි ගෙවල් ද වෙත්.

23. තස්ස, ඒ වෙසවුණු මහරජු ගේ ද; අන්තලික්ඛෙ, අන්තරීක්ෂයෙහි; සුමාපිතා, මොනවට මවන ලද; ආටානාටා, ආටානාටා නම් වූ නුවරෙක; කුසිනාටා, කුසිනාටා නම් වූ නුවරෙක; පරකුසිනාටා, පරකුසිනාටා නම් වූ නුවරෙක; නාටපුරියා, නාටපුරියා නම් වූ නුවරෙක; පරකුසිතනාටා, පරකුසිතනාටා නම් වූ නුවරෙක යන; නගරා, නගර සමූහයෝ; අහු, වූවාහු ය.

උත්තරෙන, උතුරු දිගින්; කපීවන්තො, කපීවන්ත නම් නුවරෙක; අපරෙන ච, දකුණු දෙසින්; ජනොඝ, ජනෝඝ නම් නුවරෙක; නවනවතියො අම්බර අම්බරවතියො, නව නවති අම්බර අම්බරවති යන නගරයෝ ද වෙත්; ආලකමන්දා නාම රාජධානි, ආලකමන්දා නම් රාජධානියක් ද වේ.

24. මාරිස, නිදුකාණන් වහන්ස; කුවෙරස්ස ඛො පන මහාරාජස්ස, කුවේර නම් මහරජහට; විසාණා නාම රාජධානි, විසාණ නම් රාජධානියෙක් ද වෙයි; තස්මා, ඒ කාරණයෙන්; කුවෙරො මහාරාජා, කුවේර නම් මහාරජ තෙමේ; වෙස්සවණොති පවුච්චති, වෛශ්‍රවණ යයි කියනු ලැබේ.

25. පච්චෙසන්තො, (පති + එසන්තො) වෙන් වශයෙන් කරුණු පරීක්ෂා කරන්නා වූ; තතොලා, තතෝලා නම් යක්ෂයෙක; තත්තලා, තත්තලා නම් යක්ෂයෙක; තතොජසි, තතෝජසී නම් යක්ෂයෙක; සූරො, සූර නම් යක්ෂයෙක; රාජා, රාජා නම් යක්ෂයෙක; (සූරරාජො, සූරරාජ නම් යක්ෂයෙක) අරිට්ඨො, අරිට්ඨෝ නම් යක්ෂයෙක; නෙමි, නේමි නම් යක්ෂයෙක; අරිට්ඨොනෙමි, අරිට්ඨෝනේමි නම් යක්ෂයෙක; (යන යක්ෂයෝ දොළොස් දෙන වෙත්)

තත්‍ථ, ඒ විසාණා රාජධානියෙහි; රහදොපි, පණස් යොදුන් පමණ තඩාගය ද; ධරණී නාම, ධරණී නම් වන්නී ය; යතො, යම් තඩාගයකින් ජලය ගෙන; මෙඝා, වර්ෂාවෝ; පවස්සන්ති, වර්ෂා කෙරෙත් ද; වස්සා, වර්ෂාවෝ; යතො, යම් තඩාගයකින්; පතායන්ති, පැතිරෙද්ද; තත්ථ, ඒ තඩාග තීරයෙහි; සභාපි, සභාශාලාව ද; භගලවතී නාම, භගලවතී නම් වන්නී ය; යත්ථ, යම් ශාලාවෙක්හි; යක්ඛා, යක්ෂයෝ; පයිරුපාසන්ති, පයිරුපාසනය කෙරෙත් ද;

26. තත්‍ථ, ඒ ශාලාව හාත්පස; නිච්ච ඵලාරුක්ඛා, නිරන්තර ඵලහරිත වෘක්ෂයෝ ද වෙති; නානා දිජගණායුතා, නොයෙක් පක්ෂී සමූහයා ගෙන් ද යුක්ත වෙත්; මයුර කොඤ්චාභිරුදා, මොනරුන්

Non-Commercial Distribution

ගේ හා කොස්වා ළිහිණියන් ගේ මධුර නාද ඇත්තේ ය; වග්ගුහී, මනෝඥ වූ; කොකිලාභිහි, කෝකිලයන් විසින් පවත්වන ලද; මිහිරි නාදයෙන් යුක්ත ය.

එත්ථ, මේ විල්තෙර; ජීවං ජීවක සද්දා, ජීවං ජීවක පක්ෂීන් විසින් පවත්වන ලද ශබ්දයෝ ඇත්තාහ; අථො, නැවත; ඔට්ඨචචිත්තකා, ඔට්ඨචචිත්තක නම් පක්ෂීහු ද; කුකුත්ථකා, වලිකුකුළෝ ද; කුළීරකා, රන්වන් කකුළුවෝ ද; පොක්ඛරසාතකා, පොක්ඛරසාතක නම් පක්ෂීහු ද; වනෙ, වනයෙහි හැසිරෙන්නාහ; එත්ථ, ඒ පුෂ්කරණියෙහි; සුක සාලික සද්දා, ගිරා සැලළිහිණියන් ගේ ශබ්ද ඇත; දණ්ඩ මානවකානීච, දණ්ඩ මානවක නම් පක්ෂීහු ද හැසිරෙන්නාහ; සා කුවෙරනලිනී, ඒ කුවේර නම් මහරජහු ගේ; ධරණී නාම, ධරණී නම් පුෂ්කරණී තොමෝ; සබ්බකාලං, හැම කල්හි ම; සදා, නිරන්තරයෙන්; සොභති, ශෝභමානව බබලන්නී ය.

27. ඉතො, මේ මහාමේරු පර්වතයෙන්; සා, ඕ තොමෝ; උත්තරා දිසා, උතුරු දිශාව යයි; ජනො, ජනතෙම; තං, ඒ දිශාවට; ඉති ආචික්ඛති, මෙසේ කියන්නේ ය; යසස්සි, යස පිරිවර ඇත්තා වූ; සො මහා රාජා, ඒ වරම් මහරජ තෙමේ; යං දිසං, යම් දිශාවක්; අභිපාලෙති, මොනවට පාලනය කෙරේ ද; යක්ඛානං ආධිපති, යක්ෂයන් ගේ අධිපතියා වූ; කුවෙරො ඉති නාම, කුවේර නම් වූ; සො, ඒ වරම් රජතෙමේ; යක්ඛෙහි පුරක්ඛතො, යක්ෂ සේනාවන් විසින් පිරිවරන ලද්දේ; නච්චගීතෙහි, නෘත්‍ය ගීතාදියෙන්; රමති, සිත් අලවා වාසය කරන්නේ ය; තස්ස, ඒ වෙසවුණු මහරජහට; එක නාමාති, එක් නම් ඇති; බහවො පුත්තාපි, බොහෝ දරුවන් වෙති'යි; මෙ සුතං, මා විසින් අසල ලදි; මහබ්බලා, මහත් බල ඇති; ඉන්ද නාමා, ඉන්ද්‍ර යන නම් ඇති ඔව්හු; අසීතිං දස එකො ච, ඒකානූවක් ද වෙති; තෙ වාපි, ඒ ඉන්ද්‍ර යන නම් ඇති පුත්‍රයෝ ද; ආදිච්ච බන්ධූනං, සූර්යවංශ ඇත්තා වූ; බුද්ධං, ක්ලේශ නිද්‍රාපගමයෙන් ප්‍රබුද්ධ වූ; බුද්ධං, බුදුරජාණන් වහන්සේ; දිස්වාන, දැක; දූරතොව, දුරදී ම; නමස්සන්ති, නමස්කාර කෙරෙත්; පුරිසාජඤ්ඤ, පුරුෂ ශ්‍රේෂ්ඨයන් වහන්ස; තෙ, නුඹ වහන්සේට; නමො, නමස්කාර වේවා; පුරිසුත්තම, පුරුෂෝත්තමයන් වහන්ස; තෙ, නුඹ වහන්සේට; නමො, නමස්කාර වේවා.

කුසලෙන, චතුර් වෛශාරද්‍යඥනයෙන්; සමෙක්ඛසි, බලන සේකැ යි; අමනුස්සාපි, අමනුෂ්‍යයෝ ද; තං, නුඹ වහන්සේ; වන්දන්ති, වඳිත් යි යන; එතං, මේ කාරණය; නො, අප විසින්; අභිණ්හසො, නිරතුරුව; සුතං, අසන ලදී; තස්මා, ඒ කාරණයෙන්; එවං, මෙසේ; වදෙමසෙ, කියම්හ; ගොතමං, ගෞතම ගෝත්‍රයෙහි උපන්නා වූ; ජිනං, සර්වඥයන් වහන්සේ; වන්දථ, වඳීව් ද; ගොතමං, ගෞතම ගෝත්‍රයෙහි උපන්නා වූ; ජිනං, සර්වඥයන් වහන්සේ; වන්දාම, වඳිම් හ; විජ්ජාචරණ සම්පන්නං, අෂ්ට විද්‍යා පසළොස්චරණ ගුණයෙන් යුක්ත වූ; ගොතමං, ගෞතම ගෝත්‍රයෙහි උපන්නා වූ; බුද්ධං, සර්වඥයන් වහන්සේ; වන්දාම ඉති, වඳිමු යයි එසේ කියම්හ.

28. මාරිස, නිදුකාණන් වහන්ස; අයං ඛො සා ආටානාටියා රක්ඛා, ඒ මේ ආටානාටිය ආරක්ෂාව (පිරිත) වනාහි; භික්ඛූනං, භික්ෂූන් ගේ ද; භික්ඛුණීනං, භික්ෂුණීන්ගේ ද; උපාසකානං, උපාසකයන්ගේ ද; උපාසිකානං, උපාසිකාවන් ගේ ද; ගුත්තියා රක්ඛාය, ආධ්‍යාත්මික බාහිර උවදුරු වැළකීම පිණිස; ඵාසු විහාරය, සැප විහාරය පිණිස පවතී.

29. මාරිස, නිදුකාණන් වහන්ස; යස්ස කස්සචි, යම්කිසි; භික්ඛුස්ස වා, භික්ෂුවක් විසින් හෝ; භික්ඛුණියා වා, භික්ෂුණියක විසින් හෝ; උපාසකස්ස වා, උපාසකයකු විසින් හෝ; උපාසිකාය වා, උපාසිකාවක විසින් හෝ; අයං ආටානාටියා රක්ඛා, මේ ආටානාටිය ආරක්ෂා පිරිත; සුග්ගහිතා භවිස්සති, මනා කොට ඉගෙන ගන්නා ලද්දී ද; සමත්තා පරියාපුතා, හැම අයුරින් ම පුහුණු කොට පදව්‍යඤ්ජන නොපිරිහෙළා කියන ලද්දී ද;

Non-Commercial Distribution

30. වෙ, ඉදින්; තං, ඒ ආටානාටිය පිරිත ඉගෙන ගන්නාවූ ඔහු; අමනුස්සො, අමනුෂ්‍යයෙක් තෙමේ; යක්ඛො වා, යක්ෂයෙක් හෝ; යක්ඛිණී වා, යක්ෂණියක් හෝ; යක්ඛ පොතකො වා, යක් පැටවෙක් හෝ; යක්ඛ පොතිකා වා, යක් පැටියක් හෝ; යක්ඛ මහා මත්තො වා, යක්ෂ මහ ඇමතියෙක් හෝ; යක්ඛ පාරිසජ්ජො වා, යක්ෂ පිරිසෙහි වූවෙක් හෝ; යක්ඛ පචාරො වා, යක් මෙහෙකරුවෙක් හෝ;

31. ගන්ධබ්බො වා, ගඳඹෙක් හෝ; ගන්ධබ්බී වා, ගඳඹ ඉතිරියක් හෝ; ගන්ධබ්බ පොතකො වා, ගඳඹ පැටවෙක් හෝ; ගන්ධබ්බ පොතිකා වා, ගඳඹ පැටියක් හෝ; ගන්ධබ්බ මහාමත්තො වා, ගඳඹ මහ ඇමතියෙක් හෝ; ගන්ධබ්බ පාරිසජ්ජො වා, ගඳඹ පිරිසෙහි වූවෙක් හෝ; ගන්ධබ්බ පචාරො වා, ගඳඹ මෙහෙකරුවෙක් හෝ;

32. කුම්භණ්ඩො වා, කුම්භාණ්ඩයෙක් හෝ; කුම්භණ්ඩී වා, කුම්භණ්ඩි ස්ත්‍රියක් හෝ; කුම්භණ්ඩ පොතකො වා, කුම්භාණ්ඩ පෝතකයෙක් හෝ; කුම්භණ්ඩ පොතිකා වා, කුම්භාණ්ඩ පෝතිකාවක් හෝ; කුම්භණ්ඩ මහාමත්තො වා, කුම්භාණ්ඩ මහ ඇමතියෙක් හෝ; කුම්භණ්ඩ පාරිසජ්ජො වා, කුම්භාණ්ඩ පිරිසෙහි වූවෙක් හෝ; කුම්භණ්ඩ පචාරො වා, කුම්භාණ්ඩ මෙහෙකරුවෙක් හෝ;

33. නාගො වා, නාගයෙක් හෝ; නාගිනී වා, නැයිනියක් හෝ; නාග පොතකො වා, නාග පෝතකයෙක් හෝ; නාග පොතිකා වා, නාග පෝතිකාවක් හෝ; නාග මහාමත්තො වා, නාග මහ ඇමතියෙක් හෝ; නාග පාරිසජ්ජො වා, නාග පිරිසෙහි වූවෙක් හෝ; නාග පචාරො වා, නාග මෙහෙකරුවෙක් හෝ; මොවුන් අතුරෙන් කිසිවෙක්; පදුට්ඨ චිත්තො, ප්‍රදුෂ්‍ය වූ සිත් ඇති ව;

34. ගච්ඡන්තං වා අනුගච්ඡෙය්‍ය, යන්නාහු අනුව යන්නේ වේ ද; ඨිතං වා උපතිට්ඨෙය්‍ය, සිටියාහු සමීපයෙහි සිටින්නේ වේ ද; නිසින්නං වා උපනිසීදෙය්‍ය, හිඳිනහු සමීපව හිඳින්නේ වේ ද; නිපන්නං වා උපනිපජ්ජෙය්‍ය, සැතපෙන්නහු සමීපයෙහි සැතපෙන්නේ හෝ වේ ද; මාරිස, නිදුකාණන් වහන්ස; මෙ, මාගේ; සො අමනුස්සො, ඒ අමනුෂ්‍ය තෙම; ගාමෙසු වා, ගම්හි හෝ; නිගමෙසු වා, නියම්ගම්හි හෝ; සක්කාරං වා, සත්කාරයන් හෝ; ගරුකාරංවා, ගරු කිරීමක් හෝ; න ලභෙය්‍ය, නො ලබන්නේ ය.

මාරිස, නිදුකාණන් වහන්ස; මෙ, මාගේ; සො අමනුස්සො, ඒ අමනුෂ්‍ය තෙම; ආලකමන්දාය නාම රාජධානියා, ආලකමන්දා නම් වූ නුවරෙහි; වත්ථුං වා, ගෘහ වස්තුවක් හෝ; වාසං වා, එහි වාසයක් හෝ; න ලභෙය්‍ය, නො ලබන්නේ ය.

මාරිස, නිදුකාණන් වහන්ස; මෙ, මාගේ; සො අමනුස්සො, ඒ අමනුෂ්‍ය තෙම; යක්ඛානං සමිතිං, යක්ෂ සමාගමයට; ගන්තුං, යන්නට; න ලභෙය්‍ය, නො ලබන්නේ ය.

මාරිස, නිදුකාණන් වහන්ස; අපිස්සු, තව ද; නං, ඔහු; අමනුස්සා, අමනුෂ්‍යයෝ; අනවය්හම්පි කරෙය්‍යුං, ආවාහයට ද යෝග්‍ය නො කෙරෙති; අවිවය්හම්පි, විවාහයට ද යොග්‍ය නො කෙරෙති.

මාරිස, නිදුකාණන් වහන්ස; අපිස්සු, තව ද; නං, ඔහුට; අමනුස්සා, අමනුෂ්‍යයෝ; අත්තාහිපි, ආත්ම සම්බන්ධ වූ; පරිපුණ්ණාහි, සම්පූර්ණ වූ; පරිභාසාහි, පරිභව වචනයෙන්; පරිභාසෙය්‍යුං, නින්දා කොට බණන්නාහ;

මාරිස, නිදුකාණන් වහන්ස; අපිස්සු, තව ද; නං, ඔහු; අමනුස්සා, අමනුෂ්‍යයෝ; සීසෙ, ඔහු ගේ හිසෙහි; රිත්තම්පි පත්තං, හිස් වූ ලෝහ පාත්‍රයක් ද; නික්කුජ්ජෙය්‍යුං, නමන්නාහ;

මාරිස, නිදුකාණන් වහන්ස; අපිස්සු, තව ද; නං, ඔහු; අමනුස්සා, අමනුෂ්‍යයෝ; අස්ස, ඔහු ගේ; මුද්ධං අපි, මුදුන ද; සත්තධා, සත්කඩක් කොට; ඵාලෙය්‍යුං, පළන්නාහ.

35. මාරිස. නිදුකාණන් වහන්ස; චණ්ඩා, චණ්ඩ වූ; රුද්දා, රෞද්‍ර වූ; රභසා, වේගවත් වූ; අමනුස්සා, අමනුෂ්‍යයෝ; සන්තිහි, ඇත්තාහු ම ය; තෙ, ඒ අමනුෂ්‍යයෝ; මහා රජානං, සතරවරම් මහරජදරුවන් ගේ වචනය; නෙව ආදියන්ති, නො ගනිත් ම ය; මහා රාජානං, ඒ වරම් මහ රජදරුවන් ගේ; පුරිසකානං, අමාත්‍ය වූ අටවිසි යක් සෙනෙවියන් ගේ වචනය; න ආදියන්ති, නො ගනිති; මහා රාජානං, සතර වරම් මහ රජදරුවන් ගේ; පුරිසකානං, යක් සෙනෙවියන් සම්බන්ධි වූ; පුරිසකානං, නියුක්ත පුරුෂයන් ගේ වචනය ද; න ආදියන්ති, නො පිළිගනිති; මාරිස, නිදුකාණන් වහන්ස; තෙ බො තෙ අමනුස්සා, ඒ මේ අමනුෂ්‍යයෝ වූ කලි; මහා රජානං, සතර වරම් මහ රජදරුවන් ගේ; අවරුද්ධා නාම වුච්චන්ති, පසමිතුරෝ යයි කියනු ලැබෙත්.

36. මාරිස, නිදුකාණන් වහන්ස; මාගධස්ස රඤ්ඤො, මගධෙශ්වර වූ බිම්සර රජහු ගේ; විජිතා, විජිතයෙහි; චොරා, සොරු වෙත් ද; තෙ, ඒ සොරු; මාගධස්ස, මගධෙශ්වර වූ; රඤ්ඤො, බිම්සර රජහු ගේ වචනය; නෙව ආදියන්ති, නො පිළිගනිත්; මාගධස්ස රඤ්ඤො, මගධ රජහු ගේ; පුරිසකානං, අමාත්‍යයන් ගේ වචනය ද; න ආදියන්ති, නො පිළිගනිත්; මාගධස්ස රඤ්ඤො, මගධ රජහු ගේ; පුරිසකානං, අමාත්‍යයන් සම්බන්ධ; පුරිසකානං, නියුක්ත පුරුෂයන් ගේ වචනය ද; නා ආදියන්ති, නො පිළිගනිත්; මාරිස, නිදුකාණන් වහන්ස; තෙ බො තෙ මහාචොරා, ඒ මේ මහසොරු වනාහි; මාගධස්ස රඤ්ඤො, මගධෙශ්වර වූ බිම්සර මහරජහු ගේ; අවරුද්ධා නාම වුච්චන්ති, සතුරෝ යයි කියනු ලැබෙත්.

37. මාරිස, නිදුකාණන් වහන්ස; එවමෙව බො, එපරිද්දෙන් ම; චණ්ඩා, චණ්ඩ වූ; රුද්දා, රෞද්‍ර වූ; රභසා, වේගවත් වූ; අමනුස්සා, අමනුෂ්‍යයෝ; සන්තිහි, ඇත්තාහුම ය; තෙ, ඒ අමනුෂ්‍යයෝ; මහා රාජානං, සතරවරම් මහා රජදරුවන් ගේ වචනය; න ආදියන්ති, නො ගනිති; මහා රාජානං, වරම් රජදරුවන් ගේ; පුරිසකානං, යක්ෂ සේනාධිපතියන් ගේ වචනය; න ආදියන්ති, නො ගනිති; මහා රාජානං, වරම් රජදරුවන් ගේ; පුරිසකානං, සේනාධිපතියන් සම්බන්ධ වූ; පුරිසකානං, පුරුෂයන් ගේ වචනය; න ආදියන්ති, නො පිළිගනිති; මාරිස, නිදුකාණන් වහන්ස; තෙ බො තෙ අමනුස්සා, ඒ මේ අමනුෂ්‍යයෝ වනාහි; මහා රාජානං, වරම් රජදරුවන් ගේ; අවරුද්ධා නාම වුච්චන්ති, සතුරෝ යයි කියනු ලැබෙත්.

38. මාරිස, නිදුකාණන් වහන්ස; යොහි කොචි අමනුස්සො, යම්කිසි අමනුෂ්‍යයෙක් තෙමේ; යක්ඛො වා, යකෙක් හෝ; යක්ඛිණිංවා, යකින්නක් හෝ; යක්ඛ පොතකො වා, යක් පැටියෙක් හෝ; යක්ඛ පොතිකා වා, යක් පෝතිකාවක් හෝ; යක්ඛ මහා මත්තො වා, යක් මහ ඇමතියෙක් හෝ; යක්ඛ පාරිසජ්ජො වා, යක්ෂ පිරිසෙහි වූවෙක් හෝ; යක්ඛ පවාරො වා, යක් මෙහෙකරුවෙක් හෝ; ගන්ධබ්බො වා, ගඳඹෙක් හෝ; ගන්ධබ්බී වා, ගන්ධබ්බියක් හෝ; ගන්ධබ්බ පොතකො වා, ගඳඹ පැටියෙක් හෝ; ගන්ධබ්බ පොතිකා වා, ගඳඹ පෝතිකාවක් හෝ; ගන්ධබ්බ මහාමත්තො වා, ගඳඹ මහ ඇමතියෙක් හෝ; ගන්ධබ්බ පාරිසජ්ජො වා, ගඳඹ පිරිසෙහි වූවෙක් හෝ; ගන්ධබ්බ පවාරො වා, ගඳඹ මෙහෙකරුවෙක් හෝ;

39. කුම්භණ්ඩො වා, කුම්භාණ්ඩයෙක් හෝ; කුම්භණ්ඩීවා, කුම්භාණ්ඩ ස්ත්‍රියක් හෝ; කුම්භණ්ඩ පොතකො වා, කුම්භාණ්ඩ පෝතකයෙක් හෝ; කුම්භණ්ඩ පොතිකාවා, කුම්භාණ්ඩ පෝතිකාවක් හෝ; කුම්භණ්ඩ මහාමත්තො වා, කුම්භාණ්ඩ මහ ඇමතියෙක් හෝ; කුම්භණ්ඩ පාරිසජ්ජො වා, කුම්භාණ්ඩ පිරිසෙහි වූවෙක් හෝ; කුම්භණ්ඩ පවාරො වා, කුම්භාණ්ඩ මෙහෙකරුවෙක් හෝ;

40. නාගො වා, නාගයෙක් හෝ; නාගිනි වා, නාගිනියක් හෝ; නාග පොතකො වා, නාග පෝතකයෙක් හෝ; නාග පොතිකා වා, නාග පෝතිකාවක් හෝ; නාග මහාමත්තො වා, නාග මහ

Non-Commercial Distribution

ඇමතියෙක් හෝ; නාග පාරිසජ්ජො වා, නාග පිරිසෙහි වූවෙක් හෝ; නාග පවාරො වා, නාග මෙහෙකරුවෙක් හෝ;

41. පදුට්ඨ චිත්තො, ප්‍රදුෂ්‍ය වූ සිත් ඇත්තේ; භික්ඛුං වා, භික්ෂුවක් හෝ; භික්ෂුණිංවා, භික්ෂුණියක් හෝ උපාසකං වා, උපාසකයෙකු හෝ; උපාසිකං වා, උපාසිකාවක හෝ; ගච්ඡන්තං වා, යන්නහු; අනුගච්ඡෙය්‍ය, අනුව යන්නේ හෝ වේ ද; ඨිතං වා උපතිට්ඨය්‍ය, සිටියහු සමීපව සිටින්නේ හෝ වේ ද; නිසින්නං වා, උපනිසීදෙය්‍ය, හුන්නහු සමීපව හුන්නේ හෝ වේ ද; නිපන්නං වා උපනිපජ්ජෙය්‍ය, සැතපෙන්නහු සමීපව සැතපෙන්නේ හෝ වේ ද;

42. මහා යක්ඛානං, මහා යක්ෂ වූ ද; සෙනාපතීනං, යක්‍ෂ සේනාවට අධිපති වූ ද; මහා සෙනාපතීනං, එහෙයින් ම මහා යක්ෂ සේනාවට අධිපති වූ ද; ඉමෙසං යක්ඛානං, මේ යක්ෂයන්ට; උජ්ඣාපෙතබ්බං, දැන්විය යුතු යි; වික්කන්දිතබ්බං, අඬගා කිය යුතු යි; විරවිතබ්බං, මුරගා කිය යුතු යි; (කෙසේ ද)

43. අයං යක්ඛො, මේ යක්ෂ තෙමේ; ගණ්හාති, මා අල්වාගනි යි; අයං යක්ඛො, මේ යක්ෂ තෙමේ; ආවිසති, මට ආවේශ වෙයි; අයං යක්ඛො, මේ යක්ෂ තෙමේ; හෙඨෙති, මට පීඩා කරයි; අයං යක්ඛො, මේ යක්ෂ තෙමේ; විහෙඨෙති, තදින් මට පීඩා කෙරෙයි; අයං යක්ඛො, මේ යක්ෂ තෙමේ; හිංසති, මට හිංසා කෙරෙයි; අයං යක්ඛො, මේ යක්ෂ තෙමේ; විහිංසති, තදින් ම මට හිංසා කෙරෙයි; අයං යක්ඛො, මේ යක්ෂ තෙමේ; න මුඤ්චති ඉති, මා අත් නො හරියි කියායි;

44. කතමෙසං යක්ඛානං, කවර යක්ෂ කෙනකුන්ට; මහා යක්ඛානං, කවර මහා යක්ෂ කෙනකුන්ට; සෙනාපතිනං, කවර යක්ෂ සේනාපතියන්ට; මහා සෙනාපතීනං, කවර මහා යක්ෂ සෙනෙවියන්ට අඬගා කිය යුත්තේ ද?

ඉන්දො, ඉන්ද්‍රය; සොමො, සෝම ය; වරුණො ච, වරුණ ය; භාරද්වාජො, භාරද්වාජ ය; පජාපති, ප්‍රජාපති ය; චන්‍දනො, චන්‍දන ය; කාමසෙට්ඨො ච, කාමසෙට්ඨ ය; කින්නුඝණ්ඩු, කින්නුඝණ්ඩු ය; නිඝණ්ඩු, නිඝණ්ඩු ය; පණාදො, පණාද ය; ඔපමඤ්ඤො ච, ඔපමඤ්ඤ ය; දෙවසුතො ච, දේවසූත ය; මාතලි, මාතලී ය; චිත්තසෙනො ච, චිත්‍රසේන ය; ගන්ධබ්බො, ගන්ධබ්බ ය; නලො, නල ය; රාජා, රාජ ය; ජනෙසභො, ජනසභ ය; සාතාගිරො, සාතාගිර ය; හෙමවතො, හේමවත ය; පුණ්ණකො, පුණ්ණක ය; කරතියො, කරති ය; ගුලො, ගුල ය; සීවකො, සීවක ය; මුචලින්දො ච, මුචලින්ද ය; වෙස්සාමිත්තො, වෙස්සාමිත්ත ය; යුගන්ධරො, යුගන්ධර ය; ගොපාලො, ගෝපාල ය; සුප්පගෙධො ච, සුප්පගේධ ය; හිරි, හිරි ය; නෙත්ති ච, නෙත්ති ය; මන්දියො, මන්දිය ය; පඤ්චාලචණ්ඩො, පඤ්චාලචණ්ඩ ය; ආලවකො, ආලවක ය; පජ්ජුන්නො, පජ්ජුන්න ය; සුමනො, සුමන ය; සුමුඛො, සුමුඛ ය; දධිමුඛො, දධිමුඛ ය; මණිමාණිවරො, මණිමාණිවර ය; දීඝො, දීඝ ය; අථො, තව ද; සහ, මොවුන් සමග වූ; සෙරිස්සකො, සේරිස්සක ය - යන මොව්හු යි.

45. මහා යක්ඛානං, මහා යක්ෂ වූ; සෙනාපතිනං, යක්ෂ සේනාවට අධිපති වූ; මහා සෙනාපතීනං, මහා සේනාවට අධිපති වූ; ඉමෙසං යක්ඛානං, මේ යක්ෂයන්ට; උජ්ඣාපෙතබ්බං, දැන්විය යුතු යි; වික්කන්දි තබ්බං, අඬගා කිය යුතු යි; විරවිතබ්බං, මුරගා කිය යුතු යි (කෙසේ ද)

අයං යක්ඛො, මේ යක්ෂ තෙමේ; ගණ්හාති, මා අල්වාගනියි; අයං යක්ඛො, මේ යක්ෂ තෙමේ; ආවිසති, මට ආවේශ වෙයි; අයං යක්ඛො, මේ යක්ෂ තෙමේ; හෙඨෙති, මට පීඩා කෙරෙයි; අයං

Non-Commercial Distribution

යක්ඛො, මේ යක්ෂ තෙමේ; විහෙඨෙති, මට තදින් පීඩා කෙරෙයි; අයං යක්ඛො, මේ යක්ෂ තෙමේ; හිංසති, මට හිංසා කෙරෙයි; අයං යක්ඛො, මේ යක්ෂ තෙමේ; විහිංසති, මට තදින් හිංසා කෙරෙයි; අයං යක්ඛො, මේ යක්ෂ තෙමේ; න මුඤ්චති ඉති, මා අත් නො හරියි. (කියායි);

46. මාරිස, නිදුකාණන් වහන්ස; අයං ඛො සො ආටානාටියා රක්ඛා, ඒ මේ ආටානාටිය ආරක්ෂාව (පිරිත) වනාහි; භික්ඛූනං, භික්ෂූන් ගේ ද; භික්ඛුණීනං, භික්ෂුණීන්ගේ ද; උපාසකානං, උපාසකවරුන්ගේ ද; උපාසිකානං, උපාසිකාවරුන් ගේ ද; ගුත්තියා, සංවරණය පිණිස; ආරක්ඛාය, ආරක්ෂාව පිණිස; අවිහිංසාය, වෙහෙස නොවන පිණිස; ඵාසුවිහාරාය ඉති, පහසු විහරණය පිණිස පවතී (යනුයි).

47. මාරිස, නිදුකාණන් වහන්ස; මයං, අපි; බහු කිච්චා, බොහෝ කෘත්‍ය ඇත්තම්හ; බහුකරණීයා, බොහෝ කටයුතු ඇත්තම්හ; හන්ද, එබැවින්; ඉදානි, දැන්; මයං, අපි; ගච්ඡාමාති, යම්හයි කියා බුදුරදුන්ට සැළ කළහ; මහා රාජානො, වරම් මහ රජදරුවනි; තුම්හෙ, තෙපි; ඉදානි. දැන්; යස්ස, යම් ගමනක් සිතව් ද ඒ ගමනට; කාලං මඤ්ඤථ ඉති, කල් දනුව යි වදාළ සේක.

අථ ඛො, ඉක්බිති; චත්තාරො මහාරාජා, සතරවරම් මහ රජදරුවෝ; උට්ඨායාසනා, හුනස්නෙන් නැගිට; භගවන්තං, භාග්‍යවතුන් වහන්සේට; අභිවාදෙත්වා, නමස්කාර කොට; පදක්ඛිණං කත්වා, පැදකුණු කොට; තත්‍ථෙවන්තරධායිංසු, එතැන්හි ම අතුරුදන් වූහ.

48. තෙපි ඛො යක්ඛා, ඒ යක්ෂයෝ ද; උට්ඨායාසනා, හුනස්නෙන් නැගී; අප්පෙකච්චෙ, සමහර යක්ෂ කෙනෙක්; භගවන්තං, භාග්‍යවතුන් වහන්සේ; අභිවාදෙත්වා, සකසා වැඳ; පදක්ඛිණං කත්වා, පැදකුණු කොට; තත්‍ථෙවන්තරධායිංසු, එහි ම අතුරුදන් වූහ; අප්පෙකච්චෙ, ඇතැම් යක්ෂ කෙනෙක්; භගවතා සද්ධිං, භාග්‍යවතුන් වහන්සේ සමග; සම්මොදිංසු, සතුටු වූහ; සම්මොදනීයං, සතුටුවිය යුතු වූ; සාරාණීයං, සිහි කටයුතු වූ; කථං විතිසාරෙත්වා, කථාවන් කොට නිමවා; තත්‍ථෙවන්තරධායිංසු, එහි ම අතුරුදන් වූහ; අප්පකච්චෙ, සමහර යක්ෂ කෙනෙක්; භගවා, භාග්‍යවතුන් වහන්සේ; යෙන, යම් තැනෙක් හි ද; තෙන, එතැන්හි; අඤ්ජලිං පණාමෙත්වා, ඇඳිලි බැඳ; තත්‍ථෙවන්තරධායිංසු, එහි ම අතුරුදන් වූහ; අප්පෙකච්චෙ, සමහර යක්ෂ කෙනෙක්; නාමගොත්තං, නම්ගොත්; සාවෙත්වා, විචාරා; තත්‍ථෙව, එහි ම; අන්තරධායිංසු, අතුරුදන් වූහ; අප්පෙකච්චෙ, ඇතැම් යක්ෂ කෙනෙක්; තුණ්හීභූතා, නිශ්ශබ්ද වූහු; තත්‍ථෙව, එහි ම; අන්තරධායිංසු ඉති, අතුරුදහන් වූහු ය.

**තතියක භාණවාරං. - තුන්වන බණවර යි.**

## ආටානාටිය සුත්තං. - ආටානාටිය සූත්‍රය.

**(දුතියක භාණවාරං - දෙවන බණවර)**

1. අථ ඛො, ඉක්බිති; භගවා, භාග්‍යවතුන් වහන්සේ; තස්සා රත්තියා අච්චයෙන, ඒ රාත්‍රිය ගේ ඇවෑමෙන්; භික්ඛු, භික්ෂූන්; ආමන්තෙසි, ඇමතු සේක; භික්ඛවෙ, මහණෙනි; ඉමංරත්තිං, මේ ඉකුත් රැයෙහි; චත්තාරො මහා රාජා, සතරවරම් රජ දරුවෝ; මහතියා ච යක්ඛ සෙනාය, මහත් වූ යක්ෂ සේනාවකින් ද; මහතියා ච ගන්ධබ්බ සෙනාය, මහත් ගන්ධර්ව සේනාවකින් ද; මහතියා ච කුම්භණ්ඩ සෙනාය, මහත් වූ කුම්භාණ්ඩ සේනාවකින් ද; මහතියා ච නාග සෙනාය, මහත් වූ නාග සේනාවකින් ද; චතුද්දිසං රක්ඛං ඨපෙත්වා, සිවුදිග සක්දෙවිඳු හට ආරක්ෂා පිහිටුවා; චතුද්දිසං ගුම්බං ඨපෙත්වා, සිවුදිග මහත් බල සෙනඟ තබා; චතුද්දිසං, සිවුදිග; ඕවරණං ඨපෙත්වා, සේනාව

Non-Commercial Distribution

තරකොට සිටුවා; අභික්කන්තාය රත්තියා, පෙරයම් රය ඉක්මුණු කල්හි; අභික්කන්තවණ්ණා, අතිශයින් මනෝඥ වූ වර්ණ ඇත්තා හු; කෙවලකප්පං ගිජ්ඣකූටං, සියලු ගිජුකුළු පවුව; ඔභාසෙත්වා, ඒකාලෝක කොට බබුලුවා; යෙනාහං, මම යම් තැනෙක් හි වාසය කෙරෙම් ද; තෙන, එතැන්හි; උපසංකමිංසු, එළඹියාහු ය; උපසංකමිත්වා, එළැඹ; මං අභිවාදෙත්වා, මා වැඳ; එකමන්තං නිසිදිංසු; එකත් පසෙක්හි හුන්නාහු ය.

2. භික්ඛවෙ, මහණෙනි; තෙපි බො යක්ඛා, වෙසවුණු මහ රජුන් සමග පැමිණි ඒ යක්ෂයෝ ද; අප්පෙකච්චෙ, සමහර කෙනෙක්; මං අභිවාදෙත්වා, මට නමස්කාර කොට; එකමන්තං, එකත්පසෙක; නිසිදිංසු, හුන්නාහු ය; අප්පෙකච්චෙ, ඇතැම් කෙනෙක්; මම සද්ධිං, මා සමග; සම්මොදිංසු, සතුටු වූවාහු ය; සම්මොදනීයං, සතුටු විය යුතු වූ; සාරාණීයං, සිහිකටයුතු වූ; කථං, කථාවන්; වීතිසාරෙත්වා, කොට නිමවා; එකමන්තං, නිසිදිංසු; ඒකත්පසෙක හුන්නාහුය; අප්පෙකච්චෙ, සමහර කෙනෙක්; අහං, මම; යෙන, යම් තැනෙක්හි ද; තෙන, එතැන්හි; අඤ්ජලිං පණාමෙත්වා, ඇදිලි බැඳ නමස්කාර කොට; එකමන්තං, එකත්පසෙක; නිසිදිංසු, හුන්නාහු ය; අප්පෙකච්චෙ, සමහර කෙනෙක්; නාම ගොත්තං සාවෙත්වා. නම්ගොත් අස්වා; එකමන්තං, එකත්පසෙක; නිසිදිංසු, හුන්නාහු ය; අප්පෙකච්චෙ, ඇතැම් කෙනෙක්; තුණ්හී භූතා, නිශ්ශබ්ද වූහු; එකමන්තං, එකත්පසෙක; නිසිදිංසු, හුන්නාහු ය; භික්ඛවෙ, මහණෙනි; එකමන්තං, එකත්පසෙක; නිසින්නො බො, හුන්නාවූ ද; වෙස්සවණො මහාරාජා, වෙසවුණු මහරජ තෙමේ; මං, මට; එතදවොච, මෙය දැන්වීය;

3. භන්තෙ, ස්වාමීනි; භගවතො, භාග්‍යවතුන් වහන්සේට; අප්පසන්නා, අප්‍රසන්න වූ; උළාරා යක්ඛා, මහේශාක්‍ය යක්ෂයෝ; සන්තිහි, ඇත්තාහු ම ය; භන්තෙ, ස්වාමීනි; භගවතො, භාග්‍යවතුන් වහන්සේට; පසන්නා, ප්‍රසන්න වූ; උළාරා යක්ඛා, මහේශාක්‍ය යක්ෂයෝ; සන්තිහි, ඇත්තාහු ම ය; භන්තෙ, ස්වාමීනි; භගවතො, භාග්‍යවතුන් වහන්සේට; අප්පසන්නා, අප්‍රසන්න වූ; මජ්ඣිමා යක්ඛා, මධ්‍යම ආනුභාව ඇති යක්ෂයෝ; සන්තිහි, ඇත්තාහු ම ය; භන්තෙ, ස්වාමීනි; භගවතො, භාග්‍යවතුන් වහන්සේට; පසන්නා, ප්‍රසන්න වූ; මජ්ඣිමා යක්ඛා, මධ්‍යම ආනුභාව ඇති යක්ෂයෝ; සන්තිහි, ඇත්තාහු ම ය; භන්තෙ, ස්වාමීනි; භගවතො, භාග්‍යවතුන් වහන්සේට; අප්පසන්නා, අප්‍රසන්න වූ; නීචා යක්ඛා, අල්පේශාක්‍ය යක්ෂයෝ; සන්තිහි, ඇත්තාහු ම ය; භන්තෙ, ස්වාමීනි; භගවතො, භාග්‍යවතුන් වහන්සේට; පසන්නා, ප්‍රසන්න වූ; නීචා යක්ඛා, අල්පේශාක්‍ය යක්ෂයෝ; සන්තිහි, ඇත්තාහු ම ය.

4. භන්තෙ, ස්වාමීනි; යක්ඛා, යක්ෂයෝ; යෙභුය්‍යෙන බො පන, බොහෝසේ ම වනාහි; භගවතො, භාග්‍යවතුන් වහන්සේ හට; අප්පසන්නා යෙව, අප්‍රසන්නයෝ ම ය; තං කිස්ස හෙතු?; ඊට හේතු කවරේ ද?; භන්තෙ, ස්වාමීනි; භගවාහි, භාග්‍යවතුන් වහන්සේ වනාහි; පාණාතිපාතා, ප්‍රාණඝාතයෙන්; වෙරමණියා, වෙන්වීම පිණිස; ධම්මං, ධර්මය; දෙසෙති, දේශනා කරන සේක; අදින්නාදානා, අදත්තා දානයෙන්; වෙරමණියා, වැළක්ම පිණිස; ධම්මං දෙසෙති; ධර්මය දේශනා කරන සේක; කාමෙසුමිච්ඡාචාරා, කාමයන්හි වරදවා හැසිරීමෙන්; වෙරමණියා, වැළකීම පිණිස; ධම්මං දෙසෙති; ධර්මය දේශනා කරන සේක; මුසාවාදා වෙරමණියා, මුසාවාදයෙන් වැළකීම පිණිස; ධම්මං දෙසෙති, ධර්මය දේශනා කරන සේක; සුරාමෙරය මජ්ජපමාදට්ඨානා, මදයට හා ප්‍රමාදයට හේතු වූ රහමෙර පානයෙන්; වෙරමණියා, වැළක්ම පිණිස; ධම්මං දෙසෙති; ධර්මය දේශනා කරන සේක.

5. භන්තෙ, ස්වාමීන් වහන්ස; යක්ඛා, යක්ෂයෝ; යෙභුය්‍යෙන බො පන, බොහෝ සෙයින් වනාහි; පාණාතිපාතා, ප්‍රාණඝාතයෙන්; අප්පටිවිරතා යෙව, නො වැළැක්කාහු ම ය; අදින්නාදානා, අදත්තාදානයෙන්; අප්පටිවිරතා, නො වැළැක්කාහු ය; කාමෙසුමිච්ඡාචාරා, කාමෙසුමිථ්‍යාචාරයෙන්;

අප්පටිවිරතා, නො වැළැක්කාහු ය; මුසාවාදා, මුසාවාදයෙන්; අප්පටිවිරතා, නො වැළැක්කාහු ය; සුරාමෙරය මජ්ජපමාදට්ඨානා, මදයට හා ප්‍රමාදයට හේතු වූ රහමෙර පානයෙන්; අප්පටිවිරතා, නො වැළැක්කාහුය; තෙසං, ඒ යක්ෂයන්ට; තං, ඔබ වහන්සේ ගේ ඒ ධර්ම දේශනාව; අප්පියංහොති, අප්‍රිය වෙයි: අමනාපං, අමනොඥ වෙයි.

6. භන්තෙ, ස්වාමීනි; භගවතො, භාග්‍යවතුන් වහන්සේ ගේ; සාවකා, ශ්‍රාවකයෝ; සන්තිහි, ඇත්තාහු ම ය; අරඤ්ඤෙ; ආරණ්‍යයෙහි; වනපත්ථානි, වනයට ඇතුළත් වූ ද; පත්ථානි, මනුෂ්‍ය වාසයෙන් ඉතා දුර වූ ද; අප්ප සද්දානි, මනුෂ්‍යයන් ගේ බොහෝ ශබ්ද නැත්තා වූ; අප්ප නිග්ඝොසානි, බොහෝ ඝෝෂා නැත්තා වූ; විජනවාතානි, මනුෂ්‍යයන් ගෙන් උපදනා වාතයන් නැත්තා වූ; මනුස්සරාහසෙය්‍යකානි, මනුෂ්‍යයන් ගේ රහස් කටයුතු වලට යෝග්‍ය වූ; පටිසල්ලාන සාරුප්පාන, සිත එකඟකර ගැනීමට සුදුසු වූ; සෙනාසනානි, සේනාසනයන්; පටිසෙවන්ති, සේවනය කෙරෙත්;

තත්‍ථ, ඒ අරණ්‍යයෙහි; නිවාසිනො, නිබඳ වාසය කරන්නා වූ; උළාරා යක්ඛා, ආනුභාව සම්පන්න යක්ෂයෝ; සන්තිහි, ඇත්තාහුම ය; යො, යම් යක්ෂ කෙනෙක්; භගවතො, භාග්‍යවත්හු ගේ; ඉමස්මිං පාවචනෙ, මේ ත්‍රිපිටක බුද්ධ වචනයෙහි; අප්පසන්නා, නො පැහැදුනාහු ද; තෙසං, ඔවුන් ගේ; ප්‍රසාදාය, පැහැදීම ඇති කරවනු පිණිස ය.

7. භන්තෙ, ස්වාමීනි; භගවා, භාග්‍යවතුන් වහන්සේ; භික්ඛූනං, භික්ෂූන් ගේ ද; භික්ඛුණීනං, භික්ෂුණීන් ගේ ද; උපාසකානං, උපාසකයන් ගේ ද; උපාසිකානං, උපාසිකාවන් ගේ ද; ගුත්තියා, උවදුරු වැළැක්ම පිණිස ද; රක්ඛාය, ආරක්ෂාව පිණිස ද; අවිහිංසාය, හිංසා නොවන පිණිස ද; ඵාසු විහාරාය, සැප විහරණය පිණිස ද; ආටානාටියං රක්ඛං, ආටානාටිය ආරක්ෂා පිරිත; උග්ගණ්හාතු ඉති, ඉගෙන වදාරණ සේක්වා;

8. භික්ඛවෙ, මහණෙනි; අහං බො, මම වනාහි; තුණ්හීභාවෙන, තුෂ්ණීම්භාවයෙන්; අධිවාසෙසිං, ඉවසුයෙමි; භික්ඛවෙ, මහණෙනි; අථ බො, ඉක්බිති; වෙස්සවණො මහාරාජා, වෙසවුණු මහරජ තෙමේ; මං අධිවාසනං, මගේ ඉවසීම; විදිත්වා, දැන; තායං වෙලායං, ඒ වේලාවෙහි; ඉමං ආටානාටියං රක්ඛං, මේ ආටානාටිය ආරක්ෂා පිරිත; අභාසි, කීයේ ය.

ඇතැම් කෙනෙක්; අහං, මම; යෙන, යම් තැනෙක් හි වෙම් ද; තෙන, එතැන; අඤ්ජලිං පණාමෙත්වා, ඇඳිලි බැඳ නමස්කාර කොට;

**(9. අංකයේ විපස්සිස්ස නමත්ථු - සිට 56 වැනි අංකයේ, භන්ද දානි මයං මාරිස යන කොටස තෙක් මුල් කොටසේ දී පදගතාර්ථ සම්පූර්ණව දක්වා ඇත. එය බලන්න.)**

57. භික්ඛවෙ, මහණෙනි; අථ බො, ඉක්බිති; චත්තාරො මහාරාජා, සතරවරම් මහ රජදරුවෝ; උට්ඨායාසනා, හුනස්නෙන් නැගී; මං, මට; අභිවාදෙත්වා, අභිවාදනය කොට; පදක්ඛිණං කත්වා, පැදකුණු කොට; තත්‍ථෙව, එහි ම; අන්තරධායිංසු, ඇතුරුදන් වූවාහු ය.

58. භික්ඛවෙ, මහණෙනි; තෙපි බො යක්ඛා, ඒ යක්ෂයෝ ද; උට්ඨායාසනා, හුන් තැනින් නැගී සිටියාහු; අප්පෙකච්චෙ, ඇතැම් කෙනෙක්; මං අභිවාදෙත්වා, මට වැඳ; පදක්ඛිණං කත්වා, පැදකුණු කොට; තත්‍ථෙවන්තරධායිංසු, එහි ම අතුරුදන් වූහ; අප්පෙකච්චෙ, ඇතැම් කෙනෙක්; මම සද්ධිං, මා සමග; සම්මොදිංසු, සතුටු වූහ; සම්මොදනීයං, සතුටුවිය යුතු; සාරාණියං, සිහි කටයුතු; කථං, කථා; විතිසාරෙත්වා, කොට නිමවා; තත්ථෙව, එහි ම; අන්තරධායිංසු, අතුරුදන් වූහ; අප්පෙකච්චෙ, ඇතැම් කෙනෙක්; අහං, මම; යෙන, යම් තැනෙක් හි වෙම් ද; තෙන, එතැන; අඤ්ජලිං පණාමෙත්වා, ඇඳිලි බැඳ නමස්කාර කොට; තත්ථෙව, එහි ම; අන්තරධායිංසු, අතුරුදන් වූහ;

Non-Commercial Distribution

අප්පෙකච්චෙ, ඇතැම් කෙනෙක්; නාමගොත්තං, නම්ගොත්; සාවෙත්වා, අස්වා; තපොව, එහි ම; අන්තරධායිංසු, අතුරුදන් වූහ; අප්පෙකච්චෙ, ඇතැම් කෙනෙක්; තුණ්හීභූතා, තුෂ්ණීම්භූත වූවාහු; තපොව, එහි ම; අන්තරධායිංසු, අතුරුදන් වූහ.

59. භික්ඛවෙ, මහණෙනි; ආටානාටියං රක්ඛං, ආටානාටිය ආරක්ෂා පිරිත; උග්ගණ්හාථ, පදව්‍යඤ්ජන, නො පිරිහෙලා උගනිව්; භික්ඛවෙ, මහණෙනි; ආටානාටියං රක්ඛං, ආටානාටිය ආරක්ෂාව; (පිරිත) පරියාපුණාථ, නිරන්තරයෙන් පුහුණු කරව්; භික්ඛවෙ, මහණෙනි; ආටානාටියං රක්ඛං, ආටානාටිය ආරක්ෂාව; ධාරෙථ, සිත්හි ලා දරව්; භික්ඛවෙ, මහණෙනි; ආටානාටියං රක්ඛං, ආටානාටිය ආරක්ෂාව; අත්ථසංහිතාය, මෙලෝ පරලෝ දෙක්හි අර්ථසිද්ධිය පිණිස සමත් හෙයින් අර්ථවත් ය; භික්ඛූනං, භික්ෂූන්ට ද; භික්ඛුණීනං, භික්ෂුණීයන්ට ද; උපාසකානං, උපාසකයන්ට ද; උපාසිකානං, උපාසිකාවන්ට ද; ගුත්තියා, උවදුරු දුරලීම පිණිස ද; රක්ඛාය, ආරක්ෂා පිණිස ද; අවිහිංසාය, අවිහිංසා ආදී පීඩා නොවන පිණිස ද; ඵාසු විහාරාය ඉති, සැපසේ විසීම පිණිස ද වන්නේ යැ'යි;

60. භගවා, භාග්‍යවතුන් වහන්සේ; ඉදමවොච, වරම් රජදරුවන් විසින් පළමුවෙන් කී හෙයින්; දේවභාෂිත වූ මේ සූත්‍රය දෙවෙනිවර ශ්‍රී මුඛයෙන් දේශනා කොට වදාළ සේක.

අත්තමනා තෙ භික්ඛූ, සතුටු සිත් ඇති ඒ භික්ෂූහු; භගවතො, භාග්‍යවතුන් වහන්සේ ගේ; භාසිතං, වචනයට; අභිනන්දුන්ති, විශේෂයෙන් සතුටු වූවා හු ය.

ආටානාටිය සුත්තං නිට්ඨිතං - ආටානාටිය සූත්‍රය නිමියේ ය.

චතුත්ථ භාණවරං නිට්ඨිතං - සතරවන බණවර කියා නිමවන ලදී.

* * *

Non-Commercial Distribution

# සිංහල අනුවාදය

## ඒ භාග්‍යවත් අර්හත් සම්මා සම්බුද්ධරජාණන් වහන්සේට නමස්කාර වේවා.!

## සරණ ගමනය

තථාගතයන් වහන්සේ බරණැස් නුවර මිගදාය නම් වූ ඉසිපතනාරාමයෙහි වැඩ වෙසෙන සමයෙහි ආයුෂ්මත් යස ස්ථවිරයන් වහන්සේ හා රහතුන්වහන්සේලා ලොව පහළ වී මහා ජනයාට හිත වැඩ පිණිස දහම් දෙසන කල්හි සසුනෙහි පැවිද්ද හා උපසම්පදාව දෙනු පිණිස තිසරණය දෙසූ සේක.

**මහාවග්ගයෙහි එය මෙසේ දැක්වෙයි :**

"මහණෙනි මෙසේ පැවිදි කළ යුතුයි. මෙසේ උපසපන් කළ යුතුයි. පළමුකොට කෙස් රවුළු ඉවත් කරවා කසාවත් හඳවා උතුරු සළුව සකස් කොට පෙරවා වැඩි මහලු මහණුන් පා වන්දවා උක්කුටුකයෙන් හිඳුවා ඇඳිලි බන්දවා මෙසේ තිසරණය සමාදන් කරවිය යුතුයි."

දෙවියෝ ද මිනිස්සු ද උපාසක බැවින් හා පැවිදි බැවින් සසුනට බැසගන්නා හෙයින් මෙය ඛුද්දකපාඨයෙන් ගෙන මෙහි මුලට යොදන ලදී.

බුදු රදුන් සරණ යෙමි. බුදුරදුන් පිහිට යයි දැන ගණිමි.
දහම් සරණ යෙමි. දහම් පිහිට යයි දැන ගණිමි.
සඟුන් සරණ යෙමි. සඟුන් පිහිට යයි දැන ගණිමි.

දෙවනුව ද බුදු රදුන් සරණ යෙමි.
දෙවනුව ද දහම් සරණ යෙමි.
දෙවනුව ද සඟුන් සරණ යෙමි.

තෙවනුව ද බුදු රදුන් සරණ යෙමි.
තෙවනුව ද දහම් සරණ යෙමි.
තෙවනුව ද සඟුන් සරණ යෙමි.

## දස ශික්ෂා පද

රාහුල කුමාරයන් පැවිදි කොට කිඹුල්වත් පුරයෙන් නික්ම සැවැත් නුවරට පැමිණ දෙව්රම් වෙහෙර වැඩ වෙසෙන බුදුරජාණන් වහන්සේ මහණුන්ට ශික්ෂාපද නියම කොට ව්‍යවස්ථා කරනු සඳහා දස ශික්ෂා පද වදාළ සේක.

සාමණේරවරුනට ශික්ෂා පද කෙතෙක් ද? කෙබඳු ශික්ෂා පදයන්හි අප හික්මවිය යුතු ද? යන අදහස ඇති විය. මේ නිසා ඒ අවස්ථාවේ හෙරණුන් ගේ හික්මීම සඳහා මේ දස ශික්ෂා පද පනවමි යි වදාළ සේක.

Non-Commercial Distribution

ප්‍රාණඝාතයෙන් වැළැක්ම වූ ශික්ෂාපදය සමාදන් වෙමි.
අදත්තාදානයෙන් වැළැක්ම වූ ශික්ෂාපදය සමාදන් වෙමි.
අබ්‍රහ්මචර්‍ය්‍යාවෙන් වැළැක්ම වූ ශික්ෂාපදය සමාදන් වෙමි.
බොරු කීමෙන් වැළැක්ම වූ ශික්ෂාපදය සමාදන් වෙමි.
මදයටත් ප්‍රමාදයටත් හේතු වූ රහමෙර බීමෙන් වැළැක්ම වූ ශික්ෂාපදය සමාදන් වෙමි.
විකල් බොජුනෙන් වැළැක්ම වූ ශික්ෂාපදය සමාදන් වෙමි.
නටනු ගයනු වයනු විසුළු දස්නෙන් වැළැක්ම වූ ශික්ෂාපදය සමාදන් වෙමි.
අඩුතැන් පිරවීමටත් සැරසීමටත් කරුණු වූ මල් ගඳ විලවුන් දැරීමෙන් වැළැක්ම වූ ශික්ෂාපදය සමාදන් වෙමි.
උසසුන් මහ අස්නෙන් වැළැක්ම වූ ශික්ෂාපදය සමාදන් වෙමි.
රන් රිදී මසු කහවණු පිළිගැන්මෙන් වැළැක්ම වූ ශික්ෂාපදය සමාදන් වෙමි.

## සාමණේර ප්‍රශ්නය

තථාගතයන් වහන්සේට සෝපාක නම් මහ සව්වෙක් වූයේ ය. හේ උපන් සත් අවුරුද්දෙන් ම ප්‍රඥා බහුල ය. රහත්වීමේ උපනිශ්‍රය සහිත ය. බුදුරජාණන් වහන්සේ උන්වහන්සේ ගෙන් මේ ප්‍රශ්න දහය ඇසූහ. මේ ප්‍රශ්න විසඳා ලූ හෙයින් උපසම්පදාවට අවසර දුන්හ. මේ කුමාර ප්‍රශ්න නමිනුදු ප්‍රසිද්ධ ය.

| | |
|---|---|
| **එක නම් කිම?** | සියලු සත්වයෝ අහරින් සිටින්නෝ ය. |
| **දෙක නම් කිම?** | නාම රූප දෙක ය. |
| **තුන නම් කිම?** | සුඛ, දුක්ඛ, උපෙක්ෂා යන තුන් වේදනාවෝ ය. |
| **සතර නම් කිම?** | දුඃඛ, සමුදය, නිරොධ, මාර්ග යන සතර ආර්‍ය්‍ය සත්‍යයෝ ය. |
| **පස නම් කිම?** | රූප, වේදනා, සංඥා, සංස්කාර, විඥාන යන උපාදානස්කන්ධ පස ය. |
| **සය නම් කිම?** | චක්ඛු, සොත, ඝාණ, ජිව්හා, කාය, මන යන කාමයන් කෙරෙහි වූ ආයතන සය ය. |
| **සත නම් කිම?** | සති, ධම්මවිචය, පීති, විරිය, පස්සද්ධි, සමාධි, උපෙක්ෂා යන බොජ්ඣංග සත ය. |
| **අට නම් කිම?** | සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව, සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි යන ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගය ය. |
| **නමය නම් කිම?** | නානත්තකායා, නානත්ත සඤ්ඤිය, නානත්තකායා එකත්ත සඤ්ඤිය, එකත්තකායා නානත්ත සඤ්ඤිය, එකත්තකාය, එකත්ත සඤ්ඤිය,අසඤ්ඤිය,ආකාසානඤ්චායතනූපගය, විඤ්ඤානඤ්චායතනූපගය,ආකිඤ්ඤානුයතනූපගය, නෙවසඤ්ඤානාසඤ්ඤායතනූපගය යන සත්වාවාස නව ය. |

**දසය නම් කිම?** අසෙඛ සම්මා දිට්ඨිය, අසෙඛ සම්මා සංකප්ප, අසෙඛ සම්මා වාචා ය, අසෙඛ සම්මා කම්මන්ත ය, අසෙඛ සම්මා ආජීව ය, අසෙඛ සම්මා වායාම ය, අසෙඛ සම්මා සති ය, අසෙඛ සම්මා සමාධි ය, අසෙඛ සම්මා ඤාන ය, අසෙඛ සම්මා විමුක්තිය යන අංග දසයෙන් යුත් වූයේ රහත් තෙමේ යයි කියනු ලැබේ.

## දෙතිස් ආකාරය

සෝපාක සාමණේරයන් වහන්සේ යම්බඳු නුවණකින් ඒ ප්‍රශ්න විසඳූ සේක් ද; එයට පදස්ථාන වූ යම් සමාධියක් වේ ද, එය උපදවා ගැනීමට සුදුසු බුද්ධෝත්පාද කාලයක මුත් ඉන් පෙර නො පැවැති තීර්ථකයනට විෂය නො වූ බුදුරජාණන් වහන්සේ නන් අයුරින් පසස්නා ලද කායගතා සති භාවනාව ඇතුළත් ද්වත්තිංසාකාර කර්මස්ථානය සාමණේර ප්‍රශ්නයට අනතුරුව දක්වන ලදි.

**එය මහා සති පට්ඨාන සූත්‍රයේ මෙසේ දැක්වෙයි :**

"මහණෙනි, භික්ෂූනට; "කායගතා සතිය කෙසේ වඩයි ද, පත්ලෙන් උඩ හිස්මුදුනෙන් යට තමන් ගේ බඹයක් පමණ වූ මේ ශරීරයේ හැම කොටසක ම හැම තැනෙක ම සැළකිල්ලෙන් පරීක්ෂා කර බලන යෝගාවචරයා හට මුතු හෝ මැණික් හෝ පබළු හෝ වෛදූර්‍ය්‍ය හෝ නො පෙනෙයි. සඳුන් අගිල් කොකුම් කපුරු සුවඳ සුණු ආදී ස්වල්පමාත්‍ර වූ ද සුවඳ වර්ගයක් නො පෙනෙයි. හුදෙක් අතිශයින් දුගඳ වූ පිළිකුල් වූ දැකුම් ඇති කෙස් ලොම් ආදී නානා ප්‍රකාර අශුචියක් ම පෙනෙයි - යනු සලකා නුවණින් භාවනා කොට අමාමහ නිවණ පසක් කරනු සඳහා ය."

මේ සිරුරෙහි - කෙස් ය, ලොම් ය, නිය ය, දත් ය, සම ය, මස් ය, නහර ය, ඇට ය, ඇට මිදුලු ය, වකුගඩු ය, හදවත ය, අක්මාව ය, දලබුව ය, බඩදිව ය, පපුමස ය, අතුනු වැටිය ය, අතුනුබහන් ය, උදරි ය, (උදරයෙහි නො පැසුණු අහර ආදිය) ය, වසුරු ය. පිත ය, සෙම ය, පූයා ය, ලේ ය, ඩහදිය ය, හැසුණු (මිදීගිය) තෙල් ය, කඳුළු ය, වුරුණු (දියව ගිය) තෙල් ය, කෙළ ය, මුකුණු (සොටු) ය, සඳ මිදුලු ය, මූත්‍ර ය, හිස්කබල තුළ පිහිටි මිදුලු රැස ය යන කුණප කොටස් කෙතෙක් ඇත්තා හ.

## ප්‍රත්‍යවේක්ෂා

දෙතිස් කුණප කොටස් විසින් අසාර වූ ආත්මභාවය යම් ප්‍රත්‍යයක් නිසා පවතී ද, ඒ ප්‍රත්‍යයන් සිහිනුවණින් යෙදී ලෝභාදී පාපධර්මයන් නො වැඩෙන ලෙස පරිභෝග කළ යුතු ආකාරය දක්වනු සඳහා ප්‍රත්‍යවේක්ෂා ධර්ම ක්‍රමය ඇතුළත් කරන ලදී.

ප්‍රත්‍යවේක්ෂාව නම් තමන් ප්‍රයෝජන ගන්නා සිවුපසය ගැන නුවණින් වෙන් වෙන් ව බැලීම යි. එය දෙවැදෑරුම් ය. චීවර ආදිය ලබන කල ද, ප්‍රයෝජන ගන්නා කල ද ප්‍රත්‍යවේක්ෂා කළ යුතු ය.

නුවණින් ප්‍රත්‍යවේක්ෂා කොට ඒ ඒ ප්‍රයෝජන වෙන් වශයෙන් සලකා සිවුරු වැළඳ ගනිමි. යම්තාක් සීත නසනු පිණිස, උෂ්ණ නසනු පිණිස, ඩැහැ ලේ බොන ඇට මැසි ය, විද ලේ බොන මදුරු ය, සුළඟ ය, අවුව ය, සර්පාදි දීර්ඝ ජාතිය යන මොවුන් පිළිබඳ ස්පර්ශයන් නසනු පිණිස, ලජ්ජා ස්ථාන වසා ගන්නා පිණිස සිවුරු වැළඳ ගනිමි.

නුවණින් පරීක්ෂා කොට ඒ ඒ ප්‍රයෝජන වෙන් වශයෙන් සලකා පිඬු වළඳමි. ගම් දරුවන් සේ ක්‍රීඩා සඳහා බල මද පුරුෂ මද වඩනා සඳහා අංග ප්‍රත්‍යංග ප්‍රීණනයෙන් අලංකාර කරනු පිණිස සිවි පැහැය වැඩි වීමෙන් සැදීම පිණිස නොවළඳමි. මේ ජීවිතයා ගේ පැවැත්ම පිණිස, යැපීම පිණිස, බඩගිනි වේදනා නසනු පිණිස, බඹසර සපයනු පිණිස මෙම ආහාර වළඳමි. මෙසේ වැළඳීමෙන් පැරණි වේදනා නසන්නෙමි. අළුත් වේදනා නූපදවමි. නුසුදුසු සෙවීම් දුරු කිරීමෙන් දැහැමින් සෙමින් උපන් බැවින් නිවරද බැව් ද පමණ දැන වැළඳීමෙන් කාය බල ලදින් යෙහෙන් විසීම ද වන්නේ ය යි සලකා මේ අහර වළඳමි.

නුවණින් සලකා ශීත නැසීම් ආදී ඒ ඒ ප්‍රයෝජන වෙන් වෙන් වශයෙන් සලකා මෙම සෙනසුන් වැළඳ ගනිමි. යම් තාක් ශීත පීඩා නසනු පිණිස, උෂ්ණ පීඩා නසනු පිණිස, ඩැහැ ලේ බොන මැස්සන් විද ලේ බොන මදුරුවන්, සුළඟ අවුව හා සර්පාදීන් යන මොවුන් ගේ දුක් පහස් නසනු පිණිස, හැමවිට ම ඍතු උපද්‍රව නසනු පිණිස සිත එකඟ කිරීමේ ඇලෙනු පිණිස සෙනසුන් වැළඳ ගනිමි.

ඒ ඒ ප්‍රයෝජන වෙන් වෙන් කොට සලකා ගිලන්පස බෙහෙත් වළඳිමි. හැම වේලෙහි ම/උපන් සිරුර පෙළෙන්නා වූ දුක් වේදනාවන් නසනු පිණිස නිරෝගී බැව් උතුම් බැවින් ගිලන්පස බෙහෙත් වළඳිමි.

ප්‍රත්‍යවේක්ෂාව නම් තමන් ප්‍රයෝජන ගන්නා සිවුපසය ගැන වෙන් වෙන් ව නුවණින් සලකා බැලීමයි. එය දෙවැදෑරුම් ය. සිවුපසය ලබන විටත් ප්‍රයෝජන ගන්නා විටත් ප්‍රත්‍යවේක්ෂා කළ යුතු යි.

## දස ධම්ම සූත්‍රය

මෙසේ ප්‍රත්‍යවේක්ෂා කොට ප්‍රත්‍යය පරිහරනය කරන භික්ෂු නම විසින් ධර්මය ප්‍රත්‍යවේක්ෂා කිරීම් වශයෙන් ත්‍රිවිධ ශික්ෂාව පුරා නිවන්පුර පිරවිය යුතු යයි දක්වන්නට දසධම්ම සූත්‍රය ඇතුළත් කරන ලදී. ඒ සූත්‍රයේ භික්ෂූන් වහන්සේ ගේ අභ්‍යන්තර හා බාහිර ආකල්ප දැක්වෙයි.

මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි වූ ජේතනම් කුමාරයා ගේ උයනෙහි කරවන ලද අනේපිඬු සිටුහු ගේ ආරාමයෙහි වැඩ වසන සේක. එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ මහණෙනි යි භික්ෂූන්ට ආමන්ත්‍රණය කළ සේක. භික්ෂූහු එසේ ය වහන්සැ යි උන්වහන්සේට පිළිවදන් දුන්හ.

භාග්‍යවතුන් වහන්සේ මෙම සූත්‍රය වදාළ සේක.

මහණෙනි, මෙම දශ ධර්මයෝ ගිහිගෙය හැර පැවදි වූවහු විසින් එක්වන් නුවණින් සැලකිය යුත්තාහු ය.

Non-Commercial Distribution

1. මම විවර්ණ භාවයට පැමිණියෙමි යි පැවිද්දා විසින් නිතර මෙනෙහි කළ යුතු යි.
2. මාගේ දිවි පැවැත්ම අනුන් අයත්යැයි පැවිද්දා විසින් නිතර මෙනෙහි කළ යුතු යි.
3. මා විසින් අන්‍ය වූ ආකල්පයක් කටයුතු යැයි පැවිද්දා විසින් නිතර මෙනෙහි කළ යුතු යි.
4. කිමෙක් ද? මා ගේ සිත සීලයෙන් උපවාද නො ලබාදැයි පැවිද්දා විසින් නිතර මෙනෙහි කළ යුතු යි.
5. කිමෙක් ද? නුවණැති සබ්‍රම්සරුන් වහන්සේලා මා ගැන සීලයෙන් පරිභව නො කෙරෙත් දැ යි පැවිද්දහු විසින් නිතර මෙනෙහි කළ යුතු යි.
6. ප්‍රිය වූ මන වඩන්නා වූ සියල්ලෙන් නොහොත් හැමදෙනා කෙරෙන් මාගේ නානාභාවය මරණයෙන් විනාභාවය හෙවත් වෙනස්වීම හා වෙන්වීම වේ ය යි පැවිද්දා විසින් නිතර මෙනෙහි කළ යුතු යි.
7. මම කර්මය අයත් කොට ඇත්තෙක් වෙමි. කර්මය දායාදකොට ඇත්තෙක් වෙමි. කර්මය ම යෝනි කොට ඇත්තෙක් වෙමි. කර්මය පිළිසරණ කොට ඇත්තෙක් වෙමි. යහපත් වූ හෝ අයහපත් වූ යම් කර්මයක් කෙරෙම් ද, එයට හිමිවෙමි යි පැවිද්දා විසින් නිතර මෙනෙහි කළ යුතු යි.
8. කෙසේ වූ මට රෑ දාවල් දෙක ඉක්මේ දෝ හෝ යි පැවිද්දා විසින් නිතර මෙනෙහි කළ යුතු යි.
9. කිමෙක් ද? මම සූන්‍යාගාරයෙක්හි හෙවත් මහජනයා ගෙන් හිස් වූ පෙදෙසක සියලු ඉරියව්වෙහි හුදෙකලාව ඇලෙම් දෝ හෝ යි පැවිද්දා විසින් නිතර මෙනෙහි කළ යුතු යි.
10. මා සතන්හි උතුරු මිනිස් දම්ගුණ ඇත් ද, මා විසින් ආයර්‍යභාවයට සුදුසු ඥාන දර්ශන විශේෂයක් ලබන ලද දැ යි මා මරණ මඤ්චකයෙහි හොත් කල්හි සබ්‍රම්සරුන් විසින් විචාරණ ලද්දෙම් තේජස් රහිත නො වෙම් දැ යි පැවිද්දා විසින් නිතර මෙනෙහි කළ යුතු යි.

මහණෙනි, මේ දශධර්මයෝ ගිහිගෙය හැර මහණ වූවහු විසින් එක්වන්ව සැලකිය යුත්තා හ. භාග්‍යවතුන් වහන්සේ මේ දේශනාව මෙසේ වදාළ සේක. සතුටු සිත් ඇති ඒ භික්ෂූන් වහන්සේලා භාග්‍යවතුන් වහන්සේ ගේ ධර්ම දේශනාව අසා විශේෂයෙන් සතුටු වූ හ.

## මහා මංගල සූත්‍රය

දෙවියන් සහිත ලෝකයෙහි ඒ ඒ කාලවල පස් වැදෑරුම් කෝලාහලයක් ඇති වන බව දැක්වේ. මංගල යනු කුමක් දැ යි විමසීම නිසා ඇතිවන කෝලාහලය මංගල කෝලාහලය යි. ලෝක විනාශයේ දී ඇතිවන කලබැගෑනිය කල්ප කෝලාහලය යි. සක්විති රජකු පහළ වන බව කියන ආන්දෝලනය සක්විති කෝලාහලය යි. බුදුවරයකු පහළ වන බව කියන උද්ඝෝෂණය බුද්ධ කෝලාහලය යි.

Non-Commercial Distribution

එකල දඹදිව සමූහ වශයෙන් රැස් වී රාමායනා දී විවිධ බාහිර කථා බොහෝ ධන වියදම් කොට ප්‍රීතියෙන් ඔද වැඩී සිතැතිව අසන්නාහ. ඇතැම්විට ඒ කථාවක් නිම කිරීමට සිවුමසක් වුවත් ගතවේ.

මේ කාලයේ මිනිසුන් අතර මංගල නම් කුමක් දැ යි පැන නැගුණු කථාවකි. එහි දී එකෙක් ඇසින් දුටු දැකුම්කළු දෙය මංගලය යි ද තවෙකෙක් කණින් ඇසූ දෙය ප්‍රිය ජනක නම් මංගල යැ යි ද තවෙකෙක් නැහැයට දැනෙන සුවඳ දිවට දැනෙන සුමිහිරි රස කයට දැනෙන සුව දායක පහස මංගලය යි ද කීයේ ය.

මෙසේ ඔවුනොවුනතර පැන නැගුණු විවාදය බලවත් විය. පසිඳුරන්ට හමුවන රූප ශබ්ද ගන්ධ රස ස්පර්ෂ යන විෂයයන් ප්‍රියවන්නාක් මෙන් ම අප්‍රිය ද විය හැකි යි. එසේ ඇති කල කුමක් මංගලය යි නිශ්වය කටහැකි දැ යි විවිධ විතර්ක ඇතිවිය.

මෙසේ මිනිස් ලොව ඇති වූ වාදය අනුක්‍රමයෙන් දෙව්ලොව දක්වා ද එතැනින් බඹලොව දක්වා ද පැතිරෙන්නට විය. මෙයින් මිනිස්සු ද දෙව්බඹහු ද දෙ කොටසක් වූහ. මංගල සිතුවිල්ලෙන් වෙහෙසට පත් වූහ. මෙසේ තීරණයකට බැසගත නොහී දොළොස් වසරක් ම ඉක්ම ගියේ ය.

මේ අවස්ථාවේ තව්තිසා වැසි දෙව් පිරිසක් එක්සත්ව මේ මංගල ප්‍රශ්නය විසඳා ගැනීම පිණිස බුදුරදුන් කරා එළඹ මංගල නම් කුමක් දැ යි විචාළ කල්හි මංගල සූත්‍රය දෙසූ සේක.

මේ සූත්‍රයේ අන්තර්ගත කාරණා අට තිසෙන් දෙ තිසක් ලෞකික ජීවිතයට සම්බන්ධ ය. සයක් ලෝකෝත්තර ජීවිතයට සම්බන්ධ ය. මංගල යන්නෙහි තේරුම උභය ලොකාර්ථ සංසිද්ධිය යි. දෙලොව ම අභිවෘද්ධිය යි.

මා විසින් මෙසේ අසන ලද. එක් සමයෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර නිසා ජේතවන නම් වූ අනේපිඬු මහ සිටුහු ගේ අරම්හි වැඩ වසන සේක. එකල්හි එක්තරා දෙවියෙක් රෑ (පෙරයම) ඉක්ම ගිය කල්හි විශිෂ්ට ශරීර සෝභා ඇත්තේ සියලු ජේතවනය ස්වකීය ශරීර ශෝභායෙන් බබුලුවා භාග්‍යවතුන් වහන්සේ යම් තැනක ද එතැනට එළඹියේ ය. එළැඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත් පසෙක සිටියේ ය.

එකත් පසෙක සිටි ඒ දෙවිතෙම භාග්‍යවතුන් වහන්සේට ගාථායෙන් මෙසේ කීයේ ය:

1. මෙලොව පරලොව දෙක්හි සැප කැමැති වන බොහෝ දෙවියෝ ද මිනිස්සු ද දෙලෝ වැඩ සලසන මංගල කාරණයන් ගැන සිතූහ. භාග්‍යවතුන් වහන්සේ වැඩ සලසන මඟුල් වදාළ මැනැවි.

2. බාලයන් ඇසුරු නො කිරීම ද, පණ්ඩිතයන් ඇසුරු කිරීම ද, පිදිය යුත්තන් පිදීම ද මේ එක එකක් උතුම් මඟුල් ය.

3. සුදුසු පෙදෙස්හි විසීම ද, පෙර කළ පින් ඇති බව ද, සිය අත් බව මනා දහම්හි පිහිටුවීම ද උතුම් මඟුල් ය.

4. බොහෝ ඇසූපිරූ තැන් ඇති බව ද, සිප්හි අත්හුරු බව ද, මොනවට හික්මුණු තුන්දොර ඇති බව ද මොනවට කියන ලද වචනය ද උතුම් මඟුල් ය.

Non-Commercial Distribution

5. මවුපිය උවැටන ද, අඹුදරුවනට සංග්‍රහ ය ද, නිරවුල් කර්මාන්තය ද උතුම් මඟුල් ය.
6. දානය ද, දස කුසල් දහම්හි හැසිරීම ද නෑයන්ට සංග්‍රහය ද, පෙහෙවස් විසීම් ආදි නිවැරැදි කර්ම ද උතුම් මඟුල් ය.
7. මානසික අකුශලයෙන් වැළැක්ම ද කායික වාචසික අකුශලයෙන් වැලක්ම ද මත්පැනින් වැළැක්ම ද, කුසල් දහම් වැඩීමෙහි නො පමා බව ද උතුම් මඟුල් ය.
8. ගරු කටයුත්තන්ට ගරු කිරීම ද, නිහතමාන බව ද, ලද දෙයින් සතුටුවන බවද, කෙළෙහිගුණ දන්නා බව ද, සුදුසු කල්හි බණ ඇසීම ද උතුම් මඟුල් ය.
9. ඉවසීම ද, සුවච බව ද, ශ්‍රමණයන් දැක්ම ද, සුදුසු කල්හි ධර්ම සාකච්ඡාව ද උතුම් මඟුල් ය.
10. තපස ද, බඹසර ද, චතුරාර්‍ය්‍ය සත්‍යයන් දැකීම ද, නිවන් පසක් කිරීම ද උතුම් මඟුල් ය.
11. අටලෝ දහමින් මඩනා ලද සත්වයකු ගේ සිත නොසැලේ ද, ශෝක රහිත ද, රාගාදී රජස් රහිත ද, කාමයෝගාදීන් ගෙන් නිරුපද්‍රැත ද, එබඳු රහත් හු ගේ සිතෙහි ඒ නො සැලෙන බව ආදිය උතුම් මඟුල් ය.
12. යම් කෙනෙක් බාලයන් ඇසුරු නො කිරීම් ආදී මංගල කාරණයන් කිරීමෙන් හැම තන්හි නො පැරදුනෝ ව සියලු ඉරියව්වෙහි ස්වස්ථව වෙසෙත් ද එය උතුම් මඟුල් නම් වෙයි.

## රතන සූත්‍රය

මංගල සූත්‍රයෙන් ආත්මාරක්ෂාව සලස්වා ගැනීමෙන් අනතුරුව රතන සූත්‍රයෙන් පරාරක්ෂාව හා අමනුෂ්‍යාදීන් ගෙන් වන උවදුරු වලක්වා ගැනීම පිණිස එම සූත්‍රය ඊළඟට යොදන ලදි.

අතීතයේ විශාලා මහනුවර මහා දුර්භික්ෂයක් ඇති විය. ආහාර දුර්ලභත්වයෙන් මිනිස්සු මැරෙන්නට වූහ. මළ සිරුරු නුවරින් බැහැර කළහ. මිනී කුණු ගඳින් අමනුෂ්‍යයෝ නුවරට ඇතුල් වූහ. ඒ නිසා තව තවත් මැරෙන්නට වූහ. ඒ හේතුකොට ගෙන අහිවාතක නම් දරුණු රෝගයක් ඇතිවිය. මෙසේ දුර්භික්ෂ. අමනුෂ්‍ය හා රෝග යන ත්‍රිවිධ භීතියෙන් උපද්‍රැත වූ විශාලා මහනුවර වැසියෝ මෙ පවත් රජවරුනට දැන්වූහ. රජවරු ජනතාව සන්ථාගාර ශාලාවට රැස්කර වූහ. රජුන් අත වරදක් ඇත් දැ යි විමසූහ. තමන් අත වරදක් නැතැ යි වැසියෝ පිළිවදන් දුන්හ.

දීර්ඝ සාකච්ඡාවකින් පසුව තථාගතයන් වහන්සේ මේ නුවරට වැඩමවා ගතහොත් සියලු උවදුරු දුරුවේ යයි තීරණයට බැස ගත්හ. බිම්බිසාර රජු ගේ කැමැත්ත ඇතිව ලිච්ඡවි රජවරු දෙදෙනෙක් බුදුන් වහන්සේ කරා එළඹ ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, ත්‍රිවිධ භීතියකින් උපද්‍රැත වූ අප රට වැසියන් ගේ නිදුක් නිරෝගී බැව් උදෙසා භාග්‍යවතුන් වහන්සේ අප නුවරට වැඩමවන සේක් නම් අපට යහපතක් වේ යයි දන්වා සිටිය හ.

Non-Commercial Distribution

තථාගතයන් වහන්සේ ආරාධනාව පිළිගෙන රුවන් සූත්‍රරෙහි අණ තෙදින් කෙළ ලක්ෂයක් සක්වළ ආරක්ෂාව සිදුවේය යි ද, එයින් මහත් පිරිසකට ධර්මාවබෝධය වේය යි ද සලකා පන් සියයක් භික්ෂූන් වහන්සේ සමග විශාලා මහා නුවරට වැඩමවා රුවන් පිරිත දෙසූහ. ඒ සමග ම සිවු දිගින් කළුකොට නැඟුණු මහා මේඝයෙන් මළ කඳන් ඉල්පී ගංගා නම් ගඟට පාවී ගියේ ය. නගරය පවිත්‍ර විය. පන්සියයක් පමණ වූ බුදු පාමොක් මහ සඟන විසල් මහ නුවරට පිවිසෙත් ම සක් දෙවිඳු ඈ මහානුභාව සම්පන්න දෙවිවරු පැමිණියාහු ය. ඔවුන් ගේ පැමිණීම සමගම අමනුෂ්‍යයෝ ක්‍රමයෙන් ඉවත් වී ගියාහු ය.

තථාගතයන් වහන්සේ රතන සූත්‍රය වදාරා නුවර දොරටුව අබියස වැඩ සිට අනඳ හිමියන් අමතා ආනන්දය, මේ රතන සූත්‍රය ඉගෙන පූජා ද්‍රව්‍ය ද ගෙන්වා ගෙන ලිච්ඡවි කුමරුන් සමග විශාලා මහ නුවර තුන් පවුරු වටා හැසිරෙමින් පිරිත් දෙසව යි වදාළ සේක.

අනඳ හිමියෝ ද බුදුරජාණන් වහන්සේ ගේ පාත්‍රයට පිරිත් පැන් ගෙන රතන සූත්‍රය දෙසමින් මුළු නුවරට පිරිත් පැන් ඉස්සාහ. සියලු අමනුෂ්‍යයෝ පලා ගියහ. නගරය ආරක්ෂා සහිත විය. උවදුර දුරු විය. මනුෂ්‍යයෝ සුඛිත මුදිත වූහ. සුවාසූ දහසක් ප්‍රාණීන්ට ධර්මාභිසමය විය. බුදුන් වහන්සේ දෙවන දවස්හි ද රතන සූත්‍රය වදාළහ. ඒ සමග ම සුවාසූ දහසක් ප්‍රාණීහු ධර්මාවබෝධය ලදහ. මෙසේ පිළිවෙළින් සත් දිනක් රතන සූත්‍රය දෙසූහ.

1. පොළොවෙහි වූ හෝ අහසෙහි වූ හෝ යම් අමනුෂ්‍ය කෙනෙක් මෙහි රැස්වූහු ද, ඒ සියලු අමනුෂ්‍යයෝ ම සතුටු සිතැත්තෝ වෙත්වා. තවද මගේ වචනය සකසා අසත්වා.

2. භූතයිනි, එබැවින් තෙපි සියල්ලෝ මාගේ වචනය අසවු, මනුෂ්‍ය ප්‍රජාවට මෛත්‍රිය කරවු. යම් කෙනෙක් දහවල් ද රෑ ද පුද පඬුරු එළවත් ද, එහෙයින් නොපමාව ම ඔවුන් රකිවු.

3. මේ මිනිස් ලොව හෝ නා ලෝ ආදී අන් ලොවෙක හෝ යම් ධනයක් වේ ද, දෙව්ලොව හෝ මහඟු රුවනක් වේ ද, ඔවුන් අතුරෙහි තථාගතයන් හා සදෘශයෙක් නැත්තේ ම ය. මේ කරුණින් ද බුදුරජහු උතුම් රුවනෙකි. මේ සත්‍ය බලයෙන් සෙත් වේවා.

4. ශාක්‍යමුනි තෙම එකඟ වූ සිත් ඇත්තේ, කෙලෙස් නැසීමට නිමිති වූ රාගයෙන් වෙන් වීමට නිමිති වූ මරණයක් නැති උතුම් වූ යම් නිවනක් පසක් කෙළේ ද, ඒ දහම හා සම වූ කිසිවෙක් නැත්තේ ය. මේ කරුණින් ද නිවන් දහම උතුම් රුවනෙකි. මේ සත්‍යානුභාවයෙන් සෙත් වේවා.

5. බුද්ධ ශ්‍රේෂ්ඨ තෙම අත්‍යන්ත පරිශුද්ධ වූ යම් මාර්ග සමාධියක් වර්ණනා කෙළේ ද, බුද්ධාදීහු ආනන්තරික (අනතුරුව ම ඵල දෙන) සමාධිය යි යමකට කියත් ද, ඒ සමාධිය හා සමාන අන්‍ය සමාධියක් නැත. මේ කරුණින් ද ආර්ය මාර්ගය උතුම් රුවනෙකි. මේ සත්‍ය බලයෙන් සෙත් වේවා.

6. සත්පුරුෂයන් විසින් පසස්නා ලද යම් ආර්ය පුද්ගලයෝ අට දෙනෙක් වෙත් ද නොහොත් ප්‍රශස්ත වූ යම් එකසිය අටක් ආර්ය පුද්ගලයෝ වෙත් ද මොහු

Non-Commercial Distribution

හැමදෙන සතර යුග කෙනෙක් වෙති. සුගත් බුදුරජුන්ගේ සවු වූ ඔහු තුමූ දක්ෂිණාවට සුදුස්සෝ වෙති. මේ බුදු සව්වන් කෙරෙහි දෙන ලද දානයෝ මහත්ඵල ඇත්තෝ වෙත්. මේ කරුණින් ද බුද්ධ ශ්‍රාවක සංඝ තෙමේ උතුම් රුවනෙකි. මේ සත්‍ය බලයෙන් සෙත් වේවා.

7. ගෞතම බුද්ධ ශාසනයෙහි වූ සුවිශුද්ධ කායවාක් කර්ම සංඛ්‍යාත ශීලස්කන්ධයෙන් යුක්ත වූ ස්ථිර සිතින් යුක්ත වූ ප්‍රඥාව කරණ කොටගෙන සියලු කෙළෙසුන් ගෙන් නික්මුණා වූ යම් පුද්ගල කෙනෙක් වෙත් ද, ඔහු තුමූ නිවනට බැස ගෙන නො මිලයේම රහත්ඵල සමවත ලැබ ගෙන එය විඳින්නාහු වෙති. මේ කරුණින් ද ආර්‍ය්‍ය සංඝ තෙමේ උතුම් රුවනෙකි. මේ සත්‍ය බලයෙන් සෙත් වේවා.

8. යම් සේ පොළොව තුළ වැද ගෙන සිටි ඉන්ද්‍රඛීලය සිවු දිගින් හමන සුළඟින් සෙලවිය හැකි නො වේ ද, ආර්‍ය්‍ය සත්‍යයන් ප්‍රඥාවෙන් බැස ගෙන දක්නා පුරුෂයා (සෝවාන් පුද්ගලයා) එබන්දකු කොට කියමි. මේ කරුණින් ද ආර්‍ය්‍ය සංඝ තෙමේ උතුම් රුවනෙකි. මේ සත්‍ය බලයෙන් සෙත් වේවා.

9. යම් සෝවාන් පුද්ගල කෙනෙක් ගැඹුරු නුවණැති බුදුරදුන් දෙසූ ආර්‍ය්‍ය සත්‍යයන් තමනට ප්‍රකට කෙරෙත් ද, ඔහු බෙහෙවින් පමාවූවාහු නමුත් අටවන භවයක් නො ගනිති. මේ කරුණින් ද ආර්‍ය්‍ය සංඝ තෙමේ උතුම් රුවනෙකි. මේ සත්‍ය බලයෙන් සෙත් වේවා.

10. මේ සෝවාන් පුද්ගලයා ගේ දර්ශන සම්පත්තිය හෙවත් සෝවාන් මග නුවණ පහළවීම සමග ම සක්කාය දෘෂ්ටිය ද (බුද්ධාදී අට තන්හි) සැකය ද යම් මිත්‍ථ්‍යාශීල ව්‍රත කෙනෙක් වූහු නම් ඒ සියල්ල ද යන මේ තුන් සංයෝජනයෝ දුරුකරන ලද්දෝ වෙත්. හෙතෙම සතර අපායයන් කෙරෙන් මිදුනේ ද වේ. ආනන්තර්‍ය්‍ය කර්ම පසත් මිත්‍ථ්‍යාදෘෂ්ටියත් යන බැරෑරුම් පව් සය කරන්නට ද හේ අභව්‍ය ය. මේ කරුණින් ද ආර්‍ය්‍ය සංඝ තෙමේ උතුම් රුවනෙකි. මේ සත්‍ය බලයෙන් සෙත් වේවා.

11. ඒ සෝවාන් පුද්ගල තෙම කයින් හෝ වචනයෙන් හෝ නැතහොත් සිතින් හෝ ප්‍රඥප්ති මාත්‍ර වූ කිසි වරදක් කරන්නේ නමුදු හේ එය සඟවන්නට නො හැක්කේ ය. දක්නා ලද නිර්වාණ පදය ඇති සෝවාන් පුද්ගලයා ගේ (වරද සැඟවීමේ) අභව්‍ය බව බුදුරදුන් විසින් වදාරණ ලද්දේ ය. මේ කරුණින් ද ආර්‍ය්‍ය සංඝ තෙමේ උතුම් රුවනෙකි. මේ සත්‍ය බලයෙන් සෙත් වේවා.

12. වන ලැහැබ තෙමේ ග්‍රීෂ්ම ඍතුවේ පළමුවන මාසයෙහි හෙවත් බක් මස සුපිපි අක් ඇත්තේ යම්සේ ද, එසේ වූ නිවන්පුර පමුණුවන පර්‍ය්‍යාප්ති ධර්ම රත්නය පරමහිතාඛ්‍ය වූ නිවන් පිණිස ඒ බුදුරජ තෙමේ දෙසී. මේ කරුණින් ද බුදුරජ තෙමේ රුවනෙකි. මේ සත්‍ය බලයෙන් සෙත් වේවා.

13. උතුම් වූ නිවන් දන්නා වූ, උතුම් වූ නිවන දෙන්නා වූ, උතුම් නිවන් මග ගෙනහැර පාන්නා වූ, නිරුත්තර වූ බුදුරජාණන් වහන්සේ උතුම් වූ දහමක් දෙසූ සේක. මේ කරුණින් ද බුදුරජ තෙමේ උතුම් රුවනෙකි. මේ සත්‍ය බලයෙන් සෙත් වේවා.

Non-Commercial Distribution

14. යම් කෙනකුන් ගේ පුරාතන කර්ම රහත් මගින් ක්ෂීණ වූයේ ද, අළුත් කර්මයන් ගේ පහළ වීමෙකුත් නැද්ද, මතු භවයක් කෙරෙහි නො ඇළුණු සිතැති, ක්ෂීණ වූ ප්‍රතිසන්ධි විඥාන සංඛ්‍යාත බීජ ඇති, පුනර්භව සංඛ්‍යාත සංස්කාර වෘද්ධිය කෙරෙහි කැමැත්තක් නැති, ධෛර්‍යසම්පන්න වූ ඒ රහත්හු මේ පහන මෙන් අවසන් සිත නිරුද්ධ වීමෙන් පිරිනිවෙත්. මේ සත්‍ය බලයෙන් සෙත් වේවා.

15. පොළොවෙහි හෝ අහසෙහි වූ යම් අමනුෂ්‍ය කෙනෙක් මේ තන්හි රැස්වූහු ද, ඔහු ද, මම ද දෙව් මිනිසුන් විසින් පුදන ලද තථාගත බුදුරජාණන් වහන්සේ නමදිමු. සත්ව ප්‍රජාවට සෙත් වේවා.

16. පොළොවෙහි හෝ අහසෙහි වූ යම් අමනුෂ්‍ය කෙනෙක් මෙතන්හි රැස්වූහු ද, ඔහු ද, මම ද දෙව් මිනිසුන් විසින් පුදන ලද බුද්ධාදීන් විසින් අවබෝධ කරන ලද බැවින් තථාගත වූ ධර්මය නමදිමු. සත්වයාට සෙත් වේවා.

17. පොළොවෙහි හෝ අහසෙහි වූ යම් අමනුෂ්‍ය කෙනෙක් මේ තන්හි රැස්වූහු ද, ඔහු ද, මම ද දෙව් මිනිසුන් විසින් පුදන ලද තථාගත වූ සංඝයා නමදිමු. සත්වයාට සෙත් වේවා.

## කරණීය මෙත්ත සූත්‍රය

රතන සූත්‍රය සත්‍යක්‍රියා බලයෙන් අමනුෂ්‍යෝපද්‍රව දූරීභූත කිරීමට දේශිත ය. කරණීය මෙත්ත සූත්‍රය ද එසේ ම අමනුෂ්‍යයන් ගෙන් සිදුවන උවදුරු වැළැක්වීම සඳහා දේශිත ය. රතන සූත්‍රයට අනතුරු ව මේ සූත්‍රය ඇතුළත් කරන ලද්දේ එබැවිනි.

බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර දෙව්රම් වෙහෙර වැඩ වෙසෙන සමයෙහි සසර කිලකිරුණු පන්සියයක් භික්ෂූන් වහන්සේ බුදුන් වහන්සේ වෙතින් කමටහන් ගෙන හිමාලය වන පෙදෙසෙහි එක් වන ලැහැබක් ඇසුරු කොට වස් විසූහ. සිල්වත් භික්ෂූන් ගේ ගුණ තෙදින් වෘක්ෂ දේවතාවෝ තමන් ගේ දරුවන් ගෙන රුක් විමන්වලින් බැස ඔබ්මොබ හැසිරෙන්නට වූහ. ඒ දේවතාවෝ මේ භික්ෂූහු තෙ මසක් මෙහි වෙසෙති. එතෙක් අපට දරුවන් රැගෙන බිමට බැස විසිය නො හැකි ය. එහෙයින් භික්ෂූන්ට බිය උපදවන අරමුණු පෙන්වා බිය දනවන හඬ නගා තැති ගන්වමු යි සිතා නානාප්‍රකාර යක් රකුස් රූ මවා ඉදිරියෙහි සිටින්නට වූහ. භික්ෂූහු බිය වූහ. දුර්වර්ණ වූහ. සිරුරු පඬුපාට විය. සිත් එකඟ කළ නො හැකි විය. එහෙත් කිසිවෙක් කිසිවකුට එපවත් නො දැන්වී ය.

දිනක් භික්ෂූහු සංඝ ස්ථවිරයන් වහන්සේ හමුවූහ. භික්ෂූන් ගේ මැළවුණු සිරුරු දැක යම් උවදුරක් ඇද්දැ යි විචාළහ. එවිට උන්වහන්සේ සියලු පුවත් දැන් වූ හ.

සංඝ ස්ථවිර තෙමේ භික්ෂූන් අමතා ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ පෙරවස් විසීම පසුවස් විසීම යයි වස් එළඹීම් දෙකක් වදාරා ඇත. අපට මේ සෙනසුන සැප නො වේ නම් ඒ බව බුදුරදුනට දන්වා වෙන සැප සෙනසක් ලබාගනිමු යි සාකච්ඡා කළහ.

Non-Commercial Distribution

පසුව බුදුන් වහන්සේ කරා එළඹිය හ. ඒ තොරතුරු ද සැළ කළ හ. බුදුන් වහන්සේ ආවර්ජනා කොට බැලූ හ. මහණෙනි, තොපට මෙයට වඩා සුදුසු සෙනස්නක් නොමැත. තෙපි දෙවියන් ගෙන් නිර්භය බව කැමැති වන්නාහු නම් මේ පිරිත උගනිව්. මෙය තොපට පිරිතක් මෙන් ම කර්මස්ථානයක් ද වෙයි. මේ මෙත්ත සූත්‍රය මසකට අට වරක් බණ අසන දිනයන්හි සජ්ඣායනා කරව්. මෙය පදනම් කොට ධර්ම සාකච්ඡා පවත්වව්. ධර්ම දේශනා පවත්වව්. පසුව අනුමෝදනා කරව්. මෙය ම කර්මස්ථානයක් වශයෙන් වඩව්. භාවනාවක් මෙන් පුහුණු කරව්. එවිට අමනුෂ්‍යයනට බිය ගන්වනු නො හැකි වෙයි. දෙවියෝ හිතවත් කමක් ම දක්වති යයි වදාළ සේක.

1. යම් ඒ ශාන්තිපද සංඛ්‍යාත නිර්වාණයක් වේ ද, එයට පැමිණ නොහොත් එය අවබෝධ කොට වසනු කැමැති අභිවෘද්ධිය සලසා ගැනීමෙහි දක්ෂයා විසින් එයට සුදුසු දෙය කළ යුතු ය. නිවණට පැමිණ වසනු කැමැත්තේ සත්‍ය ප්‍රතිවේධය පිණිස පිළිපදින්නට නොහොත් කිසිණු පිරියම් කිරීම් වත් සමාදන්වීම් ආදී සියලු කාර්‍ය්‍යයන් කරන්නට දක්ෂයෙක් වන්නේ ය. ඍජු වන්නේ ය. මනාකොට ඍජු වන්නේ ය. අන්‍යයන් ගේ අවවාද මනා කොට පිළිගැනීම් වශයෙන් සුවච වන්නේ ය. මෘදු වන්නේ ය. අතිමාන ඇත්තේ නො වන්නේ ය.

2. ලද දෙයින් සතුටු වන්නෙක් ද, පහසුවෙන් පෝෂණය කළ හැක්කෙක් ද ස්වල්ප කටයුතු ඇත්තෙක් ද, සැහැල්ලු පැවතුම් ඇත්තෙක් ද, සන්හුන් ඉඳුරන් ඇත්තෙක් ද, ප්‍රඥා ඇත්තෙක් ද, හැඩි දැඩි අසංවර ගති නැත්තෙක් ද, කුලයන් කෙරෙහි නො ඇලුනෙක් ද වන්නේ ය.

3. නුවණැති අන්‍යයන් නින්දා කරන සුළු වරදක්වත් නො කරන්නේ ය. සියලු සත්‍වයෝ සැප ඇත්තෝ වෙත්වා, භය නැත්තෝ වෙත්වා, සුඛිත සිත් ඇත්තෝ වෙත්වා'යි ද,

4. තෘෂ්ණා භය සහිත හෙයින් තැති ගන්නා සුලුවූ ද, තෘෂ්ණා භය ප්‍රහීන කළ හෙයින් ස්ථාවර වූ ද, යම්කිසි සත්වයෝ ඇත්තාහු නම්, ඒ සියලු දෙනා ද දික් ශරීර ඇත්තෝ ද මහත් ශරීර ඇත්තෝ ද, මධ්‍යම ප්‍රමාණ ශරීර ඇත්තෝ ද, මිටි ශරීර ඇත්තෝ ද, ඉතා සියුම් ශරීර ඇත්තෝ ද, ස්ථූල ශරීර ඇත්තෝ ද

5. ඇස් හමුවට පැමිණීම් වශයෙන් දුටු සත්තු ද ඈත සිටි හෙයින් නුදුටු සත්තු ද, දුරත් ළඟත් වසන සත්තු ද, ඉපදීම අවසන් කළ සත්වයෝ ද, මතු ඉපදීම සොයන සත්වයෝ ද යන මේ සියලු සත්වයෝ සුඛිත සිත් ඇත්තෝ වෙත්වා යි ද මෙත් වඩන්නේ ය.

6. එකෙක් අනිකකු නො රවටන්නේ ය. අනෙකකුට අවමන් නො කරන්නේ ය. කය හා වචනය පිළිබඳ විකෘතියෙන් ද, මනෝවිකාරයෙන් ද එකෙක් අනෙකකුට දුකක් නො කැමැති වන්නේ ය.

Non-Commercial Distribution

7. මව යම්සේ තමා ගෙන් ඇති වූ එක ම ඖරස පුත්‍රයා ජීවිත පරිත්‍යාගයෙන් වුවත් රක්නේ ද එපරිද්දෙන් ම සියලු සත්වයන් කෙරෙහි අප්‍රමාණ වූ මෛත්‍රී සහගත සිත වඩන්නේ ය.

8. උඩ ද, යට ද, සරස ද, සීමාවකුදු නැතිව අතරතුරවත් වෛර චේතනා පහළවීමක් නැතිව, සතුරන් රහිත ව සියලු ලෝක සත්වයා කෙරෙහි අප්‍රමාණ වූ මෛත්‍රී සහගත සිත වඩන්නේ ය.

9. සිටින්නේ හෝ ඇවිදින්නේ හෝ උන්නේ හෝ නිදන්නේ හෝ යම්තාක් මෛත්‍රීසහගත සිහිය ඉටනු කැමැත්තේ ද ඒ තාක් පහ වූ මිද්ධය අලස බව ඇතිව අධිෂ්ඨාන කරන්නේ ය. මෛත්‍රී විහරණය මේ බුද්ධ ශාසනයෙහි ශ්‍රේෂ්ඨ විහරණයෙකැ යි ප්‍රකාශ කළහ.

10. මිථ්‍යා දෘෂ්ඨියට නො පැමිණ සිල්වත් වූයේ දර්‍ශනයෙන් යුක්ත වූයේ වස්තු කාමයන්හි ගිජු බව දුරු කොට ඒකාන්තයෙන් ම නැවත ගර්භයෙක්හි විසීමට නො පැමිණෙන්නේ ය. (ශුද්ධාවාසයක) ඉපිද එහිදී ම රහත් බවට පැමිණ පිරිනිවන් පාන්නේ ය.

## ඛන්ධ පරිත්තය

සර්ප ජාතීන් කෙරෙහි මෙත් කිරීමෙන් තමන්ගේ පංචස්කන්ධය පිළිබඳ ආරක්ෂාව සලස්වා ගැනීමට කරණීය මෙත්ත සූත්‍රයට අනතුරු ව කඳ පිරිත යොදා තිබේ.

අතීතයේ අප මහ බෝසතාණන් වහන්සේ බමුණු මහසල් කුලයක ඉපිද වැඩී වයසට පැමිණ පැවිදි වී පඤ්චාභිඥ අෂ්ටසමාපත්ති උපදවා ගෙන වනයෙහි වසන්නේ තම අතවැසි තවුසනට සර්ප ආදීන් ගෙන් වන උවදුරු දැක මේ පිරිත දෙසූහ. එතැන් පටන් සර්පයන් ගෙන් උවදුරක් නො වී ය.

මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහි අනේපිඬු මහ සිටුහු විසින් කරවා පිළිගන්වන ලද ජේතවන නම් වූ ආරාමෙහි වැඩ වසන සේක. එසමයෙහි වනාහි සැවැත් නුවර එක්තරා භික්ෂු නමක් නයකු විසින් දෂ්ඨ කරන ලදුව කලුරිය කෙළේ ය.

එකල්හි බොහෝ භික්ෂූන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක ද එතන්හි එළඹි සේක. එළඹ බුදුරදුන් වැඳ එකත් පසෙක හුන් සේක. එකත් පසෙක හුන් ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මේ පවත් දැන් වූ සේක.

"ස්වාමීනි, මේ සැවැත් නුවර එක්තරා භික්ෂු නමක් සර්පයකු විසින් දෂ්ඨ කරන ලදුව කාලක්‍රියා කෙළේ ය." යනුයි. මහණෙනි, ඒ භික්ෂු නම මේ සතර සර්ප රාජ කුලයන් මෛත්‍රී සිතින් නො පැතිර වී යයි හඟිමි. මහණෙනි, ඉදින් ඒ භික්ෂු නම සතර සර්ප රාජ කුලයන්

මෙත් සිතින් පහළේ වී නම් මෛත්‍රිය වැඩුයේ වී නම් ඒ මහණ තෙම සර්පයකු විසින් දෂ්ඨ කරන ලදුව කලුරිය නො කරන්නේ ය.

සතර සර්ප රාජ කුලයෝ කවරහු ද යත්? විරූපක්ඛ නම් සර්ප රාජ කුලය, එරාපථ නම් සර්ප රාජ කුලය, ඡබ්‍යාපුත්ත නම් සර්ප රාජ කුලය, කණ්හාගොතමක නම් සර්ප රාජ කුලය යන මේ සතරයි.

මහණෙනි, ඒ මහණ තෙම ඒකාන්තයෙන් මේ සතර නාග රාජ කුලයන් මෙත් සිතින් නො පැතිර විය. මහණෙනි ඉදින් ඒ භික්ෂුනම මේ සතර අහිරාජ කුලයන් මෙත් සිතින් පැතිර වී නම් ඒ භික්ෂුනම සර්පයකු විසින් දෂ්ඨ කරන ලදුව කලුරිය නො කරන්නේ ය.

මහණෙනි, ඒ සතර නාග කුලයන් කෙරෙහි මෙත් සිත පතුරු වන්නට අවසර දෙමි. කුමක් හෙයින් ද යත්? තමාගේ සංවරණය පිණිස, තම හට ආරක්ෂාව පිණිස පවත්නා හෙයිනැ යි වදාළ සේක.

භාග්‍යවතුන් වහන්සේ මෙය මෙසේ වදාළ සේක. සුගත නම් වූ ශාස්තෘන් වහන්සේ මෙය වදාරා යළිත් මත්තෙහි ගාථා වශයෙන් ද ප්‍රකාශ කළ සේක.

1. මාගේ මෛත්‍රිය විරූපාක්ෂ නම් සර්ප කුලයන් සමග ය. මාගේ මෛත්‍රිය ඒරාපථ නම් සර්ප කුලයන් සමඟ ය. මාගේ මෛත්‍රිය ඡබ්‍යාපුත්ත නම් සර්ප කුලයන් සමඟ ය. මාගේ මෛත්‍රිය කණ්හාගොතමක නම් සර්ප කුලයන් සමග ය.

2. මාගේ මෛත්‍රිය පා නැති නාග, පිඹුරු, පොළොං ආදී දීර්ඝ ජාතීන් සමග ය. මාගේ මෛත්‍රිය දෙපා ඇති මිනිසුන් හා පක්ෂීන් සමග ය. මගේ මෛත්‍රිය හස්ති, අශ්ව, ගව, මහිස ආදී සිවුපා සත්වයන් සමග ය. මගේ මෛත්‍රිය පත්තෑ, ගෝනුසු ආදී බොහෝ පා ඇති සත්වයන් සමග ය.

3. අපාදක සත්වයෙක් මා නො පෙළා වා, දිපාදක සත්වයෙක්, සිවු පා සතෙක්, බහුපාද සතෙක් මා නො පෙළාවා.

4. හැම සත්වයෝ ද, හැම ප්‍රාණීහු ද, හුදෙක් සියලු භූතයෝ ද යන හැමදෙන යහපතක් ම දකිත්වා, මොවුන් කෙරෙන් කිසිවකු කරාත් දුකක් නො පැමිණේවා.

5. බුදුරුවන්හි ගුණ අප්‍රමාණ ය. දහම් ගුණ අපමණ ය. සංඝ ගුණ අපමණ ය. දීර්ඝ ජාතීහු නම් ප්‍රමාණවත් හ. එනම්: සර්පයෝ ය. ගෝනුස්සෝ ය, බොහෝ පා ඇති සත්වයෝ ය, මකුළුවෝ ය, සිකනල්ලු ය. මීයෝ ය යන මේ විසිනි.

6. තෙරුවන් ගුණ සිහි කිරීමෙනුදු මා විසින් ආරක්‍ෂාව කරන ලද්දී ය. මා විසින් පරිත්‍රාණයෝ කරන ලද්දාහු ය. මා කෙරෙහි අදහස් ඇති සත්වයෝ ඉවත් වෙත්වා. මා නො වෙහෙසත්වා.

ඒ මම භාග්‍යවතුන් වහන්සේට වඳිමි. සත් බුදුවරයන්ට ද නමස්කාර කරමි.

Non-Commercial Distribution

# මෙත්තානිසංස සූත්‍රය

එක් සමයක බුදුන් වහන්සේ සැවැත් නුවර ඇසුරු කොට දෙව්රම් මහ වෙහෙර වසන සේක් දිනෙක පැසුළුයම ලොව බලා වදාරණ සේක් මෙබඳු සිදුවීමක් දුටු සේක.

කොසොල් රට සැරිසරන මා අග්ගික්ඛන්ධොපම සූත්‍රය දෙසීමෙන් සැට නමක් රහත් වන්නාහ. සැට නමක් කටින් උණු ලේ වමාරන්නාහ. සැට නමක් සිවුරු හැර ගිහි වන්නාහ යනුයි.

භික්ෂූන්හට සංග්‍රහ පිණිස චාරිකාවෙහි හැසිරෙනු කැමැති භික්ෂූන්ට දන්වන්නැ යි කීහ. මෙසේ වදාළ බුදුන් වහන්සේ මහත් භික්ෂු සමූහයක් පිරිවරාගෙන ගම් නියම්ගම් පිළිවෙළින් සැරි සරමින් මහත් වූ බෙණයක් සහිත රුකක් ගින්නෙන් ඇවිලෙනු දැක මෙය අරමුණු කොට දම් දෙසම් යි අග්ගික්ඛන්ධොපම සූත්‍රය දෙසූ සේක. මෙසේ වදාළ කළ හැටක් උණු ලේ වැමැරූහ. සැටක් සිවුරු හළහ. පිරිසිදු සිල් ඇත්තෝ රහත් වූහ.

මේ ධර්ම දේශනාව තුන් කොටසකට ප්‍රයෝජනවත් විය. රහත් වූවනට ප්‍රයෝජන වනු පුදුමයක් නො වේ. සෙස්සනට වූ ප්‍රයෝජන කවරේ ද යත්? ඉදින් බුදුහු අග්ගික්ඛන්ධොපම සූත්‍රය නො දෙසූහු නම් සමහරු ප්‍රමාද විහරණයෙන් යුක්තව පව් වඩමින් අපායෙහි උපදනාහ. මේ දහම් දෙසුම අසා සමහරු සාමණේර භූමියෙහි සිට දසසිල් පුරා භාවනා වඩා සෝවාන්, සකෘදාගාමි හා අනාගාමි වන්නාහ. සමහරු දෙව්ලොව උපදින්නාහ. අනික් අය මෙය නො ඇසුයේ නම් කල් යත් යත් සංඝාදිසෙසාදියට හා පාරාජිකාදියට පැමිණෙන්නාහ.

මේ දේශනාව ඇසූ දුසිල් මහණුහු මේ ශාසනය ආශ්චර්‍යයියි. අප පැවිදි වූයේ කෙලෙසුන් තැවීමට මිස කෙලෙසුන් වැඩීමට නොවේ. අපට දිවිහිම් කොට කෙලෙසුන් නැති කරන පිළිවෙතක් පිරිය නො හැකි ය. එබැවින් උවසුදම් පුරා දුකින් මිදෙමු යි ගිහි වූහ. ඔවුහු තිසරණ පන්සිල් හා අටසිල් රැක ඇතැම් කෙනෙක් සෝවාන් වූහ. ඇතැම් කෙනෙක් සකෘදාගාමි වූහ. කෙනෙක් දෙව්ලොව උපන්හ. මෙසේ ඔවුන්ටත් මේ දෙසුම ඵලවත් විය. මේ දේශනාව ගැන ආරංචි වූ භික්ෂූහු විසි දෙන සැට දෙන සිය දෙන බැගින් සිවුරු හැර ගිහි වූහ.

මෙසේ බුදුන් වහන්සේ දහම් දෙසමින් දනවු සැරිසරා නැවත දෙව්රම් වෙහෙරට වැඩ එම ගඳ කිළියෙහි අඩ මසක් විවේකව ඵලසමවත් සුව විඳ පසුව අනඳ මහ තෙරුන් සමග දෙව්රම් වෙහෙර බලා හැසිරෙන සේක් පෙර කාෂාය වස්ත්‍රයෙන් බබලමින් පැවැති දෙව්රම් වෙහෙර අද මෙසේ හිස්වන්නට හේතු කවරේ දැ යි අනඳ හිමියන් ගෙන් විචාළ සේක.

අනඳ හිමියෝ බුදුන් වහන්සේට මෙසේ පැවසූ සේක.

ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, ඔබ වහන්සේ දනව් සැරිසරා වඩිද්දී අග්ගික්ඛන්ධොපම සූත්‍රය වදාළ තැන් පටන් භික්ෂූහු සංවේගයට පැමිණ අපට මේ සසුනෙහි පිළිවෙත් පිරිය නො හැකි ය. නො මනා පැවතුම් ඇති අප විසින් සැදැහැවතුන් විසින් පින් සලකා පිරිනමනු ලබන දන් වැළඳීම නුසුදුසුය යි සිවුරු හැර ගියහ. මෙය ඇසූ බුදුන් වහන්සේට ධර්ම සංවේගය පහළ විය.

Non-Commercial Distribution

ඉක්බිති බුදුන් වහන්සේ අනඳ තෙරුන් ඇමතූහ. මා සමවත් සුවෙන් විවේකීව සිටිය දී මෙහි කිසිදු භික්ෂු නමක් මගේ දරුවන්ගේ සැනසීම පිණිස අවවාදයක් නො දුන්නේ ය. ගඟකට බසින්නට බොහෝ තොටවල් ඇත්තාක් මෙන් සසුනෙහි සැනසෙන්නට බොහෝ දේ තිබේ.

ආනන්දය, ගඳකිළි මලුවෙහි බුද්ධාසනයක් පණවා භික්ෂූන් රැස්කරව යි කී සේක. මේ කාරණය අර්ථෝත්පත්ති කොට ගෙන මහණෙනි, මේ සස්නෙහි යම් භික්ෂු නමක් අසුරුසනක් ගසන කෙටි කාලයක් නමුදු සියලු සතුන් කෙරෙහි මෙත් සිත වඩා නම් හෙවත් මෛත්‍රී කෙරේ නම් මහණෙනි, ඒ භික්ෂු නම මේ සස්නෙහි නො සිස් වූ ධ්‍යාන ඇත්තෙක් ව වසන්නේ ය යි ද, ශාසනානුශාසනය පිළිපදින්නේ ය යි ද, අවවාද පිළිපදින්නේ ය යි ද, දායකයන් විසින් දෙන රට්ඨපිණ්ඩය නො සිස්ව වළඳන්නේ ය යි ද කියනු ලැබේ.

යම් කෙනෙක් මෙත් සිත නැවත නැවත පුහුණු කෙරෙත් නම් වඩත් නම් ඔවුන් ගැන කියනුම කවරේ දැ යි මෙසේ චුල්ල අච්ඡරාසංඝ සූත්‍රය වදාරා මෙකී භාවනාවේ අනුසස් දක්වනු සඳහා **මෙත්තානිසංස සූත්‍රය** දෙසූ සේක.

මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර ජේතවන නම් වූ අනේපිඬු මහ සිටුහු ගේ ආරාමයෙහි වැඩ වසන සේක. එකල්හි **භාග්‍යවතුන් වහන්සේ** මහණෙනි යි භික්ෂූන්ට ආමන්ත්‍රණය කළ සේක. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සැ යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හ.

**භාග්‍යවතුන් වහන්සේ** මෙය වදාළ සේක.

මහණෙනි, ආදරයෙන් සෙවුනා ලද එසේ ම වඩනා ලද නැවත නැවත වැඩීම් වශයෙන් පුරුදු කරන ලද යානාවක් මෙන් කරන ලද වස්තුවක් මෙන් කරන ලද නැවත නැවත උපදවන ලද සියලු අන්දමින් ම පුරුදු කරන ලද මොනවට පටන් ගන්නා ලද මෛත්‍රී චෙතො විමුක්තිය පිළිබඳ අනුසස් එකොළොසක් කැමැති විය යුත්තාහ.

කවර එකොළොසක් ද යත්?

(i) සැපසේ නිදයි (ii) සැපසේ පුබුදියි (iii) නපුරු සීනයන් නො දකි යි (iv) මිනිසුනට ප්‍රිය වෙයි (v) අමනුෂ්‍යයනට ද ප්‍රිය වෙයි (vi) දෙවියෝ රකිති (vii) මේ මෛත්‍රී විහරණ ඇති පුද්ගලයා ගේ ශරීරයෙහි ගිනි හෝ, විස හෝ, සැත් හෝ නො වදියි (viii) වහාම සිත එකඟ වෙයි (ix) මුහුණ පැහැපත් වෙයි (x) නො මුළාව කලුරිය කරයි (xi) මෛත්‍රී සමවතින් මතු රහත් වන්නට නො හැකි වී නම් මරණින් මතු බඹලොව උපදියි.

මහණෙනි, ආදරයෙන් සෙවුනා ලද මෛත්‍රී චෙතො විමුක්තිය ආසෙවිත භාවිත බහුලීකෘත කළ කල්හි යානාවක් මෙන් වස්තුවක් මෙන් කළ කල්හි එළඹ සිටි කල්හි පුරුදු කළ කල්හි මොනවට පටන් ගත් කල්හි මේ එකොළොස් ආනිසංසයෝ කැමති විය යුත්තාහු ය.

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක. සතුටු වූ ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ ගේ දේශනාවට කැමති වූහ.

Non-Commercial Distribution

# මිත්තානිසංස පිරිත

මිතුරනට උපකාර කිරීමේ අනුසස් දැක්වීම සඳහා මිත්තානිසංස ගාථා දේශිත ය. එය ජාතක පාලියේ මහා නිපාතයේ තේමිය ජාතකයෙහි තේමිය කුමාරව උපන් අප මහා බෝසතුන් දෙවියන් ගේ සාධුකාරයෙන් හා තමන් ගේ ඝෝෂායෙන් මහා වනය උන්නාදයට පත් කරවමින් මිත්ත පූජා ගාථා නම් මේ ගාථා දසය දෙසන ලදි.

1. යම් පුද්ගලයෙක් මිත්‍රද්‍රෝහි නො වේ නම් හෙතෙම තමාගේ ගෙයින් බැහැර යම් තැනෙකට ගියේ නම් බොහෝ කන බොන දෑ ලබයි. බොහෝ දෙනෙක් ඔහු ඇසුරු කොට ජීවත් වෙති.

2. යමෙක් මිත්‍රද්‍රෝහි නො වේ නම් හෙතෙම යම් රටකට යේ ද, නියම් ගමකට නුවරකට යේ ද ඒ හැම තැන ම හේ පුදනු ලැබේ.

3. යමෙක් මිත්‍රද්‍රෝහි නො වේ නම් ඔහුට සොරු ළං නො වෙති. රජ තෙමේ අවමන් නො කෙරෙයි. ඔහු හැම සතුරන් මැඩ පවත්වති.

4. යමෙක් මිත්‍රද්‍රෝහි නො වේ නම් හෙතෙම නො ගැටුනු සිත් ඇතිව තමාගේ ගෙට එයි. මිත්‍රද්‍රෝහි නො වන පුද්ගලයාගේ අපමණ වූ ගුණ සභාවෙහි පවා කියති. හෙතෙම නෑයිනට උතුම් වෙයි.

5. යමෙක් මිත්‍රද්‍රෝහි නො වේ නම් හෙතෙම අනුනට සත්කාර කොට අනුන්ගෙන් සත්කාර ලබන්නෙක් වෙයි. අනුන් කෙරෙහි ගෞරව සහිත වූයේ ඔවුන් විසින් ගරු කරනු ලබන්නේ ද වෙයි. ලෝකයා තමාගේ ගුණ වැනුම හා යසස උසස් කොට නගාලන්නේ ද වෙයි.

6. මිත්‍රයන් පුදන තැනැත්තා ඔවුන් විසින් පුදනු ලබන්නේ ද වෙයි. බුද්ධාදී කල්‍යාණ මිත්‍රයනට වඳින තැනැත්තා තෙමේ ද වැඳුම් ලබන්නෙක් වෙයි. හෙතෙම කීර්තියට ද පැමිණෙයි.

7. යමෙක් මිත්‍රද්‍රෝහි නො වේ නම් හෙතෙම දිලිසෙන ගිනි මෙන් යස ඉසුරු පිරිවර සැපතින් උජ්වලිත වෙයි. දෙවියකු මෙන් බබලයි. ශ්‍රී කාන්තාව විසින් අත් නො හරන ලද්දේ වෙයි.

8. යමෙක් මිත්‍රද්‍රෝහි නො වේ නම් ගවයෝ ඔහුට ඵල ප්‍රයෝජන දෙති. ක්ෂෙත්‍රයෙහි වපුලතාක් පැළ හට ගනිති. දරු සැප වළඳයි.

9. යමෙක් මිත්‍රද්‍රෝහි නො වේ නම් ඇඳුරෙන්, පර්වතයෙන්, ගසින් හෝ යමකින් ගිලිහුණේ නම් පිහිට ලබයි.

Non-Commercial Distribution

10. යමෙක් මිත්‍රද්‍රෝහි නො වේ නම් හෙතෙම වැඩුණු මුල් හා නුග අරළු ඇති නුග රුකක් සුළඟින් සොලවා එලන්නට නො හැක්කා සේ සතුරන් විසින් ඔහු මඩනට නො හැකිවෙත්.

## මෝර පරිත්ත

ජාතක පාළියෙහි දුක නිපාතයෙහි එන 13 මෝර පරිත්තය සංයුත්තනිකායේ දේවපුත්ත සංයුත්තයේ 14 - 15 චන්ද - සූරිය පරිත්ත දෙක ද සක්ක සංයුත්තයේ එන 16 ධජග්ග පරිත්තය ද පරිත්ත 4 පළමුවන බණවර අවසනට යොදා තිබේ.

1. ලොව අඳුරු දුරුකොට ලෝවැස්සනට ඇස් පාදා දෙන හෙයින් ඇස් ඇති, ලොවට එළිය දෙන්නවුන් අතරෙහි එක ම රජෙක් වූ, රන්වන් සිරුරු ඇති, මහපොළොව බබුළු වන්නා වූ මේ සූයර්‍යයා නැගෙ යි, රන්වන් ඒ හිරුට වඳිමි. ඔබගෙන් ආරක්ෂාව ලැබූ අපි මෙ දවස සතර ඉරියව්වෙන් ම යුක්තව සැපසේ වෙසෙමු.

2. සවාසනා සකල ක්ලේශයන් දුරු කළ යම් බුදු කෙනෙක් සියලු දතයුතු ධර්මයන් දැන බුද්ධත්වය අවබෝධ කළාහු ද, උන්වහන්සේලාට මාගේ නමස්කාරය වේවා. උන්වහන්සේලා ද මා ආරක්ෂා කරන සේක්වා. අතීත බුදුවරයන් වහන්සේලාට ද මාගේ නමස්කාරය වේවා. උන්වහන්සේලා ගේ නව ලොව්තුරා බෝධි ගුණයට ද මාගේ නමස්කාරය වේවා.

ඒ මයුර තෙම මෙම පිරිත කියා ගොදුරු සෙවීමෙහි හැසිරෙයි. දෙවන මෝර පිරිතෙහි පෙරසේ ම මේ සූයර්‍යතෙම අප අතරෙන් ඉවත් වෙයි. ඔබගෙන් ආරක්ෂාව ලත් අපි (මුළු රැයෙහි ම) සුවසේ වෙසෙමු. සෙස්ස මුල් ගාථා දෙක මෙනි.

•••••••••••••••

Non-Commercial Distribution

# චන්‍ද පරිත්ත.

## සූරිය පරිත්ත. – ධජග්ග පරිත්ත.

මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහි ජේත නම් රාජ කුමාරයා ගේ උයන්හි අනේපිඬු මහ සිටුහු විසින් කරවන ලද අරම්හි වැඩ වසන සේක. එසමයෙහි චන්ද්‍ර දිව්‍ය පුත්‍ර තෙම රාහු අසුරේන්ද්‍රයා විසින් අල්වා ගන්නා ලද්දේ විය. ඉක්බිති චන්ද්‍ර දිව්‍ය පුත්‍ර තෙම එවේලෙහි බුදුරදුන් සිහිකරමින් මේ ගාථාව කීයේ ය:

1. බුද්ධ වීරයන් වහන්ස, නුඹ වහන්සේ සියලු කෙලෙසුන් කෙරෙන් විශේෂයෙන් මිදුණු සේක. එසේ වූ ඔබ වහන්සේට මාගේ නමස්කාරය වේවා. මම කරදරයට වැටී සිටිමි. ඒ මට පිළිසරණ වුව මැනව.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සඳු දෙව් පුත් අරභයා රාහු අසුරේන්ද්‍රයාට මේ ගාථාවෙන් මෙසේ වදාළ සේක:

2. රාහු අසුරේන්ද්‍රය, චන්‍ද දිව්‍ය පුත්‍ර තෙමේ නික්ලේශී වූ තථාගතයන් වහන්සේ සරණ ගියේ ය. බුදුවරයෝ වනාහි ලොවට අනුකම්පා කරන්නෝ ය. එහෙයින් සඳු අත් හරුවයි වදාළ සේක.

ඉක්බිති රාහු අසුරේන්ද්‍ර තෙම සඳු දෙව්පුතු අත හැර වේගයෙන් **වේපචිත්ති** අසුරිඳු යම් තැනෙක ද එතන්හි එළඹියේ ය. එළඹ හටගත් සංවේග ඇතිව ලොමුදැහැගත් සිරුරු ඇතිව එකත් පසෙක සිටියේ ය. එසේ සිටියා වූ රාහු අසුරේන්ද්‍රයාට **වේපචිත්ති** අසුරේන්ද්‍රයා ගාථාවකින් මෙසේ කීයේ ය.

3. එම්බල රාහු අසුරේන්ද්‍රය, ඉක්මන් වූවකු මෙන් සඳු අත්හැරියේ කුමකට ද? කැළඹුණු සිත් ඇත්තෙක් ව අවුත් බිය වූවකු මෙන් කුමක් හෙයින් සිටින්නෙහි ද?.

4. බුදු රදුන් විසින් සඳු අත් හරුවයි ගාථාවකින් අස්වන ලද්දෙමි. ඉදින් සඳු අත් නො හැරියෙම් නම් මාගේ හිස සත්කඩක් ව පැළෙයි. ජීවත් වුවද සැපයක් නො ලබමි.

## සූරිය පරිත්තය

බුදුහු සැවැත් නුවර දෙව්රම් වෙහෙර අනේපිඬු මහ සිටුහු ගේ අරම්හි වැඩ වෙසෙන කල්හි සූර්‍ය්‍ය දිව්‍ය රාජතෙම රාහු අසුරේන්ද්‍රයා විසින් අල්ලා ගන්නා ලද්දේ ය. එකල්හි හිරු දෙව් පිත් බුදුරදුන් සිහිකරමින් මේ ගාථාව කීයේ ය:

1. බුද්ධ වීරයන් වහන්ස, ඔබට නමස්කාර වේවා, ඔබ වහන්සේ හැම තන්හි ම මිදුණු සේක් ම ය. මම කරදරයට වැටුණෙමි. ඒ මට පිහිටවනු මැනවි.

*Non-Commercial Distribution*

ඉක්බිති බුදුරජාණන් වහන්සේ හිරු දෙව්පිත් ඇරබ රාහු අසුරේන්ද්‍රයාට ගාථාවකින් මෙසේ වදාළ සේක:

2. එම්බා රාහු, හිරු දෙව්පුත් අර්හත් වූ තථාගතයන් වහන්සේ සරණ ගියේ ය. එහෙයින් ඔහු මුදව, බුදුවරයෝ ලොවට අනුකම්පා කෙරෙති.

3. යම් සූර්‍යයෙක් ගණඳුරු දුරහැර එළිය කෙරේ ද? බබළන මඩුලු ඇත්තේ ද මහා තේජස් ඇත්තේ ද එම්බල රාහු එසේ වූ අහස හැසිරෙන හිරු නො ගිල. එම්බා රාහු මාගේ පුත්‍ර වූ සූර්‍යයා මුදව.

ඉක්බිති රාහු අසුරේන්ද්‍රයා හිරු දෙව් පුත් අත්හැර යුහුසුළුව වේපචිත්ති අසුරේන්ද්‍රයා යම් තැනෙක ද එතෙනට එළඹියේ ය. එළඹ කලකිරුණු සිත් ඇතිව බියෙන් තැති ගත්තෙක් ව එකත් පස්ව සිටියේ ය. එසේ සිටි රාහු අසුරේන්ද්‍රයාට වේපචිත්ති අසුරිඳු ගාථාවකින් මෙසේ කීය:

4. එම්බා රාහු කිමෙක් ද? ඉක්මන් වූවකු මෙන් හිරු අතහැරියෙහි ද? කුමක් හෙයින් කලකිරුණු ගතියෙන් යුක්තව මෙහි පැමිණ තැති ගත්තෙකු මෙන් සිටින්නෙහි ද?

5. බුදු රදුන් විසින් වදාළ ගාථා දෙකක් ඇසීමි, ඒ තථාගත වචනය ඉක්මවා ඉදින් හිරු අත නො හැරියෙම් නම් මාගේ හිස සත්කඩකට පැළෙන්නේ ය. දිවි තිබුණත් සුවයක් නො ලබමි.

## ධජග්ග පිරිත

එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහි ජේතවන නම් වූ අනේපිඬු සිටුහු ගේ අරම්හි වැඩ වසන සේක. එහි දී භාග්‍යවතුන් වහන්සේ මහණෙනි, යි භික්ෂූන් ඇමතූ සේක. ඒ භික්ෂූහු වහන්සැ යි භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හ.

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක:

මහණෙනි, පෙර වූවක් කියමි. දෙවියන් ගේ හා අසුරයන් ගේ යුද්ධයෙක් විය. මහණෙනි, එකල්හි සක්දෙව් රජ තව්තිසා වැසි දෙවියන් ඇමතී ය. භවත්නි, ඉදින් යුද්ධයට ගිය දෙවියනට බියෙක් හෝ තැතිගැන්මෙක් හෝ ලොමුදැහැගැන්මෙක් හෝ උපදනේ නම්, මාගේ ධ්වජාග්‍රය බලව, මාගේ ධ්වජාග්‍රය බලන්නා වූ තොපට යම් බියෙක් හෝ තැතිගැන්මෙක් හෝ ලොමුදැහැගැන්මෙක් හෝ වන්නේ නම් එය පහ වන්නේ ය.

ඉදින් මාගේ ධ්වජාග්‍රය නො දක්නහු නම්, එකල්හි ප්‍රජාපති දෙව් රජු ගේ ධ්වජාග්‍රය බලව. ප්‍රජාපති දෙව් රජු ගේ ධ්වජාග්‍රය දක්නා තොපට යම් බියෙක් හෝ තැතිගැන්මෙක් හෝ ලොමුදැහැගැන්මෙක් හෝ වන්නේ නම් එය පහ වන්නේ ය.

Non-Commercial Distribution

ඉදින් ප්‍රජාපති දෙව් රජු ගේ ධ්වජාග්‍රය නො දක්නහු නම් එකල්හි වරුණ දෙව් රජු ගේ ධ්වජාග්‍රය බලව. වරුණ දෙව් රජු ගේ ධ්වජාග්‍රය දක්නා තොපට යම් බියෙක් හෝ තැතිගැන්මෙක් හෝ ලොමුදැහැගැන්මෙක් හෝ වන්නේ නම් එය පහ වන්නේ ය.

ඉදින් වරුණ දෙව් රජු ගේ ධ්වජාග්‍රය නො දක්නහු නම් එකල්හි ඊසාන දෙව් රජු ගේ ධ්වජාග්‍රය බලව. ඊසාන දෙව් රජු ගේ ධ්වජාග්‍රය දක්නා වූ තොපට යම් බියෙක් හෝ තැතිගැන්මෙක් හෝ ලොමුදැහැගැන්මෙක් හෝ වන්නේ නම් එය පහ වන්නේ ය.

මහණෙනි, සක්දෙව් රජු ගේ ධ්වජාග්‍රය බලන්නවුනට හෝ ප්‍රජාපති දෙව් රජු ගේ ධ්වජාග්‍රය බලන්නවුනට හෝ වරුණ දෙව් රජු ගේ ධ්වජාග්‍රය බලන්නවුනට හෝ ඊසාන දෙව් රජු ගේ ධ්වජාග්‍රය බලන්නවුනට හෝ යම් බියෙක් හෝ තැතිගැන්මෙක් හෝ ලොමුදැහැගැන්මෙක් හෝ වන්නේ නම් එය පහවන්නේ හෝ වෙයි. පහ නො වන්නේ හෝ වෙයි.

ඒ කවර හෙයින් ද යත් ?

මහණෙනි, සක්දෙව් රජ පහ නො වූ රාග ඇත්තේ ය. පහ නො වූ ද්වේෂ ඇත්තේ ය. පහ නො වූ මෝහ ඇත්තේ ය. බියවන සුලු ය. තැතිගන්නා සුලුය. පලා යන සුලු ය.

මහණෙනි, මම තොපට මෙසේ කියමි. මහණෙනි, ඉදින් ආරණ්‍යයකට ගියා වූ හෝ රුක් මුලකට ගියා වූ හෝ ශූන්‍යාගාරයකට ගියා වූ හෝ තොපට බියෙක් හෝ තැතිගැන්මෙක් හෝ ලොමුදැහැගැන්මෙක් හෝ උපදනේ නම් එකල්හි ඒ භාග්‍යවත් තෙමේ මේ කරුණෙනුදු **අර්හත් ය, සම්‍යක් සම්බුද්ධ ය, විද්‍යාචරණ සම්පන්න ය, සුගත ය, ලෝකවිදූ ය, අනුත්තර පුරිස දම්මසාරථී ය, දෙව් මිනිසුන්ට ශාස්තෘ ය, බුද්ධ ය, භගවත් ය** යි මා ම සිහිකරව, මහණෙනි, මා සිහිකරන්නා වූ තොපට යම් බියෙක් හෝ තැතිගැන්මෙක් හෝ ලොමුදැහැගැන්මෙක් හෝ වන්නේ නම්, එය පහව යන්නේ ය.

ඉදින් මා සිහි නො කරන්නාහු නම්, එකල්හි ධර්මය භාග්‍යවතුන් වහන්සේ විසින් **ස්වාක්ඛාත ය, සන්දිට්ඨික ය, අකාලික ය, එහිපස්සික ය, ඔපනයික ය, නුවණැත්තන් විසින් සිය සතන්හි ලා දත යුත්තේ** යයි ධර්මය සිහි කරව. මහණෙනි, ධර්මය සිහි කරන්නා වූ තොපට යම් බියෙක් හෝ තැතිගැන්මෙක් හෝ ලොමුදැහැගැන්මෙක් හෝ වන්නේ නම්, එය පහව යන්නේ ය.

ඉදින් ධර්මය සිහි නො කරන්නාහු නම්, එකල්හි භාග්‍යවතුන් වහන්සේ ගේ ශ්‍රාවක **සංඝ තෙමේ සුපටිපන්න ය, භාග්‍යවතුන් වහන්සේ ගේ ශ්‍රාවක සංඝ තෙමේ උජුපටිපන්න ය, භාග්‍යවතුන් වහන්සේ ගේ ශ්‍රාවක සංඝ තෙමේ ඤායපටිපන්න ය, භාග්‍යවතුන් වහන්සේ ගේ ශ්‍රාවක සංඝ තෙමේ සාමීචිපටිපන්න ය,** යම් මේ පුරුෂ යුග සතරක් වේ ද, පුරුෂ පුද්ගලයෝ අට දෙනෙක් වෙද් ද, **භාග්‍යවතුන් වහන්සේ ගේ ශ්‍රාවක සංඝ තෙමේ ආහුනෙය්‍ය ය, පාහුනෙය්‍ය ය, දක්ඛිණෙය්‍ය ය, අඤ්ජලීකරණීය ය, ලෝකයා ගේ නිරුත්තර පින්කෙත** යයි සංඝයා සිහි කරව. මහණෙනි, සංඝයා සිහි කරන්නා වූ තොපට යම් බියෙක් හෝ තැතිගැන්මෙක් හෝ ලොමුදැහැගැන්මෙක් හෝ වන්නේ නම්, එය පහව යන්නේ ය.

Non-Commercial Distribution

ඒ කවර හෙයින් ද යත්?

මහණෙනි, අර්හත් වූ සම්මා සම්බුද්ධ වූ තථාගතයන් වහන්සේ වනාහි පහ වූ රාග ඇත්තාහ. පහ වූ ද්වේෂ ඇත්තාහ. පහ වූ මෝහ ඇත්තාහ. නො බාන සුලු ය. නො තැති ගන්නා සුලු ය. ත්‍රස්ත නො වන සුලු ය. පලා නො යන සුලු ය.

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක. මෙසේ වදාරා මේ ගාථා ද වදාළ සේක:

1. මහණෙනි, ආරණ්‍යයෙහි දී හෝ රුක්මුල දී හෝ ශූන්‍යාගාරයෙහි දී හෝ බුදුරජාණන් වහන්සේ සිහි කරන්නේ ය. (එවිට) තොපට බියෙක් නො වන්නේ ය.
2. ඉදින් ලෝක ජ්‍යෙෂ්ඨ වූ බුදුරජාණන් වහන්සේ සිහි නො කරන්නහු නම්, එකල්හි නෛර්‍යාණික වූ සුදේශිත වූ ධර්මය සිහි කරන්නේ ය.
3. ඉදින් නෛර්‍යාණික වූ සුදේශිත වූ ධර්මය සිහි නො කරන්නහු නම් එකල්හි නිරුත්තර වූ පුණ්‍යක්ෂේත්‍ර වූ සංඝයා සිහි කරන්නේ ය.
4. මහණෙනි, මෙසේ බුදුරජාණන් වහන්සේ ද, ධර්මය ද, සංඝයා ද සිහි කරන්නවුනට බියෙක් හෝ තැතිගැන්මෙක් හෝ ලොමුදැහැගැන්මෙක් හෝ නො වන්නේ ය.

   (සරණාගමනයේ සිට මෝර පරිත්ත අවසන දක්වා මෙලොව වැසි මනුෂ්‍යාදීන් ගේ උපද්‍රව නිවාරණය සඳහා දෙසන ලද සූත්‍ර දක්වා අනතුරුව චාතුර්මහාරාජික, තාවතිංස දෙව්ලෝ වැසියන් ගේ බිය නිවාරණය සඳහා චන්ද - සූරිය හා ධජග්ග යන පරිත්ත තුන දේශනා කර තිබේ.)

**පළමුවන බණවර නිමි.**

•••••••••••••••

Non-Commercial Distribution

## II බණවර

උත්පත්ති දෙවියනට සිදුවන උවදුරුවලින් වැළකීම සඳහා දෙසන ලද විසුද්ධි දේව සංඛ්‍යාත මහ කසුප් - මහ මුගලන් දෙ හිමිවරුනට හා බුදු රදුනට උපන් ආබාධ සංසිඳුවීම පිණිස දෙසන ලද බොජ්ඣඞ්ග සූත්‍ර තුන දක්වන ලදි.

මහකසුප් මහ මුගලන් දෙ හිමිවරුන් හා බුදුන් වහන්සේ රෝගාතුර වූයේ ගිජුකුළු පව්ව පාමුල විස ගසක පිපිණු මල් පිස එන සුළඟ ආඝ්‍රාණය කිරීමෙනි.

රාගාදී මානසික රෝග සුව කිරීමේ බලය පමණක් නොව කායික රෝග සුව කිරීමේ ශක්තියක් ද බොජ්ඣඞ්ග ධර්මයන්හි පවතී. ආයුෂ්මත් මහා කාශ්‍යප ස්ථවිර රෝගාතුර වී රජගහ නුවර පිප්ඵලි ගුහාවෙහි විසීය. තථාගතයන් වහන්සේ එක් සන්ධ්‍යා සමයක එහි වැඩ සුවදුක් විචාරා බොජ්ඣඞ්ග ධර්ම දෙසූ සේක. ඒ දෙසුම අසා සිටි කසුප් හිමියෝ නිරෝගී වූ හ. බුදු සසුනෙහි නෛර්‍යාණිකත්වය සිතන කසුප් හිමියන් ගේ සිත ප්‍රසන්න වූයේ ය. එයින් රුධිරය ද ප්‍රසන්න විය. සියලු සිරුර පිනා ගියේ ය. උන්වහන්සේ ගේ රෝගය පියුම් පතෙහි දිය බිඳක් මෙන් පහ වී ගියේ ය.

බුදු රජාණන් වහන්සේ තවත් අවස්ථාවක රෝගී වූ මුගලන් තෙරුන් කරා ද පැමිණ කරුණු විචාරා උන්වහන්සේට ද බොජ්ඣඞ්ග ධර්මය දෙසූහ. එයින් සිත පැහැදුණු උන්වහන්සේගේ ද රෝගය සුව වූයේ ය.

එක් අවස්ථාවක බුදුන් වහන්සේ ද රෝගාතුරව වේළුවනාරාමයෙහි වැඩ විසූ සේක. ආයුෂ්මත් චුන්ද ස්ථවිරයන් වහන්සේ දක්නට එළඹ බොජ්ඣඞ්ග ධර්ම දෙසූහ. තථාගතයන් වහන්සේ ද නීරෝග වූ සේක. බොජ්ඣඞ්ග ධර්මවල රෝග ව්‍යපසමනය කිරීමේ ශක්තියක් තිබේ. බොජ්ඣඞ්ග යන්නෙහි තේරුම බෝධි නම් චතුමාර්ග ඥානය යි. බෝධි නම් වූ ධර්ම සමූහයා ගේ අංගයෝ ය යන අරුතින් ද නිර්වාණය ප්‍රත්‍යක්ෂ කරන යෝගාවචර්යා ගේ අංගයෝ ය යන අරුතින් ද බොධ්‍යඞ්ග නම් වෙයි.

බොජ්ඣඞ්ග ධර්ම : (1) සති (2) ධම්මවිචය (3) විරිය (4) පීති (5) පස්සද්ධි (6) සමාධි (7) උපෙක්ඛා යන විසින් සතකි

1. නිවන් මගට පිළිපන් ආර්‍යශ්‍රාවකයා ගේ සිතෙහි පහළවන සති චෛතසිකය ම සති සම්බොජ්ඣඞ්ග නමි.
2. ප්‍රඥා චෛතසිකය හෙවත් නුවණ ධම්මවිචය සම්බොජ්ඣඞ්ග නමි.
3. කය පිළිබඳ වූත් සිත පිළිබඳ වූත් වීර්‍යය විරිය සම්බොජ්ඣඞ්ග නම්.
4. සිත පිනවන ප්‍රීති චෛතසිකය පීති සම්බොජ්ඣඞ්ග නමි.
5. කය සිත දෙකේ තැන්පත් ගතිය පස්සද්ධි සම්බොජ්ඣඞ්ග නමි.
6. එක අරමුණෙක්හි සිත නතර කර ගැනීම සමාධි සම්බොජ්ඣඞ්ග නම්.
7. ජීවිතයේ ඒ ඒ විපරිනාමවල දී අකම්පිතව සමසිතින් ඒවාට මුහුණ දීම උපෙක්ඛා සම්බොජ්ඣඞ්ග නමි.

සප්ත බොජ්ඣඞ්ග ධර්ම ලෞකික ලෝකෝත්තර විසින් දෙ වැදෑරුම් වේ.

Non-Commercial Distribution

# මහා කස්සපත්ථේර බොජ්ඣඞ්ගය

මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ **රජගහ** නුවර **සමීපයෙහි කලන්දක නිවාප** නම් වූ **වේළුවන මහා විහාරයෙහි** වැඩ වසන සේක. එකල්හි **ආයුෂ්මත් මහා කාශ්‍යප** ස්ථවිර තෙමේ පීඩිත ව දුකට පත් ව ඇඩි ගිලන්ව පිප්ඵලි ගුහායෙහි වෙසෙයි.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සවස් වේලෙහි ඵල සමවතින් නැගිට ආයුෂ්මත් මහා කාශ්‍යප ස්ථවිරයන් වහන්සේ යම් තැනෙක වෙසේ ද එතැනට එළඹ පැනවූ අස්නෙහි වැඩහුන් සේක. එසේ වැඩහුන් භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් මහා කාශ්‍යප ස්ථවිරයන් වහන්සේට මෙසේ වදාළ සේක:

කිමෙක් ද? කාශ්‍යපය ඔබට ඉවසිය හැකි ද? කිම යැපිය හැකි ද? හෙවත් ඔබගේ ශරීරය පවත්වන්නට හැකි ද? කිම දුක්ඛ වේදනාවෝ පිරිහෙත් ද? අඩුවෙත් ද? කිම දියුණු නොවෙත් ද? ඒ දුක්ඛ වේදනාවන් ගේ කෙළවරක් පෙනේ ද? වැඩීමක් නො පෙනේ ද යි මෙසේ විචාළ සේක:

ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, මට ඉවසිය නො හැකියි. සිව් ඉරියව්වෙහි සිරුර පැවත්විය නො හැකි යි. මාගේ දුඃඛ වේදනාවෝ බලවත්හ. දියුණුවනු මිස අඩු නොවෙත්. වැඩිවනු මිස අඩුවක් නො පෙනේ යයි පිළිතුරු දුන්හ.

කාශ්‍යපය, මේ **සප්තබොධ්‍යඞ්ග ධර්මයෝ** මා විසින් මනාකොට කියන ලදහ. වඩන ලදහ. නැවත නැවත පුරුදු කරන ලදහ. ඒ ධර්මයෝ චතුස්සත්‍ය ධර්මයන් විශිෂ්ට ඥානයෙන් දැන ගැනීම පිණිස චතුස්සත්‍යයා ගේ අවබෝධය පිණිස නිවන් පිණිස පවතිත්.

ඒ සප්ත බොධ්‍යඞ්ගයෝ කවරහුද යත්?

කාශ්‍යපය, **ස්මෘති බොධ්‍යඞ්ගය** මා විසින් යහපත් කොට කියන ලදී. වඩන ලදි. නැවත නැවතත් පුරුදු කරන ලදි. ඒ චතුස්සත්‍යය පිළිබඳ විශිෂ්ට ඇනීම පිණිස ඔවුන්ගේ ම අවබෝධය පිණිස නිවන් පිණිස පවතියි.

**ධර්ම විචය සම්බොධ්‍යඞ්ගය, වීර්‍ය්‍ය සම්බොධ්‍යඞ්ගය, ප්‍රීති සම්බොධ්‍යඞ්ගය, ප්‍රශ්‍රබ්ධි සම්බොධ්‍යඞ්ගය, සමාධි සම්බොධ්‍යඞ්ගය, උපෙක්‍ෂා සම්බොධ්‍යඞ්ගය,** පෙර සේ මැයි.

කාශ්‍යපය, මේ සප්ත බොධ්‍යඞ්ග ධර්මයෝ මා විසින් මැනවින් කියන ලදහ. වැඩි වශයෙන් පුරුදු කරන ලදහ. නැවත නැවතත් පුරුදු කරන ලදහ. ඒ සප්ත ධර්මයෝ විශිෂ්ට ඥානය පිණිස, චතුස්සත්‍යාවබෝධය පිණිස නිවන් පිණිස පවත්නාහ.

ඉක්බිති මහා කාශ්‍යප ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්ස, බොධ්‍යඞ්ග ධර්මයෝ නම් මැනවි. බොධ්‍යඞ්ග ධර්මයෝ ඒකාන්තයෙන් මැනව යි සැළ කළහ. භාග්‍යවතුන් වහන්සේ මේ ධර්මය වදාළ සේක. එයට සතුටු වූ ආයුෂ්මත් මහා කාශ්‍යප ස්ථවිර තෙමේ භාග්‍යවතුන් වහන්සේ ගේ ධර්මදේශනාව පිළිගත්තේ ය.

ආයුෂ්මත් මහා කාශ්‍යප ස්ථවිර තෙමේ ඒ ලෙඩින් නැගිට්ටේ ය. ආයුෂ්මත් මහා කාශ්‍යප ස්ථවිරයන් වහන්සේ ගේ ඒ රෝගය නැවත නූපදනා පරිද්දෙන් නැති වූයේ ය.

Non-Commercial Distribution

# මහා මොගගල්ලානත්‍ථෙර බොජ්ඣඞගය

මා විසින් මෙසේ අසන ලදි. එක් සමයෙක්හි **භාග්‍යවතුන් වහන්සේ කලන්දක නිවාප නම් වූ වේළුවනාරාමයෙහි** වැඩ වසන සේක. එසමයෙහි වනාහි ආයුෂ්මත් **මහා මුගලන්** ස්ථවිර තෙම හටගත් ආබාධ ඇත්තේ දැඩි ගිලන් වූයේ **ගිජුකුළු පව්වෙහි** වෙසෙයි.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සවස් කාලයෙහි ඵල සමාපත්තියෙන් නැගී සිටියේ ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්සේ යම් තැනෙක්හි ද එතැනට එළඹි සේක. එළඹ පැණ වූ අස්නෙහි වැඩහුන් සේක. එසේ වැඩ හුන් **භාග්‍යවතුන් වහන්සේ** ආයුෂ්මත් **මහා මොග්ගල්ලාන ස්ථවිරයන්ට** මෙසේ වදාළ සේකః

මෞද්ගල්‍යායනය, ඉවසිය හැකි ද? යැපිය හැකි ද? කිම දුක් වේදනාවෝ පිරිහෙත් ද? අඩුවෙත් ද? දුක් වේදනාවන් ගේ කෙළවරක් පෙනේ ද? වැඩීමක් නො පෙනේ ද? යි මෙසේ විචාළ සේක.

ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, මට ඉවසිය නො හැකි ය. සිරුර පැවැත්විය නො හැකි ය. මාගේ දුඃඛ වේදනාවෝ බලවත්හ. දියුණු වෙත්. වැඩිවෙනු මිස අඩුවන මගක් නො පෙනෙයි.

මෞද්ගල්‍යානය, මේ **සප්ත බොධ්‍යඞ්ග** ධර්මයෝ මා විසින් මොනවට කියන ලදහ. වඩන ලදහ. නැවත නැවතත් වඩන ලදහ. ඔවුහු විශිෂ්ට ඥානයෙන් දැනීම පිණිස සම්‍යක් සම්බෝධිය පිණිස නිවන් පිණිස පවතිත්.

ඒ සත කවරහු ද යත්?

මෞද්ගල්‍යායනය, **සතිසම්බොධ්‍යාඞ්ගය** මා විසින් කියන ලදි. වඩන ලදි. නැවත නැවතත් පුරුදු කරන ලදී. එය දැනීම පිණිස මනාව දැනීම පිණිස නිවන් පිණිස පවත්නේ ය.

**ධම්ම විචය සම්බොජ්ඣඞ්ගය, වීරිය සම්බොජ්ඣඞ්ගය, ප්‍රීති සම්බොජ්ඣඞ්ගය, පස්සද්ධි සම්බොජ්ඣඞ්ගය, සමාධි සම්බොජ්ඣඞ්ගය, උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගය** පෙර සේම ය.

මෞද්ගල්‍යායනය, මේ බොජ්ඣඞ්ග සත මා විසින් මනාව කියන ලදහ. වඩන ලදහ. නැවත නැවතත් පුරුදු කරන ලදහ. ඔවුහු යහපත් දැනීම පිණිස මනා අවබෝධය පිණිස නිවන් පිණිස පවතිත්.

භාග්‍යවතුන් වහන්ස, බොජ්ඣඞ්ග ධර්මයෝ මැනවි. ඒකාන්තයෙන් මැනවැ යි පැවසූහ. භාග්‍යවතුන් වහන්සේ මේ දේශනාව වදාළ සේක. සතුටු වූ ආයුෂ්මත් මහා මෞද්ගල්‍යායන ස්ථවිර තෙමේ භාග්‍යවතුන් වහන්සේ ගේ දේශනාව හොඳින් පිළිගත්තේ ය.

ආයුෂ්මත් මහා මෞද්ගල්‍යායන ස්ථවිර තෙම ඒ ලෙඩෙන් නැගිට්ටේ ය. ආයුෂ්මත් මහා මෞද්ගල්‍යායන ස්ථවිරයන් වහන්සේ ගේ ඒ රෝගය එයින් ම දුරු වූයේ ය.

Non-Commercial Distribution

# මහා චුන්දත්ථෙර බොජ්ඣඞ්ගය

මා විසින් මෙසේ අසන ලදි. එක් සමයෙක්හි **භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර සමීපයෙහි වූ වෙළුවන විහාරයෙහි** වැඩ වසන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ ගිලන් වූයේ, දුක් වූයේ බලවත් ලෙස ගිලන් බවට පැමිණි සේක.

ඉක්බිති ආයුෂ්මත් **මහා චුන්ද ස්ථවිර** තෙම සවස් භාගයෙහි ඵල සමවතින් නැගී සිටියේ භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක ද එතැනට වැඩියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේට වැඳ එකත්පසෙක හුන්නේ ය. එකත් පසෙක හුන්නා වූ ආයුෂ්මත් මහා චුන්ද ස්ථවිරයන් වහන්සේට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.

චුන්දය ඔබට **බොජ්ඣඞ්ග ධර්මයෝ** වැටහෙත්වා.

ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, මේ **සප්ත බොජ්ඣඞ්ග ධර්මයෝ** භාග්‍යවතුන් වහන්සේ විසින් මනාකොට වදාරන ලදහ. වඩන ලදහ. නැවත නැවතත් පුරුදු කරන ලදහ. ඔවුහු විශිෂ්ට ඥානය පිණිස සම්‍යක් සම්බෝධිය පිණිස නිවන් පිණිස පවතිත්.

ඒ කවර සතක් ද යත්?.

ස්වාමීනි, **සති සම්බොජ්ඣඞ්ගය** භාග්‍යවතුන් වහන්සේ විසින් මැනවින් වදාරණ ලද්දේ ය. වඩන ලද්දේය. නැවත නැවතත් පුරුදු කරන ලද්දේ ය. එය මනාව දැනීම පිණිස යහපත් අවබෝධය පිණිස නිවන් පිණිස පවතියි.

**ධම්ම විචය සම්බොජ්ඣඞ්ගය, විරිය සම්බොජ්ඣඞ්ගය, ප්‍රීති සම්බොජ්ඣඞ්ගය, පස්සද්ධි සම්බොජ්ඣඞ්ගය, සමාධි සම්බොජ්ඣඞ්ගය, උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගය** ද පෙර සේමැ යි.

ස්වාමීනි, මේ සප්ත බොජ්ඣඞ්ග ධර්මයෝ භාග්‍යවතුන් වහන්සේ විසින් මැනවින් දෙසන ලද්දාහු ය. වඩන ලද්දාහු ය. නැවත නැවතත් වඩන ලද්දාහු ය. ඔවුහු යහපත් දැනීම පිණිස, සම්‍යක් සම්බෝධිය පිණිස නිවන් පිණිස පවත්නාහ.

චුන්දය, බොධ්‍යඞ්ග ධර්මයෝ ඒකාන්තයෙන් සත්‍යය, චුන්දය බොධ්‍යඞ්ග ධර්මයෝ ඒකාන්තයෙන් සත්‍යය යි වදාළහ.

ආයුෂ්මත් චුන්ද ස්ථවිරයන් වහන්සේ මේ ධර්මය ප්‍රකාශ කළ සේක. භාග්‍යවතුන් වහන්සේ එය සතුටින් පිළිගත්හ. භාග්‍යවතුන් වහන්සේ එම ලෙඩින් නැගී සිටි සේක. උන්වහන්සේ ගේ රෝගාබාධය එයින් ම සුව වූයේ ය.

# ගිරිමානන්ද සූත්‍රය.

එක් කලෙක **භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහි ජේතවන නම් අරම්හි** වැඩ වසන සේක. එකල්හි ආයුෂ්මත් **ගිරිමානන්ද ස්ථවිර** තෙමේ හටගත් ආබාධ ඇත්තේ දුකට පැමිණියේ දැඩි ගිලන් බව ඇත්තේ වෙයි. එකල්හි ආයුෂ්මත් **ආනන්ද ස්ථවිර** තෙමේ භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ

Non-Commercial Distribution

එකත්පස්ව හුන්නේ ය. එකත්පස්ව හුන් ආනන්ද ස්ථවිර තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීයේ ය:

භාග්‍යවතුන් වහන්ස, ආයුෂ්මත් **ගිරිමානන්ද** ස්ථවිර තෙමේ උපන් ආබාධ ඇත්තේ, පැමිණි දුක් ඇත්තේ දැඩිව ගිලන් වූයේ වෙයි. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ අනුකම්පා පිණිස ආයුෂ්මත් ගිරිමානන්ද තෙරුන් කරා වඩනා සේක් නම් මැනවි.

ආනන්දයෙනි, ඉදින් තෙපි ගිරිමානන්ද මහණහු වෙත එළඹ දස සංඥා කියහු නම්, යම් හෙයකින් දස සංඥා අසා ගිරිමානන්ද මහණහුගේ ඒ ආබාධය හේතු වශයෙන් සංසිඳෙන්නේ ය.

කවර දශයෙක් ද යත්?

**අනිත්‍ය සංඥය, අනාත්ම සංඥ ය, අශුභ සංඥ ය, ආදීනව සංඥ ය, ප්‍රහාණ සංඥ ය, විරාග සංඥ ය, නිරෝධ සංඥ ය, සියලු ලෝකයෙහි කලකිරීම් සංඛ්‍යාත සංඥ ය, සියලු සංස්කාරයන්හි අනිත්‍ය සංඥ ය, ආනාපාන සතිය** යන දශය යි.

ආනන්දයෙනි, **අනිත්‍ය සංඥව** කවරී ද?

ආනන්දයෙනි, මේ සස්නෙහි මහණ වලට ගියේ වේව යි. රුක්මුලට ගියේ වේව යි. ශුන්‍යාගාරයට ගියේ වේව යි මෙසේ නුවණින් සලකන්නේ ය. රූපය අනිත්‍ය ය, වේදනා අනිත්‍යය. සංඥ අනිත්‍ය ය. සංස්කාරයෝ අනිත්‍ය ය හ. විඥනය අනිත්‍ය ය. මෙසේ මේ පඤ්චෝපාදානස්ඛන්ධයන්හි අනිත්‍යානුදර්ශිව වසයි. ආනන්දයෙනි, මේ අනිත්‍ය සංඥය යි කියනු ලැබේ.

ආනන්දයෙනි, **අනාත්ම සංඥ** කවරහ යත්?

ආනන්දයෙනි, මේ සස්නෙහි මහණ වලට ගියේ වේවයි .......... මෙසේ නුවණින් සලකන්නේ ය. චක්ෂුව අනාත්ම ය. රූප ආනාත්ම ය. ශ්‍රෝතස අනාත්ම ය, ශබ්ද අනාත්ම ය, ඝ්‍රාණය අනාත්ම ය, ගන්ධය අනාත්ම ය, ජිව්හා අනාත්ම ය, රස අනාත්ම ය, කය අනාත්ම ය, ධර්‍ම අනාත්මය යි මෙසේ සවැදෑරුම් ආධ්‍යාත්මික බාහිර ආයතනයන්හි අනාත්මානුදර්ශීව වාසය කරයි. ආනන්දයෙනි, මේ අනාත්ම සංඥය යි කියනු ලැබේ.

ආනන්දයෙනි, **අශුභ සංඥ** කවරහ යත්?

ආනන්දයෙනි, මේ සස්නෙහි මහණ පා තලින් උඩ, කෙස් මතුයෙන් යට සම හිම් කොට ඇති නානාප්‍රකාර අසූචියෙන් පිරි මෙම කය ප්‍රත්‍යවේක්ෂා කරන්නේ ය. මේ කයෙහි කේශයෝ ය. රෝමයෝ ය, නිය ය, දත් ය, සම් ය, මාංශය ය, නහර ය, ඇට ය, ඇට මිදුලු ය, වකුගඩු ය, හෘදය ය, අක්මා ය, දලබුවය, බඩ දිව ය, පපු කැණ ය, අතුනු ය, අතුනු බහන ය, ඖදය්‍ය ය, පූරීෂ ය, පිත් ය, ශ්ලේස්මා ය, පූයා ය, ලේ ය, සෝදිය ය, මේදස් ය, කඳුළු ය, වුරුණු තෙල් ය, කෙළ ය, මුකුනු ය, සඳමිදුලු ය, මූ ය යන මොහු ඇතැයි මෙසේ මේ කයෙහි අශුභානුදර්ශීව වාසය කරයි. ආනන්දයෙනි මේ අශුභ සංඥය යයි කියනු ලැබේ.

ආනන්දයෙනි, **ආදිනව සංඥ** කවරහ යත්?

ආනන්දයෙනි, මේ සස්නෙහි මහණ වලට ගියේ වේව යි, රුක් මුලට ගියේ වේව යි, ශුන්‍යාගාරයට ගියේ වේව යි මෙසේ සලකන්නේ ය. බොහෝ දුක් ඇති මේ කය බොහෝ

Non-Commercial Distribution

ආදීනව ඇත්තේ ය. මෙසේ මේ කයෙහි විවිධ ආබාධයෝ උපදනාහ. ඔහු කවරහ යත්? චක්ඛු රෝග ය, සෝත රෝග ය, ඝාණ රෝග ය, ජිව්හා රෝග ය, කාය රෝග ය, සිස රෝග ය, කණ්ණ රෝග ය, මුඛ රෝග ය, දන්ත රෝග ය, කාස ය, ශ්වාස ය, පිනාස ය, දාහ ය, ජවර ය, කුච්ඡි රෝග ය, මුර්ඡා ය, පක්ඛන්දි කාය, ශූලා ය, විශූචිකා ය, කුෂ්ඨ ය, ගණ්ඩ ය, කිලාස ය, ස්වාස ය, අපස්මාරය ය, දද්දු ය, කණ්ඩු ය, කච්ඡු ය, රඛසා ය, විතච්ඡිකා ය, ලෝහිත පිත්ත ය, මධුමේහය, අංස ය, පිළිකා ය, භගන්දරා ය, පිතින් උපදනා ආබාධ ය, වාතයෙන් උපදනා ආබාධ ය, සන්නිපාතික ආබාධ ය, ඍතු පරිනාමයෙන් වන ආබාධ ය, විෂම පරිහාරයෙන් උපදනා ආබාධ ය, උපක්‍රමයෙන් උපදනා ආබාධ ය, කර්‍ම විපාකයෙන් උපදනා ආබාධ ය, ශීත ය, උෂ්ණය, සාය, පවස ය, උච්චාර ය, පස්සාව ය යි මෙසේ මේ කයෙහි ආදීනවානුදර්ශීව වෙසෙයි. ආනන්දයෙනි, මේ ආදි නවානුසංඥා යයි කියනු ලැබේ.

ආනන්දයෙනි, ප්‍රහාණ සංඥා කවරහ යත්?

ආනන්දයෙනි, මේ සස්නෙහි මහණ උපන් කාම විතර්ක නො ඉවසයි. දුරලයි, වෙසෙසින් දුරු කෙරෙයි. අභාවයට පමුණුවයි. උපන් විහිංසා විතර්කය නො ඉවසයි. දුරලයි, වෙසෙසින් දුරු කෙරෙයි. අභාවයට පමුණුවයි. උපනුපන් අකුශල ධර්‍ම නො ඉවසයි. දුරලයි. වෙසෙසින් දුරු කරයි. අභාවයට පමුණුවයි. ආනන්දයෙනි, මේ ප්‍රහාණ සංඥාවය යි කියනු ලැබේ.

ආනන්දයෙනි, විරාග සංඥා කවරහ යත්?

ආනන්දයෙනි, මේ සස්නෙහි මහණ වලට ගියේ වේව යි, රුක්මුලට ගියේ වේව යි, ශූන්‍යාගාරයට ගියේ වේව යි, මෙසේ සලකන්නේ ය. සර්‍ව සංස්කාරයන්ගේ යම්බඳු සමථයෙක් සර්‍වෝපධීන් ගේ දුරලීමෙක්, තෘෂ්ණාක්ෂයෙක්, විරාගයෙක්, නිර්‍වාණයෙක් වේ නම් එය ශාන්ත ය, එය ප්‍රණීත ය. මේ විරාග සංඥය යි කියනු ලැබේ.

ආනන්දයෙනි, නිරෝධ සංඥා කවරහ යත්?

ආනන්දයෙනි, මේ සස්නෙහි මහණ වලට ගියේ වේව යි, රුක්මුලට ගියේ වේව යි, ශූන්‍යාගාරයට ගියේ වේව යි, මෙසේ සලකන්නේ ය. සර්‍ව සංස්කාරයන්ගේ යම්බදු සමථයෙක් සර්‍වෝපධීන් ගේ දුරලීමෙක්, තෘෂ්ණාක්ෂයෙක්, විරාගයෙක්, නිරෝධයෙක් නිර්‍වාණයෙක් වේ නම් එය ශාන්ත ය, ආනන්දයෙනි, මේ නිරෝධ සංඥය යි කියනු ලැබේ.

ආනන්දයෙනි, සර්‍ව ලෝකයෙහි අනභිරත සංඥා කවරහ යත්?

ආනන්දයෙනි, මේ සස්නෙහි භික්ෂු නමක් ලෝකයෙහි පඤ්චස්කන්ධය පිළිබඳ ඇඩි ගැනීමක් හෝ සිත පිළිබඳ අරමුණු අනුව ඇතිවන කෙලෙස් හෝ වෙත් නම් ඔවුන් දුරු කරන්නේ වේ ද, ඇඩිව අල්වා නො ගන්නේ වේ ද, මෙය ලෝකයෙහි කලකිරීම් සහගත හැඟීමය යි කියනු ලැබේ.

ආනන්දයෙනි, සියලු සංස්කාරයන් කෙරෙහි අනිත්‍ය සංඥාව කවරහ යත්?

ආනන්දයෙනි, මේ සසුනෙහි මහණ තෙම හැම ප්‍රත්‍යුත්පන්න ධර්මයන්ගෙන් පෙළෙයි. ලජ්ජා වෙයි. පිළිකුල් කෙරෙයි. ආනන්දයෙනි, මේ සර්‍ව සංස්කාරයන් ගේ අනිත්‍ය සංඥාවය යි කියනු ලැබේ.

ආනන්දයෙනි, ආනාපානසති කවරහ යත්?

ආනන්දයෙනි, මේ සස්නෙහි මහණ වලට ගියේ වේව යි, රුක්මුලට ගියේ වේව යි, ශූන්‍යාගාරයට ගියේ වේව යි කය සෘජු කොට තබා සිහි පෙරටු කොට එළවා පලක් බැඳ හිඳියි. හේ සිහි ඇතිසේ ම ආශ්වාස කෙරෙයි. සිහි ඇතිසේ ම ප්‍රශ්වාස කෙරෙයි.

දීර්ඝ කොට ආශ්වාස කරනුයේ හෝ දීර්ඝ කොට ආශ්වාස කෙරෙමි යි දනී. දීර්ඝ කොට ප්‍රශ්වාස කරනුයේ හෝ දීර්ඝ කොට ප්‍රශ්වාස කරමි යි දනී. ලඝු කොට ආශ්වාස කරනුයේ හෝ ලඝු කොට ආශ්වාස කෙරෙමි යි දනී. ලඝු කොට ප්‍රශ්වාස කරනුයේ ලඝු කොට ප්‍රශ්වාස කරමි යි දනී. සකල ආශ්වාස කායය මුල මැද අග පහළ කරමින් ආශ්වාස කරමි යි හික්මෙයි. සකල ප්‍රශ්වාස කාය මුල මැද අග පහළ කරමින් ප්‍රශ්වාස කරමි යි හික්මෙයි. ඖදරික ආශ්වාස කාය සංස්කාරය සන්හිඳුවමින් ආශ්වාස කරමින් හික්මෙයි. ඖදාරික ප්‍රශ්වාස කාය සංස්කාරය සන්හිඳුවමින් ප්‍රශ්වාස කරමින් හික්මෙයි.

ප්‍රීතිය මොනවට දන්නේ ආශ්වාස කෙරෙමි යි හික්මෙයි. ප්‍රීතිය මොනවට දන්නේ ප්‍රශ්වාස කෙරෙමි යි හික්මෙයි. සුඛය මොනවට දන්නේ ආශ්වාස කෙරෙමි යි හික්මෙයි. සුඛය මොනවට දන්නේ ප්‍රශ්වාස කෙරෙමි යි හික්මෙයි. චිත්ත සංස්කාරය දන්නේ ආශ්වාස කෙරෙමි යි හික්මෙයි. චිත්ත සංස්කාරය දන්නේ ප්‍රශ්වාස කෙරෙමි යි හික්මෙයි. ඖදාරික චිත්ත සංස්කාර සංහිඳුවමින් ප්‍රශ්වාස කෙරෙමි යි හික්මෙයි. සිත දන්නේ ආශ්වාස කෙරෙමි යි හික්මෙයි. සිත දන්නේ ප්‍රශ්වාස කෙරෙමි යි හික්මෙයි. සිත පහන් කරවමින් ආශ්වාස කෙරෙමි යි හික්මෙයි. සිත පහන් කරවමින් ප්‍රශ්වාස කෙරෙමි යි හික්මෙයි. සිත අරමුණෙහි සමව තබමින් ආශ්වාස කෙරෙමි යි හික්මෙයි. සිත අරමුණෙහි සමව තබමින් ප්‍රශ්වාස කෙරෙමි යි හික්මෙයි. නීවරණයෙන් සිත මුදමින් ආශ්වාස කෙරෙමි යි හික්මෙයි. නීවරණයෙන් සිත මුදමින් ප්‍රශ්වාස කෙරෙමි යි හික්මෙයි.

අනිත්‍යානුදර්ශී වූවෙමි ආශ්වාස කෙරෙමි යි හික්මෙයි. අනිත්‍යානුදර්ශී වූවෙමිප්‍රශ්වාස කෙරෙමි යි හික්මෙයි. විරාගානුදර්ශී වූවෙමි ආශ්වාස කෙරෙමි යි හික්මෙයි. විරාගානුදර්ශී වූවෙමි ප්‍රශ්වාස කෙරෙමි යි හික්මෙයි. නිරෝධානුදර්ශී වූවෙමි ආශ්වාස කෙරෙමි යි හික්මෙයි. නිරෝධානුදර්ශී වූවෙමි ප්‍රශ්වාස කෙරෙමි යි හික්මෙයි. ප්‍රතිනිඃසර්ගානුදර්ශී වූවෙමි ආශ්වාස කෙරෙමි යි හික්මෙයි. ප්‍රතිනිඃසර්ගානුදර්ශී වූවෙමි ප්‍රශ්වාස කෙරෙමි යි හික්මෙයි. මේ **ආනාපාන සතිය** යි. කියනු ලැබේ.

ආනන්දයෙනි, ඉදින් තෙපි ගිරිමානන්ද මහණහු වෙත ගොස් මේ දස සංඥා කියවු නම් යම් හෙයකින් මේ දශ සංඥා අසා ගිරිමානන්ද මහණහු ගේ ඒ ආබාධය හේතු විසින් සංහිඳෙන්නේ ය. යන මේ කාරණය ඇත.

එකල්හි ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ හමුවෙහි මේ දශ සංඥා උගෙන ආයුෂ්මත් ගිරිමානන්ද තෙරුන් කරා එළඹිය හ. එළඹ ආයුෂ්මත් ගිරිමානන්ද තෙරුන්ට මේ දශ සංඥා කීහ. ඉක්බිති මේ දශ සංඥා අසා ආයුෂ්මත් ගිරිමානන්ද තෙරුන් ගේ ආබාධය හේතු විසින් සන්හිඳුනේ ය. ආයුෂ්මත් ගිරිමානන්ද තෙරණුවෝත් ඒ ආබාධයෙන් නැගී සිටියේ ය. ආයුෂ්මත් ගිරිමානන්ද තෙරුන් ගේ ඒ ආබාධය එසේ ප්‍රහීණ වූයේ ය.

# ඉසිගිලි සූත්‍රය

බුද්ධ, ධම්ම, සංඝ යන ත්‍රිවිධ රත්නයේ ගුණ දැක්වෙන පිරිත් නිමවා පසේ බුදුවරයින් ගේ ගුණ දැක්වෙන එක ම සූත්‍රය වන ඉසිගිලි සූත්‍රය දන්වන ලදී.

එක් කලෙක සවස් වේලෙහි බුදුන් වහන්සේ එල සමවතට සම වැද එයින් නැගී ගඳකිළියෙන් නික්ම භික්ෂු සංඝයා පිරිවරාගෙන පර්වත පස පෙනෙන මානයේ හිඳ එයත් හඳුන්වා දුන්හ.

බුදුරජාණන් වහන්සේට සෙසු පර්වත හැඳින්වීමට අනවශ්‍ය වුවත් ඉසිගිලි පව්ව හැඳින්වීමෙන් පන්සියයක් පසේ බුදුවරයන්ගේ නම් හා පද්මාවතී දේවියගේ ප්‍රාර්ථනාවත් පැහැදිලි වන නිසා සෙසු පර්වත ද හැඳින්වීමට අවශ්‍ය විය.

පන්සීයක් පසේ බුදුවරයන් වහන්සේලා රජගහ නුවර පිඬු සිඟා හැසිර ඉසිගිලි පර්වතය දෙබෑදොරක් විවෘත කරන්නාක් මෙන් විවෘත කර එහි ඇතුළට පිවිස රෑ වසන තැන් හා දිවා වසන තැන් පිළියෙල කොට ගෙන විසූහ. එය බලා සිටින්නවුනට එසේ පිවිසෙන පසේ බුදුවරයින් දක්නට ලැබෙනු මිස පිවිස යනු දක්නට නො ලැබේ. ඒ නිසා මේ පර්වතය ඍෂීන් ගිල ගනිති යි ඉසිගිලි නම් විය. මේ සූත්‍රයේ පසේ බුදුවරයන් පන්සිය නමක ගේ නම් දැක්වෙයි. ඇතැම් නමකින් දහ දොළොස් නම සිටි බව කිය වේ.

මා විසින් මෙසේ අසන ලදි. එක් සමයෙක්හි **භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර ඉසිගිලි** පව්වෙහි වැඩ වසන සේක. එකල්හි එහි දී භාග්‍යවතුන් වහන්සේ මහණෙනි යි භික්ෂූන් අඬගා වදාළ සේක. 'පින්වතුන් වහන්ස' යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස් වූහ. භාග්‍යවතුන් වහන්සේ මේ **ඉසිගිලි සූත්‍රය** වදාළ සේක.

මහණෙනි, තෙපි තෙල **වෙභාර පර්වතය** දක්නහු ද?

වහන්ස, එසේ ය, මහණෙනි, මේ වෙභාර පර්වතයට අනික් නමෙක් විය. අනික් පැණවීමක් විය.

මහණෙනි, තෙපි තෙල **පාණ්ඩව පර්වතය** දක්නහු ද?

වහන්ස, එසේ ය. මේ පාණ්ඩව පර්වතයට අනික් නමෙක් විය. අනික් පැණවීමක් විය.

මහණෙනි, තෙපි තෙල **වෙපුල්‍ය පර්වතය** දක්නහු ද?

වහන්ස, එසේ ය. මේ වෙපුල්‍ය පර්වතයට ද අනික් නමෙක් විය. අනික් පැණවීමක් විය.

මහණෙනි, තෙපි තෙල **ගෘධ්‍රකූට පර්වතය** දක්නහු ද?

වහන්ස, එසේ ය. මේ ගෘධ්‍රකූට පර්වතයට ද අනික් නමෙක් විය. අනික් පැණවීමක් විය.

මහණෙනි, තෙපි මේ **ඉසිගිලි පර්වතය** දක්නහු ද?

එසේය වහන්ස.

Non-Commercial Distribution

මහණෙනි, මේ ඉසිගිලි පර්වතයට තෙල සංඥව ම විය. තෙල ප්‍රඥප්තිය ම විය. මහණෙනි, පෙර වූවක් කියමි. මේ ඉසිගිලි පර්වතයෙහි පන්සියයක් පසේ බුදුහු බොහෝ කලක් වාසය කළාහු ය. ඔහු මේ පර්වතයට පිවිසෙන්නාහු දක්නා ලැබෙති. පිවිසියාහු නො දක්නා ලැබෙති. ඒ දැක මනුෂ්‍යයෝ මෙසේ කීහ: මේ පර්වතය මේ මේ ප්‍රත්‍යෙකබුද්ධ ඍෂින් ගිල ගනී යයි.

එහෙයින් 'ඉසිගිලි ඉසිගිලි' යි කියා ම නම උපන. මහණෙනි, පසේ බුදුවරුන් ගේ නම් පවසන්නෙමි. නම් කීර්තනය කරන්නෙමි. මහණෙනි, පසේ බුදුවරයින් ගේ නම් දෙසන්නෙමි. ඒ අසවු. මොනොවට මෙනෙහි කරවු. කියන්නෙමි.

'එසේ යැ වහන්සැ' යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ. භාග්‍යවතුන් වහන්සේ තෙල වදාළ සේක:

මහණෙනි, අරිට්ඨ නම් පසේ බුදුහු මේ ඉසිගිලි පව්වෙහි බොහෝ කල් විසූහ. මහණෙනි, උපරිට්ඨ නම් පසේ බුදුහු, තගරසිඛී නම් පසේ බුදුහු, යසස්සී නම් පසේ බුදුහු, සුදස්සන නම් පසේ බුදුහු, පියදස්සී නම් පසේ බුදුහු, ගන්ධාර නම් පසේ බුදුහු, පිණ්ඩොල නම් පසේ බුදුහු, උපාසභ නම් පසේ බුදුහු, නීත නම් පසේ බුදුහු, තථ නම් පසේ බුදුහු, සුතවන්තු නම් පසේ බුදුහු, භාවිතත්ත නම් පසේ බුදුහු මේ ඉසිගිලි පව්වෙහි බොහෝ කල් විසූහ.

1. සත්වයන් කෙරෙහි සාර වූ හෙවත් උත්තම සත්ව වූ නිදුක් වූ නිස්තෘෂ්ණ වූ යම් පසේ බුදු කෙනෙක් වෙන වෙන ම සතර මාර්ගඥාන බොධිය අවබෝධ කළාහු ද විගත වූ රාගාදී ශල්‍ය ඇති ඒ නරෝත්තමයන් ගේ නාමයන් කීර්තනය කරන්නා වූ මාගේ බසින් අසවු.

2. අරිට්ඨ ය, උපරිට්ඨ ය, තගරසිඛී ය, යසස්සි ය, සුදස්සන ය, පියදස්සී බුද්ධ ය, ගන්ධාර ය, පිණ්ඩෝල ය, උපාසභ ය, නීත ය, තථ ය, සුතවන්තු ය, භාවිතත්ත ය යන පසේ බුදුහු ද,

3. සුම්භ ය, සුභ ය, මේථුල ය, අට්ඨම ය, යළි සුමේධ ය, අනීඝ ය, සුදාඨෝ ය, හිංගු ය, හිංග ය යන මහත් ආනුභාව ඇති භවනෙත්ති සංඛ්‍යාත තෘෂ්ණාක්ෂය කළ පසේ බුදුහු ය.

4. චුල්ලජාලි - මහාජාලි යයි නම් ඇති දෙ මුනිහු ය, අට්ඨක බුදුහු ය, නැවත කෝසල බුද්ධ ය යළී සුබාහු ය උපනේමිස ය, නේමිස ය, සන්තචිත්ත ය, සච්ච ය, තථ ය, විරජ ය, පණ්ඩිත ය යන පසේ බුදුහු ද,

5. කාල - උපකාල යන දෙ බුදුහු ය, විජිත ය, අංග ය, පංග ය, ගුතිජ්ජිත ය, පස්සී නම් ඒ පසේ බුදුහු ස්ඛන්ධ දුඃඛයට මුල වූ උපධිහල ය, අපරාජිත නම් පසේ බුදුහු මාරබල දිනූය.

6. සත්‍ථු, පවත්තු, සරභංග, ලෝමහංස, උච්චංගමා ය යන නම් ඇති පසේ බුදුහු ය. අසිත, අනාසව, මනෝම ය යන තුන් පසේ බුදුහු ය. නව විධ මාන පසුන් කළ

බන්ධුමන්තු නම් පසේ බුදුහු ය, තදාධිමුත්ත ය, විමල ය, කේතුමන්තු ය පසේ බුදුහු ද,

7. කේතුම්බරාග ය, මාතංග ය, අරිය ය යන තුන් පසේ බුදුහු ය. යළි අච්චුතය, අච්චුතගාමබ්‍යාමක ය යන පසේ බුදුහු දෙදෙන ය. සුමංගල, දබ්බිල, සුප්පතිට්ඨිත, අසය්හ යන පසේ බුදුහු ය, ඛේමාභිරත ය, සෝරත ය යන පසේ බුදුහු දෙදෙන ද,

8. දුරන්න ය, සංඝ යන පසේ බුදුහු ය, යළිදු උච්ච ය, අලාමක වීර්‍ය ඇති සය්හ නම් අන්‍ය පසේ බුදු මුනිවරයෙක, ආනන්ද නන්ද, උපනන්ද යන සිය දෙනෙකුන් බැගින් දොළොස් පසේ බුදු කෙනෙක, අන්තිම ශරීරය ධරන භාරද්වාජ නම් පසේ බුදුහු ද,

9. බෝධි, මහානාම යන පසේ බුදුහු ය, යළිදු උත්තර, කේසී, සිඛි, සුන්දරභාරද්වාජ යන පසේ බුදුහු ය, තෘෂ්ණා පසුන් කළ සීදරී නම් පසේ බුදුහු ද,

10. වීතරාග වූ මංගල පසේ බුදුහු ද වූහ. පස්කඳ දුකට මුල් වූ තෘෂ්ණාජාලිනිය සුන් කළ උසභ නම් පසේ බුදුහු ය, ශාන්ත පදයට පැමිණි උපනීත ය, උපෝසථ ය, සුන්දර ය සච්ච නාම ය.

11. ජේත, ජයන්ත, පදුම, උප්පල යන සිව් පසේ බුදුහු ද, පදුමුත්තර, රක්ඛිත, පබ්බත යන තුන් පසේ බුදුහු ද, මානත්ථද්ධ, සෝභිත, විතරාග යන පසේ බුදුහු ද, මොනවට කෙලෙසුන් කෙරෙන් මිදුනු සිත් ඇති කණ්හ නම් පසේ බුදුහු ද,

12. නාම විසින් පෙළ ආ තෙල පසේ බුදුහු ද, ක්ෂය කළ භව තෘෂ්ණාව ඇති අන්‍යවූත් යම් පසේ බුදු කෙනෙක් ඇත් ද, සියලු ක්ලේශයන් ඉක්මවා ගිය ස්කන්ධ පරිනිර්‍වාණයෙන් පිරිනිවන් වන් ගුණ විසින් අප්‍රමේය වූ ප්‍රත්‍යෙක බුද්ධ මහර්ෂීන්ට නමස්කාර කරව.

**දෙවන බණවර නිමි**

•••••••••••••••

Non-Commercial Distribution

# III බණවර

## 1. ධම්මචක්කප්පවත්තන සූත්‍රය

බරණැස ඉසිපතන නම් වූ මිගදායෙහි දී ඇසළ පුණු පොහෝ දින පස්වග තවුසන් අමතා දම්සක් පැවතුම් සූත්‍රය දෙසූ සේක. එය බුදුරජාණන් වහන්සේ ගේ ප්‍රථම ධර්ම දේශනාවයි. එසේ ම එය ත්‍රිපිටකයේ සාරය යි. එහි දී මහණුන් විසින් හල යුතු අංග දෙක පෙන්වා දුන් බුදුන් වහන්සේ අනුගමනය කළ යුතු මැදි පිළිවෙත පෙන්වා දුන්හ. මෙහි එන චතුස්සත්‍යය ත්‍රිපරිවෘත්තයකින් හා ද්වාදශාකාරයකින් සමන්විත විය. මේ දේශනාව ඇසීමෙන් කොණ්ඩඤ්ඤ තවුසාට ධර්ම චක්ෂුස පහළ විය.

මා විසින් මෙසේ අසන ලදි. එක් සමයෙක **භාග්‍යවතුන් වහන්සේ බරණැස සමීපයෙහි මිගදාය නම් වූ ඉසිපතනාරාමයෙහි** වැඩ වසන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ පස්වග මහණුන් ඇමතූ සේක. මහණෙනි, ළාමක වූ ගැමි දහමක් වූ පුහුදුනුන් විසින් සෙවුණු ආර්‍යයන් සතු නොවූ අවැඩ ඇසුරු කළ කාම වස්තූන් කෙරෙහි යම් මේ ක්ලේශ කාමයෙහි පුන පුනා යෙදීමකුත් වේ ද, දුක් වූ ආර්‍යයන් සතු නොවූ අවැඩ ඇසුරු කළ යම් මේ සිරුර පෙළීමෙහි පුන පුනා යෙදීමකුත් වේ ද, පැවිද්දහු විසින් මේ අන්ත දෙක නො සෙවිය යුතු යි. මහණෙනි, තථාගතයන් විසින් ඒ මේ අන්ත දෙකට නො පැමිණ පැණැස ඇති කරන නුවණැස ඇති කරන මැදුම් පිළිවෙත අවබෝධ කරන ලද්දේ කෙලෙස් සංසිඳුවීම පිණිස, වෙසෙස් දැනුම පිණිස, සිවුසස් දැනුම පිණිස, නිවන් පිණිස පවතී. මහණෙනි, තථාගතයන් විසින් අවබෝධ කරන ලද පැණැස ඇති කරන, නුවණ ඇස ඇති කරන ඒ කවර නම් මැදුම් පිළිවෙතක් කෙලෙස් සංහිඳුවීම පිණිස, වෙසෙස් දැනුම පිණිස, සිවුසස් දැනුම පිණිස, නිවන් පිණිස පවතී ද යත්? මේ අරිඅටඟි මග මැ යි, එනම්: **සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව, සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි**'යි. මහණෙනි, පැණැස ඇති කරන, නුවණ ඇස ඇති කරන ඒ මේ මැදුම් පිළිවෙත තථාගතයන් විසින් අවබෝධ කරන ලද්දේ කෙලෙස් සංසිඳුවීම පිණිස, වෙසෙස් දැනුම පිණිස, සිවුසස් දැනුම පිණිස, නිවන් පිණිස පවතී.

මහණෙනි, මේ වූ කලි, **දුක්ඛාර්‍ය සත්‍යය** යි. ඉපදීමත් දුක් ය, ජරාවත් දුක් ය, ව්‍යාධියත් දුක් ය, මරණයත් දුක් ය, අප්‍රියයන් හා එක්වීමත් දුක් ය, ප්‍රියයන් ගෙන් වෙන්වීමත් දුක් ය, කැමැති දැ නො ලැබීමත් දුක් ය, සැකෙවින් පඤ්ච උපාදානස්කන්ධයෝ දුක් ය. මහණෙනි, මේ වූ කලී **දුක්ඛ සමුදයාර්‍ය සත්‍යය** යි. පුනර්භවය ඇති කරන නන්දිරාගය සහගිය ඒ ඒ භවයන්හි ඇල්ම ඇති කරන යම් තෘෂ්ණාවක් වේ ද, එනම්: **කාම තණ්හා** (කාම වස්තූන් කෙරෙහි පවත්නා තෘෂ්ණාව) **භවතණ්හා** (ශාස්වත දෘෂ්ටි සහගත තෘෂ්ණාව) **විභව තණ්හා** (උච්ඡේද දෘෂ්ටිසහගත තෘෂ්ණාව) යි. මහණෙනි, මේ වූ කලි, **දුක්ඛනිරෝධාර්‍ය සත්‍යය** යි, ඒ තෘෂ්ණාවේ ම යම් නිරවශේෂයෙන් නො ඇලීම් සංඛ්‍යාත නිරෝධයෙක් දුරලීමෙක් අත්හැරීමෙක් මිදීමෙක් නො ඇල්මෙක් වේ ද, එය යි. මහණෙනි, මේ වූ කලි, **දුක්ඛ නිරෝධ ගාමිණි ප්‍රතිපදාර්‍ය සත්‍යය** යි. මේ ආර්‍යඅෂ්ටාංගික මාර්ගය ම ය. එනම්: සම්මාදිට්ඨිය .... සම්මා සමාධිය යි.

Non-Commercial Distribution

මහණෙනි මට මේ දුක්ඛ ආර්‍ය්‍ය සත්‍යය යි, පෙර නොඇසූ විරූ ධර්‍ම විෂයෙහි චතුස්සත්‍යය ඥාන චක්‍ෂුසය පහළ විය. එහි දැනීම ඇති විය. ප්‍රඥාව ඇති විය. විද්‍යාව හෙවත් නුවණ ඇති විය. අවිද්‍යාන්ධකාරය දුරු කරන ඥානාලෝකය පහළ විය.

මහණෙනි, ඒ මේ දුක්ඛාර්‍ය්‍ය සත්‍යය පිළිබඳ දත යුතුය යි .............

මේ දුක්ඛ සමුදයාර්‍ය්‍ය සත්‍යය යි - ඒ මේ දුක්ඛ සමුදය දුරු කළ යුතු යි.

මේ දුක්ඛ නිරෝධාර්‍ය්‍ය සත්‍යය යි. මේ දුක්ඛ නිරෝධය නම් වූ නිවන නුවණින් ප්‍රත්‍යක්ෂ කළ යුතුය යි - මේ දුක්ඛ නිරෝධාර්‍ය්‍ය සත්‍යය නුවණින් ප්‍රත්‍යක්‍ෂ කරන ලද්දේය යි .............

මේ දුක්ඛ නිරෝධගාමිනී ප්‍රතිපදාර්‍ය්‍යසත්‍යය යි - මේ දුක්ඛ නිරෝධගාමිනී ප්‍රතිපදාව වැඩිය යුතුය යි - මේ දුක්ඛ නිරෝධගාමිනී ප්‍රතිපදාව මා විසින් වඩනා ලදැ යි පෙර නො ඇසූවිරූ ධර්‍ම විෂයයෙහි ප්‍රඥා චක්ෂුස පහළ විය. චතුස්සත්‍යඥානය, එහි ප්‍රඥාව, විශිෂ්ට දැනුම, එයින් නිර්වාණාලෝකය පහළ විය.

මහණෙනි මම යම්තාක් කල් මට චතුස්සත්‍ය ධර්‍ම විෂයයෙහි ත්‍රිපරිවෘත්තයක් හා දොළොස් ආකාරයක් ඇති තත් වූ පරිදි පිරිසිදු අවබෝධයක් නො වූයේ ද, මහණෙනි, දෙවියන් සහිත, මරුන් සහිත, බඹුන් සහිත ලෝකයෙහි ද, මහණ බමුණන් සහිත ප්‍රජාව අතරෙහි ද උතුම් වූ සම්බෝධිය ප්‍රත්‍යක්ෂ කෙළෙම් යයි ප්‍රතිඥා නො කෙළෙම්.

මහණෙනි, යම් අවස්ථාවක පටන් මට මේ චතුස්සත්‍ය ධර්‍ම විෂයයෙහි මෙසේ තුන් පෙරළියකින් හා දොළොස් ආකාරයෙන් යුත් තත් වූ පරිදි ඥාන දර්‍ශනය පිරිසිදු වූයේ ද, මහණෙනි, එකල්හි මම දෙවියන්, මරුන්, බඹුන් සහිත ලෝකයෙහි මහණ බමුණන් හා දෙව් මිනිසුන් සහිත ප්‍රජාව අතරෙහි උතුම් වූ සම්‍යක් සම්බෝධිය අවබෝධ කෙළෙම් යි ප්‍රතිඥා කෙළෙම්. චතුස්සත්‍ය ධර්‍මයන් කෙරෙහි මට ඥාන දර්ශනය පහළ විය. මාගේ චේතෝවිමුක්ති නම් වූ අර්හත් ඵල සමාධිය අකෝප්‍ය විය. මෝ තොමෝ අන්තිම උත්පත්තිය වන්නී ය. දැන් (මට) පුනරුත්පත්තියක් නැත යනුයි. භාග්‍යවතුන් වහන්සේ මේ දම්සක් පැවතුම් සූත්‍ර දේශනාව වදාළ සේක. සතුටු සිත් ඇති පස්වග භික්ෂූන් වහන්සේලා භාග්‍යවතුන් වහන්සේගේ දේශනාව සතුටින් පිළිගත්හ. යම් කිසිවක් ඇතිවීම ස්වභාව කොට ඇත්තේ වී නම් ඒ සියල්ල නැතිවීම ස්වභාව කොට ඇත්තේ ය යන නුවණයි. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙසේ දම්සක් පැවැත් වූ කල්හි භූමිනිශ්‍රිත දෙවියෝ සාධුකාර දුන්හ. බුදුරදුන් වහන්සේ විසින් බරණැස ඉසිපතන මිගදායෙහි ශ්‍රමණයකු විසින් හෝ බ්‍රාහ්මණයකු විසින් හෝ මාරයකු විසින් හෝ බ්‍රහ්මයකු විසින් හෝ ලෝකයෙහි අන් කිසිවකු විසින් හෝ නො පැවැත්විය හැකි ධර්මචක්‍රය පවත්වන ලදැ යි කියා යි.

භූමිනිශ්‍රිත දෙවියන්ගේ සාධුකාර ශබ්දය අසා චාතුර්මහාරාජික දෙවියෝ ද, ඔවුන් ගේ සාධුකාර ශබ්දය අසා තාවතිංස දෙවියෝ ද, යාම තුසිත නිම්මානරති පරනිම්මිතවසවර්ති දෙවියෝ ද, ඔවුන්ගේ සාධුකාර ශබ්දය අසා බ්‍රහ්ම පාරිෂද්‍ය බඹලොව බ්‍රහ්මයෝ ද, බ්‍රහ්ම පුරෝහිත, මහා බ්‍රහ්ම, පරිත්තාභ, අප්පමාණාභ, ආභස්සර, පරිත්තසුභ, අප්පමාණසුභ,

Non-Commercial Distribution

සුභකිණ්හ, වේහප්ඵල, අවිහ, අතප්ප, සුදස්ස, සුදස්සි, අකනිට්ඨ බඹලොව වාසී බ්‍රහ්මයෝ ද සාධුකාර දුන්හ.

මෙසේ එකෙණෙහි ඒ මොහොතෙහි අකනිටා බඹලොව දක්වා සාධුකාර ශබ්දය ඉතා උස්ව පැන නැංගේ ය. මේ දශ සහශ්‍රී ලෝක ධාතුව කම්පා විය. අතිශයින් කම්පා විය. වෙව්ලන්නට පටන් ගත්තේ ය. දෙවියන්ගේ දේවතානුභාවය ඉක්මවා අප්‍රමාණ වූ මහත් වූ ආලෝකයක් පහළ විය.

එකල්හි භාග්‍යවතුන් වහන්සේ මෙසේ ප්‍රීති වාක්‍යය පහළ කළ සේක. පින්වත් කොණ්ඩඤ්ඤ තෙම චතුස්සත්‍යය අවබෝධ කළේ ය. පින්වත් කොණ්ඩඤ්ඤ තෙම චතුස්සත්‍යය අවබෝධ කළේ ය. හෙවත් නිවන් දුටුවේ ය කියායි.

මෙසේ මේ කාරණය නිමිති කොට ගෙන ආයුෂ්මත් කොණ්ඩඤ්ඤ ස්ථවිරයන් වහන්සේට අඤ්ඤාකොණ්ඩඤ්ඤය යන නමෙක් විය.

## 2. මහසමය සූත්‍රය

බුදුන් වහන්සේ ශාක්‍ය - කෝලිය දෙ පිරිසෙන් පැවිදි වූ පන්සියයක් භික්ෂු සංඝයා සමග ශාක්‍ය ජනපදයේ කිඹුල්වත් පුර අසල මහා වනයට වැඩ ම වූහ. අසිරිමත් මේ මහා සමාගමය දැකීමට දෙවියෝ රැස් වූහ. ඒ සමාගමයයෙහි දී මේ සූත්‍රය දෙසූහ.

මහාවස්තු නමැති මහාසාංඝික බෞද්ධ සංස්කෘත ග්‍රන්ථයේ ද මෙවැනි දේවතා නාමාවලියක් දැක්වේ.

මා විසින් මෙසේ අසන ලදි.

එක් සමයෙක භාග්‍යවතුන් වහන්සේ ශාක්‍ය ජනපදයෙහි කිඹුල්වත් පුර අසල මහා වෙනෙහි සියලුදෙනා ම රහත් වූ පන්සියයක් පමණ වූ මහත් භික්ෂු සමූහයක් හා වැඩ වසන සේක. දස දහසක් ලෝදායෙනුත් භගවත් බුදු රජුන් ද, බික් සඟන ද දක්නා පිණිස දෙවියෝ බෙහෙවින් මුළු දෙවුණාහු වෙත්. එකල්හි මේ භාග්‍යවතුන් වහන්සේ වනාහි ශාක්‍ය ජනපදයෙහි කිඹුල්වත්පුර අසල මහා වෙනෙහි සියලු දෙනාම රහත් වූ භික්ෂූන් පන්සියයක් පමණ වූ මහත් මහණ මුළුවක් හා වැඩ වසන සේක. දස දහසක් ලෝදායෙන් ද භාග්‍යවතුන් වහන්සේත් භික්ෂු සංඝයාත් දක්නා පිණිස දෙවියෝ බෙහෙවින් මුළු දෙවුණාහු වෙත්. අපිදු භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹෙන්නමෝ නම්, එළඹ භාග්‍යවතුන් වහන්සේ ගේ සමීපයෙහි එක් එක් ගයක් කියන්නමෝ නම් යෙහෙකැ'යි සතර සුදවැසි දෙවියනට මේ සිත විය.

ඉක්බිති ඒ දෙවියෝ බලවත් මිනිසෙකු වක් කළ අතක් දික් කරන්නාක් මෙන් ද දික් කළ අතක් වක් කරන්නාක් මෙන් ද ශුද්ධාවාස දෙවියන් අතුරෙන් අතුරුදන් වූවාහු භාග්‍යවතුන් වහන්සේ ඉදිරියෙහි පහළ වූවාහු ය. එයට පසු ඒ දෙවියෝ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත් පසෙක සිටියා වූ ම එක් දෙවියෙක් බුදුරදුන් හමුවෙහි මේ ගාථාව කීයේ ය.

Non-Commercial Distribution

“මේ මහා වනයෙහි දිව්‍ය සමූහයා රැස් වූ මහා සමාගමයයෙකි. කෙලෙසුන් ගෙන් නො පැරදුණු මහා සංඝයා දක්නට මේ සමාගමයට පැමිණියෙමු.”

ඉක්බිති අන් දෙවියෙක් භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථාව කීයේ ය.

එහි රැස්වූ සියලු භික්ෂූහු තමන් සිත එකඟ කළහ. තමන් ගේ සිත ඍජු කළහ. සාරථියක්හු රැහැන් ගෙන රිය හසුරුවන්නාක් මෙන් නැණැත්තෝ ඉඳුරන් රකිති’යි පැවසී ය.

ඒ රහත්හු පසැස් ඇති බුදුරදුන් විසින් මොනවට දැමුණාහු කෙලෙස් හුල සිඳ, කෙලෙස් තණයම සිඳ රාග ද්වේශ මෝහ ඉන්ද්‍රකීලය උදුරා පියා, තෘෂ්ණා නැතිව, පිරිසිදු ව නිර්මල ව හැසිරෙත් යි පැවසීය.

එකල අන් දෙවියෙක් භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹ,

යම් කෙනෙක් බුදුන් සරණ ගියාහු ද, ඔහු අපායට නො යන්නාහ. මිනිස් කය හැර දෙව් මුළුව සපුරන්නාහ’යි පැවසී ය.

ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ මහණුන් අමතා: “මහණෙනි, බොහෝ සෙයින් දස දහසක් ලෝධාහි දෙවියෝ තථාගතයන් ද, බික් සඟන ද දක්නට මුළුදෙවුනාහු වෙති. මහණෙනි, ඉකුත් කල යම් සම්මා සම්බුදු කෙනෙක් වූහු ද, ඒ භගවත් බුදුවරුන් ගේ ද, දැන් මෙසමයෙහි මගේ මෙන් මෙපමණ වූ දෙවියෝ රැස්වූහ. මහණෙනි, අනාගතයෙහි යම් රහත් සම්මා සම්බුදු කෙනෙක් වන්නාහු ද, ඔවුන් ගේ ද දැන් මෙසමයෙහි මෙන් මෙතෙක් ම දෙවියෝ රැස් වන්නාහ.

මහණෙනි, දේව සමූහයන්ගේ නම් හෙළි කරන්නෙමි. මහණෙනි, දේව සමූහයන්ගේ නම් පෙහෙළි කරන්නෙමි. මහණෙනි, දෙවියන්ගේ නම් දෙසන්නෙමි. එය අසවු, මොනවට මෙනෙහි කරවු, කියන්නෙමි” යි වදාළ සේක.

“එසේ ය වහන්ස යි” ඒ මහණහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක:

“සිලෝවක් කියන්නෙමි. යම් තැනෙක බූමාටු දෙවියෝ ඇත් ද, රහත්හු එතැන් ඇසුරු කළාහු වෙත්. යම් තැනෙක බූමාටු දෙවියෝ ඇත් ද, රහත්හු එ තැන් ඇසුරු කළාහු වෙත්. නිවන් කරා මෙහෙය වූ සිත් ඇති, සමාධිගත සිත් ඇති, ලොමු දහගැනුම් මැඩලූ, පිරිසිදු සිතැති නො කිලිටි වූ වෙසෙසින් පහන් වූ, නො කැළඹුණු ඒ රහත්හු විවික්ත වූ බොහෝ සිංහයන් සේ ගිරි ගුහා ඇසුරු කළාහු වෙත්.”

කිඹුල්වත් පුර අසල වෙනයෙහි දී ශාස්තෲහු සස්න ඇලුණු පන්සියයකට වැඩි සව්වන් දැන, ඉක්බිති ඔවුන් අමතා මහණෙනි, දේව සමූහයෝ පැමිණියහ. ඔවුන් දිවැස් නුවණින් දනිව්’යි වදාළහ. ඔවුහු ද බුදු රජුන් ගේ හස්න අසා දිවැස උපදවනුවට වැර වැඩූහ.

වහා ම ඔවුනට අමනුෂ්‍යයන් දක්නා නුවණ පහළ විය. ඇතැම් මහණ කෙනෙක් දහසක් අමනුෂ්‍යයන් සියයක් දුටුහු. ඇතැම් මහණ කෙනෙක් දහසක් අමනුෂ්‍යයන් දුටුහු. ඇතැම් මහණ කෙනෙක් සැත්තෑ දහසක් දුටුහු. ඇතැම් මහණ කෙනෙක් සියදහසක් දුටුහු.

Non-Commercial Distribution

ඇතැම් මහණ කෙනෙක් අනන්ත දෙව් බඹුන් දුටුහු. සියලු දිසාවෝ දෙව්බඹුන් ගෙන් පැතිර ගත්තෝ වූහ.

පසස් ඇති ශාස්තෲන් වහන්සේ ඒ සියල්ල වෙසෙසි නුවණින් දැන වෙන් කොට දැන ඉක්බිති සස්න ඇලුණු ඒ සිය සව්වන් බණවා.

"මහණෙනි, දිව්‍ය සමූහයා එළඹියහ. වචනවලින් පිළිවෙලින් යම් ඒ දෙව් කෙනෙකු හෙළි කරන්නෙම් ද ඔවුන් දැනගනිවු" යැයි වදාළ සේක.

කිඹුල්වත් පුර වැසි, ඉදුමත්, බබළන, පැහැපත් යසස් ඇති සත් දහසක් බූමාටු දෙවියෝ සතුටු වන්නාහු, රහත් මහණ මුළුව දක්නට වනය කරා එළඹියාහ.

හිමවත් වැසි, නන් වැදැරුම් පැහැසපු ඇති ඉදුමත්, බබළන පැහැපත් යසස් ඇති දහසක් දෙවියෝ සතුටු වන්නාහු ඒ රහත් මහණ දක්නට වනය කරා එළඹියාහ.

හිමවත් වැසි, නන් වැදැරුම් පැහැසපු ඇති, ඉදුමත් බබළන පැහැපත් යසස් ඇති, දහසක් දෙවියෝ සතුටු වන්නාහු ඒ රහත්' මහණ දක්නට වනය කරා එළඹියාහ.

සාතාගිරි පර්වත වාසි, නන් වැදැරුම් පැහැසපුව ඇති, ඉදුමත් බබළන, පැහැපත්, යසස් ඇති තුන් දහසක් දෙවියෝ සතුටු වෙමින් භික්ෂු සමාගමය දක්නට වනය කරා එළඹියහ.

මෙසේ නන් වැදැරුම් පැහැසපු ඇති, ඉදුමත් බබළන පැහැපත්, යසස් ඇති සොළොස් දහසක් දෙවියෝ සතුටු වෙමින් රහත් භික්ෂූන් ගේ සමාගමය දක්නට පැමිණියහ.

විශ්වාමිත්‍ර පර්වතවාසී, නන් වැදැරුම් පැහැසපු ඇති, ඉදුමත්, පැහැපත්, යසස් ඇති පන්සියයක් දෙවියෝ සතුටු වෙමින් ඒ රහත් භික්ෂූන් ගේ සමාගමය දක්නට වනයට පැමිණියහ.

රජගහ නුවර වැසි, කුම්භීර නම් යක් සෙනෙවියෙක් වෙයි. විපුලගිරි පව්ව ඔහු වසන තැන ය. සිය දහසකටත් වැඩි යක්කු ඔහු ඇසුරු කෙරෙති. රජගහ වැසි ඒ කුම්භීර තෙමේ ද භික්ෂු සමාගමය දක්නට වනයට පැමිණියේ ය.

පෙරදිගට රජ වූ ධෘතරාෂ්ට්‍ර තෙම එදෙස පාලනය කරයි. ගන්ධර්වයනට අධිපති යසස් ඇති ඒ වරම් මහරජ ද මහබලැති, ඉදුමත් බබළන පැහැපත්, යසස් ඇති ඉන්ද්‍ර යන නම් ඇති බොහෝ වූ ඔහු පුත්තු සතුටු වන්නාහු භික්ෂූන් ගේ සමාගමය දක්නට වනය කරා පැමිණියහ.

විරූඪක වරම් රජ ඒ දකුණු දෙස පාලනය කෙරෙයි. කුම්භාණ්ඩයනට අධිපති වූ යසස්වී මහරජ ද, මහත් බල ඇති ඉදුමත්, බබළන, පැහැපත් යසස් ඇති, ඔහුගේ ඉන්ද්‍ර නම් බොහෝ පුත්තු ද සතුටු වන්නාහු භික්ෂූන් ගේ සමාගමය දක්නට වනයට පැමිණියහ.

විරූපාක්ෂ වරම් රජ ඒ පැසිම් දෙස පාලනය කෙරෙයි. නාගයිනට අධිපති වූ යශස්වී වූ ඒ වරම් රජ ද මහ බලැති, ඉදුමත්, බබළන, පැහැපත් යසස් ඇති, ඔහුගේ ඉන්ද්‍ර නම් බොහෝ පුත්තු ද සතුටු වන්නාහු භික්ෂු සමාගමය දක්නට වනයට පැමිණියහ.

කුවේර වරම් රජ ඒ උතුරු දිග පාලනය කෙරෙයි. යක්ෂයිනට අධිපති වූ යසස්වී වූ ඒ මහරජු ද ඉන්ද්‍ර යන නමැති මහ බලැති, ඉදුමත්, ද්‍යුතිමත් වර්ණවත්, යසස්වී වූ ඔහු ගේ බොහෝ පුත්තු ද සතුටු වන්නාහු භික්ෂූන්ගේ සමාගමය දක්නට වනයට පැමිණියාහු ය.

Non-Commercial Distribution

ධ්‍රතරාෂ්ට්‍ර වරම් රජ පෙරදිග ද, විරූඪක වරම් රජ දකුණු දිග ද, විරූපාක්ෂ වරම් රජ පැසිම් දිග ද, කුවේර වරම් රජ උතුරු දිග දැ යි ඒ සතර වරම් මහරජහු කිඹුල්වත් පුර වනයෙහි හාත්පස අතිශයින් බබළමින් සිටියහ.

ඔවුන් ගේ මායාවී වූ වංචනික වූ ශඨ වූ කපට වූ කුටෙණ්ඩු, වේටෙණ්ඩු, විටු, විටූඩ යන දාසයෝ ද,

චන්දන, කාමසෙට්ඨ, කින්නු, සණ්ඩු, නිසණ්ඩු පනාද, ඕපමඤ්ඤ, දෙව් රියදුරු මාතලී යන දෙවියෝ ද, චිත්‍රසේන යන ගාන්ධර්වද, නල නම් දෙව් රජ ද, ජනවසභ දෙව් පුත් ද,

පන්සිළු දෙව් පුත් ද, තිම්බරු නම් ගාන්ධර්ව රජ ද, සූරිය වච්චසා දෙව් දූ ද යන මේ සියල්ලෝ ද, අන්‍ය ගාන්ධර්ව රජහු ද සතුටු වන්නාහු සිය රජුන් සමග භික්ෂූන්ගේ සමාගමය දක්නට වනයට පැමිණියහ.

තවද ආකාශස්ථ නාගයෝ ද, විශාලා නාගපුර වැසි නාගයෝ ද තක්ෂක නම් නාගයන් කැටුව ආහ, කම්බල - අස්සතර යන කුල දෙකේ නාගයෝ ද, ප්‍රයාග වාසි නාගයෝ ද නෑයන් කැටුව ආහ.

යසස් ඇති යමුනා නදී වසන නාගයෝ ද, ධ්‍රතරාෂ්ට්‍ර කුලයට අයත් නාගයෝ ද, ඓරාවන නම් ඒ මහා නාගයා ද භික්ෂු සමාගමය දක්නට වනයට පැමිණියාහ.

පිරිසිදු ඇස් ඇති යම් දිව්‍ය ගරුඬ පක්ෂි කෙනෙක් නාරජුන් වහා ඩැහැගෙන යෙත් ද ඔහු අහසින් වනයට පැමිණියාහ. චිත්‍ර - සුපර්ණ ද යනු ඔවුන්ගේ නම් ය.

එදා නා රජුනට අභය විය. බුදු රජහු ගරුඬයන් කෙරෙන් නිරුපද්‍රැත බව කළහ. නාගයෝ ද, ගරුඬයෝ ද මොළොක් බසින් උනුන් කැඳවන්නාහු බුදු රජුන් සරණ ගියාහ.

සක්දෙවිඳුන් විසින් දිනන ලද මුහුද ඇසුරු කල සක්දෙව් රජු ගේ භාතෲ වූ ඉදුමත් යසස් ඇති අසුරයෝ ද,

කාලකංජක - දානවේඝස යන නම් ඇති මහ බියකරු අසුරයෝ ද, වේපචිත්ති - සුචිත්තී යන අසුරයෝ ද පහාරාද නම් අසුර ද නමුචිහු කැටුව ආහ. හැමදෙනා ම වේරෝචන යන නම් ඇති, බලි අසුරයා පුත් සිය දෙනා ද බලයෙන් සන්නද්ධ කොට ගෙන රාහු අසුරිඳු වෙත එළඹියාහ. ඔබට සෙත් වේවා ! දැන් භික්ෂූන්ගේ සමාගමය දක්නට වනයට යන්නට කල් පැමිණියේ යයි ඔහු සැළ කළාහ.

ආපො දේවතාවෝ ද, පෘථිවි දේවතාවෝ ද, තේජෝ දේවතාවෝ ද, වායු දේවතාවෝ ද එයට ආහ. වරුණ - වාරුණ යන දෙවිහු ද, සෝම දෙවියා ද, යසස් නම් දෙවියා ද කැටුව ආහ. යසස් ඇති මෙත්තා කායික, කරුණා කායික දෙවියෝ ආහ.

නන් වැදැරුම් පැහැති දස පරිද්දෙන් වූ ඉදුමත් වූ ධෘතිමත් වූ වර්ණවත් වූ යශස්වී වූ දශ දේව සමූහයෝ සතුටු වන්නාහු, භික්ෂූන්ගේ සමාගමය දක්නට වනය කරා දස අයුරකින් එළඹුණාහ.

Non-Commercial Distribution

විෂ්ණු දේව නිකායේ දෙවියෝ ද, සහලී නිකායේ දෙවියෝ ද අසම නම් නිකායේ දෙවියෝ ද යම නම් දේව නිකාය දෙකක දෙවියෝ ද ආහ. සඳ මඬල නිසා වසන දෙවියෝ ද සඳ දෙව් පුතු පෙරටු කොට ආහ.

හිරු මඬල නිසා වසන දෙවියෝ හිරු දෙව් පුතු පෙරටු කොට ගෙන ආහ. නැකත් තරු ඇසුරු කොට වසන දෙවියෝ නැකත් තරුවලට අධිපති දෙවියන් පෙරටු කොට ගෙන ද ආහ. මන්ද වලාහක දෙවියෝ ද ආහ.

වසු දේවතාවුනට නායක වූ පුරින්දද යන අපර නාමාංගයයක් ඇති සක් දෙවිඳු ද ආයේ ය.

නන් පැහැති ඉදුමත් ද්‍යුතිමත් වණීවත් යශස්වී වූ දස නිකාය කෙනෙක් සතුටු වන්නාහු භික්ෂූන්ගේ ඒ සමාගමය දක්නට දස සැටියෙකින් වනයට ආහ.

ඉක්බිති සහභූ නම් දෙවියෝ ගිනිසිළු මෙන් දිලිසෙන්නාහු වනයට ආහ. දියබෙරලිය මල් පැහැති අරිට්ඨක නම් දෙවියෝ ද, රෝජ නම් දෙවියෝ ද, වරුණ, ධම්ම, අච්චුත, අනෝජක යන නම් ඇති දෙවියෝ ද, ආහ. සුලෙය්‍ය - රුචිර යන දෙවියෝ ද ආහ. වාසවනේසී දෙවියෝ ද ආහ.

නන් පැහැති ඍද්ධිමත් ද්‍යුතිමත් වර්ණවත් යශස්වී වූ මේ දශ දේව සමූහයෝ ද සතුටු වන්නාහු භික්ෂූන්ගේ සමාගමය දක්නට වනය කරා දශ පරිද්දෙකින් ආහ.

සමාන, මහා සමාන මානුස මානුසුත්තම ඛිඩ්ඩාපදෝසික නම් දෙවියෝ ද ආහ. මනෝපදෝසික නම් දෙවියෝ ද ආහ. ඉක්බිති හරි නම් දෙවියෝ ද ආහ. රතුවත් හඳුනා යම් දෙව් කෙනෙක් ඇත් ද, ඔහු ද යශස් ඇති පාරග මහාපාරග නම් වූ දැ යි මේ දශ දෙව් මුළුහු භික්ෂූන්ගේ ඒ සමිතිය දක්නට වනය කරා දස පරිද්දෙකින් ආහ.

සුක්ක, කරුම්භ, අරුණ යන දෙවියෝ වේඛනස යන දෙවියන් හා ආහ. ඕදාත, ගය්හ පාමොක්ඛ, විචක්ඛණ යන දෙවියෝ ද ආහ.

යසස් ඇති සදාමත්ත හාරගජ යන නමැති දෙවියෝ ද, මිස්සක නම් දෙවියෝ ද ආහ. යමෙක් දිශාවන්හි තෙමන්නේ ද ඒ පර්ජන්‍ය දෙව් ද අහස ගුගුරුවමින් ආයේ ය.

නානා වර්ණ ඇති ඍද්ධිමත් වූ වර්ණවත් වූ යශස්වී වූ මේ සියලු දශ දේව සමූහයෝ සතුටු වන්නාහු භික්ෂූන්ගේ සමාගමය දක්නට ආවෝ ය.

කීර්තිමත් ඛේමිය නම් දෙවියෝ ද, තුසිත, යාම, කට්ඨක, ලම්බිත, කාලාම සෙට්ඨ, ජෝති, ආසව නම් ඇති දෙවියෝ ද, නිම්මාණරතී නම් දෙවියෝ ද ආහ. ඉක්බිති පරනිම්මිත නම් දෙවියෝ ආහ.

නන් පැහැති ඍද්ධිමත් ද්‍යුතිමත් වර්ණවත් යශස් ඇති මේ දශ දේව නිකායයෝ සතුටු වෙමින් භික්ෂූන්ගේ සමාගමය දක්නට දස අයුරින් වනයට එළඹියාහ.

නන් පැහැති මේ සියලු සැටෙක් දේව නිකායයෝ තවද තමනට සමාන යම් අන් දෙව් කෙනෙක් ඇද්ද, ඔවුන් ද කැටුව නම් පිළිවෙලින් ආහ.

Non-Commercial Distribution

වැස නිම වූ ජාති ඇති, කෙලෙස් හුල් නැති, සතර කෙලෙස් මහ වතුර තරණය කළ, ආසව නැති අරි සඟන ද, ඕසයන් තරණය කළ අගතියට නො යන අඳුරු පැහැ ඉක්මි සඳහු වැනි බුදුරජ දකිම්හ යි ආහ.

මහ බඹ තෙම බඹලෝ දහසක් අබිබවා සිටී. බඹ ලොව උපන් ද්‍යුතිමත් බිහිසුණු මහ කයක් ඇති කීර්තිමත් හෙතෙමේ ද ආයේ ය.

වෙන් වෙන් ව තම පිරිස් සිය වසයෙහි පවත්වන, ඊශ්වර වූ බඹහු දශ දෙනෙක් ද මෙහි ආහ. ඔවුන් මැදින් බඹ පිරිස විසින් පිරිවැරුණු හාරිත නම් බ්‍රහ්ම තෙම පැමිණියේ ය.

එළැඹ සිටි ඉන්ද්‍රයා සහිත බ්‍රහ්මයා සහිත ඒ සියලු දෙවියන් කරා මාර සේනාවෝ පැමිණියාහ. බලව, මරහු ගේ මුළාවෙක හැටි.

එවු, ගනිවු, බඳිව්, මොහු හැම රාගයෙන් බඳින ලදුවෝ ම වෙත්වා, හාත්පසින් පිරිවරවූ, තෙපි ඒ කිසිවෙකුදු නො මුදවු. මෙසේ බිහිසුණු හඬ කොට අත්ලෙන් පොළොව පැහැර මාර දිව්‍ය පුත්‍ර තෙම මරසෙන් එහි යැවීය.

යම්සේ වැසි සමයේ වසින මේඝය ගර්ජනා කරනුයේ විදුලිය සහිත වනුයේ ද, එසේ ම එදා ඒ මරදෙව් පුත් ඒ දෙව් පිරිස තමා වශයෙහි පැවැත්විය නුහුණුයේ ඉතා කිපියේ පෙරළා නැඟී ගියේ ය.

පණැස් ඇති ශාස්තෘන් වහන්සේ ඒ සියල්ල දැන, වෙසෙසා දැක ඉක්බිති සස්න ඇලුණු ඒ සව්වන් බණවා, මහණෙනි, මාරසෙන්හු ආහ. ඔවුන් දන ගනිවු යි වදාළ සේක.

ඔහු ද බුදුරජාණන් වහන්සේ ගේ අනුශාසනය අසා වැර වැඩූහ. පහ වූ රාග ඇති ඒ භික්ෂූන් කෙරෙන් මාර සේනාවෝ ඉවත්ව ගියහ. ඒ රහතුන් ගේ ලෝමයකුදු සොලවනු නොහැකි වූහ.

ජනයා කෙරෙහි ප්‍රකට වූ ඒ සියලු බුදු සව්වෝ දිනූ මර යුද ඇත්තාහු, බිය ඉක්මියාහු, එහෙයින් ම කීර්තිමත් වූවාහු, අරී සව්වන් හා සතුටු වෙත්.

## 3. ආලවක සූත්‍රය

සැවැත් නුවර දෙව්රම් වෙහෙර වැඩ වසන බුදු රජාණන් වහන්සේ අළුයම ලොව බලා වදාරණ සේක් අලව් කුමරුට අනාගාමි ඵලප්‍රාප්තිය පිණිස හේතු සම්පත් ඇති බවත් ඔවුන් දෙදෙන උදෙසා වදාරණ බණින් සුවාසූ දහසක් දෙනා නිවන් දක්නා බවත් යන මේ සියල්ල දිවැසින් දැනගත් බුදුන් වහන්සේ ආලවක යක්ෂයා ගේ විමනට වැඩි සේක.

ඒ අවස්ථාවේ අලව් යකු හිමාලය වනයේ යක්ෂ සමාගමයට ගොස් සිටිය බැවින් අලව් විමන රැකීමට සිටිය ගද්‍රභ යක්ෂයා බුදු රදුන් වෙත පැමිණ ඔබ වහන්සේ කුමකට මෙහි පැමිණියෙහි දැ යි ඇසී ය. උන් වහන්සේ පැමිණි කරුණු වදාළහ. ගද්‍රභයාට වුවමනා වූයේ උන් වහන්සේ එතැනින් පිටත්කර හැරීමට ය. එහෙත් එය පිළිවන් නො වී ය. ගද්‍රභයා අලව්

Non-Commercial Distribution

යකුගේ රෞද්‍රකම කීයේ ය. එයින් පලක් නොවිණි. කෝපයෙන් දිලිහෙමින් ආලවක යක්ෂයා ද පැමිණියේ ය. බුදු රදුන් තම විමානයෙන් පිටමං කිරීමට මුළු ශක්තිය යෙද වූයේ ය. එහෙත් එයින් පලක් නොවිණි. මේ සූත්‍රයේ ආලවක දමනය විස්තර වශයෙන් දැක්වෙයි.

මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ අලවු නුවර සමීපයෙහි වූ ආලවක යක්ෂයා ගේ විමානයෙහි වැඩ වසන සේක. ඉක්බිති ආලවක යක්ෂයා භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීයේ යː

මහණ, නික්ම යව, මැනව ඇවැතැ යි නික්මුණු සේක. එව, මහණ, මැනව ඇවැතැ යි භාග්‍යවතුන් වහන්සේ පිවිසි සේක. දෙවන වරට ද අලව් යක් භාග්‍යවතුන් වහන්සේට එසේ කීයේ යː මහණ නික්ම යව, මැනැව ඇවැතැ යි නික්ම ගිය සේක. එව මහණ යි කීයේ ය. මැනැව ඇවැතැ යි පිවිසි සේක. තෙවන වර ද අලව් යක් මහණ නික්ම යව යි කීයේ ය. මැනැව ඇවැතැ යි නික්මුණු සේක. එව මහණැ යි කීයේ ය. භාග්‍යවතුන් වහන්සේ පිවිසි සේක.

සිව්වන වර ද අලව් යක් භාග්‍යවතුන් වහන්සේට නික්ම යව යි කීයේ ය. මම නොයමි. තා විසින් යමක් කටහැකි නම් කරව යි වදාළ සේක.

මහණ ඔබගෙන් විසඳිය නොහැකි ප්‍රශ්නයක් විචාරමි. ඉදින් මට පැහැදිළිව නො කියන්නේ නම් ඔබගේ සිත හෝ පෙරළන්නෙමි, ළය හෝ පළන්නෙමි, දෙපය හෝ ගෙන පරසක්වළට දමන්නෙමි.

ඇවැත, යමෙක් මාගේ සිත හෝ පෙරළා නම්, හදවත හෝ පළා නම්, දෙපය හෝ අල්ලා ගඟිනෙතර දමා ගසා නම් එබන්දකු දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත ලෝකයෙහි හෝ මහණ බමුණන් සහිත දෙව් මිනිසුන් සහිත ප්‍රජාවෙහි නොම දනිමි. එහෙත් ඇවැත කැමැත්තේ නම් යමක් විචාරව, ආලව් යක් භාග්‍යවතුන් වහන්සේට ගාථාවෙන් කීවේ යː

1. මේ ලෙව්හි පුරුෂයාට කවර ධනයක් ශ්‍රේෂ්ඨ වේ ද? මොනවට පුරුදු කරන ලද කවරක් සුව එළවා ද? කවරෙක් රසයන් අතුරෙන් ඉතා මියුරු වේ ද? කෙසේ ජීවත් වන්නහු ගේ ජීවිතය ශ්‍රේෂ්ඨ වේ ද?

2. මෙලොවැ ශ්‍රද්ධාව ශ්‍රේෂ්ඨ ධනය වේ. ධර්මය මොනවට පුරුදු කරන ලදුයේ සුව එළවයි. රසයන් අතුරෙන් සත්‍යය ඒකාන්තයෙන් මධුර වෙයි. ප්‍රඥාවෙන් ජීවත් වන්නා හු ගේ ජීවිතය ශ්‍රේෂ්ඨය.

3. කවර ප්‍රකාරයකින් ඕඝයන් තරණය කෙරේ ද? කවර පරිද්දෙකින් සංසාර සාගරයෙන් එතෙර වේ ද? කවර පරිද්දෙකින් සසර දුක් දුරු කෙරේ ද? කවර ප්‍රකාරයකින් පිරිසිදු වේ ද?.

4. ශ්‍රද්ධාව කරණකොට ගෙන සසර සැඩ පහරින් එතෙර වෙයි. අප්‍රමාදයෙන් සසර සයුර එතෙර කෙරෙයි. වියර්‍ය්‍ය කරණකොට ගෙන දුක දුරු කෙරෙයි. ප්‍රඥයෙන් පිරිසිදු වෙයි.

Non-Commercial Distribution

5. කෙසේ ප්‍රඥා ලබා ද? කෙසේ වස්තුව ලබා ද? කෙසේ කීර්තියට පැමිණේ ද? කෙසේ මිතුරන් සපයා ද? මෙලොවින් පරලොව ගොස් කෙසේ ශෝක නො කෙරේ ද?

6. කුශලාකුශල ධර්මයන් ගේ විපාක දන්නා වූ අප්‍රමාද වූ පුද්ගල තෙම රහතුන් පැමිණි නිවනට පැමිණෙනු පිණිස බණ අසා ඇදහීම් ඇත්තෙක්ව ප්‍රඥාව ලබයි.

7. අධිගම ලාභය පිණිස යෙදූ උපාය ඥාන ඇති, බහා නො තබන ලද වීර්‍ය්‍ය ඇති, පටන් ගන්නා ලද වීර්‍ය්‍ය ඇති පුරුෂ තෙම ලෞකික වූ ද ලෝකෝත්තර වූ ද ධනය ලබයි. සත්‍ය වචනයෙන් කීර්තියට පැමිණෙයි. දෙන තැනැත්තේ මිතුරන් සපයයි.

8. ගිහිගෙයි වසන යම් සැදැහැවත් පුරුෂයකුට සත්‍යය ද ධර්මය ද, ධෛර්‍ය්‍යය ද, පරිත්‍යාගය ද යි සතර ධර්මයෝ වෙත් නම් හෙතෙම ඒකාන්තයෙන් පරලෙව්හි ශෝක නො කරයි.

9. සත්‍යය ඉන්ද්‍රිය, දමනය, පරිත්‍යාගය, ඉවසීමය යන මේ සතර ධර්මයන්ට වඩා උසස් වූ ධර්මයක් නැත්තේ ය. එහෙයින් අනිකුදු ධර්ම කෙනෙක් තවත් ඇත්නම් බොහෝ වූ මහණ බමුණන් අතින් එය වහා ම විචාරා දැන ගනුව යි වදාළ සේක.

10. පරලොව විපාක දෙන්නා වූ යම් අර්ථයක් වේ නම් මම අද ඒ අර්ථය වදාළ පරිද්දෙන් ම දනිමි. දැන් නොයෙක් මහණ බමුණන් අතින් කුමට විචාරම් ද?

මෙසේ කී කල්හි ආලවක යක්ෂ සේනාධිපති තෙම බුදුරජාණන් වහන්සේට මෙසේ සැළ කෙළේ ය. භවත් ගෞතමයන් වහන්ස, නුඹ වහන්සේ ගේ ධර්ම දේශනාව ඉතා යහපති. භවත් ගෞතමයන් වහන්ස, යටි කුරු කොට තැබූ භාජනයක් උඩුකුරු කොට තබන්නාක් මෙන් යටපත් වූ නිධානයක් විවෘත කරන්නාක් මෙන් මං මුළාවූවකුට මග කියන්නාක් මෙන් 'ඇස් ඇත්තෝ රූප දකිත්වා' යි අන්ධකාරයෙහි තෙල් පහනක් දල්වන්නාක් මෙන් ද භාග්‍යවතුන් වහන්සේ විසින් නොයෙක් කරුණුවලින් ධර්මය දේශනා කොට වදාරණ ලද්දේ ය. ඒ මම භාග්‍යවතුන් වහන්සේ ද, ධර්මය ද, භික්ෂු සංඝයා වහන්සේ ද, සරණ කොට යෙමි. භවත් ගෞතමයන් වහන්සේ අද පටන් මා දිවි කෙළවර කොට සරණ ගියා වූ උපාසකයෙකැ යි සිත්හි ලා දරණ සේක්වා.

## 4. කසීභාරද්වාජ සූත්‍රය

බුදුන් වහන්සේ එක් අවස්ථාවක ඒකනාලා නම් බමුණුගම දක්ඛිණගිරි වෙහෙර වැඩ විසූ සේක. එසේ එහි වැඩ සිටියේ කසීභාරද්වාජ බමුණා ගේ ඉන්ද්‍රිය පරිපාකය වනතුරු ය. භාරද්වාජ නම් සුප්‍රසිද්ධ බ්‍රාහ්මණ ගෝත්‍රයකි. එහෙත් මේ බමුණා කෘෂි කර්මාන්තයෙන් දිවි පෙවෙත රැක ගත්තෙකි.

බමුණා ගේ වප් මඟුල් දිනය එළඹිනි. බමුණා ප්‍රථම කොට කළ යුතු පුද පිළිවෙත් පවත්වා බමුණන්ට ආහාර වළඳවන අවස්ථාව එළඹියේ ය. බමුණු දෙමහල්ලෝ සිය කාර්‍ය්‍යයෙහි නියුක්ත වූහ.

Non-Commercial Distribution

මේ අවස්ථාවේ බුදුන් වහන්සේ මේ ස්ථානයට වැඩි සේක. බමුණාට පෙනෙන පරිදි සවණක් බුදුරැස් පතුරුවමින් එහි වැඩ හුන්හ. කැම කා අවසන් වූ පිරිස එතැනට රොක් වූහ. මේ අවස්ථාවේ එතැනට පැමිණි බමුණා හා බුදුන් වහන්සේ අතර සාකච්ඡාව ඇති විය. සාකච්ඡාවෙන් පසුව කසීභාරද්වාජ සූත්‍රය දේශනා කළ සේක.

මා විසින් මෙසේ අසන ලදී. භාග්‍යවතුන් වහන්සේ මගධ දනව්වේ දක්ඛිණ ගිරියෙහි ඒකනාල නම් බමුණු ගමෙහි වැඩ වසන කල්හි කසීභාරද්වාජ නම් බමුණා විසින් වප් දවස්හි පන්සියයක් පමණ නඟුල් යොදන ලද්දේ වෙයි.

එකල්හි භාග්‍යවතුන් වහන්සේ පෙරවරුවෙහි හැඳපෙරව පා සිවුරු ගෙන කසීභාරද්වාජ බ්‍රාහ්මණයා ගේ කර්මාන්ත ස්ථානය කරා වැඩි සේක. එසමයෙහි කසීභාරද්වාජ බ්‍රාහ්මණයා ගේ අනුභව කරවීම පවතී. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ අනුභව කරවන තැන යම් තැනෙක්හි ද එතැන්හි එළඹි සේක. වැඩ එකත්පසෙක සිටි සේක. කසීභාරද්වාජ බමුණා පිඬු පිණිස වැඩ සිටි භාග්‍යවතුන් වහන්සේ දුටුයේ ය. දැක භාග්‍යවතුන් වහන්සේට තෙල බස් කීයේ ය.

"මහණ, මම සී සාමි, වපුරමි, සී සා වපුරා වළඳමි. මහණ, තොපිත් සී සා වපුරා වළඳව" යි කීයේ ය.

"බමුණ මමත් සී සාමි, වපුරමි, වපුරා වළඳිමි".

"අපි භවත් ගෞතමයන් ගේ වියගස, නඟුල්, හීවැල්, කෙවිටි, ගෙරි සරක් නො දකිමු. එතකුදු වුවත් භවත් ගෞතම තෙමේ මෙසේ කියයි. මම ද බමුණ සී සාමි, වපුරමි, සී සා වපුරා වළඳිමි" ඉක්බිති කසිභාරද්වාජ බමුණු තෙමේ ගාථායෙන් මෙසේ කී:

කසීකයෙමි යි ප්‍රතිඥා කෙරෙහි, තොප ගේ කෘෂිභාණ්ඩ නො ද කුම්හ. යම් පරිද්දකින් තොප ගේ කෘෂිභාණ්ඩ දනුවෝ නම් එපරිද්දෙන් පුළුවුස්නා ලද තොපි අපට කෘෂිභාණ්ඩ කියව යි.

මා ගේ ශ්‍රද්ධාව බිජුවට යි. තපස වැසි දහර වෙයි. ප්‍රඥාව විය නඟුල් වෙයි. හිරිය නඟුලිස යි. චිත්තය විය රැහැන් වෙයි. ස්මෘතිය මාගේ හී වැල හා කෙවිට යි.

කාය සුචරිතයෙන් ගුප්තයෙමි. චතුර්විධ වාග් සුචරිතයෙන් ගුප්ත යෙමි. සිවුපසයෙහි සංයතයෙමි. අවිසන්වාදන සංඛ්‍යාත සත්‍ය වශයෙන් කැම් බීම් කෙරෙමි. සුරත භාවය මාගේ විය මිදීම වෙයි.

'නිර්වාණ සංඛ්‍යාත යම් ක්ෂේමයකට ගොස් ශෝක නො කෙරේ නම් ඒ නිවණ කරා නො නවත්වමින් යන සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යී මාගේ ධුර වාහක වෙයි. මෙසෙයින්, මා විසින් තෙල සී සැම කරන ලදි. ඒ කෘෂිකර්මය අමාඵල ඇත. තෙල කෘෂිකර්මය කොට සී සා හැම දුකින් මිදේය'යි වදාළහ.

ඉක්බිති කසීභාරද්වාජ බ්‍රාහ්මණයා මහ රන්තලියෙක්හි කිරිපිඬු වඩා යම් හෙයකින් භවත් ගෞතමයන් වහන්සේ අමෘත ඵලවත් කෘෂිකර්මය කරන්නාහු නම් භවත් ගෞතමයන් වහන්සේ එබඳු කර්ෂක වන්නාහ. භවත් ගෞතමයෝ පායාස වළඳත්වා'යි භාග්‍යවතුන් වහන්සේට පිරි නැමී.

බ්‍රාහ්මණය, ගී ගැයුමින් ලත් පායාසය මා විසින් වළඳනට නො නිසි ය. සම්‍යක් ආජීව පාරිශුද්ධිය දක්නා බුදුවරයනට තෙල ධර්මය නො වේ. සර්වඥයෝ ගී ගැයුමින් ලත් භෝජනය බැහැර කෙරෙත්. බමුණ, ආර්යයන්ගේ ආචාර ධර්මය ඇති කල්හි මේ ජීවිකා වෘත්තිය යි.

Non-Commercial Distribution

සියලු ගුණයෙන් යුක්ත වූ මහාර්ෂි වූ ක්ෂීණාශ්‍රව සන්සුන් කුකුස් ඇති බුදුරජාණන් වහන්සේට අන්‍ය ආහාර පානයකින් ම උවටැන් කරවු. යම් හෙයකින් ඒ පින් කැමතියහුට පින් කෙත් වේ ද එහෙයිනි.

භවත් ගෞතමයන් වහන්ස, එසේ වත් ම මේ පායාසය මම් කවරකුහට දෙම් ද?

බමුණ, දෙවියන් සහිත වූ මරුන් සහිත වූ බඹුන් සහිත වූ ලොව දෙව් මිනිසුන් සහිත මහණ බමුණන් සහිත සත්වාබ්‍ය ප්‍රජාවෙහි තථාගතයන් වහන්සේ හෝ තථාගත ශ්‍රාවකයකු හෝ විනා යමෙකු විසින් ඒ පායාසය වළඳන ලද්දේ මොනවට පරිණාමයට යේ නම් එබන්දකු නො දක්මි. බමුණ, එකරුණින් තෝ ඒ පායාසය තිල් තණ නැති බිමෙක හෝ දමව. එයින් නැසෙන ප්‍රාණීන් රහිත දියෙහි හෝ උල්පවා ලව.

ඉක්බිති කසීභාරද්වාජ බමුණු ඒ පායාසය ප්‍රාණීන් රහිත දියෙහි උල්පවාලී ය. එකල්හි ඒ පායාසය දියෙහි බහාලන ලදුයේ චිට චිට යන අනුකරණය කෙරෙයි. චිට චිට යන අනුකරණය කෙරෙයි. හාත්පසින් දුමයි. අධිමාත්‍රව හාත්පසින් දුමයි. යම් සේ දවසක් තැවුණු සී වැලක් දියෙහි බහාලන ලදුයේ චිටි චිටි යන අනුකරණය කෙරේ ද, චිට චිට යන කරණය කෙරේ ද, හාත්පසින් දුමා ද, අධිමාත්‍රව හාත්පසින් දුමා ද එසෙයින් ම ඒ පායාසය දියෙහි බහාලන ලදුයේ චිට චිට යන ශබ්ද කෙරෙයි. චිටි චිටි යන ශබ්දය කෙරෙයි. හාත්පසින් දුමයි. අධිමාත්‍රව හාත්පසින් දුමයි.

එකල්හි කසීභාරද්වාජ බ්‍රාහ්මණයා සංවිග්ග වූයේ හටගත් ලොමුදහ ඇත්තේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේගේ පාමුල්හි හිසෙන් වැඳහෙව භාග්‍යවතුන් වහන්සේට තෙල සැල කළ සේක:

භවත් ගෞතමයන් වහන්ස, ඉතා මැනවි, භවත් ගෞතමයන් වහන්ස ඉතා මැනවි. භවත් ගෞතමයන් වහන්ස, යම් සේ වනාහි යටිකුරු කොට තබන ලද්දක් උඩුකුරු කොට තබන්නේ වේ ද, පිළිසන් වූවක් වැසුම් හරනේ වේ ද, මංමුළාවූවකුට හෝ මග කියන්නේ වේ ද, ඇස් ඇත්තාහු රූ දක්නාහ යි අඳුරෙහි හෝ තෙල් පහනක් දල්වන්නේ වේ ද, එපරිදි ම භවත් ගෞතමයන් වහන්සේ විසින් නන් අයුරින් ධර්මය දෙසන ලදි. මම භවත් ගෞතමයන් වහන්සේ ද, ධර්මය ද, සංඝයා ද සරණ කොට යමි. මම භවත් ගෞතමයන් වහන්සේ සමීපයෙහි පැවිද්ද ලබම්වා. උපසපුව ලබම්වා.

කසීභාරද්වාජ බ්‍රාහ්මණ භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි පැවිද්ද ලැබී ය. උපසපුව ලැබීය. උපසපු ලැබූ නොබෝකල් ඇත්තේ ආයුෂ්මත් භාරද්වාජ එකලා වූයේ කයින් සිතින් වෙන් වූයේ නො පමා වූයේ කෙලෙස් තවන වැර ඇති වූයේ නිවනට මෙහෙයූ සිත් ඇතිව වෙසෙන්නේ යම් රහත් ඵලයක් පිණිස කුලපුත්‍රයෝ මනාකොට ගිහි ගෙයින් නික්ම පැවිද්දට පැමිණෙද්ද මාර්ග බ්‍රහ්මචරිය අවසන් කොට ඇති ඒ රහත් ඵලය ඉහාත්මයෙහි තමා විසින් දැන පසක් කොට සපයා විසී. ජාතිය ක්ෂය විය. බඹසර වස් පුරා අවසන් කෙළේ ය. සිවු මගින් කළ යුතු කටයුතු කරන ලද්දේ විය. යළි මේ භවයට නො එම් යි දැන ගත්තේ ය. ආයුෂ්මත් භාරද්වාජ රහතන් කෙරෙහි එක්තරා මහ රහත් තෙරනමක් වූයේ ය.

Non-Commercial Distribution

# 5. පරාභව සූත්‍රය

පරාභව සූත්‍රය මංගල සූත්‍රයේ ප්‍රතිවිරෝධතාව සේ සැලකිය හැකි යි. බුදුරදුන් වෙත පැමිණ පරිහානියට හේතුවන කාරණා විමසූ එක්තරා දේවතාවකුට වදාරණ ලද්දකි. කෙනකු දහමට ඇළුම් කරතොත් හේ උන්නතියට ද, දහමට ද්වේෂ කරතොත් අවනතියට ද පත්වේ ය යන ආදි කරුණු මෙහි අන්තර්ගත යි.

මා විසින් මෙසේ අසන ලදි. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර දෙව්රම් නම් අනේපිඬු සිටුහු ගේ ආරාමයෙහි වැඩ වසන සේක. එකල එක්තරා දෙවියෙක් රෑ පෙරයම ඉක්ම ගිය කල්හි විශිෂ්ට වර්ණ ඇත්තේ සියලු ජේතවනය එකලු කෙරෙමින් භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පස්ව සිටියේ ය. එකත්පස්ව සිටි ඒ දෙවි භාග්‍යවතුන් වහන්සේට ගාථායෙන් මෙසේ සැළ කළේ ය:

1. අපි පින්වත් ගෞතමයන් වහන්සේ ගෙන් පිරිහෙන පුද්ගලයා කෙබඳු දැ යි විචාරමු. අපි පිරිහීමේ කරුණු මොනවා දැ යි දැනගනු පිණිස පැමිණියෙමු.

2. දියුණු වන පුද්ගලයා ද ඒ ඒ කරුණුවලින් දත හැකි වෙයි. පිරිහෙන පුද්ගලයා ද එසේ ම දත හැකි වෙයි. දශ කුසල ධර්මයට කැමැති වූ පුද්ගල තෙමේ දියුණු වෙයි. ධර්මයට ද්වේෂ කරන තැනැත්තේ පිරිහෙයි.

3. භාග්‍යවතුන් වහන්සේ විසින් වදාළ පරිද්දෙන් මේ කාරණය දනිමු. හේ පළමුවන පිරිහීමේ දොරටුව යි. පිරිහීමට හේතුවන දෙ වන කාරණය වදාළ මැනවි.

4. මොහුට අන්‍ය ශාස්තෲහු ප්‍රිය වෙත් ද, බුද්ධාදි සත්පුරුෂයන් ප්‍රිය නො කෙරෙත් ද, දෙසැටක් මිථ්‍යාදෘෂ්ටි ඇති අසත්පුරුෂ ධර්මයට ප්‍රිය කෙරෙත් ද මේ කරුණු තුන පිරිහීමේ දෙ වන දොරටුව ය.

5. මෙසේ දෙ වන පරිහානිය දනිමි. භාග්‍යවතුන් වහන්ස, පිරිහීමට හේතුවන තෙ වන කාරණය කුමක් දැ යි ප්‍රකාශ කරනු මැනවි.

6. යම් මිනිසෙක් නිදනසුලු වේ ද? ගණයා කෙරෙහි ඇලෙනසුලු වේ ද, උට්ඨානවීර්‍ය්‍ය නැත්තේ ද උපතින්ම අලස වේ ද, ක්‍රෝධය ලක්ෂණ කොට ඇතිවේ ද මේවා පිරිහීමට හේතුවන කාරණාය.

7. මෙසේ මේ තෙ වන පරිහාණි කාරණය දැන ගතිමු. පිරිහීමේ හේතු වූ හතර වන කාරණය ප්‍රකාශ කරනු මැනවි.

8. යමෙක් පොහොසත් වූයේ ජරාවෙන් දිරාගිය ඉක්ම වූ යොවුන් බව ඇති මව හෝ පියා පෝෂණය නො කරයි ද, එය පිරිහීමට කරුණකි.

9. අපි මෙය මෙසේ දනිමු. ඒ සිවු වන පිරිහීමේ කාරණය යි. භාග්‍යවතුන් වහන්ස, පිරිහීමට හේතු වූ පස් වන කරුණ කුමක් දැ යි ප්‍රකාශ කරනු මැනවි.

Non-Commercial Distribution

10. යමෙක් බමුණකු වේව යි. මහණකු වේව යි. අන්කිසි යදියකු වේව යි මුසවායෙන් රවටා නම් එය පිරිහීමට කරුණු ය.

11. මෙසේ මේ කරුණු දැන ගනිමු. පිරිහෙන පුද්ගලයා ගේ ස වන කාරණය කුමක් දැ යි වදාළ මැනවි.

12. බොහෝ රන් රුවන් කහවණු ඇති සූපව්‍යඤ්ජන භෝජනයෙන් සමෘද්ධි වූ පුරුෂයා තනිව ම පිණිබොජුන් වළඳා නම් එය පිරිහීමේ කාරණාවෙකි.

13. මෙසේ මේ කරුණ දැන ගනිමු. පිරිහීමට හේතු වූ සත් වන කාරණය වදාළ මැනවි.

14. යම් මිනිහෙක් ජාති මානයෙන් තද වූයේ, ධන මානයෙන් තද වූයේ, කුල මානයෙන් තද වූයේ සිය නෑයන් ඉක්මවා සිතා ද එය පිරිහීමට කරුණුය.

15. මෙසේ මේ කරුණ දැන ගනිමු. පිරිහීමට හේතු වූ අට වන කාරණය වදාළ මැනවි.

16. යම් මිනිසෙක් ස්ත්‍රී ධූර්ත වූයේ, සුරා ධූර්ත වූයේ, අක්ෂ ධූර්ත වූයේ ලද ලද දැ වනසයි ද එය පිරිහීමට කරුණු ය.

17. මෙසේ මේ කාරණය දැන ගනිමු. පිරිහීමට හේතු වූ නව වන කාරණය වදාළ මැනවි.

18. සිය බිරියන් විසින් නො සතුටු වූයේ වෛශ්‍යාවන් කරා පැමිණේ ද එය පිරිහීමට කරුණු ය.

19. මෙසේ මේ කාරණය දැන ගනිමු. පිරිහීමට හේතුවන දහ වන කාරණය වදාළ මැනවි.

20. ඉක්ම ගිය යොවුන් බව ඇති පුරුෂයා තිඹිරිඵල බඳු පියොවුරු ඇති තුරුණු දැරියන් ආවාහ කොට ගනී ද, හේ ඇයට ඊර්ෂ්‍යාවෙන් නො නිදා ද ඒ පිරිහීමේ කරුණු ය.

21. මෙසේ මේ කාරණය දැන ගනිමු. පිරිහීමට හේතුවන එකොළොස් වන කාරණය වදාළ මැනවි.

22. මත්ස්‍ය මාංශ මද්‍යපාන ආදියෙහි ලොල් වූ ඒ සඳහා ධනය විසුරුවන මාගමක් හෝ එබඳු පුරුෂයකු ආධිපත්‍යයෙහි තබා ද එය පිරිහීමේ කරුණු ය.

23. මෙසේ මේ කාරණය දැන ගනිමු. පිරිහීමට හේතුවන දොළොස් වන කාරණය වදාළ මැනවි.

24. අල්ප භෝග ඇති, මහත් වූ භෝග තෘෂ්ණා ඇති යමෙක් ක්ෂත්‍රිය කුලයෙහි උපදී ද හේ රාජ්‍යය පතා නම් ඒ පිරිහීමට කරුණු ය.

25. පණ්ඩිත වූ ඒ පරාභවය දක්නා නුවණැති ඒ ආර්‍ය්‍ය පුද්ගලයා ලෝකයේ එම පරිහාණි කාරණා පිරිසිඳ දැන දෙව්ලොවට පැමිණෙයි.

Non-Commercial Distribution

# 6. අග්ගික භාරද්වාජ සූත්‍රය

එක් සමයෙක්හි බුදු රජාණන් වහන්සේ සැවැත් නුවර සමීපයේ දෙව්රම් වෙහෙර වැඩ වෙසෙන සේක. ඉක්බිති එක් දිනෙක පෙරවරු සමයෙහි සැවැත් නුවර පිඬු පිණිස වැඩි සේක.

ඒ අවස්ථාවේ අග්ගික භාරද්වාජ බමුණා ගේ ගෙදොර අසල ගිනි දල්වා හෝමය පටන් ගන්නා ලදි. බුදුන් වහන්සේ ද ඒ අවස්ථාවේ එතැනට එළඹි සේක. බුදුන් වහන්සේ දුටු බමුණා කෝපාවිෂ්ටව වසල වාදයෙන් බැණ වැදුණේ ය. එතැනට එන්නට එපා යයි ඔහි නවතින්නැ යි කෑ ගැසුවේ ය.

එවිට බුදුන් වහන්සේ බමුණාණෙනි, ඔබ වසලයා කවරෙක් ද? වසල බව ඇති කරන කරුණු දන්නෙහි දැ යි විචාළ සේක. ස්වාමීනි මම නො දනිමි. එය වදාළ මැනවැ යි කීවේ ය. ඒ අවස්ථාවේ වසල බව ඇති කරන කරුණු තිස්හතරක් (34) වදාළහ.

මා විසින් මෙසේ අසන ලදි. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර ජේතවන නම් අනේපිඬු සිටුහු ගේ අරම්හි වැඩ වසන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ පෙරවරුයෙහි හැඳ පෙරව පාසිවුරු ගෙන සැවැත් නුවරට පිඬු සිඟා වැඩි සේක. එසමයෙහි අග්ගික භාරද්වාජ බ්‍රාහ්මණයාගේ නිවෙස්න සමීපයෙහි හෝම ගින්න දල්වන ලද්දේ වෙයි. එකල්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර ගෙපිළිවෙළින් පිඬු සිඟා වඩිනා සේක් අග්ගික භාරද්වාජ බ්‍රාහ්මණයාගේ නිවෙසට වැඩි සේක. අග්ගික භාරද්වාජ බ්‍රාහ්මණ දුර ම වඩිනා භාග්‍යවතුන් වහන්සේ දුටුයේ ය. දැක තෙල බස් කීයේ ය. ශ්‍රමණකය, මුණ්ඩකය, වසලය ඔහි ම සිටුව යනුයි.

මෙසේ කී කල්හි භාග්‍යවතුන් වහන්සේ අග්ගික භාරද්වාජ බමුණාට මෙය වදාළහ. “බමුණ, තෝ වසලයා වේව යි, වසල කරන ධර්‍ම වේව යි දන්නෙහි” දැ යි ඇසී.

භවත් ගෞතමයන් වහන්ස, මම වසලයා වේව යි, වසල කරන ධර්‍ම වේව යි නො දනිමි. ඉදින් භවත් ගෞතමයන් ගෙන් යම් පරිදි මම් වසල වේව යි වසල කරන ධර්‍ම වේව යි දැන ගනීම් ද? එපරිදි භවත් ගෞතමයන් වහන්සේ දහම් දෙසන සේක්වා.

බ්‍රාහ්මණය, එසේ නම් අසව, මොනවට මෙනෙහි කරව, කියන්නෙමි යි කීහ. භවත්නි, එසේ ය යි අග්ගික භාරද්වාජ භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වී ය. භාග්‍යවතුන් වහන්සේ මේ සූත්‍රය වදාළ සේක:

1. යම් මිනිසෙක් කිපෙන සුලු වූයේත්, බඳනා ලද වෛර ඇතියේත්, පව්ටු ළාමක ගුණමකු වූයේත්, විපර්‍යාස්ත දෘෂ්ටි ඇතියේත්, මායාවිත් වේ ද ඔහු වසලයෙකැයි දන්නේ ය.

2. මෙලොව යමෙක් ඒකජ වේව යි, ද්විජ වේව යි, ප්‍රාණීන් දිවි ගලවා ද? යමක්හට ප්‍රාණීන් කෙරෙහි දයා නැත් ද ඔහු වසලයෙකැ යි දන්නේ ය.

3. යමෙක් ගමුදු නියම්ගමුදු වනසා ද, වටලා ගනී ද, “ගම් පහරන සොරෙකැ” යි ප්‍රකට වේද ඔහු වසලයෙකැ යි දන්නේ ය.

4. ගම්හි චේව යි වල්හි චේව යි අනුන් විසින් මමත්වය කළ (හිමියන් විසින්) නොදුන් වස්තුවක් සොර සිතින් ගනී ද ඔහු වසලයෙකැ යි දන්නේ ය.

5. යමෙක් එකැතින් ණය ගෙන චෝදනා කරනු ලබන්නේ 'තට මාගේ ණයක් නැතැ' යි පලායේ නම් ඔහු වසලයෙකැ යි දන්නේ ය.

6. යමෙක් අල්පමාත්‍ර වූ ද, කිසිවක් කැමැත්තෙන් මගැ යන ජනයා නසා බඩු වෝලෝ ගනී ද ඔහු වසලයෙකැ යි දන්නේ ය.

7. යමෙක් ආත්ම හේතුයෙන් හෝ පරහේතුයෙන් හෝ චේව යි තවද යම් මිනිසෙක් ධනය හේතුවෙන් හෝ සාක්ෂි කොට පුළුවුස්නා ලද්දේ දැන දැන මුසා බස් බෙණේ ද ඔහු වසලයෙකැ යි දන්නේ ය.

8. යමෙක් නෑ සබඳුන් ගේ චේව යි යහළුවන් ගේ චේව යි අඹුවන් කෙරෙහි බලහත්කාරයෙන් හෝ දෙදෙනා ගේ සභායෙන් හෝ අනාචාරයෙහි හැසිරේ ද ඔහු වසලයෙකැ යි දන්නේ ය.

9. යමෙක් අර්ථෝපකරණයෙන් පොහොසත් වූයේ ජරාවෙන් දිරූ පහ වූ යොවුන් බව ඇති මව හෝ පියා හෝ නො පුස්නේ ද ඔහු වසලයෙකැ යි දන්නේ ය.

10. යමෙක් මව හෝ පියා හෝ බෑයා බුහුන හෝ පෙළා ද, වචනයෙන් හෝ කෝප උපදවා ද ඔහු වසලයෙකැ යි දන්නේ ය.

11. යමෙක් අර්ථය පුළුවුස්නා ලද්දේ ඔහුට අහිතයක් ම පවසා ද, අර්ථය ම වූවත් සඟවා කථා කරන්නේ ද ඔහු වසලයෙකැ ය දන්නේ ය.

12. යමෙක් පව්කම් කොට, මා නහමක් දකීවා යි කැමැති වේ ද, යමෙක් ප්‍රතිච්ඡන්න කර්ම ඇති යෙක් වේ ද ඔහු වසලයෙකැ යි දන්නේ ය.

13. යමෙක් පර කුලයට ගොස් පිනි භොජුන් වළඳා තම නිවෙසට පැමිණියහුට ප්‍රතිපූජා නො කෙරේ ද ඔහු වසලයෙකැ යි දන්නේ ය.

14. යමෙක් බමුණකු චේව යි, මහණකු චේව යි, අන්කිසි යදියකු චේව යි, මුසවායෙන් රවටා ද ඔහු වසලයෙකැ යි දන්නේ ය.

15. යමෙක් භෝජන කාලය එළඹෙත් ම බමුණකු චේව යි, මහණකු චේව යි, පරොස් බසින් කෝප උපදවා ද, කිසිත් නොදේ ද ඔහු වසලයෙකැ යි දන්නේ ය.

16. යමෙක් මෝහයෙන් වෙළුණේ කිසිවක් ගනු කැමැත්තේ අසත් බස් තෙපලා ද ඔහු වසලයෙකැ යි දන්නේ ය.

17. යමෙක් ස්වකීය මානයෙන් ඉතා හීනවූයේ තමා හුවා දක්වා ද, මෙරමා හෙලා දකී ද ඔහු වසලයෙකැ යි දන්නේ ය.

18. මෙරමා හට කෝප උපදවනුයේ තද මසුරු වූයේත් ළාමක වූ ඊර්ෂ්‍යා ඇත්තේ ද, මසුරු බැව් ඇත්තේ ද, ශඨ භාවයෙන් යුක්ත වේ ද, පවට ලජ්ජා නැත්තේ පවට බිය නැත්තේ වේ ද ඔහු වසලයෙකැ යි දන්නේ ය.

Non-Commercial Distribution

19. යමෙක් සම්මා සම්බුදුනට පරිභව බෙණේ ද නොහොත් උන්වහන්සේ ගේ සවු වූ පැවිද්දකුට වේව යි, ගැහැවියකුට වේව යි අපවාද කෙරේ ද ඔහු වසලයෙකැ යි දන්නේ ය.

20. යමෙක් රහත් නො වූයේ මම රහත්මි යි පිළින කෙරේ ද, බඹුන් සහිත වූ ලොව්හි සොරකු වූ මේ තෙමේ ම අධම වූ ම වසලයෙක් වෙයි. යම් පුඟුල් කෙනෙක් මා විසින් තොපට පවසන ලද්දාහු ද මොහු ඒකාන්තයෙන් වසලයෙකැ යි කියන ලදහ.

21. ජාතියෙන් වසල නොවෙ යි. ජාතියෙන් බමුණු ද නොවේ. කර්මයෙන් වසල වෙයි. කර්‍මයෙන් බ්‍රාහ්මණ වේ.

22. යම් ප්‍රකාරයකින් මාගේ මේ නිදසුන් වේ ද, ඒ කරුණ මේ ප්‍රකාරයෙනුදු දැනගනිවු (කෑමට) බලුමස් උයන සෝපාක නම් සැඩොල් පුතෙක් මාතංග ය යි ප්‍රසිද්ධ විය.

23. ඒ මාතංග හීන කුලෝත්පන්නයකු විසින් ඉතා දුර්ලභ වූ යම් යශසකට පැමිණියේ ද, ඔහුට උවැටැනට බොහෝ ක්ෂත්‍රියෝ ද බ්‍රාහ්මණයෝ ද පැමිණියහ.

24. හේ බුද්ධාදීන් විසින් පිළිපන් බැවින් මහා මාවතක් වූ අෂ්ට සමාපත්ති යානයට නැඟී කාමරාගය දුරුකොට බ්‍රහ්ම ලෝකයට පැමිණියේ විය.

25. ජාතිය බඹලොව උපතින් නො වැළැහී ය. වේද හදාරණ කුලයෙහි උපන් වේදය පිළිසරණ කොට ඇති, ඒ බ්‍රාහ්මණයෝ ද නිතර පව් කම්හි දක්නා ලැබෙත්.

26. ඉහාත්මයට ගැරහීමට පත්වූවාහු පරලොව්හි දුගතියට ද පත්වූවාහු දක්නා ලැබෙති. ජාති තොමෝ ඔවුන් දුගතියෙන් හෝ ගැරහීමෙන් නො වළහයි.

27. ජාතියෙන් වසල නො වේ. ජාතියෙන් බ්‍රාහ්මණ නො වෙයි. කර්මයෙන් වසල වේ. කර්මයෙන් බ්‍රාහ්මණ වේ.

මෙසේ වදාළ කල්හි අග්ගික භාරද්වාජ බ්‍රාහ්මණයා මෙසේ සැල කෙළේ ය. (සූත්‍රාවසානය ආලවක සූත්‍රයෙහි මෙනි.)

## 7. සච්ච විභඞ්ග සූත්‍රය

තථාගතයන් වහන්සේ බුද්ධත්වයෙන් දෙ මසකට පසු ඇසළ පුන් පොහෝදා බරණැස ඉසිපතන නම් මිගදායෙහි දී පස්වග තවුසන් අමතා දම්සක් පැවතුම් සූත්‍රය දෙසූ සේක. එය සංක්ෂිප්ත දේශනාවකි. එහි චතුරාර්‍ය්‍ය සත්‍යය ත්‍රිපරිවෘත්ත ද්වාදශාකාර වශයෙන් හා ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගය මාතෘකා වශයෙන් ද දේශනා කරන ලදි.

එහිදී සැකෙවින් දෙසූ ඒ සූත්‍රය සැරියුත් හිමියන් ලවා විස්තර වශයෙන් දේශනා කරනු කැමති වූ බුදුරජාණන් වහන්සේ භික්ෂූන් අමතා අගසව් දෙනම ගේ ගුණ පවසා උන් වහන්සේලා ඇසුරු කරන්නට අවවාද දී චතුරාර්‍ය්‍ය සත්‍යය දේශනාවෙහි ශාරිපුත්‍ර හිමියන්ගේ විශේෂ සාමර්ථ්‍යය දක්වා ගඳ කිළියට වැඩි සේක.

Non-Commercial Distribution

මහණෙනි,

තොපි සැරියුත් මුගලන් දෙ නම ඇසුරු කරව්. ඒ දෙ නම නැණවත් ය. භික්ෂූන්හට සංග්‍රහ කරන්නෝ ය. සැරියුත් තෙර වැදූ මව සමාන ය. මුගලන් තෙර කිරිමවු සමාන ය.

මෙසේ ආයුෂ්මත් සැරියුත් තෙමේ තමන් වෙත පැවිදි වූ හෝ අනුන් වෙත පැවිදි වී හෝ පැවිද්දනට ආමිෂයෙන්, ධර්මයෙන් සංග්‍රහ කරමින්, ගිලනුනට උවටැන් කෙරෙමින්, නො ගිලනුනට කමටහන් දෙමින්, අවවාද කරමින් සෝවාන් පෙලෙහි පිහිටුවති. මෙසේ සෝවාන් ඵලය ලැබූවහු මෙයින් මතු ඉතිරි තුන් මගෙහි කටයුතු කරගත හැකිවෙයි. ඔවුන් කෙරෙහි අපෙක්ෂා රහිතව වෙනත් නවක තෙරවරුනට අවවාද කෙරෙති.

මුගලන් හිමි ද තමන් වෙත හෝ අනුන් වෙත හෝ පැවිදි වූ කුලපුත්‍රයනට එසේ සංග්‍රහ කොට කමටහන්හි යොදවා රහත් ඵලය දක්වා තෙමගෙහි හික්මව යි.

මා විසින් මෙසේ අසන ලදි. එක් කලෙක **භාග්‍යවතුන් වහන්සේ බරණැස්** නුවර **මිගදාය** නම් ඉසිපතනාරාමයෙහි වැඩ වාසය කරන සේක. එකල භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි, කියා මහණුන් ඇමතූ සේක. ඒ මහණහු වහන්සැ' යි පිළිවදන් දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක:

මහණෙනි, අර්හත් සම්‍යක් සම්බුද්ධ වූ තථාගතයන් විසින් බරණැස ඉසිපතන නම් මුව වනයේ දී මහණකු විසින් වේව යි, බමුණකු විසින් වේව යි, දෙවියකු විසින් වේව යි, මරහු විසින් වේව යි, බඹහු විසින් වේව යි, ලොව කිසිවකු විසින් වේව යි නො පැවැත්විය හැකි අනුත්තර **ධර්ම චක්‍රය** පවත්වන ලදි. ඒ කෙසේ ද යත්?

චතුරාර්‍ය්‍ය සත්‍යයන් පැවසීම දෙසීම පැනවීම තැබීම විවරණය විභාගය පළට කිරීමයි. කවර සතර දෙනෙකු ගේ ය යත්? **දුඃඛාර්‍ය්‍යසත්‍යයාගේ** පැවසීම දෙසීම පැනවීම තැබීම විවරණය විභජනය උත්තානි කරණය, **දුඃඛසමුදයාර්‍ය්‍යසත්‍යයාගේ** - පෙ - **දුඃඛනිරෝධාර්‍ය්‍යසත්‍යයාගේ** - පෙ - **දුඃඛනිරෝධගාමිනී ප්‍රතිපදයාර්‍ය්‍යසත්‍යයාගේ** පැවසීම දෙසීම පැනවීම තැබීම විවරණය විභජනය උත්තානි කරණය යි.

මහණෙනි, **සැරියුත්** - **මුගලන්** දෙදෙන සේවනය කරවු. මහණෙනි, සැරියුත් - මුගලන් දෙදෙන භජනය කරවු. ඒ භික්ෂූහු දෙදෙන පණ්ඩිතය හ. සබ්‍රහ්මචාරීනට අනුග්‍රාහකයෝ ය. මහණෙනි, ශාරිපුත්‍රයෝ **විජාතමාතෘ** සදෘශයහ. මහණෙනි, මෞද්ගල්‍යායනයෝ **පෝෂක උපමාතෘ** සදෘශයහ. මහණෙනි, මෞද්ගල්‍යායනයෝ **පෝෂක උපමාතෘ** සදෘශයහ. මහණෙනි, ශාරිපුත්‍රයෝ සෝවාන් පෙළෙහි හික්මවති. මෞද්ගල්‍යායනයෝ අර්හත්වයෙහි පිහිටුවති. මහණෙනි, ශාරිපුත්‍රයෝ චතුරාර්‍ය්‍ය සත්‍යයන් විස්තර විසින් පවසන්නට දෙසන්නට පනවන්නට පිහිටුවන්නට විවරණය කරන්නට විභාග කරන්නට ප්‍රකට කරන්නට ප්‍රභූ වෙති.

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළහ. සුගතයන් වහන්සේ මෙය වදාරා හුනස්නෙන් නැගී විහාරයට වැඩියහ.

එකල්හි ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ වඩනා හා මැ ඇවැත්නි මහණෙනි යි භික්ෂූන් ඇමතුහ. ඒ භික්ෂූහු ඇවැත්නි යි ආයුෂ්මත් සැරියුත් තෙරණුවනට පිළිවදන් ඇස්වූහ. ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ තෙල **සච්චවිභංග සූත්‍රය** වදාළහ.

ඇවැත්නි, අර්හත් සම්‍යක් සම්බුද්ධ වූ තථාගතයන් විසින් බරණැස ඉසිපතන නම් මුව වනයේ දී මහණකු චේව යි. බමුණකු චේව යි, දෙවියකු චේව යි, මරකු චේව යි, ලොව අන්කිසිවක්හු විසින් නො පැවැත්විය හෙන අනුත්තර ධර්මචක්‍රය පවත්වන ලදි. ඒ කෙසේ ද යත්, චතුරාර්‍ය්‍ය සත්‍යයන්ගේ පැවසීම දෙසීම පැනවීම තැබීම විවරණය විභජනය උත්තානිකරණය යි. කවර සතර දෙනකුන්ගේ ද යත්? දුඃඛාර්‍ය්‍යසත්‍යයාගේ, දුඃඛසමුදයාර්‍ය්‍යසත්‍යයාගේ, දුඃඛනිරෝධාර්‍ය්‍යසත්‍යයාගේ, දුඃඛනිරෝධගාමිනි ප්‍රතිපදයාර්‍ය්‍යසත්‍යයාගේ පැවසීම දෙසීම පැනවීම තැබීම විවරණය විභජනය උත්තානි කරණය යි.

ඇවැත්නි, දුඃඛාර්‍ය්‍යසත්‍යය කවරේ ද යත්? ජාතියත් දුක ය, ජරාවත් දුක ය, මරණයත් දුක ය, ශෝකපරිදේව දුඃඛ දෞර්මනස්‍ය උපායාසයෝ ද දුක් ය. රිසි යමක් නො ලබා නම් එයද දුක ය. සැකෙවින් පංච උපාදානස්කන්ධයෝ දුක් ය.

ඇවැත්නි ජාතිය කවරී ද? ඒ ඒ සත්වයන්ගේ ඒ ඒ සත්ව නිකායයෙහි යම් ඉපැත්මෙක්, මොනවට ඉපැත්මෙක්, අවක්‍රාන්තියෙක්, ඉපැත්මෙක් ස්කන්ධයන්ගේ පහළවීමෙක් ආයතනයන්ගේ ප්‍රතිලාභයෙක් වේ ද ඇවැත්නි, මේ ජාතිය යි කියනු ලැබේ.

ඇවැත්නි, ජරා කවරහය යත්? ඒ ඒ සත්වයන්ගේ ඒ ඒ සත්ව නිකායයෙහි යම් දිරීමක් දිරන අයුරෙක් කැඩුණු බවෙක්, පලිත ඇති බවෙක්, ඇඟ රැලිවැටුනු බවෙක්, ආයු පිරිහීමෙක්, ඉඳුරන් පැසීමෙක් වේ ද, ඇවැත්නි, මේ ජරාය යි කියනු ලැබේ.

ඇවැත්නි, මරණය කවරේ ද යත්? ඒ ඒ සත්වයන්ගේ ඒ ඒ සත්ව නිකායයෙන් යම් ච්‍යුතියෙක් චවනාකාරයෙක් බිඳීමෙක්, අතුරු දහනෙක් මෘත්‍යුසංඛ්‍යාත මරණයෙක් කාලක්‍රියාවෙක් ස්කන්ධයන් ගේ බිඳීමෙක් ශරීරයා ගේ නික්ෂේපයෙක් ජීවිතින්ද්‍රියාගේ උපච්ඡෙදයෙක් වේද, ඇවැත්නි මේ මරණය යි කියනු ලැබේ.

ඇවැත්නි, ශෝක නම් කවරේ ද යත්? ඇවැත්නි, අන්‍යතර අන්‍යතර ව්‍යසනයෙකින් සමන්නාගත වූ අන්‍යතර අන්‍යතර දුඃඛයකින් පහරණ ලද්දහු ගේ යම් ශෝකයෙක් වේ ද, ශෝක කළ බවෙක් වේ ද, අභ්‍යන්තර ශෝකයක් වේ ද, ඇවැත්නි, මේ ශෝකය යි කියනු ලැබේ.

ඇවැත්නි, පරිදේව නම් කවරේ ද යත් ? ඇවැත්නි, අන්‍යතර ව්‍යසනයෙකින් සමන්නාගත වූ අන්‍යතර අන්‍යතර දුඃඛයකින් පහරණ ලද්දහු ගේ නම් ගොත් දක්වමින් හැඬීමෙක්, නම කියා හඬන අයුරෙක්, නම් ගොත් කියා හඬන බවෙක් වේ ද, ඇවැත්නි, මේ පරිදේවය යි කියනු ලැබේ.

ඇවැත්නි, දුඃඛය කවරේ ද යත්? යම් කායික දුඃඛයෙක්, කායික අමධුරයෙක්, කාය සංස්පර්ශයෙන්, උපන් දුකෙක්, නො මිහිරක්, වේදනාවෙක් වේ ද, ඇවැත්නි, මේ දුඃඛය යි කියනු ලැබේ.

ඇවැත්නි, දොම්නස කවරේ ද යත්? යම් චෛතසික දුඃඛයෙක්, චෛතසික අමධුරයෙක්, මනෝසම්ඵස්සයෙන් හටගත් දුඃඛ වේදනාවෙක්, අමධුර වේදනාවෙක් ඇද්ද, ඇවැත්නි, මේ දොම්නසය යි කියනු ලැබේ.

Non-Commercial Distribution

ඇවැත්නි, උපායාසය කවරේ ද යත්? ඇවැත්නි, අන්‍යතර වූ ව්‍යසනයකින් යුක්ත වූවහු ගේ අන්‍යතර අන්‍යතර වූ දුඃඛ ධර්මයකින් පහළහු ගේ යම් ආයාසයක්, උපායාසයක්, ආයාසාකාරයෙක් ඇද්ද, ඇවැත්නි, මේ උපායාසය යි කියනු ලැබේ.

ඇවැත්නි, යම් ඉච්ඡාවක් නො ලබා නම් එ ද දුකය. ඇවැත්නි, ජාති ස්වභාව ඇති සත්‍වයාට මෙබඳු ඉච්ඡායෙක් උපදනේ ය. අපි ජාතිස්වභාව ඇත්තමෝ නො වන්නමෝ නම් මනා මැනු, උත්පත්තිය අප වෙත නො ඒ නම් මනා මැනු කියායි. එය ඉච්ඡායෙන් නො ලැබිය හැක්කකි. මෙ ද යම් ඉච්ඡාවක් නො ලබා නම් එද දුකය. යනුවෙයි. ඇවැත්නි, ජරා ස්වභාව ඇති සත්වයනට ..... ඇවැත්නි, මරණස්වභාව ඇති සත්වයන්ට ඇවැත්නි, ශෝක - පරිදේව - දෞර්මනස්ස්‍ය ස්වභාව ඇත්තමෝ නො වන්නමෝ නම් මනා මැනු, ශෝක - පරිදේව - දුඃඛ - දෞර්මනස්ස්‍ය - උපායාසයෝ අප කරා නො පැමිණේත් නම් මනා මැනු කියාය. තෙල ඉච්ඡායෙන් නො ලැබිය හැක්කකි. මෙ ද යම් ඉච්ඡාවක් නො ලබා නම් එද දුකය යනු නම් වෙයි.

ඇවැත්නි, සංක්ෂේපයෙන් දුඃඛ වූ, පඤ්චෝපාදානස්කන්ධයෝ කවරහය යත්? හේ මෙසේ යඃ රූපෝපාදානස්කන්ධය,. වේදනෝපාදානස්කන්ධය, සංඥෝපාදානස්කන්ධය, සංඛාරෝපාදානස්කන්ධය, විඥනෝපාදානස්කන්ධය යි. ඇවැත්නි මොහු සැකෙවින් දුඃඛ වූ පඤ්චෝපාදානක්ඛන්ධය ය යි කියනු ලැබේ. ඇවැත්නි, මේ දුඃඛාර්‍ය්‍ය සත්‍යය යි කියනු ලැබේ.

ඇවැත්නි, දුඃඛ සමුදයාර්‍ය්‍ය සත්‍යය කවරේ ද යත්? පුනර්භවය පිණිස වැටෙන නන්දිරාග සහගත වූ ඒ ඒ භවයෙහි ඇළුම් කරන යම් තෘෂ්ණායෙක් ඇද්ද, ඒ කෙසේ ද යත්? කාමතෘෂ්ණා ය, භවතෘෂ්ණා ය, විභවතෘෂ්ණා ය, මේ දුඃඛ සමුදය ආර්‍ය්‍ය සත්‍යය යි කියනු ලැබේ.

ඇවැත්නි, දුඃඛ නිරෝධ - ආර්‍ය්‍යසත්‍යය කවරේ ද යත්? ඒ තෘෂ්ණාව ගේ මැ, යම් අශේෂ විරාග නිරෝධයෙක්, ත්‍යාගයෙක්, නෙරපීමෙක්, මිදීමෙක්, නො ඇල්මෙක් ඇද්ද, ඇවැත්නි, මේ දුඃඛ නිරෝධ ආර්‍ය්‍ය සත්‍යය යි කියනු ලැබේ.

ඇවැත්නි, දුඃඛ නිරෝධ ගාමිනී ප්‍රතිපදා - ආර්‍ය්‍ය සත්‍යය කවරේ ද යත්? මේ අරී අටඟිමග මැයි. ඒ කෙසේ ද යත්? **සම්‍යක් දෘෂ්ටිය, සම්‍යක් සංකල්පය, සම්‍යක් වචනය, සම්‍යක් කර්මාන්තය, සම්‍යක් ආජීවය, සම්‍යක් ව්‍යායාමය, සම්‍යක් ස්මෘතිය, සම්‍යක් සමාධිය** යි.

ඇවැත්නි, **සම්‍යක් දෘෂ්ටිය** කවරී ද? දුක කෙරෙහි මේ දුක යයි දැනීමෙක් වේ ද, දුඃඛ සමුදය කෙරෙහි මේ දුඃඛ සමුදය යි දැනීමෙක් වේ ද, දුඃඛ නිරෝධය පිළිබඳ දැනීමෙක් වේ ද, දුක නිරුද්ධ කිරීමට පිළිපැදීම පිළිබඳ යම් දැනීමෙක් වේ ද එය සම්‍යක් දෘෂ්ටිය යි කියනු ලැබේ.

ඇවැත්නි, **සම්‍යක් සංකල්පය** කවරේ ද යත්? **නෛෂ්ක්‍රම්‍ය සංකල්පය, අව්‍යාපාද සංකල්පය, අවිහිංසා සංකල්පය යි.** ඇවැත්නි, මේ **සම්‍යක් සංකල්පය** යි කියනු ලැබේ.

ඇවැත්නි, **සම්‍යක් වචන** කවරේ ද යත්? මුසවායෙන් වැළකීම, පිසුණු බසින් වැළකීම, පරොස් බසින් වැළකීම හා ප්‍රලාපයෙන් වැළකීම යි. ඇවැත්නි, මේ සම්‍යක් වචනය යි කියනු ලැබේ.

Non-Commercial Distribution

ඇවැත්නි, සම්‍යක් කර්මාන්තය කවරේ ද යත්? පණිවායෙන් වැළකීම, අයිනාදනින් වැළකීම, කාමයෙහි මිසහසරින් වැළකීම යි. මේ සම්‍යක් කර්මාන්තය යි කියනු ලැබේ.

ඇවැත්නි, සම්‍යක් ආජීවය කවරේ ද යත්? ඇවැත්නි, මේ සස්නෙහි ආර්‍ය්‍ය ශ්‍රාවක තෙමේ මිථ්‍යා ආජීව හැරපියා සම්‍යක් ආජීවයෙන් ජීවිකා කෙරෙයි. ඇවැත්නි, මේ සම්‍යක් ආජීවය යි කියනු ලැබේ.

ඇවැත්නි, සම්‍යක් ව්‍යායාමය කවරේ ද යත්? ඇවැත්නි, මේ සස්නෙහි මහණ නූපන් ලාමක අකුශල ධර්මයන් නූපදනා පිණිස කර්තුකම්‍යතා කුශලච්ඡන්දය උපදවයි. ව්‍යායාම කෙරෙයි. වීර්‍ය්‍යය පවත්වයි. සිත නඟයි. ප්‍රධන් වීර්‍ය්‍ය කෙරෙයි. උපන් ලාමක අකුශල ධර්මයන් දුරුකරනු පිණිස කුසලච්ඡන්දය උපදවයි. ව්‍යායාම කෙරෙයි. වීර්‍ය්‍යය පවත්වයි. සිත නඟයි. ප්‍රධන් වීර්‍ය්‍ය කෙරෙයි. උපන් කුශල ධර්මයන්ගේ පැවැත්ම පිණිස නො නැසීම පිණිස බහුල භාවය පිණිස විපුලභාවය පිණිස වර්ධනය පිණිස පරිපූර්ණය පිණිස කර්තුකම්‍යතා කුසලච්ඡන්දය උපදවයි. ව්‍යායාම කෙරෙයි. වීර්‍ය්‍ය පවත්වයි. සිත නඟයි. ප්‍රධන් වීර්‍ය්‍ය කෙරෙයි. ඇවැත්නි, මේ සම්‍යක් ව්‍යායාමය යි කියනු ලැබේ.

ඇවැත්නි සම්‍යක් ස්මෘතිය කවරේ ද යත්? ඇවැත්නි, මේ සස්නෙහි මහණ කයෙහි කය අනුව නුවණින් දක්නා සුලු වැ කෙලෙස් තවන වැර ඇතිව සම්‍යක් ප්‍රඥා ඇතිව ස්මෘතිමත්ව පඤ්චස්කන්ධ ලෝකයෙහි අභිධ්‍යා දෞර්මනස්‍ය දුරුකොට වාසය කෙරෙයි. වේදනායෙහි .... චිත්තයෙහි ..... ධර්මයෙහි ධර්මය නුවණින් දක්නා සුලුව කෙලෙස් තවන වැර ඇතිව ..... අභිධ්‍යා දෞර්මනස්‍ය දුරුකොට වාසය කෙරෙයි. ඇවැත්නි, මේ සම්‍යක් ස්මෘතිය යි කියනු ලැබේ.

ඇවැත්නි, සම්‍යක් සමාධිය කවරේ ද යත්? ඇවැත්නි, මේ සස්නෙහි මහණ කාමයෙන් වෙන්ව ම අකුසල් දහමින් වෙන්ව ම විතර්ක සහිත විචාර සහිත විවේකයෙන් හටගත් ප්‍රීතිසුඛ ඇති පළමුවන දැහැන උපයා වාසය කෙරෙයි. විතර්ක විචාරයන් ගේ ව්‍යුපශමනයෙන් සිය සිතෙහි පැහැදීම කරන චිත්තයා ගේ ඒකග්‍රතාව ඇති විතර්ක රහිත විචාර රහිත සමාධියෙන් උපන් ප්‍රීති සුඛ ඇති දෙවන දැහැන් - තුන්වන දැහැන් - සිවුවන දැහැන් උපයා වාසය කෙරෙයි. ඇවැත්නි, මේ සම්‍යක් සමාධිය යි කියනු ලැබේ.

ඇවැත්නි, අර්හත් සම්‍යක් සම්බුද්ධ වූ තථාගතයන් වහන්සේ විසින් බරණැස් නුවර මිගදාය නම් වූ ඉසිපතනාරාමයෙහි දී මහණකු විසින් වේව යි, බමුණකු විසින් වේව යි, දෙවියකු විසින් වේව යි, නො පැවැත්විය හැකි අනුත්තර, ධර්මචක්‍රය පවත්වන ලදි. යම් මේ චතුරාර්‍ය්‍ය සත්‍යයන් ගේ විභාග කොට පැවසීමෙක් වේ ද, දෙසීමෙක් වේ ද, පැනවීමෙක් වේ ද, ස්ථාපනයක් වේ ද, විවෘත කිරීමෙක් වේ ද, බෙදාලීමෙක් වේ ද, ප්‍රකට කිරීමෙක් වේ ද එය යි.

ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ මේ සච්ච විභඞ්ග සූත්‍රය දෙසූහ. සතුටු සිත් ඇති ඒ මහණහු ආයුෂ්මත් සැරියුත් තෙරණුවන්ගේ භාෂිතය සතුටින් පිළිගත්හ.

Non-Commercial Distribution

# ආටානාටිය සූත්‍රය

පිරිත් දේශනාව අවසන් කරනු පිණිස සජ්ඣායනා කරනු ලබන මේ සූත්‍රය දසලක්ෂ සීයක් තරම් වූ ලෝක පද්ධතීන් කෙරෙහි බලපෑමක් කළ හැකි බැව් දැක්වේ. විපස්සී බුදුන් ගේ පටන් බුදුවරුන් සත් නමක් වෙත නමස්කාර කෙරෙන අතර වෙනත් දෙවි දේවතාවන් ද නම් කෙරේ.

භික්ෂු භික්ෂුණී උපාසක උපාසිකා යන සිවුවණක් පිරිසට අමනුෂ්‍යාදීන් ගෙන් පැමිණෙන උවදුරු වලක්වා ගැනීම සඳහා සිවුවරම් දෙවියන් වෙනුවෙන් වෛශ්‍රවණයා විසින් බුදුරජුන්ට පැවසුවේ යයි කියන ආටානාටිය සූත්‍රය ඇසීමට මිනිසුන් වඩාත් ප්‍රිය කරන්නේ යකුන් එළවීමේ බලයක් මේ සූත්‍රයේ අන්තර්ගත වේ ය යන විශ්වාසය නිසයි. භික්ෂූන් වහන්සේත් මෙය දේශනා කළේ භය සම්ප්‍රයුක්ත ගෞරවයකින් යුක්තව ය.

යක්ෂාවේෂ වූ රෝගියකු සුව කිරීමෙහි දී පිරිත සජ්ඣායනා කළ යුතු අන්දම සුමංගල විලාසිනියෙහි විස්තර වශයෙන් දක්වා තිබේ. එහි සඳහන් වන හැටියට මෙත්ත, රතන සහ ධජග්ග සූත්‍ර සත් දවසක් සජ්ඣායනා කළ යුතුය. එසේ කිරීමෙන් පසුව ද අමනුෂ්‍යයා මිනිසා අතහැර නො ගියහොත් ආටානාටිය සූත්‍රය සජ්ඣායනා කළ යුතු වේ. එහෙත් මුලින් සඳහන් කළ සූත්‍ර නොකියවා ආටානාටිය සජ්ඣායනා කරනු සුදුසු නොවේ. පිරිත් සජ්ඣායනා කරන භික්ෂූනට මෙම කාලය තුළ මස් හෝ පිටියෙන් සෑදූ අහරක් හෝ වැළඳීම නුසුදුසු ය. සුසාන භූමියක නො විසිය යුතු ය. විහාරයේ සිට ගිහියා ගේ නිවස දක්වා පළිහවලින් මැනවින් කළ ආරක්ෂා සහිතව යා යුතු වේ. සජ්ඣායනා කළ යුත්තේ ගෙයක් තුළ ය. එහි දොර කවුළු සියල්ල වසා තැබිය යුතු අතර ආයුධ ගත් අත් ඇති මිනිසුන් භික්ෂූනට වටේ සිට ආරක්ෂා කළ යුතු වේ. භික්ෂූනට මෛත්‍රීසහගත සිතිවිලි සිතෙහි ප්‍රමුඛව තබාගෙන පිරිත් සජ්ඣායනය ඇරඹිය යුතු වේ. එවිට ද අමනුෂ්‍යයෝ නො ගියහොත් රෝගියා චෛත්‍ය මළුවකට ගෙන ගොස් එහි දී මංගල ගාථා සජ්ඣායනා කළ යුතු ය. සියල්ල ම අසාර්ථක වුවහොත් දෙවියන් ඇයද, "දෙවියනි, මෙසේ දනිව්. මේ අමනුෂ්‍යයා අපි කීවක් නොකරයි. දැන් අපි බුදුන්ගේ ආඥාව කරන්නෙමු" යි කිව යුතු ය.

අමනුෂ්‍යයකු භික්ෂු නමකට ආවේෂ වුවහොත් බුදුනට සුවඳ දුම් මල් පහන් පුදා පැමිණි පිරිසට එම පින් අනුමෝදන් කොට උපද්‍රැත වූ භික්ෂුව ගේ යහපත පිණිස සෙසු භික්ෂූන් විසින් පිරිත් සජ්ඣායනා කළ යුතු වේ. සිල්වත් භික්ෂු නමකට හිරිහැර නො කරන ලෙස ද අමනුෂ්‍යයනට කියා සිටිය යුතු ය.

මා විසින් මෙසේ අසන ලදි. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර නිසා ගිජුකුළු පව්වෙහි වැඩ වසන සේක. එකල වරම් දෙවි මහරජහු සතර දෙනා මහත් යක්ෂ සේනායෙන් ද, මහත් ගන්ධර්ව සේනායෙන් ද, මහත් කුම්භාණ්ඩ සේනායෙන් ද මහත් නාග සේනායෙන් ද සතර දෙස රැකවල් තබා, සතර දෙස බල මුළු පිහිටුවා, සතර දිග මුරකරුවන් රඳවා, රෑ පෙරයම් ඉක්ම ගිය කල්හි අභිරාම වර්ණ ඇතිව, සියළු ගිජුකුළුපව්ව එකලු කොට, භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියාහු ය. එළඹ ඔබ ආදරයෙන් වැඳ එකත්පස්ව

Non-Commercial Distribution

උන්හ. ඔවුන් පිරිවර වූ ඒ යක්කු ද ඇතැම් කෙනෙක් භාග්‍යවතුන් වහන්සේ ආදරයෙන් වැඳ එකත්පසෙක උන්හ. ඇතැම් කෙනෙක් භාග්‍යවතුන් වහන්සේ හා සතුටු වූහ. සතුටට කරුණු වූ සිත රැඳවිය යුතු වූ කථාව නිමවා එක් පසෙක උන්හ. ඇතැම් කෙනෙක් නම් ගොත් අස්වා එක් පසෙක හුන්හ. ඇතැම් කෙනෙක් නිහඬ ව එක් පසෙක හුන්හ.

එකත් පසෙක හුන් වෙසවුණු මහරජ භාග්‍යවතුන් වහන්සේට මේ කරුණ සැළ කෙළේ ය. වහන්ස, භාග්‍යවතුන් වහන්සේට නො පැහැදුණු මහ තෙදැති යක්කු වෙත්ම ය. වහන්ස, භාග්‍යවතුන් වහන්සේට පැහැදුණු මහ තෙදැති යක්කු ද වෙත්ම ය. වහන්ස, භාග්‍යවතුන් වහන්සේට නො පහන් වූ හීන තෙද ඇති යක්කු ද වෙත්ම ය. භාග්‍යවතුන් වහන්සේට පහන් වූ හීන තෙද ඇති යක්කු ද වෙත්ම ය. වහන්ස, බොහෝ සෙයින් යක්කු භාග්‍යවතුන් වහන්සේට නො පැහැදුණෝ ම වෙත්. ඒ කවර හෙයින් ද යත්? වහන්ස, භාග්‍යවතුන් වහන්සේ වනාහි පණිවායෙන් වැළැක්ම පිණිස දහම් දෙසන සේක. අයිනාදනින් වැළැක්ම පිණිස දහම් දෙසන සේක. කාමයන්හි වැරදි හැසිරීම වැළැක්ම පිණිස දහම් දෙසන සේක. මුසවායෙන් වළක්නා පිණිස දහම් දෙසන සේක. මත් බවට හා පමාවට කරුණු වූ රහමෙර පීමෙන් වැළැක්ම පිණිස දහම් දෙසන සේක.

යක්කු වනාහි බොහෝ සෙයින් පණිවායෙන් නො වැළැක්කාහු ම ය. අයිනාදනින් නො වැළැක්කාහු ම ය. කාමයන්හි වැරදි හැසිරීමෙන් නො වැළැක්කාහු ම ය. මුසවායෙන් නො වැළැක්කාහු ම ය. මත් බවට ද පමාවට ද කාරණ වූ රහමෙර පීමෙන් නො වැළැක්කාහු ම ය. ඔවුනට භාග්‍යවතුන් වහන්සේ ගේ දහම් දෙසුම අප්‍රිය වේ. අමනාප වේ. වහන්ස, යම් කෙනෙක් අල්ප ශබ්ද ඇති, මඳ වූ හඬ ඇති, පහ වූ ජනවාතය ඇති, මිනිසුන් ගේ හුදෙකලාව කළ යුතු ක්‍රියාවනට නිසි වූ එකලාව හිඳීමට සුදුසු වූ, අරණ්‍ය වනප්‍රස්ථයන් ද බොහෝදුර සෙනසුන් ද සේවනය කෙරෙත් ද, භාග්‍යවතුන් වහන්සේ ගේ සස්නෙහි නො පහන් වූ ඒ සෙනසුන්හි නිවැසි මහ තෙදැති යක්කු වෙත්. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ ඔවුන් ගේ පැහැදීම පිණිස මහණුන් ගේ මෙහෙණින් ගේ උවසුවන් ගේ උවැසියන් ගේ ගුප්තිය පිණිස, ආරක්ෂාව පිණිස, පීඩාවක් නො වනු පිණිස, පහසු වාසය පිණිස ආටානාටිය පිරිත උගන්නා සේක්ව'යි කීයේ ය. භාග්‍යවතුන් වහන්සේ නිහඬ ව ඉවසූ සේක.

ඉක්බිති වෙසවුණු මහරජ භාග්‍යවතුන් වහන්සේ ඉවසූ නියාව දැන එවේලෙහි මේ ආටානාටිය පිරිත කීයේ ය.

පසස් ඇති සිරිමත් වූ විපස්සී බුදු රජුනට නමස්කාර වේවා. සියලු සත්නට අනුකම්පා ඇති සිඛී බුදු රජුනට නමස්කාර වේවා.

සෝදා හළ කෙලෙස් ඇති තපස්වී වූ වෙස්සභූ බුදු රජුනට නමස්කාර වේවා. මරසෙන් මැඬලූ කකුසඳ බුදු රජුනට නමස්කාර වේවා.

බාහිත පාපී වූ, වැස නිම වූ මග බඹසර ඇති කෝණාගමන බුදු රජුනට නමස්කාර වේවා. හැම දැයෙහි මිදුනා වූ කසුප් බුදු රජුනට නමස්කාර වේවා.

යමෙක් දුක් දුරලන මේ ධර්මය දෙසී ද ශ්‍රීමත් වූ ඒ ශාක්‍ය පුත්‍ර අංගීරසයන් වහන්සේට නමස්කාර වේවා.

Non-Commercial Distribution

ලොව යම් කෙනෙක් තුමූ නිවුණාහු තත් වූ පරිදි (සත්‍යයන්) විවසුත් නුවණින් දුටුහු ද, මහත් වූ, පහ වූ බිය ඇති, මාත්‍රභාණී වූ (මුසවා කේලාම් ඈ නො කියන) ඒ ක්ෂීණාශ්‍රවයෝ

දෙව් මිනිස්නට හිත වූ විද්‍යා හා චරණ ධර්මයෙන් සම්පූර්ණ වූ, මහත්වයට පැමිණි, පහ වූ බිය ඇති යම්බඳු වූ ගෞතමයන් වහන්සේට නමස්කාර කෙරෙත් ද, ඒ බුදු රජුනට ද ඔබට පළමුව සිටි බුදුවරුනට ද නමස්කාර වේවා.

මහා රශ්මි මණ්ඩලයක් ඇති, ආදිත්‍ය සංඛ්‍යාත සූර්‍ය්‍ය තෙමේ යම් තැනෙකින් උදාවේ ද, යම් ඒ හිරුහු නැගෙනා කල්හි, රාත්‍රියක් අතුරුදහන්වේ ද,

යම් දිනෙක හිරු නැගි කල්හි දහවලැ යි කියනු ලැබේ ද, ඒ දිගැ පිවිසුණු නදී ජලය ඇති සමුද්‍ර නම් වූ ගැඹුරු ජලාශය වෙයි. මෙසේ එහි එය නදී ජලය ඇති මුහුද යැ යි දනිත්. කීර්තිමත් ඒ මහරජෙක් යම් දිශාවක් පාලනය කෙරෙයි ද, එය මෙතැනින් පෙර දෙස යයි මහජන තෙමේ කියයි.

ගන්ධර්වයනට අධිපති වූ, නම් වශයෙන් ධෘතරාෂ්ට්‍ර යයි ප්‍රකට වූ හේ ගන්ධර්වයන් විසින් පෙරටු කරන ලද්දේ, නැටුම්, ගැයුම්වලින් සිත් අලවා වෙසෙයි. ඔහුට ඉන්ද්‍ර යන එක්ම නමක් ඇති පුතුන් ද බොහෝ ඇතැ යි මා විසින් අසන ලදි. මහ බලැති ඉන්ද්‍ර නම් වූ ඔහු අසූවෙක් ද දශයෙක් ද එකෙක් ද වෙත්. ඔහු ද සූර්‍ය්‍ය බන්ධු වූ කෙලෙස් නින්දෙන් පිබිදියා වූ මහත්වයට පැමිණි පහවූ භය ඇති බුදුරදුන් දැක,

පුරුෂාජානෙයයාණෙනි, ඔබට නමස්කාර වේවා. පුරුෂෝත්තමයාණෙනි, ඔබට නමස්කාර වේවා යි දුර සිටැ ම නමස්කාර කෙරෙත්. ඔබ නිපුණ වූ සර්වඥතාඥානයෙන් මහජනයා දෙස බලති යි කියා අමනුෂ්‍යයෝ ද ඔබ වඳිති. මෙය අප විසින් එක්වන් අසන ලදි. එහෙයින්, තෙපි ගෞතම ජිනයන් වහන්සේ වඳිහු දැ යි අපි මෙසේ ප්‍රශ්න වශයෙන් කියම්හ. අපි ගෞතම ජිනයන් වහන්සේ වඳිම්හ. විද්‍යාචරණ සම්පන්න වූ ගෞතම බුදුරජාණන් වහන්සේ වඳිම් හ යි (පිළිතුරු දෙති)

මහා රැස් මඬුලු ඇති, ආදිත්‍ය නම් වූ හිරු යම් දිනෙක බස්නේ ද, යම් ඒ හිරු බස්නා කල්හි, දහවලත් අතුරුදහන්වේ ද, යම් දිගකට හිරු බැස ගිය කල රාත්‍රිය යි කියනු ලැබේ ද ඒ දින පිවිසුණු නදී ජලය ඇති සමුද්‍ර නම් වූ ගැඹුරු ජලාශය වෙයි. මෙසේ එහි එය නදී ජලය ඇති මුහුද යැ යි දනිත්. යසස් ඇති ඒ මහරජෙක් යම් දිගක් පාලනය කෙරෙයි ද, එය මෙතැනින් පැසිම් දෙස යයි මහජනයා කියයි.

නාගයනට අධිපති වූ නම් විසින් විරූපාක්ෂ යයි ප්‍රකට වූ හේ නාගයන් විසින් පෙරටු කරන ලද්දේ, නැටුම්, ගැයුම්වලින් සිත් අලවා එහි වෙසෙයි. ඔහුට එක්ම නමක් ඇති පුතුන් ද බොහෝ ඇතැ යි මා විසින් අසන ලදි. මහ බලැති ඉන්ද්‍ර නම් වූ ඔහු එක් අනූ දෙනෙක් වෙත්. ඔහු ද සූර්‍ය්‍ය බන්ධු වූ කෙලෙස් නින්දෙන් පිබිදියා වූ මහත්වයට පැමිණි පහවූ බිය ඇති බුදුරදුන් දැක,

ආජානෙය පුරුෂයාණෙනි, ඔබට නමස්කාර වේවා. පුරුෂෝත්තමයාණෙනි, ඔබට නමස්කාර වේවා යි දුර සිටැ ම නමස්කාර කෙරෙත්.

Non-Commercial Distribution

ඔබ නිපුණ වූ සර්වතාඥානයෙන් මහජනයා දෙස බලති යි අමනුෂ්‍යයෝ ද ඔබ වඳිත්. මෙය අප විසින් එක්වන් අසන ලදි. එහෙයින්, තෙපි සර්වඥයන් වහන්සේ වඳිහු ඇ යි මෙසේ අපි ප්‍රශ්න කරම්හ. ගෞතම ජිනයන් වහන්සේ වඳුම්හ. විද්‍යාචරණ සම්පන්න වූ ගෞතම බුදුරජාණන් වහන්සේ වඳුම් හ යි ඔහු කියත්.

යම් දිග් භාගයක ඉතා ඇකුම්කළු මහමේරු පර්වත වෙයි. එහි සිත්කලු වූ උතුරුකුරුව වෙයි. එහි මමත්වය නැති ස්ත්‍රීන් කෙරෙහි පරිග්‍රහයක් නැති මිනිස්සු උපදිති. ඔහු ධාන්‍ය බිජුවට නො වපුරත්. නඟුල ද කෙතට නො පමුණුවනු ලැබේ. ඒ මිනිස්සු නො සානා ලද බිම තමන් ම නැගී පැසුණු හාල් පරිභෝග කරත්. කුඩු නැති, තොහො නැති, ශුද්ධ වූ සුවඳ ඇති සහල් සැලියක බහා පිසැ එයින් ගෙන බොජුන් වළඳත්.

එහි වෙසවුණු රජු ගේ පිරිවර යක්කු එළදෙන එක් කුරැති වාහනයක් කොට ගෙන දිශාවෙන් දිශාවට යෙත්. සිවුපාවකු එක් කුරයක් ඇති වාහනයක් කොට ගෙන දෙසින් දෙස යෙත්, ස්ත්‍රියක වාහන කොට ගෙන දෙසින් දෙස යෙත්. පුරුෂයකු වාහන කොට ගෙන දෙසින් දෙස යෙත්. කුමාරියක වාහනය කොට ගෙන දෙසින් දෙස යෙත්. කුමරකු වාහන කොට ගෙන දෙසින් දෙස යෙත්. ඒ වෙසවුණු රජු ගේ පරිවාරක යක්ෂයෝ එළඹ සිටි හස්ති යානය ද අශ්ව යානය ද දිව්‍යයාන ද යන එකී යානයන් අරා සියලු දික් සිසාරා යෙති.

යසස් ඇති ඒ වෙසවුණු මහ රජුට ප්‍රාසාද ද සිවි ගෙවල් ද වෙත්. නුවරෙක් ද, එයින් ඔබ්බෙහි ජනෝඝ නම් නුවරෙක් ද, අන්‍ය නවනවතිය නම් නුවරෙක් ද, අම්බර අම්බරවතිය නම් නුවරෙක් ද, අන්‍ය ආලකමන්දා රාජධානියෙක් ද ඇත. නිදුකාණෙනි, කුවේර මහ රජු ගේ රජදහන විසාණා නම, එහෙයින් කුවේර මහරජ වෙස්සවණ (වෙසවුණු) යැයි නම් කරනු ලැබෙයි. එහි තතෝලා, තත්තලා, ඕජසී, තේජසී, තතෝජසී, සූරරාජ, අරිෂ්ට, නේමි, අරිෂ්ටනේමි යන නම් ඇති (දොළොස්) යක් රැටියෝ කරුණු විමසා පවසත්.

යම් පොකුණකින් දිය ඇදගෙන මේඝයෝ වසිත් ද, යම් පොකුණකින් වර්ෂාවෝ පැතිරෙත් ද, එසේ වූ ධරණී නම් ජලාශයක් ද එහි වෙයි. එහි තෙර යකුන් රැස්ව හිඳනා හගලවතී නම් රුවන් මඩුවෙක් වෙයි.

එහි විවිධ පක්ෂි සමූහයන් ගෙන් යුක්ත වූ මොණරුන් ද කොස්වාලිහිණියන් ද විසින් දුන් නාද ඇති, කෝකිලාදීන් විසින් මනෝඥ නාදයෙන් උන්නාදිත වූ නිති ඵල දරණ වෘක්ෂයෝ වෙත්. මෙහි පියුම් වෙනෙහි ජීවං ජීව යයි හඬ නඟන පක්ෂි කෙනෙක් ද, තව උට්ඨව, චිත්තක නම් පක්ෂීහු ද, වැලි කුකුළෝ ද, රන්වන් කකුළුවෝ ද ඒ පොක්ඛරසාතක නම් පක්ෂීහු ද වෙත්, මෙහි ගිරවුන් ගේ ද, සැළලිහිණියන් ගේ ද හඬ ඇත. දණ්ඩ මානවක නම් පක්ෂීහු ද මෙහි හැසිරෙත්. මෙසේ හැමකල්හි ඒ කුවේරයා ගේ පියුම් විල හොබනේ ය.

යසස් ඇති කුවේර මහරජ යම් දිගක් පාලනය කෙරෙයි ද, මෙතැනින් උතුර දෙස යැයි මහජන තෙමේ කියයි. නම් විසින් කුවේර යයි ප්‍රකට වූ, යක්ෂයනට අධිපති වූ, හෙතෙමේ යකුන් විසින් පෙරටු කර ගන්නා ලද්දේ නෘත්‍ය ගීතයෙන් සිත් අලවා වෙසෙයි. ඔහුට එක් නම ඇති බොහෝ පුතුන් ද වෙති යි මා විසින් අසන ලදි. ඔහු ඉන්ද්‍ර යන නම ඇති බලැති එක් අනූ දෙනෙකි.

Non-Commercial Distribution

ඔහු ද සූයඍීබන්ධු වූ ක්ලෙශ නිද්‍රායෙන් පිබිදුණු මහත්ව ප්‍රාප්ත පහවූ බිය ඇති බුදුරදුන් දැක ආජානෙය පුරුෂයාණනි, ඔබට නමස්කාර වේවා. උත්තම පුරුෂයාණනි, ඔබට නමස්කාර වේවා යි දුර සිට ම නමදිත්. ඔබට නිපුණ වූ සර්වඥතාඥනයෙන් මහජනයා වෙත බලති යි කියා අමනුෂ්‍යයෝ ද ඔබ වඳිත්. මෙය අප විසින් එක්වන් අසන ලදි. එහෙයින්, ගෞතම ජිනයන් වහන්සේ වඳිහුදැ'යි මෙසේ (ප්‍රශ්න කොට) කියම්හ. ගෞතම ජිනයන් වහන්සේ අපි වඳිමු. විද්‍යාචරණ දෙකින් සම්පූර්ණ වූ ගෞතම බුදුරජාණන් වහන්සේ වඳිමු'යි ඔහු උත්තර දෙත්.

නිදුකාණන් වහන්ස, මහණුනට ද, මෙහෙණනට ද, උවසුවනට ද, උවැසියනට ද ගුප්තිය පිණිස, රැක්ම පිණිස, නො වෙහෙසීම පිණිස, සැප විහරණය පිණිස වූ ඒ ආටානාටිය පිරිත නම් මෙය ය. නිදුකාණන් වහන්ස, යම්කිසි මහණක්හු හෝ මෙහෙණක හෝ උවසුවකු හෝ උවැසියක විසින් මේ ආටානාටිය පිරිත මනාකොට උගන්නා ලද්දේ, අර්ථව්‍යංජනයෙන් පිරිපුන් කොට පුහුණු කරන ලද්දේ වී නම් යක්ෂයෙක් හෝ යක්ෂණියක් හෝ යක්ෂ පෝතකයෙක් හෝ යක්ෂ පෝතකයෙක් හෝ යක්ෂ පෝතිකාවක් හෝ යක්ෂ මහාමාත්‍රයෙක් හෝ යක්ෂ පාරිෂද්‍යයෙක් හෝ යක්ෂ පරිචාරකයෙක් හෝ ගන්ධර්වයෙක් හෝ ගන්ධර්වියක් හෝ ගන්ධර්ව පෝතකයෙක් හෝ ගන්ධර්ව පෝතිකාවක් හෝ ගන්ධර්ව මහාමාත්‍රයෙක් හෝ ගන්ධර්ව පාරිෂද්‍යයෙක් හෝ ගන්ධර්ව පරිචාරකයෙක් හෝ කුම්භණ්ඩයෙක් හෝ කුම්භණ්ඩියක් හෝ කුම්භණ්ඩ පෝතකයෙක් හෝ කුම්භණ්ඩ පෝතිකාවක් හෝ කුම්භණ්ඩ මහාමාත්‍රයෙක් හෝ කුම්භණ්ඩ පාරිෂද්‍යයෙක් හෝ කුම්භණ්ඩ පරිචාරකයෙක් හෝ නාගයෙක් හෝ නාගිනියක් හෝ නාග පෝතකයෙක් හෝ නාග පෝතිකාවක් හෝ නාග මහාමාත්‍රයෙක් හෝ නාග පාරිෂද්‍යයෙක් හෝ නාග පරිචාරකයෙක් හෝ මෙකී යම්කිසි අමනුෂ්‍යයෙක් ද්වේෂයෙන් ප්‍රදුෂිත සිතැත්තේ මහණකු හෝ මෙහෙණක හෝ උවසුවකු හෝ උවැසියක හෝ මේ කිසිවකු යන්නහු අනුව යන්නේ ද, සිටියහු වෙත සිටින්නේ ද, උන්නහු වෙත ඉඳුනේ ද, හොත්තහු වෙත හෝනේ ද, නිදුකාණන් වහන්ස, ඒ අමනුෂ්‍ය තෙමේ මාගේ ගම්හි හෝ නියම්ගම්හි හෝ සත්කාරයක් හෝ ගෞරවයක් හෝ නො ලබන්නේ ය. නිදුකාණන් වහන්ස, ඒ අමනුෂ්‍ය තෙමේ මගේ ආලකමන්දා රාජධානියෙහි වසන ගෙයක් හෝ නවාතැනක් හෝ නො ලබන්නේ ය.

නිදුකාණන් වහන්ස, ඒ අමනුෂ්‍ය තෙමේ මගේ යක්ෂ සමාගමයට යන්නට හෝ නො ලබන්නේ ය.

වැලිදු නිදුකාණන් වහන්ස, අමනුෂ්‍යයෝ ඔහු ආවාහයක් නො කොට හැක්කකුදු විවාහයක් නො කට හැක්කකුදු කරන්නාහ. තවද නිදුකාණන් වහන්ස, අමනුෂ්‍යයෝ ඔහුට අත් බව එළවා කියනු ලබන පරිපූර්ණ පරිභව වචනයෙන් බණින්නාහ. නිදුකාණන් වහන්ස, තවද අමනුෂ්‍යයෝ හිස් වූ ලෝහ පාත්‍රයක් යටිකුරු කොට හිස නමන්නාහ. තවද නිදුකාණන් වහන්ස, අමනුෂ්‍යයෝ ඔහු හිස සත් කඩක් කොට පලන්නාහු ද වෙති.

නිදුකාණන් වහන්ස, නපුරු වූ, සතුරු වූ, කළ දැයම වැඩියක් කරන්නා වූ අමනුෂ්‍යයෝ ඇත. ඔහු සතර වරම් මහ රජදරුවන් ගේ බස් නොම පිළිගනිත්. වරම් රජුන් අයත්

Non-Commercial Distribution

සෙනෙවියන් ගේ බස් ද නොම පිළිගනිත්, වරම් රජුන් වෙත සිටිනා යක් සෙනෙවියන් ගේ මෙහෙකරුවන්ගේ බස්දු නොම පිළිගනිති. නිදුකාණන් වහන්ස, ඒ අමනුෂ්‍යයෝ වරම් මහරජුන් ගේ සතුරෝ නමැයි කියනු ලැබේ.

නිදුකාණන් වහන්ස, යම්සේ මගධාධිපති රජු ගේ රටෙහි මහ සොරහු ඇති ද, ඔහු මගධාධිපති රජු ගේ වචන නොම පිළිගනිත් ද. මගධාධිපති රජු ගේ සෙනෙවියන් ගේ මෙහෙකරුවන්ගේ වචනත් නොම පිළිගනිත් ද, නිදුකාණන් වහන්ස, ඒ මහ සොරු මගධාධිපති රජු ගේ සතුරෝ නමැයි කියනු ලැබෙත් ද, එසේම නිදුකාණන් වහන්ස, නපුරු වූ සතුරු වූ කළ එකට වැඩියක් කරන්නා වූ අමනුෂ්‍ය කෙනෙක් වෙත් ම ය. ඔහු වරම් මහ රජුන් ගේ සෙනෙවියන් බස් ද නොම පිළිගනිත්, වරම් මහරජුන් අයත් සෙනෙවියන් ගේ මෙහෙකරුවන් බස් දු නො පිළිගනිත්. නිදුකාණන් වහන්ස, ඒ අමනුෂ්‍යයෝ වරම් මහරජුන් ගේ සතුරෝය යි කියනු ලබත්.

නිදුකාණන් වහන්ස, යකෙක් හෝ යකින්නක් හෝ යක් දරුවෙක් හෝ යක් දැරියක් හෝ යක් දෙටුවෙක් හෝ යක් පිරිසදැ වූවෙක් හෝ යක් මෙහෙකරුවෙක් හෝ ගඳෙව්වෙක් හෝ ගඳෙවියක් හෝ ගඳෙව් දරුවෙක් හෝ ගඳෙව් දැරියක් හෝ ගඳෙව් දෙටුවෙක් හෝ ගඳෙව් පිරිසෙහි වූවෙක් හෝ ගඳෙව් මෙහෙකරුවෙක් හෝ කුම්භණ්ඩයෙක් හෝ කුම්භණ්ඩියක් හෝ කුම්භණ්ඩ දරුවෙක් හෝ කුම්භණ්ඩ දැරියක් හෝ කුම්භණ්ඩ දෙටුවෙක් හෝ කුම්භණ්ඩ පර්ෂත්හි වූවෙක් හෝ කුම්භණ්ඩ පරිචාරකයෙක් හෝ නාගයෙක් හෝ නැයිනියක් හෝ නා දරුවෙක් හෝ නා දැරියක් හෝ නා දෙටුවෙක් හෝ නා පරිසද වූවෙක් හෝ නා මෙහෙකරුවෙක් හෝ මෙකී කිසි අමනුෂ්‍යයෙක් ද්වේෂයෙන් ප්‍රදුෂිත සිතැත්තේ මහණකු හෝ මෙහෙණක හෝ උවසුවකු හෝ උවැසියක හෝ මේ කිසිවක්හු යන්නාහු පසුපස යන්නේ වී නම්, සිටියහු පසුපස සිටින්නේ වී නම්, හෝ හුන්නාහු වෙත හිඳින්නේ වී නම් හෝ හොත්තාහු වෙත හෝනේ වී නම් හෝ මේ යකුනට, යක් සෙනෙවියනට, යක් මහ සෙනෙවියනට මේ යක් තෙමේ මා අල්ලා ගනී. මේ යක් තෙමේ වෙසෙසින් මා පෙළනේයි, මේ යක් තෙමේ මට හිංසා කෙරෙයි, මේ යක් තෙමේ මා නොමුඳා අත් නො හරී යයි දැන්විය යුතු, හඬ නගා කියැ යුතු, මුරගා කිය යුතු.

(එසේ දැක්විය යුත්තේ) කවර යකුනට ද? කවර මහා යකුනට ද? කවර යක් සෙනෙවියනට ද? කවර මහ යක් සෙනෙවියනට ද?

ඉන්ද්‍ර ය, සෝම ය, වරුණ ය, භාරද්වාජ ය, ප්‍රජාපති ය, චන්‍දන ය, කාමශ්‍රේෂ්ඨ ය, කින්නිඝණ්ඩු ය, නිඝණ්ඩු ය, පණාද ය, ඕපමඤ්ඤ ය, දේවසූත ය, මාතලි ය, චිත්‍රසේන ය, ගන්ධර්ව ය, නළ ය, රාජ ය, ජනර්ෂභ ය, සාතාගිර ය, හේමවත ය, පූර්ණක ය, කරතිය ය, ගුල ය, මන්දිය ය, පඤ්චාලචණ්ඩ ය, ආලවක ය, පර්ජන්‍ය ය, සුමන ය, සුමුඛ ය, මණී ය, මානි ය, වර ය, දීර්ඝ ය, සේරීසක ය යන මොවුනට ය.

මේ යක්ෂයනට ද මහා යක්ෂයනට ද, යක්ෂ සේනාපතියනට ද, මහා යක්ෂ සේනාපතියනට ද, හඬ නගා කිය යුතු මුර ගා කිය යුතු,

Non-Commercial Distribution

මේ යක් තෙමේ මා අල්ලා ගනිය යි, මේ යක් තෙමේ මට ආවිෂ්ට වේ ය යි, මේ යක් තෙමේ මා පෙළාය යි, මේ යක් තෙමේ වෙසෙසින් පෙළාය යි, මේ යක් තෙමේ මට හිංසා කෙරේය යි, මේ යක් තෙමේ මා වෙහෙසාය යි, මේ යක් තෙමේ මා නො මුදායැ යි දැන්විය යුතු, හඬ නගා කියැ යුතු.

නිදුකාණන් වහන්ස, මේ මහණුනට මෙහෙණනට උවසුවනට උවැසියනට ගුප්තිය පිණිස, රැකවරණ පිණිස, නො වෙහෙසීම පිණිස, පහසු විහරණ පිණිස වූ ආටානාටිය පිරිත ය.

නිදුකාණන් වහන්ස, අපි දැන් යම්හ. අපි බොහෝ කෘත්‍යය ඇත්තම්හ, බොහෝ කටයුතු ඇත්තම්හ'යි වරම් රජහු කීහ.

මහරජුනි, තෙපි යම් ගමනකට දැන් කල්වේ යයි සලකන්නහු ද, ඒ ගමන කරනු ලැබේවා යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

ඉක්බිති සතර වරම් මහ රජහු හුනස්නෙන් නැඟී, සාදර වැ භාග්‍යවතුන් වහන්සේ වැඳ පැදකුණු කොට, එහිම අතුරුදන් වූහ. ඒ යක්කු ද හුනස්නෙන් නැඟී, ඇතැම් කෙනෙක් සාදර වැ භාග්‍යවතුන් වහන්සේ වැඳ පැදකුණු කොට එහිම අතුරුදන් වූහ. ඇතැම් කෙනෙක් භාග්‍යවතුන් වහන්සේ හා සතුටු වූහ. සතුටට කරුණු වූ සිත රැඳවිය යුතු වූ කථා නිමවා එහිම අතුරුදන් වූහ. ඇතැම් කෙනෙක් භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හි ද ඒ දිසාවට දොහොත් නඟා එහිම අතුරුදන් වූහ. ඇතැම් කෙනෙක් නිහඬවූවාහු එහිම අතුරුදන් වූහ.

**තුන්වන බණවර නිමියේ ය.**

• • • • • • • • • • • • • • •

Non-Commercial Distribution

# 1. පිරිත් පේකිරීම

අවිජ්ජාපච්චයා සංඛාරා, සංඛාරපච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණපච්චයා නාම රූපං, නාම රූප පච්චයා සළායතනං, සළායතනපච්චයා ඵස්සො, ඵස්සපච්චයා වෙදනා, වෙදනාපච්චයා තණ්හා, තණ්හාපච්චයා උපාදානං, උපාදානපච්චයා භවො, භවපච්චයා ජාති, ජාතිපච්චයා ජරා මරණං, සොක පරිදෙව දුක්ඛ දොමනස්සුපායාසා සම්භවන්ති. එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති. අවිජ්ජායත්වෙව අසේස විරාග නිරොධා, සංඛාර නිරෝධො, සංඛාර නිරොධා, විඤ්ඤාණ නිරොධො, විඤ්ඤාණ නිරොධා, නාම රූප නිරොධො, නාම රූප නිරොධා, සළායතන නිරොධො, සළායතන නිරොධා, ඵස්ස නිරොධො, ඵස්ස නිරොධා, වෙදනානිරොධො, වෙදනා නිරොධා, තණ්හා නිරොධො, තණ්හා නිරොධා, උපාදාන නිරොධො, උපදාන නිරොධා, භව නිරොධො, භව නිරොධා, ජාති නිරොධො, ජාති නිරොධා, ජරා මරණං සොක පරිදේව දුක්ඛදොමනස්සුපායාසා නිරුජ්ඣන්ති. එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොති.

අනේක ජාති සංසාරං සන්ධා විස්සං අනිබ්බිසං
ගහකාරකං ගවේසන්තො දුක්ඛා ජාති පුනප්පුනං
ගහකාරක දිට්ඨෝසි පුනගෙහං නකාහසි
සබ්බා තෙ ඵාසුකාභග්ගා ගහකූටං විසංඛිතං
විසංඛාර ගතං චිත්තං තණ්හානං ඛය මජ්ඣගාති.

ඉතිපිසො භගවා අරහං සම්මා සම්බුද්ධෝ විජ්ජාචරණ සම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථී සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා ති.

ස්වාක්ඛාතො භගවතා ධම්මො සන්දිට්ඨිකො අකාලිකො එහිපස්සිකො ඔපනයිකො පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහී ති.

සුපටිපන්නො භගවතො සාවකසංඝො උජුපටිපන්නො භගවතො සාවකසංඝො ඤායපටිපන්නො භගවතො සාවකසංඝො සාමීචිපටිපන්නො භගවතො සාවකසංඝො යදිදං චත්තාරි පුරිසයුගානි අට්ඨපුරිස පුග්ගලා එස භගවතො සාවකසංඝො ආහුනෙය්‍යො පාහුනෙය්‍යො දක්ඛිනෙය්‍යො අඤ්ජලිකරණීයො අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සා ති.

# 2. ජය මංගල ගාථා

1. බාහුං සහස්ස මභිනිම්මිත සායුධං තං
ගිරිමෙඛලං උදිතඝොර සසෙන මාරං
දානාදි ධම්ම විධිනා ජිතවා මුනින්දො
තං තෙජසා භවතු තේ[1] ජයමංගලානි

1. තමන් සඳහා කියන විට "මේ" කියා යොදා ගන්න.

Non-Commercial Distribution

2. මාරාතිරෙක මභියුජ්ඣිත සබ්බ රත්තිං
ඝොරම්පනාලවක මක්ඛ මථද්ධ යක්ඛං
ඛන්තී සුදන්ත විධිනා ජිතවා මුනින්දො
තං තෙජසා භවතු තෙ[1] ජයමංගලානි

3. නාලාගිරිං ගජවරං අතිමත්ත භූතං
දාවග්ගි චක්ක මසනීව සුදාරුණං තං
මෙත්තම්බු සෙක විධිනා ජිතවා මුනින්දො
තං තෙජසා භවතු තෙ[1] ජයමංගලානි

4. උක්ඛිත්ත ඛග්ග මතිහත්ථ සුදාරුණං තං
ධාවං තියොජන පථං ගුලිමාල වන්තං
ඉද්ධීභිසංඛත මනො ජිතවා මුනින්දො
තං තෙජසා භවතු තෙ[1] ජයමංගලානි

5. කත්වාන කට්ඨ මුදරං ඉව ගබ්භිනීයා
චිඤ්චාය දුට්ඨ වචනං ජනකාය මජ්ඣෙ
සන්තෙන සොම විධිනා ජිතවා මුනින්දො
තං තෙජසා භවතු තෙ[1] ජයමංගලානි

6. සච්චං විහාය මතිසච්චක වාද කෙතුං
වාදාභිරොපිතමනං අති අන්ධභූතං
පඤ්ඤාපදීප ජලිතො ජිතවා මුනින්දො
තං තෙජසා භවතු තෙ[1] ජයමංගලානි

7. නන්දොපනන්ද භුජගං විබුධං මහිද්ධිං
පුත්තෙන ථෙර භුජගෙන දමාපයන්තො
ඉද්ධූප දෙස විධිනා ජිතවා මුනින්දෝ
තං තෙජසා භවතු තෙ[1] ජයමංගලානි

8. දුග්ගාහ දිට්ඨි භුජගෙන සුදට්ඨ හත්ථං
බ්‍රහ්මං විසුද්ධි ජුති මිද්ධි බකාභිධානං
ඤාණාගදෙන විධිනා ජිතවා මුනින්දො
තං තේජසා භවතු තෙ[1] ජයමංගලානි

9. එතාපි බුද්ධ ජය මංගල අට්ඨ ගාථා
යො වාචකො දින දිනෙ සරතෙ මතන්දි[2]
හිත්වාන නෙක විවිධානි චුපද්ද වානි
මොක්ඛං සුඛං අධිගමෙය්‍ය නරො ස පඤ්ඤො

---

1. 1, 2, 3, 4, 5, 6, 7, 8 යන ගාථාවල තමන් සඳහා කියන විට "මේ" කියා යොදා ගත යුතුය.
2. 9 ගාථාවේ මතන්දි වෙනුවට වතන්දි කියා ද ඇත.

Non-Commercial Distribution

හවතු සබ්බ මංගල රක්ඛන්තු සබ්බ දෙවතා
සබ්බ බුද්ධානු'භාවෙන සදා සොත්ථී භවන්තු තෙ[1]

හවතු සබ්බ මංගලං රක්ඛන්තු සබ්බ දෙවතා
සබ්බ ධම්මානු'භාවෙන සදා සොත්ථී භවන්තු තෙ[1]

හවතු සබ්බ මංගලං රක්ඛන්තු සබ්බ දෙවතා
සබ්බ සංඝානු'භාවෙන සදා සොත්ථී භවන්තු තෙ[1]

නක්ඛත්ත යක්ඛ භූතානං පාපග්ගහ නිවාරණා
පරිත්තස්සානු'භාවෙන හන්තු තෙසං උපද්දවෙ

මෙයින් පිරිත් පේකිරීම අවසන් කෙරෙති. නැවත බෙරය වරක් ගස්වා පිරිත් නූල් ඇද (පිරිත් හුය තිස් පැයේ ඇතැම් පෙදෙස්වල පිරිතට ගෙන යෑමක් නැත.) මංගල සූත්‍රය, රතන සූත්‍රය, කරණීය මෙත්ත සූත්‍රය යන තුන් සූත්‍රය මෙතැනට දේශනා කොට "මහා කාරුණිකො නාථො" යනාදීන් පටන් ගෙන අවසන් කෙරෙති.

## 3. මහා ජය මඞගල ගාථා

මහා කාරුණිකො නාථො හිතාය සබ්බ පාණිනං
පූරෙත්වා පාරමී සබ්බා පත්තො සම්බොධි මුත්තමං
එතෙන සච්ච වජ්ජෙන හොතු තෙ[1] ජයමංගලං (තුන් වරක්)

ජයන්තො බොධියා මූලෙ සක්‍යානං නන්දි වද්ධනො
එවං තුය්හං[2] ජයො හොතු ජයස්සු ජය මංගලං (තුන් වරක්)

සක්කත්වා බුද්ධ රතනං ඔසධං උත්තමං වරං
හිතං දෙව මනුස්සානං බුද්ධ තෙජෙන සොත්ථිනා
නස්සන්තු පද්දවා සබ්බේ දුක්ඛාවූප සමෙන්තු තෙ[1]

සක්කත්වා ධම්ම රතනං ඔසධං උත්තමං වරං
පරිළාහූපසමනං ධම්ම තෙජෙන සොත්ථිනා
නස්සන්තු පද්දවා සබ්බෙ භයාවූප සමෙන්තු තෙ[1]

සක්කත්වා සංඝ රතනං ඔසධං උත්තමං වරං
ආහුනෙය්‍යං පාහුනෙය්‍යං සංඝ තෙජෙන සොත්ථිනා
නස්සන්තු පද්දවා සබ්බේ රොගාවූප සමෙන්තු තෙ[1]

යං කිඤ්චි රතනං ලොකෙ විජ්ජති විවිධා පුථූ
රතනං බුද්ධ සමං නත්ථි තස්මා සොත්ථී භවන්තු තෙ[1]

යං කිඤ්චි රතනං ලොකෙ විජ්ජති විවිධා පුථූ
රතනං ධම්ම සමං නත්ථි තස්මා සොත්ථී භවන්තු තෙ

යං කිඤ්චි රතනං ලොකෙ විජ්ජති විවිධා පුථූ
රතනං සංඝ සමං නත්ථි තස්මා සොත්ථී භවන්තු තෙ[1]

---

1. මෙ 2. මය්හං

Non-Commercial Distribution

නත්ථි මේ සරණං අඤ්ඤං බුද්ධො මෙ සරණං වරං
එතෙන සච්ච වජ්ජෙන හොතු තේ[1] ජය මංගලං

නත්ථි මේ සරණං අඤ්ඤං ධම්මො මෙ සරණං වරං
එතෙන සච්ච වජ්ජෙන හොතු තේ[1] ජය මංගලං

නත්ථි මේ සරණං අඤ්ඤං සංඝො මෙ සරණං වරං
එතෙන සච්ච වජ්ජෙන හොතු තේ[1] ජය මංගලං

සබ්බීතියෝ විවජ්ජන්තු සබ්බ රොගො විනස්සතු
මා තේ[1] භවත්වන්ත රායො සුඛී දීඝායුකො භව (තුන් වරක්)

භවතු සබ්බ මංගලං රක්ඛන්තු සබ්බ දෙවතා
සබ්බ බුද්ධානුභාවෙන සදා සොත්ථී භවන්තු තේ[1]

භවතු සබ්බ මංගලං රක්ඛන්තු සබ්බ දෙවතා
සබ්බ ධම්මානුභාවෙන සදා සොත්ථී භවන්තු තේ[1]

භවතු සබ්බ මංගලං රක්ඛන්තු සබ්බ දෙවතා
සබ්බ සංඝානුභාවෙන සදා සොත්ථී භවන්තු තේ[1]

නක්ඛත්ත යක්ඛ භූතානං පාපග්ගහ නිවාරණා
පරිත්තස්සානුභාවෙන හන්තු[1] තෙසං උපද්දවෙ (තුන් වරක්)

(භවතු සබ්බ මංගලං, නක්ඛත්ත යක්ඛ භූතානං යන ගාථා දෙක එකට සම්බන්ධ කොට ගෙන "පරිත්තස්ස ආනුභාවෙන තෙසං නක්ඛත්ත යක්ඛ භූතානං උපද්දවෙ හන්ත්වා පාපග්ගහ නිවාරණා සබ්බ මංගලං භවතු සබ්බ දෙවතා රක්ඛන්තු සබ්බ බුද්ධානුභාවෙන සදා තෙ සොත්ථී භවන්තු"යි සලකනු.)

සමහරු පිරිත් පේ කිරීමෙන් පසු පිරිත් නූල් ඇද තුන් සූත්‍රය කියා "මහා කාරුණිකො නාථො" යනු නො කියා, "යන්දුන්නිමිත්තං, දුක්ඛප්පත්තා, සබ්බෙ බුද්ධා" යි අවසන් කෙරෙති.

යන්දුන්නිමිත්තං අවමංගලඤ්ච - යොචා මනාපො සකුණස්ස සද්දො
පාපග්ගහො දුස්සුපිනං අකන්තං - බුද්ධානුභාවෙන විනාස මෙන්තු

යන්දුන්නිමිත්තං අවමංගලඤ්ච - යොචා මනාපො සකුණස්ස සද්දො
පාපග්ගහො දුස්සුපිනං අකන්තං - ධම්මානුභාවෙන විනාස මෙන්තු

යන්දුන්නිමිත්තං අවමංගලඤ්ච - යොචා මනාපො සකුණස්ස සද්දො
පාපග්ගහො දුස්සුපිනං අකන්තං - සංඝානුභාවෙන විනාස මෙන්තු

සබ්බෙ බුද්ධා බලප්පත්තා පච්චෙකානඤ්ච යං බලං
අරහන්තානඤ්ච තෙජෙන රක්ඛං බන්ධාමි සබ්බසො

1. හන්තු තෙසං යනුවෙන් ද හනන්තු තෙසං කියා ද ඇත.

Non-Commercial Distribution

# උදේ පිරිත හමාර කිරීම

රැයෙහි මහ පිරිතෙන් පසු යුග දේශනා පවත්වා, සූත්‍ර හා හමාර කියා, උදේ පිරිත, කරණීය මත්ථ කුසලෙන යනුවෙන් පටන් ගෙන, යන්දුන්නිමිත්තං, දුක්ඛප්පත්තා, සබ්බෙ බුද්ධා, ජයාසන ගතාවිරා, තණ්හංකරො මහා වීරො, මහාකාරුණිකො නාථො. වන්දාමි චේතියං සබ්බං, ඉමිනා පුඤ්ඤ කම්මෙන, උපජ්ඣායා ගුණුත්තරා, කායෙන වාචා චිත්තෙන, ඔකාස ද්වාරත්තයෙන කතං සබ්බං අපරාධං ඛමථ මෙ භන්තෙ'යි අවසන් කෙරෙති.

කරණීය මත්ථ කුසලෙන - පෙ - පුනරෙතීති,

යන්දුන්නිමිත්තං - පෙ - බුද්ධානුභාවෙන - පෙ -
ධම්මානුභාවෙන - පෙ - සංඝානුභාවෙන විනාස මෙන්තු

දුක්ඛප්පත්තා ච නිද්දුක්ඛා භයප්පත්තා ච නිබ්භයා
සොකප්පත්තා ච නිස්සොකා හොන්තු සබ්බෙපි පාණිනො

සබ්බෙසු චක්ක වාලෙසු යක්ඛා දෙවා ච බ්‍රහ්මුනො
යං අම්හෙහි කතං පුඤ්ඤං සබ්බ සම්පත්ති සාධකං

සබ්බෙතං අනුමොදිත්වා සමග්ගා සාසනෙ රතා
පමාද රහිතා හොන්තු ආරක්ඛාසු විසෙසතො

සාසනස්ස ච ලොකස්ස වුද්ධි භවතු සබ්බදා
සාසනම්පි ච ලොකඤ්ච දෙවා රක්ඛන්තු සබ්බදා

සද්ධිං හොන්තු සුඛී සබ්බෙ පරිවාරෙහි අත්තනො
අනීඝා සුමනා හොන්තු සහ සබ්බෙහි ඤාතිභී.

රාජතො වා, චොරතො වා, මනුස්සතො වා, අමනුස්සතො වා, අග්ගිතො වා, උදකතො වා, පිසාචතො වා, ඛාණුකතො වා, කණ්ටකතො වා, නක්ඛත්තතො වා, ජනපද රොගතො වා, අසද්ධම්මතො වා, අසන්දිට්ඨිතො වා, අසප්පුරිසතො වා, චණ්ඩ, හත්ථි, අස්ස, මිග, ගොණ, කුක්කුර, අහිවිච්ඡික, මණිසප්ප, දීපි, අච්ඡ, තරච්ඡ, සූකර, මහිස, යක්ඛ, රක්ඛසාදී හි නානා භය තො වා, නානා රොගතො වා, නානා උපද්දවතො වා, ආරක්ඛං ගණ්හන්තු.

සබ්බේ බුද්ධා බලප්පත්තා පච්චෙකානඤ්ච යං බලං
අරහන්තානඤ්ච තෙජෙන රක්ඛං බන්ධාමි සබ්බසො

## 4. ජින පඤ්ජරය

| | | | |
|---|---|---|---|
| 1. | ජයාසන ගතා වීරා | - | ජෙත්වා මාරං සවාහිණිං |
| | චතුසච්චා මතරසං | - | යෙ පිවිංසු නරා සභා |
| 2. | තණ්හඞ්කරාදයො බුද්ධා | - | අට්ඨ වීසති නායකා |
| | සබ්බේ පතිට්ඨිතා තුය්හං[1] | - | මත්ථකෙ තෙ මුනිස්සරා |
| 3. | සිරෙ පතිට්ඨිතා බුද්ධා | - | ධම්මො ච තවලොචනෙ |
| | සංඝො පතිට්ඨිතො තුය්හං[1] | - | උරෙ සබ්බ ගුණාකරො |

1. තමාට කියනවිට 'මය්හං'යි යොදා ගන්න. 2. තමාට කියනවිට 'මම' යි යොදා ගන්න. 3. තමාට කියනවිට 'මේ' යි යොදා ගන්න.

Non-Commercial Distribution

4. හදයෙ අනුරුද්ධො ච - සාරිපුත්තො ච දක්ඛිණෙ
කොණ්ඩඤ්ඤො පිට්ඨි භාගස්මිං - මොග්ගල්ලානොසිවාමකෙ

5. දක්ඛිණෙ සවණෙ තුය්හං[1] - ආහුං ආනන්ද රාහුලා
කස්සපො ච මහානාමො - උභොසුං වාම සොතකෙ

6. කෙසන්තෙ පිට්ඨිභාගස්මිං - සූරියො විය පභංකරො
නිසින්නො සිරිසම්පන්නො - සොභිතො මුනිපුංගවො

7. කුමාර කස්සපො නාම - මහෙසි චිත්‍ර වාදකො,
සො තුය්හං[1] වදනෙ නිච්චං - පතිට්ඨාසි ගුණාකරො

8. පුණ්ණො අංගුලිමාලො ච - උපාලි නන්ද සීවලී
ථෙරා පඤ්ච ඉමෙ ජාතා - ලලාටෙ තිලකා තව[2]

9. සෙසාසීති මහා ථෙරා - විජිතා ජින සාවකා
ජලන්තා සීල තෙජෙන - අංගමංගෙසු සණ්ඨිතා

10. රතනං පුරතො ආසී - දක්ඛිණෙ මෙත්ත සුත්තකං
ධජග්ගං පච්ඡතො ආසි - වාමෙ අංගුලිමාලකං

11. ඛන්ධ මොර පරිත්තඤ් ච - ආටානාටිය සුත්තකං
ආකාසච්ඡදනං ආසී - සෙසා පාකාර සඤ්ඤිතා

12. ජිනාණා බල සංයුත්තෙ - ධම්මපාකාර ලංකතෙ
වසතො තෙ[3] චතුකිච්චෙන - සදාසම්බුද්ධ පඤ්ජරෙ

13. වාතපිත්තාදි සඤ්ජාතා - බාහිරජ්ඣත්තු පද්දවා
අසෙසා විලයං යන්තු - අනන්ත ගුණ තෙජසා

14. ජිනපඤ්ජර මජ්ඣට්ඨං - විහරන්තං මහීතලෙ
සදා පාලෙන්තු ත්වං සබ්බෙ - තෙ[3] මහා පුරිසා සභා,

15. ඉච්චෙව මච්චන්ත කතො සුරක්ඛො - ජිනානු භාවෙන ජිතුපපද්දවො
බුද්ධානුභාවෙන හතාරි සංඝො - චරාහි[1] සද්ධම්මනු භාව පාලිතො

16. ඉච්චෙව මච්චන්ත කතො සුරක්ඛො - ජිනානු භාවෙන ජිතුපපද්දවො
ධම්මානුභාවෙන හතාරි සංඝො - චරාහි[1] සද්ධම්මනු භාව පාලිතො

17. ඉච්චෙව මච්චන්ත කතො සුරක්ඛො - ජිනානු භාවෙන ජිතුපපද්දවො
සංඝානුභාවෙන හතාරි සංඝො - චරාහි[1] සද්ධම්මනු භාව පාලිතො

18. සද්ධම්මපාකාර පරික්ඛිතොසි[2] - අට්ඨාරියා අට්ඨ දිසාසු හොන්ති
එත්ථන්තරෙ අට්ඨනාථා භවන්ති - උද්ධං විතානංව ජිනාඨිතා තෙ[3]

1. තමාට කියනවිට "චරානි" යි ද, 2. "පරික්ඛිතොස්මි"යි ද 3. "මෙ" යි ද, 4. "මම"යි ද, 5. "මං"යි ද යොදා ගනු.

Non-Commercial Distribution

19. හින්දන්තො මාරසෙනං තව[4] සිරසිඨිතො - බොධි මාරුය්හ සත්ථා
මොග්ගල්ලා නොසි වාමෙ වසති භුජතටෙ - දක්ඛිණෙ සාරිපුත්තො
ධම්මො මජ්ඣෙ උරස්මිං විහරති භවතො - මොක්ඛතො මොර යොනිං
සම්පත්තො බොධිසත්තොචරණ යුගගතො - භානු ලොකෙක නාථො

20. සබ්බාව මංගලමුපද්දව දුන්නිමිත්තං - සබ්බීති රොග ගහදොස මසෙස නින්දා
සබ්බන්තරාය භය දුස්සුපිණං අකන්තං - බුද්ධානුභාව පවරෙන පයාතු නාසං

21. සබ්බාව මංගලමුපද්දව දුන්නිමිත්තං - සබ්බීති රොග ගහදොස මසෙස නින්දා
සබ්බන්තරාය භය දුස්සුපිණං අකන්තං - ධම්මානුභාව පවරෙන පයාතු නාසං

22. සබ්බාව මංගලමුපද්දව දුන්නිමිත්තං - සබ්බීති රොග ගහදොස මසෙස නින්දා
සබ්බන්තරාය භය දුස්සුපිණං අකන්තං - සංඝානුභාව පවරෙන පයාතු නාසං

## අටවිසි පිරිත

1. තණ්හඞ්කරො මහා වීරො - මෙධඞ්කරො මහායසො
සරණඞ්කරො ලොකහිතො - දීපඞ්කරො ජුතින්ධරො

2. කොණ්ඩඤ්ඤො ජනපාමොක්ඛො - මඞ්ගලො පුරිසා සභො
සුමනො සුමනො ධීරො - රෙවතො රති වද්ධනො

3. සොභිතො ගුණ සම්පන්නො - අනොමදස්සී ජනුත්තමො
පදුමො ලොක පජ්ජොතො - නාරදො වර සාරථී

4. පදුමුත්තරො සත්තසාරො - සුමෙධො අග්ග පුග්ගලො
සුජාතො සබ්බ ලොකග්ගො - පියදස්සි නරා සභො

5. අත්ථදස්සි කාරුණිකො - ධම්මදස්සී තමොනුදො
සිද්ධත්ථො අසමො ලොකෙ - තිස්සො වරද සංවරො

6. ඵුස්සො වරද සම්බුද්ධො - විපස්සී ච අනූපමො
සිඛී සබ්බ හිතො සත්ථා - වෙස්සභූ සුඛ දායකො

7. කකුසන්ධො සත්ථවාහො - කොණාගමනො රණඤ්ජහො
කස්සපො සිරි සම්පන්නො - ගොතමො සක්‍ය පුංගවො

8. තෙසං සච්චෙන සීලෙන - ඛන්ති මෙත්ත බලෙන ච
තෙපි ත්වං[5] අනුරක්ඛන්තු - ආරොග්‍යෙන සුඛෙනවා'ති

"මහා කාරුණිකො නාථො" යනාදී මහා ජය මංගල ගාථා කියනු.

වන්දාමි චෙතියං සබ්බං - සබ්බ ඨානෙසු පතිට්ඨිතං
සාරීරික ධාතු මහා බොධිං - බුද්ධරූපං සකලං සදා

ඉච්චෙව මච්චන්ත නමස්සනෙය්‍යං - නමස්ස මානො රතනත්තයං යං
පුඤ්ඤාභි සන්දං විපුලං අලත්ථං - තස්සානු භාවෙන හතන්තරායො

Non-Commercial Distribution

1. ඉමිනා පුඤ්ඤ කම්මෙන - උපජ්ඣායා ගුණුත්තරා
ආචරියූපකාරා ච - මාතා පිතා පියා මමං

2. සුරියො චන්දිමා රාජා - ගුණවන්තා නරා පි ච
බ්‍රහ්මා මාරා ච ඉන්දා ච - ලොක පාලා ච දෙවතා
යමො මිත්තා මනුස්සා ච - මජ්ඣත්තාචඨ වෙරිනො

3. සබ්බෙ සත්තා සුඛි හොන්තු - පුඤ්ඤානි පකතානිමෙ
සුඛං ච තිවිධං දෙන්තු - ඛිප්පං පාපෙථ වොමතං

4. ඉමිනා පුඤ්ඤ කම්මෙන - ඉමිනා උද්දිසෙන ච
ඛිප්පා'හං සුලභෙ චෙව - තණ්හුප්පාදාන ඡෙදනං

5. යෙ සන්තානෙ හීනා ධම්මා - යාව නිබ්බාණතො මමං
නස්සන්තු සබ්බදායෙව - යත්ථ ජාතො භවෙ භවෙ

6. උජුචිත්තො සතිපඤ්ඤො - සල්ලෙඛො විරියවාමිනා
මාරා ලභන්තු නොකාසං - කාතුං ච විරියෙසු මෙ

7. බුද්ධාදි පවරො නාථො - ධම්මො නාථො වරුත්තමො
නාථො පච්චෙක සම්බුද්ධො - සංඝො නාථොත්තරො මමං
තෙ සොත්තමානුභාවෙන - මාරොකාසං ලභන්තු මා

## දෙවියන්ට පිංදීම

ආකාසට්ඨා ච භුම්මට්ඨා - දෙවා නාගා මහිද්ධිකා
පුඤ්ඤං තං අනුමොදිත්වා - චිරං රක්ඛන්තු සාසනං

ආකාසට්ඨා ච භුම්මට්ඨා - දෙවා නාගා මහිද්ධිකා
පුඤ්ඤං තං අනුමොදිත්වා - චිරං රක්ඛන්තු දෙසනං

ආකාසට්ඨා ච භුම්මට්ඨා - දෙවා නාගා මහිද්ධිකා
පුඤ්ඤං තං අනුමොදිත්වා - චිරං රක්ඛන්තු මං පරං

දෙවො වස්සතු කාලෙන - සස්ස සම්පත්ති හොතු ච
පීතො භවතු ලොකො ච - රාජා භවතු ධම්මිකො

කායෙන වාචා චිත්තෙන - පමාදෙන මයා කතං
අච්චයං ඛම මෙ භන්තෙ - භූරිපඤ්ඤ තථාගත

ඕකාස ද්වාරත්තයෙන කතං සබ්බං අපරාධං ඛමථ මෙ භන්තෙ, ඕකාස ඛමාමි භන්තෙ.

Non-Commercial Distribution

උපග්‍රන්ථය I

# 1. ඇනවුම් පිරිත

1. යෙ සන්තා සන්ත චිත්තා - තිසරණ සරණා එත්ථ ලොකන්තරෙ වා
භුම්මා භුම්මා ච දෙවා ගුණගණගහණබ්‍යාවටා සබ්බ කාලං
එතෙ ආයන්තු දෙවා වරකණකමයෙ - මෙරුරාජෙ වසන්තො
සන්තො සන්තො සහෙතුං මුනිවර වචනං - සොතුමග්ගං සමග්ගං

2. සබ්බෙසු චක්කවාළෙසු - යක්ඛා දෙවා ච බ්‍රහ්මුණො
යං අම්හෙහි කතං පුඤ්ඤං - සබ්බ සම්පත්ති සාධකං
සබ්බෙ තං අනුමොදිත්වා - සමග්ගා සාසනෙ රතා
පමාද රහිතා හොන්තු - ආරක්ඛාසු විසෙසතො

3. සාසනස්ස ච ලොකස්ස - වුද්ධි භවතු සබ්බදා
සාසනම්පි ච ලොකඤ් ච - දෙවා රක්ඛන්තු සබ්බදා
සද්ධිං හොන්තු සුඛී සබ්බෙ - පරිවාරෙහි අත්තනො
අනීඝා සුමනා හොන්තු - සහ සබ්බෙහි ඤාතිභී

රාජතො වා, චොරතො වා, මනුස්සතො වා, අමනුස්සතො වා, අග්ගිතො වා, උදකතො වා, පිසාචතො වා, ඛාණුකතො වා, කණ්ටකතො වා, නක්ඛත්තතො වා, ජනපද රොගතො වා, අසද්ධම්මතො වා, අසන්දිට්ඨිතො වා, අසප්පුරිසතො වා, චණ්ඩ, හත්ථි, අස්ස, මිග, ගොණ, කුක්කුර, අහි විච්ඡික, මණිසප්පා දීපි, අච්ඡ, තරච්ඡ, සූකර, මහිස, යක්ඛ, රක්ඛසාදීහි නානා භයතොවා, නානා රොගතො වා, නානා උපද්දවතො වා ආරක්ඛං ගණ්හන්තු.

පණිධානතො පට්ඨාය තථාගතස්ස දස පාරමියො දස උපපාරමියො දස පරමත්ථපාරමියො පඤ්ච මහා පරිච්චාගෙ, තිස්සොචරියා, පච්ඡිමභවෙ ගබ්භාවක්කන්තිං ජාතිං අභිනික්ඛමනං පධානචරියං බොධිපල්ලංකෙ මාර විජයං සබ්බඤ්ඤුතඤාණ පටිවෙධං නවලොකුත්තර ධම්මෙති සබ්බෙපි මෙ බුද්ධ ගුණෙ ආවජ්ජිත්වා, වෙසාලියා තීසු පාකාරන්තරෙසු තියාමරත්තිං පරිත්තං කරන්තො ආයස්මා ආනන්දත්ථෙරො විය කාරුඤ්ඤ චිත්තං උපට්ඨපෙත්වා.-

කොටිසත සහස්සෙසු - චක්කවාළෙසු දෙවතා
යස්සාණං පතිගණ්හන්ති - යඤ්ච වෙසාලියං පුරෙ
රොගා මනුස්ස දුබ්භික්ඛ - සම්භූතං තිවිධං භයං
ඛිප්පමන්තරධාපෙසි - පරිත්තං තං භණාමහෙ.

---

තමන් ගැන කියන විට 1. 'මය්හං' යනුවෙන් ද 2. 'අම්හෙ' යනුවෙන් ද 3. 'මේ' යනුවෙන් ද යොදා ගන්න.

Non-Commercial Distribution

## 2. අංගුලිමාල පිරිත

පරිත්තං යං භණන්තස්ස - නිසින්නට්ඨාන ධොවනං
උදකම්පි විනාසෙති - සබ්බමෙව පරිස්සයං
සොත්ථිනා ගබ්භවුට්ඨානං - යං ච සාධෙති තං ඛණෙ,
ථෙරස්සංගුලිමාලස්ස - ලොක නාථෙන භාසිතං
කප්පට්ඨායිං මහා තෙජං - පරිත්තං තං භණාමහෙ.

"යතො'හං භගිනි අරියාය ජාතියා ජාතො නාභි ජානාමි සංචිච්චපාණං ජීවිතා වොරොපෙතා, තෙන සච්චෙන සොත්ථි තෙ හොතු සොත්ථි ගබ්භස්සා'ති."

බුදුරජාණන් වහන්සේ විසින් අංගුලිමාල නම් මහරහතුන් වහන්සේට මෙය උගන්වා වදාරණ ලදී.

## 3. ජය පිරිත

සිරි ධිති මති තෙජො ජයසිද්ධි මහිද්ධි මහා ගුණං, අපරිමිත පුඤ්ඤාධිකාරස්ස සබ්බන්තරාය නිවාරණ සමත්ථස්ස, භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස. -

ද්වත්තිංස මහා පුරිසලක්ඛණානුභාවෙන, අසීත්‍යානුව්‍යඤ්ජන ලක්ඛණානුභාවෙන, අට්ඨුත්තරසත මංගල ලක්ඛණානුභාවෙන, ඡබ්බණ්ණරංස්‍යානුභාවෙන, කෙතුමාලානුභාවෙන, දසපාරමිතානුභාවෙන, දස උප පාරමිතානුභාවෙන, දස පරමත්ථ පාරමිතානුභාවෙන, සීලසමාධිපඤ්ඤානුභාවෙන, බුද්ධානුභාවෙන, ධම්මානුභාවෙන, සංඝානුභාවෙන, තෙජානුභාවෙන, ඉද්ධ්‍යානුභාවෙන, බලානුභාවෙන, ඤෙය්‍යධම්මානුභාවෙන, චතුරාසීතිසහස්ස ධම්මක්ඛන්ධානුභාවෙන, නවලොකුත්තර ධම්මානුභාවෙන, අට්ඨංගික මග්ගානුභාවෙන, අට්ඨ සමාපත්ත්‍යානුභාවෙන, ඡළභිඤ්ඤානුභාවෙන, මෙත්තා - කරුණා - මුදිතා - උපෙක්ඛානුභාවෙන, සබ්බ පාරමිතානුභාවෙන, රතනත්තය සරණානුභාවෙන, තුය්හං[1] සබ්බ රොග සොක උපද්දව දුක්ඛදොමනස්සුපායාසා විනස්සන්තු, සබ්බ සංකප්පා තුය්හං[1] සමිජ්ඣන්තු දීඝායුකො හොතු සත වස්ස ජීවෙන සමංගිකො හොතු සබ්බදා -

ආකාස පබ්බත වන භූමි තටාක ගංගා මහා සමුද්ද ආරක්ඛක දෙවතා සදා තුම්හෙ[2] අනුරක්ඛන්තු සබ්බ බුද්ධානුභාවෙන සබ්බ ධම්මානුභාවෙන සබ්බ සංඝානුභාවෙන බුද්ධරතනං ධම්මරතනං සංඝරතනං තින්නං රතනානං ආනුභාවෙන, චතුරාසීති සහස්ස ධම්මක්ඛන්ධානුභාවෙන, පිටකත්තයානුභාවෙන, ජිනසාවකානුභාවෙන සබ්බෙ තෙ[3] රොගා, සබ්බෙ තෙ[3] භයා, සබ්බෙ තෙ[3] අන්තරායා, සබ්බෙ තෙ[3] උපද්දවා, සබ්බෙ තෙ[3] දුන්නිමිත්තා, සබ්බෙ තෙ[3] අවමංගලා විනස්සන්තු.-

ආයුවඩ්ඪකො, ධනවඩ්ඪකො, සිරිවඩ්ඪකො, යසවඩ්ඪකො, බලවඩ්ඪකො, වණ්ණවඩ්ඪකො, සුඛවඩ්ඪකො හොතු සබ්බදා.

Non-Commercial Distribution

දුක්ඛ රොග භයා වෙරා
සොකා සබ්බෙ උපද්දවා
අනෙකා අන්තරායාපි
විනස්සන්තු ච තෙජසා
ජය සිද්ධි ධනං ලාභං
සොත්ථි භාග්‍යං සුඛං බලං
සිරි ආයු ච වණ්ණො ච
භොගං වුද්ධි ච යසවා
සතවස්සා ච ආයූ ච
ජීව සිද්ධි භවන්තු තෙ[2]

මේ පිරිත සියලු රෝගයන්ට ද, යක්ෂ භයට හා ග්‍රහ දෝෂවලට ද යහපති.

## 4. ගිනි පිරිත

ජාලො මහා ජාලො, ජාලං මහා ජාලං, ජාලිතෙ මහා ජාලිතෙ, ජාලිතං මහා ජාලිතං, මුඛෙ මුඛෙ, සම්පත්තෙ මුඛං මුඛං, සම්පත්තං, සුතං ගමිති, මිගයිති, මිගයිති දිට්ඨාලා දන්තලා මණ්ඩලා රොකිලා, කරලා, දුබ්බලා, රිත්ති රිත්ති, ලිත්ති ලිත්ති, කිත්ති කිත්ති, මිත්ති මිත්ති, චිත්ති චිත්ති, මුත්ති මුත්ති, වුත්ති වුත්ති, ධාරණී ධාරණීති.

| | | |
|---|---|---|
| භවතු සබ්බ මංගලං | - | රක්ඛන්තු සබ්බ දෙවතා |
| සබ්බ බුද්ධානුභාවෙන | - | සදා සොත්ථි භවන්තු තෙ[1] |
| පඤ්චමාර ජිතො නාථො | - | පත්තො සම්බොධි මුත්තමං |
| චතුසච්චං පකාසෙසි | - | මහාවීරං නමාමහං |
| එතෙන සච්චවජ්ජෙන | - | සබ්බෙ මාරා පලායන්තු |

(තුන්වරක් කියනු. සියලු දේට යහපති).

## 5. චූල ජිනපඤ්ජර පිරිත හෙවත් දසදිසා පිරිත

### (I)

| | | |
|---|---|---|
| දීසාසු දස භාගෙසු | - | ඨිතා බුද්ධානු භාවතො |
| වෙරාදි අන්තරායාපි | - | විනස්සන්ති අසෙසතො |
| එවමාදි ගුණොපෙතං | - | පරිත්තං තං භණාමහෙ |
| පදුමුත්තරො පුරත්ථිමායං | - | අග්ගිම්හිචෙව රෙවතො |
| දක්ඛිණෙ කස්සපො බුද්ධො | - | නෙරුතෙ ච සුමංගලො |
| පච්ඡිමෙ ච සිඛී බුද්ධො | - | වායව්‍යා මෙධංකරො |
| උත්තරෙ පියදස්සී ච | - | ඊසානෙ දීපංකරො |

තමන් ගැන කියන විට: 1. 'මය්හං' යනුවෙන් ද 2. 'අම්හෙ' යනුවෙන් ද 3. 'මේ' යනුවෙන් ද යොදා ගන්න.

Non-Commercial Distribution

පඨවියා කකුසන්ධො ච - ආකාසෙ සරණංකරො
අච්චන්තරායා සබ්බෙ තෙ[1] - සොක රොග භයාපි ච

විනස්සන්තු සදා තුය්හං[2] - සබ්බිරියා පථෙසු ච
යක්ඛාදි දෙවතාහී ච - රාජ චොරාරි අග්ගිහි

අමනුස්සෙහි සබ්බෙහි - තිරච්ඡාන ගතෙහි ච
ජාතා උපද්දවා සබ්බේ - විනස්සන්තු අසෙසතො

### (II)

සිරස්මිං තෙ[1] බුද්ධ සෙට්ඨො - සාරිපුත්තො ච දක්ඛිණෙ
වාමංසෙ මොග්ගල්ලානො තෙ[1] - පුරතො පිටකත්තයං

පච්ඡිමෙ තව[3] ආනන්දො - චතුද්දිසා ඛිණාසවා
සමන්තා ලොකපාලා ච - ඉන්දදෙවො ච බ්‍රහ්ම ච
එතෙසං ආනුභාවෙන - සබ්බුපද්දවුපද්දවා
අනේකා අන්තරායාපි - විනස්සන්තු අසෙසතො.

## 6. වට්ටක පිරිත

1. පූරෙන්තං බොධි සම්භාරෙ - නිබ්බත්තං වට්ටක ජාතියං
යස්ස තෙජෙන දාවග්ගී - මහා සත්තං විවජ්ජයි

2. ථෙරස්ස සාරිපුත්තස්ස - ලොකනාථෙන භාසිතං
කප්පට්ඨායිං මහතෙජං - පරිත්තං තං භණාමහෙ

3. අත්ථි ලොකෙ සීලගුණො - සච්චං සොචෙය්‍යානුද්දයා
තෙන සච්චෙන කාහාමි - සච්ච කිරියමනුත්තරං

4. ආවජ්ජිත්වා ධම්ම බලං - සරිත්වා පුබ්බකෙ ජිනෙ
සච්චබල මවස්සාය - සච්චකිරිය මකා සහං

5. සන්තිපක්ඛා අපතනා - සන්තිපාදා අවඤ්චනා
මාතා පිතා ච නික්ඛන්තා - ජාතවෙද පටික්කම

6. සහසච්චෙ කතෙ මය්හං - මහා පජ්ජලිතො සිඛී
වජ්ජෙසි සොළස කරීසානි - උදකං පත්වා යථා සිඛී
සච්චෙන මෙ සමොනත්ථි - එසා මෙ සච්ච පාරමීති

**වස විස උපද්‍රවවලට ද, ගිනි බිය ආදියෙන් වැළකීමට හා දැවීමෙන් හටගත් තුවාල ආදියට වතුර, තෙල් මැතිරීමට යහපති.**

Non-Commercial Distribution

## 7. වැසි පිරිත

1. සුභූතො ච මහා ථෙරො - මහා කායො මහොදරො
නීලවණ්ණො මහා තේජො - පවස්සන්තු වළාහකා
අභිත්ථනය පජ්ජුන්න - නිධිං කාකස්ස නාසය
කාකං සොකාය රන්ධෙහි - මං ච සොකා පමොචය
එතෙන සච්ච වජ්ජෙන - සම්මා දෙවො පවස්සතු

(වැසි ලැබීම සඳහායි)

## 8. මත්ස්‍ය රාජ පිරිත

1. පුනා පරං යදා හොමි - මච්ඡරාජා මහා සරෙ
උණ්හෙ සුරිය සන්තාපෙ - සරෙ උදක ඛියථ
2. තතො කාකා ච ගිජ්ඣා ච - බකා කුලල සෙනකා
භක්ඛන්ති දිවා රත්තිං - මච්ඡෙ උපනිසීදිය
3. එවං චින්තෙ සහං තථා - සහ ඤාතීහි පීළිතො
කෙන නුඛො උපායෙන - ඤාති දුක්ඛා පමොචයෙ
4. විචින්තයිත්වා ධම්මත්ථං - සච්චං අද්දස පස්සයං
සච්චෙ ඨත්වා පමොචෙසිං - ඤාතීනං තං අතික්ඛයං
5. අනුස්සරිත්වා සතං ධම්මං - පරිමත්ථං විචින්තයං
අකාසි සච්ච කිරියං - යං ලොකෙ ධුව සස්සතං
6. යතො සරාමි අත්තානං - යතො පත්තොස්මි විඤ්ඤුතං
නාභිජානාමි සංචිච්ච - එකපාණම්පි හිංසිතං
7. එතෙන සච්ච වජ්ජෙන - පජ්ජුන්නො අභිවස්සතු
අභිත්ථනය පජ්ජුන්න - නිධිං කාකස්ස නාසය
කාකං සොකාය රන්ධෙහි - මච්ඡෙ සොකා පමොචය
8. සහකතෙ සච්චවරෙ - පජ්ජුන්නො අභිගජ්ජිය
ථලං නින්නංච පුරෙන්තො - ඛණෙන අභිවස්සථ
9. එවං රූපං සච්චවරං - කත්වා විරිය මුත්තමං
වස්සාපෙසිං මහාමෙසං - සච්චතෙජ බලස්සිතො
සච්චෙන මෙ සමො නත්ථි - එසා මෙ සච්ච පාරමී

(වැසි ලැබීම සඳහා යි)

## 9. බොජ්ඣඞ්ග පිරිත

1. සංසාරෙ සංසරන්තානං - සබ්බ දුක්ඛ විනාසකෙ
සත්ත ධම්මෙව බොජ්ඣඞ්ගෙ - මාරසෙනාප්පමද්දිනො
2. බුජ්ඣිත්වා යෙ පි මෙ සත්තා - තිභවා මුත්තාහි උත්තමා
අජාතිං අජරව්‍යාධිං - අමතං නිබ්භයං ගතා

Non-Commercial Distribution

3. එවමාදි ගුණො පෙතං - අනෙක ගුණ සංගහං
ඔසධංච ඉමං මන්තං - බොජ්ඣඞ්ගං තං භණාමහෙ

4. බොජ්ඣඞ්ගො සතිසංඛාතො - ධම්මානං විචයො තථා
විරියං පීති පස්සද්ධි - බොජ්ඣඞ්ගා ච තතො පරෙ

5. සමාධුපෙක්ඛා බොජ්ඣඞ්ගා - සත්තෙ තෙ සබ්බදස්සිනා
මුනිනා සම්ම දක්ඛාතා - භාවිතා බහුලීකතා

6. සංවත්තන්ති අභිඤ්ඤාය - නිබ්බානාය ච බොධියා
එතෙන සච්ච වජ්ජෙන - සොත්ථි තෙ හොතු සබ්බදා

7. එකස්මිං සමයෙ නාථො - මොග්ගල්ලානඤ්ච කස්සපං
ගිලානෙ දුක්ඛිතෙ දිස්වා - බොජ්ඣඞ්ගෙ සත්ත දෙසයි

8. තෙ ච තං අභිනන්දිත්වා - රොගා මුච්චිංසු තංඛණෙ
එතෙන සච්ච වජ්ජෙන - සොත්ථි තෙ හොතු සබ්බදා

9. එකදා ධම්ම රාජාපි - ගෙලඤ්ඤෙනා'භි පීළිතො
චුන්දත්ථෙරෙන තං යෙව - භණාපෙත්වාන සාදරං

10. සම්මොදිත්වා ච ආබාධා - තම්හා වුට්ඨාසි ඨානසො
එතෙන සච්ච වජ්ජෙන - සොත්ථි තෙ හොතු සබ්බදා

11. පහීණාතෙ ච ආබාධා - තිණ්ණන්නම්පි මහෙසිනං
මග්ගාහත කිලෙසා ච - පත්තානුප්පත්ති ධම්මතං
එතෙන සච්ච වජ්ජෙන - සොත්ථිතෙ හොතු සබ්බදා

(රෝග සුවය සඳහා රෝගීන්ට කියන පිරිතකි.)

## 10. චක්ක පිරිත

1. දස සඤ්ඤොජන ජිතො - බුද්ධො ලොකග්ගනායකො
මාරසෙනං අභික්කන්තා - සමන්තා ද්වාදස යොජනා

2. ඛන්ති මෙත්තමධිට්ඨානං - විමංසෙත්වාන චක්ඛුමා
භවා භවෙ සරන්තානං - හිතාය ච සුඛායච

3. පරියාපන්න සත්තානං - හිතාය ච සුඛාය ච
බුද්ධ කිච්චං විසොධෙසි - පරිත්තං තං භණාමහෙ

එවං මෙ සුතං එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථ පිණ්ඩිකස්ස ආරාමෙ තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවො'ති භදන්තෙ'ති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං භගවා එතදවොච:

යථාහි විමුත්තො සත්තො අධිගතො ඛො ම්‍යායං ධම්මො එවං මාරසෙනං විද්ධංසෙය්‍යං පලාපෙය්‍යං, අසිචක්ක සදිසං චක්කං එවං භික්ඛවෙ මයා පාරමියො පුරෙත්වා බුද්ධත්තං පත්වා මාරසෙනං විද්ධංසෙත්වා ලද්ධ ධම්ම චක්කස්සානු භාවෙන.

Non-Commercial Distribution

පුරත්ථිමාය දිසාය ආගතානි සබ්බානි භයානි අසීති සතසහස්සානි පටික්කමන්තු: අග්ගිනාය දිසාය ආගතානි සබ්බානි භයානි අසීති සතසහස්සානි පටික්කමන්තු: දක්ඛිණාය දිසාය ආගතානි සබ්බානි භයානි අසීති සතසහස්සානි පටික්කමන්තු: පච්ඡිමාය දිසාය - පෙ - පටික්කමන්තු: උත්තරාය දිසාය ආගතානි සබ්බානි භයානි - පෙ - පටික්කමන්තු: ඊසාන දිසාය ආගතානි - පෙ - පටික්කමන්තු: උපරිමාය දිසාය ආගතානි - පෙ - පටික්කමන්තු: හෙට්ඨිමාය දිසාය ආගතානි - පෙ - පටික්කමන්තු:

අසීතිචක්ක සදිසං චක්කං, එවං භික්ඛවෙ මයා පාරමියො පූරෙත්වා බුද්ධත්තං පත්වා මාරසෙනං විද්ධංසෙත්වා ලද්ධ ධම්ම චක්කස්සානුභාවෙන: ඉමස්මිං ඨානෙ වා ඉමස්මිං විහාරෙ වා ඉමස්මිං ගෙහෙ වා භික්ඛු වා භික්ඛුණී වා උපාසකො වා, උපාසිකා වා රාජා වා රාජදේවි වා රාජ පුත්තො වා රාජධීතා වා රාජනත්තා වා රාජනෙත්තී වා.

“මය්හං” සීස රොගො, ලලාට රොගො, කණ්ණ  රොගො, සාණ රොගො, චක්ඛු රොගො, මුඛ රොගො, දන්ත රොගො, ඔට්ඨ රොගො, සකල සරීර රොගො, පඤ්චවීසති භයා, ද්වත්තිංස කම්ම කරනා, සොළස උපද්දවා, දස තණ්හා, අට්ඨ දොසා සබ්බෙ “මෙ” විනස්සන්තු පටික්මන්තු පලායන්තු උද්ධං ආකාසෙ වා භූමි වා හෙට්ඨා අපාය භූමි වා, යක්ඛ භූත පිසාචා වා හොන්තු: භුම්මා දෙවා ආකාස දෙවා සබ්බේ තෙ සපරිවාරා “මං” පාලයන්තු.

තණ්හංකරො මෙධංකරො - මුනින්දො සරණංකරො
දීපංකරො ච කොණ්ඩඤ්ඤො - පඤ්චිමෙ ලොක නායකා
පුරිමසම්ං දිසා එව - සන්නිසින්නා සසාවකා

පියදස්සි අත්ථදස්සි - ධම්මදස්සී අනුත්තරො
සිද්ධත්ථො තිස්ස ඵුස්සො ච - ඡට්ඨීමෙ ලොක නායකා
දක්ඛිණස්මිං දිසා එව - සන්නිසින්නා සසාවකා

මංගලො සුමනො බුද්ධො - රෙවතො සොභිතො මුනී
අනොමදස්සී සම්බුද්ධො - පඤ්චිමෙ ලොක නායකා
පච්ඡිමස්මිං දිසා එව - සන්නිසින්නා සසාවකා

පදුමො නාරදො බුද්ධො - පදුමුත්තරො ච නායකො
සුමංගලො සුජාතො ච - පඤ්චිමෙ ලොක නායකා
උත්තරස්මිං දිසා එව - සන්නිසින්නා සසාවකා

බුද්ධො විපස්සී සිඛී ච - වෙස්සභූ ච මහා මුනී
කකුසන්ධො කොණාගමනො - කස්සපො චාපි ගොතමො
ඉමෙ අට්ඨ ජිනා හෙට්ඨා - උපරිමෙ ච මහා රහා

ජොතෙන්තා මණිපල්ලංකෙ - සන්නිසින්නා සසාවකා
එතෙසං සන්නිසින්නාහං - මජ්ඣෙධකත්වා දිනෙ දිනෙ
සක්කච්ච අවිදූරෙ “ස්මි” - තෙ “මං” රක්ඛන්තු සබ්බදා

Non-Commercial Distribution

සර්ව ආරක්ෂාවට, තෙල් මැතිරීමට, පැන් මතුරා දීමට සුදුසු යි. හඳුන් කිරිපැන් කළයකට මතුරා මූණ සේදීමෙන්, ඇස්වහ කටවහ දුරුවෙයි. අඹ අත්තෙන් මතුරන්න උණ බසියි. සියලු ලෙඩට, බාලග්‍රහ දෝෂවලට ආරක්ෂා යොදන්න. රාජවශියට ද ශුභ යි. අනුන්ට කියන විට තුය්හං, ත්වං, යනුවෙන් ද, ස්මිං, යනු “සි” යනුවෙන් ද යොදා ගන්න.

## 11. දස මාර පිරිත

1. ඉති තදුභය සෙනා සට්ටයං අඤ්ඤමඤ්ඤං
විවිධ විසම වාචං උග්ගිරන්තී රමන්තී
සතත දුරිත වෙලා බග්ගරාසි වහන්ති
දුසිත ලලිත චිත්තා යුද්ධ සජ්ජා අහෙසුං

2. ඉති මුනි කකුසන්ධො දී පමාගම්ම මෙතං
බහු විධ ජන සඞ්ඝං නිබ්බුතිං පාපුනිත්වා
තදහනි සිරි සම්බොධි සාඛං ච නෙත්වා
නිදහිය ගගනම්හා ජම්බුදීපා අගච්ඡි

3. එවංපි කොණාගමනො මුනින්දො
දත්වා බහුන්නං ඵලමග්ගදානං
නෙත්වා තතො දුම්බර බොධි සාඛං
සොපාගමාසී පුන ජම්බුදීපා

4. එවම්පි කස්සප ජිනො වරමණ්ඩදීපං
පත්තො ඵලග්ග රතනො බහුනො ජනසස
දත්වාන ආනීත තං වට බොධි සාඛං
රොපාපයිත්ව මගමා පුනජම්බුදීපං

5. පාරොහ දන්තො චිත කුට කුම්භො
අනෙක සොතත්ථ විරාජමානො
සොනිජ්ජරා සාර මදප්පවාහො
ධජො යථා භාති සුරාධිපස්ස

6. තස්මිං සමන්තනග මුද්ධනි ලොක නාථො
ඡබ්බණ්ණ රංසිනිකරං දිසි පග්සරන්තො
භික්ඛුහි සො පරිවුතො සරසාගරන්තො
ඔලොකයං ඨිතමකාසි අනොම වණ්ණො

7. ලංකාවධූ සුමනකූට කිරීට කූට
සජ්ජෙහි තග්ස ජිනරාජ මණීවහන්තො
ඉච්ජිත්ථදං සිවපදං පටිමන්ති ලොකෙ
තන්දානි භො භජත සෙවිත සබ්බකාලං

8. දිවා විහාරං භගවා සසඞ්ඝො
කත්වාන කස්මිං පන කිඤ්චිකාලං
මහීයමානෙසු සදෙවකෙසු
තතො ගතො රොහණ අම්බරස්මා

9. තස්මිං සසඞ්ඝො මුනි දීඝවාපියං
ථූපාය ඨානෙ පරමාය භූමියං
ගරුං කරොන්තො ජනතං මහීතලෙ
නිරොධමාපජ්ජ නිසීදි උත්තමො

10. විහංග මානං ගරුඩොව මජ්ඣෙ
මිගාන මජ්ඣෙ පරමොව සීහො
මහා යසො මාර බලස්ස මජ්ඣෙ
විසාරදො චිත භයො නිසීදි

11. සබ්බන්තමද මොහෙන නාලාගිරිං මහාගජං
වෙස්සන්රො දෙවදත්ත මෙබලා ගිරිභුසංගජං

12. විවත්ත මද වෙගෙන නාලාගිරි කරිස්සරං
මෙත්තා සද්ධානුභාවෙන සම්බුද්ධොනිම්මදං අකා

1. අමනුෂ්‍ය උපද්‍රවවලට - 108 වරක් මතුරා තෙල් ගාන්න 108 වරක් මතුරා නූල් බඳින්න.
2. ගෘහ ආරක්ෂාවට - මේ පිරිතෙන් වැලි-ගල්-පස්ලෝ, නූල්, වතුර මතුරා පිරිත් කොට ගෙයි සතර කොනේත්, වත්තේ අට කොනේත් සතුන් හඬන්නට පෙරාතුව වල දමන්න. සම්පූර්ණ ආරක්ෂාව ලැබේ.

Non-Commercial Distribution

3. උණට - නොබසින උණට 108 බැගින් තුන් වරක් තෙල් මතුරන්න, නූල් මතුරා බඳින්න.
4. සුව නොවන බඩේ අජීර්ණයට - දෙහි-ඉඟුරු-සුදුළූණු 108 වර බැගින් මතුරා තුන්වරක් කෑමට දෙන්න.

## 12. ජ්වර පිරිත

1. තණ්හංකරො නාමජිනො - පූරෙත්වා දස පාරමී
ජෙත්වා මාරාරිසංගාමං - සම්බුද්ධත්ත මුපාගමි
එතෙන සච්ච වජ්ජෙන - පජ්ජරො තෙ විනස්සතු

2. මෙධංකරො නාමජිනො - පූරෙත්වා දස පාරමී
ජෙත්වා මාරාරිසංගාමං - සම්බුද්ධත්ත මුපාගමී
එතෙන සච්ච වජ්ජෙන - පජ්ජරො තෙ විනස්සතු

3. සරණංකරො නාමජිනො - පූරෙත්වා දස පාරමී
ජෙත්වා මාරාරිසංගාමං - සම්බුද්ධත්ත මුපාගාමී
එතෙන සච්ච වජ්ජෙන - පජ්ජරො තෙ විනස්සතු

4. දීපංකරො නාමජිනො - පෙ - පජ්ජරො තෙ විනස්සතු
5. කොණ්ඩඤ්ඤො නාම සම්බුද්ධො - පෙ - පජ්ජරො තෙ විනස්සතු
6. මංගලො නාම සම්බුද්ධො - පෙ - පජ්ජරො තෙ විනස්සතු
7. සුමනො නාම සම්බුද්ධො - පෙ - පජ්ජරො තෙ විනස්සතු
8. රෙවතො නාම සම්බුද්ධො - පෙ - පජ්ජරො තෙ විනස්සතු
9. සොභිතො නාම සම්බුද්ධො - පෙ - පජ්ජරො තෙ විනස්සතු
10. අනොමදස්සී නාම සම්බුද්ධො - පෙ - පජ්ජරො තෙ විනස්සතු
11. පදුමො නාම සම්බුද්ධො - පෙ - පජ්ජරො තෙ විනස්සතු
12. නාරදො නාම සම්බුද්ධො - පෙ - පජ්ජරො තෙ විනස්සතු
13. පදුමුත්තරො නාම සම්බුද්ධො - පෙ - පජ්ජරො තෙ විනස්සතු
14. සුමෙධො නාම සම්බුද්ධො - පෙ - පජ්ජරො තෙ විනස්සතු
15. සුජාතො නාම සම්බුද්ධො - පෙ - පජ්ජරො තෙ විනස්සතු
16. පියදස්සි නාම සම්බුද්ධො - පෙ - පජ්ජරො තෙ විනස්සතු
17. අත්ථදස්සී නාම සම්බුද්ධො - පෙ - පජ්ජරො තෙ විනස්සතු
18. ධම්මදස්සී නාම සම්බුද්ධො - පෙ - පජ්ජරො තෙ විනස්සතු
19. සිද්ධත්ථො නාම සම්බුද්ධො - පෙ - පජ්ජරො තෙ විනස්සතු
20. තිස්සො නාම සම්බුද්ධො - පෙ - පජ්ජරො තෙ විනස්සතු
21. ඵුස්සො නාම සම්බුද්ධො - පෙ - පජ්ජරො තෙ විනස්සතු

Non-Commercial Distribution

22. විපස්සී නාම සම්බුද්ධො - පෙ - පජ්ජරො තෙ විනස්සතු
23. සිඛී නාම සම්බුද්ධො - පෙ - පජ්ජරො තෙ විනස්සතු
24. වෙස්සභූ නාම සම්බුද්ධො - පෙ - පජ්ජරො තෙ විනස්සතු
25. කකුසන්ධො නාම සම්බුද්ධො - පෙ - පජ්ජරො තෙ විනස්සතු
26. කොණාගමනො නාම සම්බුද්ධො - පෙ - පජ්ජරො තෙ විනස්සතු
27. කස්සපො නාම සම්බුද්ධො - පෙ - පජ්ජරො තෙ විනස්සතු
28. ගොතමො නාම සම්බුද්ධො - පෙ - පජ්ජරො තෙ විනස්සතු

මේ පිරිතෙන් උණ රෝගීනට නූල් බැඳීමට, කෂාය මතුරා දීමට හා ගුණ ලැබීම සඳහා දිනකට තුන් වරක් පිරිත් කීමට ද යහපති.

# ආටානාටිය පිරිත

1. අප්පසන්නෙහි නාථස්ස - සාසනෙ සාධු සම්මතෙ
අමනුස්සෙහි චණ්ඩෙහි - සදා කිබ්බිස කාරිහි

2. විපස්සිස්ස ච නමත්ථු - චක්ඛුමන්තස්ස සිරිමතො
සිඛිස්සා පිච නමත්ථු - සබ්බ භූතානුකම්පිනො

3. වෙස්ස භූස්ස ච නමත්ථු - නහාතකස්ස තපස්සිනො
නමත්ථු කකුසන්ධස්ස - මාරසෙනා පමද්දිනො

4. කොණාගමනස්ස නමත්ථු - බ්‍රාහ්මණස්ස වුසීමතො
කස්සපස්ස ච නමත්ථූ - විප්පමුත්තස්ස සබ්බධි

5. අංගීරසස්ස නමත්ථු - සක්‍ය පුත්තස්ස සිරිමතො
යො ඉමං ධම්ම මදෙසෙසි - සබ්බදුක්ඛා පනූදනං

6. යෙ චාපි නිබ්බුතා ලොකෙ - යථා භූතං විපස්සිසුං
තෙ ජනා අපිසුණා - මහන්තා විතසාරදා

7. හිතං දෙව මනුස්සානං - යං නමස්සන්ති ගොතමං
විජ්ජාචරණ සම්පන්නං - මහන්තං විතසාරදං

8. එතෙ චඤ්ඤෙ ච සම්බුද්ධා - අනෙකසත කොටියො
සබ්බෙ බුද්ධා සමාසමා - සබ්බෙ බුද්ධා මහිද්ධිකා

9. සබ්බෙ දසබලූපෙතා - වෙසාරජ්ජෙසුපාගතා
සබ්බෙ තෙ පටිජානන්ති - ආසභං ඨාන මුත්තමං

10. සීහනාදං නදන්තෙ තෙ - පරිසාසු විසාරදා
බ්‍රහ්මචක්කං පවත්තෙන්ති - ලොකෙ අප්පටිවත්තියං

Non-Commercial Distribution

11. උපෙතා බුද්ධධම්මෙහි - අට්ඨාරසහි නායකා
බත්තිංස ලක්ඛණූපෙතා එතෙ - සබ්බෙ ඛීණාසවාජිනා

12. ව්‍යාමප්පභාය සුප්පභා - සබ්බෙ තෙ මුනිකුඤ්ජරා
බුද්ධා සබ්බඤ්ඤුනො එතෙ - සබ්බෙ ඛීණාසවාජිනා

13. මහාපභා මහා තෙජා - මහා පඤ්ඤා මහබ්බලා
මහා කාරුණිකා ධීරා - සබ්බෙසානං සුඛාවහා

14. දීපා නාථා පතිට්ඨා ච - තාණා ලෙණා ච පාණිනං
ගතිබන්ධූ මහෙස්සාසා - සරණා ච හිතෙසිනො

15. සදෙවකස්ස ලොකස්ස - සබ්බෙ එතෙ පරායණා
තෙසානං සිරසා පාදෙ - වන්දාමි පුරිසුත්තමෙ

16. වචසා මනසා චෙව - වන්දාමෙතෙ තථාගතෙ
සයනෙ ආසනෙ ඨානෙ - ගමනෙචාපි සබ්බදා

17. සදා සුඛෙන රක්ඛන්තු - බුද්ධා සන්තිකරා (මමං)
තෙහි (අහං) රක්ඛිතො සන්තො - මුත්තො සබ්බභයෙහි ච

18. සබ්බරොගො විනිම්මුත්තො - සබ්බසත්තා පවජ්ජිතො
සබ්බ වෙර මතික්කන්තො - නිබ්බුතො ච (භවාමහං)

19. තෙසං සච්චෙන සීලෙන - ඛන්ති මෙත්ත බලෙන ච
තෙපි (අම්හෙ) නු රක්ඛන්තු - ආරොග්‍යෙන සුඛෙන ච

20. පුරත්ථිමස්මිං දිසාභාගෙ - සන්ති භූතා මහිද්ධිකා
තෙපි (අම්හෙ) නු රක්ඛන්තු - අරොග්‍යෙන සුඛෙන ච

21. දක්ඛිණස්මිං දිසාභාගෙ - සන්ති දෙවා මහිද්ධිකා
තෙපි (අම්හෙ) නු රක්ඛන්තු - ආරොග්‍යෙන සුඛෙන ච

22. පච්ඡිමස්මිං දිසාභාගෙ - සන්ති නාගා මහිද්ධිකා
තෙපි (අම්හෙ) නු රක්ඛන්තු - ආරොග්‍යෙන සුඛෙන ච
23. උත්තරස්මිං දිසාභාගෙ - සන්ති යක්ඛා මහිද්ධිකා
තෙපි (අම්හෙ) නු රක්ඛන්තු - ආරොග්‍යෙන සුඛෙන ච
24. පුරස්ථිමෙන ධතරට්ඨො - දක්ඛිණෙන විරූළ්හකො
පච්ඡිමෙන විරූපක්ඛො - කුවෙරො උත්තරං දිසං
25. චත්තාරො තෙ මහාරාජා - ලොකපාලා යසස්සිනො
තෙපි (අම්හෙ) නු රක්ඛන්තු - ආරොග්‍යෙන සුඛෙන ච

26. ආකාසට්ඨා ච භුම්මට්ඨා - දෙවා නාගා මහිද්ධිකා
තෙපි (අම්හෙ) නු රක්ඛන්තු - ආරොග්‍යෙන සුඛෙන ච

27. ඉද්ධි මන්තො ච යෙ දෙවා - වසන්තා ඉධ සාසනෙ
තෙපි (අම්හෙ) නු රක්ඛන්තු - ආරොග්‍යෙන සුඛෙන ච

Non-Commercial Distribution

28. සබ්බීතියො විවජ්ජන්තු - සොකො රොගො විනස්සතු
මා (මෙ) භවත්තන්තරායො - සුඛී දීඝායුකො (භව)

29. අභිවාදන සීලිස්ස - නිච්චං වුද්ධාපචායිනො
චත්තාරො ධම්මා වඩ්ඪන්ති - ආයු වණ්ණො සුඛං බලං

මේ පිරිතෙන් ගත හැකි ප්‍රයෝජන මෙසේ යි.

මේ පිරිත භාවිත කරන තැනැත්තාට හෝ තැනැත්තියට අමනුෂ්‍යයන්ගෙන් කරදර ඇති නොවේ. දෙවියන්ගේ ආරක්‍ෂාව ද ලැබේ. කලක් දිනපතා භාවිතා කළහොත් අමනුෂ්‍යයෝ කීකරු වෙති. දේව බැල්ම නිතර පවතී.

## නිධිකණ්ඩ සුත්තං

1. නිධිං නිධෙති පුරිසො - ගම්භීරෙ ඔදකන්තිකෙ
අත්ථෙ කිච්චෙ සමුප්පන්නෙ - අත්ථාය මෙ භවිස්සති

2. රාජතො වා දුරුත්තස්ස - චොරතො පීළිතස්ස වා
ඉණස්ස වා පමොක්ඛාය - දුබ්භික්ඛෙ ආපදාසු වා
එතදත්ථාය ලොකස්මිං - නිධීනාම නිධීයති

3. තාව සුනිහිතො සන්තො - ගම්භීරෙ ඔදකන්තිකෙ
න සබ්බො සබ්බදා එවං - තස්ස තං උපකප්පති

4. නිධි වා ඨානා චවති - සඤ්ඤාවාස්ස විමුය්හති
නාගා වා අපනාමෙන්ති - යක්ඛා වාපි හරන්ති නං

5. අප්පියා වාපි දායාද - උද්ධරන්ති අපස්සතො
යදා පුඤ්ඤක්ඛයො හොති - සබ්බ මෙතං විනස්සති

6. යස්ස දානෙන සීලෙන - සංයමෙන දමෙන ච
නිධි සුනිහිතො හොති - ඉත්ථියා පුරිසස්ස වා

7. චෙතියම්හි ච සඞ්ඝෙ වා - පුග්ගලෙ අතිථීසු වා
මාතරි පිතරි වාපි - අථො ජෙට්ඨම්හි භාතරි

8. එසො නිධි සුනිහිතො - අජෙය්‍යො අනුගාමිකො
පහාය ගමනීයෙසු - එතං ආදාය ගච්ඡති

9. අසාධාරණමඤ්ඤෙසං - අචොර හරණො නිධි
කයිරාථ ධීරො පුඤ්ඤානී - යො නිධි අනුගාමිකො

10. එස දෙවමනුස්සානං - සබ්බකාම දදො නිධී
යං යදෙවාභි පත්ථෙන්ති - සබ්බමෙතෙන ලබ්භති

11. සුවණ්ණතා සුස්සරතා - සුසණ්ඨාන සුරූපතා
ආධිපච්ච පරිවාරං - සබ්බමෙතෙන ලබ්භති

Non-Commercial Distribution

12. පදෙසරජ්ජං ඉස්සරියං - චක්කවත්ති සුඛංපියං
දෙවරජ්ජම්පි දිබ්බෙසු - සබ්බමෙතෙන ලබ්භති

13. මානුසිකා ච සම්පත්ති - දෙවලොකෙ ච යා රතී
යා ච නිබ්බාණ සම්පත්ති - සබ්බමෙතෙන ලබ්භති

14. මිත්තසම්පදමාගම්ම - යොනිසො ච පයුඤ්ජතො
විජ්ජා විමුත්ති වසීභාවො - සබ්බමෙතෙන ලබ්භති

15. පටිසම්භිදා විමොක්ඛා ච - යාච සාවක පාරමී
පච්චෙකබොධි බුද්ධභූමි - සබ්බමෙතෙන ලබ්භති

16. එවං මහිද්ධියා එසා - යදිදං පුඤ්ඤ සම්පදා
තස්මා ධීරා පසංසන්ති - පණ්ඩිතා කත පුඤ්ඤතන්ති.

## තිරොකුඩ්ඩ සුත්තං

1. තිරොකුඩ්ඩෙසු තිට්ඨන්ති - සන්ධිසිංඝාටකෙසු ච
ද්වාරබාහාසු තිට්ඨන්ති - ආගන්ත්වාන සකං ඝරං

2. පහූතෙ අන්නපානම්හි - ඛජ්ජභොජ්ජෙ උපට්ඨිතෙ
න තෙසං කොචි සරති - සත්තානං කම්මපච්චයා

3. එවං දදන්ති ඤාතීනං - යෙ හොන්ති අනුකම්පකා
සුචිං පණීතං කාලෙන - කප්පියං පානභොජනං

4. ඉදං වො ඤාතීනං හොතු - සුඛිතා හොන්තු ඤාතයො
තෙ ච තත්ථ සමාගන්ත්වා - ඤාතිපෙතා සමාගතා

5. පහූතෙ අන්නපානම්හි - සක්කච්චං අනුමොදරෙ
චිරං ජීවන්තු නො ඤාති - යෙසං හෙතු ලභාමසෙ

6. අම්හාකඤ්ච කතා පූජා - දායකාච අනිප්ඵලා
නහි තත්ථ කසී අත්ථි - ගොරක්ඛෙත්ථ න විජ්ජති

7. වණිජ්ජා තාදිසී නත්ථි - හිරඤ්ඤෙන කයාක්කයං
ඉතො දින්නෙන යාපෙන්ති - පෙතා කාලකතා තහිං

8. උන්නමෙ උදකං වට්ඨං - යථා නින්නං පවත්තති
එව මෙව ඉතො දින්නං - පෙතානං උපකප්පති

9. යථා වාරිවහා පූරා - පරිපූරෙන්ති සාගරං
එව මෙව ඉතො දින්නං - පෙතානං උපකප්පති

10. අදාසි මෙ අකාසි මෙ - ඤාති මිත්තා සඛා ච මෙ
පෙතානං දක්ඛිණං දජ්ජා - පුබ්බෙ කත මනුස්සරං

11. නහි රුණ්ණං ව සොකො වා - යා චඤ්ඤා පරිදෙවනා
න තං පෙතාන මත්ථාය - එවං තිට්ඨන්ති ඤාතයො

Non-Commercial Distribution

12. අයං බො දක්ඛිණා දින්නා - සඞ්ඝම්හි සුප්පතිට්ඨිතා
දීඝ රත්තං හිතායස්ස - ඨානසො උපකප්පති

13. සො ඤාති ධම්මො ච අයං නිදස්සිතො
පෙතාන පූජා ච කතා උළාරා
බලඤ්ච භික්ඛූන මනුප්පදින්නං
තුම්හෙහි පුඤ්ඤං පසුතං අනප්පකන්ති

## රන්දෙණේ ගාථා

(i) නමො තෙ කරුණා භාර, නමො තෙ මතිසාගර
නමො තෙ අමතාකාර නමො තෙ අමතණ්ණව,

රංසිමාල නමො තුය්හං - නරම්බුරුහමණ්ඩලං
ජල මාල නමො තුය්හං - භවාරඤ්ඤ දවානල

ඉධානන්ත ගුණාධාර - සද්ධම්ම රතනාකර
පාදෙ වන්දාමි තෙ නාථ - සද්ධාය තව මුද්ධනා

(ii) අලීනගා විජ්ජු වරං පභස්සරං - විමුත්තක්ඛණෙ දොණියුගං පදං වරං
ථෙරස්ස සීසෙ ගතෙ පතිට්ඨිතං - අනුත්තරො ගෙය්‍ය සතම්හි වණ්ණනා

කරෙය්‍ය මානස්ස ගුණෙහි බුද්ධං - අනුට්ඨිතො ගබ්භ ගතාය පාදං
උට්ඨෙහි සො කස්සප ථෙර පාදං - ඔසානයෙ පඤ්ච සතෙහි භික්ඛු

ඛණෙන අග්ගිං ජලමානනාය - සබ්බම්පි චෙ චන්දනදාරුබීයෙ
සරීර බීයෙ සුගතස්ස ධාතුයො - මුත්තං සුවණ්ණං සුමනංච දිස්සති

(iii) සබ්බ සංඛත ධම්මේසු - ඔත්තප්පාකාර සණ්ඨිතා
ඤාණමොහිත භාරානං - ධම්ම සංවේග සඤ්ඤිතා

සස්සිරික තරො නාථො - කෙතුමාලාය ලංකතො
දක්ඛිණාවත්ත කෙසොසි - නීලාමල සිරොරුහෙ

උණ්හීස සීසො රුචිරො - පරිපුණ්ණ සිරො වරො
අනොලොකිය බුද්ධාසි - සුගන්ධතර මුද්ධනො

උණ්හීස රුචිරොදාර - ලලාට තට සොභිතො
මුදුතුල නිභොදාත - උණ්ණා මණ්ඩල මණ්ඩිතො

ඉන්දචාප නිභොනීල - භූතටාක සුසජ්ජිතො
කඤ්චනං කුස සංකාස - තුංග නාසො විරොචති

ලොචන ද්වය මාභාති - පඤ්ච වණ්ණ සමුජ්ජලං
දෙහං දෙව විමානම්හි - මණිජාලූප මුත්තමං

රංසිමාල නමො තුය්හං - බුද්ධ සෙනාදි පඤ්ජර
එවං තං බුද්ධ ජානාථ - බුද්ධං දස විලොචනං

Non-Commercial Distribution

# උදේ සවස භාවිතා කළයුතු ආරක්ෂා ගාථා

(i) බුද්ධං සුද්ධ ගුණාකරං දස බලං - දෙවාති දෙවං ජිනං
ධම්මං තෙන සුදෙසිතං භවනුදං - දුක්ඛා පහං නිම්මලං
සංඝං චාපිනිරංගනං මුනිසුතං - වන්දා මහං මුද්ධනා
බුද්ධො ධම්ම ගණො තථාගත වරො - පාලෙන්තු තෙ (මං) සදා

(ii) පඨවි බල සුන්දරි - සබ්බඤ්ඤු බොධි මණ්ඩලං
අසංඛෙය්‍යං මාර සෙනං - ජයො ජයතු මංගලං

කකුසන්ධො කොණාගමනො - කස්සපො ගොතමො මුනි
මෙත්තෙය්‍යො පඤ්ච බුද්ධා තෙ - සීසෙ (මෙ) සෙන්තු සබ්බදා

එතෙසං ආනුභාවෙන - යක්ඛා දෙවා මහිද්ධිකා
තෙ සබ්බෙ සුඛිතා හොන්තු - මම මිත්තා සහායකා

සම්බුද්ධෙ අට්ඨ විසං ච - ද්වාදසං ච සහස්සකං
පඤ්චසත සහස්සානි - නමාමි සිරසා අහං

තෙසං ධම්මඤ් ච සංඝඤ් ච - සබ්බෙ පච්චෙක සම්බුද්ධෙ
බොධිරාජෙ ච සබ්බෙසං - සාදරෙන නමා මහං

නමක්කාරෙනු භාවෙන - සබ්බෙ භයා උපද්දවා
අනෙකා අන්තරායාපි - විනස්සන්තු අසෙසතො

# දුටුගැමුණු රජතුමන් නිතර භාවිතා කළ ආරක්ෂා ගාථා

බුද්ධො තිලොක සරණො, බුද්ධො සූරියො තමොනුදො
එවං තං සරණං ඛෙමං, බුද්ධො මෙ සරණං වරං
ගච්ඡාමි සරණං බුද්ධං, නත්ථි මය්හං භයං සදා

ධම්මො තිලොක සරණො, ධම්මො සූරියො තමොනුදො
එවං තං සරණං ඛෙමං, ධම්මො මෙ සරණං වරං
ගච්ඡාමි සරණං ධම්මං නත්ථි මය්හං භයං සදා

සංඝො තිලොක සරණො. සංඝො සූරියො තමොනුදො
එවං තං සරණං ඛෙමං, සංඝො මෙ සරණං වරං
ගච්ඡාමි සරණං සංඝං නත්ථි මය්හං භයං සදා

ජයො මුනින්දස්ස සුබොධි මූලෙ - අහොසි මාරස්ස පරාජයොසි
උග්ඝොසයුං දෙවගණා පසන්නා - එතෙන සච්චෙන ජයස්සු මය්හං

Non-Commercial Distribution

**දුටුගැමුණු රජතුමා විසින් නිතර භාවිතා කෙළේය යි ප්‍රසිද්ධ මහානුභාව සම්පන්න ගාථාවක්.**

ජයො මුනින්දස්ස සුබෝධි මූලෙ
අහොසි මාරස්ස පරාජයොහි
උග්ඝොසයුං දෙවගණා පසන්නා
එතෙන සච්චෙන සුවත්ථි හොතු

## රත්නමාලා බන්ධන ගාථා

| | | |
|---|---|---|
| සං | සාර සාරොස විනීත | ණීසං |
| සං | නීත සාතං සුවිසාර | ධීසං |
| සං | ධීරකං සොණ්ණ තනූ | පලාසං |
| සං | ලාප දෙසිං පණමෙහි | සාසං |
| සං | සාහිගං කෙවල මොහ | නාසං |
| සං | නාහකං මාර රණෙ | විසෙසං |
| සං | සෙවිතං දාසි මුදාර | භාසං |
| සං | භාර ධම්මං පණෙමෙ | සදාසං |
| සං | දාසගං නාසිත පාප | නාසං |
| සං | නාපමං සිං හත සොර | පාසං |
| සං | පාර ගාමිං සුවිසාර | වාසං |
| සං | වාර සංසං පණමෙ | රසාසං |

මහා බලසම්පන්න ගාථා තුනකි. නිතර කීමෙන් විශිෂ්ඨ ප්‍රතිඵල ලැබේ. ගමනක් පිටත්වීමට පෙරාතුව ගාථා කියා ගමන ඇරඹීමෙන් සාර්ථක ප්‍රතිඵල ලැබේ.

## නරසීහ ගාථා

1. චක්කවරංකිත රත්තසුපාදො
ලක්ඛණ මණ්ඩිත ආයතපණ්හි
චාමර ඡත්ත විභුසිත පාදො
එස හි තුය්හ පිතා නරසීහො

2. සක්‍ය කුමාරවරො සුකුමාලො
ලක්ඛණ විත්තිත පුණ්ණ සරීරො
ලොකහිතාය ගතො නරවීරො
එස හි තුය්හ පිතා නරසීහො

3. පුණ්ණ සසංඛ නිභාමුඛ වණ්ණො
දෙවනරා නපියො නර නාගො
මත්ත ගජින්ද විලාසිත ගාමී
එස හි තුය්හ පිතා නරසීහො

4. ඛත්තිය සම්භව අග්ගකුලීනො
දෙව මනුස්ස නමස්සිත පාදො
සීල සමාධි පතිට්ඨිත චිත්තො
එස හි තුය්හ පිතා නරසීහො

Non-Commercial Distribution

5. ආයත යුත්ත සුසණ්ඨිත නාසො
ගොපඛුමො අභිනීල සුනෙත්තො
ඉන්ද ධනූ අභිනීල භමූකො
එස හි තුය්හ පිතා නරසීහො

6. වට්ට සුමට්ට සුසණ්ඨිත ගීවො
සීහහනූ මිග රාජ සරීරො
කඤ්චන සුච්ඡවි උත්තම වණ්ණො
එස හි තුය්හ පිතා නරසීහො

7. සිනිද්ධ සුගම්භිර මඤ්ජුසු ඝොසො
හිංගුල බන්ධුසුරත්ත සුජිව්හො
වීසති වීසති සෙත සුදන්තො
එස හි තුය්හ පිතා නරසීහො

8. අඤ්ජනවණ්ණ සුනීලසු කෙසො
කඤ්චන පට්ට විසුද්ධ ලලාටො
ඔසධි පණ්ඩර සුද්ධසු උණ්ණො
එස හි තුය්හ පිතා නරසීහො

9. ගච්ඡති නීල පථෙ විය චන්දො
තාරගණා පරිවෙඨිත රූපො
සාවක මජ්ඣගතො සමණින්දො
එස හි තුය්හ පිතා නරසීහො

•••••••••••••••

Non-Commercial Distribution

උපග්‍රන්ථය II

# සතර කමටහන

**බුද්ධානුස්සති මෙත්තා ච - අසුභං මරණස්සති**
**ඉති ඉමා චතුරාරක්ඛා - භික්ඛු භාවෙය්‍ය සීලවා**

## බුද්ධානුස්සති

1. අනන්ත විත්ථාර ගුණං - ගුණතොනුස්සරං මුනිං
භාවෙය්‍ය බුද්ධිමා භික්ඛු - බුද්ධානුස්සති මාදිතො

2. සවාසනෙ කිලෙසෙ සො - එකො සබ්බෙ නිඝාතිය
අහූ සුසුද්ධ සන්තානො - පූජානඤ් ච සදාරහො

3. සබ්බ කාලගතෙ ධම්මෙ - සබ්බෙ සම්මා සයං මුනී
සබ්බාකාරෙන බුජ්ඣිත්වා - එකො සබ්බඤ්ඤුතං ගතො

4. විපස්සනාදි විජ්ජාහි - සීලාදිචරණෙහි ච
සුසමිද්ධෙහි සම්පන්නො - ගගනාභෙහි නායකො

5. සම්මාගතො සුභං ඨානං - අමොඝ වචනො ච සො
තිවිධස්සාපි ලොකස්ස - ඤාතා නිරවසෙසතො

6. අනෙකෙහි ගුණෞඝෙහි - සබ්බ සත්තුත්තමො අහු
අනෙකෙහි උපායෙහි - නරදම්මෙ දමෙසි ච

7. එකො සබ්බස්ස ලොකස්ස - සබ්බ සත්තානුසාසකො
භාග්‍යඉස්සරියාදිනං - ගුණානං පරමො නිධි

8. පඤ්ඤාස්ස සබ්බ ධම්මෙසු - කරුණා සබ්බ ජන්තුසු
අත්තත්ථානං පරත්ථානං - සාධිකා ගුණ ජෙට්ඨිකා

9. දයාය පාරමීචිත්වා - පඤ්ඤා යත්තාන මුද්ධරී
උද්ධරී සබ්බ ධම්මෙ ච - දයායඤ්ඤෙ ච උද්ධරී

10. දිස්සමානො පි තාවස්ස - රූපකායො අචින්තියො
අසාධාරණ ඤාණඩ්ඪෙ - ධම්මකායෙ කථාවකාති.

## මෙත්තානුස්සති

1. අත්තූපමාය සබ්බෙසං - සත්තානං සුඛ කාමතං
පස්සිත්වා කමතො මෙත්තං - සබ්බ සත්තෙසු භාවයෙ

2. සුඛී භවෙය්‍යං නිද්දුක්ඛො - අහං නිච්චං අහං විය
හිතා ච මෙ සුඛී හොන්තු - මජ්ඣත්තා ථච' වෙරිනො

3. ඉමම්හි ගාමක්ඛෙත්තම්හි - සත්තා හොන්තු සුඛී සදා
තතො පරඤ් ච රජ්ජෙසු - චක්කවාළෙසු ජන්තුනො

Non-Commercial Distribution

4. සමන්තා චක්කවාළෙසු - සත්තා'නන්තෙසු පාණිනො
සුඛිනො පුග්ගලා භූතා - අත්තභාවගතා සියුං

5. තථා ඉත්ථී පුමා චෙව - අරියා අනරියාපි'ච
දෙවා නරා අපායට්ඨා - තථා දසදිසාසුචා'ති.

## අසුභානුස්සති

1. අවිඤ්ඤාණ'සුභනිභං - සවිඤ්ඤාණ'සුභං ඉමං
කායං අසුභතො පස්සං - අසුභං භාවයෙ යති

2. වණ්ණසණ්ඨාන ගන්ධෙහි - ආසයො'කාසතො තථා
පටික්කූලානි කායෙ'මෙ - කුණපාණී ද්විසොළස

3. පතිතම්භා'පි කුණපා - ජෙගුච්ඡං කායනිස්සිතං
ආධාරොහි සුචී තස්ස - කායො තු කුණපෙඨිතං

4. මිළ්හෙ කිමිව කායො'යං - අසුචිම්හි සමුට්ඨිතො
අන්තො අසුචි සම්පුණ්ණො - පුණ්ණවච්චකුටී විය

5. අසුචි සන්දතෙ නිච්චං - යථා මෙදක ථාලිකා
නානාකිමි කුලාවාසො - පක්කවන්දනිකා විය

6. ගණ්ඩභූතො රොගභූතො - වණභූතො සමුස්සයො
අතෙකිච්ඡො'ති ජෙගුච්ඡො - පභින්නකුණපූපමො'ති

## මරණානුස්සති

1. පවාත දීප තුල්‍යාය - සායුසන්තතියාක්ඛයං
පරූපමාය සංපස්සං - භාවයෙ මරණස්සතිං

2. මහාසම්පත්ති සම්පත්තා - යථා සත්තා මතා ඉධ
තථා අහං මරිස්සාමි - මරණං මම හෙස්සති

3. උප්පත්තියා සහෙ'වෙදං - මරණං ආගතං සදා
මරණත්ථාය ඔකාසං - වධකො විය එසති

4. ඊසකං අනිවත්තන්තං - සතතං ගමනුස්සුකං
ජීවිතං උදයා අත්ථං - සූරියො විය ධාවතී

5. විජ්ජු බුබ්බුල උස්සාව - ජලරාජී පරික්ඛයං
ඝාතකො'ව රිපූතස්ස - සබ්බත්ථා'පි අවාරියො

6. සුයසත්ථාම පුඤ්ඤිද්ධි - බුද්ධි වුද්ධි ජිනද්වයං
ඝාතෙසි මරණං ඛිප්පං - කාතුමාදිසකෙ කථා

7. පච්චයානඤ්ච වෙකල්‍යා - බාහිරජ්ඣත්තුපද්දවා
මරාමො'රං නිමෙසා'පි - මරමානො අනුක්ඛණන්ති.

Non-Commercial Distribution

## අට්ඨ මහා සංවෙගවත්ථු

1. භාවෙත්වා චතුරා රක්ඛා
ආවජ්ජෙය්‍ය අනන්තරං
මහා සංවෙග වත්ථූනි
අට්ඨ අට්ඨීත වීරියො

2. ජාති ජරා ව්‍යාධි චුතී අපායා
අතීත අප්පත්තක වට්ට දුක්ඛං
ඉදානි ආහාර ගවෙට්ඨී දුක්ඛං
සංවෙගවත්ථූනි ඉමානි අට්ඨ

3. පාතො ච සායමපිචෙව ඉමං විධිං යො
අසෙවතෙ සතතමත්ත හිතාභිලාසී
පප්පොති සො'ති විපුලං හතපාරිපන්ථො
සෙට්ඨං සුඛං මුනිවිසිට්ඨ මතං සුඛෙනචාති

## මෙත්තා භාවනා ගාථා

1. පුඤ්ඤෙනානෙන මෙ යාව - ජීවං සබ්බත්ථ සබ්බදා
සුඛී භවෙය්‍යං නිද්දුක්ඛො - අබ්‍යාපජ්ඣො භවෙය්‍යහං

2. මය්හං හිතා ච වෙරා ච - මජ්ඣට්ඨා සබ්බ පාණිනො
සුඛී අවෙරා නිද්දුක්ඛා - අබ්‍යාපජ්ඣා ච හොන්තු තෙ

3. තථා අස්මිං සරාරාමෙ - ගාම පබ්බත පාදපෙ
රජ්ජෙපි මජ්ඣ දීපස්ස - ගාමක්ඛෙත්ත වනාදිසු

4. චක්කවාළස්ස මජ්ඣාපි - මහා දීප චතුස්වපි
ද්විසහස්ස ඛුද්ද දීපෙසු - තෙසු ගාමාදි කෙසු'පි

5. තථා සමන්තානන්තෙසු - චක්කවාළෙසු තෙසු'පි
හෙට්ඨා අවීචිතො යාව - භවග්ගා දසදිසාසු'පි

6. ඛත්තියා බ්‍රාහ්මණා වෙස්සා - සුද්දා චණ්ඩාල පුක්කුසා
මනුස්සා අමනුස්සා ච - සුපණ්ණා ච අසෙසකා

7. සබ්බෙ අපාද ද්විපාදා - චතුප්පාද බහුප්පාදා
තෙසු භූතෙසු සබ්බෙසු - පුමා සබ්බා'පි ඉත්ථියො

8. සබ්බෙ ජෙට්ඨා අජෙට්ඨා ච - සබ්බෙ දීඝා ච රස්සකා
සබ්බෙ සුඛුමථූලා ච - හීනමජ්ඣිම උත්තමා

9. දූරට්ඨා'පි අදූරට්ඨා - සන්තිකට්ඨා ච කෙවලා
යෙ පඤ්චගතිකා සත්තා - සබ්බෙ තෙ චතුයොනිකා

10. යෙ සබ්බෙ පාණිනො ජීවා - භූතා සත්තා ච සබ්බදා
සුඛී අවෙරා නිද්දුක්ඛා - අබ්‍යාපජ්ඣා ච හොන්තු තෙ

11. නාගා ච සබ්බෙ පාතාලෙ - අසුරාවාසුරෙ පුරෙ
නරකෙ යමරාජානො - නෙරයිකා විසාතිනො

12. තිරච්ඡාන ගතා සබ්බෙ - පෙතා පෙතභවෙසු ච
අසුරකායා ච සත්තා ච - සබ්බෙ භූතිස්සිතා'පි ච

13. සුඛිතා හොන්තු නිද්දුක්ඛා - අවෙරා ච අනාමයා
දීඝායුකා අඤ්ඤමඤ්ඤං - පියා පප්පොන්තු නිබ්බුතිං

14. විහාරෙසු ච සබ්බෙසු - චෙතියෙ පටිමාඝරෙ
බොධිරුක්ඛෙසු සබ්බෙසු - සෙසරුක්ඛ වනෙසු ච

15. පබ්බතෙසු ච සබ්බෙසු - කන්දරෙ නිජ්ඣරෙ තථා
නදී ගංගා තටාකෙසු - වාපිපොක්ඛරණීසු ච

16. ජලාසයෙසු සබ්බෙසු - සමුද්දෙසු ච දෙවතා
සබ්බාපි දෙවතා නාගා - සබ්බෙ සත්තා ජලාසයා

17. සුඛිතා හොන්තු නිද්දුක්ඛා - අවෙරා ච අනාමයා
දීඝායුකා අඤ්ඤමඤ්ඤං - පියා පප්පොන්තු නිබ්බුතිං

18. ථලාසයා ච සබ්බෙපි - සබ්බෙ සත්තා වනාසයා
රුක්ඛෙසු දෙවා සබ්බා - විමානා වන දෙවතා

19. සුඛිතා හොන්තු නිද්දුක්ඛා - අවෙරා ච අනාමයා
දීඝායුකා අඤ්ඤමඤ්ඤං - පියා පප්පොන්තු නිබ්බුතිං

20. භුම්මට්ඨා දෙවතා සබ්බා - ආකාසට්ඨා ච දෙවතා
චාතුම්මහා රාජිකා ච - තාවතිංසා ච දෙවතා

21. යාමා ච තුසිතා දෙවා - නිම්මාණරතිනො පි'ච
පරෙහි නිම්මිතා සබ්බා - දෙවා ච වසවත්තිනො

22. සබ්බෙ බ්‍රහ්ම පාරිසජ්ජො - තථා බ්‍රහ්ම පුරොහිතා
මහාබ්‍රහ්මා පරිත්තාභො - අප්පමාණාභනාමකා

23. ආභස්සරා ච බ්‍රහ්මානො - පරිත්තාසුභ නාමකා
අප්පමාණසුභාචෙ ච - සුභකිණ්ණක නාමකා

24. වෙහප්ඵලා 'සඤ්ඤසත්තා - අවිහාතප්පකා' පි ච
සුදස්සා ච සුදස්සී ච - අකනිට්ඨා ච රූපිනො

25. ආකාසානඤ්චායතන - විඤ්ඤාණඤ්චායතනානි ච
ආකිඤ්චඤ්ඤායතන - නෙවනාසඤ්ඤි නො'පි ච

Non-Commercial Distribution

26. සබ්බේ'පි තෙ බහූසත්තා - පාණභූතා ච පුග්ගලා
සුඛිතා හොන්තු නිද්දුක්ඛා - අවෙරා ච අනාමයා

27. යෙහි යා සුඛ සම්පත්ති - අලද්ධා තං ලභන්තු තෙ
පීරා ච හොන්තු ලද්ධාය - සුඛසම්පත්තියා සදා

28. විජ්ජා සම්පත්ති භොගෙහි - පවඩ්ඪන්තු යසස්සිනො
පරිවාර බලප්පත්තා - භයොපද්දව වජ්ජිතා

29. සඛිලා සුඛසම්භාසා - අඤ්ඤමඤ්ඤං හිතෙසිනො
මොදන්තු සුඛිතා සබ්බෙ - මාකඤ්චිපාපමාගමා

30. සද්ධාපාමොජ්ජබහුලා - දාන සීල බහුස්සවා
ගුණභූසිත සන්තානං[1] - ආයුං පාලෙන්තු අනාමයා

31. සම්මාදිට්ඨිං පුරොධාය - සද්ධම්ම පටිපත්තියා
ආරාධෙන්තු හිතොපාය - මච්චන්ත සුඛ සාධනං

32. ඉති නානාප්පකාරෙන - සත්තෙසු හිත මානසං
මාතා ච පිය පපුත්තම්හි - පවත්තෙය්‍යං නිරන්තරං

33. භවග්ගුපාදාය අවීචි හෙට්ඨතො - එත්ථන්තරෙ සත්තකායූපපන්නා
රූපී අරූපී ච අසඤ්ඤී සඤ්ඤිනො - දුක්ඛා පමුච්චන්තු ඵුසන්තු නිබ්බුතිං

34. ඉමංහි මෙත්තං පටිවාසරං යො - භාවෙති පාතො ච දිවා ච රත්තිං
සුඛං සුපච්චෙව සුඛං පබුජ්ඣති - සුත්තෙ සුපාපං සුපිනං න පස්සති

35. පියො ච සො හොති නරාමරානං - රක්ඛන්ති තං දෙවගණාපි නිච්චං
පරප්පයුත්තා ච විසග්ගි සත්තා - නතංහි බාධෙන්ති මලංකදාපි

36. චිත්තං සමාධිං තුවටඤ්ච ගච්ඡති - වණ්ණො මුඛො චස්ස ච විප්පසීදති
අමූළ්හකො යෙව කරොති කාලං - ආයුක්ඛයෙ බ්‍රහ්මනිවාසගාමී

37. අස්මිං විහාර සර පබ්බත රුක්ඛ ගාමෙ
සබ්බෙසු දීප නගරෙසු'පි චක්කවාළෙ
දෙවාසුරා ගරුළ රක්ඛස නාග යක්ඛා
රක්ඛන්තු මං සකනුභාව බලෙන නිච්චං.

1. සන්තානා

Non-Commercial Distribution

උපග්‍රන්ථය III

# නවගුණ යන්ත්‍රය

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| ඉ | ති | ති | වා | පි | ග | සො |
| ත්වා | මබු | ස | දෙධා | පී | වි | භ |
| ස | පු | නෙනා | රො | සු | ර | භ |
| දෙ | මප | දු | ක | තත | ජ්ජා | දෙධා |
| මමා | රි | ලො | මි | ග | සා | ග |
| ව | ස | අ | තො | නු | ච | බු |
| ස | ස | ණ | ද | ර | මම | වා |
| ම | හං | නු | ර | සසා | අ | නං |

## නවගුණ යන්ත්‍රය

මෙම යන්ත්‍රය මෙහි පෙනෙන ආකාරයට රන් තහඩුවක හෝ රිදී තහඩුවක හෝ තඹ තහඩුවක හෝ පුස්කොළයක ලියා අටවිසි පිරිතෙන් 1000 වරක් ජපකර ළදරුවන්ට සෑදෙන සියලු ග්‍රහදෝෂ, යක්ෂ, ප්‍රේත ආදී දෝෂවලට ද, ස්ත්‍රී පුරුෂ සියලු දෙනාගේ ආරක්ෂාවට ද බඳිනු. කුඩා දරුවන්ගේ වයස අවුරුදු 3 ගතවන තුරු මෙයින් විශේෂ ආරක්ෂාව සැලසෙයි.

## රතන යන්ත්‍රය

රතන යන්ත්‍රය ක්‍රම කීපයකට ලියනු ලැබේ. කොටු 18 ක් වනසේ ඇඳ සූත්‍රයේ මුල් ගාථාව පටන් එක ගාථාවක් එක කොටුවකට එන සේ ගාථා 18 කොටු දහඅටේ ලිවීම සාමාන්‍ය ක්‍රමය යි.

කොටු 16 ට බෙදා ප්‍රස්තාර ක්‍රමයෙන් ලියන ක්‍රමයක් ද වේ. එය යන්ත්‍ර ශාස්ත්‍රය දත්තකු විසින් කළ යුතු වේ. මෙහි දක්වා තිබෙන්නේ ඒ දෙකට ම වෙනස්ක්‍රමයකි. මෙහි කොටු 18 කි. මුල ගාථාව පටන් සියලු ගාථාවල අකුර බැගින් එම කොටුවල ලිවීම මෙහි ක්‍රමය යි. මේ සටහනේ යොදා ඇත්තේ මුල ගාථා දෙක පමණයි. අනිත් ගාථාත් මෙසේ ම ලිවිය යුතුයි. එක කොටුවක එක ගාථාවක් ලියනුවට වඩා මෙහි ඇති වෙනස නම් හැම ගාථාවකම අකුරු මාරුවී කොටු දහඅටේ පිරී සිටීමයි. මෙය ද පෙර සිට පවත්නා යන්ත්‍ර සටහනෙකි.

මුල ගාථාවේ “යා” යන්න මුල කොටුවේ ද, “නි” යන්න 2 වැනි කොටුවේ ද යනාදී ක්‍රමය මෙහි පෙනේ. මුල ගාථාව නිම වූ පසු 2 වැනි ගාථාව ද ඊළඟ ගාථා ද ලියන්නේත් මෙසේ මැ යි.

Non-Commercial Distribution

මෙම යන්ත්‍රය පිරිසිදු ව රන් තහඩුවක හෝ රිදී තහඩුවක හෝ පුස්කොළයක ලියා තමන් පස් පවින් වැළැකී පිරිසිදුව සීලයෙහි පිහිටා සිට රතන සූත්‍රයෙන් 1000 වරක් ජප කර සියලු අමනුෂ්‍ය දෝෂවලට ද, ළදරුවන්ට පැමිණෙන බාලග්‍රහ දෝෂවලට ද, ස්ත්‍රීන්ට පැමිණෙන අමනුෂ්‍ය දෝෂවලට ද, ග්‍රහ දෝෂවලට ද, රාත්‍රියට පෙනෙන නපුරු සීනවලට ද, සියලු ආරක්ෂාදියට ද බැඳීමට ඉතා යහපති.

## රතන යන්ත්‍රය

| | | | | | |
|---|---|---|---|---|---|
| 1<br>යාඅසස | 2<br>නි නත<br>කක බෙබ | 3<br>ධලි වච<br>මෙ | 4<br>භුකෙබ<br>සු තතං | 5<br>භාසණ<br>ක | 6<br>නි බෙබ<br>නතු රො |
| 7<br>සව තාථ | 8<br>මාතුසිවා | 9<br>ගතා තා<br>නූ | 10<br>තංසූතසි | 11<br>නිමසමා<br>යා | 12<br>භූනාහිප |
| 13<br>මමා තකු<br>ජා | 14<br>නිවතාය | 15<br>වානතුනි | 16<br>යාඅසා | 17<br>නිඵොවෙ | 18<br>වපි ථ |

## තවත් රතන යන්ත්‍රයක්

| | |
|---|---|
| යාඅ නින්ත ධලි භුක්බෙ තාස නිබ්බේ<br>හ ත්ත ම්ම සු ණන්තු<br>භාසි සිශූ සිභූ තං මඃන<br>මො නි වාද යානි ච<br>භවන්තු අ ථො පි | යෙ පුග්ගලා අට්ඨ සතම්පසත්ථා<br>චත්තාරි එතානි යුගානි හොන්ති<br>එතෙසු දින්නානි මහප්පලානී<br>ඉදම්පි සංඝෙ රතනං පණීතං<br>එතෙන සච්චෙන සුවත්ථි හොතු. |

මෙම රතන සූත්‍රය මුල් කර ගත් යන්ත්‍රයක් ජප කරන්නේ පිරිත් ගාථාවකිනි. "යං කිංචි විත්තං ඉධ වා හුරං වා - සග්ගෙ සුවායං රතනං පණීතං - න නො සමං අත්ථි තථාගතෙන - ඉදම්පි බුද්ධෙ රතනං පණීතං - එතෙන සච්චෙන සුවත්ථි හොතු."

සියලු අපල සුව කරන්නා වූ මෙම රතන යන්ත්‍රය දහස් වාරයක් ජප කළ යුත්තකි. එමෙන්ම චන්ද්‍රයාගෙන් වන්නා වූ අපල ඇති අයට ද විශේෂ යි.

එම යන්ත්‍රයේ සටහන මෙසේ ය.

යං තු කි හො ච ත්ථි චි ව ත්තං සු ඉ

Non-Commercial Distribution

# I සීවලී පිරිත

1. පූරෙන්තා පාරමී සබ්බෙ - සබ්බෙ පච්චෙකනායකා
සීවලී ගුණතෙජෙන - පරිත්තං තං භණාමහෙ
නජාලීති ති ජාලිතාමි - ආ. ඊ. ඌ. ආම් ඉ ස්වාහා
බුද්ධසාමි බුද්ධසත්‍යාමි.

2. පදුමුත්තරො නාම ජිනො - සබ්බ ධම්මෙසු චක්ඛුමා
ඉතො සතසහස්සම්හි - කප්පෙ උප්පජ්ජි නායකො

3. සීවලී ච මහාථෙරො - සො රහො පච්චයාදිනං
පියො දෙවමනුස්සානං - පියො බ්‍රාහ්මණ මුත්තමො
පියො නාග සුපණ්ණානං - පීණින්ද්‍රියං නමාමහං

4. නාසං සීමො ච මේ සීසං - නානාජාලිති සඤ්ජලිං
සදේව මනුස්ස පූජිතං - සබ්බ ලාභා උපෙන්තු මෙ[1]

5. සත්තා හං ද්වාරමූළ්හෝහං - මහාදුක්ඛසමප්පිතො
මාතා මෙ ඡන්දදානෙන - එවමාසි සුදුක්ඛිතා

6. කෙසෙසු ඡිජ්ජමානෙසු - අරහත්තමපාපුණි
දෙවා නාගා මනුස්සා ච - පච්චයානුපනෙන්තිමං

7. පදුමුත්තරනාමඤ්ච - විපස්සිං ච විනායකං
සංපූජයිං පමුදිතො - පච්චයෙහි විසෙසතො

8. තතො තෙසං විසෙසෙන - කම්මාන විපුලුත්තමං
ලාභං ලභාමි සබ්බත්ථ - වනෙ ගාමෙ ජලෙ ථලෙ

9. තදා දෙවො පණීතෙහි - මමත්ථාය මහාමති
පච්චයෙහි මහාවීරො - සසංඝො ලොකනායකො

10. උපට්ඨිතො මයා බුද්ධො - ගන්ත්වා රෙවතමද්දස
තතො ජෙතවනං ගන්ත්වා - එතදග්ගෙ ඨපෙසි මං

11. රෙවතං දස්සනත්ථාය - යදා යාති විනායකො
තිංස භික්ඛු සහස්සෙහි - සහ ලොකග්ගනායකො

12. ලාභීනං සීවලී අග්ගො - මම සිස්සෙසු භික්ඛවො
සබ්බලොකහිතො සත්ථා - කිත්තයී පරිසාසු මං

---

1. අනුන් සඳහා කියන කල 'ත්වං' යනුවෙන් යොදා ගන්න.

Non-Commercial Distribution

13. කිලෙසා ඣාපිතා මය්හං - භවා සබ්බෙ සමූහතා
නාගොව බන්ධනං ඡෙත්වා - විහරාමි අනාසවො

14. ස්වාගතං වත මෙ ආසි - බුද්ධසෙට්ඨස්ස සන්තිකං
තිස්සොවිජ්ජා අනුප්පත්තො - කතං බුද්ධස්ස සාසනං

15. පටිසම්භිදා චතස්සො ච - විමොක්ඛාපි ච අට්ඨමො
ජලභිඤ්ඤා සච්ඡිකතා - කතං බුද්ධස්ස සාසනං

16. බුද්ධපුත්තො මහාථෙරො - සීවලී ජින සාවකො
උග්ගතෙජො මහාවීරො - තෙජසා ජින සාසනං

17. රක්ඛන්තා සීල තෙජෙන - ධනවන්තො යසස්සිනො
එවං තෙජානුභාවෙන - සදා රක්ඛන්තු සීවලී

18. කප්පට්ඨායීති බුද්ධස්ස - බොධි මූලෙ නිසිදයි
මාරසෙනප්පමද්දන්තො - සදා රක්ඛන්තු සීවලී

19. දස පාරමිතප්පත්තො - පබ්බජි ජින සාසනෙ
ගොතම සක්‍යපුත්තොසි - ථෙරෙන මම සීවලී

20. මහා සාවකා අසීතිංසු - පුණ්ණථෙරො යසස්සි සො
භවභොගෙ අග්ග ලාභීසු - උත්තමො තෙන සීවලී

21. එවං අචින්තියා බුද්ධා - බුද්ධ ධම්මා අචින්තියා
අචින්තියෙසු පසන්නානං - විපාකොහොති අචින්තියො

22. තෙසං සච්චෙන සීලෙන - ඛන්ති මෙත්ත බලෙන ච
තෙපි මං[1] අනුරක්ඛන්තු - සබ්බ දුක්ඛ විනාසනං

23. තෙසං සච්චෙන සීලෙන - ඛන්ති මෙත්ත බලෙන ච
තෙපි මං[1] අනුරක්ඛන්තු - සබ්බ භය විනාසනං

24. තෙසං සච්චෙන සීලෙන - ඛන්ති මෙත්ත බලෙන ච
තෙපි මං[1] අනුරක්ඛන්තු - සබ්බ රොග විනාසනං

(මෙම පිරිත භාවිතා කරන්නවුන්ට වෙළෙඳාම් ආදියෙන් ලාභ, ආහාරපානාදිය ද සුලභ වේ. රජ - සොර - සතුරු භය හා තුන්දොස් කිපීමෙන් හටගන්නා භය ද දුරු වේ.)

1. අනුන් සඳහා කියන කල 'ත්වං' යනුවෙන් යොදා ගන්න.

Non-Commercial Distribution

# සීවලී යන්ත්‍රය

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| ඉතිපි | අරහං | සම්මා | විජ්ජා | තස්ස | සුග | සං |
| ඉතිපි | අරහං | සම්මා | විජ්ජා | සම්ප | සුග | සං |
| විජ්ජා | සසං | මධෙ | අරහං | නෙනා | තො | ඔධ |
| අරහං | ගම | රොපු | ලොක | නිසං | ඨාන | සසා |
| විදූ | අධො | මත්ත | සසර | නාග | ධාමි | දෙවිං |
| නධෙ | භගවා | අරහං | ධම්මබු | ධම්මා | විසං | මපි |
| තණබු | ගචඡා | නිමින | මනවි | සරග | ජෙන | සරඟ |
| ඬො | මෙග | රණ | වන්ති | නමො | සරණ | තෙජ |

# XI සීවලී දැහැණ

නමො සිද්ධ සීවලී රාජා පඨවියා සබ්බතොමෙච ආකාසෙ උදකෙන නෙවි සං සං හස්සං තම්පි සාරෙමි සබ්බලොකං උපෙන්තු මෙ.

නමො සොහිසදිස්සති තෙජී පියදස්සති නමඃ - පදුමුත්තරො නාම ජිනො සබ්බ ධම්මේසු චක්ඛුමා ඉතො සතසහස්සම්හි කප්පෙ උප්පජ්ජි නායකො සීලං තස්ස අසංඛෙය්‍යං සමාධි වජිරූපමා අසංඛියං ඤාණවරං විමුත්තිඤ්ච අනුපමා මනුජා' මරනාගානං බ්‍රහ්මාණං ච සමාගමෙ.

නමාමහං මහාලාභිං සීවලී නාම අරහන්තං තස්ස තෙජෙන සබ්බ ලාභා උපෙන්තු මෙ - සීවලී ච මහා ථෙරො සො රහො පච්චයාදිනං තිලී ජාත සිබොනාසං[1] මන ආ උ උමනාං ආ සල්ලජනා[2] බහුජනා.

පියො දෙවමනුස්සානං පියො බ්‍රාහ්මණමුත්තමො; පියො නාගසුපණ්ණානං පීතින්දියං නමාමහං, නාසං සීමො ච මෙ සීසං නානාජාලීති සංජලිං; සදෙවමනුස්ස පූජිතං සබ්බලාභා උපෙන්තු මෙ.

නමො ථෙරස්සන්ති සො නාම කිං මෙ සුතං එතං සබ්බ නෙති සීවලී තෙජානං එවං සීවලී නමඃ :

සමණ බ්‍රාහ්මණාකිණ්ණො ධම්මං දෙසෙති නායකො. සසාවකං මහාලාභිං පුඤ්ඤවන්තං ජුතින්ධරං ඨපෙසි එතදග්ගම්හි පරිසාසු විසාරදො, තදාහං ඛත්තියො ආසිං නගරෙ හංසවතීවිහයෙ.

---

1. සිබොභාසං 2. සබ්බජනා

Non-Commercial Distribution

නමො ජාති ජලාගාර විසදන ආකාස අහන්තිං ච
ඊවඳා හන්ති යස්ස රෙරස්ස තෙ ජයතෙ නමඃ

සුත්වා ජිනස්ස තං වාක්‍යං සාවකස්ස ගුණං බහුං, නිමන්තයිත්වා සත්තාහං භොජයිත්වා සසාවකං මහා දානං දදිත්වාන, තංඨානමභිපත්‍ථයිං, තඳා මං විතතං පාදෙ දිස්වාන පුරිසා සභො. සො සරෙහ, මහා වීරො ඉදං වචනමබ්‍රෑවි, තතො ජිනස්ස වචනං සොතුකාමා, මහජනා දෙවඳානව ගන්ධබ්බා බ්‍රහ්මානො ච මහිද්ධිකා.

නමො තෙජං ලොකෙක සෙට්ඨං නරාසභං එතං තෙජෙන සෙට්ඨං නරාහතිං තෙජ නමඃ

සමණබ්‍රාහ්මණා චාපි නමස්සිංසු කතංජලි, නමො තෙ පුරිසාජඤ්ඤ නමො තෙ පුරිසුත්තම, ඛත්තියෙන මහාදානං දින්නං සත්තාහකං විභො සොතුකාමා එලන්තස්ස ව්‍යාකරොහි මහාමුනෙ, නමො ශ්‍රී බුද්ධ ජය ජය එස්වාහා.

නමො රෙරශ්ච යතො හොති යස්ස යන්තො පියායාති යස්ස යන්ති නමො නමඃ

ලාභීනං සීවලී අග්ගො මම සිස්සෙසු භික්ඛවො, සබ්බලොක හිතො සත්‍ථා කිත්තයි පරිසාසුමං, රෙවතං දස්සනත්‍ථාය යඳායාති විනායකො තිංස භික්ඛු සහස්සෙහි සහලොකග්ග නායකො.

නමො සර්‍වාත්‍ථකාරණානී තෙසං භගවතො ඉති රාජහංස තෙ නමඃ, නමො භව භව සර්වසිද්ධිකාරණාය සහස්‍රකොටි බන්ධනාය නබජ්වලොභං ඉති සාධනෙ නමඃ, හන හන දහනප්‍රසිද්ධ සිද්ධි සාධකාය හුදශ්‍රී[1] සම්බන්ධනාය භග්නමුඛ තෙ නමඃ, නමො තෙසං ඉති සංස ධරණං කොටිප්‍රකොටි බන්ධනං සටීකංත ප්‍රභවතො නමඃ, නමො කුට පුට පුට යොග දක්ෂිණ උත්‍ර පුත්‍ර සීවලී තෙ නමඃ, නමො භොගිත්‍යාරාම භග්න ජාතහංස භගවතො නමො නමඃ, නමො සීවලී සූයර්‍යාතාපනී ආ, ඊ, ඌ, ඒ, ඕ, ඖ න තෙ බන්ධු ත්‍රිවර්‍ණ යුගල තෙ නමඃ

## තවත් සීවලී යන්ත්‍රයක්

සීවලී යන්ත්‍ර රාශියක් විවිධ ස්වරූපයෙන් අදත් ව්‍යවහාරයෙහි එයි.

| | | | | |
|---|---|---|---|---|
| ප | භ | ය | ස්සං | වි |
| බ් | කා | බ | ශෙ | ත |
| ආ | න්තු | වි | ලා | යා |
| ස | නෙ | මිමෙ | උ | ම් |
| ච | පෙ | සං | හං | ස |
| මි | කෙ | උ | ද | පි |
| මෙ | රෙ | තො | සා | බ්බ |

1. හුදශ්‍රී.

Non-Commercial Distribution

මෙම යන්ත්‍රය ජප කරන අවස්ථාවේ භාවිතයට ගන්නා ජප මන්ත්‍රයෙහි ද ඇත්තේ බෞද්ධ ස්වරූපයකි.

නමෝ ආසෝර සරස්වතී දිෂ්ටි නමෝ
මුඛරංජනී ස්ර්ව භය විනාශනය නමඃ
නමො සිද්ධ සීවලී රාජා පඨවියා සබ්බතො මෙ ච
ආකාසෙ උදකෙ නෙ විසං සංහස්සං තම්පි සාරෙමි
සබ්බ ලාභං උපන්තු මෙ අතෙ

මෙහි ප්‍රතිඵලය වශයෙන් දක්වා ඇත්තේ මෙලොව සැප සම්පත් රැකී රක්ෂාදීය සඵල වීමත් ය. උදේ ගෙදරින් දොරට බහින විට යමෙකු මේ යන්ත්‍රය ගැන තුන් වරක් සිහි කර ඉදිරියට කෙළ ගසා ඊට උඩින් පැන යාමත්, මුහුණ සෝදන විට වතුරට තුන් වරක් සිහි කර සේදීමත්, නිද ගන්නට යන විටත් සිහි කළොත් ඔහුට නපුරු සිහින පෙනීමක් නැත.

## තවත් සීවලී යන්ත්‍රයක් මෙසේයඃ

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| ඉතිපි | අරහං | සම්මා | විජ්ජා | තස්ස | සුග | සං |
| ඉතිපි | අරහං | සම්මා | විජ්ජා | සම්ප | සුභ | සං |
| විජ්ජා | ස්සං | ම්ධො | අරහං | න්තො | තො | බුද්ධ |
| අරහං | නම | රොපු | ලොක | නිසං | ඨාන | ස්සා |
| විදු | අධො | මත්ත | ස සර | තාග | ධාවී | දේවිං |
| නධෙ | භගවා | අරහං | ධම්මබු | ධම්ම | විසං | මවී |
| දෙ | | | | | | |

මෙම යන්ත්‍රයෙහි දකුණත කෙළවරේ ශ්‍රී අකුරු දෙකක් මැද සීවලී මහරහත් පින්තූරය ඇඳිය යුතු වෙයි. මහා සිද්ධ සීවලී යන්ත්‍රය යනුවෙන් අදත් මෙම යන්ත්‍රය ගුප්ත විද්‍යාවෙන් ප්‍රයෝජන ගන්නා අය අතර ඇත.

## අභිසම්භිදාන පිරිත (මන්ත්‍රය) අංක 1

1. නමො අභිසම්භිදානෙ යුත්තෙ යුත්තෙ පජ්ජලති පජ්ජලති තීහුම් තීහුම් ලුහු ලුහු පරමේස්වාහා.
2. නමො පච්චෙක සම්බුද්ධෙ යුත්තෙ යුත්තෙ පජ්ජලති පජ්ජලති තීහුම් තීහුම් ලුහු ලුහු පරමේස්වාහා.
3. නමො සාරිපුත්ත මොග්ගල්ලානෙ යුත්තෙ යුත්තෙ පජ්ජලති පජ්ජලති තීහුම් තීහුම් ලුහු ලුහු පරමේස්වාහා.
4. නමො සාරිපුත්ත මොග්ගල්ලානෙ යුත්තෙ යුත්තෙ පජ්ජලති පජ්ජලති තීහුම් තීහුම් ලුහු ලුහු පරමේස්වාහා.

Non-Commercial Distribution

5. නමො අංගුලිමාල මහා ථෙරො මහාවීරො මහාකායො මහාබලො යුත්තෙ යුත්තෙ පජ්ජලති පජ්ජලති තීහුම් තීහුම් ලුහු ලුහු පරමේස්වාහා.


6. නමො සීවලී මහාථෙරො යුත්තෙ යුත්තෙ පජ්ජලති පජ්ජලති තීහුම් තීහුම් ලුහු ලුහු පරමේස්වාහා.

7. නමො සත්තතිංස බොධිපක්ඛියා ධම්මා; චත්තාරො සතිපට්ඨානා; චත්තාරො ඉද්ධිපාද චත්තාරො සම්මප්පධානා; චත්තාරි අරියසච්චානි; පඤ්චින්ද්‍රියානි; පඤ්චබලානි; සත්තබොජ් ඣංගානී; අරියො අට්ඨංගිකො මග්ගො; බුද්ධ මන්තංච මන්තංච, ධම්ම මන්තංච මන්තංච, සංඝ මන්තංච මන්තංච මන්තං. ............................................ නාමස්ස සබ්බ රොගා, සබ්බ දොෂා, සබ්බන්තරායා, විනස්සන්තු යුත්තෙ යුත්තෙ පජ්ජලති පජ්ජලති තීහුම් තීහුම් ලුහු ලුහු පරමේස්වාහා.

(නොයෙක් ආරක්ෂාදිය සඳහා මේ මන්ත්‍රවලින් ජප කිරීම යහපති, පිරිසිදු රත්තැඹිලි තෙල් ජප කොට රන් සුරයක ලා පැළඳීමෙන් ආරක්ෂාව ද, ජය ද සැළසේ, බාලග්‍රිහදෝෂයට, නපුරු උණරෝගාදියට, නපුරු සිහින දැකීමට, විශේෂයෙන් ස්වප්න මෝචනයට, ඇස්වහ, කටවහ ආදී රෝගවලට තෙල් හෝ ජලය ජපකොට ආරක්ෂා කිරීම යහපති. භූත දෝෂ වැළකීමට මේ මන්ත්‍රවලින් පොල් තෙල් ජපකොට උදේ - හවස පහන් දැල්වීම මැනවි. ආරක්ෂාව ලැබෙයි.)

(ගෙවතු ආරක්ෂා කිරීමට ගන්නා තිරුවානා ගල් ආදී ද්‍රව්‍ය ජප කොට සතර කොන් වැළලීම ද හොඳ ය. 7 වැනි මන්ත්‍රයේ "........................................................ නාමස්ස" යන තැන්හි තිත් ඇති තැන ආතුරයාගේ නම යෙදිය යුතුයි. ස්ත්‍රියක සඳහා නම් 'නාමස්ස' යනු 'නාමිකාය' කියා යොදා ගත යුතුයි. ඊට මුලින් නම පෙර කී ලෙසට යෙදිය යුතුයි.)

## අභිසම්භිදන යන්ත්‍ර 1




රත්රන් හෝ තඹ පත්‍රයක් ගෙන මේ සටහන අනුව ඇඳගත යුතුයි. පළල මෙන් තුන් ගුණයක් හෝ 5 ගුණයක් 7 ගුණයක් හෝ දිග විය යුතුය. කොන් සම වන්නට කවකටුවට ගත යුතුයි. කොන් විෂමවීම දොස්සහිතයි. ප්‍රස්තාර කිරීමෙක් මෙබඳු යන්ත්‍රවල නැත. යන්ත්‍රයේ 1 දරණ කොටුවේ 1 දරණ මන්ත්‍රය ලිවිය යුතුයි. අනික් කොටුවලත් එසේ යි. නම යෙදීම පෙර සඳහන් කළ පරිද්දෙනි. ලියන විට අකුරු නොවරදවා අකුරකින් අකුරක් නොකපා ලිවිය යුතුයි. බැඳි අකුරු

Non-Commercial Distribution

බැඳිව ලිවිය යුතුයි. අඩුතරමින් 108 වරක්වත් ජප කළ යුතුයි. දහස් වාරය දසදහස් වාරය යනාදී ක්‍රමයට ජප කිරීම ඉතා ගුණදායක යි. වාර ගණන වැඩි වූ තරමට හොඳය. උදය සවස තෙරුවන් වැඳ පුදා ශීලයක පිහිටා එක් වේලේ වළඳමින් බ්‍රහ්මචාරීව ජප කළ යුතුයි. ජපය අවසානයේ දී ජය පිරිත, බොජ්ඣංග පිරිත, අටවිසි පිරිත, ගිනි පිරිත, ජයමංගල ගාථා, මහාජය මංගල ගාථා කියා අවසන් කළ යුතුය.

## අභිසම්භිදාන පිරිත (යන්ත්‍රය) අංක 2


1. නමො අභිසම්භිදානෙ යුත්තෙ යුත්තෙ පජ්ජලති පජ්ජලති තීහුම් තීහුම් ලුහු ලුහු පරමේස්වාහා.
2. නමො සම්මා සම්බුද්ධෙ යුත්තෙ යුත්තෙ පජ්ජලති පජ්ජලති තීහුම් තීහුම් ලුහු ලුහු පරමේස්වාහා.
3. නමො පච්චේක සම්බුද්ධෙ යුත්තෙ යුත්තෙ පජ්ජලති පජ්ජලති තීහුම් තීහුම් ලුහු ලුහු පරමේස්වාහා.
4. නමො ආනන්ද ථෙරො යුත්තෙ යුත්තෙ පජ්ජලති පජ්ජලති තීහුම් තීහුම් ලුහු ලුහු පරමේස්වාහා.
5. නමො කස්සප මහාථෙරො යුත්තෙ යුත්තෙ පජ්ජලති පජ්ජලති තීහුම් තීහුම් ලුහු ලුහු පරමේස්වාහා.
6. නමො සීවලී මහාථෙරො යුත්තෙ යුත්තෙ පජ්ජලති පජ්ජලති තීහුම් තීහුම් ලුහු ලුහු පරමේස්වාහා.
7. නමො සාරිපුත්ත මොග්ගල්ලානෙ යුත්තෙ යුත්තෙ පජ්ජලති පජ්ජලති තීහුම් තීහුම් ලුහු ලුහු පරමේස්වාහා.
8. නමො අංගුලිමාල මහාථෙරො යුත්තෙ යුත්තෙ පජ්ජලති පජ්ජලති තීහුම් තීහුම් ලුහු ලුහු පරමේස්වාහා.
9. නමො සත්තතිංස බොධිපක්ඛියා ධම්මා; චත්තාරො සතිපට්ඨානා; චත්තාරො ඉද්ධිපාදා; චත්තාරො සම්මප්පධානා; චත්තාරි අරියසච්චානි; පඤ්චින්ද්‍රියානි; පඤ්චබලානි; සත්තබොජ්ඣංගානි; අරියො අට්ඨංගිකො මග්ගො; බුද්ධ මන්තං ච මන්තං; ධම්ම මන්තං ච මන්තං; සංඝ මන්තං ච මන්තං ........................................... නාමස්ස සබ්බ රොගා, සබ්බ දොෂා, සබ්බන්තරායා විනස්සන්තු යුත්තෙ යුත්තේ පජ්ජලති පජ්ජලති තීහුම් තීහුම් ලුහු ලුහු පරමේස්වාහා.

(ආදී සෙත් පිරිත් එකෙකින් හෝ කීපයකින් ජප කළ යුතුයි. වාර ගණන පෙර කී ලෙසිනි. දස දහස් වරක් යන්ත්‍රය ජප කරනු ලැබේ නම් සෙත් පිරිත් ජපය 500 වර බැගින්වත් විය යුතුයි. යන්ත්‍ර විධි දන්නන්ගෙන් අසා කටයුතු කිරීම හැම අතින් ම යහපති. යන්ත්‍රයේ ඇතුළ පිට නූල් දෙකේ ගැට 14 යි. ඒ එක එක ගැටයට සෙත් පිරිත්වලින් යට කී පරිදි සුදුසු වාර ගණනක් ජප කිරීම සුදුසු යි.)

(කස්තුරි ගෝරෝචනවලින් පලිප්පු කළ යුතුයි. සුදුහඳුන්, රත්හඳුන්, දේවදාර, අගිල්, ගුගුල්, සුවඳකොට්ටම්, ජටාමාංස, සැවැන්දරා, විෂ්ණුක්‍රාන්ති, සාම්බ්‍රානි දෙවගය, සඳුන් ලාටු යන ද්‍රව්‍ය එක තරමට ම ගෙන කුඩු කර ධූපය සාදාගෙන ජප කරන විට ඒ දුම් යන්ත්‍රයට දිය යුතුයි.)

Non-Commercial Distribution

# අභිසම්භිදන යන්ත්‍ර II




(මේ යන්ත්‍ර සටහනේ කොටු 7 ක් නමුත් අංක 9 ක් තිබේ. කොටු දෙකක අංක දෙක බැගින් මන්ත්‍ර 9 ක් වශයෙන් ගන්නා ක්‍රමයක් ද ඇති හෙයිනි. ඒ අනුව මුල මන්ත්‍ර තුනෙත් 9 වැන්නේත් වෙනසක් නැත. 4 ට "නමො ආනන්ද ථෙරො" යන්න ද 5 වැන්නට "නමො කස්සප මහාථෙරො" යන්න ද 6 ට "නමො සීවලී මහාථෙරො" යන්න ද 7 ට "නමො සාරිපුත්ත මොග්ගල්ලානො" යන්න ද 8 ට "නමො අංගුලිමාල මහාථෙරො" යන්න ද මුල් කර ගනිති. එබැවින් මේ යන්ත්‍රය ලියන විට 2 - 3 දරණ කොටුවේ 2 - 3 දරණ මන්ත්‍ර දෙක ද 5 - 6 කොටුවේ 5 - 6 දරණ මන්ත්‍ර දෙක ද ලිවිය යුතුවේ. ලිවීම, ජප කිරීම ආදිය පෙර පරිද්දෙනි. සුදුසු පරිදි ලියා වැඩි වාර ගණනක් විධි නො වරදවා ජප කරගත් අභිසම්භිදාන යන්ත්‍රයක් බැඳ ගැනීමෙන් පෙර සඳහන් කළ උවදුරු ආදිය වැළකී සෙත සැලසෙයි. යන්ත්‍ර අඳින විට ඉරි නොකැපෙන සේ වුවහොත් මැනවි.)

# ජලනන්දන පිරිත

1. චතුවීසති බුද්ධොති - යො භවිස්සති උත්තමං
   පාරමීබල යුත්තෙහි - ජලනන්දන මුත්තමං

2. අනොමානී ජලත්තීරෙ - උත්තමං පත්ත චීවරෙ
   පාරමී තෙ ජලං හොති - සර්ව බන්ධන ඡෙදනං

3. ආනන්දොති මහාථෙරං - උත්තමං ධම්ම භාණ්ඩකං
   යෙන භික්ඛු මහාථෙරං - සයනෙ බන්ධන විධ්වංසනං

4. ඉති ශ්‍රී ලොක බුද්ධෙහි - යෙන ධම්මානු භාවතො
   යන්ත්‍ර මන්ත්‍ර හරංකත්වා - විනාසං බුද්ධානු භාවතො

5. මුනින්දො හොති නමො බුද්ධො - මාරසෙනා පභිජ්ජති
   දසකොටි සහස්සාති - සර්ව බන්ධන ඡෙදනං

6. පාරමිතා ගුණා හොන්ති - සො භවිස්සති උත්තමං
   අනෙක ජාති සංසාරං - සහස්සං ධම්මානු භාවතො

7. සයානො වා සහස්සානි - උත්තමං ගුණ පුග්ගලං
   අසීතිං යෙන සබ්බෙපි - සබ්බ සිද්ධි භවන්තු තෙ


Non-Commercial Distribution

8. ¹අසීතිං දසතෙජෙන - සර්ව භය විනාසනං
සර්ව රොග විනස්සන්තු - සර්ව බන්ධන ඡේදනං

9. යක්ෂ භූත පිශාචාත්ම - ග්‍රහ දොෂ විනාසනං
නමොස්තු තෙ බුද්ධ රාජ - සර්ව දොස විනාසනං

1. මෙම ශ්ලොක දෙක පසු කලෙක යම්කිසි ඇදුරකු විසින් සකස් කරන ලද්දක් බව පෙනේ.

## ජලනන්දන යන්ත්‍රය




(බැස යන වතුර කඩකින් ගල් කැට 8 ක් ගෙන 108 වරක් මතුරා හිරු උදාවීමට පළමුව මුට්ටි 4 ක බහා ගෙයි කොන් සතරේ වළලනු. සියලු යක්ෂ, ප්‍රේත, පිශාචාදීන්ගෙන් වන භය දුරු වෙයි; ගිනියම් උණට තුන් වරුවක් පිරිත් කරනු. තැඹිලි තෙල් මතුරා නොයෙක් ආරක්ෂාවට සුදුසු යි. ඇස්වහ කටවහ ආදී දෝෂවලට හා බාල රෝගවලට යහපති. තමාට කියන විට "තෙ" වෙනුවට "මෙ" කියා යොදා ගනු.)

## ජලනන්දන යන්ත්‍රය

මෙම යන්ත්‍රය තඹ කොළයක ඇඳගෙන අභිසම්භිදාන යන්ත්‍රයට කී පරිද්දෙන් ජපකර ගත යුතු යි. ජප කිරීම ජලනන්දන පිරිතෙනි. 108 වරක් හෝ 1000 වරක් හෝ දහදහස් වරක් හෝ ලක්ෂ වාරයක් හෝ ජපකර ගැනීම හොඳයි. වාර වැඩි තරමට ප්‍රතිඵල වැඩියි. සුබ කටයුතුවලදී ඉතා අනගි බලගතු යන්ත්‍රයකි. සුවඳ දුම් සකස් කර ගැනීම ද අභිසම්භිදානයට කී අයුරිනි.

ඇදුම, වලිප්පුව, ග්‍රහණිය, මාන්දම් වැනි කුඩා දරුවන්ගේ රෝග වැළැක්වීමට භූත දෝෂ හා ස්වප්න මෝචනය දුරු කිරීම සඳහා ද යන්ත්‍රය සුදුසු ලෙසින් බැඳීම හොඳයි.

රන් තැඹිලි තෙල් මතුරා ආරක්ෂා විධි සලසා ගත හැකියි. අමනුෂ්‍ය උවදුරු දුරු කිරීමට ද; ගෙවතු ඉඩම් ආරක්ෂා කිරීමට ද ඉතා හොඳයි. පයට නොපෑගෙන තැනකින් ගල් කැට 108 ක් ගෙන 108 වරක් මතුරා ගෙයි අටකොනේ පොඩි මුට්ටි 08 කට දමා වැළලීමෙන් අමනුෂ්‍ය දෝෂ දුරු වෙයි. අනවින, කොඩිවින, බන්ධන භංග වී යයි. ආරක්ෂාව සැලසෙයි. ශ්‍රීයාව ගෙන දෙයි.

(අනුන්ට කියන කල 'මෙ' වෙනුවට 'තෙ' කියා ද; 'මය්හං' වෙනුවට 'තුය්හං' කියා ද යොදා ගත යුතුයි.)

Non-Commercial Distribution

# රත්නමාලී යන්ත්‍රය



සං සාර සාරොස විණිත ණිසං
සං නීථ සාතං සුවිසාර ධීසං
සං ධීරතං සොණ්ණ තනූ පලාසං
සං ලාප දෙසිං පණමෙ හිසාසං

සං සාහිගං කෙවල මොහ නාසං
සං නාහකං මාර රණෙ විසෙසං
සං සේවිතං දාසි මුදාර හාසං
සං භාර ධම්මං පණමෙ සදාසං

සං දාසගං නාසිත පාප නාසං
සං නාප ධංසිං හත සොර පාසං
සං පාර ගාමිං සුවිසාර වාසං
සං වාර සංසං පණමෙ රසාසං

මෙම මහා බලැති යන්ත්‍ර මණ්ඩලය දළදා මැඳුරේ සහ රුවන්මැලි චෛත්‍ය රාජයාගේ ආරක්ෂාව සඳහා යොදා ඇති බව සඳහන් වේ.

උදේ සවස මෙම ගාථා තුන කියවීමෙන් සියළු බිය, උවදුරු නැතිවීමත්, නිරෝගී බව සහ චිත්ත සාන්තියක් ඇති කර ගැනීමටත් හැකිවනු ඇත.

Non-Commercial Distribution

# පිරිත් ගාථාවලින් කළ හැකි හාස්කම්

**නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස**

## I

## මහාමංගල සූත්‍රයෙන් කළ හැකි හාස්කම්

1. එවං මෙ සුතං එකං සමයං භගවා, සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථ පිණ්ඩිකස්ස ආරාමෙ, අථ ඛො අඤ්ඤතරා දෙවතා අභික්කන්තාය රත්තියා අභික්කන්ත වණ්ණා කෙවලකප්පං ජෙතවනං ඔභාසෙත්වා යෙන භගවා තෙනුපසංකමි උපසංකමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි.

මෙයින් ඉරුවාරදයට 108 වරක් තෙල් කිරි මතුරා උදය තුනක් ගානු, සුවවේ.

2. එකමන්තං ඨිතා ඛො සා දෙවතා භගවන්තං ගාථාය අජ්ඣභාසි.
බහු දෙවා මනුස්සා ච මංගලානි අචින්තයුං ආකංඛමානා සොත්ථානං බ්‍රෑහි මංගල මුත්තමං.

මෙයින් 108 වරක් පැන් මතුරා පිස්සන්ට පොවනු, සුවවේ.

3. බාහුසච්චඤ්ච සිප්පඤ්ච විනයො ච සුසික්ඛිතො සුභාසිතා ච යා වාචා එතං මංගල මුත්තමං
මාතා පිතු උපට්ඨානං පුත්තදාරස්ස සංගහො අනාකුලා ච කම්මන්තා එතං මංගල මුත්තමං

මේ ගාථා දෙකින් සර්ප විෂට 108 වරක් දෙහි අත්තෙන් මතුරනු, බල්ලන් කෑවාට තෙල් මතුරා ගානු.

4. දානං ච ධම්ම චරියා ච ඤාතකානං ච සංගහො අනවජ්ජානි කම්මානි එතං මංගල මුත්තමං
ආරති විරති පාපා මජ්ජපානා ච සඤ්ඤමො අප්පමාදො ච ධම්මෙසු එතං මංගල මුත්තමං.
ගාරවො ච නිවාතො ච සන්තුට්ඨී ච කතඤ්ඤුතා කාලෙන ධම්ම සවණං එතං මංගල මුත්තමං

මේ ගාථා තුන පුස්කොළයෙක ලියා තුන් වරක් ජේකොට තබා දහස් වරක් ජප කර අත තබා ගෙන යනු, යුක්තිය දිනයි.

5. ඛන්තී ච සොවචස්සතා සමණානඤ්ච දස්සනං කාලෙන ධම්ම සාකච්ඡා එතං මංගල මුත්තමං
ඵුට්ඨස්ස ලොක ධම්මෙහි චිත්තං යස්ස න කම්පති අසොකං විරජං ඛෙමං එතං මංගල මුත්තමං
එතාදිසානි කත්වාන සබ්බත්ථමපරාජිතා සබ්බත්ථ සොත්ථිං ගච්ඡන්ති තං තෙසං මංගල මුත්තමන්ති.

මෙයින් යක්ෂ බැල්ම, ප්‍රේත බැල්ම ඇති ගෙදර උදය සවස පිරිත් කරනු. අබ මතුරා ගෙට ඉසිනු. ගේ සිව් කොණෙහි නොපෑගුණ ගල් මතුරා වළලනු.

Non-Commercial Distribution

# II
# රතන සූත්‍රයෙන් කළ හැකි හාස්කම්

1. කොටි සතසහසෙසසු - චක්වාළෙසු දෙවතා
යස්සානං පතිගණ්හන්ති - යඤ්ච වෙසාලියංපුරෙ
රොගා මනුස්ස දුබ්භික්ඛ - සම්භුතං තිවිධං භයං
ඛිප්පමන්තරධාපෙසි - පරිත්තං තං භණාමහෙ.

2. යානීධ භූතානි සමාගතානි භුම්මානි වා යානිව අන්තලික්ඛෙ
සබ්බෙව භූතා සුමනා භවන්තු අථොපි සක්කච්ච සුණන්තු භාසිතං
තස්මාහි භූතානි සාමෙථ සබ්බෙ මෙත්තං කරොථ මානුසියා පජාය
දිවා ච රත්තො ච හරන්ති යෙබලිං තස්මාහි නෙ රක්ඛථ අප්පමත්තා.

මේ ගාථා දෙකින් පිරිත් කරන කල ඉස්සෝදා නහා පිරිසිදු වස්ත්‍ර ඇඳ චෛත්‍යස්ථානයකට පැමිණ තිසරණ පන්සිල්හි පිහිටා ඒකාන්ත ශුද්ධ චිත්තයෙහි යෙදී මල් පහන් සුවඳ ආදිය බුදුන්ට පුදා ගිතෙලින් පහණක් බුදුන්ට පුදා විවේකීව හිඳ මාගේ අභිමතය සිද්ධ වේවා යි අධිෂ්ඨාන කොට දෙවියන්ට පිං දී මේ ගාථා දෙක 108 වරක් කියා සැතපෙනු. කැමැත්ත සිහිනෙන් පෙනේ. මේ හැර යක් ලෙඩට පිරිත් කර නූල් බඳිනු. රෙදි කොනකට මතුරා ගැට ගසනු. බිළිඳුන්ගේ බාලගිරි දොසට කිරිතෙල් මතුරනු.

3. යං කිඤ්චි චිත්තං ඉධ වා හුරං වා සග්ගෙසු වා යං රතනං පණීතං
න නො සමං අත්ථි තථාගතෙන ඉදම්පි බුද්ධෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු

(i) මේ ගාථාවෙන් පිරිත් කරන කල මුලින් කී පරිදි සීලා දී ගුණයෙහි පිහිටා චෛත්‍යයක් සමීපයෙහි බුදුන්ට විළඳ, කිරිබත් පුදා තමන්ගේ අභිමතය දෙවියන්ට කියා ඔයකින් හෝ මුහුදු වෙරළකින් හෝ වැලිගෙන 108 වරක් මතුරා ගෙහි දමනු. යක්ෂ දිෂ්ටි දුරුවේ. සොල්මන් නැති වේ. භය දුරුවේ. භය ඇති මාර්ගයක යනවිට තුන් පුරුකක් ඇති ඊතණ ගසක් කඩා 108 වරක් පිරිත් කර හිසෙහි පැළඳ එම ගාථාව කිය කියා යනු. භය දුරු වේ.

(ii) ගෝරෝචන ගෙන වස්ත්‍ර කඩක රඳා මෙයින් මතුරා තිලක දී රජුන් දකිනු. වසඟ වේ.

(iii) බාල දරුවන් හඬන කල පිරිසිදු අළුවලට මතුරා තිලක දෙනු. ඇඬීම නවතී.

(iv) ප්‍රේත බැල්මට නොයිඳුල් පැන් මතුරා ලෙඩාට දෙනු.

4. ඛයං විරාගං අමතං පණීතං යදජ්ඣගා සක්‍යමුනී සමාහිතො
න තෙන ධම්මෙන සමත්ථිකිඤ්චි ඉදම්පි ධම්මෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු.

(i) මේ ගාථාවෙන් පිරිත් කරන කල ද පෙර කී ලෙස සීලාදී ගුණයෙහි පිහිටා සැම පිල්ලි අංගම්, සූනියම්වලට 108 වරක් හඳුන් මතුරා ඉන තබා යනු. නොවදී.

(ii) සර්ප විෂට මතුරා ඇඟ ගානු. විෂ බසියි.

Non-Commercial Distribution

(iii) සතුරන් දකිනු. මිතුරු වේ.

(iv) තෙලට මතුරා ඇඟ ගානු, විෂ බසියි.

(v) 108 වරක් පිරිත් කිරීමෙන් රුජා ද දුරුවේ.

5. යම්බුද්ධ සෙට්ඨො පරිවණ්ණයී සුචිං සමාධිමානන්තරිකඤ්ඤමාහු
සමාධිනාතෙන සමො න විජ්ජති ඉදම්පි ධම්මෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු.

(i) මෙයින් පෙර කී ලෙස ම සිලාදී ගුණයෙහි පිහිටා 108 වරක් සමන් මල් මතුරා දාගැබක් සමීපයේ පුදනු. සෑම රෝග උපද්‍රව දුරුවේ.

(ii) මෙසේ ම පැන් මතුරා ඉරි පැන්නුම් ලෙඩට බොන්නට දෙනු.

(iii) සමන් මල් මතුරා හරක් ගාලේ දමනු. ගවයෝ බෝවෙත්.

(iv) සපුමලට 108 වරක් මතුරා ගවයන් නාවනු. ගවයෝ බෝවෙත්.

(v) වතුරට 108 වරක් මතුරා ගවයන් නාවනු. ගවයෝ බෝවෙත්.

(vi) ස්ත්‍රීන් ඔසප් වූ දවසේ මෙයින් 108 වරක් පිරිත් කර පොවනු. දරුගැබ සිටියි.

(vii) එසේ ම 108 වරක් සපුමලට මතුරා රෙදි පිළි තිබෙන තැන ද, වී කොටුවල ද තබනු. එහි උපද්‍රව දුරුවෙයි.

6. යෙ පුග්ගලා අට්ඨසතං පසත්‍ථා - චත්තාරි එතානි යුගානි හොන්ති
තෙ දක්ඛිණෙය්‍යා සුගතස්ස සාවකා - එතෙසු දින්නානි මහප්ඵලානි
ඉදම්පි සංඝෙ රතනං පණීතං - එතෙන සච්චෙන සුවත්ථි හොතු

(i) මෙයින් තුන්දොස් හිරකරපු රෝගවලට දෙහි මතුරා කපනු.

(ii) තැඹිලි කස පැනට 108 වරක් මතුරා බොනු. ශ්‍රීයා වැඩෙයි. භය දුරුවෙයි. සතුරෝ නැතිවෙති.

(iii) අනුන් හා යුක්ති බණන විට සිහිකර බණනු. දිනයි.

(iv) රජුන් දැකීමට 108 වරක් තැඹිලි තෙල් මතුරා ගානු.

7. යෙ සුප්පයුත්තා මනසා දළ්හෙන - නික්කාමිනො, ගොතම සාසනම්හි
තෙ පත්ති පත්තා අමතං විගය්හ - ලද්ධා මුධා නිබ්බුතිං, භුඤ්ජමානා
ඉදම්පි සංඝෙ රතනං, පණීතං - එතෙන සච්චෙන සුවත්ථි හොතු

(i) මෙයින් සහල් ගැරූ තැනකින් ගල්කැට 7 ක් ගෙන එක එක ගලට 7 වර බැගින් මතුරා ගෙහි සතර කොණේ ද, ගේ මැද ද, ඉස්දොර පාමුල ද තබනු, තමාගේ රහස් ද, රහසේ තැබූ බඩු ද එළි නොවේ.

(ii) කුරුම්බියන් කෑ පත්‍රයක මෙය ලියා 108 වරක් පිරිත් කර තමන්ගේ ඉන තබා ගනු, වසංගත නො වදියි.

8. යථින්දඛීලො පඨවිංසිතොසියා - චතුබ්භි වාතෙහි අසම්පකම්පියො
තථූපමං සප්පුරිසං වදාමි - යො අරියසච්චානි අවෙච්ච පස්සති
ඉදම්පි සංඝෙ රතනං පණීතං - එතෙන සච්චෙන සුවත්ථි හොතු

Non-Commercial Distribution

(i) මෙයින් 108 වරක් බෝමැඩක දී සමන් මල් මතුරා චෛත්‍යයට පුදා දෙවියන්ගෙන් ආරක්‍ෂාව පතා සතුරන් මැදට යනු. මිතුරු වේ.

(ii) කුළු හරකුන්ගේ භයට ද ලියා පේකොට අත තබා යනු. උපද්‍රවයක් නො වේ.

9. යෙ අරියසච්චානි විභාවයන්ති - ගම්භීරපඤ්ඤෙන සුදෙසිතානි
කිඤ්චාපි තෙ හොන්ති භුසප්පමත්තා - න තෙ භවං අට්ඨමං ආදියන්ති
ඉදම්පි සංඝෙ රතනං පණීතං - එතෙන සච්චෙන සුවත්ථි හොතු.

(i) මෙයින් මීතෙලට 108 වරක් මතුරා ඇඟ ගානු. ශ්‍රීයා ඇතිවේ.

(ii) යක්ෂ, ප්‍රේත භය හා තමන්ට වෙනත් යම් භයක් ඇති වූ විට මේ ගාථාවෙන් පිරිත් කරනු. ඒ භය දුරුවෙයි. නපුරක් වන විට සඳුන් මතුරා තිලක තබනු.

(iii) බෝවෙන රෝගවලින් වැළකීමට කොටි තෙලට 108 වරක් මතුරා ළඟ තබා ගනු.

10. සහාවස්සදස්සන සම්පදාය - තයස්සු ධම්මා ජහිතා භවන්ති
සක්කාය දිට්ඨි විචිකිච්ඡිතඤ්ච - සීලබ්බතංවාපි යදත්ථි කිඤ්චි
චතූහ' පායෙහි ච විප්පමුත්තො - ඡචාභිඨානානි අභබ්බොකාතුං
ඉදම්පි සංඝෙ රතනං පණීතං - එතෙන සච්චෙන සුවත්ථි හොතු.

(i) මෙයින් 108 වරක් තෙල් මතුරා කකුලේ ගා ගමන් යනු. වේදනාවක් නො දැනෙයි. පහසුවෙන් ගමන් කළ හැකියි.

11. කිඤ්චාපි සො කම්මං කරොති පාපකං - කායෙන වාචා උදාචෙත සාවා
අභබ්බො සො තස්ස පටිච්ඡාදාය - අභබ්බ තා දිට්ඨ පදස්ස වුත්තා
ඉදම්පි සංඝෙ රතනං පණීතං - එතෙන සච්චෙන සුවත්ථි හොතු.

(i) මේ ගාථාව කියා කුඹුර සී සානු, ඌරෝ නොකත්. සොරුන්ගෙන් උපද්‍රව නොවේ.

(ii) මෙයින් බෙහෙත්වලට මතුරා දෙනු, සියලු ආරක්‍ෂාවට යහපති. සිහිකරනු.

12. වනප්ප ගුම්බෙ යථා ඵුස්සිතග්ගෙ - ගිම්හාන මාසෙ පඨමස්මිං ගිම්හෙ
තථූපමං ධම්මවරං අදෙසයි - නිබ්බාන ගාමිං පරමං හිතාය
ඉදම්පි බුද්ධෙ රතනං පණීතං - එතෙන සච්චෙන සුවත්ථි හොතු.

(i) මෙයින් 108 වරක් පැන් මතුරා පොවනු. ගර්භණීහු වහා ප්‍රසූත කෙරෙත්.

(ii) වී වලට 108 වරක් මතුරා වපුරනු, අස්වැන්න වැඩි වෙයි.

(iii) තෙලට 108 වරක් මතුරා දල්වනු, ශ්‍රියාව ඇතිවේ. අමනුෂ්‍ය දෝෂ දුරුවෙයි.

(iv) බෙහෙත් දෙන විට මතුරා දෙනු, සුව වේ.

13. වරො වරඤ්ඤූ වරදො වරාහරො - අනුත්තරො ධම්ම වරං අදෙසයි.
ඉදම්පි බුද්ධෙ රතනං පණීතං - එතෙන සච්චෙන සුවත්ථි හොතු

(i) මේ ගාථාවෙන් 108 වරක් වතුර මතුරා ඉසිනු. ඉපියන්, මීයන් ආදී සතුන්ගේ උපද්‍රව නැති වෙයි.

(ii) පැනට පිරිත් කොට ළදරුවන් නාවනු. උපද්‍රව දුරුවේ.

(iii) තැඹිලි තෙල් 108 වරක් මතුරා ගා යනු, නඩු දිනත්.

Non-Commercial Distribution

(iv) සිරුරේ ගඩු ඇති විට අතට 108 වරක් මතුරා පිරිමදිනු, සුවවේ.

14. ඛීණංපුරාණං නවං නත්ථිසම්භවං - විරත්ත චිත්තා ආයතිකෙ භවස්මිං
තෙ ඛීණ බීජා අවිරුළ්හිච්ඡන්දා - නිබ්බන්ති ධීරා යථා යම්පදීපො
ඉදම්පි සංඝෙ රතනං පණීතං - එතෙන සච්චෙන සුවත්ථි හොතු.

(i) මෙයින් පිස්සු බල්ලන් කෑවාට 108 වරක් තෙල් මතුරා ගානු.

(ii) මෙයින් පිරිත් පැන් ගෙයි ඉසිනු. උපද්‍රව දුරුවේ.

(iii) මෙයින් පිරිත් කොට හරක් ගාලට ගත් කල සියලු උවදුරු දුරුවී ගවයෝ බෝවෙත්.

(iv) ළදරුවන්ට රන්කිරි කට ගෑමේදී කිරට මතුරනු.

(v) ඉඳුල් කැවීමේදී තෙල් මතුරා දෙනු.

15. යානිධ භූතානි සමාගතානි - භුම්මා නිවා යා නිව අන්තලික්ඛෙ
තථාගතං දෙව මනුස්ස පූජිතං - බුද්ධං නමස්සාම සුවත්ථි හොතු.
යානීධ භූතානි - පෙ - ධම්මං නමස්සාම සුවත්ථි හොතු.
යානීධ භූතානි - පෙ - සංඝං නමස්සාම සුවත්ථි හොතු.

(i) මෙයින් මීමැස්මොරට 108 වරක් තැඹිලි වතුර මතුරා සතියක් බොන්ට දෙනු.

(ii) සියලු ආරක්ෂාවට නිතර සිහි කරනු.

# III
# කරණීය මෙත්ත සූත්‍රයෙන් කළ හැකි හාස්කම්

1. යස්සානුභාවතො යක්ඛා - නෙව දස්සෙන්ති භිංසනං
යම්හිචෙවානු යුඤ්ජන්තො - රත්තින්දිව මතන්දිතො
සුඛං සුපති සුත්තොච - පාපං කිඤ්චි න පස්සති
එවමාදි ගුණොපෙතං - පරිත්තං තං භණාමහෙ

(i) පොල්ගස් කුරුම්ණියන් කනවාට ලියා ගසේ තබනු.

(ii) වී පෙට්ටිවලට තල් කොලේ ලියා දමනු.

2. කරණීය මත්ථ කුසලෙන - පෙ - සුවචො චස්ස මුදු අනතිමානි
සන්තුස්සකො ච සුභරො ච - පෙ - අප්පගබ්භො කුලෙසු අනනුගිද්ධො
නච ඛුද්ධං සමාචරෙ කිඤ්චි - පෙ - සබ්බෙ සත්තා භවන්තු සුඛිතත්තා

(i) මීයන් කනවාට මේ ගාථා ලියා දෙකොනේ තබනු.

(ii) උඳුගොව්වා කනවාට මීතෙල් මතුරා ගානු.

3. යෙ කෙචි පාණ භූතත්ථි - පෙ - මජ්ඣිමාරස්සකානුකථූලා
දිට්ඨා වා යෙව අද්දිට්ඨා - පෙ - සබ්බෙ සත්තා භවන්තු සුඛිතත්තා

(i) මෙය මැස්සන් බොනවාට ලියා එල්ලනු.

Non-Commercial Distribution

4. මාතා යථා නියං පුත්තං - පෙ - මානසම්භාවයෙ අපරිමාණං
මෙත්තං ච සබ්බ ලොකස්මිං - පෙ - අසම්බාධං අවෙරං අසපත්තං
තිට්ඨං චරං නිසින්නො වා - පෙ - බ්‍රහ්මමෙතං විහාරං ඉධමාහු

(i) මේ ගාථා තුනේ මුලකුරු තුන බුලතේ ලියා මෙයින් 108 වරක් මතුරා කන්ට දෙනු, ප්‍රසූත කරත්.

5. දිට්ඨිඤ්ච අනුපගම්ම සීලවා - පෙ - පුනරෙතීති

(i) මෙයින් ගල් මතුරා පට්ටියේ වළලනු. ගවයෝ බෝවෙත්.

(ii) කමතේ මුදුන් කණුව ළඟ ගල් මතුරා වළලනු, අස්වැන්න වැඩිවෙයි.

# IV
# කඳ පිරිතෙන් කළ හැකි හාස්කම්

1. සබ්බාසිවිස ජාතීනං - දිබ්බ මන්තා ගදංවිය
යං නාසෙසි විසං සොරං - යෙ සඤ්චාපි පරිස්සයං
ආණක්ඛෙත්තම්හි සබ්බත්ථ - සබ්බදා සබ්බ පාණීනං
සබ්බසොපි විනාසෙති - පරිත්තං තං භාණාමහෙ

(i) මෙයින් සර්ප විෂට 108 වරක් දෙහි අත්තෙන් මතුරනු.

(ii) බලු විෂට 108 වරක් මුරුංගා පොතු යුෂට මතුරා ගානු.

2. විරූපක්ඛෙහි මෙ මෙත්තං - පෙ - මෙත්තං කණ්හාගොතම කෙහි ච
අපාදකෙහි මෙ මෙත්තං - පෙ - මෙත්තං බහුප්පදෙහි මෙ

(i) මෙයින් වෙඩි වැළැක්වීමට සිහිකර සුණු මතුරා අත උඩ ගානු.

3. මා මං දීපදකො හිංසි - පෙ - මා මං හිංසි බහුප්පදො
සබ්බෙ සත්තා - පෙ - මාකඤ්චි පාපමාගමා
අප්පමාණො බුද්ධො අප්පමාණො ධම්මො අප්පමාණො සංඝො
පමාණ වන්තානි සිරිංසපානි අහිවිච්ඡිකා සතපදී උණ්ණා නාභි.

(i) මෙයින් පොල් මුල් වේයන් කනවාට ලියා ගසේ එල්ලනු.

4. සරබූ මූසිකා කතා මෙ රක්ඛා කතා මෙ පරිත්තා
පටික්ක මන්තු භූතානි සොහං නමො භගවතො
නමො සත්තන්තං සම්මා සම්බුද්ධා නන්ති.

(i) මෙයින් 108 වරක් මතුරා වසංගත, බෝවෙන රෝගවලට රසදිය අත බඳිනු.

# V
# මෝර පිරිතේ හාස්කම්

1. පූරෙන්තො බොධි සම්භාරෙ - නිබ්බත්තො මොරයොනියං
යෙන සංවිහිතාරක්ඛා - මහාසත්තං වනෙචරං
චිරස්සං වාය මන්තාපි - නෙව සක්ඛිංසු ගණ්හිතුං
බ්‍රහ්ම මන්තන්ති අක්ඛාතං - පරිත්තං තං භණාමහෙ

Non-Commercial Distribution

(i) මීයන් ගෙවල් හාරනවාට කොළයක ලියා ගෙ මැද වළලනු, ඊට උඩින් නො නිදනු.

2. උදෙතයං - පෙ - ඉමං සො පරිත්තං කත්‍වා මොරො චරති එසනා

(i) මේ ගාථාව යන්ත්‍රයක් මෙන් ලියා 108 වරක් මතුරා රක්තශ්‍රාවයට ඉනේ බඳිනු.

3. අපෙතයං - පෙ - ඉමං සො පරිත්තං කත්‍වා මොරො වාසමකප්පයීති.

(i) මෙයින් ඇවිලිල්ලට 108 වරක් මතුරා තෙල් ගානු.

# VI
# ධජග්ග සූත්‍රයේ හාස්කම්

1. යස්සානුස්සරණෙනාපි - අන්තලික්ඛෙපි පාණිනො
පතිට්ඨමධි ගච්ඡන්ති - භූමියං විය සබ්බථා
සබ්බූපද්දව ජාලම්හා - යක්ඛ චොරාරී සම්භවා
ගණනා නච මුත්තානං - පරිත්තං තං භණාමහෙ

(i) මේ ගාථාව ලියා බඩුවල තබනු. හොරු නොගනිති.

2. එවං මෙසුතං එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවන අනාථ පිණ්ඩිකස්ස ආරාමෙ, තත්‍ර ඛො භගවා භික්ඛු ආමන්තෙසි භික්ඛවොති භදන්තෙති, තෙ භික්ඛු භගවතො පච්චස්සොසුං, භගවා එතදවොච භූත පුබ්බං භික්ඛවෙ දෙවාසුර සංගාමො සමූපබ්බූල්හො අහොසි, අථ ඛො භික්ඛවෙ සක්කො දෙවානමින්දො දෙවෙ තාවතිංසෙ ආමන්තෙසි.

(i) මෙයින් මතුරා කකුලට කෙළ ගසා යනු. සර්පයෝ නොකත්.

3. සචෙ මාරිසා දෙවානං සංගාමගතානං උප්පජ්ජෙය්‍ය භයං වා ඡම්භිතත්තං වා ලොමහංසො වා මමෙව තස්මිං සමයෙ ධජග්ගං උල්ලොකෙය්‍යාථ මමංහි වො ධජග්ගං උල්ලොකයතං යං භවිස්සති භයං වා ඡම්භිතත්තං වා ලොමහංසො වා පහීයිස්සති. නො චෙ මෙ ධජග්ගං උල්ලොකෙය්‍යාථ අථ පජාපතිස්ස දෙවරාජස්ස ධජග්ගං උල්ලොකෙය්‍යාථ පජාපතිස්ස හිවො දෙවරාජස්ස ධජග්ගං, උල්ලොකයතං යං භවිස්සති භයං වා ඡම්භිතත්තං වා ලොමහංසො වා සො පහීයිස්සති, නො චෙ පජාපතිස්ස දෙවාරාජස්ස ධජග්ගං උල්ලොකෙය්‍යාථ අථ වරුණස්ස දෙවරාජස්ස ධජග්ගං උල්ලොකෙය්‍යාථ වරුණස්ස හිවො දෙවාරාජස්ස ධජග්ගං උල්ලොකයතං යං භවිස්සති භයං වා ඡම්භිතත්තං වා ලොමහංසො වා සො පහීයිස්සති. නො චෙ වරුණස්ස දෙවාරාජස්ස ධජග්ගං උල්ලොකෙය්‍යාථ අථ ඊසානස්ස දෙවාරාජස්ස ධජග්ගං උල්ලොකෙය්‍යාථ ඊසානස්ස හිවො දෙවරාජස්ස ධජග්ගං උල්ලොකෙයතං යං භවිස්සති භයං වා ඡම්භිතත්තං වා ලොමහංසො වා සො පහීයිස්සති.

(i) මෙයින් නූල් 7 පොටක් ගෙන ගැට 7 ක් ගසා 108 වර මතුරා අත බඳිනු, සන්නි දහඅට ගුණ වේ.

4. තං ඛො පන භික්ඛවෙ සක්කස්ස වා දෙවානමින්දස්ස ධජග්ගං උල්ලොකයතං, පජාපතිස්ස වා දෙවරාජස්ස ධජග්ගං උල්ලොකයතං, වරුණස්ස වා දෙවරාජස්ස ධජග්ගං උල්ලොකයතං, ඊසානස්ස වා දෙවරාජස්ස ධජග්ගං උල්ලොකයතං යං භවිස්සති, භයං වා ඡම්භිතත්තං වා ලොමහංසො වා සො පහීයෙථාපි නොපි පහීයෙථ. තං කිස්සහෙතු.

Non-Commercial Distribution

(i) මෙයින් කැමට මතුරා විරුද්ධ අයට කන්ට දෙනු මිතුරු වේ.

5. සක්කො භික්ඛවේ දෙවානමින්දො අවීත රාගො, අවීත දොසො, අවීත මොහො, භීරුච්ඡම්භි උත්‍රාසී පලායි අහං ච ඛො භික්ඛවේ එවං වදාමි. සචෙ තුම්හාකං භික්ඛවේ අරඤ්ඤගතානං වා රුක්ඛමූලගතානං වා සුඤ්ඤාගාරගතානං වා උප්පජ්ජෙය්‍ය භයං වා ඡම්භිතත්තං වා ලොමහංසො වා මමෙව තස්මිං සමයෙ අනුස්සරෙය්‍යාථ.

(i) මෙයින් හරක් වනවලට අලු මතුරා දමනු. පණුවෝ දුරු වෙත්.

6. "ඉතිපිසො භගවා අරහං .......... බුද්ධො" මමංහි වො භික්ඛවේ අනුස්සරතං යං භවිස්සති භයං වා ඡම්භිතත්තං වා ලොමහංසො වා සො පහීයිස්සති.

(i) මෙයින් තෙල් මතුරා ගා යනු, යුක්ති දිනත්. රාජ වශීයට ශුභයි.

7. නො චෙ මං අනුස්සරෙය්‍යාථ "ස්වාක්ඛාතො භගවතා ධම්මො - පෙ - වෙදිතබ්බො විඤ්ඤූහීති. ධම්මංහි වො භික්ඛවේ අනුස්සරතං යං භවිස්සති භයං වා ඡම්භිතත්තං වා ලොමහංසො වා සො පහීයිස්සති නො චෙ ධම්මං අනුස්සරෙය්‍යාථ අථ සංඝං අනුස්සරෙය්‍යාථ.

(i) සතුරන් දුටු තැන සිහි කරනු. මිතුරු වේ. සියලු වශීයට ද විශ්වාසයි.

8. "සුපටිපන්නො භගවතො සාවක සංඝො උජුපටිපන්නො භගවතො සාවක සංඝො ඤායපටිපන්නො භගවතො සාවක සංඝො - පෙ - පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සාති.

(i) හරකුන් ගේ කැම බැරිවීමට කැමට මතුරා දෙනු.

(ii) සියලු පළතුරු වර්ගවලට මෙයින් පැන් මතුරා ඉසිනු. සත්තු නොකත්.

9. "සංඝංහි වො භික්ඛවේ අනුස්සරතං යං භවිස්සති භයං වා ඡම්භිතත්තං වා ලොමහංසො වා සො පහීයිස්සති

(i) හරකුන් ගේ ගෙඩිවලට මෙයින් මතුරනු. සුවවේ.

10. "තං කිස්ස හේතු තථාගතො භික්ඛවේ අරහං සම්මා සම්බුද්ධො වීත රාගො වීත දොසො වීත මොහො අභීරු අච්ඡම්භි අනුත්‍රාසි අපලායි'ති අරඤ්ඤෙ රුක්ඛමූලෙ වා, සුඤ්ඤාගාරෙව භික්ඛවො අනුස්සරෙථ සම්බුද්ධං භයංතුම්හාක නොසියා නො චෙ බුද්ධං සරෙය්‍යාථ ලොක ජෙට්ඨං නරාසභං අථ ධම්මං සරෙය්‍යාථ නිය්‍යාණිකං සුදෙසිතං නො චෙ ධම්මං සරෙය්‍යාථ නිය්‍යාණිකං සුදෙසිතං අථ සංඝ සරෙය්‍යාථ පුඤ්ඤක්ඛෙත්තං අනුත්තරං එවං බුද්ධං සරන්තානං ධම්මං සංඝඤ්ච භික්ඛවො භයං වා ඡම්භිතත්තං වා ලොමහංසො න හෙස්සතීති.

(i) මෙය ලියා කුඹුරේ එල්ලනු. සත්තු නොකත්.

## VII
## ඇණවුම් පිරිතේ භාස්කම්

1. යෙ සන්තා සන්ත චිත්තා තිසරණ සරණා එත්ථ ලොකන්තරෙ වා භුම්මා භුම්මා ච දෙවා ගුණගණ ගහණබ්‍යාවටා සබ්බ කාලං

(i) බඩ රුජාවට මෙයින් 108 වරක් තෙල් මතුරා ගානු.

2. එතෙ ආයන්තු දෙවා වරකනකමයෙ මෙරුරාජෙ වසන්තො සන්තො සන්තො සහෙතුං මුනිවර වචනං සොතු මග්ගං සමග්ගං

Non-Commercial Distribution

(i) වමනයට මෙයින් 108 වරක් හුනු මතුරා ගානු.

3. සබ්බෙතං අනුමොදිත්වා සමග්ගා සාසනෙ රතා පමා ද රහිතා හොන්තු ආරක්ඛාසු විසෙසතො

(i) සියලු ගෙඩිවලට මෙයින් 108 වරක් මතුරනු, ගෙඩි ඉසිරේ.

4. සාසනස්ස ච ලොකස්ස වුද්ධි භවතු සබ්බදා
සාසනම්පි ච ලොකඤ් ච දෙවා රක්ඛන්තු සබ්බදා

(i) මෙයින් ගර්භණීන්ට වතුර මතුරා දෙනු. දරුවා බිහිවේ.

5. සද්ධිං හොන්තු සුඛී සබ්බෙ - පරිවාරෙහි අත්තනො
අනීඝා සුමනා හොන්තු - සහ සබ්බෙහි ඤාතිහී

(i) උළුක්කුවට මෙයින් තෙල් මතුරා ගා අදිනු.

6. රාජතො වා චොරතො වා මනුස්සතො වා අමනුස්සතො වා
අග්ගිතො වා උදකතො වා පිසාචතො වා, ඛාණුකතො වා
කණ්ටකතො වා නක්ඛත්තතො, ජනපද රොගතො වා

(i) මෙය සියලු යක්‍ෂ භයට සිහි කරනු.

7. අච්ඡතරච්ඡ සූකර මහිස යක්ඛ රක්ඛසාදීහි නානා භයතො වා
නානා රොගතො වා නානා උපද්දවතො වා ආරක්ඛං ගණ්හන්තු.

(i) මෙය සිහිනෙන් භය වෙනවාට සිහි කරනු.

(ii) තඹ තහඩුවක හෝ රිදී තහඩුවක යන්ත්‍රය වශයෙන් ලියා ආරක්‍ෂාවට අතේ බඳිනු.

8. පණිධානතො පට්ඨාය තථාගතස්ස දස පාරමියො
දස උපපාරමියො දස පරමත්‍ථ පරමියො.

(i) මෙයින් ඉස රදයට 108 වරක් මතුරා තෙල් ගානු.

(ii) බඩේ කැක්කුමට ඉඟුරු මතුරා කන්නට දෙනු.

9. පඤ්චමහා පරිච්චාගෙ තිස්සොචරියා පච්ඡිමභවේ ගම්භාවක්කන්තිං
ජාතිං අභිනික්ඛමණං පධාන චරියං බොධිපල්ලංකෙ මාර විජයං

(i) මෙයින් අනවින කැවුනාට ද, යක්ෂ අජීර්ණයට ද 108 වරක් පැන් මතුරා දෙනු.

10. සබ්බඤ්ඤුත ඤාණ පටිවෙධං නවලොකුත්තර ධම්මෙති සබ්බෙපිමෙ
බුද්ධගුණෙ ආවජ්ජිත්වා වෙසාලියා තිසු පාකාරන්තෙසු

(i) බල්ලන් බුරා එන විට සිහිකරනු.

11. තියාම රත්තිං පරිත්තං කරොන්තො ආයස්මා ආනන්ද ථෙරො විය
කාරුඤ්ඤ චිත්තං උපට්ඨපෙත්වා.

(i) මෙයින් කිඹුලන්ගෙන් අන්තරා නැති වීමට දියට ගල් මතුරා දමනු.

Non-Commercial Distribution

# VIII
# ආටානාටිය සූත්‍රයෙන් කළ හැකි හාස්කම්

1. අප්පසන්නෙහි නාථස්ස - සාසනෙ සාධු සම්මතෙ
අමනුස්සෙහි චණ්ඩෙහි - සදා කිබ්බිස කාරිහි
පරිසානං චතස්සන්නං - මහිංසාය ච ගුත්තියා
යං දෙසෙසි මහා වීරො - පරිත්තං තං භණාමහෙ

විපස්සිස්ස නමත්ථු - චක්ඛු මන්තස්ස සිරිමතො
සිඛිස්සපි නමත්ථු - සබ්බභූතානු කම්පිනො

(i) මෙයින් උළුක්කුවට, කොරයට 108 වරක් තෙල් මතුරා ගානු.

2. වෙස්සභුස්ස කමත්ථු - නහාතකස්ස තපස්සිනො
නමත්ථු කකුසන්ධස්ස - මාරසෙනා පමද්දිනො
කොණාගමනස්ස නමත්ථු - බ්‍රාහ්මණස්ස වුසීමතො
කස්සපස්ස නමත්ථු - විප්පමුත්තස්ස සබ්බධී
අංගීරසස්ස නමත්ථු - සක්‍ය පුත්තස්ස සිරීමතො
යො ඉමං ධම්මමදෙසෙසී - සබ්බ දුක්ඛා පනූදනං
එතෙචඤ්ඤෙච සම්බුද්ධා - අනෙක සතකොටියො
සබ්බෙ බුද්ධා අසමසමා - සබ්බෙ බුද්ධා මහිද්ධිකා

(i) මෙයින් ගෙඩි ගැට වෙන්ට 108 වර මතුරනු.

3. සබ්බෙ දස බලූපෙතා - වෙසාරජ්ජෙසුපාගතා
සබ්බෙ තෙ පටිජානන්ති - ආසභණ්ඨාන මුත්තමං
සීහනාදං නදන්තෙ තෙ - පරිසාසු විසාරදා
බ්‍රහ්ම චක්කං පවත්තෙන්ති - ලොකෙ අප්පතිවත්තියං
උපෙතා බුද්ධ ධම්මෙහී - අට්ඨාදසහි නායකා
ද්වත්තිංස ලක්ඛණූපෙතා - සීත්‍යානුබ්‍යඤ්ජනාධරා
ව්‍යාමප්ප භාය සුප්පභා - සබ්බෙ තෙ මුනිකුඤ්ජරා
බුද්ධා සබ්බඤ්ඤුනො එතෙ - සබ්බෙ ඛීණා සවා ජිනා

(i) මෙයින් වෙඩිසැර, හෙනසැර වදිනවාට මතුරා ආරක්ෂා කරනු.

4. මහප්පභා මහා තෙජා මහා පඤ්ඤා මහබ්බලා මහා කාරුණිකා ධීරා සබ්බෙසානං සුඛාවහා දීපංනාථා පතිට්ඨා ච තානා ලෙනා ච පාණිනං ගතී ච මහාස්සා සා හරණා ච හිතෙසිනො. සදෙවකස්ස ලොකස්ස සබ්බෙ එතෙ පරායනා, තෙසාහං සිරසා පාදෙ වන්දාමි පුරිසුත්මෙ, වචසා මනසාචෙව වන්දාමෙතෙ තථාගතෙ සයනෙ, ආසනෙ, ඨානෙ, ගමනේ චාපි සබ්බදා, සදා සුඛෙන රක්ඛන්තු බුද්ධා සන්තිකරා තුවං, තෙහි ත්වං රක්ඛිතො සන්තො මුත්තො සබ්බ භයෙන ච, සබ්බ රොගො විනිම්මුත්තො සබ්බ සන්තාප වජ්ජිතො සබ්බ වෙරමතික්කන්තො නිබ්බුතො ච තුවංභව, සබ්බීතියො විවජ්ජන්තු සබ්බ රොගො විනස්සතු මා තෙ භවත්වන්තරායො සුඛීදීඝායුකො භව, අභිවාදන සීලිස්ස නිච්චං වද්ධාපචායිනො, චත්තාරො ධම්මා වඩ්ඪන්ති ආයුවණ්ණො සුඛං බලන්ති.

Non-Commercial Distribution

(i) මෙයින් තෙල් මතුරා පොර පොල් ගෙඩියේ ගා යවනු, දිනත්.

(ii) තැඹිලි තෙල් 108 වර මතුරා නළලේ ගා යනු, යුක්ති දිනත්.

# IX
# අංගුලිමාල පිරිතේ හාස්කම්

1. පරිත්තං යං භණන්තස්ස - නිසින්නට්ඨාන ධොවනං
උදකම්පි විනාසෙසි - සබ්බ මෙව පරිස්ස යං
සොත්ථිනාගබ්භ වුට්ඨානං - යඤ්ච සාධෙති තං ඛණෙ
ථෙරස්සංගුලිමාලස්ස - ලොක නාථෙන භාසිතං
කප්පට්ඨා යි මහාතෙජං - පරිත්තං තං භණාමහෙ

යතො'හං භගිනි අරියාය - ජාතියා ජාතො නාභිජානාමි
සඤ්චිච්ච පාණං ජීවිතා - වොරොපෙතා
තෙන සච්චෙන සොත්ථිතෙ හොතු සොත්ථි ගබ්භස්සාති

(i) මෙයින් තැඹිලි පැන් මතුරා බොන්ට දෙනු. තෙල් මතුරා බඩේ ගානු.

# X
# බොජ්ඣඞ්ග පිරිතේ හාස්කම්

1. බොජ්ඣඞ්ගා සතිසංඛාතො - ධම්මාන විචයො තථා
වීරියං පීති පස්සද්ධි - බොජ්ඣඞ්ගා ච තථාපරෙ
සමාධ්‍යුපෙක්ඛ බොජ්ඣඞ්ගා - සත්තෙ සම්බුද්ධදස්සිනා
මුනිනා සම්මදක්ඛාතා - භාවිතා බහුලීකතා
සංවත්තන්ති අභිඤ්ඤාය - නිබ්බානාය ච බොධියා
එතෙන සච්ච වජ්ජෙන - සොත්ථි තෙ හොතු සබ්බදා

(i) මෙය ලියා මෙයින් මතුරා පලේ යට කරනු. වෙයො නොකත්.

2. එකස්මිං සමයෙ නාථො - මොග්ගල්ලානඤ්ච කස්සප
ගිලානෙ දුක්ඛිතෙ දිස්වා - බොජ්ඣංගං තස්ස දෙසයි
තෙච නං අභිනන්දිත්වා - රොගා මුත්තිංසු තං ඛණෙ
එතෙන සච්ච වජ්ජෙන - සොත්ථි තෙ හොතු සබ්බදා

එකදා ධම්ම රාජා - ගෙලඤ්ඤෙහි පීළිතො
චුන්දත්ථෙරෙන තං යෙව - භණාපෙත්වාන සාදරං
සම්මොදිත්වා ච ආබාධා - තම්හා වුට්ඨාසි ඨානසො
එතෙන සච්ච වජ්ජෙන - සොත්ථි තෙ හොතු සබ්බදා

පහීණා තෙච ආබාධා - තින්නන්නම්පි මහෙසිනං
මග්ග හත කිලෙසා ච - පත්තානුප්පත්ති ධම්මතා
එතෙන සච්ච වජ්ජෙන - සොත්ථි තෙ හොතු සබ්බදා

Non-Commercial Distribution

යංදුන්නි මිත්තං - පෙ - බුද්ධානුභාවෙන විනාසමෙන්තු
යංදුන්නි මිත්තං - පෙ - ධම්මානුභාවෙන විනාසමෙන්තු
යංදුන්නි මිත්තං - පෙ - සංඝානුභාවෙන විනාස මෙන්තු

දුක්ඛප්පත්තා ච නිද්දුක්ඛා - භයප්පත්තා ච නිබ්භයා
සොකප්පත්තා ච නිස්සොකා - හොන්තු සබ්බෙපි පාණිනො

එත්තාවතා ච අම්හෙහි - සම්භතං පුඤ්ඤ සම්පදං
සබ්බෙ දෙවානුමොදන්තු - සබ්බ සම්පත්ති සිද්ධියා

දානං දදන්තු සද්ධාය - සීලං රක්ඛන්තු සබ්බදා
භාවනාභිරතා හොන්තු - ගච්ඡන්තු දෙවතා ගතා

සබ්බෙ බුද්ධා බලප්පත්තා - පච්චෙකානං ච යං බලං
අරහන්තානඤ්ච තෙජෙන - රක්ඛං බන්ධාමි සබ්බසො

(i) මෙයින් සියලු යක්ෂ භයට ද, ලෙඩට ද පිරිත් කර නූල් බඳිනු.

(ii) ඇස්වහට නො ඉඳුල් පැන් මතුරනු.

# XI
# රන්දෙණේ ගාථාවලින් කළ හැකි හාස්කම්

1. සබ්බ සංඛත ධම්මෙසු - ඔත්තප්පාකාර සණ්ඨිතං
ඤාණමොහිත භාරානං - ධම්ම සංවෙග සඤ්ඤුතා

ඕං තස්ස විරෙණ භගො දෙවස්සිය දෙව මහා චතුර් වෙද
මූලස්ස භවිසානාය ඕං නමො නමඃ (රන්දෙන විවෘත වූ ගාථාවත් සමග යි).

(i) මෙයින් ගර්භණීන්ට දෙහි කපනු. තෙල් මතුරනු. මෙයින් පොල් ගෙඩියක් ගෙන පේ කොට මතුරා එළිපතට තබා බඳිනු. ප්‍රසූත කරත්.

(ii) සර්ප විෂට ද, කටු උගුරේ ඇණුනාට ද වතුර මතුරා පොවනු.

(iii) එළකටරොළු ඉස්ම අතේ ගා 108 වර මතුරා දොරට අත ගසනු. දොර ඇරේ. (සීලයෙහි පිහිටා මේවා කරනු.)

2. සස්සිරික තරො නාථො - කෙතුමාලාය ලංකතො
දක්ඛිණාවත්ත කෙසොසී - නීලා මල සිරොරුහො
නමො ශ්‍රී ගති ශ්‍රී වාං ශ්‍රී බුද්ධරාජෙ ස්වාහඃ (රන්දෙන වැහුණු ගාථාවත් සමගයි).

(i) මෙයින් ත්‍රිවිධ වශියට නැඹුල් බුලත් මතුරා දෙනු. සර්ප විෂට මතුරනු. කකුල් දෙකට මතුරනු. සර්පයෝ නොකත්.

(ii) බල්ලා කෑවාට තෙල් මතුරනු.

(iii) උණට ද බඩ රුජාවට ද මතුරනු.

Non-Commercial Distribution

3. උණ්හීස සීසො රුචිරො - පරිපුණ්ණ සිරො වරො
අනො ලොකිය මුද්ධාසි - සුගන්ධවර මුද්ධනො

(i) මෙයින් විෂ කැවුණාට ද, තුන්දොස් බැඳුන්වලට ද, මස්වැලකුම් හිර කෙරුම් යනාදී කැපීමට ද හොඳයි. යකුන් ආරූඪ වූ අයට මතුරා පිඹිනු. වැටේ.

4. උණ්හීස රුචිරොදාර - ලලාටතල සොභිතො
මුදුතුලානි හොදාත - උණ්ණා මණ්ඩල මණ්ඩිතො
නමො රාජගුරු, සුරගුරු බොධි මණ්ඩලෙස්වාහඃ
(ධාතු මංගල්‍ය පැවැත් වූ ගාථාවත් සමගයි.)

(i) මෙයින් නැට්ටුවාට ප්‍රලය නොවන්නට වීදියේ ගොක් කොළයකට මතුරා ගැට ගසනු.

(ii) වස්තු පෙට්ටිවල දැමීමට ද, වී අටුවල දැමීමට ද, දරුවන් දොරට වැඩීමට ද දරුවනට ඉඳුල් කට ගැමට ද යහපති.

5. ඉන්දවාපනී හොනිල - භූතටාක සුසජ්ජිතො
කඤ්චනංකුසගංකාස - තුංග නාසො විරොචති

(i) වස විස කැවුනාට බත්පිඩු මතුරා ගිලිනු.

(ii) යක්ෂ දෝෂ මූර්ඡාවට පැන් මතුරා ඉසිනු.

(iii) අංගම් පිල්ලි යක්‍ෂ දිෂ්ටි හොල්මන්වලට පැන් මතුරා ඉසිනු.

(iv) උළුක්කුවට තෙල් කිරි මතුරනු. සර්ප විෂට මතුරනු.

(v) අජීර්ණයට ඇඹුල් මතුරනු.

6. ලොචනද්වය මාභාති - පඤ්චවණ්ණ සමුජ්ජලං
දෙහදෙව විමානම්හි - මණීජාලූප මුත්තමං
ඕං කුරු කුරු දලෙස්වාහඃ (ගාථාවත් සමගයි).

(i) මෙයින් වස් දොස් දුරු කිරීමට ද, සියලු භය, උන්මාද, අපස්මාර, අතීසාර, බඩේ රුජාදියට ද බෙහෙත් පැන් මතුරා පොවනු.

7. රංසිමාල නමො තුය්හං - බුද්ධ සෙනාධි පඤ්ජරං
එවං තං බුද්ධ ජානාථ - බුද්ධංදස විලොචන
තවසාරි ච සොගතං - උණ්හයරිව නිබ්බුතිං
සුවණ්ණතො පතිනං නාග - කොහිංසි යාය නායකා.
ඕං කුරු කුරු ඒස්වාහඃ ඕං නමො ශ්‍රී ඒස්වාහඃ
(රංසිමාල යන ගාථා සියල්ලට ම ඇතුළත් ගාථාවයි).

(i) මෙයින් ගල් මතුරා කෙතට දමනු. ආරක්ෂායි. එසේ ම පට්ටියේ වළලනු, ගවයෝ බෝවෙත්. දිවියා නාල්ලයි. ගැට හිර කපනු. මෙයින් තීන්දු ක්‍රියා කරනු.

Non-Commercial Distribution

උපග්‍රන්ථය IV

## ලිත කීම

ශ්‍රී බුද්ධ වර්ෂයෙන් දෙදහස් තුන්සිය පසක් වූ වෙසක් මස පුර බදාදා පුසේ නැකත තිස්නවය යි, කාල යි, සැටවක පණස් එක යි, මුක්කාල යි, කාලේ අරික්කාල යි.[1]

(ලිත කියන විට එදිනට ගැලපෙන සේ වර්ෂ - මාස - පක්ෂ - දින - නැකැත් - තිථි යෙදිය යුතුයි.)

## විහාර අස්න

.................. මස .................. වක් පිරි ...................... වක නම් තිථිය ලත් ................. මෙ දවසැ ...................... බද .................. දේවාලයට ....................... දිසාභාගයෙහි වූ .................. විහාරාභ්‍යන්තරයෙහි ....................... බොහෝ ධාතුවරුන් වහන්සේ වඩා මහාසංඝයා වහන්සේත් රැස් වැ පෙරයම් රාත්‍රියෙහි බණ සමහර කරන තැනට-

සගම පස්ගම අරත්තන මාදන්වල විල්වල කඩදොර මොරපාය දිඹුල පුසුල්පිටිය **නියම්ගම්පාස්ථාන ය.**

වල්වාසගොඩ සැලව අරම මැදිලිය දිප්පිටිය බම්පනේ කාරියගම ගල්ලෑල්ල අලුත්නුවර පරණනුවර මාවෙල මාකඩවර හිඟුල **කප්පාගොඩ,**

පදීදොර උතුරාවල අම්බුලුගල දනගිරිගල වාගිරිගල ලෙනගල අලවතුර වතුර **මාකුරාව,**

කවුඩුගම බිසෝවෙල ඇදිගම අරන්දොර දොරවක බඩබඩවිට කොටගෙදර මදුරුපිටිය අත්තනගල්ල ඌරුවෙල ගොඩගෙදර **දොරණාගොඩ,**

යටවත්ත රාගම මීගමුව දඩගමුව දඹදෙණිය බෙලිගම නවගමුව බමුණුගම වට්ටාරම චතුදෙණිය පුහුරිය ගල්බඩගම කොල්ලූර ඔකඳපොළ උඩපොළ අල්ගම නවකෙළගමුව **ඇත්කඳ විහාර ය.**

කුරුණෑගල කුරුවෙණියාගල ආදාගල ඉබ්බාගල යක්දෙස්සාගල නාථගම සංවැල්ල වඩිකාව මලගණේ කබල්ලෑලෙන නියඳවනේ **නාගලවිහාර ය.**

රැස්වෙරුව තලන්ගමුව පෙරියකඩුව **දේවගිරි විහාර ය, සංගමු විහාර ය** උතුරුපව් විහාර ය බුජස්ලෙන යාන්ලෙන ජයකඩුලෙන සැගෑලෙන කුඹුරුලෙන රිදීලෙන රම්බඩගල්ල දෙල්විට විල්ගම අස්ගිරිය රුසීගම ඇම්බැක්ක මිලිලවානය **බම්බා විහාර ය.**

---

1. ශබ්දතුල්‍ය ශකාබ්දයෙහි වෘෂභ රවි අටභාගයට මේ පුරාතන යෙදීම ය. මෙම අනුසාරයෙන් සෙසු වර්ෂයන්හි ද යොදාගත යුතුයි.

Non-Commercial Distribution

රන්ගිරිදඹුල්ල සීගිරිය කලාවැව බලල්ලෑව අනුරාධපුරයෙහි **ශ්‍රී මහා බෝධින්වහන්සේ ය.**

ලෝවාමහාප්‍රාසදස්ථාන ය මිරිසවැටි විහාර ය අභයගිරි විහාර ය දෙනානකය භගිරිනකය රත්නමාලි චෛත්‍යය ථූපාරාම චෛත්‍යය මිහින්තලේ අටසැටලෙන නීතුපත්පාන සුරුළුමහමුනියාව මුන්නේස්සරම ඇත්තල මක්කම මන්නාරම මාන්තෝට්ටම පොම්පරප්පුව මල්විල දෙමළපට්ටනමෙහි නාගකෝවිල **කඳුරුගොඩ විහාර ය.**

තෙලිපොල මල්ලාගම මිනිවන්ගමු විහාරය තන්නිදිවයින අග්නිදිවයින නාගදිවයින පුවඟුදිවයින කාරදිවයින මොල්ලියාවල තිරිකුණාමලය විල්ගම්වෙහෙර තිස්සමහවෙහෙර ඉලන්දගොඩ කඳුරුකෝට්ටයෙහි ඇතුබදය ලංකාතිලකය ගඩලාදෙණිය විජයෝත්පාය **අභයගිරි විහාර ය,**

ජේතවන විහාරය කපිල විහාරය ඉසිපතනාරාමය කුසිනාරාරාමය පූර්වාරාමය දක්ෂිණාරාමය පශ්චිමාරාමය උත්තරාරාමය සළුම්ණිසෑය සිළුම්ණිසෑය දෙමළමහසෑය **පොළොන්නරු විහාර ය,**

සුළුන්නරු විහාරය සිතුල්පව් විහාරය ධනඤ්ජය විහාරය කුකුළුවා විහාරය දිඹුලාගල් විහාරය නබාවෙහෙර මියුඟුණා වෙහෙර සොරොන්නාතොට බදුලු වෙහෙර යුදඟණාපිටිය රුහුණුබද කතරගම උග්ගල් අලුත්නුවර තඹගමුව මුල්ගිරිය **ඹවාගිරි විහාර ය.**

දෙවිනුවයෙහි දිව්‍යරාජභවනය ඔත්පිළිමගෙය සිටිපිළිමගෙය ගල්ගණේ වැලිගම අග්‍රබෝධි විහාරය පරගොඩ විහාරය තොටගමුව විහාරය ගලපාත විහාරය බෝධිමලු විහාරය **වනවාස විහාර ය.**

බෙන්වෙහෙර බෙන්තොට කළුතොට සොරණ වීදාගම කොතලාවල රඹුක්කන **පානදුරේ දේවාල ය.**

බෙල්ලන්විල පැපිළියාන නාවින්න විජයාරාමය සුභද්‍රාරාමය ජයවර්ධන කෝට්ටයෙහි පිළිමගෙය ෂන්මුඛ දේවාලය කිත්සිරිමෙවන් කැළණිය රජමහ කැළණිය **විභීෂණ දේවාල ය.**

වැලිවිට බොල්ලෑගල සේවාගම දිසාපති නුගය කඩුදෙවොල බෝමිරිය සංවැල්ල කෙහෙල් බටුවාව **අතුරුගිරි විහාර ය,**

දෙණගමුව දෙල්ගමුව බටුගෙදර දෙණවක සපරගමුව ගිලිමලය සමන්තකූට පර්වතය දිවාගුහාව බල්ලාහෙල සිඳගල කළුගමුව **ගංගාතිලක විහාර ය,**

කුඹුල්ඔලුව අලුදෙණිය කොටකේදෙණිය ඉලුපැන්දෙණිය සේන්දෙණිය නිග්ගම්මන අරත්තන සන්තානාගොඩ වේගිරිය අම්බැක්ක ලංකාතිලකය වටදාගෙය ගඩලාදෙණිය ඇලිවෙල ගඟුල්දෙණිය උරුලෑවත්ත කොටබෝගොඩ රන්මුන්ගොඩ දෙල්දෙණිය මැණික්දිවෙල මොණරාගොඩ කොළුගල වල්ගම්පාය දන්තොට වතුර **සියඹලාගොඩ,**

දොඩම්වෙල දියකෙළිනාවෙල සූරියගොඩ කොබ්බෑකඩුව ගන්නොරුව කුළුගම්මන මාලගම්මන අත්තරගම මැදවෙල ගල්ලෑල්ල දොළපිල්ල අලවතුගොඩ කොහොන තිබ්බටුවාව ඇඹිල්ල විහාරය **ආලෝක විහාර ය.**

*Non-Commercial Distribution*

කුරුවාබෝගම්බර කඩුවෙල දුනුවිල ඇඹෙල නිත්තවෙල සිරිමල්වත්ත අමුණුගම ගංගාරාම විහාර ය,

සෙන්කඩගල අලුත් විහාරය පරණ විහාරය නාගවිමානය උපොසථාරාමය ශ්‍රී දංෂ්ට්‍රා දළදා මන්දිරය- ඇතුළු වූ සියලු විහාර දේවාලවල අධිගෘහිත දෙවිමහරජාණන් තමනුත් තමන් ගේ සහාය පිරිවර දෙවියනුත් සන්දෘෂ්ට - සම්භක්ත දෙවියනුත් උපවෙනෙහි දෙවියනුත්,

නොහැර කැඳවාගෙන මංගලසූත්‍රාදී බණ අසනු පිණිස ඊම, සමග මහා සංඝයා වහන්සේට අභිමතදෝ අභිමතදෝ අභිමතදෝ අභිමතයි අභිමතයි අභිමතයි - සමග මහා සංඝයාවහන්සේ සගැ වැ වදාළ මෙහෙවර සංඝාණත්තිය නූගුලුවා ඉයැයුතු-

## දේවාල තල්පත

ශ්‍රී බුද්ධ වර්ෂයෙන් දෙදාහස්තුන්සිය පසක් වූ වෙසක් මස පුර සැටවක් පිරි සතවක් නම් තිථිය ලත් බදාදා මෙදවස කටුපුළුලබද සෙන්කඩගල නාථ දේවාලයට දක්ෂිණ දිශාභාගයෙහි වූ පුෂ්පාරාම විහාරාභ්‍යන්තරයෙහි පෞෂථාගාරයට-

බොහෝ ධාතුවරුන් වහන්සේ වඩා මහා සංඝයා වහන්සේත් රැස්ව පෙරයම රාත්‍රියෙහි බණ සමහර කරන තැනටැ-

මේ දේවස්ථානයෙහි අධිගෘහිත දෙවිමහරජාණන් තමනුත් තමන්ගේ සහාය පිරිවර දෙවියනුත් සන්දෘෂ්ට-

සම්භක්ත දෙවියනුත් උපවෙනෙහි දෙවියනුත් නො හැර කැඳවා ගෙන මංගල සූත්‍රාදී බණ අසනු පිණිස ඊමැ-

සමග මහා සංඝයා වහන්සේ සඟ වැ වදාළ මෙහෙවර සංඝාණත්තිය නූගුළුවා ඉයැයුතු-

(පළමුවන පැත්තේ ටැ යන තුනට තුන්පෙළ නිමවනු. දෙවෙනි පැත්තේ මැ යන්නට කෙළින් තු යන්න ගෙන දෙපෙළ නිමවනු.)

අනුශාසකයන් වහන්සේ විසින් දොරකඩ අස්නයට මුලින් ම දේවදූතයා ගෙන් අසනු ලබන ප්‍රශ්න මෙසේ යිඃ

(1)

1. විචිත්‍රවර්ණෝපශෝභිත වූ මෙම මණ්ඩපද්වාරයෙහි මිනිස්සු ඇත. ?
2. ප්‍රවරතර සුරේන්ද්‍රාරාධනාවට ගියොත් අවු ද?
3. නෛකශ්‍රීන් විරාජමාන කමලායනෙන්ද්‍ර වෛශ්‍රවණාදී දෙවියොත් අවු ද?

Non-Commercial Distribution

(2)

1. විශුද්ධ ශ්‍රද්ධාවන්ත සුප්‍රතිෂ්ඨිතොත්තුංග නෛකාලංකාර සර්ජිත ප්‍රවරාතිසුන්දර සුරමන්දිර සිරි සන්නිභවර මෙම ධර්ම මණ්ඩප ද්වාරයෙහි මිනිස්සු ඇත.

2. විශුද්ධ ප්‍රාතිමොක්ෂ සීල සංසිද්ධ ප්‍රසිද්ධ ගුණප්‍රශස්ත මහාසංඝයා වහන්සේ සර්ජිත කොට කරවන ලද මෙම ධර්ම මණ්ඩපයට රැස්ව අනලස්ව කළ අස්න ගෙන පේව සිට සතියකින් දේවදූතයා යන නමින් බෝව සහපිරිවරින් දේවතාරාධනාවට ගියොත් අවු ය.

3. නෛකතෙජොබලවික්‍රම ප්‍රතාපාලංකෘත පබ්බතට්ඨක එලට්ඨක භූමට්ඨකාකාසට්ඨකා ද්‍යල්පෙශාක්‍ය මහේශාක්‍යාදීහු දෙසන දම් ශ්‍රවණ කර මෙසැම සුජනන් සැම දුක් දුරැර දමන මෙන් බැහැර කරගෙන යන ලෙස තමන් සපිරිවර දෙවියොත් අවු ය.

## දොරකඩ අස්න

සෞශීල්‍යාදී අමිතගුණ ගණාඪගයෙන් උපලක්ෂිත වූ, පින්වත් ස්වාමීන් වහන්ස! විචිත්‍ර වර්ණොපශොභිත වූ මෙම මණ්ඩපද්වාරයෙහි මිනිස්සු ඇති-

නෛකතෙජොබලපරාක්‍රම ප්‍රතාපාලංකෘත සුරේන්ද්‍රාරාධනාවට ගියා වූ දේවදූතයා වන මම මෙහි අවුත් සිටිනෙමි.

ස්වස්ති ශ්‍රීකර මනොරම්‍ය කනකගිරි ශෘඞ්ගතුඞ්ගාලඞ්කාර ලඞ්කා පුරප්‍රවරාධීශ්වර, වෛවස්වත මනුවංශ ශ්‍රී මහා සම්මත, මහාරාජාධිරාජොත්තම වරවංශාභිජාත ලක්ෂණසම්පූර්ණ මහීරක්ෂණ දක්ෂ ස්වර්ණවර සිංහාසනාරූඪ-

අඞ්ග වඞ්ග කලිඞ්ග තෙලිඞ්ග බඞ්ගාල පරඞ්ගි ඕලන්ද කර්ණාට ගුර්ජරාදී පරමණ්ඩලේශ්වර- ගජ තුරඟ කණක මණිභූෂණ දිව්‍යාම්බර ස්වර්ණ සිවිකාදී, නානාප්‍රකාර භාග ධෙයානීත- රාජබෘන්දනන්දිතොත්තුඞ්ග මකරතොරණ මහාද්වාර රාජිත, නිත්‍ය සත්‍ය ධර්ම ප්‍රවර්ධිත-

සුරරාජ සමභොග කරරාජ ඉවතෙජ ගිරිරාජ දෘඪවීර රිපුරාජ ගජහාර, කෘතභීත - මෘගරාජ නිභරාජ කවිභොජ නරධීර මහරාජ මනුරාජ කුලරාජ යසබීජ, භුවිචාප-නෘපදීප සරචාප ධරසූර බහුකොප රණචොර ජනතාප සකලාප සිබිවාහ උපමාන, සසිමාන- සිරිසාර ඝනසාර[1] නරලොක පුරන්දර, පරරාජ භයංකර වීරරාජ ජයංකර සිරිධාර භුජන්දර, භූලොක- පුරන්දර-දිනෙශ්වර කුලේශ්වර ගජෙශ්වර, හයෙශ්වර, රාජ පරමෙශ්වර වූ-

සකල ලොක දශදිශාභ්‍යන්තරයෙහි පතළා වූ, ඝන බහල රිපුතිමිර හරණනිකර විධ්වංසනය කිරීමෙන්-අරුණ තරුණ කිරණ ප්‍රභාමණ්ඩිත ප්‍රාදුර්භූත, සූර්‍ය්‍ය දිව්‍යරාජයා මෙන්-

ශ්‍රී ලඞ්කාද්වීපයෙහි නානාවිධ ශත්‍රු අන්ධකාර සන්දොහ දූරීභූත කෙරෙමින්, ලොකශාසනාභිවෘද්ධි වර්ධනය කිරීම සඳහා-ඉන්ද්‍රොපෙන්ද්‍ර චන්ද්‍රශෙඛර ප්‍රජාපත්‍යාදී, දිව්‍යරාජ සමූහයා විසින්-සකල පුණ්‍යසම්භාරයෙන් නිර්මිත කොට, සිතුමිණි රුවනක් මෙන් පහළ කරන ලද්දා වූ-

---

1. මේ ඉහත දැක්වූ පුරාතන ලිපියෙහි අනුසාරයෙන් වර්ෂ මාස පක්ෂ තිථි දින ප්‍රදේශ ස්ථාන නාමයන් ඒ ඒ තිසිසේ යොදාගත යුතුයි. මේ ලිපිය ඊට ආදර්ශ වේ.

Non-Commercial Distribution

අපගේ ද්වීපචක්‍රවර්ති ස්වාමීන් වහන්සේ ගේ, අඛිලලොක පූජිත ප්‍රශස්ත ශශිබිම්බ ප්‍රතිබද්ධ රශ්මිමාලා ස්වරූපානුලක්ෂණ ආඥාචක්‍රය පැවැත්තා වූ-මහීවරවධූසුලලිත ලලාටස්ථලාභ්‍යන්තර කොට ඇති, සුප්‍රතිෂ්ඨිත කර්ණ යුග්මයක් බඳු වූ-රුහුණු මායා පිහිටි රට ය යන ත්‍රිසිංහලාභ්‍යන්තරයෙන්, මායා රටට අන්තර්ගත වූ-[2]

මෙම පින්කමට ඇතුළත් දායක මූලික කාරකාදී, සකල ශ්‍රද්ධාවත්, සත්පුරුෂ ජනයන්ට අරිෂ්ට දර්ශනීය දිග්දාහ උල්කා රුධිරාම්බර, ධූමකේතු වක්‍රානුවක්‍ර ග්‍රහසට්ටන භූමිකම්පා-ගාන්ධර්වගීත පරිවෙශණ රක්තභානු ප්‍රාකාර ගොපුරද්වාර, පතනවෘක්ෂ වාපිවෙස්ට භෙද දිවා තුරඟ සූති නිසා කාකරව - පුච්ඡමණ්ඩුක ශ්වේත මණ්ඩුක දර්ශන මෘග නරප්‍රසූත ශ්වාන ශෘගාල, හෙකාර හොකාරාදි රව - අකාල පුෂ්පඵල කපොත උලූක, නාග මේස පක්ෂි ඇටිකුකුළු කොබෝ දෙබර ගෘහප්‍රවේශ - තෙල් වේ තුඹස් ගෙරිකුරු පහර ක්ෂුද්‍රස්ථූල මීබන්ධන, ඡදනාගමන සුනඛ බිළාල කලහ කාකමෛථුන දර්ශන නිසා ඉන්ද්‍රචාප - ශකුණගොචරග්‍රහණ පශ්වංග, වෛකෘති පාංශු වර්ෂණ භූම්‍යාරම්භ වනාරම්භ ගෘහාරම්භ ප්‍රාකාර බන්ධනාදියෙන් සඤ්ජාත වූ ද නොහොත්-

මෙම පිංකම කරවීමට ඇතුළත් දායක මූලික කාරකාදී, සකල ශ්‍රද්ධාවන්ත, සත්පුරුෂ ජනයන්ගේ - බාහ්‍යාභ්‍යන්තරොත්පන්න දුඃස්වප්න දුර්නිමිත්ත කලිකලහ, වෛකල්‍ය විග්‍රහ විවාදාදීන් වන්නා වූ - අෂ්ටාතිරෙක නවුති සංඛ්‍යාත රොගයෙන් හා නවාතිරෙක නවුති සංඛ්‍යාත ව්‍යාධියෙන් හා - සංවත්සර ඍතු පරිවර්තනොපක්‍රම ජන්ම නක්ෂත්‍රාධිපති ග්‍රහදූෂණාදී සකලාන්තරාය සර්වොපද්‍රව නිවාරණය කොට -

කීර්ති තාරහාර තුෂාර කහ්ලාර, ක්ෂීරස්ඵටික ක්ෂීරාර්ණවාකාර - අරුණාකර කිරණස්ඵුරණ, තරුණා රුණ ප්‍රවාලාංකුර ප්‍රවාලාර්ණවවර්ණ, සුරභි සුරතරු හදසට නවනිධීන් සාදෘශ්‍ය වූ, සකලෛශ්වර්යාභිවෘද්ධිවර්ධනය, කරන පිණිස - ධෘතරාෂ්ට්‍ර විරූඪ විරූපාක්ෂ වෛශ්‍රවණය යන සතරවරම් දෙවිමහ රජදරුවන් ඇතුළු වූ සෑම දෙවියෝ ම සහපිරිවරින් වැඩිසේක.-

දොරකඩ අස්න නිමි.

• • • • • • • • • • • • • • •

1. මංතසාර යනු ද ඇත.
2. මෙතනට පින්කම කරන ස්ථානයට යෝග්‍ය වූ ග්‍රාම විහාර නාමයන් යොදා කියනු.

Non-Commercial Distribution

# අනුශාසනාව

මෙතැන්හි රැස් වූ දෙවියන්ට පඬුරු පිණිස-

සුප්‍රතිපන්න ඍජු භාවාදී රක්ෂිත පොෂිත ශීලස්කන්ධ ගුණප්‍රතාපාලංකෘත - ශ්‍රී නිකෙත වරචාරුදෙහ ශ්‍රී සාරවිරාජිත දූරිකෘතාශෙෂ දොෂාන්ධකාරප්‍රකීර්ණ නෛකගුණගණානුභාවොත්පන්න මහා සංඝයා වහන්සේ-

ස්වර්ගමර්ත්‍යපාතාල සංඛ්‍යාත භුවනත්‍රයවාසී, සමස්ත සත්වහිතාභි වෘද්ධිය - පිණිස බාලජන සංසර්ග විරහිත වැ, අඛණ්ඩිතාචාර මණ්ඩිත පණ්ඩිත ජන භජන සෙවන පර්යුපාෂණ සම්භාෂණා දී වූ, අටතිසක් මංගල්‍ය කථාවන් - කරණකොට ගෙන අනල්ප කල්පොපචිත කුසලබල සමුද්භව දසබල චතුවෛශාරද්‍යඥනාදී ගුණ ගණ මණි මයූක - විසර විස්පුරිතාමිත, ධම්කාය සම්පත්තීන් විශුද්ධ වූ-

ත්‍රිභුවනෛකතිලක සකලඥෙයසාගරපාරගතානෙක ගුණරත්න මන්දිරාශෙෂ ජනවන්දනීය මකුටමණිමරිචිකදම්බචුම්බිත චරණනඛකිරණශ්‍රෙණීන් විරාජමාන වූ සම්‍යක් සම්බුද්ධ සර්වඥ රාජොත්තමයාණන් වහන්සේ විසින් - මධුමද මුදිත ලලිත රතිකර මනොහර කුරවීකනාද නිර්විශෙෂාෂ්ටාංගසමුපෙත, මධුර ස්වරයෙන් දෙශනා කරන ලද අඥනජන සංසර්ගාපගමාදී අෂ්ටොත්තර ත්‍රිංශත්ප්‍රභෙද මංගල ලක්ෂණයෙන් උපලක්ෂිත වූ ධම්මාර්ථදෙශනා ප්‍රතිවේධ ගම්භිර සුරමනුජ සුරාසුරොරග ශ්‍රවණ, ජනමන කර්ණ රසායනය වූ **- මේ මංගල සූත්‍රය ගණසජ්ඣායනා කොට එහි පින් අනුමෝදන් විය යුත්තේ ය.**

මෙම පින්කම කරවීමට දායක වූ ප්‍රධානාප්‍රධාන, සකල සත්පුරුෂ සාධුජනයන් විසින්, සත් දවසක් මුළුල්ලෙහි දූර්වාර සපරිවාර සොරමාරායතිහංකාර, නිර්වාපණෛකදක්ෂ යක්ෂ රාක්ෂස ගරුඬ ගන්ධර්ව සිද්ධ විද්‍යාධර, මෞලිමණිමාලාලංකෘත - අංඝ්‍රිපද්ම යුග්මයක් ඇති බුද්ධාදී රත්නත්‍රය විෂයෙහි පවත්වන ලද, දීපපූජා පුෂ්ප පූජා ධූපපූජා සුගන්ධ පූජා වන්දනමානනාදි සත්කාර කරණයෙන් ජනිත වූ **පින් අනුමෝදන් විය යුත්තේ ය.**

ශීල සමාධි ප්‍රඥ විමුක්ති විමුක්තිඥනාද්‍යනෙකගුණභූෂණ භූෂිතාශෙෂ, විෂධරොරග ගරුඬ ගණසදෘශ මාරවිරතිමිරනිධාන දිවාකරාකාර, චාරුතර ශ්‍රී සාර විරාජිත, ශ්‍රීඝන සකල ශාසනොදයකාරි ශාරිපුත්‍ර මෞද්ගල්‍යාන ස්ථවිරාන්වයාගත විශුද්ධ ප්‍රාතිමොක්ෂ සංවරශීල සංසිද්ධ ප්‍රසිද්ධ ගුණප්‍රශස්ත මහාසංඝයා වහන්සේ විෂයෙහි, පවත්වන ලද - ආවාසදාන, ආසනදාන ප්‍රත්‍යයදාන තාම්බූලදාන කර්පූරදාන අංජලිකම් සාමිචිකම්මා දියෙන් ජනිත වූ - **පින් අනුමෝදන් විය යුත්තේ ය.**

ශක්‍ර බ්‍රහ්ම විෂ්ණු මහේශ්වර සුයාම සන්තුෂිතාදී, කාමාවචර රූපාවචර දිව්‍යරාජයන් **විසින් ද, එහි පින් අනුමෝදන් විය යුත්තේ ය.**

නෛකවිධ මණිශිඛරවිනිර්ගත අමෘතකර කිරණනිභ හිමපටල ප්‍රකටිත, ශිශිර සීකර වාරි පූරිත නිර්ඣරාකුල ගිරි නිර්ඣර නීරධාරා ලංකෘත - මේරු යුගන්ධරෙෂධර කරවීක

Non-Commercial Distribution

සුදර්ශන නෙමින්ධර විනතකාශ්වකණී කෛලාස වින්ධ්‍යා ගන්ධමාදන මන්ථාවල මලයාදි, පර්වතස්ථායි දිව්‍ය සමූහයා විසින් ද, එහි පින් - පෙ -

අන්තරීක්ෂ විමානයෙහි වාසය කරන රවි චන්ද්‍ර කුජ බුධ ගුරු ශුක්‍ර ශනි රාහු කේතු ය යන නවග්‍රහයන් විසින් ද, එහි පින් - පෙ -

අස්විනාාදි සප්තවිංසති නක්ෂත්‍ර තාරකාවන්ට අධිපති වූ දෙව වෛදාාදී[1] සප්තවිංශති දේවතාවන් විසින් ද, එහි පින් - පෙ -

මේ ශ්‍රී ලංකාද්වීපයෙහි අධිගෘහිත බදිරදෙහලී වංශෝද්භූත උත්පලවණී සුමන කාර්තිකෙය විභීෂණ සංඛ්‍යාත, සතර දෙවාලයෙහි දෙවි මහාරජදරුවන් විසින් ද, එහි පින් - පෙ -

මහීවර වධූදර නාභිමණ්ඩලාකාර ප්‍රශස්ත, කජංගල සලලවතී ශ්වේතකර්ණික ථූන උසිරධවජාභිධාන පයඨන්ත පරිච්ඡේද නිමිත්තභූත නදී ග්‍රාම නිගම ප්‍රතිමණ්ඩිත, මධ්‍ය දේශයෙහි වූ - පාණ්ඩව ගිජ්ඣකූට ඉසිගිලි වෙභාර වෙපුල්ල පර්වතාදියෙහි අධිගෘහිත දේවතාවන් විසින් ද, එහි පින් - පෙ -

ඉන්ද්‍රසොමාග්නි නෛරුති වාරුණාාදි අෂ්ටදිග්පාලයන් විසින් ද, එහි පින් - පෙ -

ඉන්ද්‍ර සෝම වරුණ භාරද්වාජ ප්‍රජාපත්‍යාදි අෂ්ටවිංශති යක්ෂ සේනාධිපතීන් විසින් ද, එහි පින් - පෙ -

ආදිත්‍ය වසුවිද්වාදි ගණදෙවතාවන් විසින් ද, එහි පින් - පෙ -

පුෂ්පදන්තොර්වශ්‍ය කුවෙර මණිභද්‍රාදි භූතගණයා විසින් ද, එහි පින් - පෙ -

සියලු බොධිවෘක්ෂ චෛත්‍ය ප්‍රතිමාගෘහ ග්‍රාමාරාම විහාර නගරාරණ්‍ය තරුවන සරසරිත් සාගර විමානාදියෙහි අධිගෘහිත දේවතාවන් විසින් ද, එහි පින් - පෙ -

කර්ණාට ලලාට කාම්බෝජ කාශ්මීර කාම්පිල්ල හරිපුඤ්ජ නෙපාල සබර බර්බර ගුර්ජර චීන මහාචීන - ගන්ධාර ජලධාර මොධාර සිරිරට්ට කුරුරට්ට මහරට්ට වගුරට්ට සොතත්ත පුරතත්ත පත්තුන්න කල්‍යාණ තුරාණ මර්කටාන්ත කොටාන්ත මහා කොටාන්ත - ගයා භෘංග අංග තුංග තුරංග කංග කොංග කාලිංග තේලිංග ලාඩ ගෞඩ ද්‍රවිඩ ඔඩ්ඩි වඩිග පාරසි කෞශි උරුමුසි කාරල කෙරල නෙපාල මලයාල බංගාල - රොජ වරරොජ ප්‍රතිකාල් අරමණ මල්ලව තෝණ්ඩි පාඩි මණ්ඩල කාවේරි තායල සිල්ලමාදි[2] සර්වදේශාධිගෘහිත දේවතාවන් විසින් ද, එහි පින් - පෙ -

වටවිපට කිසලයාලිකෘතාන්ත න්‍යග්‍රොධාශ්වත්ථ වකුලපාටලාශොක, සරල ශාල සල්ලාකීලාශ නිකුම්භ නිම්බ ජම්බිර ජම්බු දුම්බර කදම්බාදි, තරුවන ගහණයෙහි අධිගෘහිත දේවතාවන් විසින් ද, එහි පින් - පෙ -

---

1. දෙවදෛත්‍යාදී යනු ශාස්ත්‍රොචිත නොවේ.
2. මෙහි සමහර දේශනාවයන්ගේ අශුද්ධතා හැඟෙතත් බොහෝ වෙනසක් විය හැකි හෙයින් එය වෙනස් නො කෙළෙමු.

Non-Commercial Distribution

ගංගා යමුනා සරස්වතී සින්ධු චන්ද්‍රභාගා භගීරථී නම්දාදී වූ ගංගාවන්හි, අධිගෘහිත දෙවතාවන් විසින් ද, එහි පින් - පෙ -

ප්‍රබල පවන බල ලුලිත නිතාන්ත සන්තතස්‍යන්දන වෙගවද් ඩිණ්ඩීර පිණ්ඩ මණ්ඩිත චණ්ඩිමග්‍රාහ ෂණ්ඩාඛණ්ඩ නිවසිත, මුඛරිත දිංමුඛ විද්‍යුත්ප්‍රාය කල්ලොලමාලා සමුල්ලසිත නිකට මුක්ත මුක්තා ප්‍රවාල උත්තුංග තරංගාභිරාම, චතුස්සාගර සංරක්ෂණයෙහි නියුක්ත ක්‍රමොන්නත නිම්බපත්‍රාකාර, භ්‍රෑයුග්මයකින් හා - භාව භාව ලීලාකටාක්ෂප්‍රෙමණීය නයනාමෘත ප්‍රතිභාග සමස්ත රූපලාවණ්‍ය විශෙෂ සම්පත්තියෙන් යුක්ත වූ, මණිමේඛලා නම් දිව්‍යාංගනාව විසින් ද, එහි පින් - පෙ -

හෙම සිංහාසනාසීන දක්ෂිණකරගෘහිත කනක කලසාභාරාම වූ මහීකාන්තාව විසින් ද, එහි පින් - පෙ -

සුගන්ධ මකරන්දාකීර්ණ පුඤ්ජ පිඤ්ජරිත මත්තාලි නිකර නිසේවිත විචිත්‍ර ශතපත්‍රාසනාරූඪ වූ සරස්වතී දිව්‍යාංගනාව විසින් ද, එහි පින් - පෙ -

අසුරපුරාධීශ්වර වූ වෙපචිත්‍යාදී අසුරෙන්ද්‍රයන් විසින් ද, එහි පින් - පෙ -

උරගපුරාධීශ්වර වූ මණි කණක කිරීටකුට ප්‍රතිෂ්ඨිත ශංඛපාල මහාකාලාදී, නාගෙන්ද්‍රයන් විසින් ද, එහි පින් - පෙ -

ජලස්ථල වෘක්ෂපර්වත විසෘතානෙකප්‍රසව ජලගම්භීර කන්දරාන්තර නිස්තල නිකුඤ්ජර නිර්ඣර ප්‍රපාත ගිරිශිඛර සින්ධුපද්මාකරාදීන් වාසස්ථානය කොට ඇති, දේවසමූහයා විසින් ද, එහි පින් - පෙ -

මෙසේ යථොක්ත වූ මේ සියලුම පින් අනුමෝදන් ව අධිකතර සම්පත්තීන් සමෘද්ධ වූ දිව්‍ය සමූහයා විසින් - මේ පින්කම කරවීමට ඇතුළත් දායක මූලික කාරකාදීන්ට අමනොඥ අසන්තුෂ්ට දුෂ්ටාරිෂ්ට අමනුෂ්‍ය කෙනෙක් ඇත්නම් - ඔවුනට අවවාදානුශාසනා කොට අවවාදක්ෂම වූ නම් හිතසුඛ කරණ ප්‍රවෘත්ත සාධුභාවයෙහි පිහිටුවා, කායික මානසික ව්‍යසන සහිත - තිථි කරණ හෝරා මුහුර්ත නවග්‍රහාදී පීඩා සංහිඳුවා, ආයුරාරොග්‍යාදී සකලෛශ්වර්‍ය්‍යාභිවෘද්ධිවර්ධනය කටයුත්තේ ය.

එසේත් අවවාදක්ෂම නො වන්නා වූ ස්ථබ්ධවිපරීතාධ්‍යාශයෙන් යුක්ත වූ, අමනුෂ්‍ය කෙනෙක් වූ නම් චතුර්දිශාධිපති වූ ධෘතරාෂ්ට්‍ර විරූඪ විරූපාක්ෂ වෛශ්‍රවණ යන සකල යක්ෂ රාක්ෂසාධිපති සතරවරම් දෙව් මහරජ දරුවන් විසින් - භික්ෂු භික්ෂුණ්‍යාදී වූ සිවුවනක් පාරිෂද්‍යයන් ගේ ගොපණ රක්ෂණාවරණ අවිහිංසා ඵාසු විහරණය පිණිස, මහාකරුණාඥනයෙන් දේශනා කරන ලද්දා වූ -

සකල සත්වහිතවිධායක ප්‍රබුද්ධ බුද්ධි ඇති නෙකාවාදීභ කුම්භ නිර්භෙදාහිතකෙශරී භූත, මාරවීර සර්වඥරාජෝත්තමයන් වහන්සේ විසින්, සප්තරත්නප්‍රකාර ගොපුර පරිඛා පරික්ෂිප්ත රක්ෂාවරණයෙන් යුක්ත වූ, රාජගෘහනගරාවරාසන්නයෙහි වූ

Non-Commercial Distribution

ගිජ්ඣවිහඟාරාරකූටලංකෘත හෙයින් ගිජ්ඣකූට නම් වූ පර්වතමස්තකයෙහි, සන්ධ්‍යාවලාහකප්‍රභාරංජිත ඉන්ද්‍රචාප විද්‍යුල්ලතා පරික්ෂිප්ත තරුණ රවි කිරණ කනක ගිරිශිඛරයක් සේ අචින්ත්‍යානොපමේය වූ ප්‍රඥප්තවර බුද්ධාසනාරූඪව වැඩහිඳ, දේශනා කරන ලද්දා වූ කොටි ශතසහස්‍ර චක්‍රවාලවාසී යක්ෂ රාක්ෂසොරග ගරුඩ ගන්ධර්ව සිද්ධ භූත ප්‍රේත පිසාචාදීන් විසින් අවිලංඝනීය වූ ආඥා ඇති මේ ආටානාටිය සූත්‍රාන්ත ධර්මදේශනාව, මේ වැඩහුන් දෙදෙනා වහන්සේ ඇතුළු වූ මහාසංඝයා වහන්සේ ලවා පිරුවා වන සේක.

තුන්යම් රාත්‍රිය මුළුල්ලෙහි ක්ෂාන්තික්ෂමොපශමාදීන් සිට බණ අසා ශාසනොපකාරී වූ, රත්නත්‍රයසරණ පරායන සකල සත්පුරුෂ සාධුජනයන්ට - ඍතුපරිවර්තනොපක්‍රම සුපක්ෂ ප්‍රතිපක්ෂ, යක්ෂ රාක්ෂස තරක්ෂ වෘද්ධොක්ෂ මහිෂ මෙෂාශීවිෂොපද්‍රව ගෘහසංක්‍රාන්ති දුඃස්වප්න දුර්නිමිත්ත කලිකලහ වෛකල්‍ය විග්‍රහ විවාදාදීන් වන්නා වූ සකලාන්තරාය සර්වොපද්‍රව නිවාරණය කොට-

කීර්ති තාර හාර තුෂාර කහ්ලාරක්ෂීරස්ඵටික ක්ෂීරාණීවාකාර - අරුණකරකිරණස්ඵුරණ තරුණාරුණ ප්‍රවාලංකුර ප්‍රවාලාණීව වර්ණ - සුරභි සුරතරු භද්‍රසට නවනිධීන් සාදෘශ්‍ය වූ සකලෛශ්වර්‍ය්‍යාභිවෘද්ධිවර්ධනය කටයුතු -

අනුශාසනාව නිමි.

# බුද්ධ වර්ෂය කීම

සිරි සාක්‍යමුනි සබ්බඤ්ඤු බුද්ධස්ස බලව පච්චූස සමයෙ කුසිනාරායං, යමකසාලානමන්තරෙ අමුම්හි සප්පසංවච්ඡරෙ ගිම්හාන උතුම්හි වෙසාඛමාසෙ සුක්කපක්ඛෙ පණ්ණරසී තිථියං භුම්මවාරෙ රාධාන්කඛත්තෙ අනුපාදිසෙසාය නිබ්බාණධාතුයා පරිනිබ්බාණ දිවසතො පට්ඨාය සත්තමාස පඤ්චදින සත්ත පඤ්ඤාසති සංවච්චඡර චත්තාරිසතාධිකානි ද්වෙ සංවච්ඡර සහස්සානි අතික්කන්තානි අහෙසුං

ඉමස්මිං ව්‍යග්ග සංවච්ඡරෙ හෙමන්ත උතුම්හි කත්තික මාසෙ කාලපක්ඛෙ ඡට්ඨමතිථියං සූරවාරො සම්පත්තො. අනාගතෙ කාලෙ පඤ්චමාසෙ පඤ්ච වීසති දින තිචත්තාළීසති සංවච්ඡර චත්තාරි, සතාධිකානි ද්වෙ සංවච්ඡර සහස්සානි අවසෙසානි භවිස්සන්ති.[1]*

1. මේ සඳහන් කරන ලද්දේ ශක වර්ෂ 1836 තුලා 23 භාග රිවිදින බුද්ධ වර්ෂය කියාලූ පරිදි ය. එනම් : - බුද්ධ වර්ෂ 2457 ක් වූ 7 වැනි මස අව විසේනිය දිනය යි. මේ අනුව ඒ ඒ දිනට යෙදෙන පරිදි වර්ෂ, ඍතු, මාස, පඤ්ච, තිථි, දින යොදාගත යුතුයි.
* වන පිරිත කීමේ දී බුද්ධ වර්ෂය කීම සිරිතකි.

Non-Commercial Distribution

# දෙවියන්ට පිංදීම

ආකාසට්ඨා ච භුම්මට්ඨා - දෙවා නාගා මහිද්ධිකා
පුඤ්ඤං තං අනුමොදිත්වා - චිරං රක්ඛන්තු සාසනං

ආකාසට්ඨා ච භුම්මට්ඨා - පෙ - චිරං රක්ඛන්තු දෙසනං
ආකාසට්ඨා ච භුම්මට්ඨා - පෙ - චිරං රක්ඛන්තු මං පරං

සම්බුද්ධ සාසනවරං යතිපුංග වංච
සම්පාලනාය පටිලද්ධ වරො මහිද්ධි
පුඤ්ඤාභිමානි අනුමොදිය වාසුදෙවො
පාලෙතු මං සතත සාතහිතා ච හන්තො

සම්බුද්ධ සාසනාවරං ඉධ රොහණස්මිං
සම්පාලනාය පටිලද්ධ වරො යසස්සී
පුඤ්ඤානුමොදිය සළානන දෙවරාජා
පාලෙතු සන්තත මමං සුඛමාවහන්තො

සම්බුද්ධපාදවරලඤ්ජන සොභිතස්මිං
වාසොසමන්තගිරිමුද්ධනි දෙවරාජා
පුඤ්ඤානුමොදිය ඉදං සුමනාභිධානො
පාලෙතු සන්තත මමං සුඛමාවහන්තො

සංසුද්ධ තෙජ ජලතිද්ධි මහානුභාවො
යො අය්යනායක ඉතීරිත චාරුදෙවො
පුඤ්ඤාභිමානි අනුමොදිය මොදමානො
පාලෙතු සන්තත මමං සුඛමාවහන්තො

රාමමාසජ්ජ ලංකායං - ලද්ධරාජත්තනෙ යසො
විභීසනව්හ දෙවෙ සො - ඉදං පුඤ්ඤානුමොදතු

**සියලු සත්වයෝ නිදුක් වෙත්වා ! නීරෝග වෙත්වා !! සුවපත් වෙත්වා!!!**



Non-Commercial Distribution

# පිරිත් සූත්‍රයන්හි ආරම්භක ගාථා

## දසධම්ම සූත්‍රය

භික්ඛූනං ගුණසංයුත්තං - යං දෙසෙසි මහාමුනි
යං සුත්වා පටිපජ්ජන්තො - සබ්බදුක්ඛා පමුච්චතී

## මහාමංගල සූත්‍රය

යං මංගලං ද්වාදසසු - චින්තයිංසු සදෙවකා
සොත්ථානං නාධිගච්ඡන්ති - අට්ඨතිංසඤ්ච මංගලං
දෙසිතං දෙව දෙවෙන - සබ්බ පාප විනාසනං
සබ්බලොක හිතත්ථාය - පරිත්තං තං භණාමහෙ

## රතන සූත්‍රය

කොටිසතසහස්සෙසු - චක්කවාළෙසු දෙවතා
යස්සානං පතිගණ්හන්ති - යඤ්ච වෙසාලියං පුරෙ
රොගාමනුස්ස දුබ්භික්ඛ - සම්භූතං තිවිධං භයං
ඛිප්පමන්තරධාපෙසි - පරිත්තං තං භණාමහෙ

## කරණීය මෙත්ත සූත්‍රය

යස්සානුභාවතො යක්ඛා - නෙවදස්සෙන්ති භිංසනං
යම්හිචෙවානු යුඤ්ජන්තො - රත්තින්දිව මතන්දිතො
සුඛං සුපති සුත්තො ච - පාපං කිඤ්චි න පස්සති
එවමාදි ගුණො පෙතං - පරිත්තං තං භණාමහෙ

## ඛන්ධ පරිත්තය

සබ්බාසි විසජාතීනං - දිබ්බ මන්තා ගදංචිය
යංනාසෙසි විසං ඝොරං - සෙසං චාපි පරිස්සයං
ආණක්ඛෙත්තම්හි සබ්බත්ථ - සබ්බදා සබ්බ පාණිනං
සබ්බසොපි විනාසෙති - පරිත්තං තං භණාමහෙ

## මෙත්තානිසංස සූත්‍රය

අග්ගික්ඛන්ධොපමං සුත්වා - ජාතසංවෙග භික්ඛුනං
අස්සාදත්ථාය දෙසෙසි - යං පරිත්තං මහාමුනි
සබ්බලොක හිතත්ථාය - පරිත්තං තං භණාමහෙ

## මිත්තානිසංස සූත්‍රය

පුරෙන්තො බොධිසම්භාරෙ - නාථො තෙමිය ජාතියං
මිත්තානිසංසං යං ආහ - සුනන්දං නාම සාරථිං
සබ්බලොක හිතත්ථාය - පරිත්තං තං භණාමහෙ

Non-Commercial Distribution

## මොර පරිත්තය

පූරෙන්තො බොධි සම්භාරෙ - නිබ්බත්තො මොරයොනියං
යෙන සංවි හිතාරක්ඛං - මහාසත්තං වනෙ චරා
චිරස්සං වාය මන්තාපි - නෙව සක්ඛිංසු ගණ්හතුං
බ්‍රහ්ම මන්තන්ති අක්ඛාතං - පරිත්තං තං භණාමහෙ

## චන්ද පරිත්තය

රාහුනො ගහිතො චන්දො - මුත්තො යස්සානු භාවතො
සබ්බ වෙරි භයං නාසං - පරිත්තං තං භණාමහෙ

## සූරිය පරිත්තය

සූරියො රාහු ගහිතො - මුත්තො යස්සානු භාවෙතො
සබ්බ වෙරි භයං නාසං - පරිත්තං තං භණාමහෙ

## ධජග්ග පරිත්තය

යස්සානුස්සරණෙනාපි - අන්තලික්ඛෙපි පාණිනො
පතිට්ඨමධි ගච්ඡන්ති - භූමියං විය සබ්බථා
සබ්බුපද්දව ජාලම්හා - යක්ඛ චොරාරි සම්භවා
ගණනා නච මුත්තානං - පරිත්තං තං භණාමහෙ

## මහා කස්සපත්ථෙර බොජ්ඣංග පරිත්තය

යං මහා කස්සපත්ථෙරො - පරිත්තං මුනි සන්තිකං
සුත්වා තස්මිං ඛණෙයෙව - අහොසි නිරුපද්දවො
බොජ්ඣඞ්ග බල සංයුත්තං - පරිත්තං තං භණාමහෙ

## මහා මොග්ගල්ලානත්ථෙර බොජ්ඣඞ්ග පරිත්තය

මොග්ගල්ලානොපි ථෙරො යං - පරිත්තං මුනි සන්තිකං
සුත්වා තස්මිං ඛණෙයෙව - අහොසි නිරුපද්දවො
බොජ්ඣඞ්ග බල සංයුත්තං - පරිත්තං තං භණාමහෙ

## මහාචුන්දත්ථෙර බොජ්ඣඞ්ග පරිත්තය

භගවා ලොකනාථො'යං - චුන්දත්ථෙරස්ස සන්තිකා
සුත්වා තස්මිං ඛණෙයෙව - අහොසි නිරුපද්දවො
බොජ්ඣඞ්ග බල සංයුත්තං - පරිත්තං තං භණාමහෙ

## ගිරිමානන්ද සූත්‍රය

ථෙරොයං ගිරිමානන්දො - ආනන්දත්ථෙර සන්තිකෙ
සුත්වා තස්මිං ඛණෙයෙව - අහොසි නිරුපද්දවො
දස සඤ්ඤප සංයුත්තං - පරිත්තං තං භණාමහෙ

## ඉසිගිලි සූත්‍රය

පච්චෙක බුද්ධනාමානි - දෙසෙන්තොයං අදෙසයි
අනන්ත බල සංයුත්තං - පරිත්තං තං භණාමහෙ

Non-Commercial Distribution

## මොර පරිත්තය

පූරෙන්තො බොධි සම්භාරෙ - නිබ්බත්තො මොරයොනියං
යෙන සංවි හිතාරක්ඛං - මහාසත්තං වනෙ චරා
චිරස්සං වාය මන්තාපි - නෙව සක්ඛිංසු ගණ්හතුං
බ්‍රහ්ම මන්තන්ති අක්ඛාතං - පරිත්තං තං භණාමහෙ

## චන්ද පරිත්තය

රාහුනො ගහිතො චන්දො - මුත්තො යස්සානු භාවතො
සබ්බ වෙරි භයං නාසං - පරිත්තං තං භණාමහෙ

## සූරිය පරිත්තය

සූරියො රාහු ගහිතො - මුත්තො යස්සානු භාවෙතො
සබ්බ වෙරි භයං නාසං - පරිත්තං තං භණාමහෙ

## ධජග්ග පරිත්තය

යස්සානුස්සරණෙනාපි - අන්තලික්ඛෙපි පාණිනො
පතිට්ඨමධි ගච්ඡන්ති - භූමියං විය සබ්බථා
සම්බුපද්දව ජාලම්භා - යක්ඛ චොරාරි සම්භවා
ගණනා නච මුත්තානං - පරිත්තං තං භණාමහෙ

## මහා කස්සපථෙර බොජ්ඣංග පරිත්තය

යං මහා කස්සපථෙරො - පරිත්තං මුනි සන්තිකං
සුත්වා තස්මිං ඛණෙයෙව - අහොසි නිරුපද්දවො
බොජ්ඣඞ්ග බල සංයුත්තං - පරිත්තං තං භණාමහෙ

## මහා මොග්ගල්ලානථෙර බොජ්ඣඞ්ග පරිත්තය

මොග්ගල්ලානොපි ථෙරො යං - පරිත්තං මුනි සන්තිකං
සුත්වා තස්මිං ඛණෙයෙව - අහොසි නිරුපද්දවො
බොජ්ඣඞ්ග බල සංයුත්තං - පරිත්තං තං භණාමහෙ

## මහාචුන්දථෙර බොජ්ඣඞ්ග පරිත්තය

භගවා ලොකනාථො'යං - චුන්දථෙරස්ස සන්තිකා
සුත්වා තස්මිං ඛණෙයෙව - අහොසි නිරුපද්දවො
බොජ්ඣඞ්ග බල සංයුත්තං - පරිත්තං තං භණාමහෙ

## ගිරිමානන්ද සූත්‍රය

ථෙරොයං ගිරිමානන්දො - ආනන්දථෙර සන්තිකෙ
සුත්වා තස්මිං ඛණෙයෙව - අහොසි නිරුපද්දවො
දස සඤ්ඤාප සංයුත්තං - පරිත්තං තං භණාමහෙ

## ඉසිගිලි සූත්‍රය

පච්චෙක බුද්ධනාමානි - දෙසෙන්තොයං අදෙසයි
අනන්ත බල සංයුත්තං - පරිත්තං තං භණාමහෙ

Non-Commercial Distribution

# බණ පිරිත් කතිකාවත

ශ්‍රී සුගත තථාගත අප භාග්‍යවත් සම්‍යක් සම්බුද්ධ සර්වඥ රාජෝත්තමයාණන් වහන්සේ විසින් භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා සංඛ්‍යාත සිවුවණක් පර්ෂදුන් ගේ රක්‍ෂාවරණ ගෝපන වශයෙන් ඓහලෞකිකාභිවෘද්ධිය ද තත්මූලික වූ ශීල - ධුත ව්‍රතාදීන් ගේ වශයෙන් පාර ලෞකිකාභිවෘද්ධිය දැ යි යන උභය ලෝක විජය ප්‍රතිපදාව සඳහා දක්වා වදාරන ලද මහාකරුණා ඥාන ප්‍රවෘත්ත වූ පරිත්‍රාණ ධර්ම දේශනාව සිංහල දේශ භාෂා ව්‍යවහාරයෙහි **"බණපිරිත"** යන නාමයෙන් දක්නා ලැබේ.

ඒ මේ බණ පිරිත් දේශනාව වනාහි ධර්ම - විනය වශයෙන් ද්විවිධි වූ ශාස්තෘශාසනයෙහි ධර්ම නම් ලද සූත්‍රාන්ත පිටකයෙහි සංගෘහිත වූවත් ඒ සම්බන්ධ වූ වත්පිළිවෙත් විධිය විනය පිටකාන්තර්ගත වේ.

එහෙයින් බණ පිරිත් සම්බන්ධ සියලු කර්තව්‍ය ම ධර්මානුගත ව ද, විනයානුගත ව ද සිද්ධ කටයුත්තේ ය.

හෙද සම්‍යක් සම්බුද්ධ මතානුයායි, අනුබුද්ධ ආයුෂ්මත් **මහාකාශ්‍යප** ස්ථවිර, විනයධර **උපාලි** ස්ථවිරාදි අර්ථකථාචාර්යවරයන් වහන්සේලා විසින් සංගායනාකර වදාරන ලද - "අන්තො ගාමෙ'පි ගිලානස්සත්ථාය විහාරං පෙසෙන්ති පරිත්තං භණන්තූ'ති භණිතබ්බං, අන්තොගාමෙ රාජගෙහාදිසු රොගෙ වා උපද්දවෙ වා උප්පන්නෙ පක්කොසාපෙත්වා භණාපෙන්ති, ආටානාටිය සුත්තාදීනි භණිතබ්බානි" යනාදි විනයනය ලෙස සම්බුද්ධශාසන ශ්‍රී භාරධාරි වූ මහා විහාර වංසාගත පුරාතන මහාස්ථවිර උතුමන් විසින් සස්නෙහි නො පහන් පැණවතුන් ගේ ප්‍රසාදය ඇතිවෙන ලෙස ද, පහන් සිත් ඇති පැණවතුන් ගේ ප්‍රසාදභීයොභාවය වන ලෙසට තදනුකූල උපචාර විධින් සමලංකෘත ව්‍යවස්ථිත විධිවිධානයෙන් යුක්තකොට පුලසතිපුර රාජධානිකාලයෙහි පටන් **"බණ පිරිත් පින්කමය"** යන නාමයෙන් විශාල පුණ්‍යෝත්සවයක් වශයෙන් පවත්වන සේ ලක්දිව වැසි සරාජක බෞද්ධ මහා පිරිසට පුරුදු පුහුණු කරන ලද්දේ ය.

මෙහි ප්‍රාරම්භ උත්සවය රාජමන්දිරාසන්නයෙහි සියලු කල්හි ම ප්‍රතිෂ්ඨාපිත වූ **ශ්‍රී දංෂ්ට්‍රා දළදා මන්දිරයෙහි** දළදා සාමින් ප්‍රමුඛකොට තුනුරුවන් පිදීමේ විධිවිධාන සහිත වැ පැවැත ආ බැව් මේ සම්බන්ධ පුරාතන ලිපි වශයෙන් නැණවතුන්ට සුප්‍රකාශ වේ. ශ්‍රද්ධාබුද්ධි - තෙජොබල පරාක්‍රමාන්විත බෞද්ධ රාජකීය අනුග්‍රහයෙන් තොරව සාමාන්‍ය බෞද්ධ මහජනයා ගේ සාමර්ථ්‍යයෙන් ම ලක්සසුන් පවත්නා වර්තමාන කාලයෙහි යථොක්ත පුණ්‍යෝත්සවය අනුක්‍රමයෙන් තේජශ්ශක්ති විරහිත ව සුළුතරම් සමූහයන් විසිනුදු නොයෙක ලෙස පවත්වන්නට වන් හෙයින් මෙකල එහි ආශ්චර්ය අද්භූත බැරෑරුම් ස්වභාවය ඌනවන්ට පටන්ගෙන තිබේ.

මහා සංඝයාවහන්සේට ද, දායක කාරක සමූහයන්ට ද ඒ කරණකොට ගෙන නොයෙක් අළුංසු බොහෝ විට පැමිණෙන බව ද, ශ්‍රද්ධා බුද්ධි විරහිත ජනයන් නොයෙක් විට ඒ මගින්නුත් පව් සිදු කරගන්නා බව ද, නිතර අසන්ට, දකින්ට ලැබීම ඛේදයක් ව පවත්නේ ය.

චාරිත්‍ර වාරිත්‍ර සීමා උල්ලංඝනය කිරීමෙන් සුචරිත ක්‍රියාවල යෙදෙන්නන් පවා දුසිරිතට පැමිණිය හැකි බැවින් ඒ වළක්වා ගෘහස්ථ, ප්‍රව්‍රජිත මහාපර්ෂදුන් සම්බන්ධ ව පැවැත්ත යුතු වූ මෙම ගරුතර පුණ්‍යෝත්සවය ද, ලෝකශාසන චාරිත්‍ර මාර්ගානුකූලව ව්‍යවස්ථාසහිත ව විධි නො වරදවා පවත්වන රඟට කතිකා කළ මැනවැ යි බෞද්ධ ප්‍රභූමහතුන් සමූහයක් විසින් ආරාධිත වූ මහා සංඝයා

Non-Commercial Distribution

වහන්සේ විසින් ශික්ෂාශාසන ගෞරවයෙන් බණ පිරිත් පින්කම් සම්බන්ධ මේ කතිකාවත සම්මත කරනු ලැබේ.

1. "මෙත්තචිත්තං පුරෙචාරිකං කත්වා වත්තබ්බං පඨමං සික්ඛාපදානි ගාහාපෙත්වා සීලෙ පතිට්ඨිතස්ස පරිත්තං කාතබ්බං" යනු විනය නියමය බැවින් පිරිත් වදාරන මහා සංඝයා වහන්සේ විසින් ඒ ශ්‍රවණය කරන පිරිස කෙරෙහි මෛත්‍රී චිත්තය පෙරදැරිකොට ගෙන ලාභ, කීර්ති, ප්‍රශංසා පරවශ නොව නිස්සරණාධ්‍යාශ යෙන් යෙදී පිරිත් වදාළ යුතු.

2. වෙනුව - සප්තාහාදී කාල වශයෙන් නියමිත කාලයක් තුළ නො කඩවා පිරිත් වදාරන පිණිස සම්මත වූ යුග පිරිතෙහි යෙදෙන භික්ෂූන් විසින් ද තම තමන්ට පැමිණි කාල ප්‍රමාණය මෛත්‍රී පුරස්සර සිතින් අන්‍යවිහිත නොව නිරතුරු පිරිත් දේශනාව පවත්නා සේ ව්‍යඤ්ජන බුද්ධිය නො පිරිහෙළා ගීතස්වර හෝ ආතීස්වර හෝ මන්දස්වර හෝ නො පවත්නා ශ්‍රවණිය මාත්‍රඥතායෙන් පැවැත්විය යුතු යුග පිරිත් දේශනාවේ දී දෙනම ම එකවිට විශ්‍රාමයට නො පැමිණෙන සේ උත්සාහ කටයුතු

3. වෙනුව - ධම් මණ්ඩපයට තුන්වේලේ මහපිරිතට වඩනා මහ සඟන විසින් පූජ්‍යාසනප්‍රාප්ත වූ ධාතු චෛත්‍යය සිරිත් ප්‍රකාර තුන්වේලේ නමස්කාර කටයුතු

4. වෙනුව - පිරිසිදු මනහර පරිෂ්කාරවරවැ සු සංවෘත ඉන්ද්‍රියයෙන් හා සුපාරුත වේශයෙන් ද ශ්‍රමණ සාරුප්‍ය විධියෙන් මණ්ඩපයට ගමනාගමන කටයුතු

5. වෙනුව - ගෘහස්ත මහ පිරිස් මැද මහපිරිතට වඩනා භික්ෂූන් එකවිට පෙළ නොකැඩී මණ්ඩපයට වැඩීම ද, එසේ ම නිකුත්වීම ද විනා කඩකඩ ව ගමනාගමන නො කටයුතු

6. වෙනුව - මහජනතාව රැස්වන සූත්‍ර දේශනා, ආටානාටිය දේශනා දින දෙක්හි මණ්ඩපයෙහි නිතර වැඩ හිඳිනා භික්ෂූන් ද තමතමන්ට පැමිණෙන ක්‍රියාචාර අපේක්ෂාකරමින් තුෂ්ණිම්භූත වැ සුසංවෘත වැ අන්‍යවිහිත නොව වැඩහිඳිනු මිස වෙනයම් කායික වාචසික ක්‍රියාවන්හි නො යෙදිය යුතු

7. වෙනුව - දායක පිරිස වෙනුවෙන් දේවදූතයකු ලවා පවත්වන දොරකඩ අස්න ද, මහසඟන වෙනුවෙන් භික්ෂු කෙනෙකු ලවා පවත්වන විහාර අස්න හා අනුශාසනාව ද, පවත්නා වේලාවල දී ඒ එක එක පුද්ගල කෙනෙකුන්ගේ රන්ධ්‍රගවේසි නොව හැමදෙන ම බලවත් කරුණා මෛත්‍රී සිතින් හා ශුභප්‍රාර්ථනාවෙන් යෙදී සාවධානව හින්ද යුතු

8. වෙනුව - මහපිරිත් වදාරන සඟන අතුරින් පුරණ ස්ථවිරයන් උපදවන ශබ්දයට අනුරූප ව ශ්‍රවණීය පමණින් සෙසු භික්ෂූන් විසින් උච්චාරණය කටයුතු වනු මිස වෙන වෙන ම තම තමන් කැමති කැමති නානාස්වර ඉපදවීම හා නානාක්ෂරයන්හි උච්චාරණය ගෙන යාම ද නො කටයුතු

9. වෙනුව - ආටානාටිය සූත්‍ර දේශනාව වදාරන විට ද දෙපස යුගදෙක්හි භික්ෂූන් සමප්‍රමාණ මධුර මනොහර ශබ්දයෙන් ම උච්චාරණ කරනු මිස මහ හඬින් උද්ඝෝෂණය නො කටයුතු

10. වෙනුව - පිරිත් මණ්ඩපයට පැමිණි මහා සංඝයා වහන්සේ ද විනය ප්‍රතිපත්තියක් සිද්ධකරන්නට පැමිණියන් හෙයින් එහි ශික්ෂා සමාදාපන අවවාදානුශාසනාදි ප්‍රස්තාවොචිත සියලු කටයුතු ථෙරාධීන ද ව්‍යක්ත ප්‍රතිබලාධිනද වේ යයි සලකා මහාස්ථවිරානුමතයෙන් ව්‍යක්ත ප්‍රතිබල භික්ෂූන් ලවා ම කරවිය යුතුයි.

Non-Commercial Distribution

# ආරාධක වත

බණ පිරිත් පින්කම් කරවනු කැමැති දායක පක්ෂය කුළුපග වූ හෝ සමීප විහාරයෙක් හි ආවාසික වූ හෝ පැවිදි කෙනකුන් ආධාර කොට ගෙන සංඝස්ථවිරයන් වසන වෙහෙරකට පැමිණ ආරාධනා කටයුතු යි. යටත් පිරිසෙයින් පස්විසිනමකින් අඩු නොවන මහා සංඝයාවහන්සේ ලබාගත යුතුයි සංඝයාගේ ගමනාගමන ප්‍රත්‍යය පහසු ආදිය ආරාධනා කළ දායක පක්ෂය විසින් සැලැස්විය යුතුයි. ලැබෙන පමණ මහසඟන හෝ එයින් කොටසක් හෝ සංඝයා අසල් තැනක රැස්කරවා සැප පහසු දී සිරිත් පරිදි පෙරහරකින් පූජ්‍යවස්තු ප්‍රමුඛව වැඩමවා ගත යුතුයි.

උපස්ථාන ශාලාවට වැඩම වූ මහසඟනට ආගන්තුක සත්කාර පවත්වා සංඝසභාවේ තත්කාලික කටයුතු කථාබස් නිමිකල ආවාස පිළිගැන්විය යුතුයි. මහාස්ථවිර උප ස්ථවිර දෙනමකට ගරු විවේක සෙනස්නක් ද එසේ ම ව්‍යක්ත මුක්ත ස්ථවිර නමක් හෝ දෙනමකට ඊට සුදුසු විවේක සෙනස්නක් ද ඉතිරි භික්ෂූන් යුගය යුගය බැගින් පළමුවෙනි යුගය පටන් පිළිවෙළට වැඩ වසන සෙනසුන් ද, තේවාවේ භික්ෂු නමක් හෝ දෙනමකට දොර යතුරු සහිත සුරක්ෂිත සෙනස්නක් ද පිළිගැන්විය යුතුයි. ඒ ඒ සෙනසුන්හි දායක පක්ෂයේ ශක්තිය පමණින් ඇඳ ඇතිරි තිර වියන් ආදී සෙනසුන් උපකරණ පිරිසිදු ලෙස සම්පූර්ණ කටයුතු යි.

උපස්ථාන ශාලාව සකස් ව සුපිරිසිදු වියන් ඇතිරි ආදියෙන් ද නිරතුරු පැන වූ අසුන්වලින් ද සමන්විත විය යුතුයි. එහි පැන වූ කිසිවක් අතරතුර ගිහින්ගේ ප්‍රයෝජනයට නො ගන්නා සේ සුරක්ෂිත කටයුතු යි. පාන භෝජනාදි ද්‍රව්‍ය කරණකොට ගෙන දුගඳ නොවන සේ පවත්වන ආරක්ෂකයෙක් එහි නිතර ම වැසවිය යුතුයි. ආගන්තුකව එන යන භික්ෂූන්ට පසය ද ගිලන් භික්ෂූන්ට පසය ද සියලුවිට ම එහි සැලසී තිබිය යුතුයි.

යථාකාලයෙහි මහසඟන වැඩමවා උපස්ථාන කටයුතු යි. ආවාසාංගයක් වූ වැසිකිළි කෙසිකිළි උපස්ථාන ශාලාවෙන් දුරුව ආවාස පශ්වාද්භාගයෙක්හි නුදුරු නො ළංව කරවිය යුතුයි. ආවාසයන්හි රක්ෂණ ගෝපණය සඳහා දිවා රාත්‍රි දෙක්හි ම නිතිපතා ආරක්ෂකයෙක් තැබිය යුතුයි. සේවාවේ භික්ෂූන් විසින් දැනුම් දෙන පරිද්දෙන් උපස්ථානයට සුදුසු ඇහැටි දඬු ආදිය ද උණු පැන්, සිහිල් පැන් ආදිය ද සපයන මෙහෙකරු ජනයා සැලැස්විය යුතුයි.

මහ සඟන බණ පිරිත් ආරම්භයට වැඩම වු තැන් පටන් සත් දින තුළ ම ධර්ම මණ්ඩපයේ වත් පිළිවෙත් ද, තූර්‍යනාද, ජන සමූහයා සාවධානව යෙදවීම ද, යුග පණිවුඩ ගෙන ඊම ද, සොරභය, ගිනිභය ආදියෙන් ආරක්ෂා කිරීම ද, මහපිරිත් ආරම්භයේ දී පෙනීසිටීම ද, දේවදූතයකු ජේව සිටින සේ සලස්වා ආරක්ෂා කිරීම ද, පැමිණි පිරිසගෙන් ලබන ආධාර සමාදම් - පිරිස නො පෙළා ඝෝෂා නො පවත්වා සන්සුන් ලෙස ලබාගැනීම ද, පිරිත් සමාදම් මිස විශේෂ සමාදම් නො පැවැත්වීම ද, තුණුරුවන් උදෙසා සැදැහැවතුන් දෙන පුදක් ඇතහොත් එය සුරක්ෂිත කොට මහසඟනට හෝ උපකාරී සංඝ සභාවට හෝ සැලකර ලැබෙන අවසරයකින් ක්‍රියාකිරීම ද, පින්කමේ කටයුතු සඳහා ලැබෙන මිළ මුදල් දෙදෙනකු වෙත ලේඛන දෙකක් සඳහන් කොට භාණ්ඩාගාරික ප්‍රධාන තැනක් භාරයේ තැබීම ද, අතරතුර ලැබෙන සාංඝික පිරිකරක් ඇතහොත් තේවාවේ භික්ෂූන්ගේ අනුදැක්මෙන් ඒ ඒ විට ම බෙදා දීම හෝ අවසානයෙහි බෙදීම ද, පින්කම සම්බන්ධ නියම පරීක්ෂකාර පූජාව උපකාරී සභාවේ අවසර ලෙස දායක පක්ෂයේ ශක්ති පමණින් පැවැත්වීම ද, ඒ පිණිස වැඩි ලාභයක් ලැබී ඇතහොත් මහ සඟන වෙතින් නො විචාරා අනිකකට පිරිනොනැමීම ද, පින්කම්පළ අසළ සුරාධූර්ත අක්ෂධූර්තාදී අශික්ෂිත ජනයන් රැස්නොවන සේ සුරක්ෂිත කරගන්ට ශක්ති පමණින් උත්සාහ ගැනීම ද, අවට ගම්වලින් පෙරහැර ආදියක් පැමිණි විට නෘත්‍යගීත ගිනිකෙළි ආදී පැවතුම් ඔවුනට රිසි රිසි තැන කැමැති කැමැති වේලාවක් පවත්වන්ට අවකාශ නොදී **"දායක සභාවේ හෝ සංඝ සභාවේ"** හෝ අවසරයක් ලෙස ඉඩදීම ද, දායක පිරිස නිතරම අඛණ්ඩ පඤ්ච ශීලයෙන් හා

Non-Commercial Distribution

ශ්‍රද්ධාබුද්ධියෙන් යෙදී උභය ලෝකාර්ථ සිද්ධිය මුදුන්පත් කොට ගෙන කරුණා මෛත්‍රියෙන් ක්‍රියා කිරීම ද යුතුයි.

## ආවාසික වත

බණ පිරිත් පින්කම් සම්බන්ධව දායකයන්ට උපදෙස් දෙන කුලුපග භික්ෂු කෙනකුන්ට දායක පක්ෂයේ අදහස දැන් වූ විට තමන් ගේ ආචාර්‍ය්‍ය උපාධ්‍යායන්ට නො දන්වා අවසර නොමැතිව ඊට සම්බන්ධ නොවිය යුතුයි. අවසර ලද්දා වූ හෝ සංඝස්ථවිර කෙනෙක් වූ කුලුපග භික්ෂු කෙනකුන්ට දායක පක්ෂයේ ආරාධනාව ලැබුණු විට සංඝයා ලැබිය යුතු ආකාරය සලකා දායකවරුන් ලවා ම මහසඟන වෙත සත්කාර පුරස්සර ආරාධනාව පැමිණ විය යුතුයි.

ධම්මණ්ඩප උපස්ථානශාලා ආවාසාදි කටයුතු දායක පක්ෂයට කියා දිය යුතුයි.

මණ්ඩප සැරසිලි ආදිය ගැන උපදේශ පමණකින් මුත් කම්කරු විලාසයෙන් ක්‍රියා නොකට යුතුයි. වඩමවාගත් භික්ෂූන්ගේ සැපපහසු සෙවීම ද, අඩුලුහුඬු පිරිමැස්වීමද, සංඝ ගෞරවය කරවීම ද, ඒ කිසි ක්‍රියාවක් නිසා අතිරේක ලාභයක් නො ඉවසීම ද, ආරාධක වූ කුලුපග භික්ෂූන් ගේ යුතුකම වේ.

## ආරාධනා ලත් මහා සංඝයාගේ වත

යම් සංඛ්‍යාවක් පැමිණෙන සේ ආරාධනා ලද්දාහු නම් ඒ ගණන් නො පිරිහෙළා ආරම්භ දින සවස් භාගයෙහි පින්කම්පළට පැමිණීම ද, පත් පොත් සිවුරු පිරිකර ගෙන්වාගෙන ඒ රැක බලාගන්නා පිණිස සුවිනීත අතවැසියන් ඇතිව පැමිණීම ද, උපස්ථාන ශාලාවට රැස්ව ග්‍රීෂ්ම නිර්වාපනය කළ පසු පින්කමේ යෙදිය යුතු භික්ෂූන් තෝරා ගෙන තාවකාලික වශයෙන් තනතුරු සම්මත කිරීමේදී මහාස්ථවිර, උපස්ථවිර, අනුශාසක, ලේඛක, අනුමෝදක, ධර්මකථික, උපස්ථායක, තනතුරුවලට සුදුසු ස්ථවිරාදී, සම්මත කොට මෙකී තනතුරු ලත් භික්ෂූන් කාරක සභාවක් පත්කොට නියම කිරීම ද යුග පිරිත් දෙසන පිළිවෙළ ද නියම කොට කල්නොයවා සෙනසුන් පිළිගැනීම ද, පිරිත පේ කිරීමේ පටන් සියලු මහපිරිත්හිම අලස්ව ගිලන් කෙනෙකුන් හැර සියලු මහසඟන ම පැමිණීම ද, දේවදූතයකු නියම වූ පසු ඔහු සුදුසු භික්ෂු කෙනකුන් භාරයේ ප්‍රගුණත්වයට පැමිණවීම ද, උපස්ථාන ශාලාවෙහි සන්ටාරාවයෙන් කාලොද්ඝෝෂණය කළවිට නිකරුණේ පමානොව සඟපිරිස රැස්ව විශේෂ අවසරයක් නොලත් සෑම තැන්ම මහලු පිළිවෙළ නො ඉක්මවා, වැඩහිඳ සත්කාර ප්‍රතිග්‍රහණය කිරීම ද, එහි ආගමානුකූල වත් පිරිත් නියායෙන් හා ප්‍රත්‍යවෙක්ෂණයෙන් ආහාර කෘත්‍යය කරනු මිස කායික වාචසික චාපල්‍ය නො පැවැත්වීම ද, අහරකිස නිමවූ පසු ධර්මවිනයානුගත කථාවක් පිණිස මුත් අන් කිසි කථා සඳහා උපස්ථාන ශාලායෙහි වගී වගී ව නො රැඳීම ද, තම තමන්ට පැමිණි ක්‍රියාචාර පණිවුඩ වූ කල නොපහසු ගිලන්කම් නොදක්වා යුහුව ම පිළිගැනීම ද, කිසියම් ගිලන්කමක් ඇති වුවහොත් පණිවුඩ එවන්ට පළමුව උපස්ථායක භික්ෂුනමට දක්වාලීම ද, සියලු භික්ෂූහු ම සහාය සාධු සාමීචි පැවැත්මෙන් මිස කිසිවකිනුත් අන්‍යෝන්‍ය ප්‍රතිවිරුද්ධතාවක් නො උපදවා ගැනීම ද, ප්‍රමාද දෝෂයක් හැඟුණු විට මහාස්ථවිරාදි කාරක සභාවට හෝ එයින් එක් නමකට හෝ අප්‍රකාශ ලෙස සැලකර සාමග්‍රිය සලස්වා ගැන්ම ද, ගිහි පැවිදි සභාග ප්‍රශ්නයක් උපන්විට කාරක සභාවෙන් හෝ එසේත් නොහැකිවිට මහා සංඝ සභාවෙන් හෝ එය නිර්වේෂ්ටනය කරගැනීම ද, චිරකාල ප්‍රවෘත්ත නිකායාන්තර මතාන්තර වාද භේද ගැන ව්‍යාපෘත නොවීම ද, පින්කමට සම්බන්ධ වූ භික්ෂූන් එම ස්ථානෝපචාරයෙන් බැහැර අන් කිසි කටයුතු සඳහා ගමනාගමනය නො කිරීම ද, එක් වරුවක් නමුත් බැහැර යා යුතු කෘත්‍යයක් වී නම් තමන් වෙනුවට කෙනකු පත්කර සභාවේ අවසර ලද හොත් යාම ද, බලවත් අන්තරායක් වී නම් සභාවෙන් කරුණා අවසරයක් ලබාගැන්ම ද,

Non-Commercial Distribution

සර්වප්‍රකාරයෙන් සංසකතීව්‍යයන්ගේ ශෝභාව සමෘර්ධ වන ලෙස සුවිනීත ප්‍රියශීලි ගුණයෙන් ක්‍රියා කිරීම ද, මාත්‍රඥතායෙන් යුක්ත ව ක්ලිෂ්ට භෝජනාදියෙන් තොරව සුපිරිසුදුව පැවැත්ම ද, පිරිත් මණ්ඩපය තුළ දී සිහිල් පැන් උණු පැන් හැර කිසි විශේෂ පාන වර්ග නො පිළිගැන්ම හා මණ්ඩපය තුළ කෙළ බඳුන් නො තැබ්බවීම දැ'යි යනාදි වත් මහසඟන විසින් සැලකිය යුතුයි.

## උපස්ථායක වත

සතියක් පරිත්‍රාණ දේශනාව පවත්වා අවසාන වූ කල්හි රෝගෝපද්‍රවාදියක් නොමැති ව නැවත සතියක්, නැවත සතියක් පිරිත් දේශනා කෙරෙත්වා යි අතරක් නො මැතිව බණ පිරිත් පවත්වන්නට ආරාධනා කරන්නවුන්ගේ යාඥා පරිද්දෙන් ම ඒ ආයාචනා නො පිළිගෙන විශේෂ ශාසනාධාර උදාරතර නිමිත්තක් ඇතිවිට අතර අනික් පින්කමක් කළ පසු දෙවෙනි බණ පිරිතක් පවත්වන සේ ඒ ආරාධකයන් සුදුසු ලෙස යෙදවීම ද, සංඝ උපස්ථානයෙහි විධිවිධාන මේ මේ යැ'යි සලකා වතාවත්කරුවන් ලවා අනලස්ව කරවීම ද, සුදුසු වේලා බලා මහ පිරිත් ආරම්භ කරවීම ද, සෙනසුන්හි සැප පහසු පරීක්ෂා කිරීම ද, රාත්‍රි කාලයෙහි යුග පිරිත් සඳහා අවදිකරවා භික්ෂූන් වැඩමවා ගන්නා පණිවුඩකාරයන්ට විශේෂ වශයෙන් දැනුමැතිකම් දීම ද කාරක සභාවේ කැමැත්ත ලෙස තුන් වේලේ මහපිරිතට කල් නියම කොට ඒ එසේ පවත්වා ලීම ද, ගිහි පැවිදි සභා දෙකින් තමන් වෙත පවත්වන අයදුම් හා නියෝග සාදරයෙන් පිළිගැන්වීම ද, තමන්ට අපහසුවක් පෙනේ නම් මහසඟන වෙත සැලකර උපස්ථම්භක කෙනකුන් ලබාගැනීම මුත් කිසි ලෙසකිනුත් තම යුතුකම ගැන පසුබට නොවීම ද, ගිලන් භික්ෂූන් නිසා හෝ ඉවත්ව ගිය භික්ෂූන් නිසා හෝ පිළිවෙළ වියවුල් නො වන ලෙස නුවණින් ක්‍රියාකිරීම ද, තමන් භාරයට පත්වන දළකඩමය විජිනිපත් ආදී ගරු පරීෂ්කාරයන් සුරැකි කොට දීම ද, කාරක සභාව විසින් නිශ්චය කටයුතු තරම් කරුණක් පැමිණි විට ස්වකීය මතයෙන් ම නිශ්චය නො කොට සභාවේ මතය ලබා ගැනීම ද පූජ්‍යාසනයේ ධාතු චෛත්‍යය සම්බන්ධව පූජාවිධි සම්පූර්ණ කරමින් තමන් සැප විහරණය යථාවකාශයෙන් සැලකීම ද යුතුයි.

## කාරක සංඝ සභාවේ වත

මුළු මහා සංඝ සභාව කිසිවිටකවත් රැස්වන්ට අවකාශ නො ලැබෙන බැවින් මුළු සභාවේ බලය ලත් කාරක සභාව විසින් භික්ෂූන්ගේ ද, දායකවරුන්ගේ ද සාමග්‍රිය සුරක්ෂිත කටයුතු යි. භික්ෂු කෙනකුන් සම්බන්ධව හෝ අතවැසි කැපකරුවන් සම්බන්ධව හෝ දායක කාරකවරුන් සම්බන්ධව හෝ යම්කිසි ව්‍යාකූලයක් දුටු ඇසූ වහාම ඒ සන්සිඳුවා ලීම ද, ගිලන් තැන් ආදීන්ගෙන් පැමිණෙන පුරප්පාඩු පිරිමසාලීම ද, අමුතුවෙන් සම්බන්ධ කටයුත්තක් පැමිණිය හොත් පත්කර ගැනීම ද, පත් වූ කෙනකුන් ඉවත් කළ යුතු වී නම් එසේ කිරීම ද, පින්කමේ ගිහි පැවිදි පිරිස් සම්බන්ධව හෝ සුදුසු අණපනත් ආදිය සැලැස්වීම ද, මුළු පින්කමේ සමෘද්ධිය හා ගෞරවයත් රැකබලා ගැන්ම ද කාරක සභාවේ වැඩි පක්ෂයේ කල්පනාවෙන් ආගම සිරිත් ප්‍රකාර කටයුතු යි.

මෙසේ මේ කතිකාවත ස්ථිරව පවත්වන ලෙසට නියම කරන්ට යෙදුණේ ශ්‍රී සෛංඛණ්ඩ ශෛලාභිධාන ශ්‍රී වර්ධනපුරප්‍රවරාභ්‍යාන්තරයෙහි වූ පුෂ්පාරාම විහාරයෙහි විංශතිවර්ගික කාරක මහාසංඝ සභාවේ කැමැත්ත ඇතිව උපොසථ පුෂ්පාරාම විහාර පදවිය ලැබී කරවන **"තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමංගලාභිධාන"** මහානායක ස්ථවිරයන් වහන්සේ සහ එසේ ම අනුනායක පදවිය ලැබී කරවන **"වටරක රතනජෝති සොභිතාභිධාන"** අනුනායක ස්ථවිරයන් වහන්සේ ද, **"අනුක්කනේ සංඝරක්ඛිත සරණංකරාභිධාන"** අනුනායක ස්ථවිරයන් වහන්සේ ද යන අප විසින් ය.

(අත්සන)

Non-Commercial Distribution

# බණ පිරිත් කතිකාවතෙහි සඳහන් බණ පිරිත් විධි

## නමෝ තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස

1. එග්ගුනමාසෙ කාලපක්ඛෙ එකාදසි දිවසෙ සබ්බෙ භික්ඛු නායකාදයො රාජගෙහෙ සන්නිපතන්ති, සබ්බෙ අමච්චාදයො මඤ්චං වා මඤ්චධාරං වා ඨපෙත්වා උදකකුම්භං වා මංගල සුත්තංවා රඤ්ඤා පරිභොගං වා මඤ්චාධාරෙ ඨපෙන්ති, සබ්බෙ භික්ඛු අඤ්ජලිං පණාමෙත්වා ධම්මං භණන්ති.

2. අවිජ්ජා පච්චයා - අවිජ්ජායත්වෙව - අනෙකජාති - ඉතිපිසො භගවා - ස්වාක්ඛාතො - සුපටිපන්නො - බාහුං සහස්ස - භවතු සබ්බ මංගලං - නක්ඛත්ත යක්ඛ භූතානං, යාව තතියවාරං;

3. නිට්ඨිතං - තුරියං පවත්තෙති;

4. පුන භික්ඛු සුත්තං ජපෙන්තො තාලවණ්ටං ගහෙත්වා පරිත්තං භණන්ති; කරණීය මෙත්ත සුත්තං - යංකිඤ්චි චිත්තං, යාව බණං පුරාණං - යංදුන්නිමිත්තං - දුක්ඛප්පත්තා ච - සබ්බෙ බුද්ධා;

5. නිට්ඨිතං - තුරියං පවත්තෙති;

6. එකො නායකො පරිත්ත සුත්තං ගහෙත්වා මඤ්චං අනුපරියායති; එකො නායකො උදක භාජනං ගහෙත්වා අන්තො රාජගෙහෙ අබ්භුක්කිරති.

7. පුනදිවසෙ පච්චුසකාලෙ භික්ඛු රාජගෙහෙ සන්නිපතන්ති, එකො අමච්චො පූජාසක්කාරං කත්වා විපත්ති පටිබාහාය සබ්බ සම්පත්ති සිද්ධියා - සබ්බ භය - දුක්ඛ - රොග විනාසාය පරිත්තං බ්‍රෑථ මංගලන්ති - යාව තතිය වාරං ආරාධනං කරොති.

8. ද්වෙ භික්ඛු පරිත්තං භණන්තා පඨමක භාණවාරෙ සරණා ගමනං - දසසීලං - සාමණෙරපඤ්හං ද්වත්තිංසාකාරං - පච්චවෙක්ඛණා - දස ධම්ම සුත්තං නිට්ඨාපෙන්ති.

9. සබ්බෙ භික්ඛු පරිත්තං භණන්තා මංගල සුත්තං - රතන සුත්තං - කරණීය මෙත්ත සුත්තං නිට්ඨාපෙත්වා - මහාකරුණිකො - ජයන්තො - සක්කත්වා - යංකිඤ්චි රතනං - නත්ථිමෙ - සබ්බීතියො - භවතු සබ්බ මංගලං - නක්ඛත්ත යක්ඛ භූතානං යාව තතිය වාරං නිට්ඨා පෙත්වා ආරාමං ගච්ඡන්ති තුරියං පවත්තෙති.

10. යමකා භික්ඛු පුන දසධම්ම සුත්තතො පට්ඨාය පඨමක භාණවාරං නිට්ඨාපෙන්ති තුරියං පවත්තෙති; පුන යමකා භික්ඛු දුතියක භාණවරං නිට්ඨා පෙන්ති; තුරියං පවත්තෙති, එවං දුතිය දිවසෙපි.

11. සුත්තාරම්භ දිවසෙ පඨම සජ්ජිතානි අපනෙත්වා පුන සජ්ජිතානි කත්වා සායණ්හ සමයෙ සබ්බෙ භික්ඛු මණ්ඩපං ගහෙත්වා පුබ්බෙ වුත්තනයෙනෙව මංගල සුත්තං - රතන සුත්තං - කරණීය මෙත්ත සුත්තං - මහාකාරුණිකො - ජයන්තො - සක්කත්වා - යංකිඤ්චි රතනං - නත්ථිමෙ - සබ්බීතියො - භවතු සබ්බ මංගලං - නක්ඛත්ත - ද්වෙනායකා ආසනං ආරුහන්ති - නිට්ඨිතං තුරියං පවත්තෙති.

12. නමො තස්ස - සරණා ගමනං - ධම්මචක්කප්පවත්තනං නිට්ඨාපෙත්වා ආරාමං ගච්ඡන්ති; පුන අඤ්ඤෙ ද්වෙ භික්ඛු ඡ සුත්තං නිට්ඨාපෙත්වා පරිත්තං භණන්ති.

13. සත්තමෙ දිවසෙ පඨමං පුබ්බණ්හෙ යෙව සබ්බෙ භික්ඛූ සන්නිපතිත්වා තීනි සුත්තානි භණන්ති ද්වෙ ථෙරා භික්ඛූ තාලවණ්ටානි ගහෙත්වා ආසනෙ නිසීදන්ති; පරිත්ත සුත්තං ගාහාපෙත්වා පරිත්ත සුත්තස්ස හෙට්ඨා ඨිතෙනෙව දිවස නක්ඛත්තං කථෙත්වා දෙවාලය පත්තං අක්ඛරානි අවිනාසෙත්වා ලිඛන්තෙන, තස්ස පුරෙතරමෙව ආසනස්ස පිට්ඨිභාගෙ ඨිතකෙන, විහාර සාසනං වාචෙත්වා නිට්ඨිත කාලෙ දෙවාලය පත්තං ලිඛිතබ්බං

14. තං දිවසං සායණ්හ කාලෙ සබ්බෙ භික්ඛූ මංගල සුත්තං නිට්ඨාපෙන්ති, ද්වෙ නායකා ආසනෙ නිසීදිත්වා ඉසිගිලි සුත්තෙ අන්තිමා ද්වෙ ගාථායො භණන්ති, පුන දෙවදූතො පුන එකො භික්ඛු අනුසාසනං නිට්ඨිතං - තුරියං පවත්තෙති.

15. පුන ආසනෙ නිසින්නාදයො චත්තාරො භික්ඛූ ද්වෙ පොත්ථකානි ගහෙත්වා ද්වෙ භාණවාරානි චුද්දසවාරං නිට්ඨාපෙන්ති - ද්වෙ නායකා ආටානාටිය සුත්තං නිට්ඨාපෙන්ති - තුරියං පවත්තෙති.

16. පරිත්තං නිට්ඨාපෙන්තෙහි පන සබ්බෙහි භික්ඛූ පරිත්ත සුත්තං ගහෙත්වා රතන සුත්තං, කරණීය මෙත්ත සුත්තං, යං දුන්නිමිත්තං, දුක්ඛප්පත්තා ච, සබ්බෙසු චක්කවාළෙසු, ගච්ඡන්තු දෙවතාගතා, ආරක්ඛං ගණ්හන්තු එත්තාවතා ච, සබ්බෙ බුද්ධා, පුන මහාකාරුණිකාදයො පුබ්බෙච, සබ්බෙ බුද්ධා, භණනකාලෙ පරිත්ත සුත්තෙ බන්ධනං කත්වා ඨපිතානි ද්වෙ වා තීනි වා චාරිත්තාරි වා නාළිකෙර පණ්ණානි මොචෙතබ්බානි.

17. තදනන්තරං තුරියං පවත්තෙතබ්බං, ඉතිපිසොති ආදිනා බුද්ධාදී රත්නත්තයං වන්දිත්වා ඛමාපෙතබ්බං, දානං දදන්තාවසානෙ සුත්තා ධාරං ඛණ්ඩිතබ්බන්ති නිට්ඨිතං.

## බණ පිරිත් විධිය

සරසන ලද පිරිත් මණ්ඩපයෙහි හැම සංඝයා ම බද්ධපර්‍යංකව හිඳ විජිනිපත් පසෙක තබා වැඳගෙන නමස්කාරය නො කියා අවිජ්ජා - පෙ - සමුදයො හොතු අවිජ්ජායත්වෙව - පෙ - නිරොධො හොති - අනෙක ජාති සංසාරං - පෙ - මජ්ඣගාති, ඉතිපිසො භගවා, ස්වාක්ඛාතො, සුපටිපන්නො, බාහුං සහස්ස - පෙ - නරොසපඤ්ඤො - භවතු සබ්බ මංගලං - නක්ඛත්ත - හේවිසි කරවා - කරණීය මත්ථ කුසලෙන - යංකිඤ්චි චිත්තං - ඛීණං පුරාණං - යන්දුන්නි මිත්තං - දුක්ඛප්පත්තා - සබ්බේ බුද්ධා - පෙ - රක්ඛං බන්ධාමි සබ්බසො - හැම සංඝයා ම නැගිට සබ්බෙ බුද්ධා - යන ගය කිය කියා පිරිත් හුව මැදිකොට ගොප්කොළ ගැට ගසා පිරිත් හුව දකුණට අදිනු. පිරිත් හුව ඇද හේවිසි කරවා දණ බිම ඔබා වැඳ නමස්කාරය කියා - ඉතිපිසො, බුද්ධං ජීවිතං, බුද්ධො ඛමතු තං මමං ස්වාක්ඛාතො, ධම්මං ජීවිතං, ධම්මො ඛමතු තං මමං, සුපටිපන්නො, සංඝං ජීවිතං, සංඝො ඛමතු තං මමං, බුද්ධ ධම්මා ච, මය්හං පණාම තෙජෙන චිත්තං පාපෙහි මුඤ්චතං.

මෙසේ බුදුන් වැඳ පිරිත් පේ කොට දෙවෙනි දා උදය පිරිත් පුරන දෙනම ආසනේ හිඳ හැම සංඝයාට ම සඳුන් කිරිපැන් දී පිරිත් හුව දී "විපත්ති පටිබාහාය" යන ගයින් ආරාධනා කරවා හේවිසි කරවා පුරන දෙනම නමස්කාරය කියා සරණාගමනය "තතියම්පි සංඝං සරණං ගච්ඡාමි" කියා නැවත නමස්කාරය කියා "පාණාතිපාතා වෙරමණී" ආදීන් දසසිල් කියා එකනාමකිං - අත්ථි ඉමස්මිං

- පටිසංඛා යොනිසො - දසධම්ම සූත්‍රයන් කියා නැවත ආසනේ ම හිඳ හැම සංඝයා සමග තුන් සූත්‍රය කියා මහා කාරුණිකො, ජයන්තො, සක්කත්වා, යංකිඤ්චි, නත්ථි මෙ, සබ්බීතියො, භවතු සබ්බ මංගලං, නක්ඛත්තයක්ඛා (සුහුතොච - පෙ -)

උදය දවල් සවස තුන් සූත්‍රය කියා 'මහා කාරුණිකො' යන්නෙන් පටන් ගෙන නක්ඛත්ත යක්ඛ භූතානං යනු දක්වා මහ පිරිත කියනු - පිරිත පටන්ගත් සවෙනිදා සවස මහා පිරිත කියා පිරිත් පුරන දෙනම ආසනේ හිඳ හෙවිසි කරවා නමස්කාරය කියා බුද්ධං, ධම්මං, සංඝං සරණං ගච්ඡාමි යන්නෙන් සරණාගමනය කියා "ධම්ම චක්කය" කියනු.

නැවත අනුශාසනාව කියන දේවාල පත ලියන දෙනම නමස්කාරය කියා සරණාගමනය කියා මහාසමය සූත්‍රය කියා, මෙසේ නමස්කාරය සරණාගමනය කියා සූත්‍ර හත පිළිවෙලින් කියා හත්වෙනිදා උදය මහ පිරිත කියා ඉක්බිති පිරූ දෙනම ආසනේ හිඳ යුගය නො කියා ඉන්ද දී සූත්‍රය කී දෙනම ද නිශ්ශබ්දව ආසනයෙහි ම හින්ද දී හැම සංඝයා ම, පිළිවෙලින් හිඳි පිරිත් හුව දී අල්ලා සිටියදී ම දේවාල පත ලියන නම ආසනයට දකුණු පස, වලයම ළඟ පිරිත් හුව ඉදිරි පිට සිටුවා අනුශාසනාව කියන නම ආසනේ වම්පස සිටුවා දේවාල පත ලියන නම ලිත කී ඉක්බිති අනුශාසනා කියන නම විහාර අස්න කී ඉක්බිති දෙවාල පත ලියා ලිවූ නම ඒ පත කියා සමාප්ත කළ පසු පිරිත් හුව අකුළා නැවත සූත්‍ර පටන් ගෙන කියනු - ලිවූ දේවාල පතෙන් පත් තුනක් ලියා ඒ සතර ම සුලිකොට කසා පැනින් නහවා දුම් අල්ලා පිරිසිදු කොට සතර කොන බුලත් පලු කැන් පුවක් මල් ඉති සමග හේමකඳ බැඳ දුම් අල්ලා උසක තබා මහදන් වළඳා පෙරසේ ම මහ පිරිත කියා සූත්‍ර කියන්ට හැර මහ පෙරහරින් පිටත්ව යන කල හේමකඳ පත ලිවූ නම දේවදූතයාට දී දේවාලයට ගොස් මල් පහන් පුදවා දුම්මල ගස්වා පසු ජයමංගල කියා තල්පත් බෝමැඩ සිව්කොන එල්වා එනු.

සවස හැම සංඝයා රැස්ව හිඳ පිරිත් හුව දී පිරූ දෙනම ආසනයේ හිඳ නමස්කාරය කියා මංගල සූත්‍රය පටන් ගෙන හැම ම කියා පසු දොරකඩ අස්න අනුශාසනාව කියා පසුව පිරූ දෙනම හමාරක් කියා පැන් දී ඉක්බිති අනුශාසනාව කිවූ දේවාල පත ලිවූ දෙනම හමාරක් කියා අතිරේක සංඝයා හමාර කියා අරුණු වේලාවට පිරූ දෙනම ආටානාටිය සූත්‍රය හමාරකොට හැම දෙනම රතන සුත, කරණීය සුත, මහපිරිත යුගය කියා නක්ඛත්ත යක්ඛ යන ගය දක්වා කියා යන්දුන්නි මිත්තං, දුක්ඛප්පත්තා, දෙවතාගතා, සබ්බෙ බුද්ධ - පෙ - සබ්බසො - මෙසේ කිය කියා බැඳ තුබූ පුළුන් කොළ ගැට හුනා පිරිත්හුව අකුළා පෝය කරන ලෙස බුදුන් වැඳ යනු.

**බණපිරිත් විධිය නිමි.**

•••••••••••••••

Non-Commercial Distribution

# පළාත්බද පිරිත් චාරිත්‍ර විධි

## තිස් පැයේ පිරිත

ගෞරව භක්ති සම්මාන සහිත ව පිරිත් මණ්ඩපයට සංඝයා වැඩම වූ පසු දැහැත් වට්ටියක් පිළිගන්වා ආරාධනා කිරීම.

1. මණ්ඩපය වටා ඇති කලස්වල දායකයන් ලවා පහන් දැල්වීම.

2. හඳුන් කිරි පැන් හෝ සුවඳවලින් අත් පිරිසුදු කොට පොරි හා මල් සංඝයාගේ අතිනත යවා ධාතු කරඬුවට මල් පූජා කිරීම හා පොරි ඉසීම.

3. පන්සිල් දීම.

4. දායකයාගෙන් අදහස විචාරීම.

5. පිරිත් අවවාදය.

6. මඟුල් බෙර.

7. දේවතාරාධනාව (සමන්තා චක්කවාළෙසු - යනාදීන්)

8. නමස්කාරය තෙවරක් කියා පටන් ගෙන සමහර භික්ෂූන් වහන්සේ පටිච්චසමුප්පාදය කියති. ඉතිපිසො භගවා - ස්වක්ඛාතො භගවතා ධම්මො - සුපටිපන්නො භගවතො සාවක සංඝො- බාහුං සහස්ස - භවතු සබ්බ මංගලං - නක්ඛත්ත යක්ඛ භූතානං යන්නෙන් අවසන් කෙරෙති.

9. බෙරය පමණක් එකවරක් ගස්වා පිරිත් නූල් ඇද (රුහුණේ පිරිත් හුය තිස් පැයේ පිරිතට ගෙන යැමක් නැත) තුන් සූත්‍රය කියා මහා කාරුණිකො නාථො යනාදීන් දකුණු පළාතේ අවසන් කෙරෙති. (සමහර පළාත්වල භික්ෂූන් වහන්සේ තුන් සූත්‍රය කියා යංදුන්නි මිත්තං දුක්ඛප්පත්තා ච නිද්දුක්ඛා සබ්බෙ බුද්ධා බලප්පත්තා යි අවසන් කෙරෙති)

10. යුග දේශනා පවත්වා සූත්‍ර දෙසා, හමාර කියා, උදේ පිරිත, කරණීයමත්ථ කුසලෙන, යංදුන්නිමිත්තං, දුක්ඛප්පත්තා ච නිද්දුක්ඛා, සබ්බෙ බුද්ධා බලප්පත්තා, ජයාසන ගතාවීරා, තණ්හංකරො මහා වීරො, මහා කාරුණිකො නාථො, වන්දාමි චෙතියං සබ්බං, ඉමිනා පුඤ්ඤ කම්මෙන, උපජ්ඣායා ගුණුත්තරා, කායෙන වාචා චිත්තේන, ඕකාස ද්වාරත්‍යෙන'යි අවසන කෙරෙති.

11. අනතුරුව සිටින පිරිසට පන්සිල් දී පිරිත් අනුමෝදනා කෙරෙති.

12. (පිරිත් පැන් දීමේ දී ප්‍රධාන) දායක මහතාට හෝ ලෙඩාට, යංකිඤ්චි චිත්තං, සම්බුද්ධ සෙට්ඨො, යෙ පුග්ගලා යනාදී ගාථා තුන කියා සබ්බීතියො, භවතු සබ්බ, නක්ඛත්ත යක්ඛ භූතානං යනාදිය කියති. නූල් බැඳීමේ දී නවගුණ පාඨාදිය හා සබ්බෙ බුද්ධ බලප්පත්තා යනාදිය කියති.

Non-Commercial Distribution

## තුන්තිස් පැයේ හෙවත් තුන්වේලේ පිරිත

1 සිට 7 දක්වා තිස් පැයේ පිරිත මෙනි.

4 අංකයේ දී මෙන් දායකයාගේ අදහස් විචාරා. විපත්ති පටිබාහාය සබ්බ සම්පත්ති සිද්ධියා, සබ්බ දුක්ඛ විනාසාය පරිත්තං බ්‍රෑථ මංගලං - පෙ - සබ්බ භය විනාසාය - පෙ - සබ්බ රොග විනාසාය පරිත්තං බ්‍රෑථ මංගලං යනුවෙන් දායකයා ලවා කියවිය යුතුයි.

8. නමස්කාරය පුරමින් පටන්ගෙන පටිච්ච සමුප්පාදය කියා ඉතිපිසො භගවා, ස්වාක්ඛාතො, සුපටිපන්නො, බාහුං සහස්ස, භවතු සබ්බ, නක්ඛත්ත යක්ඛ යනාදිය දේශනා කරති.

9. බෙරය වරක් ගස්වා: කරණීය සූත්‍රයෙන් පටන් ගෙන, ඛීණං පුරාණං යන ගයෙන් අවසන් කොට යන්දුන්නි මිත්තං දුක්ඛප්පත්තා, එත්තාවතා, සබ්බෙ බුද්ධා යන ගය තුන් වරක් කීමෙන් පසු සියලුම සංඝයා නැගිට[1] පිරිත් හුය මණ්ඩපය උඩ වටා ගැට ගැසිය යුතුයි.[2] පිරිත අවසන් කරන්නේ තිස් පැයේ පිරිතට සමානව ය. කප ගහ වෙනුවට ගන්නේ සූරිය ලීයකි. එහි වටාපතක් මෙන් ඉන්ද්‍රකීලය සරසා බඳියි.[3]

## පස්වේලේ (තිස් පැ හතේ) පිරිත

මෙහි චාරිත්‍ර තුන් වේලේ මෙනි.

## හත්වේලේ (තිස් පැ පහේ) පිරිත

සිරිත් විරිත් තුන් තිස් පැයේ පිරිත මෙනි.

1. චිරාගත සම්ප්‍රදාය අනුව පැවැත්වෙන ක්‍රමය පිරිත පේ කළ දිනයේ රාත්‍රී මහ පිරිතෙන් පසු පිරිත් මණ්ඩපය වසා දැමීමයි. පසුදින උදේ මහ පිරිතෙන් පසු යුග දේශනාව ආරම්භ කරයි. මෙම චිරාගත ක්‍රමය ඇතැම් තැන්හි අදත් පැවැත්වෙන අතර, බොහෝ තැන්හි දී මුල් දිනයේ ම රාත්‍රී මහ පිරිතෙන් පසු යුග දේශනාව ද කීම සිරිතක් කරගෙන තිබේ. මහ පිරිතෙන් පසු වුව ද පිරිත් ශ්‍රවණය කරන මහජනයා නතරව සිටින බැවින් මෙසේ යුග දේශනාව පවත්වන බව පෙනේ. පිරිත පේ කළ දවසේ සිට 3 වන දින රාත්‍රී මහපිරිත කියා සූත්‍ර දේශනාව පවත්වා උදේ මහ පිරිත කියා දෙනමක් යුග දේශනාව පවත්වති. නැවත උදේ 9 ට පමණ සංඝයා මණ්ඩපය වටා ගැට ගසා විහාර අස්න පටන් ගනියි.

3. විහාර අස්න කියා අවසන් වූ විට දේවාල පත්‍රය හිටගෙන ම ලියා කියවයි. අනික්වා පහසු අන්දමට ලියති.

4. සවස සංඝයා රැස්ව මණ්ඩපය වටා හෝ කොටසක් තිරවලින් ආවරණය කොට දූතයා ගෙන යන දේවාල කදු නොහොත් හේමකද බඳියි.

---

1. පිරිත් හුය නො අඳියි. පිරිත පේ කරන දින එය නැත.
2. හතරවන වාරයේ පටන් පිරිත් හුය බැඳ අවසන් වනතෙක් දෙසිය යුතුයි.
3. පිරිතට වැඩමවීමට පෙර බුදුන් වැඳ ඇවැත් දෙසිය යුතුයි.

Non-Commercial Distribution

5. අනුශාසනා භික්ෂුව හා දේවදූතයා වැඩමවා දේවාල පෙරහරේ යන අයට පන්සිල් දී[1] පිරිත් පැන් කොතලය, තෙල් මල් ආදි පූජා ද්‍රව්‍ය හේමකද[2] දූතයාට දෙයි.

6. පෙරහරේ දවුල් ශබ්දය නො ඇසෙන තරමට ගමන් කළ විට මහා පිරිත කියා පිරිත් පැන් දෙයි. දේවාලයට ගොස් ආපසු පැමිණෙන පෙරහරේ හේවිසි ශබ්දය ඇසෙන විට දක්ෂ දෙනමක් මහාසමය සූත්‍රදේශනාව පටන් ගනිති.

## අළුත්කුරු - සිය නෑ ආදි කෝරළ බද පිරිත

තිස්පැයේ පිරිතෙහි සරසන ලද ධර්ම මණ්ඩපයට පළමු කොට ධාතු කරඬුව සහිත පිරිත් පොත් වහන්සේ ඇතුළු මහා සංඝයා වහන්සේ වැඩමවා ඉක්බිති පිරිත් පැන් ද වැඩමවා පිරිත් හුය ඇද්ද යුතු.

ඊට පසු දායක මහතා සියලු සංඝයා වෙනුවෙන් මහතෙරුන් වහන්සේට දැහැත් වට්ටියක් පිළිගන්වා "මෙලොව ආරක්ෂා පිණිසත් පරලොව දෙව් මිනිස් සැප හා නිවන් සැප පිණිසත් කරුණාවෙන් පිරිත් ධර්මය දේශනා කරන සේක්වා"යි ආරාධනා කළ යුතුයි.

එයින් පසු ව්‍යක්ත තෙරනමක් ධර්මානුශාසනයක් කොට පසුව මල්පැලවල හා කලස්වලත් පහන් දල්වා සුවඳ දුම් අල්වා හේවිසි කරවා මණ්ඩපයෙහි ලදපස්මල්[3] ඉස පන්සිල් සමාදන් කරවා දේවතාරාධනා කළ යුතුයි. (අසනීපයකට නම් දේවතාරාධනා නො කොට පූරන දෙනම ඇනවුම් පිරිත කියා) පසුව පිරිත් පේකොට පිරිත් හුය ගැට ගසා හේවිසි කරවා පිරිත් හුය සංඝයා අතට දී මහපිරිත දේශනා කළ යුතුයි.

**තිස් පැය 3 - 5 - 7 පිරිත්වල දී**

පළමුසේ ම ඒ කටයුතු කොට සූත්‍ර කියන දින සවස තෙල් මල්, පිරිත් පැන් රැගෙන දායක මහතුන් විහාරස්ථානයකට හෝ දේවාලය, චෛත්‍ය, වෘක්ෂයක් වෙත එළඹ මල් පහන් පුදා හේවිසි කරවා දෙවියන්ට පින් දී සූත්‍ර දේශනා හා ආටානාටිය දේශනා ශ්‍රවණයට පැමිණෙන ලෙස දෙවියන්ට ආරාධනා කළ යුතුයි.

**සතියේ බණ පිරිත්වල**

පළමු දින මහාසංඝයා වහන්සේ වැඩම කළ පසු ගෙඩිය ගසා දාන ශාලාවට රැස්කරවා ගිලන් පස පිළිගන්වා අවසන් වූ පසු ප්‍රධාන මහා තෙරුන් වහන්සේ ගේ අවසරය ලෙස ඒ ඒ තනතුරුවලට සංඝයා පත්කොට ආවාස පිළිගන්වා පසුව පස්නමකට නො අඩු වූ සංඝයා දායකවරුන් සමග විහාරයට ගොස් මල් පහන් පුදා බුදුන් වැඳ දෙවියන්ට පින් දී "මේ පින්කම ඇතුළත කටයුතු කරන මහා සංඝයා හා දායකවරුන් නිරුපද්‍රතව ආරක්ෂා කරන ලෙස" ආරාධනාවක් ද කෙරෙයි.

ඊට පසුව ධාතු කරඬුව සහිත පිරිත් පොත් වහන්සේ විසිතුරු කොට සරසන ලද මණ්ඩපයට වැඩමවා පසුව පිරිත් පැන් ද වැඩමවා පිරිත් හුය ඇද පසුව මහා සංඝයා වහන්සේ හේවිසි, උඩුවියන් සහිතව වැඩමවා ඉක්බිති දායකවරුන් සතියක් පිරිත් ධර්ම දේශනා කරන ලෙස ආරාධනා

---

1. අනුශාසනා කියන භික්ෂුව එහි දී පන්සිල් දීම කළ යුතුයි.
2. හේමකද මල් එල්ලූ කොටස ඉස්සර කොට කරේ තබා ගත යුතුයි.
3. විළඳ, සමන්පිච්ච කැකුළු, ඊතණ, අබ, සුන්සහල් යන පස් වර්ගය යි.

Non-Commercial Distribution

කළ ඉක්බිති මහතෙරුන් වහන්සේ විසින් පින්කමේ අදහස හා දොරකඩ අස්න. අනුශාසනා දිනයත් දොරකඩ අස්නය සඳහා දේවදූතයකු ගැනත් විචාරා පසු දින අලුයම්හි වතාවත් කරනු පිණිස දේවදූතයා මෙහි ධර්ම මණ්ඩපය ඉදිරිපිටට පමුණවන ලෙස නියම කොට එයින් ව්‍යක්ත තෙරනමක් විසින් ධර්මානුශාසනාවක් කළ යුතුයි.

ඉක්බිති මල් පැලවල හා කලස්වලත් පහන් දල්වා හේවිසි කරවා පසුව පන්සිල් දී කතිකාවතෙහි සඳහන් පරිදි පිරිත පේකොට හේවිසි කරවා පිරිත් හුය සංඝයා අතට දී මහපිරිත් දේශනා කොට අවසන්හි පිරිත් හුය බැඳ සතර දොරටුවෙහි පිරිත් පැන් ඉස බුදුන් වැඳ දොරටු වස්වා මණ්ඩපයෙහි රැකවල් තබා පැමිණිය යුතුයි.

පිරිත පේකළ දිනට පසු දින අලුයම පිරිත් පිරීමට නියම වූ දෙනම මණ්ඩපයට පැමිණ දේවදූතයා ලවා පහන් දල්වා පන්සිල් දී ඔහු ලවා පිරිතට ආරාධනා ගාථා කියවා දේවතාරාධනා කොට නමස්කාරය කියා පොත පටන් ගෙන දසධම්මසූත්‍රාවසානයෙහි මහ පිරිත් කියා යළිත් යුග පිරිත් පටන්ගත යුතුයි.

මෙසේ නො කඩවා පිරිත කියා හවෙනි දින මණ්ඩපය අලුත්වැඩියා කොට ලදපස්මල් ඉස රාත්‍රි සූත්‍ර දේශනාව පවත්වා හත්වෙනි දින විහාරස්න කියා දේවාලපත් ලියා සවස ගෞරව සමාචාර විධිවලින් දේවාල තල්පත් දේවදූතයා අත යැවිය යුතුයි. දේවාල පෙරහැර පිටත් වූ පසු පළමු දිනයෙහි ආරම්භ කළ තැන් සිට ම යළිත් "බුද්ධං සරණං ගච්ඡාමි" යන තැන පටන් පොත පටන් ගෙන දසධම්ම සූත්‍රය දක්වා කියූ කල මහපිරිත කියා යුග පිරිත් පටන් ගත යුතුයි. එදින රාත්‍රි සියලු සංඝයා වහන්සේ ධර්ම මණ්ඩපයට වැඩමවා මංගල සූත්‍රය සජ්ඣායනා කොට දොරකඩ අසුන් අනුශාසනා පවත්වා සතරනම බැගින් ආටානාටිය සූත්‍රය දේශනා කොට පසුවදා අලුයම පිරිත අවසන් කළ යුතුයි.

මේ සියලු සිරිත් විරිත් බණ පිරිත් කතිකාවතට අනුව සිදු කළ යුතුයි. වෘද්ධ මහාස්ථවිරොපදෙශාශ්‍රයෙන් දැක පුරුද්ද හා කළ පුරුද්දත් මේවා ක්‍රමානුකූලව පවත්වා ගෙන යෑමට හේතුවන බව ද සැලකිය යුතුයි.

•••••••••••••••

Non-Commercial Distribution

# උඩරට, හතර කෝරළේ

# පිරිත් දේශනා කිරීමේ දී අනුගමනය කරනු ලබන චාරිත්‍ර විධි

**තිස් පැයේ පිරිත් දේශනාව**

පිරිත් දේශනා කරන ස්ථානයේ මිදුලේ ගෙට මුහුණ ලා සිටින සේ පහන් පැලක් සාදනු ලැබේ. එහි පහන් පහක් ම දල්වනු ලබන්නේ සතරවරම් දෙවිවරුන් හා ගම්බාර දෙවියන් වෙනුවට යි. අනතුරුව වඩා රැබෝවීමට පෙර එනම් රාත්‍රී 7.30 ට පමණ මහාසංඝයා වහන්සේ නිවසට වැඩමවා, දැහැත් ගිලන්පස පිළිගන්වා පිරිත් මණ්ඩපයට වැඩමවනු ලැබේ.

ඉනික්බිතිව පිරිත් පැන් වැඩමවීම සඳහා අලුත් කළයක් රැගෙන හේවිසිකාරයින් සමග එක්තරා පිරිසක් අලුත තැනූ ළිඳ ළඟට ගොස් පැන් පෙරා හේවිසි මධ්‍යයේ උඩු වියනක් අල්වාගෙන පැන් කළය වැඩමවා ගෙනවිත් ලොකු පොල් මලක් පුබුදුවා පැන්කළය තුළට බහා කළය වටේ ගොක්කොළවලින් බැඳ, ඉඩ ඇත්නම් මණ්ඩපය තුළ ඇති මේසය මත කෙළවරක තැන්පත් කරයි. මේසය ඉඩ මදිනම් ටීපෝ එකක් ගෙන එයට සුදු පිරුවටයක් දමා මණ්ඩපයේ ප්‍රධාන දොරටුව පැත්තට පෙණෙන සේ තබා අනතුරුව තුන් නූල්. පිරිත් පොතේ, ධාතු කරඬුවේ හා පැන් කළයේ බඳිනු ලැබේ.

අනතුරුව ප්‍රධාන දායක මහතා ලවා මහා සංඝරත්නයට දැහැත් වට්ටියක් පිළිගන්වා, මේ තුම්යම් රාත්‍රිය මුලුල්ලෙහි පිරිත් දේශනා කිරීම සඳහා වැඳගෙන ආරාධනා කරනු ලැබේ.

විපත්ති පටිබයහාය - සබ්බ සම්පත්ති සිද්ධියා
සබ්බ දුක්ඛ විනාසාය - පරිත්තං බෲථ මංගලං

විපත්ති පටිබයහාය - සබ්බ සම්පත්ති සිද්ධියා
සබ්බ භය විනාසාය - පරිත්තං බෲථ මංගලං

විපත්ති පටිබයහාය - සබ්බ සම්පත්ති සිද්ධියා
සබ්බ රොග විනාසාය - පරිත්තං බෲථ මංගලං

භික්ෂූන් වහන්සේ නමක් විසින් මේ ගාථා කියවා අවසන් වූවාට පසු පිරිත් අනුශාසනාව අවසන් කර, නිවස ඉදිරියේ තනා ඇති පහන් පැලේ පහන් දල්වා සුවඳ දුම් අල්වා එයට හේවිසි කරවා දේවතාරාධනාව කර පිරිත් පේ කිරීම පටන් ගනු ලැබේ. ඒ අවස්ථාවේ ම මණ්ඩපය තුළ ද සුවඳ දුම්දීම, කපුරු පත්තු කිරීම හා කලස්වල පහන් දල්වා පිරිත් පේ කිරීම සඳහා මහා සංඝ රත්නය නමස්කාරය පටන්ගන්නා විට ම ලෙලි ඉවත් කරන ලද පොල් ගෙඩියක් කලින් සූදානම් කර මණ්ඩපයේ ප්‍රධාන දොරටුව අසළ බිමට ගෝනියක් හෝ පැදුරක් එලා ඒ මත ලෙලි ඉවත් කරන ලද පොල් ගෙඩිය තබා, ඒ මත පොල්තෙල් වැටියක් දල්වා තබා කැත්තකින් හෝ ලොකු පිහියකින් එක පහරින් බිඳී යන සේ කෙටීම සිදු කරනු ලැබේ.

පිරිත් පේ කිරීම අවසන් වූ පසු මණ්ඩපය ඉදිරියේ මඟුල් බෙර හා හේවිසි වාදනය කර මහ පිරිත් දේශනය ආරම්භ කරනු ලැබේ. එය අවසන් වූවාට පසු පිරිත් පොත් දෙක මේසය දෙපැත්තේ

Non-Commercial Distribution

තබා එක පැත්තකට දෙනම බැගින් දෙපැත්තට 4 නමක් බැගින් වැඩ හිඳ පිරිත් දේශනාව පටන් ගනු ලැබේ.

පහන් වන විට මෙසේ පිරිත් පොත සම්පූර්ණයෙන් කියා අවසන් කර සෙත් පිරිත (මහ පිරිත) කියා පිරිස පන්සිල්හි පිහිටුවා පින් අනුමෝදන් කර පිරිත් පැන් දී පිරිත් නූල් බැඳ අවසන් කරනු ලැබේ.

තුන් වේලේ, හත් වේලේ හා හත් දවසේ ආදී පිරිත් වල දි අනෙකුත් ප්‍රදේශවල අනුගමනය කරන චාරිත්‍ර විධි හතර කෝරළයේත් එලෙස ම අනුගමනය කරනු ලැබේ.

✤ ✤ ✤

Non-Commercial Distribution

# 1. පිරිත් පේකිරීම

අවිජ්ජාපච්චයා සංඛාරා, සංඛාරපච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණපච්චයා නාම රූපං, නාම රූප පච්චයා සළායතනං, සළායතනපච්චයා ඵස්සො, ඵස්සපච්චයා වෙදනා, වෙදනාපච්චයා තණ්හා, තණ්හාපච්චයා උපාදානං, උපාදානපච්චයා භවො, භවපච්චයා ජාති, ජාතිපච්චයා ජරා මරණං, සොක පරිදෙව දුක්ඛ දොමනස්සුපායාසා සම්භවන්ති. එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති. අවිජ්ජායත්වෙව අසේස විරාග නිරොධා, සංඛාර නිරෝධො, සංඛාර නිරොධා, විඤ්ඤාණ නිරොධො, විඤ්ඤාණ නිරොධා, නාම රූප නිරොධො, නාම රූප නිරොධා, සළායතන නිරොධො, සළායතන නිරොධා, ඵස්ස නිරොධො, ඵස්ස නිරොධා, වෙදනානිරොධො, වෙදනා නිරොධා, තණ්හා නිරොධො, තණ්හා නිරොධා, උපාදාන නිරොධො, උපදාන නිරොධා, භව නිරොධො, භව නිරොධා, ජාති නිරොධො, ජාති නිරොධා, ජරා මරණං සොක පරිදේව දුක්ඛදොමනස්සුපායාසා නිරුජ්ඣන්ති. එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොති.

අනේක ජාති සංසාරං සන්ධා විස්සං අනිබ්බිසං
ගහකාරකං ගවේසන්තො දුක්ඛා ජාති පුනප්පුනං
ගහකාරක දිට්ඨොසි පුනගෙහං නකාහසි
සබ්බා තෙ ඵාසුකාභග්ගා ගහකුටං විසංඛිතං
විසංඛාර ගතං චිත්තං තණ්හානං ඛය මජ්ඣගාති.

ඉතිපිසො භගවා අරහං සම්මා සම්බුද්ධෝ විජ්ජාචරණ සම්පන්නො සුගතො ලොකවිදු අනුත්තරො පුරිසදම්මසාරථී සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා ති.

ස්වාක්ඛාතො භගවතා ධම්මො සන්දිට්ඨිකො අකාලිකො එහිපස්සිකො ඔපනයිකො පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහී ති.

සුපටිපන්නො භගවතො සාවකසංඝො උජුපටිපන්නො භගවතො සාවකසංඝො ඤායපටිපන්නො භගවතො සාවකසංඝො සාමීචිපටිපන්නො භගවතො සාවකසංඝො යදිදං චත්තාරි පුරිසයුගානි අට්ඨපුරිස පුග්ගලා එස භගවතො සාවකසංඝො ආහුනෙය්‍යො පාහුනෙය්‍යො දක්ඛිනෙය්‍යො අඤ්ජලිකරණීයො අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සා ති.

## 2. ජය මංගල ගාථා

1. බාහුං සහස්ස මභිනිම්මිත සායුධං තං
ගිරිමෙඛලං උදිතඝොර සසෙන මාරං
දානාදි ධම්ම විධිනා ජිතවා මුනින්දො
තං තෙජසා භවතු තෙ[1] ජයමංගලානි

1. තමන් සඳහා කියන විට “මේ” කියා යොදා ගන්න.

Non-Commercial Distribution

මේ යක් තෙමේ මා අල්ලා ගනිය යි, මේ යක් තෙමේ මට ආවිෂ්ට වේ ය යි, මේ යක් තෙමේ මා පෙළාය යි, මේ යක් තෙමේ වෙසෙසින් පෙළාය යි, මේ යක් තෙමේ මට හිංසා කෙරේය යි, මේ යක් තෙමේ මා වෙහෙසාය යි, මේ යක් තෙමේ මා නො මුදායැ යි දැන්විය යුතු, හඬ නගා කියැ යුතු.

නිදුකාණන් වහන්ස, මේ මහණුනට මෙහෙණනට උවසුවනට උවැසියනට ගුප්තිය පිණිස, රැකවරණ පිණිස, නො වෙහෙසීම පිණිස, පහසු විහරණ පිණිස වූ ආටානාටිය පිරිත ය.

නිදුකාණන් වහන්ස, අපි දැන් යම්හ. අපි බොහෝ කෘත්‍යය ඇත්තම්හ, බොහෝ කටයුතු ඇත්තම්හ'යි වරම් රජහු කීහ.

මහරජුනි, තෙපි යම් ගමනකට දැන් කල්වේ යයි සලකන්නහු ද, ඒ ගමන කරනු ලැබේවා යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

ඉක්බිති සතර වරම් මහ රජහු හුනස්නෙන් නැගී, සාදර වැ භාග්‍යවතුන් වහන්සේ වැඳ පැදකුණු කොට, එහිම අතුරුදන් වූහ. ඒ යක්කු ද හුනස්නෙන් නැගී, ඇතැම් කෙනෙක් සාදර වැ භාග්‍යවතුන් වහන්සේ වැඳ පැදකුණු කොට එහිම අතුරුදන් වූහ. ඇතැම් කෙනෙක් භාග්‍යවතුන් වහන්සේ හා සතුටු වූහ. සතුටට කරුණු වූ සිත රැඳවිය යුතු වූ කථා නිමවා එහිම අතුරුදන් වූහ. ඇතැම් කෙනෙක් භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හි ද ඒ දිසාවට දොහොත් නඟා එහිම අතුරුදන් වූහ. ඇතැම් කෙනෙක් නිහඬවූවාහු එහිම අතුරුදන් වූහ.

**තුන්වන බණවර නිමියේ ය.**

•••••••••••••••

Non-Commercial Distribution

නිරොධ ගාමිනිපටිපදා අරිසච්චං, දුක්ඛ නිරෝධ ගාමිණීප්‍රතිපදා ආර්‍ය්‍ය සත්‍යය යි; වුච්චති, කියනු ලැබේ.

34. ආවුසො, ඇවැත්නි; අරහතා, අර්හත් වූ; තථාගතෙන, තථාගත වූ; සම්මා සම්බුද්ධෙන, සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ විසින්; බාරාණසියං, බරණැසෙහි; මිගදායෙ, මිගදාය නම් වූ; ඉසිපතනෙ, ඉසිපතනාරාමයෙහි; සමණෙන වා, ශ්‍රමණයකු විසින් හෝ; බ්‍රාහ්මණෙන වා, බමුණකු විසින් හෝ; දෙවෙන වා, දෙවියකු විසින් හෝ; මාරෙන වා, මාරයකු විසින් හෝ; බ්‍රහ්මුණා වා, බ්‍රහ්මයකු විසින් හෝ; ලොකස්මිං, ලෝකයෙහි; කෙනචි වා, අන්කිසිවකු විසින් හෝ; අප්පතිවත්තියං, නො පැවැත්විය හැකි; යං, යම්බඳු වූ; ඉමෙසං චතුන්නං, අරියසච්චානං, මේ චතුරාර්‍ය්‍ය සත්‍යය ධර්මයන් ගේ; ආචික්ඛණා, කීම ය; දෙශනා, දේශනා කිරීම ය; පඤ්ඤපනා, පැණවීම ය; පට්ඨපනා, පිහිටුවීම ය; විවරණා, විස්තර කිරීම ය; විභජනා, විභාග කිරීම ය; උත්තානීකම්මං ඉති, ප්‍රකට කිරීම ය යන; ඉදං, මේ; අනුත්තරං, උතුම් වූ; ධම්මචක්කං, ධර්මචක්‍රය; පවත්තිතං, පවත්වන ලදී.

35. ආයස්මා, ආයුෂ්මත් වූ; සාරිපුත්තො, සාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ; ඉදං, මේ ධර්ම දේශනාව; අවොච, වදාළ සේක; අත්තමනා, සතුටු වූ; තෙ භික්ඛූ, ඒ භික්ෂූන් වහන්සේලා; ආයස්මතො සාරිපුත්තස්ස, ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් ගේ; භාසිතං, දේශනාව; අභිනන්දුං ඉති, සතුටින් පිළිගත්හ.

**සච්ච විභංග සූත්‍රය යි.**

**(අතිරෙකානි, අතිරේක වූ; සත්ත සුත්තානි, සප්ත සූත්‍රයෝ; නිට්ඨිතානි, නිම කරන ලදී.)**

* * *

Non-Commercial Distribution

32. ආවුසො, ඇවැත්නි; සම්මා සති, සම්‍යක් ස්මෘතිය; කතමා ච?; කවරීද?; ආවුසො, ඇවැත්නි; ඉධ, මේ සස්නෙහි; භික්ඛු, යෝගාවචර භික්ෂු තෙම; ආතාපි, කෙලෙසුන් තවන වීර්‍ය්‍ය ඇතිව; සම්පජානො, නුවණ ඇතිව; සතිමා, සිහිය ඇතිව; ලොකෙ, ශරීර සංඛ්‍යාත ලෝකයෙහි; අභිජ්ඣා දොමනස්සං, දැඩි ලෝභය හා ක්‍රෝධය; විනෙය්‍ය, දුරුකොට; කායෙ, කායගතානුසති භාවනාවෙහි; කායානුපස්සී, ශරීරය අනුව නුවණින් කල්පනා කර බලමින්; විහරති, වාසය කෙරේ ද; ආතාපි, කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇතිව; සම්පජානො, නුවණ ඇතිව; සතිමා, සිහිය ඇතිව, ලොකෙ, ශරීර සංඛ්‍යාත ලෝකයෙහි; අභිජ්ඣා දොමනස්සං, දැඩි ලෝභය හා ක්‍රෝධය; විනෙය්‍ය, දුරුකොට; වෙදනාසු, වේදනාවන්හි; වෙදනානුපස්සී, වේදනාව අනුව බලමින්; විහරති, වාසය කෙරේ ද; ලොකෙ, ශරීර සංඛ්‍යාත ලෝකයෙහි; ආතාපි, කෙලෙසුන් තවන වීර්‍ය්‍ය ඇතිව; සම්පජානො, නුවණ ඇතිව; සතිමා, සිහිය ඇතිව; අභිජ්ඣා දොමනස්සං, දැඩි ලෝභය හා ක්‍රෝධය; විනෙය්‍ය, දුරුකොට; චිත්තෙ, සිතෙහි; චිත්තානුපස්සී, සිත අනුව බලමින්; විහරති, වාසය කෙරේ ද; ලොකෙ, ශරීර සංඛ්‍යාත ලෝකයෙහි; ආතාපි, කෙලෙසුන් තවන වීර්‍ය්‍ය ඇතිව; සම්පජානො, නුවණ ඇතිව; සතිමා, සිහිය ඇතිව; අභිජ්ඣා දොමනස්සං, දැඩි ලෝභය හා ක්‍රෝධය; විනෙය්‍ය, දුරුකොට; ධම්මෙසු, නීවරණාදී ධර්මයන් කෙරෙහි; ධම්මානුපස්සී, ධර්මය අනුව බලමින්; විහරති, වාසය කෙරේ ද; ආවුසො, ඇවැත්නි; අයං, මෝ තොමෝ; සම්මා සති, සම්‍යක් ස්මෘතිය යි; වුච්චති, කියනු ලැබේ.

33. ආවුසො, ඇවැත්නි; සම්මා සමාධි, සම්‍යක් සමාධිය; කතමා ච?, කවරේ ද?; ආවුසො, ඇවැත්නි; ඉධ, මේ සස්නෙහි; භික්ඛු, යෝගාවචර භික්ෂු තෙම; විවිච්චෙව කාමෙහි, පඤ්චකාමයන්ගෙන් වෙන්ව ම; විවිච්ච අකුසලෙහි ධම්මෙහි, පඤ්චනීවරණ අකුසලයන් ගෙන් වෙන්ව; සවිතක්කං, විතර්ක සහිත වූ; සවිචාරං, විචාර සහිත වූ; විවෙකජං විවේකයෙන් උපන්නා වූ; පීතිසුඛං, ප්‍රීතිය හා සැපය ඇති; පඨමජ්ඣානං, ප්‍රථමධ්‍යාන කුසල් සිතට; උපසම්පජ්ජ, පැමිණ; විහරති, වාසය කෙරෙයි.

විතක්ක විචාරනං, විතර්ක විචාරයන් ගේ; වූපසමං, සංසිඳීමෙන්; අජ්ඣත්තං, තමා කෙරෙහි පැවැති; සම්පසාදනං, මනා පැහැදීම ඇති; චෙතසො එකොදිභාවං, සිත පිළිබඳ එකඟ බවක් ඇති; අවිතක්කං, විතර්කයක් නැති; අවිචාරං, විචාරයක් නැති; සමාධිජං, සමාධියෙන් උපන්; පීති සුඛං, ප්‍රීතිය හා සැපය ඇති; දුතියජ්ඣානං, දෙවෙනි ධ්‍යානයට; උපසම්පජ්ජ, පැමිණ; විහරති, වාසය කෙරෙයි; පීතියා ච විරාගා, ප්‍රීතියෙහි ද නො ඇලීමෙන්; උපෙක්ඛකො ච, උපේක්ෂකව හෙවත් මැදහත්ව; විහරති, වාසය කෙරෙයි.

සතො ච, සිහි ඇති ව; සම්පජානො, නුවණ ඇති ව; කායෙන, නාම කයින්; සුඛං පටිසංවෙදෙති, ධ්‍යාන සැපය විඳියි; යං, යම්බඳු වූ ඒ තුන්වැනි ධ්‍යානයෙන් යුත් පුද්ගලයා; උපෙක්ඛා, මධ්‍යස්ථ වූයේ; සතිමා, සිහි ඇත්තෙක; සුඛවිහාරීති, ධ්‍යාන සැප විහරණ ඇත්තෙකැ යි; අරියා, ආර්‍ය්‍යයෝ; ආචික්ඛන්ති, කියත් ද; තං තතියජ්ඣානං, ඒ තුන්වෙනි ධ්‍යානයට; උපසම්පජ්ජ, පැමිණ; විහරති, වාසය කෙරෙයි.

සුඛස්ස ච පහානා, කායික සැපය දුරු කිරීමෙන් හා; දුක්ඛස්ස ච පහානා, කායික දුක්ඛය දුරු කිරීමෙන්; පුබ්බෙව, පළමු කොට ම; සොමනස්ස දොමනස්සානං, සිත පිළිබඳ වූ සොමනස් දොම්නස් දෙදෙනා ගේ; අත්ථංගමා, නැති වී යාමෙන්; අදුක්ඛං අසුඛං, දුකක් නැති සැපක් නැති; උපෙක්ඛා, මධ්‍යස්ථ බැවින් වූ; සති පාරිසුද්ධිං, සිහි පිරිසුදු බැව් ඇති; චතුත්ථජ්ඣානං, චතුර්ථධ්‍යාන කුසල සිතට; උපසම්පජ්ජ, පැමිණ; විහරති, වාසය කෙරෙයි; ආවුසො, ඇවැත්නි; අයං, මේ ධර්මය තෙම; සම්මා සමාධි, සම්‍යක් සමාධිය යි; වුච්චති, කියනු ලැබේ; ආවුසො, ඇවැත්නි; ඉදං, මෙය; දුක්ඛ

Non-Commercial Distribution

1. යෙ සත්තසාරා අනීඝා නිරාසා
පච්චෙකමෙවජ්ඣගමුං සුබොධිං;
තෙසං විසල්ලානං නරුත්තමානං
නාමානි මෙ කිත්තයතො සුණාථ.

2. අරිට්ඨො උපරිට්ඨො තගරසිඛී යසස්සී
සුදස්සනො පියදස්සී ච බුද්ධො;
ගන්ධාරො පිණ්ඩොලො උපාසභො ච
නීතො තථො සුතවා භාවිතත්තො.

3. සුම්භො සුභො මෙටුලො අට්ඨමො ච
අථස්සු මෙඝො අනීඝො සුදාඨො;
පච්චෙක බුද්ධා භවනෙත්තිඛීණා
හිංගු ච හිංගො ච මහානුභාවා.

4. ද්වෙ ජාලිනො මුනිනො අට්ඨකො ච
අථ කොසල්ලො බුද්ධො අථො සුබාහු;
උපනෙමිසො නෙමිසො සන්තචිත්තො
සච්චො තථො විරජො පණ්ඩිතො ච.

5. කාලූපකාලා විජිතො ජිතො ච
අඞ්ගො ච පඞ්ගො ච ගුතිජ්ජිතො ච;
පස්සී ජහී උපධිං දුක්ඛමූලං
අපරාජිතො මාරබලං අජෙසි.

6. සත්ථා පවත්තා සරභඞ්ගො ලොමහංසො
උච්චඞ්ගමායො අසිතො අනාසවො;
මනොමයො මානච්ඡිදො ච බන්ධුමා
තදධිමුත්තො විමලො ච කෙතුමා.

Non-Commercial Distribution

12. යසස්සී නාම හික්ඛවෙ [*]පච්චෙක බුද්ධො, ඉමස්මිං ඉසිගිලිස්මිං පබ්බතෙ චිරනිවාසී අහොසි..

13. සුදස්සනො නාම හික්ඛවෙ [*]පච්චෙකබුද්ධො, ඉමස්මිං ඉසිගිලිස්මිං පබ්බතෙ චිරනිවාසී අහොසි..

14. පියදස්සී නාම හික්ඛවෙ [*]පච්චෙක බුද්ධො, ඉමස්මිං ඉසිගිලිස්මිං පබ්බතෙ චිරනිවාසී අහොසි..

15. ගන්ධාරො නාම හික්ඛවෙ [*]පච්චෙක බුද්ධො, ඉමස්මිං ඉසිගිලිස්මිං පබ්බතෙ චිරනිවාසී අහොසි..

16. පිණ්ඩොලො නාම හික්ඛවෙ [*]පච්චෙක බුද්ධො, ඉමස්මිං ඉසිගිලිස්මිං පබ්බතෙ චිරනිවාසී අහොසි..

17. උපාසභො නාම හික්ඛවෙ [*]පච්චෙකබුද්ධො, ඉමස්මිං ඉසිගිලිස්මිං පබ්බතෙ චිරනිවාසී අහොසි..

18. නීථො නාම හික්ඛවෙ [*]පච්චෙක බුද්ධො ඉමස්මිං ඉසිගිලිස්මිං පබ්බතෙ චිරනිවාසී අහොසි..

19. තථො නාම හික්ඛවෙ [*]පච්චෙක බුද්ධො, ඉමස්මිං ඉසිගිලිස්මිං පබ්බතෙ චිරනිවාසී අහොසි..

20. සුතවා නාම හික්ඛවෙ [*]පච්චෙක බුද්ධො, ඉමස්මිං ඉසිගිලිස්මිං පබ්බතෙ චිරනිවාසී අහොසි..

21. භාවිතත්තො නාම හික්ඛවෙ [*]පච්චෙක-බුද්ධො, ඉමස්මිං ඉසිගිලිස්මිං පබ්බතෙ චිරනිවාසී අහොසිති..

---

[*] බොහෝ පොත්වල පච්චේක සම්බුඬො

Non-Commercial Distribution